අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)
13 ශ්‍රේණිය

# ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

(2010 වසරේ සිට ක්‍රියාත්මක වේ)

ආගම් දෙපාර්තමේන්තුව
භාෂා, ආගම් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# පෙරවදන

නිපුණතා පාදක විෂයමාලාව පාසල් පද්ධතියට හඳුන්වාදීමේ කාර්යය 13 වන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ හඳුන්වාදීමත් සමඟ සම්පූර්ණ වේ. 12 වන හා 13 වන ශ්‍රේණිවල සිසු සිසුවියන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා පවතින දැඩි තරගයට ගොදුරුවීම නිසා නිරන්තරව ම යම් තරමක පීඩනයකට යටත් වේ. නව විෂයමාලාව ප්‍රථම වතාවට අ.පො.ස. (උ.පෙ.) සඳහා යොදා ගැනෙන විට මෙම පීඩනය තවත් දැඩි වේ. එවැනි අවස්ථාවක ඔබ අතට පත්වන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, විෂය නිර්දේශ තරමට ම ගුරුවරුනට වැදගත් වන්නේ ය. මෙහි මූලිකව ම ගුරුවරයා සැලකිල්ලට ගත යුතු පැති තුනක් ඇත. එනම් ගුරු මාර්ගෝපදේශ විෂය නිර්දේශය හා පූර්ණව ගැළපී තිබීම, විෂයමාලාවේ අපේක්ෂිත නිපුණතා පාදකව විෂයමාලාවේ දර්ශනය හා දැක්ම මුල්කොට ගෙන සකසා තිබීම හා 12 - 13 ශ්‍රේණිවල දරුවාගෙන් අපේක්ෂිත සාධන මට්ටම මෙනෙහි කොට සකසා තිබීම. එහෙයින් මෙය හොඳින් පරිශීලනය කිරීම ගුරුවරයාට අත්‍යවශ්‍ය කාර්යයක් හා වගකීමක් වන්නේය.

ජාතික අධ්‍යාපන ආයතනය ඉහත කී කරුණු තුන ම ඔබගේ අවධානයට ගෙන ඒම සඳහා 13 වන ශ්‍රේණිවල ඉගැන්වීම් කරන සියලුම ගුරුවරුනට ඒ සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම සඳහා ද ක්‍රියාත්මක වී සිටී. නිරන්තරව පැවැත්වෙන මෙම පුහුණු සැසිවලට අදාළ ගුරුවරුන් සහභාගිවීම අතිශයින් ම අවශ්‍ය කරුණක් වන්නේ මෙහි දැක්වෙන ඉගෙනුම්-ඉගැන්වීම් මූල ධර්ම හා ක්‍රියාදාම වටහා ගැනීමට පුහුණුව බෙහෙවින් ඉවහල් වන නිසා ය. විශේෂයෙන් ම පාසල් පාදක ඇගයීම් ක්‍රියා, නිපුණතා වර්ධනය සඳහා ඉවහල් කර ගැනීම අපේක්ෂා කෙරේ. විෂය කරුණුවලට පමණක් ඉගැන්වීම යටත්වීමට නොදී සිසුනගේ කුසලතා ඔප ගැන්වීමේ අභිලාෂය ඉටුකරදීමට මේ සියලු මැදිහත්වීම් අවශ්‍ය බව අධ්‍යාපන හා ඇගයීම් කාර්යයේ නියැලෙන අප සියලු ම දෙනා වටහා ගත යුතු වේ.

ගුරු මාර්ගෝපදේශ පිළියෙල කිරීමේ අතිශය වෙහෙසකාරී කාර්යය ඉටුකරලීමට මැදිහත් වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලුම ශාස්ත්‍රීය අංශවල නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩල හා බාහිරව ඒ සඳහා දායක වූ විද්වත් හැම දෙනාට ම ද මාගේ විශේෂ ස්තූතිය හිමි වේ.

**ආචාර්ය උපාලි එම්. සේදර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# සංඥාපනය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2010 වර්ෂයේ සිට 13 වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන්හට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කරගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකි ය. එහෙත් නිපුණතා මට්ටම් හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදී ම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ඔබට ශ්‍රේණියට අදාළ පාඩම් සැලසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම් ඵල බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම්ඵල ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන්ම පන්ති කාමරයේ දී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේ දී පරිශීලනය කළ යුතු අතිරේක පොත් පත් මෙන් ම වෙබ් අඩවි පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලී ගුරුවරයෙකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිතව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. එහිදී ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සිසුන් විවිධ පොත්පත් පරිශීලනය අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිට ම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදාගත් සන්නිවේදන උපක්‍රම නිර්මාණශීලී ව භාවිත කිරීමට නව පන්තිකාමරය තුළ දී උනන්දු විය යුතු වේ.

13 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගැන්වීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශ මනාව පැහැදිලි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැලැස්ම හඳුන්වා දෙන්නේ නම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට පාසල වෙත සිසුන් ආකර්ෂණය වේ. මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් - ඉගන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා අදාළ විෂය නිර්දේශය මෙන් ම මෙහි යෝජිත ක්‍රියාවලි ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලී හැකියා පුබුදුවා ගන්නා මෙන් ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශ සැකසීමේ දී දායක වූ විද්වත් සැමට, ගුරුභවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන්ට මාගේ ස්තූතිය හිමි වේ. මේ කාර්යය සඳහා මඟපෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය උපාලි එම්. සේදර මැතිඳුන් මෙන් ම මුද්‍රණ කටයුතු සිදු කර පාසල්වලට ලබාදීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්යය මණ්ඩලයට මගේ විශේෂ ස්තූතිය පුද කරමි. මෙහි ඇතුළත් කරුණු පිළිබඳ ව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබා දෙන්නේ නම් කෘතඥ වේ.

**විමල් සියඹලාගොඩ**
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(විෂයමාලා සංවර්ධන පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය

# උපදේශක මණ්ඩලය හා ලේඛක මණ්ඩලය

| | | |
|---|---|---|
| **උපදේශනය** | : | ආචාර්ය උපාලි එම්. සේදර<br>අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.<br><br>විමල් සියඹලාගොඩ මහත්මා,<br>සහකාර අධ්‍යක්ෂ ජනරාල්,<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය. |
| **අධ්‍යක්ෂණය** | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>අධ්‍යක්ෂ, ආගම් දෙපාර්තමේන්තුව. |
| **උපදේශක මණ්ඩලය** | : | අති උතුම් දේවධර්මාචාර්ය වැලන්ස් මෙන්ඩිස් රදගුරු හිමිපාණෝ<br>සභාපති, අධ්‍යාපන, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යාපනය පිළිබඳ<br>ජාතික කතෝලික රදගුරු කොමිසම.<br><br>අති උතුම් දේවධර්මාචාර්ය තෝමස් සෞන්දනායගම් රදගුරු හිමිපාණෝ,<br>උප සභාපති, අධ්‍යාපන, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යාපනය පිළිබඳ<br>ජාතික කතෝලික රදගුරු කොමිසම.<br><br>අතිගරු අයිවන් පෙරේරා නාහිමිපාණෝ,<br>ජාතික කතෝලික අධ්‍යාපන අධ්‍යක්ෂ.<br><br>අතිගරු ආචාර්ය ජයසිරි පීරිස් දේවගැතිතුමා,<br>මහලේකම්, ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය.<br><br>ගරු ඥානමුත්තු පිලේන්ද්‍රන් පියතුමා,<br>අංශ ප්‍රධානි, ක්‍රිස්තියානි හා ඉස්ලාම් සංස්කෘතික දෙපාර්තමේන්තුව,<br>යාපනය විශ්ව විද්‍යාලය.<br><br>ගරු ග්‍රෙගරි ප්‍රනාන්දු (සා.බෙ.නි.) පියතුමා,<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, ආගමික හා සාරධර්ම අංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල.<br><br>ආචාර්ය ෂර්ලි ලාල් විජේසිංහ,<br>ප්‍රධානි, ක්‍රිස්තියානි සංස්කෘතික දෙපාර්තමේන්තුව,<br>කැලණිය විශ්ව විද්‍යාලය. |
| **සම්බන්ධීකරණය** | : | ගරු ලොයිඩ් ශාන්තිකුමාර් පියතුමා,<br>ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය.<br><br>ගරු ගැමුණු ඩයස් ජයවර්ධන පියතුමා,<br>සහකාර ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය. |

| | | |
|---|---|---|
| **ලේඛක මණ්ඩලය** | : | ශාස්ත්‍රපති ගරු ආනන්ද වීරකෝන් පියතුමා,<br>කථිකාචාර්ය, දේවධර්ම නිකේතනය,<br>කුරුණෑගල ශාඛාව |
| | | ශාස්ත්‍රපති ගරු පෙරාඩ් රොසයිරෝ නි.ම.නි. පියතුමා,<br>කථිකාචාර්ය, දේවධර්ම නිකේතනය, කොළඹ 08. |
| | | ශාස්ත්‍රපති ගරු රෙජිනෝල්ඩ් ලූසන් නි.ම.නි. පියතුමා,<br>කථිකාචාර්ය, ජාතික දෙව්සත්හල, අම්පිටිය. |
| | | ශාස්ත්‍රපති ගරු ක්‍රිස්ටෝපර් බාල්රාජ් පියතුමා,<br>කථිකාචාර්ය, දේවධර්ම ශාස්ත්‍රාලය,<br>පිළිමතලාව. |
| | | ශාස්ත්‍රපති ගරු ඒ. ආර්. ලොයිඩ් ශාන්තිකුමාර් පියතුමා,<br>ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය. |
| | | ශාස්ත්‍රපති පයස් රදී යුඩොක්ෂියා පීරිස් මහත්මිය,<br>ගුරු උපදේශක, මන්නාරම අධ්‍යාපන කලාපය. |
| | | ශාස්ත්‍රවේදී එස්.ජී.කේ.ඩී.එල්.සී. ප්‍රසාද්මහත්මා,<br>ගුරු උපදේශක, හෝමාගම අධ්‍යාපන කලාපය. |
| | | ශාස්ත්‍රවේදී එන්. එෆ්. රාජයෝගිනී මෙනෙවිය,<br>ගුරු සේවය, සියලු සාන්තුවරයින්ගේ බාලිකා විද්‍යාලය,<br>කොළඹ 08. |
| | | ශාස්ත්‍රවේදී නිමාලි පෙරේරා මහත්මිය,<br>ගුරු සේවය, ශාන්ත ලෝරන්ස් විද්‍යාලය, කොළඹ 06. |
| | | ශාස්ත්‍රවේදී ගරු මරිය ශාන්තානා කන්‍යා සොයුරිය,<br>ගුරු සේවය, ශාන්ත ලුසියා මහා විද්‍යාලය, කොළඹ 13. |
| | | ශාස්ත්‍රවේදී අයි. එන්. ජේ. එස්. කෲස්<br>ගුරු සේවය, ශාන්ත සේවියර් පිරිමි ජාතික පාසල,<br>මන්නාරම |
| | | ශාස්ත්‍රවේදී ටී. අයි. රංගනායගම් මහත්මිය<br>ගුරු සේවය, ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලය,<br>කොළඹ 03 |
| **විවිධ සහය** | : | ශාස්ත්‍රපති ගරු රංජිත් ජයවීර දේවගැති තුමා<br>ශාස්ත්‍රවේදී ගරු සුරංග ද මැල් දේවගැති තුමා<br>ඒ.කේ.එස්. ඒන්ජල් මේරි මෙනවිය<br>ඒ. මැටිල්ඩා පුෂ්පරාණි මෙනවිය<br>ජී. ඩී. එෆ්. අයිරීන් මහත්මිය<br>එෆ්. ඒ. එෆ්. නිස්මියා මහත්මිය |
| **පරිගණක සැකසුම** | : | ඩී. ඒ. නිල්මිණි බටවල මහත්මිය |
| **පිටකවරය** | : | එෆ්.ඒ.එෆ්. නිස්මියා මිය<br>කාර්මික සහකාර<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සංස්කරණ සහාය** | : | ශාස්ත්‍රපති ගරු ආනන්ද වීරකෝන් පියතුමා |

# පටුන


| | පිටුව |
|---|---|
| පෙරවදන | i |
| සංඥාපනය | ii |
| අධ්‍යාපන කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවුඩය | |
| උපදේශක මණ්ඩලය හා ලේඛක මණ්ඩලය | iv |
| විස්තරාත්මක විෂය නිර්දේශය | 1 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය | 196 |

**නිපුණතාව 6.0** : **කිතුනු ශිෂ්ටාචාරයක් ගොඩනැගීමට මූලික වූ ශිෂ්ටාචාරයන් අධ්‍යයනය කොට යහපත් ජීවිත පැවැත්මකට පසුබිම සකසා ගනියි.**

**නිපුණතා මට්ටම 6.1** : ශිෂ්ටාචාරයේ ස්වභාවය අධ්‍යයනය කරයි.

**කාලය** : කාල පරිච්ඡේද 04

**ඉගෙනුම් ඵල** :

- ශිෂ්ටාචාරය හැදෑරීම තුළින් අතීතය දැනගැනීමට පමණක් නොව වර්තමාන සමාජය අවබෝධ කර ගැනීමට හැකියාව ලැබීම.
- වර්තමාන සමාජයේ ජයග්‍රාහී සාමාජිකයෙකු ලෙස ජීවත් වීමට උපකාරී වීම.
- ශිෂ්ටාචාරය හා සංස්කෘතිය අතර ඇති වෙනස හා සම්බන්ධතාව පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම.
- ශිෂ්ටාචාරයේ ලක්ෂණ හා එමගින් ලෝකයට ලැබුණු දායාද හඳුනා ගැනීම.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 6.1.1 ශිෂ්ටාචාරය නිර්වචනය කිරීම

- Civitas යන ලතින් වචනයේ ඉංග්‍රීසි අරුත Citizen යන්නයි. එහි සිංහල අරුත පුරවැසියාය. පුරවැසියා හා බැඳුණු වචනයක් ලෙස ශිෂ්ටාචාරය civilization දැක්විය හැකි ය.
- විනය ගරුක වීම, ශීලාචාර වීම, සිරිත් විරිත් පිළිපැදීම වැනි ක්‍රියාවලීන් සහිත ව මිනිසා සදාචාරාත්මක ජීවිතයකට පරිවර්තනය වීම ශිෂ්ටාචාරයයි.
- නව ශිලා යුගය අවසාන වන විට මිනිසා ස්ථිර වාසස්ථානවල වෙසෙමින් ද, සතුන් ඇතිකරමින්ද, ගොවිතැන් හි යෙදෙමින් ද ලෝහ භාවිත කරමින් ද ජීවත් විය.
- මේ අතර ලෝකයේ ගංගා කීපයක් ආශ්‍රිත ව විසූ සමහර ජනයා පිළිස්සූ ගඩොලින් තැනූ අලංකාර නිවාසවල වෙසෙමින්, වෙළෙඳාම ජීවනෝපාය කරගනිමින් ලිවීමට හා කියවීමට පුරුදු වෙමින්, ගමනාගමන පහසුකම් යොදා ගනිමින්, දියුණු සංස්කෘතියකට ද දියුණු තාක්ෂණයකට ද උරුමකම් කියමින් ජීවත් වූහ. එම ශිෂ්ටාචාර නාගරික ශිෂ්ටාචාර විය. මෙවන් තත්ත්වයක් යටතේ යම් කණ්ඩායමකට අතිරික්ත ආහාර නිෂ්පාදනයකට අවස්ථාව ලැබුණි. ඒ නිසා සෙසු ජනයාට තම ආහාර නිෂ්පාදනය සඳහා වැය වූ කාලය වෙනත් කර්මාන්ත, නිෂ්පාදන, කලා ශිල්ප හා නිර්මාණ කෙරෙහි යෙදවීමට ඉඩකඩ ලැබුණි. මෙම තත්ත්වය ශිෂ්ටාචාර බිහිවීමටත් වර්ධනය වීමටත් හේතු විය.
- යම්කිසි සමාජයක පුද්ගලයෙකුගේ සිරිත් විරිත්, සම්ප්‍රදායන් සමුදායේ එකතුව සංස්කෘතියයි.

### 6.1.2 ශිෂ්ටාචාරයේ ලක්ෂණ හඳුනාගැනීම

* නීති පද්ධතියක් තිබීම.
* පාලන ක්‍රමයක් පැවතීම.
* ආගමික ඇදහිලි හා විශ්වාසයන් පැවතීම.
* ආර්ථික ක්‍රමයක් සහිත ජීවනෝපාය මාර්ගයක් තිබීම.
* සංස්කෘතිය සමඟ ඉතා කිට්ටු බැඳීමක් පැවතීම.
* ශිෂ්ටාචාරය තුළින් සංස්කෘතිය බිහි වීම
* ශිෂ්ටාචාරයන් කාලයෙන් කාලයට විවිධ හේතු සාධක නිසා වෙනස් වීම.

- පාලන කටයුතු, ආගමික සිතුම් පැතුම්, ගෘහ නිර්මාණය, කලා නිපැයුම්, ගමනාගමනය, වෙද හෙදකම් ආදී කටයුතු ගැන වඩාත් උනන්දුවක් දැක්වීම නිසා මිනිසුන් උසස් ශිෂ්ටාචාරයන් තුළින් ලෝකයට විවිධ දෑ දායාද කළහ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 - ශිෂ්ටාචාරය හා සංස්කෘතිය යන පද නිර්වචනය කරමින් ඒවා අතර ඇති සම්බන්ධය සාකච්ඡා කිරීම.

පියවර 2 - ශිෂ්ටාචාරයේ ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කිරීම.

පියවර 3 - ශිෂ්ටාචාරය අපගේ ජීවිතවලට සම්බන්ධවන ආකාරයත් ශිෂ්ටාචාරය නිසා ලෝකයට ලැබුණු දායාද ගැනත් සාකච්ඡා කිරීම.

**නිපුණතාව 6.0 : කිතුනු ශිෂ්ටාචාරයක් ගොඩනැගීමට මූලික වූ ශිෂ්ටාචාරයන් අධ්‍යයනය කොට යහපත් ජීවිත පැවැත්මකට පසුබිම සකසා ගනියි.**

**නිපුණතා මට්ටම 6.2 :** කිතුනු ශිෂ්ටාචාරයට පදනම සකසන ශිෂ්ටාචාරයන් පිළිබඳව ක්‍රමානුකූලව විමසා බලයි.

**කාලය :** කාල පරිච්ඡේද 45

**ඉගෙනුම් ඵල :**

- බටහිර ආසියානු ජුදෙව් සංස්කෘතිය පිළිබඳ ව අවබෝධ කර ගනියි.
- ක්‍රිස්තියානි සංස්කෘතියේ ඓතිහාසික පසුබිම හා භූගෝලීය පසුබිම පිළිබඳ කරුණු සොයා ගනියි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 6.2.1 අපරදිග ආසියාතික හා සෙමිටික් ශිෂ්ටාචාරයන්

**ජුදෙව් සංස්කෘතිය**

- ගැළවීමේ ඉතිහාසය ආරම්භ වූයේ ආබ්‍රහම් ආදී පීතෘවරයාගෙන් යැයි පැවසුණ ද, සත්‍ය වශයෙන්ම එය ඇරඹුණේ ක්‍රි. පූ. 2000 ට පෙර ය.
- මෑත කාලීන සොයාගැනීම් හා ඉතිහාසඥයන්ගේ මත අනුව වර්ෂ 700,000කට පමණ පෙර මිනිසා ජීවත් ව සිටි බව දැක්වේ.
- මෙවැනි වසර ගණනාවකට පෙර මිනිසා ජීවත් වූයේ යැයි පැවසුණ ද මිනිසාගේ ශිෂ්ටාචාරය පිළිබඳ ව අවධානය යොමු කෙරුණේ ක්‍රි.පූ. 8000 පමණ සිට ය.
- එසේ ජීවත් වූ මිනිස්සු සමූහ වශයෙන් ගංගා ආශ්‍රිත ප්‍රදේශවල කුඩා පැල්පත් තනාගනිමින් දිවි ගෙවූහ.
- මැද පෙරදිග රටවල ද මධ්‍යධරණී මුහුද ආශ්‍රිත ප්‍රදේශවල ද ජනයා දිවි ගෙවූහ.
- යුප්‍රටීස් ටයිග්‍රිස් ගංගා නිම්න ආශ්‍රිත ප්‍රදේශවල ආහාර ලබාගැනීම සඳහා කෘෂිකාර්මික කටයුතු මුල්වරට ඇරඹිණ.
- යුප්‍රටීස් ටයිග්‍රිස් ගංගා නිම්න ආශ්‍රිත ප්‍රදේශයේ ප්‍රධාන නගරය වූ මෙසපොතේමියාවේ ඌර් නම් නගරය තුළ දිවිගෙවන විට දෙවියන් වහන්සේ විසින් ආබ්‍රහම් කැඳවනු ලැබීය. (ක්‍රි.පූ.1800 පමණ)
- එවකට මෙසපොතේමියානු ප්‍රදේශවල පැවතියේ එඬේරික සංස්කෘතියකි.
- ආබ්‍රහම්ගේ වංශය වර්ධනය වී, ජෝසෙප්ගේ කාලයේ දී ජනයා මිසර ප්‍රදේශයට සංක්‍රමණය විය. (විශේෂයෙන් ගෝෂෙන් නම් ප්‍රදේශයට - ක්‍රි.පූ. 1720 - 1550)

- මෙකල මිසරයේ පැවති සංස්කෘතිය හොඳින් වර්ධනය වූවකි. ඒනිසා එහි බලපෑම් ඉශ්රායෙල්වරුන් කෙරෙහි දක්නට ලැබිණ.
- මිසරයේ වහල්කමින් විමුක්තිය ලැබූ ඉශ්රායෙල්වරුන් කානාන් දේශයට පැමිණි අතර, එහිදී ඔවුහු රාජ්‍යයක් ලෙස සංවිධානය වූහ.
- මෙකල විවිධ සංස්කෘතීන් බිහි විය. එනම් මෙහිදී පැවති රාජ්‍යය තුළ ජුදා සංස්කෘතියේ කැපී පෙනෙන වර්ධනයක් සිදු විය.

**ආසියානු සංස්කෘතිය**

- අසිරියානු හා බබිලෝනියානු විප්‍රවාසය තුළ වසර 200කට ආසන්න කාලයක් එම අධිරාජ්‍යවල සංස්කෘතීන් වැඩි වර්ධනය විය. (ක්‍රි.පූ. 1100) ඒවායේ බලපෑම අන් රටවල සංස්කෘතීන් කෙරෙහි දක්නට ලැබිණ.
- සංස්කෘතික තොටිල්ල යන නමින් බබිලෝනියාව හැඳින්විය හැකි වනුයේ මේ නිසාය. බබිලෝනියානු ආගමික විශ්වාසය, ඔවුන්ගේ ලේඛන කලාව, සාහිත්‍යය හා ව්‍යවස්ථාව මගින් ඇතිකරන ලද බලපෑම පැරණි ගිවිසුම තුළ දක්නට ලැබේ.
- පර්සියාව ක්‍රි.පූ.550 - 529 දක්වා කාලය තුළ සයිරස් රජතුමන් යටතේ බටහිර ආසියාවේ ඉතා බලවත් රාජ්‍යයක් බවට පත් ව තිබිණ.
- ජුදා සංස්කෘතිය තුළ මේ සියලු අධිරාජ්‍යයන්ගේ බලපෑම (සංස්කෘතිවල) එනම් මෙසපොතේමියානු, අසිරියානු, සුමේරියානු හා බැබිලෝනියානු බලපෑම දක්නට ලැබිණ.
- සයිරස් රජු අත්පත් කරගත් ප්‍රදේශයේ පැවති ආගමික චාරිත්‍ර, නමස්කාර පිළිවෙත් හා සම්ප්‍රදායයන් ගරුත්වයෙන් සැලකීය.
- ක්‍රි.පූ. 589 දී සයිරස් රජු බබිලෝනිය අත්පත් කරගත් පසු ක්‍රි.පූ. 538 දී ඉශ්රායෙල්වරුන්ට තම දේශය බලා යෑමට අවසර දුන් අතර, පෙරුසලමේ දේවමාලිගාවට අයත් වස්තූන් නැවත සිය රටට ගෙනයාමටත්, පෙරුසලමේ දේවමාලිගාව නැවත ගොඩනගන්නටත් ඔවුනට අවසර ලැබිණ.
- සයිරස් රජුගේ කාලයේ දී පටන් මෙලෙස බටහිර ආසියානු සංස්කෘතික බලපෑම ජුදා සංස්කෘතිය කෙරෙහි ආභාෂයක් දැක්වීය.

**බටහිර සංස්කෘතිය**

- පර්සියානු අධිරාජ්‍යයට පසු ඉශ්රායෙල් රාජ්‍ය කෙරෙහි අණසක පැතිරවූයේ ග්‍රීක් අධිරාජ්‍යයයි.
- ග්‍රීක සංස්කෘතිය යුරෝපීය සංස්කෘතියේ වර්ධනයට පවා බලපෑම් ඇති කරන ලදී.
- ක්‍රි.පූ. 336 දී මහා ඇලෙක්සැන්ඩර් අධිරාජයා බටහිර රටවල් අත්පත් කරගනිමින් ග්‍රීක අධිරාජ්‍යය ස්ථාපිත කළ අතර, ක්‍රි.පූ.333 දී ඉශ්රායෙල් දේශය ග්‍රීක අධිරාජ්‍යයට නතු කරගන්නා ලදී.
- ග්‍රීක සංස්කෘතිය තුළ මුල්බැසගත් දර්ශනවාදය, ගණිතය, භූගෝලය, සාහිත්‍ය, චිත්‍ර කලාව ආදිය මගින් ජුදා සංස්කෘතියට විශාල බලපෑම් ඇතිවිය.

- ක්‍රි.පූ.1175 - 1164 දක්වා අන්තියෝකස් එපිෆානස්ගේ පාලන සමයේ දී අධිරාජ්‍යය මුළුමනින්ම ග්‍රීක් ආභාෂයට නතු විය.

- මෙය මකබි යුද්ධයට මඟ පෑදීය.

- ක්‍රි.පූ.98 - 63 දක්වා සෙලුසිද්වරුන්ගේ පාලනය පැවතිණි.

- ක්‍රි.පූ. 63 දී පොම්පේ නමැති ආණ්ඩුකාරයා යටතේ ඉශ්රායෙල් දේශය රෝම පරිපාලනයට පත් වූ අතර, එතැන් සිට ග්‍රීක පරිපාලනයෙන් ඔවුන් අත්මිදිණ. එසේ වුව ද මෙම රෝම පාලනය යටතේ ද ජුදා සංස්කෘතිය තුළ ග්‍රීක ආභාෂය දක්නට ලැබිණ.

- රෝම අධිරාජ්‍ය යුගයේ දී බටහිර ආසියානු රටවල කිතු දහම බිහිවීමට මංපෙත් විවර වූ අතර බොහෝ සංස්කෘතීන්ගේ ආභාෂය ලැබ වර්ධනය වූ ජුදා සංස්කෘතියේ ආභාෂය එම කිතුදහම සමඟ බැඳී වර්ධනය වූ කිතුනු සංස්කෘතිය කෙරෙහි බෙහෙවින් බලපෑ බව ප්‍රකාශ කළ හැකි ය.

**නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරය**

- නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරය ඉතා පැරණි ශිෂ්ටාචාරයකි. ක්‍රි.පූ. 3300 - ක්‍රි.පූ. 1070 වන තෙක් මෙම නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරය පරිපාලනමය, ආර්ථිකමය, සමාජමය හා සංස්කෘතිකමය වශයෙන් ඉතා උසස් මට්ටමක පැවති බවට සාක්ෂි තිබේ.

- නයිල් නදිය අප්‍රිකාවේ වික්ටෝරියා දිය ඇල්ලෙන් ආරම්භ වී මිසර දේශය හරහා ගලාගොස් මධ්‍යධරණී මුහුදට වැටේ.

- මිසරයේ නැගෙනහිර පසින් රතු මුහුද පිහිටා ඇත. එකල ඉන්දියාව, ශ්‍රී ලංකාව හා චීනය වැනි රටවලින් සුවස් ඇල හරහා පැමිණි වෙළෙඳුන් නිසා නැගෙනහිර හා බටහිර රටවල් අතර වෙළෙඳ කටයුතු වර්ධනය විය. මෙහිදී වෙළෙඳ මධ්‍යස්ථානය වූයේ මිසරයයි.

- නයිල් ගංගා නිම්න ආශ්‍රිත ප්‍රදේශය සරු පසකට හිමිකම් කියූ බැවින් එහි බාර්ලි, තිරිඟු, මිලට් වැනි ධාන්‍ය මනාව වගාකළ හැකි විය.

- ක්‍රි.පූ.3000 දී පමණ මිසරයේ උතුරු හා දකුණු වශයෙන් තිබූ ප්‍රදේශ නැවත එක් ප්‍රදේශයක් බවට පත් කරන ලදී. ක්‍රි. පූ. 2600 දී මෙම නයිල් ගංගා නිම්න ආශ්‍රිත ප්‍රදේශය එක් පාලන ඒකකයක් බවට පත් විය.

- 3 වන තුන්මෝස් මෙහි පාලකයා වූ අතර ඉන්පසු රාම්සෙස් 20 වන පාරම්පරික පාලකයා විය. මිසරයේ පාලකයන්/රජවරුන් පාරාවෝ යන පොදු නමින් හඳුන්වන ලදී.

- පාලන අධිකාරීත්වය දෙවියන්ගෙන් ලැබූ දායාදයක් බව මිසරවරුන්ගේ විශ්වාසය වූ නිසා ලෞකික හා ආධ්‍යාත්මික යන දෙඅංශයේ ම පාලකයා රජු වශයෙන් පිළිගන්නා ලදී.

- පාලන අධිකාරිය සමන්විත වූයේ රජු ප්‍රමුඛ මන්ත්‍රීවරුන් හා පූජකවරුන් ගෙනි.

- පරිපාලනය, ආගම, ආර්ථිකය හා කළමනාකරණය වශයෙන් පාලකයන්ගේ පාලන බලතල විවිධ විය.

- පාලන බලය පියාගෙන් පුතුට උරුම වූ අතර පුතකු නොමැති අවස්ථාවේ දියණියකට පාලන අධිකාරීත්වය හිමි විය.
- පැපිරස් පත්වල අක්ෂර ලිවීම ආරම්භ කරන ලදී.
- දෙවිවරුන් හා යක්ෂයන් ගැනත්, ඔවුන්ගේ හැකියාවන් හා ඔවුන් සමඟ සම්බන්ධ වන ආකාරයත් අවමංගල්‍ය හිමිකම් හා අවමංගල අවස්ථාවල කිවයුතු මන්ත්‍ර ලියා ඇති පැපිරස් පත් හමු වී තිබේ.
- මරණින් පසු ජීවිතයක් ඇති බව විශ්වාස කළේ මෙම නයිල් ගංගා නිම්න ආශ්‍රිත ප්‍රදේශවල වැසියන් ය. ඔවුහු මේ උදෙසා පිරමීඩ ගොඩනැගූහ.
- ගොඩනැගිලි නිර්මාණ ශිල්පය, මූර්ති කලාව, චිත්‍ර කලාව හා රූපාක්ෂර වර්ධනය වූයේ මෙම ශිෂ්ටාචාරය තුළිනි.
- ගණිතය, වෛද්‍ය විද්‍යාව, ජ්‍යොතිෂය මේ යුගයේ වර්ධනය වූ තවත් අංශ වූ අතර, ධාන්‍ය මැනීම හා ගබඩා කිරීම සිදුකිරීම සඳහා අවශ්‍ය වර්ග ප්‍රමාණය මැනීමට ද ගොඩනැගිල්ලක් සෑදීම සඳහා අවශ්‍ය ගල් ප්‍රමාණය සෙවීමට ද ගණිතමය සංකල්ප භාවිත කරන ලදී. එමෙන්ම මෙකල වසර, මාස, දින වකවානු ගණනය කිරීමට ද ගණිතමය සංකල්ප භාවිත විය. කොහොඹ තෙල්, රටඉදි හා අත්තික්කා ආදී දෑ ඖෂධ වශයෙන් භාවිත විය.

**යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා නිම්න ශිෂ්ටාචාරය**

- වර්තමානයේ මැදපෙරදිග ඉරාකය නමින් හඳුන්වන ප්‍රදේශය එකල මෙසපොතේමියාව විය.
- ක්‍රි.පූ. 3000ට පෙර පටන් පැවති මෙම ප්‍රදේශය සංස්කෘති තොටිල්ල නමින් හැඳින්වේ.
- පර්සියානු බොක්කෙන් මුහුදට ගලා බසින යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා අතර මෙම ප්‍රදේශය භූගෝලීය වශයෙන් පවතී.
- ඌර්, නිපූර්, ශිෂ්, ලාගාස් යන නගර මේ ශිෂ්ටාචාරය තුළ වර්ධනය වී ඒවා රාජ්‍ය ලෙස පසුව වර්ධනය විය.
- මෙසපොතේමියාවේ පාලකයා විසින් මේ මුළු ප්‍රදේශයම පාලනය කරන ලදී.
- රජතුමා හට පාලන බලය ලැබෙන්නේ දෙවියන්ගෙන් යැයි ඔවුහු විශ්වාස කළහ.
- මෙසපොතේමියාවේ මූර්ති කලාව තුළ හමුරාබි නමැති පාලකයාට සූර්ය දෙවියා මුදුවක් හා යෂ්ටියක් පිරිනමන මූර්තියක් දක්නට ලැබේ.
- පාලනයට අවශ්‍ය මුදල් බදු අයකිරීම මගින් ලබාගන්නා ලදී.
- හමුරාබිවරුන් අතිදක්ෂ පරිපාලකවරුන්, යුධකාමීන් මෙන් ම දක්ෂ නීතිවේදීන් ද විය. ඔවුන් විසින් බොහෝ නීති සෑම අංශයක් වෙනුවෙන් ම සකසන ලදී. ඒවා හමුරාබී නීතිය ලෙස හැඳින්විණ.
- ගොවිතැන, සත්ත්ව පාලනය ආදිය ඔවුනගේ ප්‍රධාන ආර්ථිකමය කටයුතු විය.
- මුල්වරට කාසි භාවිතය හඳුන්වා දුන්නේ මේ අය ය. (මෙසපොතේමියානුවන්)

- භාණ්ඩ හුවමාරුවට වඩා ක්‍රමවත් හුවමාරු මාධ්‍යයක් වශයෙන් මුදලේ වටිනාකම ඉස්මතු කරන ලද්දේ මොවුන් විසිනි.

- මෙසපොතේමියානු ජනතාව තුළ දෙවි දේවතාවුන් පිදීම සුලභව දක්නට ලැබිණි. ඒ දෙවි දේවතාවුන් අතර මාඩුක්, සින්, සමස් ආදීන්ට විශේෂ තැනක් ලැබිණ. මෙම දෙවිවරුන් ඔවුන් සිතුවමට නගන ලද්දේ දිග රැවුල් සහිත බුද්ධිමතුන් ලෙසත්, සූර්යයා හා චන්ද්‍රයාත් ලෙස ය.

- සෑම පුද්ගලයෙකුටම අනන්‍ය වූ දෙවිවරුන් සිටියේය. ඔවුන්ගේ ප්‍රබල විශ්වාසයක් නම් දෙවිවරුන්ට මිනිසා ගළවා ගත හැකිය යනුයි.

- යක්ෂයින් මිනිසාට උපද්‍රව පමුණුවන අය ලෙසත්, ඔවුන් පාලනය කිරීමට පූජකවරුන්ට බලය දී ඇති බවත් විශ්වාස කරන ලදී.

- ඌර් නමැති නගරයේ තිබූ විශාල ගොඩනැගිල්ල සිගුරට් නමැති විශාල දෙව්මැඳුරයි.

- ලේඛනය සඳහා විශාල මැටිවලින් තැනූ පුවරු භාවිත කරන ලදී.

- ඔවුන්ගේ අක්ෂරවල රූප තිබූ අතර ඒ සඳහා අර්ථයන් ද තිබිණ. නිදසුනක් ලෙස තාරකා, දෙවිවරුන් සංකේතවත් කිරීමටත්, පාදය, ගමන් සංකේතවත් කිරීමටත් යොදා ගන්නා ලදී.

- දින දර්ශන හඳුන්වා දෙන ලද්දේ මේ අය විසිනි.

- මුලින් ම ලෝක සිතියම සකස් කළේද මොවුන්ම ය. රෝද භාවිතයේ ද මොවුන් පුරෝගාමීන් විය.

- සිහින අර්ථකථනය මේ අය විසින් කළ වැදගත් කාර්යයකි.

- මෙසපොතේමියානු වෛද්‍ය වෘත්තිය දෙවිවරුන් යක්ෂයන් හා ආත්ම සම්බන්ධ වූ දෙයක් විය. මොවුන් රෝග සුවකළේ විජ්ජාකාරී බලයක් යොදා ගනිමිනි.

- 600ක් පමණ ශාඛ වර්ග ඖෂධ ලෙස යොදා ගැණින.

- එල්ලෙන මල් උයන ඔවුනගේ ඉතා වැදගත් උද්භිද උද්‍යානයකි.

### 6.2.2 බයිබලීය භූගෝලීය පසුබිම

- ශු. බයිබලයේ පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ හරය පලස්තීනය වේ.

- මෙය විශාල භූමි ප්‍රදේශයක් තුළ තිබූ ඉතා කුඩා රටකි.

- අවට තිබූ අධිරාජ්‍යයන්ගේ ආභාෂය ලැබ පෝෂණය වූ රටකි. පර්සියානු බොක්කෙන් ආරම්භව ඉරාකය හරහා මධ්‍යධරණිය මායිම් කොටගෙන සෑදෙන සශ්‍රීක අඩසඳක හැඩය ගත් භූමි ප්‍රදේශයක් විය. ඒ අවට තිබූ නිසරු කාන්තාරය සහ අඩසඳක හැඩ ගත් මෙම සශ්‍රීක භූමිභාගය අතර වෙනසක් දක්නට ලැබිණ. එම සශ්‍රීක අඩසඳ ප්‍රදේශයේ සාරවත් බවින් අඩු වඩාත් කුඩා ප්‍රදේශය පලස්තීනයයි.

- ශුද්ධ බයිබලයේ භූගෝලීය පසුබිම දැනගැනීමට මෙසපොතේමියා, ඒදොම්, මෙවාබ්, මිසරය, කානාන් දේශය, පිලිස්තිය දේශය, අසිරියාව, බැබිලෝනියාව, පර්සියාව වැනි රටවල් උපකාරී වේ.

- මෙසපොතේමියාව (වත්මන එයට භාවිත වන්නේ ඉරාකය යන නාමයයි) යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා නිම්න ප්‍රදේශයේ පිහිටි නගරය මෙයයි. සෙමිතික් ජාතියට ම අයත් අකාඩියා නම් ජන වර්ගය මෙහි ජීවත් වූහ. මෙසපොතේමියාව ලෙස හැඳින්වීමට හේතුව ගංගාවන් 2 ක් අතර පිහිටා තිබීමයි. මෙසපොතේමියාවේ ප්‍රදේශ කීපයකම ස්වයං පාලනයක් තිබිණ. එවිට, සෙමිතික් ජාතික අය එහි දී අමෝරිවරුන් ලෙස හඳුනාගන්නා ලදී.

- ඒදොම් හා මෝවබ්

  ඒදොම් දේශය ඉතා උස් වූ සානුවකි. එය සෙරෙද් ගංගාවට දකුණු දෙසින් මුහුදු මට්ටමට වඩා අඩි 5000ක් පමණ උසින් පිහිටා ඇත. ඒදොම් වඩාත් තෙතමනය සහිත දේශයක් වන අතර එහි බටහිර දිශාව පඳුරුවලින් ගහනව පවතී. මෙහි උස්බිම් රතු වැලි ගල්වලින් සැදී තිබිණ. පෙට්රා නගරය මෙයට නිදසුනකි. ප්‍රධාන ජීවිකාවන් වශයෙන් කෘෂිකර්මය හා සත්ත්ව පාලනය කැපී පෙනේ. එසේම ඔවුහු කඳුවලින් තඹ ලබාගැනීම, ගැල්කරුවන්ගෙන් බදු අයකිරීම වැනි කටයුතු මගින් සිය ආර්ථිකය ගොඩනගා ගත්හ. ක්‍රි.පූ.604 දී ඒදොම් බැබිලෝනි අධිරාජ්‍යයට යටත් විය. ඉන්පසු කාලීනව මොවුන් ඉදුමීයවරුන් ලෙස හඳුන්වනු ලැබීය.

  මෝවබ් දේශය මළ මුහුදේ නැගෙනහිර සීමාවේ පිහිටා ඇත. එහි ප්‍රධාන නගරය කීර් - හසෙරෙත් (වත්මන් ඉරාකය) ය. මෙම නගරය කන්දක පිහිටා ඇති අතර ඉතා අලංකාර ස්වාභාවික බලකොටුවකි. මෙම දේශයේ සත්ත්ව පාලනය ද, එක් පසෙක තිරිඟු හා බාර්ලි වගාව ද සිදු කරන ලදී. ජාතිය, සංස්කෘතිය, භාෂාව අතින් ඒදොම්වරුන් සහ මෝවබ්වරුන් හා අම්මොන්වරුන් සහ හෙබ්‍රෙව්වරුන් (ඉශ්‍රායෙල්වරුන්) සමඟ සබඳතාවක් ඇති ව මෙම ප්‍රදේශවල දිවි ගෙවීය.

- මිසරය

  මධ්‍යධරණී මුහුදට පහළින් නයිල් ගඟ ආශ්‍රිතව මෙම නගරය පිහිටා ඇත. වර්තමාන සුඩානය පිහිටා ඇත්තේ මෙම ප්‍රදේශය තුළ ය. ආරම්භක යුගයේ ඉහළ මිසරය (ඊජිප්තුව) හා පහළ මිසරය (ඊජිප්තුව) වශයෙන් කොටස් 2කට බෙදී තිබිණ. පසුව මෙම්පීස් නමැති නගරය වශයෙන් මේ නගර 2 එක්කොට මේක්ස් නමැති පාලකයා එහි රජ විය.

- කානාන් දේශය

  බටහිර ජෝර්දානයේ පිහිටි නගරයකි. පසුකාලීනව ජෝර්දානයේ බටහිර තිබූ පලස්තීනයත්, සිරියාවේ සමහර ප්‍රදේශත්, පෙනීතිය නම් මුහුද ආශ්‍රිත ප්‍රදේශයත් එක් ව මෙය විශාල රටක් බවට පත් විය.

  කානාන් දේශය ගැන කතාකිරීමේ දී මෙය කිරියෙන් හා පැණියෙන් ඉතිරී යන දේශය වශයෙන් මෙය හඳුන්වයි. එයට හේතුව මෙම දේශයේ පොළොව කෙදිනකවත් සම්පත්වලින් ඌන නොවීමයි.

- පිලිස්තිය

  ගාසා, ශේදොද්, අශ්කෙලෝන්, එකෙදුන් හා ගාත් මෙහි ප්‍රධාන පංච මහා නගර වේ. ක්‍රි.පූ. 1240 දී මධ්‍යධරණී මුහුද අවට දූපත්වලින් පැමිණි (ක්‍රීටය, සයිප්‍රස්, සරදේනියාව, සිසිලිය වැනි) ජන කොටස් මෙහි මුහුදු තීරයේ දකුණු භාගය අල්ලාගෙන එහි පදිංචි වූහ. ඔවුහු ද යුධකාමීන් වූහ. පසුකාලයේ පිලිස්තිවරුන් යැයි නම් ලැබුවේ ඔවුන් ය.

  ඔලීව් හා ධාන්‍ය වගාවන් පිලිස්තියේ ප්‍රධාන භෝග බවට පත්විය. ක්‍රි.පූ. 3 වන ශතවර්ෂයේ දී කානාන් දේශය අත්පත් කරගත් ග්‍රීක්වරු මෙම පිලිස්තිය ඇතුළු සියලුම ප්‍රදේශවලට පලස්තීනය යැයි නම් තැබූහ.

- අසිරියාව

  ටයිග්‍රීස් ගඟ අසබඩ හා සාක්‍රොස් කඳු පාමුල පිහිටි නගරයකි. වර්තමානයේ ඉරාකයේ බටහිර ප්‍රදේශය මෙයට අයත් ය. මෙහි බහුලව දක්නට ඇත්තේ කාන්තාරයයි. අසීර් නමැති දෙවියාගේ නමින් මෙම නගරය නම්කර ඇත. මෙහි අගනුවර නිනීමය යි.

- බබිලෝනියාව

  බබිලෝනියා යනුවෙන් ව්‍යවහාර වන්නේ ස්වර්ගීය දොරටුවටයි. ග්‍රීක බසින් එය දෙවියන්ගේ දොරටුව ලෙස ද හැඳින්වේ. යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා අතර පිහිටි මෙසපොතේමියා ප්‍රදේශය පසුකාලීනව බබිලෝනිය යනුවෙන් නම් කරන ලදී. බයිබලයේ එය කල්දිවරුන්ගේ දේශය නමින් සඳහන් වේ. එහි සඳහන් අන්දමට මෙම රාජ්‍යයේ අගනුවර සීනාර් ය.

- නව ගිවිසුමේ පලස්තීනය

  පලස්තීන ප්‍රදේශයේ පිහිටා ඇති කඳු පදනම් කරගෙන මෙය කොටස් කීපයකට බෙදිය හැකිය. මෙහි ඇති වූ භූමිකම්පාවක් හේතුකොට ගෙන කි.මී. 480 ක් දිග ජෝර්දාන් බෑවුම ඇති විය. මේ බෑවුම මුහුදු මට්ටමේ සිට අඩි 3000 ක් පමණ ගැඹුරු ය. එය කි.මී. 46 ක් පළල් ය. මේ බෑවුම පදනම් කරගෙන ජෝර්දාන් ගඟෙන් බටහිර හා නැගෙනහිර වශයෙන් කොටස් 2කට බෙදාලයි.

**ජෝර්දන් ගඟෙන් බටහිර දෙසට ඇති ප්‍රදේශ**

- වෙරළ තීරය

  මෙය ඇලෙක්සැන්ඩ්‍රියා ප්‍රදේශයේ සිට වාඩි - අල් - අරිස් ප්‍රදේශය දක්වා ව්‍යාප්තව පවතී. කි.මී. 32 ක් පමණ පළල ය. මෙය ජෝර්දාන් සමභූමිය ලෙස හැඳින්වේ. මෙම ප්‍රදේශය තුළ ශාරොන් පිලිස්තිය හා එස්ත්‍රිලෝන් නමැති සමභූමි 3 ක් දැකිය හැකිය. ෂාරොන් භූමිය දකුණේ ජොප්පාවේ සිට උතුරේ කිඹුල් ගංගාව ලෙස හඳුන්වන සාකෝර්ලිප්නාත් යන ප්‍රදේශය දක්වා කි.මී. 64 ක් පමණ දිගට විහිදෙන තෙත් භූමියකි.

- පිලිස්තිය සමභූමිය

  ජොප්පාවට දකුණෙන්, ඊජිප්තුවේ (මිසරයේ) සීමාව දක්වා ව්‍යාප්ත වී ඇත. මෙය තැනිතලාවකි. ඔලිව් ගස් හා ධාන්‍ය වර්ග මැනෙවින් වැවෙන ප්‍රදේශයකි.

- එස්ත්‍රලෝන්

  පලස්තීනයේ මධ්‍යයේ පිහිටි කඳුවැටිය එස්ත්‍රලෝන් සමභූමිය කොටස් 2කට වෙන්කරනු ලබයි. දකුණේ සිට උතුර දක්වා කි.මී.22.4 ක් දිග වන අතර, නැගෙනහිර සිට බටහිර දක්වා කි.මී. 32ක් පළල වේ.

- පලස්තීන කඳුවැටිය

  වෙරළ තීරයට පසු අපට හමුවන්නේ උතුරේ සිට දකුණට විහිදෙන කඳුවැටි පෙළකි. මෙම කඳුවැටි පෙළ කොටස් 4කට බෙදිය හැකිය. ඒවා නම් ගලීලය, සමාරිය, ජුදය හා නෙගෙබ් ය. (දකුණ)

- ගලීලය

ගලීලය ඉහළ හා පහළ වශයෙන් කොටස් 2කට බෙදේ. ගලීලයේ උසම ස්ථානය ජෙබර්යාමුක් ය. එය මුහුදු මට්ටමේ සිට අඩි 4000ක් පමණ උස වේ. ජේසුස් වහන්සේගේ කාලයේ දී මෙය අති වැදගත්කමක් ඉසිලූ අතර, නාසරෙත් නම් කේන්ද්‍රස්ථානය පිහිටියේ මෙහි ය.

ජේසුස් වහන්සේගේ කාලයේ දී මෙයට නාසරෙත්, කානා, තාබෝර් කඳු, නායින්, ගලීලයේ මුහුද, කපර්ණාවුම, තිබේරියස්, මග්දලා, බෙත්සයිදව යන ප්‍රදේශ ඇතුළත් විය. තද සුළං හමන මෙම ප්‍රදේශයට අධික වර්ෂාපතනයක් ලැබේ. මෙය ඉහළ කොටස වීම එයට හේතුවයි. පහළ ගලීලය මුහුද මට්ටමේ සිට අඩි 2000ට අඩු උසින් යුත් කඳුවැටිවලින් සමන්විත වේ. එහි ඇත්තේ වගාවට අති යෝග්‍ය වූ සරු පසකි. එම නගරවැසියන් විසින් සත්ත්ව පාලනය ද කරන ලදී. පහළ ගලීලයේ නුවරවල් වශයෙන් නාසරෙත් හා කානා නුවර ඉතා වැදගත් වේ. නව ගිවිසුම කාලයේ මෙම ප්‍රදේශයේ තිබූ ප්‍රධාන නගරය සෙප්පෝරිස් විය. මෙම සෙප්පෝරිස් නගරය දිස්ත්‍රික්කයේ අගනුවර ද විය.

- සමාරිය

ගලීලය හා ජුදය අතර ඇති කඳු පෙදෙස සමාරියයි. නැගෙනහිර සිට බස්නාහිරටත්, උතුරින් දකුණට ද දිග කි.මී. 32 ක් වේ. මෙම කඳුවැටිය සෘජුකෝණාස්‍රාකාර වේ. මෙයට නැගෙනහිරින් ජෝර්දාන් ගඟ ද, බස්නාහිරින් මධ්‍යධරණී මුහුද ද පිහිටා ඇත. මේ ප්‍රදේශයේ ඒබාල් කඳු හා ගෙරසීම් කන්ද ද පිහිටා ඇත. මුහුදු මට්ටමේ සිට අඩි 3000 ක් උස ය. ඒප්‍රායිම් හා මනස්සේ ගෝත්‍රවල නිජබිම ලෙස ද හඳුන්වන්නේ සමාරියයි. බෙතෙල්, ජීලෝ, ජෙකෙම්, තිර්සා, සමාරියාව හා දොතාන් නගර සමාරියට අයත් නගර වේ. මෙම නගරයේ ඉතා සරු පසක් ඇති අතර, කෘෂිකර්මාන්තය එහි සරුවට කරනු ලබයි. එහි ප්‍රධාන වගාවන් වූයේ ඔලිව් හා මිදි වගාව ය. මෙම නගරයේ සිටි පාලකයන් වූ ඔම්රි හා ආහබ් ඉතා අලංකාර ගොඩනැගිලි තනා මෙම නගරය අලංකාර කළේය. ගලීලය හා සමාරිය අතර ජෙශ්රීල් නම් නිම්නයක් පිහිටා ඇති අතර, එම නිම්නය හරහා මිසරය සහ සිරියාව යාකරන මුහුදු මාර්ගයක් වැටී තිබිණ. නිම්නයේ දකුණු කෙළවර බලකොටු හතරක් පිහිටා තිබිණ.

- ජුදය

උතුරේ සමාරිය හා දකුණේ ඉදුමිය අතර පිහිටා ඇති ප්‍රදේශයකි. මෙය ජුදා ගෝත්‍රයට ලැබුණු ප්‍රදේශයකි. මෙය එතරම් සාරවත් නොවේ. නැගෙනහිරින් මළ මුහුද ද, දකුණේ බෙයර් - ෂෙබා ද පිහිටා ඇත. මේ ප්‍රදේශයේ පිහිටා ඇති ස්ථාන නම් ජෙරුසලම, හෙබ්‍රොන්, බෙත්ලෙහෙම, ජෙරිකෝව, බෙතානිය හා ඔලීව කන්දයි. හෙබ්‍රොන් නගරය ජුදා දේශයේ බලමුළුව විය. ආදී පීතෘවරුන්ගේ සොහොන් කොත් තනා තිබුණේ එහි ය. බෙත්ලෙහෙම එතරම් ප්‍රසිද්ධියට පත් වූ නුවරක් නොවූ අතර ජෙරුසලම වැදගත් වූයේ දාවිත් එය සිය අගනගරය කරගත් නිසා ය.

- නෙගෙබ් (දකුණ)

බෙයර් - ෂෙබා නිම්නයට දකුණින් පිහිටි පාළුකරය දකුණ යන අරුත් ඇති නෙගෙබ් ය. මෙය නිසරු භූමියකි. නමුත් සමහර ස්ථානවල කෘෂිකර්මය හා සත්ත්ව පාලනය කරන ලදී. කජෙෂ් - පර්නෙයා සහ බෙයර් - ෂෙබා නෙගෙබ් හි පිහිටි බයිබලීය ඉතිහාසයට සම්බන්ධ ප්‍රධාන නගර දෙකකි.

### 6.2.3 ඓතිහාසික පසුබිම

පලස්තීනය අවට දකුණේ ඇති නයිල් ගඟ ආශ්‍රිත ප්‍රදේශයේ දී ක්‍රි.පූ. 3000 දී පමණ මිසරයේ දියුණු ශිෂ්ටාචාරයක් පැවතිණ. ක්‍රි.පූ. 1786 සිට 1552 දක්වා කයිකෝසර් (කික්කෝසර්) නමැති ජාතිය මිසරයට ඇතුළු වී මිසරය අත්පත් කරගත්තේ ය. කයිකෝසර් ලෙස අප හඳුන්වන්නේ කරීවරුන්, සෙමෙතිවරුන් හා ඉන්දියානු ආර්යයන්ගේ සම්මිශ්‍රණයකි. කයිකෝසර්වරුන්ගේ යුගයේ දී ඉශ්රායෙල්වරු මිසරයට සංක්‍රමණය වූහ. ඉශ්රායෙල්වරුන් ද සෙමෙතික් ජාතියට අයත් වූ නිසා කයිකෝසර්වරුන් සමඟ සමඟියෙන් දිවි ගෙවූහ. පසුව 3 වන තෝත්මසු (ක්‍රි.පූ. 1790 - 1730) නමැති පාරාවෝ කයිකෝස්ගේ පාලනය බිඳ දැමූ අතර, ඔහු විසින් නව පාලනයක් අරඹන ලදී. තෝත්මසු යන්න චන්ද්‍ර දේවයාගේ පුත්‍රයායි. (තෝත් යනු චන්ද්‍රයා , මසු - පුත්‍රයා) තෝත්මසු නමැති නව පාරාවෝ කයිකෝස්වරුන් ද, ඉශ්රායෙල්වරුන් ද කෙරෙහි එතරම් පැහැදීමක් නොවීය. මන්ද ඔවුන් සංඛ්‍යාවෙන් බහුල වනවිට තමාට ඔවුන්ගෙන් තර්ජනයක් එල්ල වෙතැයි ඔහු බිය වූ බැවිනි.

ක්‍රි.පූ. 1375 - 1366 දක්වා මිසරයේ පාරාවෝ 4 වන ආමන්, කෝටබූ තමන් සූර්ය දෙවියා ලෙස හඳුන්වා දෙමින් තමාට හැර වෙන කිසිවෙකුට වන්දනාමාන නොකළ යුතු බවට නියෝගයක් පැණවීය. මෙයින් ඒකදේවවාදීන් වූ ඉශ්රායෙල්වරුන්ට සිය යාහ්වේ නමස්කාරයට බාධාවක් එල්ල විය. මේ අවස්ථාවේ දී 2 වන රාම්සෙස්ගේ පාලනය යටතේ (ක්‍රි.පූ.1290 - 1224 දක්වා) ඉශ්රායෙල්වරුන් වහල් සේවයට ඇද දැමීය. (නික්මයාම 1 : 11) මෙම යුගයේ දී මෝසෙස් හා ආරොන් විමුක්ති සටනක යෙදී ඉශ්රායෙල්වරුන් වහල්කමින් මුදවා ගත්තෝය.

- නික්මයාම

  දෙවියන් වහන්සේ ආබ්‍රහම්, ඊසාක් හා ජාකොබ්ට දුන් පොරොන්දු/ ගිවිසුම තවදුරටත් ඉටුකරනු පිණිස මෝසෙස් තෝරාගත් සේක. මිසරයේ වහල් සේවයේ නියැලුණු වහලුන් කණ්ඩායම මෝසෙස්ගේ නායකත්වය යටතේ පාරාවෝගේ වහල් බැම්වලින් මිදී පාළුකරය හරහා ගොස්, ඔවුන්ට දෙවියන් වහන්සේගෙන් ලැබුණු දසපණත ක්‍රියාවට නගමින් කානාන් දේශයේ පදිංචි විය.

- ඔවුන්ට එකම දෙවියන් වහන්සේට නමස්කාර කරමින් ජීවත් වීම හා එකම ජනතාවක් වීම සඳහා තවදුරටත් නොයෙකුත් නීති සමුදායක් ලබාදෙන ලදී.

- දෙවියන් වහන්සේගේ ඉශ්රායෙල් ජනතාව සමඟ ඇතිකර ගත් ගිවිසුම තේරුම් ගැනීමට එදා සමාජයේ පැවති ගිවිසුම් පිළිබඳ අධ්‍යයනය කිරීම යෝග්‍ය වේ.

  සමාජයේ ඇති ගිවිසුම් හා ශුද්ධ වූ බයිබලයේ සඳහන් දෙවියන් වහන්සේගේ හා ඉශ්රායෙල් සෙනඟ අතර ගිවිසුම්වල පොදු ලක්ෂණ පහත දැක්වේ.

  i. රජුගේ නම හා සුදුසුකම් සඳහන් කරමින් පෙරවදනක් පැවතීම.
  *නිදසුන්* : ඔබගේ ස්වාමීන් වන දෙවියන් වහන්සේ මම ය.

  ii. රජුගේ කාරුණික ක්‍රියාවන් ගිවිසුමේ විස්තර කරනු ලබන අතර, ඒ සඳහා යුවරජු කෘතඥතා පූර්වක ව ඒ නියෝග පිලිපැදීමට ඉදිරිපත් වෙයි. (නික්මයාම 26)

  iii. යුවරජුගේ වගකීම විස්තර කරනු ලබයි. (මෙය කරන්න, මෙය නොකරන්න යනුවෙන්) (නික්. 20 : 3-17)

  iv. ගිවිසුම් පත්‍රිකා දේවමාලිගාවේ තබා එය වරින්වර කියවිය යුතු ය.

v. දෙවිවරුන්ගේ නම් ලැයිස්තුවත් එයට සාක්ෂියක් ලෙස ලබා දේ.

vi. ගිවිසුම පිළිපදින විට ලැබෙන්නා වූ ආශිර්වාදය හා නොපිළිපදින විට ලැබෙන දඬුවම පිළිබඳ ව සඳහන් වේ. (නික්මයාම 23 : 20 - 33)

- දෙවියන් වහන්සේ තම ජනතාව සමඟ ඇතිකරගත්තා වූ ගිවිසුමේ ප්‍රධාන ලක්ෂණය නම් දෙවියන් වහන්සේ විසින් ම මෙම ගිවිසුම ඇති කර ගැනීමට උනන්දු වීමයි. එය බලයෙන් අඩු යුවරජුන්ගේ තත්ත්වයට සමාන වීමකි.

**ජන නායකයෝ**

- ක්‍රි.පූ. 1200 - 1050 අතර ඉශ්‍රායෙල් ප්‍රජාවට නායකත්වයක් දුන් විනිශ්චයකරුවන් ජන නායකයන් ලෙස හැඳින්විය හැකි ය.
- ජනතාව දෙවියන් වහන්සේගේ ගිවිසුමට අවනත නොවූ අවස්ථාවක දී, දෙවියන් වහන්සේගේ උදහස හේතු කොටගෙන අන් රාජ්‍යවල රජවරුන්ගේ පීඩා අත්විඳීමට ඔවුන්ට ඉඩ හැරිය සේක. (වීරාවලිය 2:6-3:6, 10:6-16)
- කානානීය නමස්කාර ක්‍රම අනුගමනය කරමින්, ඉශ්‍රායෙල්වරුන්ගේ එකම දෙවියන් වහන්සේ වන යාඃහ්වේ දෙවිඳුන් අමතක කිරීමේ භයානක තත්ත්වයක් උදාවිය.
- ඉශ්‍රායෙල්වරුන් තමන් අතරම භේද භින්නතා ඇතිකරගත් අවස්ථා බොහොමයක් විය. මේ අවස්ථාවල දී, විනිශ්චයකරුවන් වන ජොෂුවා, දෙබෝරා, ගිඩියොන්, සැම්සන් වැනි අය ඒවා සමථයකට පත් කිරීමට ඉදිරිපත් වූහ.

**රජවරු**

- මෙතෙක් ඉශ්‍රායෙල්වරුන්ගේ නායකයන් ලෙස සිටියේ ජන නායකයින් ය. එනම් විනිශ්චයකාරවරුන් ය. නමුත් අන් රටවලට රජවරු පත්වී සිටියෝ ය. අන් රටවල් මෙන් සිය රාජ්‍යය ආර්ථිකය, සමාජමය හා දේශපාලනමය වශයෙන් දියුණු කිරීමට තමන්ට ද රජකු අවශ්‍ය බව ඉශ්‍රායෙල්වරු පැවසූහ.
- ඉශ්‍රායෙල්වරුන්ගේ රජු විය යුත්තේ දෙවියන් වහන්සේය. ඒනිසා වෙනත් මිනිස් රජවරුන් අනවශ්‍ය බවට තවත් තර්කයක් ඉදිරිපත් විය.
- නමුත් ජනතාවගේ දැඩි ඉල්ලීම මත ඔවුනට ද රජ කෙනෙකු පත්කරන්න යැයි දෙවියන් වහන්සේ සාමුවෙල්ට පැවසූ සේක.
- ජනතාවගේ රජ කෙනෙකු පත්කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීම වෙනුවෙන් හේතු කීපයකි.

i. ජන නායකයින්ට යුක්තිය නිසි අයුරින් පසිඳලීමට නොහැකි වීම. (1 සාමුවෙල් 8:1-9)

ii. විනිශ්චයකරුවන් වෙනුවට අන් රටවල් රජ කෙනෙකු මගින් පාලනය වීම.

iii. රජකු මගින් පාලනය වන ස්වයං රාජ්‍ය වශයෙන් තම අනන්‍යතාවය රැකගැනීමේ ආශාව හා අවශ්‍යතාව

iv. යුද්ධයක් ජයගැනීමට රජකු ප්‍රමුඛ හමුදාවක් අවශ්‍ය බව සිතීම.

v. මුල් ඉශ්‍රායෙල්වරුන් එක්කොට පාලනය කිරීමට දෙවියන්වහන්සේ රජවරුන් තිදෙනෙක් (එක් අයෙකුට පසුව අනෙක් රජ වශයෙන්) තෝරාගැනීම.

**සාවුල් (ක්‍රි.පූ.1030 - ක්‍රි.පූ.1010)**

- සාවුල් බෙන්ජමින්ගේ ගෝත්‍රයට අයත් වූ අතර පූජක සාමුවෙල් විසින් ඔහුව ඉශ්‍රායෙල් හි රජු ලෙස අභිෂේක කරනු ලැබීය. (1 සාමුවෙල් 10 : 1-24)

- සාවුල් පිලිස්තිවරුන් පරාජයට පත් කරමින් ඉශ්‍රායෙල් ජනතාවට අලුත් බලාපොරොත්තුවක් ලබා දුන්නේ ය. එම නිසා ඉශ්‍රායෙල් ජනතාව රජකුගෙන් අපේක්ෂා කළා වූ කර්තව්‍යය ඉෂ්ට වූයේ ය.

- නමුත් අමෙලෙක්වරුන්ට එරෙහිව කළා වූ සටනෙහි දී දේව අණට කීකරු වීමට සාවුල් අපොහොසත් වීම හේතුවෙන් දෙවියන් වහන්සේගේ උදහසට ලක් වූයේ ය.

- එම නිසා දෙවියන් වහන්සේ විසින් සාවුල් රජුව ප්‍රතික්ෂේප කරනු ලැබීය.

**දාවිත්**

- සාවුල් රජුව ප්‍රතික්ෂේප වීමත් සමඟම ඉශ්‍රායෙල් ජනතාවට නායකයකුගේ අඩුපාඩුව දැනෙන්නට විය. මේ අතරතුර දී පිලිස්තිවරුන් ඉශ්‍රායෙල් දේශයට මහත් තර්ජනයක් විය. පිලිස්තිවරුන්ගේ හමුදාවෙන් ප්‍රධාන ලෙස අභියෝගයක් එල්ල වූයේ ගොලියත් ගෙන් ය.

- ගොලියත් ඉශ්‍රායෙල්වරුන්ට අභියෝග කරමින් කියා සිටියේ තමාට ඉශ්‍රායෙල්වරුන්ගේ දක්ෂතම රණකාමියා සමඟ සටන් කිරීමට අවශ්‍ය බවයි.

  ඔහුගේ කොන්දේසි වූයේ,

  * ගොලියත් ජයගතහොත් ඉශ්‍රායෙල් ජනතාව පිලිස්තිවරුන්ට යටත් විය යුතු බවත්,

  * ඉශ්‍රායෙල් වීරයා ජයගතහොත් පිලිස්තිවරුන් ඉශ්‍රායෙල්වරුන් අභියස යටත් විය යුතු බවත් ය.

- මේ තත්ත්වය තුළ සාමුවෙල් විසින් ඉශ්‍රායෙල් නව රජ ලෙස ජෙස්සේගේ පුත් දාවිත් අභිෂේක කරන ලදී.

- එඬේරෙක් වූ දාවිත් ඔහුගේ සහෝදරයන්හට ආහාර රැගෙන යන විට දී ගොලියත්ගේ අභියෝගය ගැන දැනගන්නට විය. එම අභියෝගය පිළිගැනීමට සහ ගොලියත් සමඟ සටන් කිරීමට අධිෂ්ටාන කරගත් දාවිත් සටනට රජු වූ සාවුල්ගෙන් අවසරය ඉල්ලීය.

- ගොලියත් ව පරාජය කොට ජයග්‍රහණය ගෙන ආවොත් සාවුල් රජුගේ දියණිය සහ රටෙන් කොටසක් ලබාදීමට සාවුල් විසින් දාවිත්ට පොරොන්දු වෙමින් සටනට අවසර දෙන ලදී. පසුව දාවිත් විසින් ගොලියත්ව පරාජය කරන ලදී. මුළු මහත් ඉශ්‍රායෙල් ජනතාව එම ජයග්‍රහණය පිළිබඳ ව ප්‍රීති ප්‍රමෝද විය. (1 සාමුවෙල් 18)

දාවිත් රජුගේ පාලන සමය හා ඉශ්රායෙල් දේශයේ අභිවෘද්ධිය

- දාවිත්ගේ ජයග්‍රහණය හේතුවෙන් පලස්තීනය හා සිරියාව එකතු කරමින් ශක්තිමත් රාජ්‍යයක් බවට පත්වීමට ඉශ්රායෙල්වරුන්ට හැකි විය.
- දාවිත් රජුගේ රාජ්‍ය සමයේ දී ඊජිප්තු රාජ්‍යය හා සමාන වර්ධනයකට ගෙන ඒමට ඔහුට හැකි විය.
- ගෝත්‍රික පාලනය ඉවත් කරමින් ජෙරුසලම අගනුවරක් ලෙසට පත්කරන ලදී.
- පරිපාලනයේ සම්පූර්ණ බලය (පාලන බලය) රජුගේ පිට පැටවීම වැළැක්වීමට නොහැකි විය.
- හමුදා ආඥාපතිවරුන් (Millitary Commanders) පත් කිරීම සිදු විය.
- පසුව පූජකවරුන්ව ද පත්කරන ලදී.
- පරිපාලනමය කටයුතු සඳහා ද නිලධාරීන් පත් කරන ලදී.
- ඔවුන් රජ මාලිගයෙහි සේවකයන් හා ආණ්ඩුකාරවරුන් ලෙස පත් කරන ලද්දේ ය.
- ආගමික කටයුතුවල දී ජනතාවගේ මනස හොඳින් තේරුම්ගෙන ක්‍රියාකරන ප්‍රවණතාවයක් ඇති විය.
- ආගමික සංගීතයට වැදගත් ස්ථානයක් ලැබුණේය.
- ජනතාව තුළ එකමුතුකම හා භක්තිය වැඩිකිරීමට රට තුළ විවිධ ප්‍රදේශයන් හි දී ලෙවීවරුන් පත්කරන ලදී.
- ගිවිසුම් කරඬුව ජෙරුසලමට ගෙන එනු ලැබීය.
- මේ අන්දමින් අලුත් සංස්කෘතියක් රට තුළ ඇති වූයේ දාවිත් රාජ්‍ය කාලය තුළදී ය.

**සලමොන්**

- දාවිත්ට පසුව ඔහුගේ පුත් වූ සලමොන් රජ බවට පත්වූවේය.
- දාවිත් රජු සලමොන්ගෙන් ධර්මයට අවනතව හැසිරෙන්නැයි පැවසුව ද ඔහුගේ විදෙස් බිරින්දෑවරුන්ගේ බලපෑම කරණකොට ගෙන දෙවියන් වහන්සේගෙන් ඈත්ව දේව ආඥාවන්වලට අවනත නොවී ය.
- සලමොන් රජුගේ පාලන කාලය තුළ සම්පූර්ණ සාමයක් ද අත්දැකීමට නොතිබුණි. නමුත් එයින් අදහස් වනුයේ දැඩි යුධමය තත්ත්වයක් එහි තිබූ බව ද නොවේ.
- ඔහුට අවශ්‍ය වූයේ තම පාලන ප්‍රදේශය පුළුල් කර ගැනීමට වඩා අනෙකුත් දේශයන් සමඟ සම්බන්ධතාවන් වර්ධනය කර ගැනීමට ය.
- අසල්වාසී දේශයන් සමඟ හොඳ සම්බන්ධතාවක් තිබූ බැවින් ඉශ්රායෙල්හි රන් යුගයක් ලෙස සලමොන්ගේ පාලන කාලය හැඳින්විය හැකි ය.

සලමොන් රජුගේ පරිපාලනයේ විශේෂත්වය :

- සලමොන් රජු පරිපාලනය හා නීතිරීති මැනවින් ක්‍රියාත්මක කිරීම පිණිස දේශය දිස්ත්‍රික්ක දොලසකට බෙදා ආණ්ඩුකාරවරුන් පත්කරන ලදී. (1 රාජාවලිය 4 : 7 - 19)
- හමුදාව ශක්තිමත් කිරීම කරණකොට ගෙන විදේශ ආක්‍රමණයන් පාලනය කිරීමට හැකි විය.
- සිරියාව හා අරාබිය වැනි දේශයන් සමඟ වාණිජමය සම්බන්ධකම් ඇති කරමින් රටේ ආර්ථිකය නඟාසිටෙව්වේය. එමෙන් ම අලුත් නගර නිර්මාණය කරමින් ජනාවාස ඇති කළේය.
- රටට යම් දුරක සාමකාමී යුගයක් ඇති කළා පමණක් නොව, ආර්ථික, සමාජමය හා සංස්කෘතිමය දියුණුවක් ඇති කිරීමට ද සලමොන්ට හැකි විය.

**දේශය දෙකඩ වීම**

දේශය දෙකඩ වීමට එක හේතුවක් වූයේ සලමොන් රජුගේ පුත්‍ර වූ රෙහෙබොවම්ගේ අසාධාරණ පාලනය විය. ක්‍රිස්තු පූර්ව 922 දී දේශය දෙකඩ විය. උතුරු රාජ්‍යය ඉශ්‍රායෙලය ලෙසත්, දකුණු රාජ්‍යය ජුදා ලෙසත් හැඳින්විය. රෙහෙබොවම්ගේ හමුදාපති වූ ජෙරබොවම් ගෝත්‍ර දහයකින් සමන්විත ඉශ්‍රායෙල් දේශයේ පාලනය අත්පත් කරගත් අතර, ගෝත්‍ර දෙකකින් යුක්ත වූ ජුදා දේශය රෙහෙබොවම්ගේ පාලනයට නතු විය. වසර පනහක් තුළ උතුරු රාජ්‍යය හා දකුණු රාජ්‍යය අතර විටින් විට ගැටුම් ඇති වූ හෙයින් දේශපාලන අස්ථිරභාවයක් ඇති විය.

**උතුරු රාජ්‍යය**

- ක්‍රිස්තු පූර්ව 922 සිට ක්‍රිස්තු පූර්ව 901 දක්වා කාලය තුළ ජෙරබොවම් උතුරු රාජ්‍යය තමා සතුකර ගනිමින් පාලනය කිරීමට ජෙරබොවම්ට හැකි විය.
- පසුව පැමිණි වසර 50 මුළුල්ලෙහි නාදාබ්, බාෂා, ඒලා, සිම්රි, ඔම්රි සහ අහාබ් වැනි රජවරු උතුරු දේශය පාලනය කළෝය.
- අහාබ් රජ සමයේ දී (ක්‍රි.පූ.869 - 850) දිවැසිවර එළියා, බාල් නමස්කාරය හෙලා දැක ඉශ්‍රායෙල් ජනතාවට නිසි නමස්කාරය නැවත තහවුරු කළේය.
- අහසියා රජුගේ කාලයේදී ද (ක්‍රි.පූ. 830 - 307) එළියා දිවැසිවරයාගේ සේවය සිදුවිය.
- උතුරු රාජ්‍යය තුළ සාරධර්ම ඇති කිරීම පිණිස එළියා, එළිෂා, මීකා, ආමොස්, හොසියා වැනි දිවැසිවරුන් සේවය කළෝය.
- ක්‍රි.පූ. 722 දී සමාරියාව අසිරියාවට යටත් විය.

**දකුණු රාජ්‍යය**

- ජුදා හා බෙන්ජමින් යන ගෝත්‍ර දකුණු රාජ්‍යයේ ජීවත් වූ අතර ජෙරුසලම අගනුවර විය.
- දකුණු රාජ්‍යයේ ක්‍රි.පූ. 931, රෙහෙබියාම් රජු වසර 17 ක් පාලනය කළේය. පසුව ඔහුගේ පුත්‍රයා වන අභියා වසර 3ක් පාලනය කළේය.
- ඉක්කෝ, අනානියා, අසාරියා වැනි දිවැසිවරුන් දකුණු දේශයෙහි දිවැසි වැකි කීමෙහි යෙදී සිටියෝය.
- ක්‍රි.පූ. 873 සිට 849 තෙක් වසර 25 ක් ජෙහොෂාපාට් මැනවින් පාලන කටයුතු කළේය.
- ක්‍රි.පූ.796 සිට වසර 15 ක කාලයක් අමශියා විසින් පාලනය කරන ලදී.
- අමශියාට පසුව උශ්ෂියා, ජොතාම්, ආහස් සහ හෙසකියා වැනි රජවරු ජුදා දේශය පාලනය කළෝය.
- මේ කාලය තුළ මීකා, යෙසායා යන දිවැසිවරු ජුදාහි දිවැසිවරු ලෙස සේවය කළෝය.
- ක්‍රි.පූ. 609 දී ජෙහෝයාකිම් රජු දවසේ දී බබිලෝනියාවේ රජු වූ නෙබුකද්නෙසර් ජුදා දේශය තම බලයට නතුකර ගන්නා ලදී.
- මෙහිදී ජුදෙව්වරුන්ගෙන් වැඩි පිරිසක් බබිලෝනියට රැගෙන යන ලදී.
- මේ වකවානුවේ දී ජෙරමියා සහ එසකියෙල් යන දිවැසිවරුන්ගේ සේවය දක්නට ලැබේ.

**විප්‍රවාසය**

- ජුදෙව්වරුන් බබිලෝනියෙහි විප්‍රවාසගත ව සිටි කාල වකවානුව වසර 70 කි.
- විප්‍රවාසයට ගෙන යනු ලැබුවේ ජුදෙව් ආගමික නායකවරු, පූජකවරු හා සේවකයන් වැනි අයවරුන් ය.
- එමෙන් ම දේව මාලිගයේ සම්පත් කොල්ල කෑවෝය.
- ජුදෙව්වරු තම අනන්‍යතාවයේ සංකේතයක් වූ දේවමාලිගාව අහිමිවීම හේතුවෙන් තම පුදපූජා ඔප්පු කර ගැනීමට නොහැකිව ලතැවුලට පත්වෙමින් කල්ගත කළෝය.
- මේ හේතුව නිසාත්, බබිලෝනියාවේ සාරවත්කම නිසාත් යුදෙව්වරු බබිලෝනීය දෙවිවරුන්ට නමස්කාර කිරීමට පෙළඹුණෝය.

**අපර විප්‍රවාසී යුගය**

- නමුත් පර්සියානු රජු වූ සයිරස් රජු බබිලෝනීය පාලනය අත්පත් කර ගැනීමෙන් පසුව තමාගේ පාලන ප්‍රදේශයේ සිටි සියලුම ජුදෙව්වන් හට තම දේශයට යෑමට අවසර දෙන ලදී.
- මේ අවසරයත් සමඟ රජකුමරු වන සෙරුබාබෙල් හා නායක පූජක හොසියාගේ ප්‍රධානත්වයෙන් ජුදෙව්වරු 40 000 පමණ ජුදා දේශයට නැවත පැමිණියෝ ය.
- දේශයට පැමිණ වසරක් ගතවෙත් ම දේවමාලිගාව ප්‍රතිසංස්කරණය කරනු ලැබීය.

- බබිලෝනියේ දී මිශ්‍ර විවාහවලට පාත්‍ර වූ පසුව නිදහස ලැබුණු විට නැවත ජුදා දේශයට හැරී ආ අයවරුන් සඳහා සමාරිතයන් යන නාමය භාවිත කරනු ලැබේ.

- ටෝරාව ලෙස හැඳින්වූයේ ජුදෙව් බයිබලයේ මුල්කොටස වන පංචපුස්තකය වූ අතර එය යුදෙව්වන්ගේ ව්‍යවස්ථාව ලෙස හැඳින්විය හැකිය. එය ඔවුන්ගේ ආගමික ග්‍රන්ථය විය.

- පර්සියන් පාලනය යටතේ දකුණු රාජ්‍යයට (ජුදා රාජ්‍යය) සමාජමය අයිතිවාසිකම් හා රජයේ ආරක්ෂාව ලැබීම නිසා උතුරු රාජ්‍යය (ඉශ්රායෙල්) එතරම් ම කැමැත්තක් නොදැක්වීය.

- සමාරියයන් ලෙස හැඳින්වූ වැසියන්ව දකුණු රාජ්‍යය ජුදෙව්වන් විසින් කොන් කිරීම කරණකොට ගෙන දේවමාලිගයේ හි නමස්කාර කිරීමේ භාග්‍යය අහිමි විය. පසුව සමාරිතයන් විසින් ගෙරිසීම් පර්වතයේ දී තමන්ටම නමස්කාර ස්ථානයක් සාදාගන්නා ලදී.

**පලස්තීනයෙහි ග්‍රීක පාලනය (ක්‍රි.පූ.333 - 363)**

- පර්සියානු රජ වූ (3 වන ඩේරියස් රජු ව) මහා ඇලෙක්සැන්ඩර් විසින් පරාජය කිරීමත් සමඟ ඊජිප්තුව සිට ජුදාව, සමාරිතය වැනි ප්‍රදේශ ග්‍රීක පරිපාලනයට යටත් කරගනු ලැබීය.

- ග්‍රීක පාලකයන් විසින් ජුදෙව් සම්ප්‍රදායන් හා ආගමික සිරිත් විරිත් සඳහා නිදහස දී තිබුණේය. නමුත් ඒ අතරම ග්‍රීක සංස්කෘතිය හා ජීවන රටාවන් ජුදෙව්වන්ගේ ජීවිතවලට මහා බලපෑමක් ඇති කරන ලදී.

- දේශයේ බොහෝ නගරවල නාමය ග්‍රීක නාම බවට වෙනස් කරන ලදී.

- එමෙන් ම ග්‍රීක භාෂාව නොදත් අය මිලෙච්චයන් ලෙස කොන් කරනු ලැබූහ.

- පලස්තීනය තුළ ග්‍රීක ක්‍රීඩාංගන වැනි ගොඩනැගිලි ඉදිකිරීම කරන ලදී.

- මේසයකට හේත්තු වී ආහාර වැළඳීම වැනි ග්‍රීක චාරිත්‍ර වාරිත්‍ර ජුදෙව්වන් විසින් අනුගමනය කරන්නට විය.

- ග්‍රීක වෛද්‍ය ක්‍රමවේදයන් ද ජුදෙව්වන් විසින් ආදරයෙන් වැළඳ ගන්නා ලදී.

- ක්‍රි.පූ. 2 වන ශතවර්ෂය වනවිට සමහර ජුදෙව්වෝ තමන් ස්පාටර්ගේ පරම්පරාවෙන් පැමිණෙන නෑදෑයෝ ලෙස හඳුන්වා දීමට කැමති වූහ. එතරම් ග්‍රීක ආභාෂයක් ඔවුනට ලැබුණේය.

- මහා ඇලෙක්සැන්ඩර් රජතුමාගේ වියෝවීම සමඟ උද්ගත වූ දේශපාලනික අසමතුලිත තත්ත්වය හේතුවෙන් ඊජිප්තුවේ සේනාධිපති වූ ටොලමිට, ක්‍රි.පූ. 315 දී ජෙරුසලම් අත්පත් කර ගැනීමට අවස්ථාවක් ලැබුණි.

- ග්‍රීක පාලනය හේතුකොට ගෙන පලස්තීනයේ දේශපාලන හා ආගමික බලය උත්තම පූජකවරුන්ගේ අතට පත් විය. මෙම බලය ලැබුණු උත්තම පූජකවරු සෙන්හෙඩ්‍රින් නමැති ජුදෙව් මන්ත්‍රණ සභාව මගින් තම නීතිරීති (මිෂ්නා) සකස් කර තම ජාතිය පාලනයට භාජනය කරන ලදී.

- ක්‍රි.පූ. 200 දී පමණ සිරියානු රජ වූ 3 වන අන්තියෝකස් ටොලමිගෙන් පලස්තීනය අත්පත් කරගත්තේ ය.

- ග්‍රීක ආභාෂය ලැබූ ජුදෙව්වන් හා හෙබ්‍රෙව් ජුදෙව්වන් ලෙස බෙදීමක් ඇති වුණි. පසුකාලීනව හෙබ්‍රෙව් ජුදෙව්වන් ග්‍රීකවරුන්ට විරුද්ධව සිටීම ද දක්නට ලැබේ. මෙය පසුව කැරැල්ලක් බවට පත් විය.

**මකබි පාලනය - ජුදෙව් කැරැල්ල (ක්‍රි.පූ. 175 - 135)**

- මකබි යන්නෙහි තේරුම එතුමන් තුළින් ඉශ්රායෙල්වරුන්ට මිදීම ලැබේ ය යන්න ය.
- මකබි පාලනය යුගයේ දී ජුදෙව් මායිම් ඉදුම්ය දක්වා පුළුල් කර ගැනීමට හැකි වූ අතර, ජුදෙව් ව්‍යවස්ථාව පිළිපැදීමට ඔවුනට බලපෑම් ඇති කළෝය.
- හෙරොද්වරුන් බිහිවූයේ මකබිවරුන්ගෙන් ය. එමෙන් ම පර්සිවරුන් සහ සද්දුසිවරුන් නමැති ආගමික කණ්ඩායම් පලස්තීනයෙහි බිහි විය.
- ඉන්පසු හස්මොනිවරුන්ගේ පාලනය ඇරඹීම දක්නට ලැබේ. මේ කාලයේ දී ජුවාම්, නිර්ෂාන්, ඇලෙක්සැන්ඩ්‍රා රැජින වැනි අය ජුදෙව්වන්ව පාලනය කරන ලදී. ඇලෙක්සැන්ඩ්‍රියාවේ රැජින පරිසිවරුන්ගේ සිත් දිනාගෙන පාලනය ගෙන ගියාය.
- 2 වන ඇරිස්ටෝප්‍රල් පලස්තීනය පාලනය කරනු ලැබුවේ ක්‍රි.පූ. 67 - 63 යන කාල වකවානුවේ දී ය. ක්‍රි.පූ. 63 දී පමණ පොම්පේ නමැති රෝම සේනාධිපතිවරයා විසින් ජෙරුසලම ආක්‍රමණය කරන ලදී.
- රෝමවරුන්ගේ ආක්‍රමණයන් නිසා ජුදෙව් පාලන ප්‍රදේශය කුඩා විය. දේශපාලන විමුක්තියක් අපේක්ෂාවෙන් සිටි ජුදෙව්වරුන් හට රෝමයන්ගේ පාලනයට නතුවීමට සිදු විය. රෝම ආණ්ඩුකාර පොම්පේගේ කාලය පටන් ආරම්භ වූ ජුදයේ රෝම පාලන තන්ත්‍රය ජේසුස් වහන්සේගේ කාලයත් පසුකර දිවෙන්නකි.

**රෝම පාලනය (ක්‍රි.පූ. 63 - ක්‍රි.ව. 70)**

පලස්තීනයෙහි රෝම පාලනය කාල වකවානු 3කට බෙදිය හැකිය.

1. ජේසුස් වහන්සේගේ කාලයට පෙර රෝම පාලනය (ක්‍රි.පූ. 63 - ක්‍රි.පූ. 04)
2. ජේසුස් වහන්සේගේ කාලයේ තුළ රෝම පාලනය (ක්‍රි.පූ. 03 - ක්‍රි.ව. 30)
3. ජේසුස් වහන්සේගේ කාලයට පසු රෝම පාලනය (ක්‍රි.ව. 30 - ක්‍රි.ව. 70)

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ වර්ධනය පිළිබඳවත් එයට ආභාෂය ලැබුණු සෙසු ශිෂ්ටාචාර පිළිබඳවත් කරුණු සෙවීම කළ යුතුය.
- සශ්‍රීක අඩසඳ නමැති මැදපෙරදිග භූමියට අයත් ස්ථාන ගැන හා ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට ඒවායින් ඇති වැදගත්කම ද සෙවීම අවශ්‍ය වේ.
- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට සම්බන්ධ වූ ස්ථානයක් සිතියමක් මගින් ඉදිරිපත් කිරීමේ දැනීම අවශ්‍ය වේ.
- විප්‍රවාසයෙන් පසුව ජුදෙව්වන්ගේ ජීවන රටා හා සංස්කෘතීන් ගැන සාකච්ඡා කිරීම වැදගත් ය.

**මූලාශ්‍රය :**


1. ශුද්ධ බයිබලය
2. New Jerome Biblical Commentary (NJBC)

**නිපුණතාව 6.0** : **කිතුනු ශිෂ්ටාචාරයක් ගොඩනැගීමට මූලික වූ ශිෂ්ටාචාරයන් අධ්‍යයනය කොට යහපත් ජීවිත පැවැත්මකට පසුබිම සකසා ගනියි.**

**නිපුණතා මට්ටම 6.3** : කිතුනු දහම බිහි වූ සමාජ පසුබිම ගවේෂණය කරයි.

**කාලය** : කාල පරිච්ඡේද 16

**ඉගෙනුම් ඵල** :

- පලස්තීනයේ දේශපාලන පසුබිම අධ්‍යයනය කරයි.
- රෝම පරිපාලන යුගය හදාරයි.
- හෙරොද්ගේ පාලන ක්‍රමය ගැන අවබෝධයක් ලබයි.
- නායක පූජකවරු හා මනත්‍රණ සභාව ගැන ඉගෙන ගනියි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 6.3.1 පලස්තීනයේ දේශපාලන හා සමාජීය පසුබිම

**රෝම පරිපාලන යුගය**

- ක්‍රි.පූ. 37 වනවිට පලස්තීනය සම්පූර්ණයෙන් ම රෝමවරුන්ගේ පාලනයට නතුව තිබුණි. මෙම පාලනය පලස්තීනයේ ආරම්භ වූයේ පොම්පේගේ පැමිණීමත් සමඟ ය.
- රෝම අධිරාජයාගේ පාලන සභාව " SENATE" ලෙස හඳුන්වනු ලැබීය.
- ලතින් භාෂාව ඔවුන්ගේ පාලන භාෂාව විය.
- රෝමවරුන්ගේ පාලනය තුළ රටවල් 72 ක් සහ ප්‍රාන්ත 40 ක් තිබූ අතර එහි පාලන කටයුතු කරගෙන යාමට ආණ්ඩුකාරවරුන් ද පත් කර තිබුණි.
- ආණ්ඩුකාරවරුන් මෙන් ම එවකට බලයේ සිටි රජවරුන්ව, යුවරජ පදවි දී ඔවුන් ලවා ආදායමක් හැටියට බදු අයකිරීම ද සිදුවිය.
- ආගමික වශයෙන් රෝම අධිරාජයාට වැඳුම් පිදුම් කිරීමට ජනතාවට බලකළ ද ඉපැරණි ආගමික ඉතිහාසයක් දැරූ ජුදෙව් ආගම ඇදහූවන් හට එම නීතිරීති බලනොපෑවේය.
- ඔවුන් රටවල් යාකරමින් මාර්ග ඉදිකරන්නටත්,ව්‍යාපාර කටයුතුවලට උපකාරවන ආකාරයට ඔවුන්ගේ භාෂාව වන ග්‍රීක භාෂාව, කලාව, සංස්කෘතිය සහ ශිෂ්ටාචාරය ආදිය පිළිපැදීමට සහ ඒවා අනුගමනය කිරීමට බලපෑම කර තිබීම විශේෂ ලක්ෂණයකි.
- රෝම සමාජය තුළ ජනතාව සාමාන්‍යයෙන් කාණ්ඩ දෙකකට බෙදීය. එනම් පට්රිෂියන් හෙවත් ධනවතුන්, ඉඩම් හිමිකරුවන් හා දේශපාලනයට සම්බන්ධ වූ අය හා පිලිබියන් හෙවත් සුළු ගොවීන් හා ව්‍යාපාරිකයන්, අත් කර්මාන්තකරුවන් හා කුඩා බිම් ප්‍රදේශයට හිමිකම් කියූ අයවරුන් ය.
- මුළු ජන සංඛ්‍යාවෙන් 90% මෙම දෙවැනි ගණයට අයත් වූහ.
- රෝමවරුන් නීතිරීති ගැනත් හමුදාමය ක්‍රියාවන් පිළිබඳවත් දැඩි ලෙස උනන්දුවක් දැක්වීය.

**හෙරොද්ගේ පාලන ක්‍රමය**

- ක්‍රි.පූ. 47 දී ජුලියස් සීසර්ව පරාජයට පත් කිරීමට පොම්පේ තැත් කළේය. මේ අවස්ථාවේ දී පොම්පේ ගේ සිත දිනාගෙන තම සහයෝගය ලබා දුන්නේ උත්තම පූජක II වන හර්කානුස් හා ඉදුමීය පාලකයා වන II අන්තිසර් යන අයවරුන් ය.
- ක්‍රි.පූ. 47 දී ජුලියස් සීසර් සිරියාවට පැමිණි අවස්ථාවේ දී හිර්කානුස් ආණ්ඩුකාර තනතුරට ද, අන්තිපර්ට ජුදෙව් හි රෝම නියෝජිතයාගේ තනතුර දෙන ලදී.
- අන්තිපර්ගේ එක් පුතෙකුව ජෙරුසලමටත්, හෙරොද් ව ගලීලයට ද ආණ්ඩුකාරවරුන් ලෙස සීසර් පත් කළේය.
- ක්‍රි.පූ. 44 දී සීසර්ව ඝාතනය කිරීම සිදුවිය. පසුව හර්කානුස්ගේ සේවකයන් විසින් අන්තිපර්ට වස පොවා මරා දමන ලදී.
- අන්තිපර්ගේ පුත් හෙරොද් හා තමාගේ මිණිපිරිය අතර හර්කානුස් විවාහය සිදුකළ අතර,ඒ තුළින් සම්බන්ධතාව නැවත ගොඩනැගුනේ ය.
- ක්‍රම ක්‍රමයෙන් රෝම පාලනය දුර්වල විය. සිරියාවේ ද රෝමවරුන් පරාජයට පත්වීමත් සමඟ හෙරොද් ප්‍රබලවීමට පටන් ගත්තේ ය.
- හෙරොද් ඉදුමීය කෙනෙකු හෙයින් ඔහු තුළ තිබූ ග්‍රීක ආභාෂය මහත් විය.
- මහා හෙරොද් තමාගේ උපක්‍රම භාවිත කරමින් හා කපටි උපක්‍රම ද උපයෝගී කර ගනිමින් රෝම අධිරාජ්‍ය පාලනය යටතේ පලස්තීනය තමාගේ පාලනයකට අනුව ගෙනයෑමට හැකියාව ලබා ගත්තේ ය.
- හෙරොද්ගේ පාලනය රෝම අධිරාජයා යටතේ තිබුණ ද, හෙරොද්ගේ පාලනය එක්තරා ආකාරයක ඒකාධිකාරී පාලන ප්‍රවාහයක් විය.
- ඔහු ජුදෙව්වන්ගේ සිත් දිනාගන්නා අටියෙන් දේවමාලිගය ද ප්‍රතිසංස්කරණය කළේය.
- බහු භාර්යාවන්ගෙන් යුත් හෙරොද් රජු ක්‍රි.පූ. 4 දී මියගියේ ය.
- ඔහුගේ මියයාමෙන් අනතුරුව පාලනය පුතුන් තිදෙනා අතර බෙදී ගියේ ය.
- ඔහු තමාට විරුද්ධවාදීකම් කළ අය පමණක් නොව සමහර අවස්ථාවල දී තම භාර්යාවන්ව පවා මරාදමන්නට පසුබට නොවීය.
- ක්‍රි.පූ. 25 - 13 දක්වා කාලය තුළ පලස්තීනයේ සීමා පුළුල් කිරීමට ඔහුට හැකි විය. බදු මුදල් අඩුකර තම රටේ දී හා පිටරටවල දී ගොඩනැගිලි සෑදීමට මුදලින් උදව් කළේය. සමාරියාවේ අගනුවර වන සෙසරියාවෙහි රෝම දේවතාවට කෝවිලක් සෑදුවේය.
- රට දියුණු කරනු පිණිස විශ්වවිද්‍යාල ද, ක්‍රීඩාංගන ද, පිහිනුම් තටාක ද, පළතුරු වතු ද, බලකොටු ද වැනි දේවල් නිර්මාණය කළේය.
- ඔහු අධිරාජයාට වැඳුම් පිදුම් කිරීමට ජුදෙව්වරුන්ට බලකිරීම නිසා ඔවුන්ගේ අප්‍රසාදයට ලක්වුණි.
- හෙරොද්ගේ පාලනයේ දී ජුදෙව් සංස්කෘතියට වඩා ග්‍රීක සංස්කෘතියට වැඩි තැනක් ලැබුණි.
- තමන්ගේ කැමැත්ත පරිදි උත්තම පූජකවරුන් පත්කිරීමටත්, ඉවත් කිරීමටත් ඔහු කටයුතු කළේය.

## නායක පූජකවරු හා මන්ත්‍රණ සභාව

### නායක පූජකවරු

- ඉශ්‍රායෙල් ගෝත්‍ර දොළසින් ලෙවීගේ ගෝත්‍රය පූජකත්වයට තෝරාගනු ලැබීය. නමුත් සෑම ලෙවීවරයෙකුටම පූජකවරයෙකු වීමට භාග්‍යය නොතිබුණි.
- පූජකත්වය ලැබීමට සුදුසුකම වූයේ ලෙවීගේ ගෝත්‍රයේ ආරොන්ගේ පවුලට අයත් වීම ය.
- කලක් ගියවිට ආරොන් පවුලේ කදොක් වංශයට අයත් වූ අය පමණක් පූජකත්වයේ ප්‍රමුඛත්වය ලැබීය.
- කදොක් වංශය පසුකාලීන ව සද්දුසිවරුන් ලෙස හැඳින්වීය.
- ඉශ්‍රායෙල් හි රජවරුන් හා පූජකවරුන් යන දෙපිරිසම දේශපාලනය හා සම්බන්ධ වේ. මේ දෙපිරිස තෝරාගනු ලැබුවේ අභිෂේක කිරීමෙන් ය.
- කල්යත්ම දේශපාලනයේ යෙදුණු අයගේ වටිනාකම හා බලය අඩුවෙත් ම පූජකවරුන්හට ප්‍රමුඛස්ථානයක් හිමි විය.
- ක්‍රි.පු. 2 දී පමණ ජුදෙව් මන්ත්‍රණ සභාවෙහි නායකත්වය පූජකවරුන් විසින් ඉසුළුවේය.
- උත්තම පූජක පදවියට කැපවූ අයකු තම මුළු ජීවිත කාලයම එම ධූරයේ නිරත විය යුතුව තිබුණි.
- ජේසුස් වහන්සේගේ කාලයේ සිටියේ එක් උත්තම පූජක වරයෙකි. නමුත් විශ්‍රාම ගියාවූ අන්නාගේ පෙළපතින් ආ උත්තම පූජකවරුන් හට ද යම්කිසි බලයක් තිබිණි.
- රෝම පාලන සමයේ දී ඔවුහු උත්තම පූජකවරුන්ගේ බලය පිළිබඳ ව හොඳින් දැන සිටියෝය. එහෙයින් ඔවුහු තමන් කැමති අයව එම තනතුරට පත් කළෝය.
- එම සමාජයේ ඉහළම මට්ටමේ සිටියේ සද්දුසිවරුන් වන උත්තම පූජකවරුන් ය.
- චෝදනා ලද කෙනා නිදොස් වුවහොත් එදිනම නිදහස් කළ යුතු ය. නමුත් මරණ දණ්ඩනය තීන්දු කළහොත් දින දෙකකට පසුව එය ක්‍රියාත්මක කළ යුතුය.
- ඔවුන් දඩ නියම කිරීම, කසපහර දීම, දේවමාලිගාවෙන් පිටුවහල් කිරීම හා ජුදෙව් සමාජයෙන් පිටුවහල් කිරීම වැනි දඬුවම් නියම කළේය.
- ජේසුස් වහන්සේට දෙන ලද තීන්දුව මේ පසුබිමෙන් දෙන ලද්දක් ය.

### යුදෙව් පොදු මන්ත්‍රණ සභාව (සෙන්හෙඩ්‍රින් සභාව)

- සෙන්හෙඩ්‍රින් හෙවත් ජුදෙව් පොදු මන්ත්‍රණ සභාව ජුදෙව් ආගමික නීතිරීති හරියාකාර ව අනුගමනය කිරීම සඳහා මහත් වූ බලපෑමක් ඇති කළේය.
- 71 දෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුතු වූ මෙම මන්ත්‍රණ සභාවේ මූලිකත්වය දැරීම උත්තම පූජකයාගේ වගකීම විය.

- සද්දුවරුන් වන පූජකවරුන් (විශ්‍රාම ගත් පූජකවරුන් හා පූජක පවුලට අයත් වූ අය) හා සද්දුසිවරුන් වන වැඩිහිටියෝ (ගෝත්‍රික නායකවරු, පූජකවරුන් නොවන ප්‍රභුවරුන් හා ශුද්ධ ලියවිල්ලේ විශාරදයින්) හා ජනතාව සමඟ කිට්ටු සම්බන්ධතාවයක් තිබූ පරිසිවරුන් ද යන කණ්ඩායම් තුන මෙම මන්ත්‍රණ සභාවේ සාමාජිකත්වය දැරුවෝය.

- ක්‍රි.පූ. 76-67 දක්වා ඇලෙක්සැන්ඩර්ගේ පාලනය යටතේ පරිසිවරුන් හට මන්ත්‍රණ සභාවේ සාමාජිකත්වය හිමි විය.

- සෙන්හෙඩ්‍රින් සභාවට සොල්දාදුවන්ගේ දායකත්වය ද ලැබුණි. වැරදිකරුවන් අත්අඩංගුවට ගැනීම ඔවුන්ගේ වගකීම විය.

- මරණ දඬුවම නියම කිරීමට ඔවුනට හැකි වූ අතර එය ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුකාරවරයාගෙන් අවසරයක් ලබා ගැනීමට සිදු විය.

- මෙම සභාවේ බලතල තිබුයේ ජුදයේ මායිම් තුළ පමණි.

- විසිර සිටි ජුදෙව් සමූහයන් අතර ද මෙවැනි සභාවන් පැවැත්වුණි.

- ජේසුස් වහන්සේ, පේදුරුතුමා, ජොහන් තුමා සහ පාවුලු තුමා වැනි අයව විනිශ්චය කිරීම සඳහා ගෙන එනු ලැබුවේ සෙන්හෙඩ්‍රින් සභාව ඉදිරිපිටට ය.

- රෝමානුවන්න් ජෙරුසලම විනාශ කිරීම තුළින් ජුදෙව්වන් විසිර යෑම සිදුවූ අතර, සෙන්හෙඩ්‍රින් සභාවේ අවසානය ද එයින් උද්ගත විය.

- සෙන්හෙඩ්‍රින් සභාවේ නීතිරීති හා ජුදෙව් නීතිරීති ලියැවී තිබුණේ මිශ්නා නැමැති ග්‍රන්ථයේ ය.

- මිශ්නාවට අනුව මෙම සභාව ජෙරුසලමේ ඒ සඳහා ම නිමැවූ මණ්ඩපයේ දී රැස්විය යුතු ය. උත්සව දින හැර අනෙකුත් දිනවල දහවල් කාලය තුල රැස්විය යුතු ය.

- ජුදෙව්වෙක් ජුදෙව් නීතිරීති කඩකළ විට ඒ පිළිබඳ ව නීතිරීති ක්‍රියාත්මක කිරීම සභාවේ වගකීම විය. චෝදනා ලද අයෙකුට තීන්දුවක් දීමට දෙදෙනෙකුගේ සාක්ෂි ප්‍රමාණවත් විය. වෙන වෙනම ප්‍රශ්න කරන කළ එම සාක්ෂි දෙකම එකට එකක් සමාන වීම වැදගත් විය.

- චෝදනාව ලද අයගේ කටඋත්තරය මත තීන්දු දීම කළ නොහැකිව තිබුණි.

**මිනුම් ක්‍රම**

- ජුදයෝ බර මැනීමේ දිග මැනීමේ ක්‍රමවේදයන් භාවිතා කළහ.

- සෙක්කේල් යනු බර මනින මිනුමකි. සෙක්කේල් එකක බර ධාන්‍ය බර 218 කට සමාන ය. සෙක්කේල් භාගයක් පෙකා යනුවෙන් ද, සෙක්කෙල් ප්‍රමාණයෙන් 1/20 ක් කෙරා යනුවෙන් ද හැඳින්වේ.

- දිග මැනීමට ලී කෝදුවක් භාවිත කරන ලදී. එක් දින ගමන් දුර, සබත් දින ගමන් ගන්නා දුර, ඊයක දුර ප්‍රමාණය ආදී ලෙස දුර ප්‍රමාණය මනින ලදී. සබත් දිනක ගමන් ගන්නා දුර ප්‍රමාණය අඩි 202 කි.

**භාෂාව**

- ජුදයින්ගේ මුල් බස හේබ්‍රෙව් නමුත් ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ ද, සභා මණ්ඩපවල (සිනගෝගවල) වත්පිළිවෙත්වල දී ද, දේව මාලිගාවේ වත්පිළිවෙත් හා කියවීම්වල දී ද හේබ්‍රෙව් බස භාවිත විය.

- නමුත් එදිනෙදා ජීවිතයේ දී අරමීය බසින් ද කථා කළහ. ජුදා සමාජයේ උසස් ප්‍රභූවරු පමණක් අරමීය බසින් කථා කළහ. නමුත් සාමාන්‍ය ජනතාව අරමීය බසින් කථා කළේ ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ දී ය. එබැවින් ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ දී අරමීය බස කථා කිරීමටත්, හේබ්‍රෙව් බස ලිවීමටත් භාවිතා වූ බව කිව හැක. ඒ අතරම ග්‍රීක, රෝම ආක්‍රමණ නිසා රාජ්‍ය භාෂාව ලෙස ග්‍රීක හා ලතින් භාෂා ද, සම්මත ව තිබුණි.

- ක්‍රිස්තුස් වහන්සේගේ මරණ තීන්දුවේ පොන්සියුස් පිලාත් සමඟ ක්‍රිස්තුස් වහන්සේ ලතින් බසින් කථා කරන්නට ඇතැයි ද විශ්වාස කළ හැක.

## 6.3.2 ක්‍රිස්තු කාලීන ජුදා සමාජයේ සංස්කෘතික හා ආගමික සම්ප්‍රදාය

**සංස්කෘතිය**

- ජේසුස් වහන්සේගේ කාලයේ පලස්තීනයෙ හි විවිධ සංස්කෘතීන් දක්නට ලැබුණි.

- පවුල තුළ පියාට ළමයින්ගේ ගරුත්වය සැම විටකදී ම ලැබීමට යොමු කරනු ලැබීය.

- පියකුට තිබූ වගකීම් නම්,

    * තමන්ගේ කෙතේ හොඳ බීජ වැපිරීම
    * සොරුන්ගෙන් දේපළ ආරක්ෂා කිරීම.
    * සේවකයින්ට ඔවුන්ගේ වැඩ කොටස් බෙදාදීම.
    * වැටුප් ගෙවීම යනාදියයි.

- මේ සමාජයේ පිරිමි දරුවෙකුගේ උපත අපේක්ෂාවෙන් සිටියේ ය.

- නිවුන් දරුවන් ඉපදුණුවිට ප්‍රථමයෙන් ඉපැදුණු කෙනා කවුරුන්දැයි දැන ගැනීමට ඉතා සෝදිසියෙන් සිටියේ ය.

- ළදරුවන්ට මව්කිරි පෙවීම මවගේ වගකීමක් ලෙස සැලකීය.

- පිරිමි දරුවෙකු ව 8 වන හෝ 40 වන දිනයේ හි චර්ම ඡේදනය කරනු ලැබීය.

**සරණ බන්ධනය**

- ඔවුන් විවාහයට පෙර විවාහය නියම කරගනු ලැබීය. එය ආරාල් ලෙස හැඳින්වීය.

- ජේසුස් වහන්සේගේ කාලයේ දී වහලකුව අයිති කරගන්නා සේ ම විවාහයේ දී පුරුෂයකු ස්ත්‍රියක අයිතිකර ගනු ලැබීය.

- මනාලියගේ නිවසේ සිට මනාලයාගේ නිවසට පෙරහැරකින් ඇයව කැඳවාගෙන විත් විවාහය උත්සවාකාරයෙන් සිදුකරනු ලැබීය. එහිදී මනාලයා මෙලෙස පවසයි. අද සිට ඈ මගේ භාර්යාවයි. මම ද ඇයගේ ස්වාමිපුරුෂයා යි. නමුත් මෙලෙස ප්‍රතිඥාවක් දෙන්නේ මනාලයා පමණකි.

- විවාහයට පැමිණෙන අයට විවාහ වස්ත්‍ර ද දෙනු ලැබේ.
- විවාහයෙන් අනතුරු ව නව යුවල වෙනම ගෙයක පදිංචිය සඳහා වෙන් ව යයි.
- පුරුෂයාට තම භාර්යාව දික්කසාද කළ හැකි වූ අතර, ස්ත්‍රියට එම හිමිකම නොලැබුණි.
- විවාහ වූ හෝ විවාහ බස් දී තිබුණු හෝ කාන්තාවක් සමඟ කෙනෙකු ලිංගිකව හැසුරුණහොත් ඒ දෙදෙනාටම මරණ දඬුවම හිමි විය.
- ඔවුන් ආගන්තුක සත්කාරයට ප්‍රමුඛස්ථානයක් දීම නිසා නිතරම ආහාර බෙදාගැනීම දක්නට ලැබුණි.
- කොණ්ඩය වැවීම උසස් ලෙස සැලකුවේය.

**නිවස**

- මාර්ගය හා නිවෙස් සාදා තිබූයේ සැලසුම් සහගතව නොවේ.
- මධ්‍යාහ්නය හා රාත්‍රී කාලය හැරුණු විට සෙසු කාලවල දී මාර්ගවල ජනයා විවිධ වැඩ කටයුතුවල නිරත වීම දැකිය හැකි විය.
- සාමාන්‍ය නිවෙස් මැටියෙන් ද, පොහොසතුන්ගේ නිවාස පිලිස්සූ ගඩොලින් ද සාදන ලදී.
- සාමාන්‍ය මිනිසුන් රොටී සහ ඔලිව් තෙල් තම ආහාරය කරගත් අතර ධනවතුන්ගේ ආහාරය වූයේ මස්, මීකිරි සමඟ මිදි යුෂ විය.
- සියලු දෙනාම කෙළින් බිම වාඩිවී පාද නවා ආහාර අනුභවයෙහි යෙදිය යුතු විය. (ලූක් 7 :36-38, ජොහන් 13:23-25)
- එමෙන් ම එවිට දෙවියන් වහන්සේට ප්‍රශංසා කොට වැළඳීම සිදුවිය.
- ආහාර වැළඳීම සඳහා වන ආගන්තුකයන්ව ගෘහමූලිකයා විසින් හිස නමා සුබපතමින් සිඹිමින් මහත් වූ ආගන්තුක පිළිගැනීමකින් පිළිගන්නා ලදී.
- පැමිණෙන ආගන්තුකයන් පාවහන් ගලවා පාද සෝදා ඇතුළුවිය යුතු ය. ගෘහ මූලිකයා විසින් ඔහුගේ හිසට තෙල් ගා තමන්ගේ සතුට ප්‍රකාශ කරනු ලැබීය. (ලූක් 7 : 46)

**උසස් පංතිය ලෙස හැඳින්වෙන ප්‍රභූවරු**

- රජ පවුලේ උදවිය, රජ පවුල සමඟ කිට්ටු සම්බන්ධතා තිබූ අය, දුර නෑයින්, හිතවතුන් ආදී ලෙස මොවුන් හැඳින්විණි.
- ජේසුස් වහන්සේගේ කාලයේ දී හෙරොද් රජපවුල උසස් කුලවතුන් ලෙස ප්‍රධාන තැනක් ගත්තේය. තවද මහා පරිමාණයේ ව්‍යාපාරිකයන්, ඉඩම් හිමි ප්‍රභූවරු, බැංකු හිමියන්, ස්වයං රැකියා කළ අය, සෙන්හෙඩ්‍රින් මන්ත්‍රණ සභා සාමාජිකයින්, ධනවතුන් වූ නිසා උසස් කුලවන්ත අය ලෙස සළකන ලදී.
- රටේ පොදු වස්තූන් සියල්ලටම රජ පවුල පමණක් හිමිකම් කීහ. මේ නිසා මොවුන්ගේ ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස ආදිය ආඩම්බර ලෙස පැවතුණි ; විවිධ අන්දමින් තමන්ගේ සුඛෝපභෝගී ජීවිතය පෙන්නුම් කළහ.

- ධනවතුන්ට භාර්යාවන් කීපදෙනෙකු තබාගත හැකි බවට නීතිමය අවසර දී තිබුණි. එක් රජකෙනෙකුට බිසෝවරු 18 දෙනෙකු සමඟ විවාහ විය හැකි බවට මිස්නා නීතියේ සඳහන් විය. නමුත් කාල්වුට් නැමිති නීතිය ප්‍රකාර එය 24 - 28 දක්වා තිබිය හැකි බව ද සඳහන් වේ. (කාල්වුට් යනු ග්‍රීක පාලන සමයේ දී ලියැවුණු ජුදයින්ට අයත් නීති පොත ය.)
- ධනවත්තු තම වත්පොහොසත්කම පෙන්වා ගැනීමට නිතර නිතර භෝජන සංග්‍රහ සූදානම් කළහ. මේ සංග්‍රහයට විශාල පිරිසක් කැඳවනු ලැබූහ.
- මේ සඳහා වෙනමම අරක්කැමියන් පත්කරන ලදී.
- ජලය මිශ්‍ර නොකළ උසස් වර්ගයේ මිදියුෂ, වීදුරු බඳුන්වල දමා සංග්‍රහ කළහ. ඒ සමඟම ආරාධිතයෝ සියලු දෙනා රංගනයේ යෙදී සතුටු වූහ.
- ධනවත්තු තම භාර්යාවන් සඳහා සුවඳ විළවුන්, උසස් වර්ගයේ ඇඳුම් පැළඳුම්, ආභරණ, මැණික්, රන් ආභරණ, රිදී භාණ්ඩ ආදියට විශාල මුදලක් වැය කළහ.
- සමහර ධනවත් නායක පූජකවරුන්ගේ භාර්යාවන් තම නිවසේ සිට දේවස්ථානය දක්වා ඇවිදගෙන යාමට බුමුතුරුණු (පාවාඩ) මඟ එළූහ.

**මධ්‍යම පන්තියේ අය**

- මොවුන් පූජකවරු ද, සුළු ව්‍යාපාරිකයෝ ද, කලාකරුවෝ ද වූහ.
- ජෙරුසලමේ මංගල්‍ය කාලයේ දී, සුළු ව්‍යාපාරිකයන්ටත්, කලාකරුවන්ටත් හොඳ ආදායමක් ලැබිණි.
- ජෙරුසලමේ සිටි පූජකවරුන් අතර වර්ග 24 ක් වූහ. මොවුන්ගෙන් ජෙරුසලමේ පූජකවරුන් හැර අන් අය මධ්‍යම පංතියට අයත් වූහ. එයට හේතු වූයේ මොවුන්ගේ සේවා වාරයේ දී ලැබෙන පඬුරු, පාප පූජා පඬුරු, දේවස්ථානයේ පඬුරුවල ප්‍රථම ඵලය වගාවන්ගෙන් 1/10ක් ද මොවුන්ට ලැබුණි.
- එබැවින් මොවුන්ගේ ආදායම සුඛෝපභෝගී ජීවිත ගතකිරීමට ප්‍රමාණවත් නොවුවත්, නැත යනුවෙන් කීමට තරම් පහත් නොවීය.
- මධ්‍යම පාංතිකයන් ලෙස හැඳින්වූයේ මෙවැනි අය ය.

**පහළ පංතියේ අය**

- ජේසුස් වහන්සේගේ කාලයේ දී වත්පොහොසත්කමින් අඩු අය පහළ පාංතිකයන් ලෙස හඳුන්වන ලදී.
- තවද වහලුන්, බදු අයකරන්නන්, සමාජීයයන්, පවුකාරයන්, ස්ත්‍රීන් සැම පහත් අය ලෙස සළකන ලදී.
- මොවුන්ගෙන් දිළිඳු යැයි කොන් කරනු ලැබූ අය, තම ආදායම ඉතා අඩු දුගීහු වූහ.
- මොවුන් (AM-HA-AREZ) අම් හා අරෙස් යනුවෙන් අමතන ලදී. එනම් ගැමියන් යනුයි.
- මොවුන් මනුෂ්‍යයන් වුවත්, ආත්මයක් නැති අප්‍රාණික භාණ්ඩයක් ලෙස සළකන ලදී.
- වහලුන් ද, විසිරී ගිය ජුදෙව්වන් ද පහත් අය ලෙස සලකන ලදී.

- ජුදෙව්වෝ තම ඉතිහාසය තුළ විවිධාකාර වහල්භාවයන් ද, විප්‍රවාසී භාවයන් ද අත්දුටහ.

- මොවුන් ජෙරුසලමේ පදිංචි වූ පසු, තමන්ව වහලුන් ලෙස ගෙනගිය, ඊජිප්තු, බබිලෝනිය, අසිරියන් ආදී අවට රටවල දක්නට තිබුණු වහලුන්ගේ රටාවන් අනුගමනය කළහ.

- ජේසුස් වහනසේගේ කාලයේ දී උන්වහන්සේ තම දේශන මගින්, මෙවන් වහල්භාවයන්ගෙන් මිනිසුන් මිදිය යුතු යැයි යන්නට විවිධ දේශන හා අදහස් පළකළහ. (මතෙව් 10 : 24)

**බදු අයකරන්නන්**

- ජේසුස් වහන්සේගේ කාලයේ දී පහත් අය අතර බදු අයකරන්නෝ ද වූහ. ජුදා චාරිත්‍ර අනුව බදු අයකරන්නන් හොරුන් ලෙස ද මංකොල්ලකරුවන් ලෙස ද හැඳින්විණි.

- ජේසුස් වහන්සේගේ කාලයේ දී බදු අයකරන්නන්ගේ ප්‍රධානියා ලෙස කටයුතු කළේ සකේවුස් ය.

- මිස්නා නමැති ජුදා නීතිපොතේ, පාපී වෘත්තියක් ලෙස හැඳින්වෙන ඒවා අතර බදු අයකිරීම ද පාපයක් ලෙස හැඳින්වේ.

- බදු අයකරන්නන් ජුදෙව්වන් වුව ද, රෝම අධිරාජයා වෙනුවෙන් පලස්තීනුවන්ගෙන් බදු අයකිරීම නිසාත්, ධනපතියන්ගෙනුත් විශේෂයෙන් පාලකයන්ගෙනුත් ඉතා සුළුවෙන් බදු අයකිරීම හෝ සමහර විට අය නොකිරීම හෝ නිසාත්, මධ්‍යම පාංතිකයන් හා දිළිඳුන්ගෙන් අධික බදු අයකළ නිසාත්, ජුදෙව්වෝ බදු අයකරන්නන්ව කොන් කරනු ලැබූහ.

- නියමිත පමණට වඩා වැඩියෙන් බදු අයකළහ. එමෙන් ම වසර පහක ගිවිසුම අවසන් වූ පසුත්, ව්‍යාජ අධිකාරී බලයක් පාමින් බදු අය කළහ. එබැවින් මොවුහු රෝම අධිරාජ්‍යයේ අතකොලුවක් ලෙස සලකා කොන් කරනු ලැබූහ.

- සමහර අවස්ථාවන්හි දී මොවුහු අන්‍ය ජාතිකයන් ලෙස ද, පාපිෂ්ඨයන් ලෙස ද හඳුන්වනු ලැබූහ.

- ජේසුස් වහන්සේගේ ජීවිතයේ බදු අයකරන්නෝ දෙදෙනෙක් සම්බන්ධ වෙති. ඔවුන් නම්, රේගුපොලේ බදු අයකළ ලෙවී වන මතෙව් ද, සකේවුස් ද වෙති.

- "මනුෂ්‍ය පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නට ද, ගලවාගන්නට ද වැඩම කළ සේක" යනුවෙන් ද, "මා ආයේ දමිටුවන් නොව අදමිටුවන් කැඳවීමටයි" යනුවෙන් ද පැවසූ ජේසුස් වහන්සේ තම ජීවිතයේ දී බදු අයකරන්නන් ද, පහත් රැකියා කරන්නන් ද මනුෂ්‍යයන් ලෙස සලකා ඔවුන්ව තම මිතුරන් කරගෙන ශ්‍රේෂ්ඨ පාඩමක් අපට ඉගැන්වූ සේක.

**සමාරියයන්**

- ජේසුස් වහන්සේගේ කාලයේ දී පහත් කරනු ලැබූවන් අතර සමාරියයන් ද තවත් කොටසකි. මොවුහු ජුදෙව්වන්ගෙන් වෙන් ව තනිව ජීවත් වීමට පටන් ගත්හ.

- ක්‍රිස්තු පූර්ව 922 දී සලමොන් රජුගේ අභාවයෙන් පසු පලස්තීනය, සමාරියාව හා ජුදයාව යනුවෙන් කොටස් දෙකකට බෙදුණි.

- සමාරියාවේ රජ වූ ජෙරොබොවාම්, දකුණේ තිබූ ජෙරුසලමට තම දරුවන් යෑම හා වන්දනාමාන කිරීම ගැන අකැමැති වී සමාරියාවේ ගෙරිසිම් කන්දේ සිද්ධස්ථාන පිහිටුවා, එහි වන්දනාමාන කිරීමට සැළැසුවේය.

- එමෙන් ම ක්‍රිස්තු පූර්ව 722 දී අසිරියන්වරු උතුරු රාජ්‍යය වටලා එහි සිටි රාජකීයයන්, උගතුන්, කලාකරුවන්, ධනවතුන්, රටින් පිටුවහල් කරවා තම වහලුන් වූ උන්නීයවරුන් සමාරියාවේ පදිංචි කරවූහ.
- මොවුහු සමාරියාවේ සිටි ජුදයින් සමඟ මිශ්‍ර විවාහ කර ගත්හ. තම වංශයේ පවිත්‍රත්වය කෙළෙසීම නිසා මේ සමාරියයන්ව ජුදයෝ පහත්කොට සළකා කොන් කළහ. එම නිසා සමාරියයන් ද පහත් පංතියට අයත් වූහ.
- ජේසුස් වහන්සේගේ කාලයේ දී සමාරියාව හරහා ගමන් යාම පවා තහනම් වී තිබූ අතර, ඔවුන් ඇසුරු කිරීම ද තහනම් කර තිබුණි. (ජොහන් 4 /9, ලූක් 9/5)
- නමුත් ජේසුස් වහන්සේ ජුදෙව්වන්ගේ අර්ථයක් නැති නීති ඉවතලා මිනිස්කම උසස් යන පදනම මත ශුභාරංචිය දේශනාකළ සේක.

**ස්ත්‍රීන්**

- ජේසුස් වහන්සේගේ කාලයේ දී ජුදා කාන්තාවන් පොදු කටයුතුවල දී වැඩිපුර ඉදිරිපත් වන්නේ නැත.
- පලස්තීන කාන්තාවෝ ගෙයින් පිටව යද්දී හිසවසාගෙන, මුහුණ රෙදිකඩකින් වසාගෙන යති.
- හිස වසාගෙන මුහුණ රෙදිකඩින් වසානොගෙන කාන්තාවක් පිටතට ගියහොත්, ඇගේ ස්වාමිපුරුෂයා ඇයව දික්කසාද කළ හැකි බවත්, එසේ දික්කසාද කරනවිට, ඇයට දියයුතු දීමනා කිසිවක් යුතුකමින් ස්වාමිපුරුෂයා නිදහස් වන බවත් එදා පිළිවෙතකි.
- කිසිම ජුදෙව්වකු කාන්තාවක සමඟ වැඩිපුර කථා නොකළ යුතුය. තම බිරිඳ සමඟවත් වැඩිපුර කථා නොකළ යුතු බවට ද නීතියක් තිබුණි.
- කිසිම කාන්තාවක්, පුරුෂයකු සමඟ තනිව සිටීම හෝ පුරුෂයකු විවාහක වෙනත් කාන්තාවක දෙස බැලීම හෝ නැතහොත් ඇයට ශුභපැතීම හෝ හොඳ නැත.
- කිසිම භාර්යාවකට, තම ස්වාමිපුරුෂයා කෙරෙහි නීතිමය බලයක් නැත. නමුත් ස්වාමි පුරුෂයකුට තම භාර්යාව කෙරෙහි තනි අයිතියක් ඇත.
- එබැවින් ස්වාමි පුරුෂයකුට තම භාර්යාව අත්හැරීමට නීතිමය අවසර තිබුණි.
- කාන්තාවන්, පුරුෂයන් හා සමව සිට ආහාර ගැනීම තහනම් ය. පුරුෂයන් ආහාර ගනිත්දී කාන්තාවන් ඔවුනට ආහාර බෙදමින් සිටිය යුතුය.
- වීදිවලත්, දේවස්ථානයේත්, කාන්තාවන් තනිව සිටිය යුතුය. පොදුවේ මොවුන්ට ලෝකය වන්නේ තම නිවසයි. නිවසේ ජනෙල් පවා තිර රෙදි දමා වසා තැබිය යුතුය. ආගමානුකූලව බලද්දී කාන්තාවෝ, පුරුෂයන් කෙරෙහි ඇති යුතුකම්වලින් නිදහස් ව සිටියහ. ඔවුන්ට ක්ෂේමා යන ජුදයින්ගේ එදිනෙදා යාච්ඤා කීම, අවශ්‍ය නොවීය.
- රෙදි විවීම, රොටී සෑදීම, නිවසේ භාණ්ඩ තැනීම, නිවසට දිය රැගෙන ඒම, තෙල් හිඳීම, යන කාර්යයන් කාන්තාවන්ට හිමි කාර්යයන් බව සඳහන් වී තිබුණි.

**ජුදා ආගමික සිරිත් විරිත්**

- ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ දී පලස්තීනයේ ආගමික ඇදහිලි, ජීවන රටාව ආදිය දෙවියන් වහන්සේ හා මිනිසා අතර සම්බන්ධතාවක් ඇති කරන පුරුකක් ලෙස ඉශ්රායෙල්වරු විශ්වාස කළහ.

- (ගීතාවලිය 1/1-2) සමිඳුන්ගේ විනයෙහි ප්‍රීති ප්‍රමුදිත වන දිවා රෑ එය භාවනා කරන මිනිසා භාග්‍යවන්තයෙක් වන්නේය. එබැවින් ඔවුන් එදිනෙදා ජීවිතයේ දී පිළිපදින ආගමික සිරිත් විරිත්, පවත්වන මංගල්‍යයන්, පවත්වන යාච්ඤා මෙහෙයන් සැමදේම ඊශ්රායෙල්වරුන්ගේ ආගමික බැතිය විදහාපායි.

- ඊශ්රායෙල්වරු එකම ඓතිහාසික පසුබිමක් යටතේ වර්ධනය වූවන් නොව, විවිධ පවුල්, කණ්ඩායම්, ජාතීන් එක්ව සැදුණු ජාතියක් බව ඉතිහාසඥයින්ගේ තීරණය වේ.

- ඊශ්රායෙල් ඉතිහාසයේ, ඔවුන්ගේ ජීවිතයේ නොයෙක් සිදුවීම් තුළින් ද, ඔවුන් දෙවියන් වහන්සේ අත්දුටු ආකාරයෙන් ද, දෙවියන් වහන්සේ මැවුම්කරුවාණන් යන මතයට වඩා, උන්වහන්සේ මිදුම්කරුවාණන්, රැකවලාණන් යන්න ඔවුන්ගේ සිතේ තදින් කාවැදී තිබුණි.

- විවිධ රටවල සංස්කෘතීන්ට භාජනය වුවත්, ඊශ්රායෙල්වරුන්ගේ ආගමික විශ්වාසය, එකම දෙවිඳුන් යන්න කිසිකලෙකත් වෙනස් වූයේ නැත.

- දේව වන්දනාවට මුල්තැන දුන් අතර, යාග ඔප්පු කිරීම ප්‍රධාන ආගමික වන්දනාව විය. භූමියත්, මිනිසාත් දෙවියන් වහන්සේට අයත් ය යන සිතුවිල්ලෙන් යුතු වූ භක්තිවන්ත සෑම ජුදයින්ම දෙවියන්ට යාග ඔප්පු කිරීමට පසු බැස්සේ නැත.

**යාග**

- ජුදයින් අතර විවිධ යාග ක්‍රම තිබුණි. ඒවා,
    i. දවන යාග
    ii. සහභාගීවීමේ පූජා
    iii. වන්දි ගෙවීමේ පූජා
    iv. වෙනත් යාග ලෙස මේ යාග පවත්වන ලදී.

- මෙලෙස යාග කරන සිරිත, ඊශ්රායෙලයට යාබද රටවල් වන මෙසපොතේමියාව, අරාබිය, කානාන්, ඊජිප්තුව ආදී රටවල පැවති පිලිවෙත්වලින් ආදේශ කරගත්තකි.

- යාග කිරීම මගින් ජනතාව පරිශුද්ධ වනවායැයි යන විශ්වාසය හෙබ්‍රෙව්වරුන්ගෙන් පැවතෙන්නකි. තවද යාගය, දෙවියන් වහන්සේ හා මිනිසා අතර ඇතුලාන්ත ප්‍රේමයටත්, සම්බන්ධතාවටත්, බාහිර ලකුණකි.

- ජේසුස් වහන්සේ තම දේශනයේ දී, තමන්ට මෙන් තම අසල්වැසියාට ප්‍රේම කිරීම, දවන යාග පූජා හා වෙනත් පූජා සියල්ලට වඩා උසස් බව පැවසූ සේක. (මාක් 12/34)

- මේ ආකාර යාග පූජා පිළිවෙත් ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේත් තිබුණු බව මාක් 10/45, මතේව් 5/23, මාක් 12/33 - 34, හේබ්‍රෙව් 5/2, කොරින්ති 5/7 යන වගන්තිවලින් දැනගත හැක.

**යාච්ඤා**

- ඊශ්‍රායෙල් ආගමික වතාවත්වල දෙවන ස්ථානය ගන්නේ යාච්ඤාවයි. යාග සිදුකිරීම ඔවුහු යාච්ඤාවක් ලෙස සිතූහ.
- දෙවියන් සමඟ සංවාදයේ යෙදීමට අවශ්‍ය වූ අවස්ථාවේ දී ඔබේ නගරයේ ඇති සිනගෝගයට ගොස් යාච්ඤා කරන්න. එසේ නොහැකි වූවා නම් නිදි යහනේ සිටම හෝ ඔබගේ හද විවෘත කර දෙවියන් වහන්සේට පෙන්වන්න, යනුවෙන් රබ්බිවරු (ගුරුවරු) දේශනා කළහ.
- ජුදෙව්වන්ගේ එදිනෙදා යාච්ඤා "ක්ෂේමා" යනුවෙන් හඳුන්වන ලදී. මෙහි අංශ දෙකක් ඇත. දිනකට තෙවරක් යාච්ඤා කළහ. මේ හැර හෙමෝහේ, එස්රේ යන ප්‍රශංසාත්මක යැදුම් 18කින්ද ජුදයෝ යාච්ඤා කළහ.
- ජේසුස් වහන්සේගේ කාලයේ දී උදේ, දහවල්, සවස යන වේලාවන්හි දී යාච්ඤා කළහ.
- යාච්ඤා කරන විට තෙපිලින් යන දේව වචනය අඩංගු හම් . . . පැළඳ තාලික් යන සළුවෙන් තමන් පොරවාගෙන දෙවියන්ගේ නගරය වන ජෙරුසලම් නගරය බලා දණින් වැටී, දෑත් ඔසවා යාච්ඤා කළහ.

**පවිත්‍රවීමේ හා කැපකිරීමේ පිළිවෙත් ක්‍රම**

- ජුදා දරුවෙකු ඉපදී දින 8 කින් හෝ 40කින් චර්මඡේදනය කළ යුතුය. මේ සඳහා ව්‍යවස්ථා තිබුණි.
- මේ සඳහා දෙමාපියන් දරුවා දේවස්ථානයට ගෙනගොස්, පරෙවියන් දෙදෙනෙකු හෝ කොබෙයියන් දෙදෙනෙකු හෝ පඬුරු ලෙස ඔප්පු කර චර්මඡේදනය කළ යුතුය.
- කෙනෙකු මියගියහොත් දේහය නහවා සුවඳ තෛලයෙන් ආලේපකර සුදු රෙදිවලින් ඔතා භූමදානය කරනු ලැබේ. (මාක් 16/1, මතෙව් 27/59)
- අවමංගල්‍ය කටයුතුවලට සහභාගී වූ සැම අපවිත්‍ර නොවෙනු පිණිස තුන්වැනිදා හෝ සත්වැනිදා හෝ ස්නානය කිරීම සිරිතකි.
- මියගිය අයගේ වියෝවින් සොවින් තැවෙන අයට ඥාතීන්, හිතමිත්‍රාදීන්, ආහාර පානාදිය දී ඔවුන් ව සනසති.
- රෝගයෙන් පීඩාවිඳින කෙනෙකුව නුවරින් පිටත් කරන ලදී. සාමාන්‍ය ලෙඩරෝග වෛද්‍යවරයකු විසින් සුවකරන ලදී. නමුත් කුෂ්ඨ රෝගීන් ගමින් පිටුවහල් කරන ලදී.
- කෙනෙකු කුෂ්ඨ රෝගියෙකු දුටුවහොත් රෝගියා "හමේ හමේ" යනුවෙන් එනම් අපවිත්‍රයි, අපවිත්‍රයි යනුවෙන් කෑගැසිය යුතුයි. සමහරවිට රෝගියා සුවවූවහොත්, නායක පූජකතුමා ඉදිරියේ පෙනී සිට, සුව වූ බවට සහතිකයක් ලබාගත් පසු නගරයට පිවිසිය හැක.
- ජුදෙව්වෝ භාරයක් වූ විට හිසකෙස් කපා හිස මුඩුකර ගනිති. මෙය බාසීර් භාරයක් යනුවෙන් හැඳින්වේ. එනම් නසරීනු කැපකිරීමයි.
- ජුදෙව්වෝ සාමාන්‍යයෙන් හිසකෙස් වවති. නමුත් තමන්ගේ ඉල්ලීම් ඉටු වූ විට හිසකෙස් කපා ගනිති.

**සබත් දින පිළිවෙත් හා මංගලෝත්සව**

- ජුදෙව්වරුන්ගේ ආගමික සම්ප්‍රදායන් හි සබත් දින පිළිවෙත් හා මංගල්‍යයන් ප්‍රධාන තැනක් ගනී.
- නිවාඩු දින සබත් දවස ලෙස හැඳින්වේ. සබත් යනු හෙබ්‍රෙව් වචනයට නිවාඩු, නැවැත්වීම, බැහැර කිරීම, අවසන් කිරීම යන අරුත් ඇත.
- දෙවියන් වහන්සේ වෙනුවෙන් දිනක් වෙන්කර, සබත ලෙස අනුසාර කර එය ගිවිසුමේ ලකුණක් ලෙස ජුදෙව්වන් ගැඹුරින් විශ්වාස කළ බැවින් ඔවුහු එය ඉතා ගෞරවයෙන් පිළිපැද්දාහ.
- සබත් දින සතියේ සිකුරාදා දින සවස ආරම්භ වේ. ජුදා ඉගැන්වීම්වලට අනුව රාත්‍රිය උදාවන්නේ අහසේ තරු තුනක් පෑයූ විට ය. ඉන් පළමු තරුව අහසේ දිස්වන විට සිනගෝගවල ඇති නළා පිඹිනු ලැබේ.
- මෙම නළාහඬ ඇසුණු විට සියල්ලෝ පහන් දල්වා නිශ්ශබ්දව සිටිති. සබත් දිනට පෙර දින සබත් දිනට අවශ්‍ය ආහාර පිළියෙල කර තබන අතර, සබත් දින ආහාර පිසීමේ වැඩ කිසිවක් නොකරති.
- සබත් දින වර්ග 39 ක වැඩ කිරීම තහනම් වී තිබුණි.
- මිනිසා සබත උදෙසා නොව සබත මිනිසා උදෙසා ය යනුවෙන් පැවසූ ක්‍රිස්තුස් වහන්සේ, මානුෂික හැඟීමෙන් යුතුව සේවය කර. සාපයට වඩා අසල්වැසි ප්‍රේමය උතුම් බව පෙන්වූ සේක.

**මංගලෝත්සව**

- ජුදෙව්වෝ තම ආගමික පිළිවෙත්වල දී මංගල්‍යයන් සමරා ප්‍රීති වූහ; මේ මංගල්‍යයන් සැමරීම මගින් ඔවුන් හා දෙවියන් වහන්සේ අතර සබඳතාව තහවුරු කර ගත්හ.
- මේ මංගල්‍යයන් හා සම්බන්ධ වන්දනා චාරිකා ද ගියහ. නියමිත කාලවල දී කණ්ඩායම් වශයෙන් ජෙරුසලම් නගරය වෙත වන්දනා චාරිකා ගියහ.
- මංගල්‍ය කාලයන්හි දී ජෙරුසලම් නගරය පවිත්‍ර කර අලංකාර කරන ලදී. වන්දනා චාරිකාවල දී ගමන් වෙහෙස නොදැනෙනු පිණිස, විවිධ ගීතිකා ගයමින්, වාද්‍ය භාණ්ඩ වාදනය කරමින්, දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් යාම සිරිත ය.

**ජුදෙව්වන්ගේ ප්‍රධාන මංගල්‍යයන් :**

1. පාස්කු මංගල්‍යය
2. පෙන්තකොස්ත මංගල්‍යය
3. නුමුහුන් පූප මංගල්‍යය
4. කූඩාරම් මංගල්‍යය
5. වන්දි ගෙවීමේ දිනය
6. දේවමාලිගය කැපකිරීමේ මංගල්‍යය

**පාස්කු මංගල්‍යය**

* පසුකර යෑම යනුවෙන් අදහස් කෙරේ. මෙය ඊජිප්තුවේ වහල්බවින් මිදුනු දිනය ද, සමිඳාණන් වහන්සේ ඊජිප්තුවේ කුලුඳුල් දරුවන්ට පහර දුන් දිනය ද සිහිකර මේ මංගල්‍ය සමරනු ලැබේ.

* මේ මංගල්‍යය නිසාන් මස (මාර්තු අග සිට අප්‍රේල් මුල දක්වා) සමරනු ලැබේ.

**පෙන්තකොස්ත මංගල්‍යය**

* ග්‍රීක අර්ථකථනයට අනුව පෙන්තකොස්ත යනු පනස්වන දිනයයි.

* සති හතකට පසු පැමිණෙන පනස්වන දිනයේ දී මේ මංගල්‍යය සමරනු ලැබේ.

* අස්වැන්නේ ප්‍රථම ඵලය පඬුරු ලෙස ඔප්පු කර මේ මංගල්‍යය සමරනු ලැබේ.

**නුමුහුන් පූප මංගල්‍යය**

* පෙන්තකොස්ත මංගල්‍යයේ දී ප්‍රථම අස්වැන්න පඬුරු ලෙස පුදන්නා සේ, නුමුහුන් පූප මංගල්‍යයේ දී, මුල් දින හතේ දී නෙලාගන්නා ලද තිරිඟු අස්වැන්න අඹරා පිටිකර, රොටී සාදා අනුභව කර මංගල්‍යය සමරා සතුටු වෙති. මෙය ද නිසාන් මස සමරනු ලැබේ. පාස්කු මංගල්‍යයත්, නුමුහුන් පූප මංගල්‍යයත් එකම මස (නිසාන් මස) පැමිණෙන බැවින්, එක් ව සමරනු ලැබීය.

**කූඩාරම් මංගල්‍යය**

* ජුදෙව්වන් ඈත අතීතයේ සිට පවත්වාගෙන ආ මංගල්‍යයකි. මෙය යාවේ දෙවිඳුන්ගේ මංගල්‍යය යනුවෙන් ද හැඳින්වේ. හෙබ්‍රෙව්වරුන්ගේ මංගල්‍යය අතර, ප්‍රසිද්ධ වූද, ශුද්ධ වූද මංගල්‍යයකි.

* සුක්කොක් යනුවෙන් ද මෙය හැඳින්වේ. සුක්කොක් යන්න පැල්පත, කූඩාරම, මඩුව යන අර්ථයන් ද දෙයි.

* අස්වැන්න නෙලන කාලයේ දී වෙල්යායේ කූඩාරම් තනන විට මේ මංගල්‍යය සමරනු ලැබීය. පසුකාලයේ දී, ජෙරුසලමට යන වන්දනා චාරිකාවට සූදානම්වන දින සිට දින සතක් එක දිගට මේ මංගල්‍යය සමරනු ලැබීය.

**වන්දි ගෙවීමේ දිනය**

* මේ මංගල්‍යය තිස්රි මස සමරනු ලැබීය. (සැප්තැම්බර් අග සිට ඔක්තෝබර් මුල දක්වා) මෙය යෝම් කිප්පූර් යනුවෙන් හෙබ්‍රෙව් බසින් හැඳින්වේ.

* පාපවලට වන්දි ලෙස මර්දන ක්‍රියා කිරීම් හා නිරාහාර ශීලය රැකීම කළ යුතුය.

**දේවමාලිගාව කැපකිරීමේ මංගල්‍යය**

* හනුක්කා (HANUKKAH) යනුවෙන් හීබෲ බසින් හැඳින්වේ. එනම් ආරම්භය හා අලුත් කිරීම යන්න මින් අදහස් වේ.

* අන්තියෝකස් එපිපානස් රජු ජෙරුසලම් දේව මාලිගාව අපවිත්‍ර කළවිට, එය පවිත්‍ර කර ක්‍රි.පූ.167 දී කිස්ලු මස (දෙසැම්බර් මස) 25 වැනි දින පීඨිකයක් තනා, වසර තුනකට පසු ක්‍රි.පූ. 164 දෙසැම්බර් 25 දින කැපකරන ලදී.

* මෙය සිහිකරන මංගල්‍යය දින අටක් එක දිගට පවත්වන ලදී.

**ජුදා සමාජ පන්ති**

- ජේසුස් වහන්සේගේ කාලයේ දී ජුදා සමාජයේ උසස් පන්තිය ලෙස පූජකවරු, වේද පණ්ඩිතයෝ, විනයධරයෝ සිටියහ. මොවුහු බොහෝදුරට සද්දුසිවරු වූහ.
- පරිසිවරුන් ද සමාජයේ උසස් පන්තියක් ලෙස සළකන ලදී.
- එසීන තාපසවරු ද තවත් ජුදා සමාජ පන්තියකි.
- මොවුන්ට අමතර ව පහළ සමාජ පන්තිය ලෙස අයකැමියෝ, ධීවරයෝ, වෙළෙඳෝ, සමාරියයෝ, ගොවියෝ, විසිරී සිටි ජුදෙව්වෝ ආදිහු ද, වෙනත් අන්‍ය ජාතිකයෝ ද, ස්ත්‍රීහ ද, වහල්ලු ද සිටියහ.
- මොවුහු ආගමික ප්‍රතිපත්ති පාදක කරගෙන ද, මුදල්, තනතුරු, වත්පොහොසත්කම් අනුව ද බෙදී සිටියහ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ඔබ සමාජය තුළ වූ සංස්කෘතික හා ආගමික සම්ප්‍රදායන් විග්‍රහ කරන්න.
- ජුදා සමාජ ක්‍රමය හා සමාජ පන්තිවල ව්‍යුහය සරලව සකස් කරන්න.
- ජුදා ආගමික සිරිත් විරිත් අධ්‍යයනය කරන්න.

**මූලාශ්‍රය :**


1. ශුද්ධ බයිබලය
2. New Jerome Biblical Commentary (NJBC)

**නිපුණතාව 7.0** : **කිතුනු ශිෂ්ටාචාරයක් බිහිවීම තුළ සමාජ සංස්කෘතික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් හරහා ජීවිත වෙනසක් කරා ගමන් කරයි.**

**නිපුණතා මට්ටම 7.1** : කිතුනු දහමේ මූලාශ්‍රය අධ්‍යයනය කර වත්මන් සභාවේ වර්ධනයට ඒවා ආදර්ශ කර ගනියි.

**කාලය** : කාලච්ඡේද 66

**ඉගෙනුම් ඵල** :

- කිතුනු ශිෂ්ටාචාරයේ පදනම වූ ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ අවබෝධ කර ගනියි.
- මතෙව් 5.7 පරිච්ඡේද කියවා කිතු සමිඳුන් ශ්‍රේෂ්ඨතම ගුරුවරයාණන් බව හඳුනා ගනියි.
- ජේසුස් වහන්සේගේ ජීවිත කාලය තුළ සමකාලීන ජුදයන් අතර උන්වහන්සේගේ විශාල වෙනසක් ඇති බව පිළිගනී.
- කිතුනුවන් හා ඔවුන්ගේ ජීවිත ක්‍රමය පිළිබඳ හඳුනා ගනියි.
- ශු. පාවුලුතුමාගේ ජීවිතය හා උන්වහන්සේගේ ප්‍රධාන ඉගැන්වීම මගින් සභාවේ වර්ධනය හා විනයානුකූල පැවැත්ම, මූලධර්ම හා සභා පිහිටුවීම පිළිබඳ අධ්‍යයනය කරයි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 7.1.1 ක්‍රිස්තියානි සංස්කෘතියේ පදනම වූ ක්‍රිස්තුස් වහන්සේ

- නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්නය. මනස්ථාපනය වන්න. සුබ අස්න අදහාගන්න. (මාක් 1:15) යනුවෙන් පවසමින් ක්‍රිස්තුස් වහන්සේ තම දූත මෙහෙවර ආරම්භ කළ සේක.
- ජේසුස් වහන්සේ තමන්ම ස්වාධීනව කිසිදු රාජ්‍යයක් ගොඩනැගීමට නොසිතූ සේක. මෙලොව උන්වහන්සේ ස්ථාපනය කිරීමට වෙර දැරුවේ දේව රාජ්‍යය පමණයි.
- එම දේව රාජ්‍යය මෙලොව ස්ථාපනය කිරීමට එකී ගුණාංග ස්ථාපන කිරීම අවශ්‍ය විය. එබැවින් එම ගුණාංග වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද එතුමන් ලොවට විදහා පෑ අයුරු දැකගත හැකි විය.
- ජුදා ආගමික නීතිරීති, සිරිත් විරිත්, සම්ප්‍රදාය අනුගමනයකර ජුදා ජාතිකයකු ලෙස මෙලොව එළිය දුටු දේවපුත්‍ර ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ එකළ සමාජ, ආගමික, සංස්කෘතික බලපෑම්වලට හසු නොවූ කෙනෙකු ලෙස ජීවත්වීමට කැමැත්තක් නොදැක් වූ සේක.
- එම ජනතාවට සත්‍ය ධාර්මික ජීවිතයක් ගත කිරීමට සලස්වා දේව රාජ්‍යයේ ගුණාංග, වටිනාකම් හඳුනාගෙන ජීවත්වීමට සැලැස්වීම එතුමන් තම දූත කාර්යය කරගත් සේක.
- වචනාර්ථයෙන් වූ ජුදා නීතිය ජුදා ප්‍රභූවරුන් ලෙස සිටියවුන් නොපිළිපැදි අතර, එම නීතිය සමාජයේ පහත් මට්ටමක සිටි ජනතාව අනිවාර්යයෙන් පිළිපැදිය යුතු තත්ත්වය ද එදා ජුදා සමාජය තුළ දැකිය හැකි විය.

- මෙවැනි පසුබිමක ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ නව සංස්කෘතියක් ස්ථාපනය කර නව මාර්ගයේ ස්ථාපිතයා ද නව දහමක් ගොඩනැගූ තැනැත්තා ද වූ සේක.

- නීතිය, සමානත්වය, ආදරය, කරුණාව, යහපත්කම, බැගෑපත්කම, බෙදාගැනීම, එකමුතුකම, සමාව දීම, දිළිඳු බව යන ගුණාංග උසස් ගුණාංග ලෙස පිළිගැනීමේ දී හොඳ සංස්කෘතියක් ගොඩනැගිය හැකිය යන්න තමා ජීවත් වූ ජුදා සමාජයේ ක්‍රියාත්මක කර නව සංස්කෘතියක් බිහිකළ සේක.

- එතුමන්ගේ උපත, ජීවිතය, දූත කාර්යය, දුක්විඳීම, මරණය හා උත්ථානය ආදිය මෙවැනි ගුණාංගවලින් සමන්විත වන හෙයින් අද කිතුනුවන්ට විශිෂ්ට සංස්කෘතියකට හිමිකම් කීමට හැකිවී ඇත.

- එබැවින් මෙවන් විශිෂ්ට සංස්කෘතියක් බිහිවීමට පදනම වූයේ ක්‍රිස්තුස් වහන්සේම වන බව පැවසීම ඉතා උචිත ය.

**ක්‍රිස්තුස් වහන්සේ යනු කවරෙක් ද ?**

- හෙබ්‍රෙව්, ඇරමයික් භාෂාහි වචනය වන "මෙසියා" හා ග්‍රීක වදන වන "ක්‍රිස්තුස්" යන්න අභිෂේක කරන ලද්දා යන අදහස දෙන වචනයන් වේ.

**පැරණි ගිවිසුම**

- පැරණි ගිවිසුමේ අභිෂේක කරන ලද්දා යන වචනය ප්‍රථමයෙන් ම රජවරුන්ට භාවිත කරන ලද්දකී. (1 සාමුවෙල් 9:16, 10:1, 10, 16:13)

- පසුව පූජකවරුන් සඳහා මෙම වචනය භාවිත කරන ලදී. (නික්මයාම 29:7, 30:22-33) පසුකාලීනව නායක පූජකවරුන් පමණක් නොව සියලුම පූජකවරුන් අභිෂේක කරනු ලැබූහ. (නික්ම : 28:41, 30:30, 40:15)

- ජුදයින්ගේ යුගාන්ත මෙසියස්තුමන් පිළිබඳ බලාපොරොත්තුව ඉතා වැදගත් ය. රාජකීය මෙසියස්තුමන්ව බොහෝ දෙනෙකුද, පූජක මෙසියස්තුමන්ව සමහරු ද බලාපොරොත්තු වූහ.

- ජුදයින් බලාපොරොත්තු වූ මෙසියස් ඔවුන්ගේ එදිනෙදා ප්‍රශ්න ගැටලුවලින් ඔවුන්ට විමුක්තිය ලබාදෙන වීරයකු විය. නමුත් සුවිශේෂ ග්‍රන්ථ තුළින් පැවසෙන මෙසියස් ඔට හාත්පසින් ම වෙනස් වූ කෙනෙකි.

- සුවිශේෂ ග්‍රන්ථ මෙසියස්තුමන් මගින් දේව රාජ්‍යය ස්ථාපනය කරනු ලබන බවත්, එතුමන් දේව සේවකයාණන් ලෙසත්, මිනිස් පුත්‍රයාණන් ලෙසත්, ගැලවුම්කරුවකු ලෙසත් පැමිණෙන බව පවසයි.

- දාවිත් රජ පෙළපතින් රජකු පැමිණෙතැයි ද එවිට දෙවියන් වහන්සේ තම සදාතනික රාජ්‍යය ස්ථාපනය කරන බව ද, එබැවින් මෙම රාජ්‍යය තුළ සාමය, නීතිය, අවංක බව, දෙවියන් වහන්සේට සැබෑ ලෙස වන්දනාමාන කරන දැනුම ආදියත් පවතින බව බලාපොරොත්තු වූහ.

නව ගිවිසුම

- ක්‍රිස්තුස් යන්න නව ගිවිසුම ජේසුස් වහන්සේට දුන් ගෞරව නාමයකි. පැරණි ගිවිසුමේ දිවැසිවරුන් පැවසූ සැබැවින්ම අභිෂේක කරනු ලැබූ තැනැත්තා මෙතුමා යන්න (1 සාමු. 2:10, ගීතා 2:2) සුවිශේෂ තුළින් නැවත නැවතත් ක්‍රිස්තුස් මොහු ය යි පවසා තහවුරු කෙරේ. (ජොහන් 20:31)

- අපොස්තුලුවරුන්ගේ කාලයේ දී මෙය ජේසුස් වහන්සේට හිමි නම විය. දාවිත්ගේ පුත්‍ර වූ මෙසියස් පිළිබඳ බලාපොරොත්තුවෙන් පසු දා ජුදා ජනතාවගේ වසර ගණනාවක විශ්වාසයටත්, ජේසුස් වහන්සේටත් ඇති තිර බන්ධනය මෙම නාට්‍ය තුළින් පිළිබිඹු වේ.

- සුවිශේෂ ග්‍රන්ථයන්හි ක්‍රිස්තුස් යන වචනය, සාමාන්‍යයෙන් භාවිත කෙරේ. *උදා* : ඔබ ක්‍රිස්තුවරයාණෝ (මාක් 8:29) ස්වාමීන් වහන්සේ අභිෂේක කළ ක්‍රිස්තුස් වහන්සේ (ලූක් 2:29) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ (ක්‍රියා 5:42)

- මෙය ක්‍රිස්තුස් වහන්සේගේ තවත් නමක් නැතහොත් ගෞරව නාමයක් ලෙස වෙනස් වූවා යැයි පැවසිය හැක.

  *උදා* : * දේව පුත්‍ර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ සුබ අස්නේ ආරම්භය මෙය ය. (මාක් 1:1)
  * අප පව්කාරයන්ව, සිටියදී ම ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා දිවි පිදූ බැවිනි (රෝම 5:8)
  * බෞතිස්ම ස්නාපනයෙන් ක්‍රිස්තුස් ජේසුස් වහනසේ හා සමඟ ඒකාබද්ධ වූ අප සියල්ලන්ම (රෝම 6:3)

- නමුත් මේ නාම දෙක ඇත්තවශයෙන්ම එකිනෙකට වෙනස් නම් විය. ජේසුස් යන්න චර්මඡේදන අවස්ථාවේ දී ලද නමයි. (ලූක් 2:21)

  මෙසියස් නැතහොත් ක්‍රිස්තුස් යන්න දෙවි මහෝත්තමයාණන්ට හා මානව වංශය අතර සමඟිය ඇති කරන්නකු ලෙස, මධ්‍යස්ථකරුවෙකු ලෙස සිටින එතුමන්ගේ ගැලවීමේ කාර්යය මනාව පිළිබිඹු කරන නමක් වී ඇත. සමහර අවස්ථාවල දී සුපුරුදු ලෙස භාවිත කරන ක්‍රමය වෙනස්කර ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ යැයි පාවුලු තුමා සඳහන් කරයි. (රෝම 3:24, 8:2, 39)

**ක්‍රිස්තුස් - ජේසුස් ලද ගෞරව නාමයයි**

- ජේසුස් වහන්සේ ශුද්ධවන්ත භාවය, අධිකාරී බලය හා බලය දැක විශ්මිත වූ ජනයා (ජොහන් 7:31, 40-42)

  මෙතුමාණන් දාවිත්ගේ පුත්‍රයා විය හැකි ද ? (මතෙව් 12:23) යැයි තම තමන් අතර කථා කරගත්හ.

- ජුදා නායකයින් එතුමන්ව මෙසියස් ලෙස කවරෙකු හෝ පිළිගතහොත්, ඔහුව ධර්ම ශාලාවෙන් නෙරපා දැමීමට තීරණය කළහ. (ජොහන් 9:22)

- එතුමන්ගේ විශ්මිත බලය අත්දුටුවන් දාවිත්ගේ පුත්‍රයාණෙනි යැයි මොරගැසූහ. (මතෙව් 9:27, 15:22, 20:30)

- ඔබම මෙසියස් යැයි බොහෝ දෙනා තම විශ්වාසය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළහ. ජේසුස් වහන්සේගේ බෞතීස්ම ස්නාපනයට පසු පළමු ශ්‍රාවකයෝ අපට මෙසියස් වහන්සේ හමු වූහ යි කීය. (ජොහන් 1:41, 45, 49)

- මා කවරෙකු කියා ඔබ කියන්නාහු ද ? යන ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ඔබ ක්‍රිස්තුවරයාණෝය (මාක් 8:29) යන පේදුරුතුමාගේ විශ්වාසයේ ප්‍රකාශය පිළිබඳ සුවිශේෂකවරු මහත් ඉහළින් සඳහන් කරති.

- නමුත් මොවුන්ගේ විශ්වාසය සත්‍ය වුව ද, එම විශ්වාසය පරිණත විය යුතු තත්ත්වය පැවතුණි. මන්ද යත් එතුමන් ව අල්ලාගෙන ගොස් රජකු කිරීමේ අදහස තවමත් ඔවුන්ගෙන් පහව නොගිය හෙයිනි. (ජොහන් 6:15)

**ජේසුස් වහන්සේගේ මානසිකත්වය**

- මේ පිළිබඳ ජේසුස් වහන්සේ නිහතමානී අදහස් ඇත්තෙකු වූ සේක. තමනට තමන් ම මෙසියස් යන ගෞරව නාමය පිරිනමා නොගත් සේක.

- දාවිත්ගේ පුත්‍රයාණෙනි යැයි තමන්ම ආමන්ත්‍රණය කිරීමට අවසර දුන් නමුත් මෙසියස් යැයි යක්ෂාවේශවූවන් තමන්ට ආමන්ත්‍රණය කරන විට එය නැවැත්වූ සේක. (ලූක් 4:41) තහනම් කළ සේක.

- පේදුරුගේ විශ්වාසයේ ප්‍රකාශයට පසු තමන් මෙසියස් බව කිසිවකුට නොකියන ලෙස තම ශ්‍රාවකයන්ගෙන් ඉල්ලා සිටි සේක. (මතෙව් 16:26)

- මෙසියස් තුමා පිළිබඳ තම ශ්‍රාවකයින් වෙත වූ අදහස ශුද්ධවන්ත කිරීමේ උත්සාහයේ යෙදුණු සේක. දුක්විඳින සේවකයා ලෙස තම මෙසියාන දූත සේවාව ආරම්භ කර මනුෂ්‍ය පුත්‍රයෙකු ලෙස තම ජීවිතය දානය කර මහිමයට පත් වූ සේක. (මාක් 8:31, 9:31, 10:33-34)

- අවසානයේ දී ආගමික නායකයින් එතුමන් ව විමසූ අවස්ථාවේ දී, නුඹ දේව පුත්‍ර මෙසියස් ද ? යන්නට ජේසුස් වහන්සේම පිළිතුරු දෙන ලෙස නියෝග කළහ. ජේසුස් වහන්සේ එම ගෞරව නාමය ප්‍රතික්ෂේප නොකර තමා දෙවියන් වහන්සේගේ දකුණු පසෙහි වැඩසිටීමට බිහිවූ මනුෂ්‍ය පුත්‍රයාණන් යැයි සියල්ල අභිබවා ගිය දර්ශනයකින් පැහැදිළි කළ සේක.

  දුක් විඳීම ආරම්භයේ ප්‍රකාශ කළ මෙම ප්‍රකාශය අවසානයේ එතුමන් ව මරණයට පත් කිරීමට හේතුවක් විය. (මතෙව් 26:63)

- මෙලෙස එතුමන්ගේ මෙසියස් ගෞරව නාමය සමඟ (මතෙව් 26:68, මාක් 15:32, ලූක් 23:35-39) රජකු යන ගෞරව නාමය ද එකම අවස්ථාවේ පහත්කොට සැලකූහ.

- ශ්‍රාවකයෝ එතුමන්ගේ උත්ථානයෙන් පසු එතුමන් සඟවා සිටියේ කුමක් ද යන්න වටහා ගත්හ.

  ක්‍රිස්තුස් වහන්සේ ඒ දුක්විඳ ඉක්බිති ස්වකීය තේජශ්‍රියට පැමිණිය යුතුව තිබුණා නොවේද ? (ලූක් 24:26) මෙසියස් තුමා දුක්විඳීම තුළින් ලැබූ මහිමය ලෞකික මහිමයට වඩා උසස් වන බව දැනගත්හ. මෙසියස්තුමා දුක්විඳ මරණයෙන් තුන්වන දා උත්ථාන වෙතැයි යන දේව වාක්‍ය විශ්වාස කළහ.

**උත්ථාන වූ ජේසුස් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ වන සේක**

- පාස්කු අත්දැකීම මෙසියස් තුමා ගැන අදහස බිඳහෙළීමට සමත් විය.

- ශුද්ධ වූ සභාව ජේසුස් වහන්සේව - මෙසියස් - ක්‍රිස්තුස් යැයි ප්‍රකාශ කිරීමට ආරම්භ කළාය. මෙලෙස ප්‍රකාශ කිරීමට හේතු තිබුණි. ජේසුස් ලෙස පැමිණියේ තමන් බලාපොරොත්තු වූ ක්‍රිස්තුස් වහන්සේ යැයි ජුදයින්ට පෙන්වීමට අවශ්‍ය විය. මෙලෙස පෙන්වීමට පැරණි ගිවිසුමත්, අලුත් ගිවිසුමත් එකිනෙකට සම්බන්ධය. ඒ සමඟ පැරණි ගිවිසුම නව ගිවිසුමෙන් පූර්ණත්වයට පත් වේ යැයි ස්ථිර වශයෙන් ගෙනහැර පායි.

- මෙම චින්තනයට අනුව,
  * දාවිත්ගේ සැබෑ පුත්‍රයාණන් ජේසුස් වහන්සේ වන සේක. (මතෙව් 1:1, ලූක් 1:27, රෝම 1:3, ක්‍රියා. 2:29-13:23)
  * එතුමන් ශුද්ධාත්ම බලයෙන් මවගේ කුස තුළ මාංශගත වූ අවස්ථාවේ සිට (ලූක් 1:35) තම පියාවන දාවිත්ගේ සිංහාසනයේ වැඩ සිටීමට ස්ථිර කරනු ලබන්නේ ය. (ලූක් 1:32)
  * එතුමන් ඉශ්‍රායෙල්වරුන්ගේ රාජ්‍යයට අවසානය තීරණය කරන ආකාරයෙන් මෙලොව දේව රාජ්‍යය ස්ථාපනය කිරීමට උපන් කෙනෙකි. එතුමන්, පොරොන්දු වූ ශුද්ධාත්මයාණන් තම පියාණන් වහන්සේගෙන් ලබා ප්‍රදානය කළ සේක. (ක්‍රියා. 2:33)

- පසුව ඔබ කුරුසියෙහි ඇණ ගැසූ මේ ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේ විසින් ස්වාමීන් බවටත්, ක්‍රිස්තුන් බවටත් පත් කළ සේක. (ක්‍රියා. 2:36)

  මෙලෙස තම උත්ථානය මගින් අද ජේසුස් වහන්සේ රජුට අදාළ මහිමයෙන් පසුවන සේක. මෙම මහිමය දෙවිඳුන්ගේ නව මැවිල්ලට සම්බන්ධ වේ. මානුෂික මහිමයට වඩා උසස් මහිමයක් ජේසුස් වහන්සේ ලබාගත් සේක, යන්නට ඔවුන් වහන්සේගේ උත්ථානය පැහැදිළිව සාක්ෂි කරයි.

**නාසරෙත් හි ජේසුස් වහන්සේ**

- නාසරෙත් හි ජේසුස් වහන්සේව, එතුමන්ගේ උත්ථානයෙන් පසු එතුමන්ගේ ශ්‍රාවකයෝ සහ එතුමන් කෙරෙහි විශ්වාසය තැබූ සියල්ලෝම මෙසියස් හෙවත් ක්‍රිස්තුස් වහන්සේ ලෙස පිළිගත්හ.

- ක්‍රිස්තුස් වහන්සේ ලෙස නාසරෙත් හි ජේසුස් වහනසේගේ ජීවිතය, දූත කාර්යය, ඉගැන්වීම් පිළිබඳ දැක්ම ක්‍රිස්තියානියටත්, ක්‍රිස්තියානිය විසින් ඇතිකළ ශිෂ්ටාචාරයටත් ඇති කළ බලපෑම පදනම ලෙස ගෙන ඇත.

- එතුමන්ගේ ජීවිතය, දූත කාර්යය, ඉගැන්වීම් පිළිබඳ දැක්ම කෙබඳු වී දැයි දැනගැනීම වැදගත් වේ.

**ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් (මතෙව් 5 - 7 පරිච්ඡේද)**

- ජේසුස් වහන්සේගේ කන්ද උඩ දේශනාව මතෙව් සුවිශේෂයේ 5 - 7 දක්වා පරිච්ඡේදවල සඳහන් වේ. ජේසුස් වහන්සේ උස් තැනක වාඩිවී තම ඉගැන්වීම් අධිකාරී බලයෙන් යුතු ව ප්‍රකාශ කළ සේක. මෙම කන්ද උඩ දේශනාව තුළින් උසස් වටිනාකම් උන්වහන්සේ තම ශ්‍රාවකයින්ගේ ජීවිතයට නීති ලෙස ඉගැන්වූ සේක.

- නව මෝසෙස් ලෙස ජේසුස් වහන්සේව වෙන්කර සුවිශේෂීව දක්වනු පිණිස ජුදා නීතිවලට අදාළව නව නීතියක් ලෙස කන්ද උඩ දේශනාව මතෙව් සුවිශේෂ කතුවරයා සඳහන් කරයි.

- මේ කන්ද උඩ දේශනාවේ ජේසුස් වහන්සේ මෙසියස් ලෙස දර්ශනය වූ සේක. පැරණි ගිවිසුමේ පොරොන්දු සම්පූර්ණ වී එය නව යුගයක් ස්ථාපනය කරන්නෙකු ලෙස පැමිණි සේක.

- ජේසුස් වහන්සේ යුගාන්තයේ පැමිණෙන දේව දූතයෙකු ලෙස පෙනී සිටිය සේක. එතුමන්ගේ දූත කාර්යයට කන්ද උඩ දේශනාවේ පැමිණෙන භාග්‍යවන්තයෙකු යන්න පදනමක් වේ. මෙම ඉගැන්වීම් ජේසුස් වහන්සේ නව නීති පොතක් ලෙස ඉදිරිපත් නොකළ සේක. ඒ වෙනුවට පැරණි ගිවිසුමේ සම්ප්‍රදාය සත්‍යාලෝකය තුළින් පැහැදිළි කරන සේක.

- ජේසුස් වහන්සේගේ ජනතාව යහපත් ගුණාංගවලින් හෙබි අය වියයුතු යැයි පමණක් ඉගැන්වූයේ නැත. එතුමා ජනතාවගෙන් බලාපොරොත්තු වූයේ එතුමන් ඉගැන්වූ දේව රාජ්‍යය ජනතාවගේ කැමැත්තෙන් පිළිගත යුතු ය යන්නයි. එම දේව රාජ්‍යයට ඇතුළුවීමට නම් මිනිසා කුමක් කළ යුතු ද යන්නත්, කෙබඳු ගුණාංගවලින් හෙබි විය යුතු ද යන්නත් ජේසුස් වහන්සේ ගෙනහැර පෑ සේක.

- කන්ද උඩ දේශනාවේ සුවිශේෂී පණිවිඩය තුළින් ගොඩනැගෙන ජීවිත පැවැත්ම කෙසේ ද යන්න ගෙනහැර දක්වයි.

**භාග්‍යවන්තයෝ (මතෙව් 5:3-12)**

- මතෙව් සුවිශේෂයේ සඳහන් කන්ද උඩ දේශනාවේ මුල් කොටස භාග්‍යවන්තයෝ (Beatitudes) යන විෂයක් ලෙස සඳහන් වේ.

- දේව රාජ්‍යය පූර්ණත්වයට පත්වන විට කෙබඳු ගුණාංග හා ක්‍රියා දෙවිඳුන්ගෙන් අප තිළිණ ලබන්නට සුදුසු මට්ටමක පවතීද යන්නත්, එබැවින් දැන් අප ජීවිතයේ අප ගොඩනැගිය යුතු ගුණාංග හා ක්‍රියාකාරකම් කුමක් ද යන්නත් මෙම භාග්‍යවන්තයෝ යන කොටස පෙන්වයි.

- මෙය මකාරියොස් (Makarios) යන ග්‍රීක වචනයේ පරිවර්තනයකි.

- පැරණි ගිවිසුමේ භාග්‍යවන්තයෝ යන වචනය ජීවිතයේ පූර්ණත්වය අත්දකින තත්වයක් විදහාපායි. එම අත්දැකීම දෙවිඳුන් කෙරෙහි ඇති විශ්වාසය තුළින් ද නීති සංග්‍රහය තුළින් ද මතුවේ. (ගීතාවලිය 2:12, 40:4, 145:5-7)

  ගීතාවලිය 1:1-6 දක්වා ගීතයෙන් පුද්ගලයෙකුගේ ප්‍රශංසාත්මක හැසිරීමක ගුණාංග විදහා දක්වයි. භාග්‍යවන්තයෝ අදමිටු මගේ නොගොස් දෙවිඳුන්ට උචිත ආකාරයෙන් දිවි ගෙවති.

- නව ගිවිසුමේ භාග්‍යවන්තයින් දේව රාජ්‍යයෙහි පංගුකාරයින් වීම තුළින් ලබන සතුටත්, ගැලවීම නිධානයක් ලෙස ලබන නිසාත් මතුවන මානසිකත්වය පෙන්වයි. (ලූක් 1:48, මතෙව් 13:16, ජොහන් 20:29, රෝම: 4:6-7)

- සැබෑ වටිනාකම් ලෙස ලෞකිකව නොපිළිගන්නා දෑ දෙවියන් වහන්සේ කණපිට පෙරළා දමන සේක යන අදහස භාග්‍යවන්තයෝ යන සුබපැතුම් වදන හා චක්ව පැවසේ.

- අප බැගෑ සිතැත්තන් ලෙස, ශෝකවන්නන් ලෙස, නිහතමානී ගුණ ඇත්තන් ලෙස, යුක්තියට සාපිපාසා ඇත්තන් ලෙස, දයාවන්තයින් ලෙස, නිර්මල සිතැත්තන් ලෙස, සාමය ඇති කරන්නන් ලෙස, යුක්තිය උදෙසා පීඩා විඳින්නන් ලෙස, ජීවත් වීම ඉමහත් අභියෝගයකි. නීතිය පිළිබඳ ඇති දේව වාක්‍ය දෙවියන් වහන්සේට උචිත අවංකව කටයුතු කිරීම දක්වයි.

- භාග්‍යයන් පිළිපදින්නෝ ක්‍රිස්තු ශ්‍රාවකයින්ගෙන් සමන්විත නව සමාජයක් වෙති. මොවුහු පොලොවේ ලුණු ලෙස ද ලෝකයට ආලෝකය ලෙස ද සිටිති. (මතෙව් 5:13-16)

  මොවුහු තම ජීවිතය තුළින් දෙවියන් වහනසේට ප්‍රශංසා කිරීමට අන්‍යයින්ව ද කැඳවති.

**ව්‍යවස්ථාවලිය හා යහපත් ජීවිතය**

ව්‍යවස්ථාවලියට ස්ථිර වටිනාකමක් ඇතැයි ජේසුස් වහන්සේ ඉගැන්වූ සේක. ශ්‍රාවකයින්ගේ ජීවිත වෙන්කර දක්වනුයේ අන් අය හා සැසැඳීමේ දී ඔවුන්ගේ ජීවිත පැවැත්ම යහපත් වන නිසාය. (මතෙව් නි. 17:20)

මෙම ජීවිත පැවැත්ම විශේෂිත වන්නේ දෙයාකාරයක ජීවිත පැවැත්මක් ඇති හෙයිනි. එකක් අසල්වැසියන් කෙරෙහි ද (මතෙව් 5:41-48) අනෙක දෙවියන් කෙරෙහි ද (මතෙව් 6:1-7:12) දක්වන ක්‍රියාකාරී පැවැත්මයි. මෙම පැවැත්ම සුවිශේෂී වන්නේ ප්‍රේමය තුළිනි. (මතෙව් 5:44-45, 7:12) සැබැවින්ම දෙවියන් වහන්සේ ප්‍රේම කරන ආකාරයට ප්‍රේම කිරීම ශ්‍රාවකයින් පූර්ණත්වය කරා යාමයි. (මතෙව් 5:48)

**විරුද්ධ ඉගැන්වීම් හයක් (මතෙව් 5 :21-48)**

- පැරැන්නන්ට කී . . . එහෙත් මම ඔබට කියමි යන ආකාරයෙන් එම විරුද්ධ ඉගැන්වීම් ගොඩනැගී ඇත.

- කෝපය, කාම මිථ්‍යාචාරය, දික්කසාදය, දිවුරුම්, පළිගැනීම්, සතුරන් කෙරෙහි මෙත් සිත් වැඩීම වැනි ඉගැන්වීම්වල පැරණි අදහස ජේසුස් වහන්සේ නව ක්‍රමයකට පැහැදිළි කළ සේක.

- සුවිශේෂ ඉගැන්වීම්වල සැබෑ අදහස කුමක්ද යන්න මතුපිටින් පැහැදිළි නොකර එහි ගැඹුරු අදහස ගෙන හැර දක්වන සේක.

- ජේසුස් වහන්සේ ව්‍යවස්ථාවලිය හෝ දිවැසාවලිය අවලංගු කිරීමට නොපැමිණි සේක. ඒ වෙනුවට ඒවා සම්පූර්ණ කළ සේක. (මතෙව් 5:17)

**ජුදා ආගමික සම්ප්‍රදායයන් (මතෙව් 6:10-18).**

- ජුදා ආගමික පිළිවෙතක් වන දන්දීම වැනි පුණ්‍ය ක්‍රියා කිරීම, යාච්ඤා කිරීම, උපවාසය ආදිය පිළිබඳ ව ජේසුස් වහන්සේ ගැඹුරින් පැහැදිළි කරන සේක.

- අන් අය ප්‍රශංසා කළ යුතු හෙයින් මෙම ක්‍රියා නොකර,දෙවිඳුන් ඉදිරියේ පමණක් ඒවා සිදුකර එතුමන්ගෙන් ඵල විපාක ලබාගත යුතු ය යන්න එම ඉගැන්වීමයි.

**සග සම්පත් පිළිබඳ ඉගැන්වීම (මතෙව් 6:19 - 7:12)**

- සැබෑ වස්තුව ඇත්තේ කොහේ ද යන්න ජේසුස් වහන්සේ පැහැදිළි කරන සේක. මානසික සුවය ලැබීම සඳහා මඟ පෙන්වන සේක. යාච්ඤාවේ ස්වභාවය දක්වන සේක.

- අවසානයේ අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමති ද, ඔබත් ඒ දේම ඔවුන්ට කරන්න යන රන් අණ අපට දෙන සේක.

**ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් තුළින් ඉදිරිපත් කෙරෙන අභියෝග (මතෙව් 7:13 - 27)**

- මෙය පටු දොරටුවෙන් ඇතුළුවීම වැනි ය. මන්දයත් හිස් වචනවලින් පමණක් එතුමන්ගේ ශ්‍රාවකයෙකු විය නොහැක. වචන හා ක්‍රියා එකට සම්බන්ධව යහපත් වචනත්, යහපත් ක්‍රියාත් අප ජීවිතයේ මුද්‍රා ලෙස පත්වන විට සත්‍ය ලෙසම අප ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් බවට පත් වෙමු.

- ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් මත තිර අත්තිවාරමක් මත ගොඩනැගෙන ජීවිතය අභියෝගවලට මුහුණ දෙන නමුත් දේව රාජ්‍යයට අදාළ ක්‍රියා කිරීමේ දී ස්ථිරව පවතී. (මතෙව් 7:24-27) මොහු නැණවත් ශ්‍රාවකයකු වේ.

  * සියල්ලටම වඩා වටිනා වස්තුව දේව රාජ්‍යය යැයි ජේසුස් වහන්සේ කළ ඉගැන්වීමට අනුව, එතුමන් දේව රාජ්‍යයේ පංගුකාරයන් වීමට අවශ්‍ය නියමයන් ලෙස තම ධර්මදූත ඉගැන්වීම් කටයුතු කළ සේක.

- දේව රාජ්‍යය පූර්ණත්වය පත්වන විට අප ගතකරන ජීවිත අනුව ඵලවිපාක ලැබෙන බව වටහාගෙන, යහපත් ඵල ලැබීමේ අරමුණින් ජීවත් විය යුතුය. ශුද්ධ වූ ග්‍රන්ථයේ දේව කැමැත්ත ප්‍රකාශ කරන විට එම කැමැත්තට අනුව දිවිගෙවන අදහසින් අප යහපත් ජීවිතයක් ගතකළ යුතු ය.

- ස්වර්ගික පියාණන් අප කෙරෙහි කෙලෙස ක්‍රියාකරන සේක් ද ? එලෙසම අපත් අන් අය කෙරෙහි ක්‍රියාකිරීමට ඉදිරිපත් වී දෙවි පියාණන්ගේ ක්‍රියාකලාපය අප ක්‍රියාවන්ට ආදර්ශයක් කරගත යුතු ය. (මතෙව් 5:43-48)

- ජේසුස් වහන්සේගේ කන්ද උඩ දේශනාවේ මංගල වාක්‍ය 8 ව්‍යවස්ථාවක් ලෙස දැකීම සුදුසු නැත. ඒ තුළින් අපව සදාචාරමය ජීවිතයකට මඟ පෙන්වන බවට සැකයක් නැත. කිතුනුවන් එබඳු මානසිකත්වයකින් ක්‍රියාකළ යුතුයැයි ද කෙලෙස ජීවත් වියයුතු යැයි ද එම මංගල වාක්‍ය තුළින් ගෙනහැර දක්වයි. කිතුනු ගුණාංග අප තුළ ඇති කිරීමටත්, කිතුනු පැවැත්මට ආදර්ශයක් ලෙසත් ඒවා පවතී. ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කිරීමටත්, එතුමන්ගේ ශ්‍රාවකයකු වීමටත් මේවා සහය වේ.

- දේවරාජ්‍යය නැමති සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ උපකරණය ලෙස අපගේ සිතුවිලි, වචන, ක්‍රියා සියල්ල වෙනස් වී බැබලෙන අභියෝගාත්මක, වෙනස් සංස්කෘතියකට මඟපෑදිය යුතු ය. දේව රාජ්‍යය පිළිබඳ ඉගැන්වීම්වලට අනුව ගොඩනැගෙන ජීවිතය අන් අයට රසදෙන ලුණු ලෙසත්, ආලෝකය දෙන ආලෝකයක් ලෙසත් පවතින ධර්මදූතික ජීවිතයක් ලෙස පවතී. (මතෙව් 5:13-16)

### 7.1.2 අපෝස්තලික සම්ප්‍රදාය හා එහි ඉගැන්වීම්

**ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම (ක්‍රියා 2:2-3)**

- ජුදෙව්වරුන්ගේ මංගල්‍යවලින් වැදගත් මංගල්‍යයක් වන පෙන්තකොස්ත මංගල්‍යයට මිහිපිට හැම රටකින් ම පැමිණි භක්තිමත් ජුදෙව්වරු පෙරුසලමෙහි එක්රැස් වී සිටි අවස්ථාවේ දී ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම සිදුවිය.

- ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම ශුද්ධ වූ සභාවේ දූත කාර්යයේ ආරම්භය හා ලෝකය තුළ ශුද්ධ වූ සභාවේ උපත ද, විසිරී ගිය දේව දරුවන්ව එකමුතු කරවූ අවස්ථාව ද බව පෙනේ.

- ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසියේ මරණයෙන් පසු අපෝස්තලුවරුන් (ප්‍රේරිතවරුන්) බියෙන් සේනාකුළු නම් වූ ශාලාවේ සැඟවී සිටියෝය.

- ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය හා දර්ශනය වීම ඔවුන්ට එක්තරා සිත් හැරීමක් ගෙන දුන්නත්, ක්‍රිස්තුන් වහන්සේගේ ස්වර්ගාරෝපණයෙන් පසු නැවතත් ඔවුහු බියෙන් මිරිකී සිටියෝය.

- මෙම පසුබිම තුළ වසා තිබූ ශාලාව තුළට ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම සිදුවිය. සැඬ සුළඟක් හමන්නාක් වැනි හඬක් හදිස්සියෙන් පැමිණියෝ ය. ගිනිදළු වැනි දිව් බෙදීගොස් ඔවුන් එකිනෙකා මත පිහිටුවනු ඔවුන්ට පෙණුනි.

- ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ ඔවුන්ගේ ජීවිතයේ වෙනස්වීමක් ඇති වූයේ ය. අපෝස්තුලුවරුන් ප්‍රඥා සම්පන්නව ධෛර්‍යමත් වී මිහිපිට සෑම රටකින් ම පැමිණි ජුදෙව්වරුන්ට තේරුම්ගත හැකි භාෂාවෙන් ශුභාරංචිය දේශනා කළෝය.

- මෙසේ ශුභාරංචිය දේශනා කිරීමේ දූත කාර්යය ඇරඹුණේ ශුද්ධාත්මයාණන්ගේ පැමිණීමේදී ය.

- ශුද්ධ වූ සභාවේ ආරම්භයට තවත් හේතුවක් වූයේ අපෝස්තලුවරුන් රැස්වී සිටි ජනතාවට තේරුම්ගත හැකි භාෂාවෙන් ඔවුන් දේශනා කිරීමයි.

- දෙවනුව අපෝස්තලුවරුන් කථාකළ දේ විවිධ රටවල්වලින් පැමිණි ජනයා තේරුම් ගත් බව.

- ශුද්ධාත්මයාණන්ගේ පැමිණීමේ දී ලෝ පුරා ශුද්ධ වූ සභාව ආරම්භ වෙයි.

- ශුද්ධ වූ ජනතාව එකතු වූ ආකාරය බලන විට, පෙන්තකොස්ත මංගල්‍යයට ජුදා ජාතිකයින් හා අන්‍ය ජාතිකයන් පෙරුසලමෙහි එක්රැස් වී සිටි බවත්, ඔවුන් සැම ප්‍රේරිතවරුන් කළ දේශනා අසා, එය සිතට ගෙන, පූප කැඩීමේ දී එකතු වී දේව දරුවන්ගේ පවුලක් වූ බව සඳහන් කිරීමෙන් ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම නව සමාජයක් බිහිවීමට, නව ශිෂ්ටාචාරයක් ගොඩනැගීමට හේතු වූ බව අපට තේරුම් ගත හැකිය.

**ඩිඩාකේ**

**ඉගැන්වීම්** (Teachings & Instructions)

ඩිඩාකේ යනු අපෝස්තලුවරුන් (ප්‍රේරිතයන්)දොළොස්දෙනාගේ ඉගැන්වීම යන නමින් ද හැඳින්වෙන පැරණි ක්‍රිස්තියානි අත්පොතකි. එය පළමුවන සියවස පමණ දී සිරියාවේ දී රචිත බව සාමාන්‍යයෙන් උගතුන්ගේ පිළිගැනීමය. මෙම ලියවිල්ල කලක් නැතිවී තිබී ක්‍රි.ව. 1873 දී නිකොමීඩියාවේ ග්‍රීක රදගුරුවරයෙකු වූ ෆිලොතෙඕස් බ්‍රියෙනියොස් (Philotheos Bryennios) විසින් සොයාගන්නා ලදී. එය ශීලධර්ම, ක්‍රිස්තියානි සංවිධාන ගොඩනැගීමට උපදෙස්, ජනවන්දනා ක්‍රම යනාදිය සම්පිණ්ඩනය කළ ග්‍රන්ථයකි. දිව්‍ය සත්ප්‍රසාදය වහන්සේ, බෞතිස්ම ස්නාපනය, උපවාසය සහ පැරණිම යාච්ඤා එහි අඩංගු වේ. ශුද්ධ වූ සභා සේවයේ යෙදී සිටි රදගුරුවරුන් (Bishops) උපස්ථායකයින් (Deacons) සහ දිවැසිවරුන් (Prophets) සම්බන්ධයෙන් ද කරුණු අඩංගු වේ. මුල් කාලයේ දී සමහර කිතුනු සභාවල නැතහොත් කිතුනු සංඝයන් මෙම පොත නව ගිවිසුමේ ග්‍රන්ථ සමඟ සම තත්වයෙහිලා සලකා ඇත. සභාවේ ශුද්ධ වූ නමස්කාර මෙහෙයන්වල දී නම ගිවිසුමේ ග්‍රන්ථ සමඟ මෙම පොතේ කොටස් ද කියවා ඇත. කිතුනු දහම වැළඳගැනීමට සිටි ආධුනිකයන්ට ධර්මය ඉගැන්වීමේ දී මෙම ග්‍රන්ථය බොහෝසෙයින් උපකාරී වූ බව සභා ඉතිහාස පොත්වල සඳහන් වේ.

එහි අර්ථය නම් අපෝස්තුලුවරු 12 දෙනාගේ ඉගැන්වීම යන්නයි. මෙම ග්‍රන්ථය දෙවන සියවසරට අයත් බව බොහෝ දෙනාගේ මතයයි. (ක්‍රි.ව. 100 - 150) නව ගිවිසුමෙන් පිට ඇති සභාවේ ඉගැන්වීම් අඩංගු මුල්ම කෘතිය මෙය වේ. මේ නිසා මෙම ග්‍රන්ථය උප-අපෝස්තලික යුගයට අයත් වැදගත් ලියවිල්ලකි.

**ග්‍රන්ථයේ පසුබිම**

ක්‍රි.ව. 1873 දී කොන්ස්තන්තිනෝපලයේ දේව මාලිගාවක තිබී ෆිලෝතෙඕස් බ්‍රියෙන්නිඕස් (Philotheos Bryennios) නමැති රදගුරුතුමා විසින් මෙම ග්‍රන්ථය සොයා ගන්නා ලදී. එය 1056-1057 පමණ කාලයට අයත් ග්‍රීක් බසින් ලියන ලද පිටපතකි. රදගුරුතුමා විසින් මෙම පිටපත 1883 දී නැවත මුද්‍රණය කොට ප්‍රසිද්ධියට පත් කරන ලදී. මෙම ග්‍රන්ථයේ කර්තෘත්වය ගැන ද ලියන ලද දිනය හා ස්ථානය ගැන ද වැඩිදුර සවිස්තර සඳහන් ව නැත. මේ නිසා මෙම ග්‍රන්ථය ලියැවුණු කාලය පිළිබඳ විවිධ මත පවතී. ක්‍රි.ව. 201 දී ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් තුමා මෙම ග්‍රන්ථයෙන් උපුටා කොටස් දේව වචනය සේ සලකා තම ලියැවිලිවල සඳහන් කර ඇත. එව්සේබියස් සහා පියාගේ ලිපිවල ද ඩිඩාකේ ගැන සඳහන් වේ. නව ගිවිසුමේ ඇතැම් පොත් ලිවීමට පෙර මෙය ලියවී ඇතැයි ඇතැමුන් අනුමාන කරන අතර සුවිශේෂවලට පසු ලියූ පළමු පොත වශයෙන් ද සමහරු නම් කරති. කෙසේ වෙතත් අවසාන නිගමනයට අනුව මෙය ක්‍රි.ව. 100-150 අතර ලියවෙන්නට ඇතැයි යන්න බොහෝ දෙනාගේ මතයයි.

**ග්‍රන්ථයේ වැදගත්කම**

මුල් සභාපියවරු හා ඒ අයගේ දේව ධර්මයන් පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට තිබෙන එකම ඓතිහාසික කෘතිය ඩිඩාකේ වශයෙන් නම් කළ හැක. මෙහි සුවිශේෂත්වය නම් මෙම ග්‍රන්ථය බොහෝ තැන්වල අඩංගු වී තිබෙන්නේ අපොස්තුලුවරු 12 දෙනාගේ ක්‍රියා සමඟ සම්මිශ්‍රණය වූ ඉගැන්වීම් ය. ඒ නිසා සමහරු ඩිඩාකය අපෝස්තුලුවරු විසින් ලියන ලද්දක් බව පෙන්වා දෙති.

**අන්තර්ගතය**

මෙම ග්‍රන්ථය ඩිඩාකය නමින් අද හැඳින්වුවත් මෙය මුල් වශයෙන් අපෝස්තුලුවරු 12 දෙනාගේ ඉගැන්වීම් වශයෙන් නම් කර තිබෙන්නට ඇතැයි සභා ඉතිහාසඥයෝ පවසති.

නමුත් අපෝස්තුලුවරු ලියූ බවට සම්පූර්ණ වශයෙන් තවමත් පිළිගැනීම අපහසු ය. කෙසේ වෙතත් ඒ අයගේ ඉගැන්වීම් ඇතුළත් පොතක් ලෙස පෙන්වා දිය හැකිය. මෙම කෘතිය පරිච්ඡේද 16කින් පෙන්වා දිය හැකිය. මෙකී පරිච්ඡේද 16 කොටස් 03 කට බෙදා ඇත.

1. ශීල ධර්ම (1-6 පරිච්ඡේද)
2. ජනවන්දනාව සම්බන්ධ ඉගැන්වීම (7 - 10 පරිච්ඡේද)
3. විනය නීති සංග්‍රහය (11-15 පරිච්ඡේද)
4. ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීම (16 පරිච්ඡේදය)

**ඩිඩාකේ නම් ග්‍රන්ථයේ දේව ධාර්මික ඉගැන්වීම්**

**ශීල ධර්මය (1-6)**

මෙම කොටසින් ක්‍රිස්තියානිකාරයන් වශයෙන් පිලිපැදිය යුතු දේ උගන්වයි. ශීල ධර්මය නමැති දේව ධර්ම විෂයයේ ආරම්භය ඩිඩාකේ බව කිව හැකිය. මෙහිදී ක්‍රිස්තියානිකාරයින්ගේ යුතුකම් හා වගකීම් පෙන්වා දී ඇත. විශේෂයෙන් මාර්ග දෙකක් පිළිබඳ අවධානය යොමු කරයි. එනම් ජීවනයේ මාර්ගය හා මරණයේ මාර්ගයයි. මෙම මාර්ග පිළිබඳ ව පරිච්ඡේද 1 - 6 දක්වා ඉගැන්වීම් කරනු ලැබේ. ජීවනයේ මාර්ගය තෝරාගන්නා ලෙස අනුශාසනා කරයි. ජීවනයේ මාර්ගය ලෙස, පළමුව ඔබ මැවූ දෙවියන් වහන්සේට ප්‍රේම කළ යුතුය. මරණයේ මාර්ගය යනු අයහපත් දුෂ්ඨ ශාප ලත් මාර්ගයයි. එම මාර්ගය දෙවියන් වහන්සේගෙන් වෙන් කරන මාර්ගයයි.

*උදා :* මිනීමැරීම්, කාම මිථ්‍යාචාරය, මිත්‍යා දෙවි දේවතාවන් නැමදීම, ගබ්සාව, අලුත උපන් දරුවන් විනාශ කිරීම යනාදිය පෙන්වා දිය හැකිය.

*සැ.යු. පරිච්ඡේද 1-6 දක්වා සඳහන් වන බොහෝ ඉගැන්වීම් බාර්ණබස් තුමාගේ ලිපියේ පරිච්ඡේද 18 - 20 ත් අතර සඳහන් ඉගැන්වීම්වලට සමානකම් කියයි.*

**ජනවන්දනාව (6-10)**

ජන වන්දනාව පිළිබඳ ආරම්භක ඉගැන්වීම් කියා දී ඇත්තේ ඩිඩාකේ බව බොහෝ දෙනාගේ මතයයි. උපදේශන හා ධර්මෝපදේශන විලාශයෙන් මෙම ඉගැන්වීම් ඉදිරිපත් කර ඇත. ධර්මෝපදේශය තුළ ප්‍රසාද ස්නාපනය, නිරාහාර ශීලය, යාච්ඤාව හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ ඉගැන්වීම් ඉදිරිපත් කර ඇත.

ප්‍රසාද ස්නාපනයේ ආරම්භය හා එහි අඩංගු වචන බොහොමයක් ඩිඩාකේ සඳහන් ව ඇත. මේ ඉගැන්වීමට අනුව ශු. ත්‍රිත්වයේ නාමයෙන් ගලා යන ජලයෙන් බෞතිස්ම ස්නාපනය කිරීමේ පිළිවෙත ගැන මුලින් ම කතා කරයි. (පරි. 7 1-3)

ජලය ගිල්වා බෞතීස්මස්නාපනය කිරීම යෝග්‍ය බව ද තුන් වරක් ජලයේ ගිල්වීම හෝ තුන් වරක් ජලය වත් කිරීම ගැන ඩිඩාකේ සඳහන් කර ඇත. මේ අනුව පෙනී යන තවත් කරුණක් නම් ශු. ත්‍රිත්වයේ ධර්මය ගැන විශ්වාසය මේ කාලයේ දී ගොඩනැගී තිබූ බවයි. බදාදා හා සිකුරාදා නිරාහාරව සිටීම ක්‍රිස්තියානින් අතර පිළිගත් සත්‍යතාවක් වූ බව ද මෙම ග්‍රන්ථය සාක්ෂි දරයි.

යාච්ඤා කිරීම සම්බන්ධයෙන් ද විශේෂයෙන් ක්‍රිස්තුස් වහන්සේ තම ගෝලයන්ට ඉගැන්වූ ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාවේ වැදගත්කම ද මෙහි පෙන්වා දී ඇත. විවිධ හේතූන් උදෙසා දිව්‍ය පූජාව ඔප්පු කිරීම විවිධ ගායනා ඇතුළත් කිරීම මගින් දෙවියන් වහන්සේට අපගේ උසස්ම ස්තුතිය පුද කළ යුතුබව ද ඩිඩාකය අපට උගන්වයි.

**විනය නීති සංග්‍රහය (11 - 15)**

විනය නීති සංග්‍රහය තුළින් තමන්ට උගන්වන ගුරුවරුන්ට හා වැඩිහිටියන්ට ගරුකළ යුතු බවත්, සංඝයේ යුතුකම් ද දිවැස් වාක්‍ය පිළිබඳ විශ්වාසය ද ආරක්ෂා කළ යුතු බවත් සඳහන් කර ඇත. සභාවේ දැනට ඇති සභා නීතිය හා විනයේ මූලාශ්‍ර මෙහිදී දැකිය හැකිය. අපෝස්තුලුවරුන් හා දිවැසිවරුන් ගත කළ ජීවිතය පිළිබඳ අපට උගන්වන අතර ඒ හා සමානව ජීවත් වීමට ද අපටද ආරාධනා කරයි.

ඉරුදින ශුද්ධවන්ත ලෙස ගතකිරීම, ඉරුදින දිව්‍ය පූජාව, කිතුනු සංඝවල සුදුසු නායකයින් පත්කළ යුතු ආකාරය, මෙන් ම සංඝය තුළ සාමය ආරක්ෂා කරගත යුතු ආකාරය පෙන්වා දී ඇත. සභාවේ නායකයන් කවුරුන් ද යන්න පිළිබඳව ද තවදුරටත් සඳහන් කරයි. සභාවේ රදගුරුවරුන් තේවාචාර්යවරුන් ඡන්දයෙන් පත්කළ යුතු බවට උපදෙස් දෙන අතර ඔවුන් ගත කළ යුතු ජීවිතය පිළිබඳව ද විනය නීති සංග්‍රහය තුළ පෙන්වා දී ඇත.

**ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීම (16)**

ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීම ඩිඩාකේ 4 වන කොටසින් උගන්වයි. ජුදා ජනතාවගේ ගැළවුම්කාරයාණන් පිළිබඳව පවතින ඉෂ්ට නොවන බලාපොරොත්තුව ගැන ද පෙන්වා දෙයි. ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීම ඉතා සමීප බව එකල විසූ කිතුනුවන් විශ්වාස කළ බව මෙම ග්‍රන්ථයෙන් පැහැදිළි වේ. ජීවිතය පිළිබඳ සෝදිසියෙන් සිටිය යුතු බවත්, පහන නිවෙන්නට ඉඩ නොහැර සූදානමින් සිටිය යුතු බවත් උගන්වයි. මන්ද සමිඳාණෝ කුමන මොහොතේ පැමිණේ දැයි කිසිවෙකු නොදන්නා බව සඳහන් කරයි. මිනිස් වර්ගයාගේ අවසාන විනිශ්චය ගැන ද මලා වූ අයගේ නැගිටීම පිළිබඳව සඳහන් කරයි. ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීම ගැන කතා කරන විට උන්වහන්සේට පැමිණෙන්න යැයි කරන ඇරයුම මෙම ග්‍රන්ථයේ විශේෂ ස්ථානයක් ගනී.

*උදා* : මරණතා ! PAROUSIA (COME LORD JESUS)

**මුල් ක්‍රිස්තියානිහු**

- ශුද්ධ වූ සභාවේ ආරම්භය සිදු වූ ආකාරය හා එය වර්ධනය වූ ආකාරය ඩිඩාකේ කුම්රාන් හෝර්මස් රදගුරුතුමා ශු. ක්ලෙමන්ට් තුමාගේ ලිපිය, ශු. ඉග්නාසියුස් තුමාගේ ලිපිය මගින් දැනගැනීමට හැකිය.

- ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම සිදුවන තුරු ජෙරුසලමෙහි නැවතී සිටින ලෙසත්, ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණීමෙන් පසු සකල ලෝවාසීන්ට ශුභාරංචිය දේශනා කළයුතු යැයි කියා ක්‍රිස්තුස් වහන්සේ වදාළ සේ අපෝස්තුලුවරුන් ශුද්ධාත්මයාණන්ගේ බලය ලබා ක්‍රියා කළෝය.

- ශුද්ධාත්මයාණන්ගේ බලයෙන්, ජෙරුසලමෙහි හා ජුදයාවේ, සමාරියාවේ ගලීලයේ අපෝස්තුලුවරු ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය දේශනා කළෝය.

- අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම අසා එය පිළිගෙන සිත් හැරුණු ජුදෙව්වරුන් සමඟ ජෙරුසලමෙහි ශුද්ධ වූ සභාව ආරම්භ වී වැඩුණේය. ශුභාරංචිය පිළිගත් අයගේ ගණන දිනෙන් දින වර්ධනය වුණේය. (ක්‍රියා : 2:2, 5:15 - 6:7)

- ජෙරුසලමේ ශුද්ධ වූ සභාව ආරම්භ වීමත් සමඟම ශුභාරංචිය පිළිගත් ජනතාවගේ ජීවිතයේ නව වෙනස්වීමක් හා දියුණුවක් ඇතිවන්නට විය.

- ජනතාව අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම්වලට සවන් දෙමින් තමන්ට අයත් දේ විකුණා අපෝස්තුලුවරුන් අතට දී තමන්ගේ සමාජ ප්‍රශ්න ඔවුන්ට ප්‍රකාශ කර විසඳුම් ලබාගත්හ. (ක්‍රියා 4:34-35) නිතර එක පවුලක් සේ එකතු වූහ.

- පූප කැඩීමේ හා යාච්ඤාවේ එක්සිත් ව යෙදුණෝය. ජ්වලිතකමින් හා පිරිසිදු සහෝදර ප්‍රේමයකින් එකමුතුකමින් ජීවත් වූහ.

- මෙසේ ශුද්ධාත්මයාණන්ගේ ප්‍රේමයේ වරප්‍රසාදවලින් ශක්තිමත්වී ශුභාරංචියට හා බෙදාගැනීමේ ජීවිතයට සහය වූහ.

- විශේෂයෙන් එකමුතුකම හා පොදුවේ තබාගැනීම නමැති විශේෂ ගුණාංගය තුළ ජීවත්වන හවුලක් සේ ඔවුහු ක්‍රියා කළෝය.

- ඒකාත්මතාවය නම් "කොයිනෝනියා" නම් ග්‍රීක වචනයෙන් එන එකකි. මෙයට අර්ථ කිහිපයක් ඇත. කිතුනුවන්ගේ එකමුතුකම, තමන්ට ඇති දේ බෙදාගැනීම (ක්‍රියා 4:32) දිව්‍ය සත්ප්‍රසාද භෝජනයේ එකමුතුවීම (ක්‍රියා 2:42), සහන සේවාවන් හි එකමුතුවීම වැනි අර්ථ ගෙන දෙයි.

- මෙවැනි එකමුතුවීම් හේතුවෙන් ඇති වූ ගුණාංග අතර අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීමට සවන්දීම, එක්සිත් වී සිටීම, පූප කැඩීම, එකමුතු වී යාච්ඤා කිරීම, සියල්ලන්ගේ ප්‍රසාදයට ලක්වීම, සැදැහැවත් සියල්ලෝ එක්වී හැම දෙයක් ම පොදුවේ තබාගැනීම, එකිනෙකාගේ වුවමනාවේ හැටියට බෙදා ගැනීම, තමන් අතර උසස් පහත් කුළ භේද නොතකා සැමදෙනාට ම එකසේ සැලකීම ආදිය විය.

- කවුරුත් කාටත් නායකයකු ලෙස හෝ සේවකයකු ලෙස හෝ නොව සැමදෙනා අතර එකම සමානකමක් පවතින නව සමාජයක් ගොඩනගන්නට උත්සාහ දැරූහ.

- විශ්වාසිකයෝ, සහෝදරයෝ, ප්‍රේරිතයෝ, නව දහම් පිළිපදින්නෝ ලෙස ප්‍රශංසාව ලැබූහ.

- පොදු ජන සමාජයේ බාර්ණබස් කොතරම් ප්‍රශංසාවට ලක්වුව ද එපමණ තරම් අනනියස්, සපිරා යන යුවල තමන්ගේ ස්වආලය නිසා අයහපතත් තමන්ගේ ජීවිතයට විනාශයත් ළඟාකර ගත්හ.

- අනනියස් හා සපිරා යුවල තමන්ගේ ඉඩම විකිණූ මුදල අපෝස්තුලුවරුන්ගේ පාමුල තබා, තමන්ගේ පරිත්‍යාගශීලී භාවය අන් අය ඉදිරියේ පෙන්වා ප්‍රශංසා ලබාගැනීමට බලාපොරොත්තු වූහ. නමුත් ශුද්ධාත්මයාණන්ට විරුද්ධව වැරදි සිදුකළ නිසා අපෝස්තුලුවරුන්ගේ සාපයට ඔවුහු ලක්වී මරණයට පත් වූහ.

- තවද දහම් සේවයේ ඇති වූ අඩුපාඩුව වැන්දඹුවන් නොසලකා හරිනු ලැබීම වැනි අඩුපාඩුකම්වලින් එදා දකින්නට ලැබුණි.

## මුල් කිතුනුවන්ගේ ආධ්‍යාත්මික ජීවිතය

### ප්‍රසාද ස්නාපනය

- කිතුනුවකු වීම සඳහා ජලයෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් නැවත ඉපදීම අවශ්‍ය වේ. මේ අනුව බෞතීස්ම ස්නාපනය ලබාගනියි.

- ආරම්භක කාලයේ දී යම් කෙනෙකු දේව විශ්වාසය ප්‍රකාශ කළවිට ප්‍රසාද ස්නාපනය දානය කරනු ලැබීය.

- පසුකාලීන ව බෞතීස්ම ස්නාපනය ලබාගැනීම සඳහා වසර දෙක තුනක පමණ කාලයක් ඒ සඳහා සූදානම් විය යුතු විය. අපෝස්තුලුවරුන්ගේ කාලයේ පටන් මේ සිරිත පැවත ආ බව පෙනේ.

- මේ කාලය තුළ ඔවුහු කිතු දහම අධ්‍යයනය කරමින් යාච්ඤාවේ නිරත වූහ.

- ප්‍රසාද ස්නාපනය සඳහා ජලයේ ගිල්වන විට අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණය හා ස්වාමිවාක් ආරාධනාව උච්ඡාරණය කිරීමට ඔවුන්ට අවස්ථාව හිමි විය.

- මෙම බෞතීස්ම ස්නාපනය ලැබීමට පෙර ඔවුහු රදගුරුතුමා හෝ පූජාප්‍රසාදී තුමා බැහැදැකීම අනිවාර්යයෙන් ම කළයුතු වූහ. මේ සෑම අවස්ථාවකදී ම රදගුරුතුමන් හෝ පූජා ප්‍රසාදීතුමන් බෞතීස්මය අපේක්ෂිතයාගේ හිස මත අත් තබා යාච්ඤා කිරීමෙන් අශුද්ධ ආත්ම දුරු විය.

- ප්‍රසාද ස්නාපනය දානය කරන ලද්දේ නිසි සූදානමකින් අනතුරුව ය. ටර්ටියුලියන්ගේ ප්‍රකාශයට අනුව බෞතිස්ම පිළිවෙතේ අපේක්ෂකයා, යක්ෂයා හා උගේ ක්‍රියා ප්‍රතික්ෂේප කිරීමට පොරොන්දු වෙමින්, ස්වාමිවාක් ආරාධනාව හා විශ්වාස ලක්ෂණය උච්චාරණය කරමින් පිස්සිනා නමැති බෞතිස්මය දානය කරන ස්ථානයට බසියි.

- ප්‍රසාද ස්නාපනය දානය කළ අන්දම
    i. ජලයේ තෙවරක් ගිල්වීම
    ii. අවශ්‍යතාව අනුව ජලය ඉසීම හෝ ජලය හිස මත වත්කිරීම.

    මෙහිදී රදගුරුතුමා ප්‍රසාද ස්නාපනය දානය කරනු ලබන්නේ පූජාප්‍රසාදීවරුන් හෝ තේවාචාර්යවරුන්ගේ සහය ඇතිව ය. ස්ත්‍රී පක්ෂයට ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී තේවාචාර්යවරියන්ගේ සහය ලබාගෙන ඇත.

- ප්‍රසාද ස්නාපනය දානය කිරීමත් සමඟම අභිවෘධි ආලේපය දානය කරනු ලැබීය.

- අපෝස්තුලුවරුන්ගේ කාලයේ දී අවශ්‍යතා සඳහා ප්‍රසාද ස්නාපනය ලබා දුණි. බෞතීස්මය දානය කරනු ලැබුවේ ආලේලූයා සෙනසුරාදා දින පමණි. මෙහිදී නවක ප්‍රසාද ස්නාපනය ලද අය තම සුදු වස්ත්‍රය පාස්කු ඉරුදිනට පසු ඉරුදින දක්වා දින 8 ක් පුරාම ඇඳ සිටිය යුතු විය.

  5 වන ශතවර්ෂය දක්වා වැඩිහිටි අයට හැර වෙනත් අයට ප්‍රසාද ස්නාපනය දානය නොකළ අතර මරණාසන්න අයට පමණක් බෞතිස්මය දානය කිරීම සිදුවිය.

**දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත**

- අගපේ සංකල්පය පෙරදැරි කරගෙන දිව්‍ය සත්ප්‍රසාදය සිදුකරනු ලැබේ.
- 2වන ශත වර්ෂය තුළ දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත නිරාහාරශීලව උදෑසන ආරම්භ කළෝය.
- අගපේ විවිධ වූ පුද්ගලයින්ට ආවේනික වූ චාරිත්‍රයක් වූ අතර, සිදු වූ විවිධ අක්‍රමිකතා නිසා එම සම්ප්‍රදාය බැහැර කරන ලදී.
- මෙම පිළිවෙත ඉරුදිනට පමණක් සීමාවූයේ පළමු ශතවර්ෂ තුනක කාලයේ ය.
- එහෙත් 4 වන ශතවර්ෂයේ සිට මෙම පිළිවෙත දෛනිකව සිදු කළෝය.
- මුල්ම කිතුනුවන් ජුදාවරුන් ය. ඔවුහු සිනගෝගවලට යාම නතර කළෝය. එහෙත් ජුදා සිනගෝග ජනවන්දනා පිළිවෙත් ඔවුන්ට ආවේනික ලෙස සකස් කෙරිණී.

ක්‍රිස්තියානි ජනවන්දනා පිළිවෙතෙහි අඩංගු කොටස් කිහිපයක් මෙසේ ය.

* ශු. ලියවිලි කියවීම්
* දේශනය
* තෙහිලි ගී
* ගීතිකා
* පොදු යැදුම
* දුගී අය සඳහා පඬුරු රැස්කිරීම

ඉන්පසුව සත්ප්‍රසාද පිළිවෙත ස්ථාපනය කළ ජේසු සමිඳුන්ගේ වචන උච්චාරණය කරමින් උන්වහන්සේගේ දුක් ප්‍රාප්තිය, මරණය හා උත්ථානය සිහිකරමින් සත්ප්‍රසාද පිළිවෙත් ඉටුකරන මූලිකයා ස්තුතිකොට යාච්ඤා කිරීම සිදුවිය. ජනතාව පිළිතුරු දෙනු ලැබුවේ "ආමෙන්"යනුවෙනි.

ඉන්පසු දිව්‍ය සත්ප්‍රසාදය බෙදාදීම සිදුවිය. තේවාචාර්යවරු මෙම පිළිවෙතට සහභාගීවීමට නොහැකි අය සඳහා දිව්‍ය සත්ප්‍රසාදය රැගෙන ගියෝය. පීඩන සමය තුළ පමණක් සිදුවූ විශේෂිත ක්‍රියාවක් ලෙස විශ්වාසකයින් දිව්‍ය සත්ප්‍රසාදය රැගෙන ගොස් තම නිවෙස්වල ආරක්ෂිතව තබාගැනීම සිදුකොට ඇති අතර ගමන් බිමන්වල දී රැගෙන යාම සිදුකරන ලද්දේ දිව්‍ය සත්ප්‍රසාදය ආරක්ෂා කිරීම සඳහා ය.

මනස්ස්ථාපනය හා පශ්චාත්තාපී ක්‍රියා

සාන්තුවරයන්ගේ සභාව ලෙස ශු. සභාව හඳුන්වනු ලැබීය. විශාල පව්කළ අය මෙම සභාවෙන් ඉවත් වේ. නැවත සභාවට ප්‍රවිශ්ඨ වීම සඳහා රදගුරුතුමා නියෝග කරන ලද දීර්ඝ කාලීන ප්‍රසිද්ධ මනස්ථාපී ක්‍රියා කළ යුතුවේ.

- මනස්ස්ථාපයට නියමිත වස්ත්‍ර ඇඳ බෞතීස්මය අපේක්ෂකයන් සමඟ ඒකරාශී වී දිව්‍ය පූජාවේ පඬුරු පිළිවෙත දක්වා සහභාගී වීය යුතුය.
- මහා බ්‍රහස්පතින්දා දින රදගුරුතුමා විසින් ප්‍රසිද්ධියේ මෙම පවුකමාව දානය කරනු ලැබීය.
- එහෙත් යම් පුද්ගලයෙකු එකම පාපය තෙවරක් කළවිට නැවත සභාවට ඇතුළත් කළේ නැත.

- එලෙස ශු. සභාවෙන් සම්පූර්ණයෙන් ම ඉවත් කරනු ලැබූ පාප ලෙස හැඳින්වූයේ,

    i. රූප වන්දනාව

    ii. මිනීමැරීම

    iii. කාම මිථ්‍යාචාර කිරීම ය.

- එහෙත් 4 වන ශතවර්ෂය වනවිට මරණය අසල සිටින පවුකරුවන්ට දිව්‍ය සත්ප්‍රසාදය දානය කිරීම සිදුවිය.

- මෙම කරුණ සම්බන්ධයෙන් ශු. සභාව දැඩි පිළිවෙතක් අනුගමනය කරන බැවින් පවුකමාව ලබාගැනීමේ පිළිවෙත 2වන බෞතීස්මය ලෙස හැඳින්වීය.

**නිරාහාර ශීලය**

මුල් කිතුනු සභාව බදාදා හා සිකුරාදා දිනවල සවස 3 ට එක්රොක් වෙමින් යාච්ඤාවේ නිරත වූහ. එහිදී අවවාද අනුශාසනා සඳහා සවන්දීම සිදුවිය. එලෙසම සවස 3 දක්වා නිරාහාරශීලීව යාච්ඤාවේ නිරත වූහ.

- හැකි අය පමණක් පාස්කු මංගල්‍යයට පෙර, දින දෙකක් ම නිරාහාර ශීලය රැකීම සිදු කළෝය.

- 3 වන ශතවර්ෂයේ දී පාස්කු මංගල්‍යයට පෙර, දින 40 ක් නිරාහාර ශීලය රැකීමේ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී.

**මංගල්‍යය**

අපෝස්තුලුවරුන්ගේ කාලය සිටම කිතු සමිඳුන්ගේ උත්ථානය සමරනු ලැබූවේ සතියේ පළමු දිනය. කිතු සමිඳුන්ගේ උත්ථානය සිහිපත් කළ මෙදින ස්වාමීන්වහන්සේගේ දිනය ලෙස නම් කරනු ලැබීය.

ශු. සභාවේ ඉපැරණි මංගල්‍යයන් වන්නේ පාස්කුව හා පෙන්තකොස්ත මංගල්‍යයන් ය.

ජුදා හා රෝමවරුන්ගේ දවස ආරම්භ වන්නේ සවස 6 ට ය. මෙම සිරිතට අනුව කිතුනුවන් පාස්කු මංගල්‍ය ආරම්භ කළේ සෙනසුරාදා සවස 6 ට ය. මෙලෙස පාස්කු මංගල්‍යය සෙනසුරාදා සවස ආරම්භවී සර්ව රාත්‍රිය පුරාම සිදු කළෝය. මුළු රාත්‍රිය පුරාම බෞතිස්ම අපේක්ෂකයාට අවසාන උපදෙස් දීම සිදුවිය.

ඉන්පසු සෑම මංගල්‍යයක්ම සර්ව රාත්‍රික මෙහෙයක් සමඟම සිදු කළෝය.

පාස්කු මංගල්‍යය ශු. සභාවේ එකම දිනයක සිදුකොට නොමැත. සුළු ආසියාවේ ජුදෙව්වරු පාස්කු මංගල්‍ය සිදුකළ දිනයේම (නිසාන් මාසයේ මාර්තු/ අප්‍රේල් 14 වන දින) කිතුනුවෝ ස්වාමීන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය, මරණය, උත්ථානය මංගල්‍ය සිදු කළෝය. එහෙත් අන් ප්‍රදේශවල වසන්ත සමයේ දී පුරපසළොස්වක දිනට පසුව එන ඉරුදින පාස්කු මංගල්‍යය සිදුකරන ලදී. නිසියාන මන්ත්‍රණ සභාවේ (ක්‍රි.ව. 325 දී) ස්වාමීන් වහන්සේගේ දුක්විඳීම මරණය උත්ථානය වසන්ත සමයේ පුරපසළොස්වක දිනට පසුව එන පළමු ඉරුදින සැමරීමට තීරණය කරනු ලැබීය. නිසියාන මන්ත්‍රණ සභාවේ මෙම තීරණයට අනුව මුළු ශු. සභාවම විසින් මෙදින පාස්කු මංගල්‍යය සමරන ලදී.

3 වන ශතවර්ෂය ආරම්භයේදී, රජවරුන්ට ප්‍රත්‍යක්ෂවීමේ මංගල්‍යය ජනවාරි 6 වන දින ප්‍රථමයෙන් ඊජිප්තුවේ දී සමරනු ලැබීය. පසුව මෙම මංගල්‍ය පෙරදිග සභාවල ද සමරනු ලැබීය.

රජවරුන්ට ප්‍රත්‍යක්ෂ වීම, ස්වාමීන් වහන්සේගේ බෞතීස්මය හා කානා නුවර ප්‍රාතිහාර්ය යන අවස්ථා තුනම එකම මංගල්‍යයක් ලෙස සමරනු ලැබීය. 4 වන ශතවර්ෂයේ සිට පෙරදිග සභාව විසින් මෙම මංගල්‍යය සිදු කරන ලදී. 3 වන ශතවර්ෂයේ දී ක්‍රිස්තු උත්පත්ති මංගල්‍ය විවිධ පදවිවල සිදුකළ අතර 4 වන සියවසෙහි දී අපරදිග සභා සියල්ලම විසින් නත්තල සමරන ලදී.

සාන්ත ජෝන් ක්‍රිසෝස්තම් මුනිතුමා විසින් මේ මංගල්‍ය පෙරදිග සභාවට හඳුන්වාදීම සිදුකොට ඇත.

**වන්දනා ස්ථාන**

මුල් කාලයේ දී තුළ කිතුනුවන්ගේ දිව්‍ය සත්ප්‍රසාදීය පිළිවෙත් හා අනෙකුත් පිළිවෙත් කිතුනු නිවාසවල පැවැත්විණි.

ක්‍රි.ව. 201 දී සිරියාවේ එඩේසා (Edessa) නගරය පළමු දෙව්මැදුර ඉදිකරනු ලැබීය. ප්‍රාණපරිත්‍යාගීවරුන්ගේ සොහොන් මත ඉදිකළ දෙව්මැදුර හා කැටකුම්බ වල දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත සිදු කළෝය.

කිතුදහම විදහා දැක්වීම සඳහා චිත්‍ර කලාව,සංඥාව,මූර්ති ශිල්පය යොදා ගැනීම.

*උදා* : කුරුසිය, කාලිස් පාත්‍රය, පහන, නැංගුරම, බෝට්ටුව, මසුන්, පූප සහිත බඳුන, මරියතුමිය හා ක්‍රිස්තුස් වහන්සේගේ පින්තූර යනාදිය.

ඔවුහු ගලින් හා ලෝහයෙන් නිපදවන මූර්ති භාවිත නොකළේ රූප වන්දනාවට සමීප සම්බන්ධයක් ඇති හෙයිනි.

**සමාජ ජීවිතය**

තමන්ගේ වත්පිළිවෙත් හා අනෙකුත් ආගමික පිළිවෙත් හැරෙන්නට ජනවන්දනාවේ සෙසු කාලය තුළ සාමාන්‍ය මිනිසුන් ලෙස දිවි ගෙවීම.

එහෙත් ක්‍රිස්තියානි ජීවන රටාව අන් අයට ආදර්ශයක් වීම.

*උදා* : පවුල් ජීවිතයේ ආදර්ශය දික්කසාදය ප්‍රතික්ෂේප කිරීම, පාපය ප්‍රතික්ෂේප කිරීම, ක්‍රිස්තියානි කාන්තාවගේ කන්‍යාභාවය, සරල දිවි පැවැත්ම, උසස් ලෙස සැලකීම, තරුණ තරුණියන්ගේ පරිශුද්ධවත් දිවි පැවැත්ම, අන් අයට අභියෝගයක් වීම.

එවකට වහලුන්ට තිරිසනුන්ට වඩා පහත් තත්ත්වයකින් සැලකූ නමුත් කිතුනුවන් මිනිස් වටිනාකම් ඉස්මතුකොට ඔවුන් වහල් බවින් නිදහස් කිරීමට දැරූ ප්‍රයත්නය දෙවියන් වහන්සේට මහත් සේ ප්‍රසන්න විය. සාධාරණත්වය හා ආදරය කිතුනු ජීවිතයේ පරමාදර්ශය බවට පත්විය.

රෝම අධිරාජ්‍යය තුළ කිතුනුවන් හට සුවිශේෂ ස්ථානයක් හිමිවූයේ ඔවුන්ගේ ජීවිතයේ දක්නට ලැබූ මේ සුවිශේෂ ලක්ෂණ නිසා ය.

රෝම යුධ හමුදාව තුල කිතුනුවන් සේවය කළ අතර, ඔවුහු අනෙකුත් හමුදා භටයින්ගේ ගෞරවාදරයට පත් වූහ.

**නව සමාජ ක්‍රමයක උදාව**

- කිසියම් කණ්ඩායමකට හෝ සමාජයකට බලයක් හා නායකත්වයක් අවශ්‍ය වේ. දෙවියන් වහන්සේගේ සභාව වන ශුද්ධ වූ සභාවට ද එසේමය.

- ක්‍රිස්තුන් වහන්සේ මෙලොවෙහි ජීවත් වූ කාලයේ ශු. සභාවේ නායකයා ලෙස ක්‍රියාකළ සේක. නමුත් උන්වහන්සේ ස්වර්ගයට වැඩිය පසු තමන් වහන්සේ වෙනුවෙන් සභාව තුළ ක්‍රියාකිරීමට සැනසිලිදායකයාණන් වන ශුද්ධාත්මයාණන් වහන්සේව එවූ සේක. එහෙත් ශුද්ධවූ සභාවේ දකින්නට හැකි නායකයා ලෙස ශු. පේදුරු තුමාව පත්කළ සේක.

- ශුද්ධාත්තමයාණන් මගින් සභාව උද්යෝගීමත් වුව ද ශු. පේදුරු තුමාගේ නායකත්වය මගින් සභාවට ක්‍රියාකාරී වීමට හැකි විය.

- ශු. පේදුරු තුමාගේ නායකත්වය යටතේ මුල් කිතුනු සභාව වේගයෙන් සෑමතැනම පැතිරී දියුණුවිය. මුල් කිතුනුවන්ගේ ආදර්ශවත් ජීවිතය මගින් සිත් ඇදගන්නා ලද බොහෝ පිරිස් සභාවට එකතු වෙමින් දිනෙන් දින සභාව ගණනින් වැඩිවූහ.

- විශේෂයෙන් ජෙරුසලමෙහි ශ්‍රාවකයින්ගේ ගණන ඉතා වැඩිවිය. එහෙයින් සභාව තුළ ඉටුවිය යුතු සේවාව ද වැඩි විය.

- එමනිසා සභාව තුළ ශුභාරංචි දෙසුමට අපෝස්තුලුවරුන් හා දහම් සේවයට උපස්ථායකයින් සත් දෙනෙක් ද තෝරාගන්නා ලදී.

- මෙම උපස්ථායකයින් දහම් සේවයට නියම කරනු ලැබුවත්, ඔවුන් දේශනා කිරීම, ප්‍රසාද ස්නාපනය දානය කිරීම, ප්‍රාතිහාර්ය කිරීම, ශුභාරංචිය ප්‍රකාශ කිරීම වැනි සේවාවල යෙදුණෝය.

- ඔවුන් අතර ස්තේපන්, පිලිප් වැදගත් වෙයි. ඔවුන්ගේ සේවය නිසා කිතුනුවන්ගේ සංඛ්‍යාව වැඩිවීම දුටු නායක පූජකවරු හා පරිසිවරු, සදිසිවරු හා විනයධරයෝ කෝපයට පත්වී ජුදෙව් පීඩනය ඇතිකරමින් ස්තේපන් තුමා මරා දැමූහ.

- ස්තෙපන්ගේ මරණයෙන් පසු ජෙරුසලමේ සිටි කිතුනුවෝ පෙනිසියාව, සමාරියාව, අන්තියෝකියාව, ගලීලය, ඩැමස්කස්, සිප්රුස් දූපත වැනි රටවල්වලට ආරක්ෂාව සඳහා විසිර ගියද ශුභාරංචිය දේශනා කළෝය.

- මේ හේතුවෙන් බොහෝ කිතුනු සමාජ, ජනපද, නගර බිහිවුණේය. බොහෝ අන්‍ය ජාතිකයෝ සභාවට එකතු වූහ. මෙම බලපෑමෙන් සිරියාවේ අන්තියෝකියේ ජුදෙව් හා අන්‍ය ජාති මිශ්‍ර සභාවක් ඇති විය.

- ශු. පේදුරු තුමා මගින් සිත්හැරීමට ලක් වූ සෙසාරියාවෙහි ශතාධිපතියා වන කොරනේලියුස්ගේ සිත් හැරීම, බොහෝ අන්‍ය ජාතිකයින්ගේ සිත් හැරීමට හේතුවක් විය.

- මේ නිසා ජුදෙව් පීඩනයට මූලික වූ සාවුල් කිතුනුවන්ට පීඩා කරමින් ඔවුන්ව මරා දැමීමට ගිය ගමනේ උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ ඔහුට කතා කළ සේක. සාවුල් සිත් හැරී ප්‍රසාද ස්නාපනය ලැබ ශුභාරංචිය දේශනා කිරීම සඳහා විවිධ රටවල්, පෙදෙස්වලට ගමන් කරමින් සභාව ව්‍යාප්ත කළේය.

- ශුද්ධ වූ පාවුලු තුමා තමා ආරම්භ කළ සභාවල නායකයින් පත් කරමින් ඔවුන්ගේ සහයට උපස්ථායකයින් ද පත් කළේය.

- එමනිසා මුල් කිතුනු සභාවේ නායකයා ලෙස පේදුරුතුමා ද ඉන්පසු ප්‍රේරිතයන්ගේ කණ්ඩායම ද, ඉන්පසු මුප්පුවරු, උපස්ථායකයන් හා ගෝලයින් හෙවත් විශ්වාසිකයන් කියා විවිධ තරාතිරම්වලින් බලය සකස් කරනලද සංවිධායකයින් ලෙස ගොඩනගනු ලැබුවේය.

- ශුද්ධ වූ සභාවේ නායකත්වය හා බලය සංවිධානය කරනු ලැබූ එකක් වුව ද, එම බලය අන් අය කෙරෙහි බලය දක්වන්නට නොව සේවය කිරීම සඳහා සංවිධානය වූ සභාවකි.

- ආරම්භයේ දී අපෝස්තළුවරුන් ක්‍රිස්තුස් වහන්සේ විසින් ම තෝරාගනු ලැබූ පුහුණු කරනු ලැබ විශේෂ වගකීම් භාරදී යවනු ලැබූ අය වෙති. මෙම ප්‍රේරිතවරුන් සභාවේ කණු ලෙස සලකනු ලැබුවෝය.

- ක්‍රිස්තුස් වහන්සේගේ මරණයට හා උත්ථානයට සාක්ෂිදරා කිතුනු සභාවේ යැදුම්වල දී මූලිකත්වය දැරීමත්, දේව වරප්‍රසාද නිධාන දානය කර, නව සාමාජිකයින් සභාවට එකතු කර ගැනීමත්, ඔවුන්ට අභිවෘද්ධි ආලේපය දානය කිරීමත් විවිධ සේවාවන් සඳහා ඔවුන්ව පත්කිරීමත් ප්‍රේරිතවරුන්ගේ වගකීම විය.

- මෙම ප්‍රේරිතවරුන්ගේ නායකයා ලෙස පේදුරු තුමා සිටියේය. නායකත්ව තනතුරු දරන සැමදෙනාගේ කිතුනු විශ්වාසයේ සත්‍යතාවයත්, පරිශුද්ධත්ව රැකගැනීමත්, අපෝස්තුලුවරුන්ගේ සම්ප්‍රදාය ආරක්ෂා කර, විශ්වය පුරා ශු සභාවේ විශ්වාසයේ වර්ධනය හා සාරධර්ම ජීවිතය රැක ගැනීමත් වගකීම විය.

- රදගුරුතුමන්ලා පරිපාලකයින් තම රදගුරු වසමේ යැදුම් මෙහෙයයන්වල දී නායකත්වය දැරීමේ ශුභාරංචිය දේශනා කරීමේ විශ්වාස සත්‍යතාවයන් පරිශුද්ධවත් ව රැකගැනීමේ හා දේව වරප්‍රසාද නිධානයන් දානය කිරීමේ කටයුතුවල මෙතුමන් හා යෙදුනාහ.

පරිපාලකයින් :

තම බැටලුවන්ට ආදර්ශවත් ලෙස කිතුනු ජීවිතයට වගකීම් දරමින්, අධ්‍යාත්මික හා ලෞකික වස්තු පාලනය කරමින් රදගුරු වසමේ නියෝජ්‍ය තනතුරු දරමින් ක්‍රියා කළෝය.

මුප්පුවරුන් (අනුනායකවරුන්) :

පූජා ප්‍රසාදීවරුන්, රදගුරු වසමේ කොටසක් වන මීසම් සංඝවලට නායකත්ව දැරීමත්, ශුභාරංචිය දේශනා කිරීමත්, යැදුම් මෙහෙයයන්වල නායකත්වය දැරීමත්, දිළිඳුන් රැකබලා ගැනීමත් වැනි වගකීම් දැරූහ.

උපස්ථායකයින් :

මෙම තනතුරට පත්වූ අය, මූප්පුවරුන්ට (අනුනායකවරුන්), පූජාප්‍රසාදීවරුන්ට සහය වීම, දිළිඳුන්ට උදව් කිරීම, සුවිශේෂය දේශනා කිරීම, ප්‍රසාද ස්නාපනය දානය කිරීම වැනි සේවාවන්හි යෙදෙන අතර තවදුරටත් අවශ්‍ය වූ දහම් සේවාවන්වලට යොමු වූහ.

- මෙවැනි ආකාරයේ මුල් කිතුනු සභාව සංවිධානාත්මක වීමෙන් කිතුනු සාරධර්ම හා සුවිශේෂ සංස්කෘති අනුව ජීවත්වීමට ජනතාවට උපහාර වී ඇත.

### 7.1.3 ශුද්ධ වූ පාවුලුතුමාගේ ජීවිතය

**කිතුනු සභා පිහිටුවීම**

ශුද්ධ වූ පාවුලුතුමාගේ ධර්ම චාරිකා 3ක් මගින් කිතු දහම ප්‍රචාරය කිරීම. මෙම චාරිකා තුළින් සේවා කළ ස්ථාන තුළ කිතුනු සභා පිහිටුවන ලදී. ඒ ඒ ප්‍රදේශ හා පසුබිම පිළිබඳ අධ්‍යයනය කළ යුතු වේ.

- **ගලාතිය**

රෝම අධිරාජ්‍යය පාලනයට යටත් වූ මධ්‍යම සුළු ආසියාවේ පිහිටි ප්‍රදේශයකි. පසුකාලීනව මෙම ප්‍රදේශය ව්‍යාප්ත ව ගලාතිය, පොන්තසය, පිසීදිය, ලිකෝනිය, අන්තියෝකිය, පම්පිලිය, පර්ගා, අතාලියා, දර්බය, ලූස්ත්‍රාව, ඉකෝනිය යන ප්‍රදේශ සියල්ල ව්‍යාප්තව රෝම අධිරාජ්‍ය තුළ ඒකරාශී වී බලප්‍රදේශයක් වීම.

- පාවුලුතුමා තම ධර්මදූත චාරිකාවල යෙදෙමින් සුබ ආරංචිය දේශනා කළේය.

  * එහිදී බොහෝ ජුදාවරුන් සුබ ආරංචිය විශ්වාස නොකළහ. එහෙත් අන්‍ය ජාතිකයින් බොහෝ දෙනෙක් කිතු දහම වැළඳගත්හ.

  * මෙම අන්‍ය ජාතිකයන් අතර සර්ගියස් පාවුලස් නමැති දේශාධිපතියා විශේෂිත විය. පිසිදිය හා අන්තියෝකයේ දී පාවුලුතුමාව විශේෂයෙන් පිළිගැනුණි. ඉකෝනියේ දී ජුදෙව්වරු හා ග්‍රීක බොහෝ දෙනෙක් කිතු දහම වැළඳ ගත්හ. ලූස්ත්‍රාවේ දී පාවුලුතුමාගේ දේශනා සඳහා යහපත් ප්‍රතිඵල හිමි විය.

  * ජුදෙව්වරුන්ගේ විරෝධතා මධ්‍යයේ වුව ද පාවුලුතුමා කිතුනු සභා පිහිටුවා සභා නායකයින් පත් කළේය.

- **පිලිප්පිය**

  * රෝම අධිරාජ්‍යයේ මැසිදෝනි ප්‍රදේශය තුළ ප්‍රධාන නගරයක් ලෙස පිලිප්පිය හැඳින්වේ. කඳුවළල්ලක් තුළ මෙම නගරය පිහිටියේ ය. මෙහි රෝමවරු වැඩි දෙනෙක් ජීවත් වූහ. ක්‍රි.පූ. 42 ඇන්ටෝනියෝ හා ඔටෝවියන් බෲටස් හා කැෂියස් පරාජය කළ නිසා මෙම නගරය ජනප්‍රිය විය.

  * මෙහිදී ජුදාවරුන් සුළු පිරිසක් ජීවත් වූ නිසා සිනගෝග නොතිබුණේය. ඔවුහු තම යාච්ඤා මෙහෙයන් සඳහා ගංතෙර ඔස්සේ රැස්වූහ.

  * පාවුලුතුමා දේව වචනය දේශනා කළ, යුරෝපයේ පළමු ස්ථානය මෙය වේ. තියතිරා නුවර විසූ ලිදියා නමැති ස්ත්‍රිය පළමු කිතුනු බැතිමතා ලෙස සඳහන් වේ.

  * මෙම කිතුනු සභාව පාවුලුතුමාට බොහෝ සෙයින් ඇලුම් කළ එමෙන් ම උන්වහන්සේට ඉතා සමීප වූ සභාවක් ලෙස දැක්විය හැක.

- **තෙසලෝනිකය**

  * මෙය මැසදෝනික රටෙහි අගනුවර වූ අතර එහි වරායක් ද පිහිටියේ ය. රෝම අධිරාජ්‍යය බල ප්‍රදේශය තුළ නිදහස් කළ රටකි.

  * මෙහි ජුදාවරු බොහෝ සෙයින් සිටි අතර, සිනගෝග පිහිටා තිබිණි.

  * පාවුලු හා සීලස් මෙම සිනගෝගවල දේශනා කරමින් ශුද්ධ වූ ලියවිලි අනුව මරණයෙන් උත්ථාන වූ ජේසුස් සමිඳුන් මෙසියස් වහන්සේ බව තහවුරු කළෝ ය.

  * සමහර ජුදාවරු හා ජුදා ආගම වැළඳගත් අන්‍ය ජාතිකයෝ විශේෂයෙන් ධනවත්, ග්‍රීක ස්ත්‍රීහු, බොහෝ දෙනෙක් කිතුනු සභාවට ඇතුළත් වූහ.

  * මෙහි ජීවත් වූ කිතුනුවෝ ක්‍රිස්තුස් වහන්සේගේ පුනරාගමනය ක්ෂණයකින් සිදුවේ යැයි බලාපොරොත්තු වූහ.

- **ඇතැන්ස් නගරය**

මෙය ග්‍රීසියේ අර්ධද්වීපයේ ගිණිකොණ දිසාවේ පිහිටි වැදගත් නගරයකි. බුද්ධිවාදය, ගෘහ නිර්මාණ ශිල්පය, දර්ශනවාදය සඳහා අතිශයින් ප්‍රසිද්ධ වූ ප්‍රදේශයකි.

* මේ නගරයේ ජීවත් වූ ජනතාව දැනුම සොයා යාමේ පිපාසයකින් පසුවිය. බුද්ධිමතුන්ගේ දේශනාවලට සවන්දීමට මෙහි වැසියෝ අරියෝපග ශාලාවට රැස්වූහ.

* එපිකියුරියානුවාදීන් හා ස්ටොයික්වාදීන් බොහෝමයක් මෙම නගරයේ ජීවත් වූහ.

* ඇතැන්ස් නගරවාසීහු බහුදේවවාදය තුළ විවිධ දෙවිවරුන් හා දේවතාවියන් වන්දනාමාන කිරීමට පුරුදු වී සිටියහ.

* පාවුලුතුමා, ජුදා සීනගෝගයේ දී ජුදා හා ජුදා ආගම වැළැඳගත් අන්‍ය ආගමිකයින්ට දේශනා කළේය. එපිකියුරියානු, ස්ටොයික් හා විවිධ බුද්ධිමතුන් හට වෙනත් ප්‍රසිද්ධ ස්ථානවල දී දේශනා කළේය.

* ජේසුස් සමිඳුන් හා උන්වහන්සේගේ සුබ ආරංචිය පිළිබඳ දේශන අරියෝපග ශාලාවේ දේශනා කිරීමට පාවුලුතුමාට ආරාධනා කළෝය. පාවුලුතුමා මෙහිදී කළ දේශනා තුළ නව දර්ශනයක් හා විවිධත්වක්ය ඇති බව ඔවුන්ට පෙනී ගියෝය.

* ග්‍රීක කවීන්, චින්තකයන්, උපුටා දක්වමින් පාවුලුතුමා උතථාන වූ කිතු සමිඳුන් ගැන දේශනා කළේ ය.

* මෙහි බොහෝ දෙනෙක් කිතු දහම පිළිබඳ විශ්වාසය ප්‍රකාශ නොකළෝය. එහෙත් ඇතැන්ස් නගරයේ පාවුලුතුමාගේ දේශනයේ සුවිශේෂත්වය නිසාම ඇතැන්ස් නගරය මෙහි සඳහන් වේ.

* **කොරන්තිය**

මෙය රෝම දිස්ත්‍රික්කයේ අකයිය ප්‍රදේශයේ අගනුවර ය. යුරෝපයේ සිට ආසියාව දක්වා ගමන් මාර්ගයේ ප්‍රධාන වරාය ලෙස හැඳින්වේ. මෙහි ජුදෙව්වෝ හා විදේශිකයෝ බොහෝ දෙනෙක් ජීවත් වූහ. මෙහි සිනගෝග තිබිණ.

* මෙහි විවිධ දේවාල හා ක්‍රීඩාගාර පිහිටියේය.

* ව්‍යාපාරික මධ්‍යස්ථාන නිසා බොහෝ දෙනෙක් මේ නගරයට පැමිණෙති. එහිදී සදාචාර සම්පන්න නොවන ක්‍රියා සිදුවිය.

රෝම අධිරාජ්‍යය තුළ පිහිටි නගර අතරින් වඩාත්ම සදාචාර සම්පන්න නොවූ නගරය ලෙස හැඳින්වේ.

* ඇතැන්ස් නුවරින් කොරින්තියට පැමිණි පාවුලුතුමා අන් අය මත නොයැපෙන ජීවිතයක් ගත කිරීමට රැකියාවන්හි ද නිරත විය. කූඩාරම් තැනීම ඔහුගේ රැකියාව ය. එම රැකියාවේ යෙදුණු අකිලා හා ප්‍රිසිලා එතුමාගේ සමීප සහචරයෝ වූහ.

* සෑම සබත් දිනයකම ජුදාවරුන්ට හා ග්‍රීකවරුන්ට දේශනා කළේය. මෙහිදී බොහෝ දෙනෙක් විශ්වාසය වැළඳගත්හ.

* පාවුලුතුමාගේ දෙවන ධර්මදූත ගමනේ දී බිහිකළ සභා අතර මූලික වන්නේ ශිල්පීය, කොරින්තිය හා තෙසලෝනික සභාවන් ය.

* **එපීසිය**

මෙය රෝම අධිරාජ්‍යය තුළ ආසියානු දිස්ත්‍රික්කයේ අගනුවර ය. මෙය ධනවත් හා අලංකාර නගරයකි.

* මෙහි ඩයානා දේවතාවියට නමස්කාර කිරීම සඳහා දේවාල වැඩි ප්‍රමාණයක් තිබූ අතර, සශ්‍රීකත්වයේ දේවතාවිය ලෙස ද හැඳින්විය.

* මෙය සංචාරක මධ්‍යස්ථානයක් වන නිසා මෙම දේවතා පිළිම හා රූප නිර්මාණය කොට අලෙවියෙන් විශාල ආදායම් ලබාගැනිණි. අනවින කරුවෝ හා විජ්ජාකරුවෝ මෙහි සිටියහ.

* පාවුලුතුමා එපීසියට පැමිණෙන විට ශුද්ධාත්මයාණන්ගෙන් බෞතීස්ම ලැබූ අය නොව ස්නාවක ජොහන්ගෙන් බෞතීස්මය ලද පිරිස සිටි හෙයින් සුපුවත දේශනා කිරීමට පහසු විය. ඇලෙක්සැන්ඩ්‍රියාවේ උපන් අපොල්ලොස් තුමා ජුදා ජාතික ව්‍යක්ත කථිකයෙකි. බහුශ්‍රැත ධර්මදේශකයෙකි.

* ජුදා ජාතිකයකු වූ ද ග්‍රීක දාර්ශනික වූ අපොල්ලොස් ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිට එපීසියට පැමිණ එහි සභාවක් පිහිටුවීය. ඔහු දැනසිටියේ ස්නාවක ජොහන්ගේ බෞතීස්මය ගැන පමණකි. ශුද්ධාත්ම ආගමනය පිළිබඳ නොදත් මෙතුමා ජේසුස් වහන්සේ ගැළවුම්කරු ලෙස දැන සිටියේ නැත.

පාවුලුතුමාගේ දේශනයට සවන්දුන් පිරිස මත අත තබා යාච්ඤා කොට ශුද්ධාත්මයාණන් දානය කළේය. එවිට ඔවුහු අන්‍ය භාෂාවෙන් කථාකොට දිව්‍යසි වැකි ප්‍රකාශ කළෝය. මේ පිරිස 12 පමණ වූහ.

* පාවුලුතුමා ධර්මශාලාවට පැමිණ තුන්මසක් පමණ දේව රාජ්‍යය ගැන නිර්භීත ලෙස තර්ක කරමින් සිත් දිනාගැනීමට උත්සාහ කරමින් සාකච්ඡා කළේය.

* තෝරාගත් ශ්‍රාවකයින්ට තුරානස්ගේ ශිල්ප ශාලාවෙහි දිනපතා තර්ක කළේය.

* දෙවසරක් තුළ ආසියාවේ විසූ සියලු ජුදෙව්වරු ද ග්‍රීක්වරු ද සමිඳාණන්ගේ වචනය ඇසූහ.

* එපීසයේ රූප වන්දනාව කළ අයට ද, අණාවින කළ අයට හා විජ්ජාකරුවන්ට ද එරෙහිව දේශනා කරමින් සත්‍ය දහමට ජනතාවගේ සිත් හැරවීය. ජනතාව තම වරද පිළිගනිමින් ස්වාමීන් වහන්සේ වෙත විශ්වාසය තැබූහ. විජ්ජාකරුවෝ තම කෘතීන් පුළුස්සා දැමූහ.

* පාවුලුතුමා තම 3 වන ධර්ම චාරිකාවේ දී එපීසියේ සභාව පිහිටුවීය.

- **ප්‍රධාන ඉගැන්වීම්**

**දේව අනුග්‍රහය** (රෝම 2:12-19, 7:7-20, 8:15-29)

* දේව වරප්‍රසාදය යනු වචනයට ශු. පාවුලු තුමා භාවිත කර ඇති ග්‍රීක වචනය කාරිස්. මෙම වචනයේ අර්ථය දයාව හෝ අචල ප්‍රේමය වෙයි.

* "නුඹලා මගේ වචනයට සවන් දී ඒ අනුව ජීවත්වන්නාහු නම්, මම ඔබේ දෙවියන් වහන්සේ වෙමි. ඔබ මාගේ ජනතාව වන්නාහුය." සමිඳාණන් වහන්සේ වදාළ සියල්ල අපි ඉටු කරන්නෙමු. මෙම සීනයි ගිවිසුමෙන් ජුදා ජනතාව දේවධර පරපුරක් විය.

* පාපයේ බලපෑමෙන් දෙවියන් වහන්සේගෙන් වෙන් වී උන්වහන්සේ සමඟ ඇතිකර ගත් සම්බන්ධතාව බිඳ දමා, නපුරාට වහල් වී ජීවත්වන මිනිසා මෝසෙස්ගේ ව්‍යවස්ථාව විශ්වාසවන්තව අනුගමනය කිරීම වැනි යහපත් ක්‍රියා තුළින් තමන්ව තමාම ගලවා ගනී. එනම් තමාව දෙවියන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයෙක් බවට පත්කර ගනී යනු ජුදා ආගමේ මූලික අදහසයි.

* දෙවියන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයෙක් වීම යනු දෙවියන් වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ටයෙක් වීම, දෙවියන් වහන්සේ සමඟ බිඳුණු සම්බන්ධතාවය නැවත ගොඩනගා ගැනීම හෝ ගැලවීම ලබාගැනීම වැනි අර්ථය ලබයි.

* ජුදා ආගම කෙරෙහි හා ජුදා ව්‍යවස්ථාව කෙරෙහි ගැඹුරු ඇල්මක් ඇති ජුදා පරිසිවරයෙකු වූ පාවුලු, එම දේව ධර්ම සංකල්පය තුළම ජීවත් විය. මිනිසා ව්‍යවස්ථාව අනුගමනය කරනවිට තම යහපත් ක්‍රියා මගින් තමාව දෙවියන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයෙක් බවට පත්කර ගනී යන සංකල්පය මත පාවුලු ව්‍යවස්ථාවට ගරු නොකළ කිතුනුවන්ගේ හතුරෙකු වෙමින් ඔවුන්ට පීඩා කළේය.

* එතුමාගේ දමස්කය කරාගිය ගමනේ අත්දැකීම, එතුමාගේ ව්‍යවස්ථා සම්බන්ධ සංකල්පය නැවත සිතා බලන්නට අවස්ථාවක් විය. උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ, තමා කිතුනුවන්ට කළ පීඩා කළ පවුකාරයෙක් ව සිටිය දී (මම ඔබ විසින් පීඩා කරනු ලබන ජේසුස්ය.) උන්වහන්සේ තමා වෙත අනුකම්පා වී, තමාගේ පව් කමාකර ශුද්ධාත්මයාණන් වහන්සේව දානය කර, තමාව ගලවා වසාගත් සේක. එම නිසා තමාව දෙවියන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයෙක් බවට පත්කළේ ව්‍යවස්ථාව නොව ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයයි. උන්වහන්සේගේ දයාවයි. තමාට ගැලවීම දානය කළේ ව්‍යවස්ථාව අනුව ජීවත්වීමේ යහපත් ක්‍රියාවන් නොව දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය බව පිළිගත්තේය. දැන් මිනිසුන් ..... (රෝම 3:21)

* මිනිසා ව්‍යවස්ථාව පිළිපැදීමෙන් නොව, ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි තබන විශ්වාසයෙන් පමණකී ඔහු දෙවියන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයෙකු වෙයි. ප්‍රසන්න වීම දෙවියන් වහන්සේගේ දයාවේ කාර්යයකි. දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ දායාදයකි. එය දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයකි. මෙයයි පාවුලුතුමාගේ ඉගැන්වීම හා ශුභ ආරංචිය.

* ව්‍යවස්ථාව දෙවියන් වහන්සේගෙන් පැමිණෙන්නේ ය. එය ශුද්ධ වූ ද යහපත් ද දෙයකි. එය ඉශ්රායෙලුන්ට දෙවියන් වහන්සේ විසින් දානය කරන ලද විශේෂ සම්පතකි. ව්‍යවස්ථාව, පාපය කුමක් දැයි පැහැදිළි කරයි. නමුත් පාපයේ ග්‍රහණයෙන් බේරෙන්නේ කෙසේ දැයි නොපවසයි. මිනිසාව පාපයට පත් කරන්නේ ව්‍යවස්ථාවයි. පාපයට වහල් කරයි. සාරධර්මයේ ද එය හොඳ නරක ගැන කියාදෙයි. නමුත් යහපත කරන්නට හැකියාව නොදෙයි. (රෝම 7:16) යනු පාවුලු තුමාගේ අවසන් තීරණයයි.

* මෝසෙස්ගේ ව්‍යවස්ථාව විශ්වාසවන්තව, අකුරට පිළිපදින තැනැත්තා, තමා ම තමාව ගලවා ගනී යනු ජුදා දහමේ ඉගැන්වීමයි. නමුත් ව්‍යවස්ථාවේ සෑම පනතක් ම අකුරට පිළිපදින එක් මිනිසෙක් නැත, කියා බයිබලයේ කියා ඇත. යහපත . . . . (ගීතාවලිය 14:1-3, 53:1-3) එම නිසා තමා විසින් ම දෙවියන් වහන්සේ සමඟ සැබෑ සම්බන්ධතාවක් ඇති කර ගත හැකි මිනිසුන් කවුරුත් නැත.

* අපි පව් කරන විට ව්‍යවස්ථාවට විරුද්ධව නොව, දෙවියන් වහන්සේට විරුද්ධව පව් කරන්නෙමු. එම නිසා පාපය මහා දුෂ්ඨ දෙයකි. එයින් ගැලවෙන්නට නිමක් නැති වන්දි ගෙවිය යුතුය. ඉතා කුඩා වූ පව්කාර වූ අප විසින් කිසිමදාක නිමක් නැති වන්දි ගෙවීමට නොහැකි ය. අපට අපවම පාපයෙන් බේරා ගැනීමට හැකියාව නැත. අපට අපවම දෙවියන් වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ටයන් කර ගැනීමට නොහැකිය. එහෙයින් අපට දේව වරප්‍රසාද අවශ්‍යය.

* මුල් කාලයේ ව්‍යවස්ථාව දේව ජනතාවට මගපෙන්වීමක් හා උපදේශකයෙක් ලෙස පැවතුණේය. ගැලවුම්කාරයෙකුගේ අවශ්‍යතාවය සිත් තුළ ඇති කළේය. නමුත් දැන් ගැලවුම්කරුවාණන් පැමිණ අවසානය. එම නිසා ව්‍යවස්ථාවට අර්ථයක් නැත. ක්‍රිස්තුස් වහන්සේ ව්‍යවස්ථාවේ පූර්ණත්වය ය.

* ජේසුස් වහන්සේගේ වරප්‍රසාදය උන්වහන්සේගේ කුරුසිය මගින් අප වෙත ගලා එයි. උන්වහන්සේ කෙරෙහි අප තබනා විශ්වාසය, වරප්‍රසාද මගින් විශ්වාස කරන්නා වූ සැම දෙවියන් වහන්සේ, තමන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයන් බවට පත් කරන සේක. එමනිසා ප්‍රසන්න වීම හෝ ගැලවීම දෙවියන් වහන්සේ අපට නොමිලේ දානය කරන වරප්‍රසාදයකි; දේව දීමනාවකි. එසේ හෙයින් අපි ව්‍යවස්ථාව සම්බන්ධ ක්‍රියා නිසා නොව, ඇදහිල්ල මගින් විශේෂයෙන් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි තබන්නා වූ ඇදැහිල්ලේ බලාපොරොත්තුවෙන් දෙවියන් වහන්සේට ප්‍රසන්න පුද්ගලයින් වෙමු.

* කිසිවෙක් ව්‍යවස්ථාව සම්බන්ධ ක්‍රියාවක් මගින් දෙවියන් වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ට අය නොවෙති. අපට ව්‍යවස්ථාව ලැබෙන්නටත්, වසර හාරසියය තිහකට පෙර ආබ්‍රහම් තම ඇදහිල්ල මගින් දෙවියන් වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ට කෙනෙක් වූහ. ඔහු . . . (උත්පත්ති 15 :6) ආබ්‍රහම් තම ඇදැහිල්ල මගින් දෙවියන් වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ටයෙක් වූවා සේ, දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දුව අනුව අප වෙත එවන ලද ක්‍රිස්තුස් වහන්සේ අදහා ගනිමින් දෙවියන් වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ට අය වන්නෙමු.

* ගලාතිවරුන් ව්‍යවස්ථාව ගැන කිසිවක් නොදැන සිටි අවස්ථාවක ශුද්ධාත්මයාණන් වහන්සේ ලබාගත්තෝ ය. එසේ වුණේ ඔවුන් දේව ප්‍රේමයේ ශුභ ආරංචිය අසා දෙවියන් වහන්සේ අදහා ගත් නිසා ය. (ගලාති 3:1-12)

* ජුදෙව්වන් වේවා අන්‍ය ජාතිකයින් වේවා, අප සැම ගැලවීම ලබන්නේ, දෙවියන් වහන්සේ ඉදිරියේ පිළිගනු ලබන අය වන්නේ, ව්‍යවස්ථාව මගින් හෝ ව්‍යවස්ථාවට අදාළ ක්‍රියාවන් මගින් නොව ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ල මගින් ය.

* ගැළවීම මිලදී ගත් දෙයකි කියා පාවුළුතුමා සඳහන් කරයි. (1 කොරි 6:20, ගලාති 3:13) ක්‍රිස්තුස් වහන්සේ තමන් වහන්සේගේ ලෙයින් උරුමකර ගත් දෙවියන් වහන්සේ ශුද්ධ වූ සභාව ගැන කතා කරයි. (තීතස් 2:14) ක්‍රිස්තුස් වහන්සේගේ කල්වාරි යාගය. අපේ ගැළවීම, දෙවියන් වහන්සේට ප්‍රසන්න වීම, දෙවියන් වහන්සේ විසින් ධර්මිෂ්ට යැයි ගණන්ගනු ලැබීමේ උපකරණයයි. ඒ වෙනුවෙන් දී ඇති මිලයයි.

* ගැළවීම, දෙවියන් වහන්සේගේ දීමනාවයි. දේව වරප්‍රසාදයයි. ජුදෙව්වරු වුව ද අන්‍ය ජාතිකයින් වුව ද සෑම දෙනා පාපය මගින්, දෙවියන් වහන්සේගෙන් ලැබුණු උදාරත්වය නැති කරගත්හ. නමුත් සෑමදෙනා ක්‍රිස්තුස් වහන්සේ ඉටුකළ ගැලවීමේ ක්‍රියා මගින්, දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයෙන් නොමිලේ උන්වහන්සේට ප්‍රසන්න අය වන්නාහුය. දෙවියන්වහන්සේ පවුකාරයින්වත් යහපත් අය මෙන් ගණන් ගන්නා සේක.

**ක්‍රිස්තුස් වහන්සේගේ නායකත්වය** (එපිස 1:3-10, කොලො. 1:15-20)

* ක්‍රිස්තුන් වහන්සේගේ නායකත්වය ගැන පාවුලුතුමාගේ ඉගැන්වීම තේරුම්ගත යුත්තේ නෝස්ටිකවරුන්ගේ ඉගැන්වීමේ පසුබිම මතය. නෝස්ටිකවරුන්ගේ අදහස අනුව, දෙවියන් වහන්සේ වෙතින් නික්මුණු විවිධ බලශක්ති අතරින් ක්‍රිස්තුස් වහන්සේ ද එක් බල ශක්තියකි. එම නිසා උන්වහන්සේ උසස්, සමාන කළ නොහැකි, එකම පුද්ගලයෙක් නොවන්නේ ය. තවද දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුළින් මුළුමනින් ම එළිදරව් වන බව ද ඔවුහු පිළිගනිති.

* මෙයට විරුද්ධව පාවුලුතුමා ක්‍රිස්තුස් වහන්සේගේ සමාන කළ නොහැකි භාවය, නායකත්වය ගැන කතා කරයි. ක්‍රිස්තුස් වහන්සේගේ අදෘශ්‍යමාන . . . (කොලොස්සි 1:15)

* ස්වරූපය යන වචනයට පාවුලුතුමා භාවිත කරන ග්‍රීක වචනය නියෝජ්‍ය හෙලිදරව්ව යන තේරුම ලබයි. එම නිසා පාවුලුතුමා දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ මගින් සම්පූර්ණයෙන්ම හෙළිදරව් වන බව පවසයි. දෙවියන් වහන්සේව මනුෂ්‍යයා දැක, දැනගෙන තේරුම් ගත් තරමට ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේව සම්පූර්ණයෙන් නියෝජනය කරන සේක.

* තවදුරටත් පාවුලුතුමා ක්‍රිස්තුස් වහන්සේ හා මැවිල්ල අතර ඇති සම්බන්ධතාව ගැන කතා කරයි. ක්‍රිස්තුස් වහන්සේ මුළු මැවිල්ලේ අගතැන් ගන්නා සේකැ යි කියයි. හෙබ්‍රෙව්, ග්‍රීක චින්තනයේ මෙම කියමන, ක්‍රිස්තුස් වහන්සේ මුළු මැවිල්ලේ අගතැන ගන්නා බවට, අර්ථය නොදෙයි. ඒ වෙනුවට උතුම් බව හා තේජාන්විත බව සඳහන් කරයි. එසේ නම් මැවිල්ල අතර ඉතා උතුම් හා තේජාන්විත තැනන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේය යන අර්ථය දෙයි. උන්වහන්සේ සෑම මැවිල්ලකටම පෙර ජනිත වූ සේක.

* තවද සගලොවත් . . . . මවන ලද්දේ ය. (කොලොස්සි. 1:16)

* එපමණක් නොව සියලු දේ උන්වහන්සේ උදෙසා ද මවනු ලැබුවේ ය. ජේසුස් වහන්සේ මැවිලි සියල්ලේ මැවුම්කාරයාණන් පමණක් නොව,උන්වහන්සේ මවනු ලැබූ සියලු දේවල පරමාර්ථය ද අවසානය ද වන සේක. මැවිල්ලේ ආරම්භය හා අවසානයට අතරමැද කාලයේ එය ආරක්ෂා කරන්නා වූ තැනන් වහන්සේ, ස්වභාවධර්මයේ නීතිය නිකුත් වන්නේ ද උන්වහන්සේගේ හදවතෙහි ය.

* තවදුරටත් පාවුලුතුමා සභාවත්, ක්‍රිස්තුස් වහන්සේත් අතර ඇති සම්බන්ධතාව ගැන කතා කරයි. (1:18-19) ක්‍රිස්තුස් වහන්සේ ශරීරය නැමැති සභාවේ හිසය. එහි මූලාරම්භය ය.

* ක්‍රිස්තුස් වහන්සේ තුළින් සභාව උපත ලැබුවේය. එනම් පළමු මැවිල්ල වන ලෝකය ක්‍රිස්තුස් වහන්සේගේ මැවිල්ලක් වන්නා සේ ම සභාව ද උන්වහන්සේගේම මැවිල්ලකි. ශුද්ධ වූ සභාවේ ආරම්භය හා එය පාලනය කරන්නේ උන්වහන්සේමය. සභාව ආධ්‍යාත්මික වරප්‍රසාද ලබාගන්නේ ද උන්වහන්සේගෙන් ම ය.

* ක්‍රිස්තුස් වහන්සේ මරණයෙන් උත්ථාන වීමෙහි පළමුවැනියා වේ. ක්‍රිස්තුස් වහන්සේ ජීවත්ව සිට නැසීගිය කෙනෙක් නොවෙති. උන්වහන්සේ අද ජීවමාන කෙනෙකි. අපි උන්වහන්සේව අදත් අත්දකිමු. උන්වහන්සේ අදත් අප අතර ජීවමානව සිටින සේක. පාපය ජයගෙන, මරණය ජයගෙන, සියල්ල ජයගත් ජයග්‍රාහකයා ලෙස උන්වහන්සේ සිටින සේක. තමන් වහන්සේගේ උත්ථානය මගින් සියලු දේ අධිපතියා වූ සේක.

* පාපයේ විපාකය මගින් දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර පැවති යහපත් සම්බන්ධතාව සිඳබිඳ මිනිසා දෙවියන් වහන්සේගෙන් ඈත් වූහ. නමුත් දෙවියන් වහන්සේ නොකඩවා මිනිසාට ප්‍රේම කළ සේක. එමනිසා සමගි සන්ධානය කිරීම සඳහා ක්‍රිස්තුස් වහන්සේව මෙලොව එවූ සේක. ක්‍රිස්තුස් වහන්සේ සමගි කිරීමේ සේවාව කිරීම සඳහා මෙලොවට වැඩිය සේක.

* අහසේ හා පොළොවේ සියල්ල තමන් වහන්සේ ඒකාබද්ධ කර ගැනීමට උන්වහන්සේ අදහස් කළ සේකැයි පාවුලු තුමා පවසයි. මිනිසා සමඟ පමණක් නොව පණ ඇති, පණ නැති සෑම මැවිල්ලක් ම ඒකාබද්ධ වීම උන්වහන්සේගේ අභිප්‍රාය විය. ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේ මරණය මගින් මැවිලි සියල්ල දෙවියන් වහන්සේ හා ඒකාබද්ධ කළ සේක.

* මෙසේ පාවුලු තුමාට අනුව මැවිල්ල සියල්ල ක්‍රිස්තුස් වහන්සේට සමාන නැත. උන්වහන්සේ, සෑම මැවිල්ලකටම වඩා උතුම් වූ තැනන් වහන්සේ ය. ඉතා උසස් තැනැත් වහන්සේ ය. ක්‍රිස්තුස් වහන්සේගේ ස්වාමීත්වය හා නායකත්වය අප සැම පිළිගත යුතුය. අපේ ජීවිතයේ, අපේ පවුල්වල උන්වහන්සේ රජාණන් විය යුතුය.

**ක්‍රිස්තුස් වහන්සේගේ බැගෑපත්කම** (පිලිප්පි 2:5-11)

* ජීවත් වන්නේ මා නොව, මා තුළ ක්‍රිස්තුස් වහන්සේ ජීවත් වන සේක. මගේ ජීවිතය ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයට හරවන්නට නම් මගේ සිත ක්‍රිස්තු තුමන්ගේ සිත මෙන් විය යුතුය. එමනිසා, ක්‍රිස්තුස් වහන්සේ තුළ පැවති . . . (පිලිප් 2:5) කියා විස්තර කරන පාවුලුතුමා, ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය මගින්, ක්‍රියාව මගින්, හෙළිදරව් වූ උන්වහන්සේගේ හදවතේ ස්වභාවය අපට පෙන්නුම් කර එම ස්වභාවයම අප හදවත් තුළ ඇතිකර ගත යුතු යැයි කියා, විශේෂයෙන් උන්වහන්සේගේ බැගෑපත්කමේ උතුම්කම අපට විස්තර කරන්නේ ය.

* දෙවියන් වහන්සේගේ ස්වරූපය දැරූ උන්වහන්සේ, එය ඉවතලා, අප හා සමාන මනුෂ්‍යයෙකු වූ සේක. ස්වරූපය කියා පාවුලුතුමා භාවිත කරන ග්‍රීක වචනය, ඕනෑම පරිසරයක වෙනස් නොවන බව සඳහන් කරයි. ජේසුස් වහන්සේ වෙනස් නොවන දේවත්වය දැරූ තැනැන් වහනසේ ය. උන්වහන්සේ දෙවියන් වහන්සේ ය.

* නමුත් උන්වහන්සේ, දෙවියන් වහන්සේ හා සමානත්වය තමන් විසින් බදාගෙනම තබාගත යුතු වස්තුවකැයි නොසිතූ සේක.

* සියලු දේ ඉවත ලා සේවකයකුගේ ස්වරූපයක් ගෙන අප හා සමාන මනුෂ්‍යයෙකු වූ සේක. හිස්කර ගැනීම පාවුලුතුමා භාවිත කරන ග්‍රීක වචනය, කිසිවක් නොතබා සම්පූර්ණයෙන් හිස්වීම, එය නැතිවීමේ අර්ථය දෙයි.

* ජේසුස් වහන්සේගේ මෙලොව ජීවිත තත්ත්වය පැහැදිළි කරයි. උන්වහන්සේගේ මාංශගත වීමේ අභිරහස පාවුලුතුමා ජීවමානව විස්තර කරයි. උන්වහන්සේ මනුෂ්‍යත්වය ගැනීම සඳහා තමන්ගේ දේවත්වයෙන් සිය කැමැත්තෙන් හිස් වූ සේක. තමන්ගේ අයිතීන් උසස්භාවය, හැකියාවන්, සෑම ඉවත ලූ සේක.

* "වහලෙකුගේ ස්වරූපය ගෙන" මෙතැන නැවත ස්වරූපය යන වචනය වෙනස් කිරීමට නොහැකි තත්ත්වය සඳහන් කරයි. ජේසුස් වහන්සේ මිනිසා මෙන්, වහලෙකු මෙන්, රඟපෑවේ නැත. සැබැවින්ම මිනිසෙක් වූ සේක. මිනිසාගේ සතුට, දුක, වේදනාව, දිළිඳු භාවය, සෑම අංශයකින් ම පංගුකාරයෙක් වූ සේක. පාපය හැර අනෙක් සියලු දෙයින් මිනිසාට සමාන වූ සේක.

* මිනිසෙකු වූවා පමණක් නොව, උන්වහන්සේ වහලෙකු වූ සේක. වහලෙක් තමා වෙනුවෙන් ජීවත් නොවන කෙනෙකි. තමාට කියා කිසිවෙක් නොමැති කෙනෙකි. අනෙක් කෙනා වෙනුවෙන් ජීවත් වෙන කෙනෙකි.

* කුරුසියේ මරණය දක්වා උන්වහන්සේ බැගෑපත් වූ සේක. වහලෙක් වූවා පමණක් නොව, ඉතා පහත් මට්ටමේ වහලෙක් වූ සේක. කුරුසියේ මරණය වහලෙකුට, තමාගේ අයිතිවාසිකම් සියල්ලම නැති වූ කෙනෙකුට නියමිත දඬුවම් ක්‍රමයේ ඉතා නීච ක්‍රමයයි.

* ක්‍රිස්තුස් වහන්සේගේ මෙලොව ජීවිතයේ කැපී පෙනෙන ගුණාංග වන බැගෑපත්කම, පරිත්‍යාගය, ගැන පාවුලුතුමා විස්තර කරයි. උන්වහන්සේ මිනිසා මත බලය පෑමට නොව, ඔවුන්ට සේවය කිරීමට කැමති වූ සේක. උන්වහන්සේ තමාගේ කැමැත්ත අනුව නොව පියාණන් වහන්සේගේ කැමැත්ත අනුව ජීවත් වීමට අභිප්‍රාය කළ සේක. උන්වහන්සේ තමන් වහන්සේව උසස් කරගත්තේ නැත. . . .

* "අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ත්‍යාගශීලී කරුණාව ඔබ දන්නාහු ය." (1 කොරි. 8:9)

* තමා පහත් කරගන්නා උසස් කරනු ලබන්නේ ය කියා නව ගිවිසුමේ කියවා ඇත. ක්‍රිස්තුස් වහන්සේගේ ත්‍යාගශීලී භාවය, උන්වහන්සේගේ හිස්වීම, බැගෑපත්කම, කිසිදු මිනිසෙකුට නොලැබුණු තේජමානත්වය ලබා දුන්හ. මරණය පරාජය කොට නව ජීවිතයක් ගෙන, උත්ථාන කරනු ලැබූහ. දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේව මරණයෙන් උත්ථාන කළ සේක. මහිමයට පත්කළ සේක.

* දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේව මහිමයට පත්කර, උන්වහන්සේට සියලු නාමවල අග්‍ර නාමය දානය කළ සේක. අලුත් නමක් තැබීම කෙනෙකුගේ ජීවිතයේ නවක තත්ත්වයක් ආරම්භ කිරීම සඳහන් කරයි. දෙවියන් වහන්සේ, තැබූ නව නාමය (ස්වාමිනි) මුල් සභාවේ ජේසුස් වහන්සේව මෙම නාමයෙන් හඳුන්වනු ලැබූහ. උන්වහන්සේ සැම දෙනාගේම අයිතිකරුය.

**උත්ථානය**

* ශුද්ධ වූ සභාවේ මුල් අවදියේ, මළා වූ අය නැවත නැගිටුවීම සම්බන්ධයෙන් පැහැදිළි තේරුමක් නොපැවතුණි. බොහෝ දෙනා ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි පැමිණීම කඩිනමින් සිදුවේ යැයි යන බලාපොරොත්තුවෙන් ඉතා ආශාවෙන් බලාසිටියෝය. එහෙත් ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීම ප්‍රමාද වූ අතර, කිතුනුවන්ගෙන් සමහරුන්ට මෙලොව ජීවිතයේ අවසන් කාලය ද පැමිණියේය. මෙසේ ක්‍රිස්තුන් වහන්සේගේ දෙවෙනි පැමිණීමට පෙර මළා වූ අයට කුමක් සිදුවේ ද යන්න ප්‍රශ්නයක් ඔවුන් අතර මතුවුණි. (1 තෙස. 4:14) තවද සමහර කොරින්තිවරු මළවුන්ගෙන් නැවත නැගිටීම ගැන විශ්වාස කළේ නැත. (1 කොරි : 15:12)

* තෙසලෝනිකවරුන් හා කොරින්තිවරුන් අතර පැවති මළා වූ අය නැවත නැගිටීම සම්බන්ධ සැකය හෝ ගැටලුව නිරාකරණය කිරීම සඳහා පාවුලු තුමා මේ සම්බන්ධ ඉගැන්වීම ලියා ඇත.

* මළා වූ අය නැවත නැගිටීම, අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම් තුළින් අපට ලැබුණු දෙයකි. එසේම, ක්‍රිස්තුස් වහන්සේ නැවත නැගිට වදාල බැවින්, මළවුන්ගෙන් නැවත නැගිටීම ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යයකි. ක්‍රිස්තුස් වහන්සේගේ මාංශගත වීම පිළිගන්නා අපි, උන්වහන්සේගේ උත්ථානය ද පිළිගනිමු. එසේ උන්වහන්සේව අනුගමනය කරන අපට ද උන්වහන්සේ මෙන් දිනෙක එම අත්දැකීමක් බලාපොරොත්තු විය හැකි ය. (1 කොරි 15:20)

* ක්‍රිස්තුස් වහන්සේ යක්ෂයා කෙරෙහි, පාපය කෙරෙහි, මරණය කෙරෙහි ලැබුවා වූ ජයග්‍රහණය මළවුන් උත්ථාන කරනු ලබන බවට සහතිකයක් වේ. (1 කොරි.15:21-22)

* ක්‍රිස්තුස් වහන්සේ මහිමාන්විතව දෙවන වරට පැමිණෙන විට, උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබා මළා වූ අය ප්‍රථමයෙන් උත්ථාන කරනු ලබන්නෝ ය. ක්‍රිස්තුස් වහන්සේ දෙවන වරට පැමිණෙන විට උන්වහන්සේ, ප්‍රථමයෙන් තමන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූ සෑම උත්ථාන කරන බව පාවුලු තුමාගේ ඉගැන්වීම වෙයි.

* ප්‍රසාද ස්නාපනය යනු ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි අප තබන විශ්වාසයේ ප්‍රකාශයයි. ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් දානය කරන්නා වූ ප්‍රසාද ස්නාපනය (කොරි. 1:13) එම ප්‍රසාද ස්නාපනය ලබාගන්නා වූ තැනැත්තාව අප ක්‍රිස්තුස් වහන්සේගේ මරණයත් සමඟ වළලනු ලැබ උන්වහන්සේගේ උත්ථානයත් සමඟ උත්ථාන කරනු ලබයි. (රෝම 8:3, කොලෝ. 2:12) වතුරේ ගිල්වීම, ක්‍රිස්තුස් වහන්සේගේ මරණයත්, වළලනු ලැබීමත් සංකේතවත් කරයි. දියෙන් ගොඩවීම ක්‍රිස්තුස් වහන්සේ සමඟ ඒකාබද්ධ වී උත්ථාන වීමට සලකුණක් වෙයි. පාපයට නැසීමත්, ජීවිතය වරප්‍රසාදයක් සේ ලබාගැනීමත් වෙන් කළ නොහැකි එකම ක්‍රියාවකි.

* අපගේ විශ්වාසය, ප්‍රසාද ස්නාපනය මාර්ගයෙන් අපි ක්‍රිස්තුස් වහන්සේ හා උන්වහන්සේගේ ජීවිතය, මරණය හා උත්ථානය සමඟ එක්වෙමු. ජීවත් වෙන්නේ මා නොව, මා තුළ ක්‍රිස්තුස් වහන්සේ ජීවත් වන සේක. කිතුනුවන් හෙවත් ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවත් වන පුද්ගලයකු දිනපතා පාපයට මැරී ක්‍රිස්තුස් වහන්සේගේ නව ජීවිතයට උත්ථාන වෙයි. ඔහුගේ ජීවිතය, නිතර තමා තුළ නැසීයාම හා උත්ථානය වීමය. දිනක ඔහු ක්‍රිස්තුස් වහන්සේ මෙන් පාපයට සම්පූර්ණයෙන් විනාශ වී සදාකාල ජීවිතයටම නැවත නැගිටුවන බව ඔහුගේ බලාපොරොත්තුවයි. මෙම බලාපොරොත්තුවෙන් ඔහු ජීවත් වෙයි. මෙම බලාපොරොත්තුවේ මූලික පදනම වන්නේ ක්‍රිස්තුස් වහන්සේ තුළ නැවත නැඟිටීමයි.

* ප්‍රසාද ස්නාපනය මගින් ශුද්ධාත්මයාණන් ලබාගත් මිනිසා දේව දරුවෙක් ලෙස තමා රසවිඳින, දෙවියන් වහන්සේගේ මහිමයේ පූර්ණත්වය බලාපොරොත්තුවෙන් ජීවත් වෙයි. එම දිනය ඔහුගේ ආත්මය පමණක් නොව, ඔහුගේ ශරීරය ද විනාශ නොවී මරණයෙන් හා පාපයේ වහල් බවින් මිදීමට බලාපොරොත්තුවෙන් පුල පුලා සිටී.

* ශු. පාවුලුතුමා මළා වූ අය නැවත උත්ථාන වන බව විශ්වාස නොකරන කොරින්තිවරුන් සමහරුන්ට ඉතා කෝපයෙන් බැනවදී. (1 කොරි. 15:12-20)

* මෙම බලාපොරොත්තුව තම ජීවිතයේ බොහෝ අනතුරුවලට මුහුණදීමට ශක්තිය දුන් බව පාවුලුතුමා ප්‍රකාශ කරයි. එමෙන් ම මතු පැමිණෙන්නට තිබෙන මහිමය ගැන කිතුනුවන් සැම තුළ බලාපොරොත්තුවක් ඇති කිරීම සඳහා පාවුලු තුමා මෙසේ කියයි. (රෝම 8:18-25)

* මිනිසා පමණක් නොව සකළ මැවිල්ල පැමිණෙන්නට තිබෙන මහිමය සඳහා බලාපොරොත්තුවෙන් සිටින බව කියයි. මිනිසා කළ පාපය නිසා සාපයට ලක් වූ විශ්වය එයින් නිදහස් වීමට ජරාපත් වීමේ වහල්කමින් මිදීමට, බලාසිටියි. පාවුලු තුමා ජුදෙව්වන් තුළ අන්තිම දවස් ගැන පැවතුණු අදහස් පදනම් කොට අද පවතින ලෝකය ගැනත් පැමිණෙන්නට තිබෙන ලෝකය ගැනත් කතා කරයි. මේ ජීවිතයේ . . . කරමි. (රෝම 8:18) එම දවසේ දී දෙවියන් වහනසේව සාතන් හා සියලුම දුෂ්ට බලවේග ජයගෙන සකල ජනයා, මැවිල්ල හා ස්වභාවධර්මය මුදාගන්නා බව කියා, මුළු විශ්වයම දෙවියන් වහනසේගේ එකම රාජ්‍යයක් යටතේ ගෙන එනු ලබන බව කියයි. සාමය හා සතුට සැම තැන පැතිරී යයි.

* ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය හා ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා නැසීගිය අයගේ උත්ථානය ගැනත් තහවුරු කරන පාවුලුතුමා, අවසානව නැසීගිය අය කෙබඳු ශරීරයකින් නැවත උත්ථාන වේ ද යන කරුණු ගැනත්, අපට උගන්වයි. එයට හේතුව සමහර කොරින්තිවරු මාංශ උත්ථානය නොපිළිගත් බැවිනි. වළලනු ලැබ දිරාපත් වී ගිය ශරීරය නැවත උත්ථාන වන්නේ කෙසේ දැයි ඔවුහු ප්‍රශ්න කරති. එමනිසා ග්‍රීකවරුන්ගේ අදහස අනුව ඔවුහු දිරාපත් නොවන ආත්මය ගැන අදහස පිළිගත්හ. මාංශ උත්ථානය නොපිළිගත්හ.

* පාවුලුතුමා මළවුන්ගේ මාංශ උත්ථානය තහවුරු කරයි. මළාවූ අය වළලනු ලැබ එම සිරුරෙන්ම, නමුත් අන්‍ය රූප වූ ශරීරයකින් උත්ථාන වෙයි. එනම් වළලනු ලබන්නේ ස්වාභාවික ශරීරයකි. උත්ථානය කරනු ලබන්නේ ආධ්‍යාත්මික ශරීරයකි. උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේගේ සිරුරේ ඇණ කැලැල් දකින්නට ලැබුණේය.

* උත්ථාන කරනු ලබන ශරීරයේ ස්වභාවය විස්තර කිරීමට පාවුලුතුමා වළලනු ලබන බීජයක් උපමා කරගත්තේ ය. අපි තිරිඟු බීජයක් වපුරමු. එය පොලොවේ මැරී තවත් අලුත් පැලයක් හටගනියි. දෙවියන් වහන්සේ, තමන් වහන්සේගේ අභිප්‍රාය අනුව එම බීජයට අලුත් ජීවිතයක් දෙන සේක. එකම බීජය නමුත් පිටස්තර පෙනුම වෙනස් වී ඇත. (1 කොරි. 15:35-38) වළලනු ලබන ශරීරයත්, උත්ථාන කරනු ලබන ශරීරයත්, වපුරනු ලබන බීජයත්, එයින් හටගන්නා පැලයත් බාහිර පෙනුමෙන් වෙනස් වෙන්නේ ය. සම්බන්ධතාවක් හා වෙනත් පරිවර්තනයක් දකින්නට ලැබේ.

* පාවුලුතුමා, නැසීයන මොහොතේ ශරීරයේ ස්වභාවය හා උත්ථානවන විට ශරීරයේ ස්වභාවය සංසන්දනය කර පෙන්වයි.

| මැරෙන මොහොතේ | උත්ථාන වන මොහොතේ |
|---|---|
| - දිරන සුලුයි. | - නොදිරන සුලුයි. |
| - මැරෙන සුලුයි. | - අමරණීය තත්වයකි |
| - දුර්වලය. | - බලවත් ශරීරයකි |
| - මිනිස් ස්වභාවයකි. | - ශුද්ධාත්ම ස්වභාවයකි |
| - පසෙන් මවනු ලැබූ ශරීරයකි. | - ස්වර්ගයෙන් පැමිණි නැනැන් වහන්සේගේ ශරීරය ය. |

**දෙවන පැමිණීම**

* ශුද්ධ වූ පාවුලුතුමා ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි පැමිණීම ගැන උගන්වන දේ, පරණ ගිවිසුමේ අවසන් කාලය ගැන කියා ඇති අදහස් පසුබිම් කරගෙන එහි පෙන්වා ඇති දෙවියන් වහන්සේගේ දවස් යන පසුබිම මත තේරුම් ගත යුතුයි.

* පාවුලු තුමා ජුදා පරිසිවරයෙකි. අවසන් කාලය ගැන ජුදා ආගම ඉගැන්වූ දේ හොඳාකාරව දැන පිළිගත් කෙනෙකි. එතුමා කියන දේ අප තේරුම් ගත යුත්තේ, කෙනෙකු තුළ ඇති විශ්වාසයේ පදනම මත ය.

* ලෝකයේ අවසන් කාලය සම්බන්ධව ජුදෙව්වරුන්ගේ අදහස් අනුව ලෝක ඉතිහාසය පවතින යුගය, පැමිණෙන්නට තිබෙන යුගය, කියා කාලවකවානු දෙකකට බෙදා ඇත. අපි දැන් පවතින යුගයේ සිටිමු. එහි සාතන්, මරණ පාලනය කරයි. බොහෝ විගසින් මෙම යුගය අවසානයට පැමිණෙයි. මෙසියස් වහන්සේ පැමිණ සාතන්ව ජයගෙන ජනතාව මුදා පැමිණෙන්නට තිබෙන යුගය ආරම්භ කරයි.

* මෙම කාලවකවානු දෙකට අතර දෙවියන් වහන්සේගේ දවස පැමිණෙයි. එනම් පවතින යුගයේ අවසාන දිනයේ උදාවෙන නව යුගය ආරම්භයේ මෙම දවස පැමිණෙයි. එය ඉතා බියජනක දවසයි. පවතින යුගය අවසන් වී, පැමිණෙන්නට තිබෙන යුගය උදාවෙයි. එම දවස දෙවියන් වහන්සේ, මෙසියස් වහන්සේ යවා සාතන් සමඟ අවසන් සටන පවත්වා ඔහු පරාජය කොට ලෝකය මුදාගන්නා දවසයි. එම දවසේ දී භූමිකම්පා ඇතිවී පෘථිවිය සොලවනු ලබයි.

* පැමිණෙන්නට තිබෙන යුගයේ, අපි දෙවියන් වහන්සේගේ පාලනය යටතේ, දේව රාජ්‍යයේ සාමයෙන් ජීවත් වෙමු. මළා වූ අය උත්ථාන වන්නේ ද පැමිණෙන්නට තිබෙන යුගයේදී ය.

* දමස්කස් නුවරට යන මඟ ශුද්ධ පාවුලුතුමා උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේව මුණගැසීම එතුමාගේ ජීවිතයේ විශාල වෙනසක් ඇති කළේය. මක්නිසා ද ක්‍රිස්තුන් වහන්සේ උත්ථාන වූ සේක් නම් සැබැවින් ම පැමිණෙන්නට තිබුණු යුගය උදා වී ඇත. මරණය ජයගෙන සාතන් ව පරාජය කර අවසානයි. එම නිසා අවසන් සටන ද නිමා වී ඇත.

  එය කොතැන ද ? සිදුවුණේ කවදා ද ? එය කල්වාරියේ සිදුවෙන්නට ඇති. එම නිසා ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ විසින් දෙන ලද පොරොන්දුව හා දිවැසිවරුන් විසින් පෙර දැනුම් දෙන ලද ඉශ්‍රායෙල්වරුන් විසින් බලාපොරොත්තු වූ මෙසියාණන් බව තීරණය කරගත් එතුමා සැබැවින් ම ස්ථිරයෙන් ම එය විශ්වාස කළේය.

* අවසන් සටන නිමා වී සාතන් පරාජය කරනු ලැබූවත්, ඔහුගේ දුෂ්ට බලවේග සැමතැන පැතිර, සැඟවී ක්‍රියා කරයි.

* ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රථම පැමිණීමට හා දෙවෙනි පැමිණීමට අතර කාලය මෙසියස්ගේ කාලය කියා අපි නම් කරමු. එම නිසා අපි දැන් මෙසියස්තුමාණන්ගේ කාලයේ ජීවත් වෙමු. මෙය පවතින යුගයටත්, පැමිණෙන්නට තිබෙන යුගයටත් අතර කාලයයි. මෙම කාලයේ මෙසියස් තුමන් හෙවත් ජේසුස් වහන්සේ තම ශුද්ධාත්මික දේහයවන ශුද්ධ වූ සභාව මගින් ලෝ සැමතැන පැතිර, සැඟවී, ක්‍රියා කරන දුෂ්ට බලවේග සොයා ඒවා විනාශ කර මුළු ලෝකයම පියවරෙන් පියවරට දෙවියන් වහන්සේගේ පාලනය යටතට ගෙන එන සේක.

* ශුද්ධ වූ සභාවේ සේවාව මගින් සකල මැවිල්ල ක්‍රිස්තුස් වහන්සේගේ පාලනය යටතට ගෙන්වනු ලැබීමෙන් පසු, ක්‍රිස්තුස් වහන්සේ විගස නැවත (දෙවෙනි වතාවට) මහිමාන්විතව පැමිණ ජනතාව විනිශ්චය කර, තමන් වහන්සේගේ පාලනය යටතට ගෙනැවිත් මුළු ලෝකයම පාලනය කරන්නට දෙවියන් වහන්සේට භාර දෙන සේක. පැරණි ගිවිසුමේ දෙවියන් වහන්සේගේ දවස නමින් හඳුන්වනුයේ එම දවසයි. නව ගිවිසුමේ "පරුසියා" නමින් හඳුන්වනු ලබන මෙය ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි පැමිණීමේ දවස යන අර්ථය ලබයි.

* එම දවස භයානක දවසයි. ක්‍රිස්තුස් වහන්සේ විනිශ්චය කර වදාරන්නට නැවත පැමිණෙන විට සතුටුදායක විනිශ්චයක් ලබන්නට මාර්ගය නම් අපි දැන් සිටම උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමයි. ශුද්ධ වූ පාවුලුතුමා, ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි පැමිණීම ජනතාවගේ සාරධර්ම ජීවිතය උනන්දු කරවන අවස්ථාවක් හැටියට ......... මෙය ශුද්ධ වූ පාවුලුතුමාගේ දේව ධර්මයේ, දේව සේවයේ පදනම වෙයි.

* පාවුලුතුමා, තමාගේ සේවයේ මුල් කාලයේ තෙසලෝනියේ සේවය කළවිට තෙසලෝනිකවරුන්ට මෙය පැහැදිළි කර ඇත. එම අදහසම එතුමා විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමු හසුනෙන් අපට දකින්නට ලැබෙයි. මන්ද . . . ස්වර්ගයෙන් බැස වදාරණ . . . (1 තෙස 4:16)

* තෙසලෝනියේ සේවය කළ අවස්ථාවේ ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි පැමිණීම වහාම සිදුවන බවත්, එම මෙහොතේ ජීවතුන් අතර සිටින යන අය අතරට පාවුලු තුමා තමාව ද ඇතුළත් කරගනී. (1 තෙස 4:15) ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි පැමිණීම ප්‍රමාද වූ නිසා වසර හතරකට පසු කොරින්තිවරුනට ලියන ලද පළමු ලිපියේ එම දවසේ දී මරණයෙන් උත්ථානවන අය අතර තමා ද එක්කෙනෙකු වන බව කියයි. (1 කොරි. 6:14)

* ක්‍රිස්තුස් වහන්සේ මහිමාන්විතව නැවත පැමිණෙන විට උන්වහන්සේ සිදුකරන ප්‍රථම කාර්යය වන්නේ තමන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇතිව නැසීගිය අයව උත්ථාන කිරීමයි, යනුවෙන් පාවුලු තුමා පවසයි. ඉන්පසු ජීවත්ව සිටින අයව ද වළාකුළු මැදින් ඔසවා දෙවියන් වහන්සේ හමුවේ ඔවුන්ව ද හිඳුවන සේක.

* උත්ථානයේ දී, නැසීගිය අය අන්‍ය රූප වෙයි. එනම් ආත්මයාණන්ට අයිති ශරීරයක් ලබයි. මෙතැන දී, එකල ජුදෙව්වන් තුළ පැවති ආකල්ප වර්ධනයක් අපට දකින්නට ලැබෙයි.

* තවදුරටත් කොරින්තිවරුන්ට ලියන ලද දෙවෙනි ලිපියේ තවත් වර්ධනයක් අපි දකිමු. මෙහි දේව සේවකයන් අතර උත්ථාන වීම සිදුවන බවත්, මිනිසාගේ ඇතුළාන්ත ස්වභාවය අලුත් කරනු ලබන විට ආත්මයාණන්ට හිමි ශරීරයක් ඇතිවන බව කියයි. තවද ශරීරය මැරුණු විගස ස්වර්ගයේ නිවස අපට ලැබෙන බව කියයි. (2 කොරි. 5:2-10)

* රෝමවරුන්ට ලියන ලද ලිපියේ පාවුලුතුමා, ප්‍රසාද ස්නාපනය මගින් ක්‍රිස්තුස් වහන්සේගේ මරණයේ පංගුකාරයන් වූ අපි ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානයේ දී ද පංගුකාරයන් වන බව පවසයි. (රෝම 6:3) ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි පැමිණීම අපේ ගැලවීමේ දවස හෙවත් උන්වහන්සේගේ මහිමයේ පංගුකාරයන් වන දවසයි. (රෝම. 8:17) ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි පැමිණීමෙන්, විනාශ වීමේ වහල්බවින් නිදහස් වී, දේව දරුකම ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් සකල මැවිල්ල ඉතා ආශාවෙන් බලාසිටින බව පාවුලු තුමා කියයි. (රෝම 8:19) මෙසේ ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි පැමිණීම සම්බන්ධවන පාවුලුතුමාගේ දේවධාර්මික සංකල්පය තුළ වර්ධනයක් එතුමාගේ ලිපි මාර්ගයෙන් අපට දකින්නට ලැබේ.

* ක්‍රිස්තුස් වහන්සේ සැබැවින් ම නැවත පැමිණෙන සේක. නමුත් එම දවස හදිසියෙන්, සොරෙක් එන්නාක් මෙන්, ප්‍රසූත වේදනාවක් ඇතිවෙනවා සේ, කිසිවෙකු බලාපොරොත්තු නොවූ වේලාවේ සිදුවෙයි. ක්‍රිස්තුස් වහන්සේ පවා, එම දවස කවදා සිදුවේ ද කියා කිසිම කෙනෙකු නොදන්නා බවත්, තමන් වහන්සේ ද ඒ බව නොදන්නා බවත්, පියාණන් වහන්සේ පමණක් දැනසිටින බවත් පවසා ඇත. (මාක්. 13:32)

* ඒ දවස දෙවියන් වහන්සේ මුළු මිනිස් සංහතියටම විනිශ්චය වදාරන්නට පැමිණෙන දවසයි. නමුත් කිතුනුවන් ඒ ගැන බියවීමට හෝ, බලාපොරොත්තු නොවූ එම දිනයේ කලබල වීමට හෝ හේතුවක් නොමැත. අඳුරේ ජීවත්වන තැනැත්තන්, නපුරු දේ කරන තැනැත්තන්, සූදානම් නැති අවස්ථාවේ දෙවියන් වහන්සේ පැමිණි විට උන්වහන්සේට මුහුණදීමට නොහැකිව කලබලයට පත් වෙයි. වරදකරුවන් හැටියට අසුවෙයි. නමුත් ආලෝකයේ ජීවත්වන කිතුනුවන්ට එම දවස කවදා සිදුවුණද ප්‍රශ්නයක් නොමැත. ක්‍රිස්තුස් වහන්සේ සමඟ . . . විනිශ්චයක් නොමැත. (රෝම 8 : 1)

* අවසානව පාවුලුතුමා ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි පැමිණීමට පෙර ලෝකය තුළ යම් යම් සළකුණු දකින්නට ලැබෙන බව පවසයි. (2 තෙස. 2:3-12)

* සාතන්ගේ නපුරු බලවේග මෙතෙක් මුළුමනින් ම විනාශ නොවී පවතින නිසා, නපුරු බලවේග මැද කිතුනුවා අවදියෙන් හා සිහිකල්පනාවෙන් ජීවත් විය යුතුය. එසේ ජීවත් වීමෙන් ඔහු ඕනෑම අවස්ථාවක එම දවසට මුහුණදීමට සුදුස්සෙකු වෙයි.

- **ශීල ධාර්මික කරුණු**

**පවුල් දිවිය** (1 කොරි : 7:11-16, එපීස 5:22-30)

* කිතුනු පවුල ශුද්ධ වූ සභාවේ ජීවනාලියයි. කිතුනු පවුල් රාශියකින් ගොඩනැගුණු දෙවියන් වහන්සේගේ විශේෂ පවුල ශුද්ධ වූ සභාවයි. කිතුනු පවුලක් ගෘහස්ථ සභාවකි. එම නිසා පවුල් ජීවිතය හා ශුද්ධ වූ සභාවේ ජීවිතය අතර කිට්ටු සම්බන්ධතාවක් ඇත.

* කිතුනු පවුල් ජීවිතය ගැන ශුද්ධ වූ පාවුලු තුමා තුළ පැවති ආකල්පයේ ද වෙනසක් අද අපි දකිමු. ප්‍රථමයෙන් ලියූ ලිපිවල විවාහය සම්බන්ධ විරුද්ධ අදහස් හා විවාහ ජීවිතය සුළුකොට සලකා තමා මෙන් හැමදෙනම විවාහ නොවී සිටීම යහපතැයි ප්‍රකාශ කරයි.

* කොරින්තිවරුනට ලියන ලද පළමු ලිපියේ ශුද්ධ වූ පාවුලුතුමා විවාහය හා පවුල් ජීවිතය ගැන ලියා ඇති දේ අපි නිසියාකාරව තේරුම් ගැනීමට නම් කොරින්ති ජනතාව ජීවත් වූ පරිසරයත්, ඔවුන් මුහුණ දුන් ප්‍රශ්නත් හොඳින් දැන සිටිය යුතුය. එම කාලයේ කොරින්ති නගරය වානිජමය, විනෝදකාමී, සදාචාරයෙන් ඈත් ව ජීවත් වූ ජනතාවක් සිටි එකකි. පාපයට ඇදී යාමට හැකි පරිසරයක්, පාපිෂ්ඨ ක්‍රියාවන් හි යෙදීමට ගැලපෙන අවස්ථා ඇතිකරන වාතාවරණයක් ද එහි පැවතුණි.

* තවද සමහර කොරින්තිවරුන්ගේ අදහස අනුව ශරීරය අයහපත් දෙයකි. එමනිසා එය අපි දමනය කළ යුතුයි. විනාශ කළ යුතුයි. එසේ නැතිනම් ස්වභාවික වූ සියලු ආශාවන්, තෘෂ්ණා, හැඟීම් දමනය කළ යුතුයි. කෙනෙක් සැබෑ කිතුනුවෙකු වීමට කැමති නම්, ශරීරය සම්බන්ධ සියලුම දෙයින් ඈත් වී විවාහ නොවී සිටිය යුතුයි.

* පාවුලුතුමාගේ කීම ක්‍රියාවේ නංවන්නට හැකි දෙයක් හැටියට හැඟේ. විවාහ ජීවිතය මගින් ස්වාමි පුරුෂයා හා භාර්යාව දෙවියන් වහන්සේ කෙරෙහි තිබිය යුතු ගෞරවය දැක්වීම අඩු කරයි. එම නිසා හැමදෙනාම විවාහ නොවී සිටීම යහපත් යැයි එතුමා කියයි. හැමදෙනාටම එවැනි වරප්‍රසාදයක් නොලැබෙයි. නමුත් කොරින්තියේ පැවතුණු පරිසරය අනුවත්, මිනිස් දුර්වලකම නිසාත් ස්වදමනය කිරීමට නොහැකි නම් ඒ අයට විවාහ ජීවිතයට ඇතුළුවීම සුදුසු යැයි පාවුලුතුමා කියයි. (කොරි. 7:1- 6-7)

* එකිනෙකා තම තමාගේ තත්ත්වය, ආශාවන්, දුර්වලකම් ගැන දැන සිටිය යුතුය. පාවුලුතුමාගේ මෙම කීම, කාම තෘෂ්ණාවේ පාපයෙන් වැළැකීමට විවාහය අනුමත කරන බව හැඟේ. ඉන්පසු එතුමා විවාහ නොවූවන්ට හා වැන්දඹුවන්ට උගන්වන දෙයින් මෙම අදහස් ම දකින්නට ලැබේ. (කොරි. 7:8-9) එම නිසා පාවුලුතුමා තුළ පැවතුණේ විවාහ ජීවිතය ගැන විරුද්ධ අදහස් හා අවතක්සේරුවක් වේ.

* තවදුරටත් විවාහ ජීවිතයේ ස්වභාවය, වගකීම්, හිමිකම් ගැන කථා කරයි. විවාහය පුරුෂයෙකු හා ස්ත්‍රියක් අතර ඇතිවන ගිවිසුමකි. පුරුෂයාට හෝ ස්ත්‍රියට තම කැමැත්ත කිරීමට හෝ තනිව තීරණ ගැනීමට නොහැක. එකමුතුවෙන් ක්‍රියාකළ යුතු ය.

* ස්වාමිපුරුෂයා, තම භාර්යාව තමාගේ අවශ්‍යතාවන් ඉටුකර ගැනීමේ උපකරණයක් හැටියට හෝ, භාර්යාව තම ස්වාමිපුරුෂයාව තමාගේ අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගැනීමේ උපකරණයක් හැටියට හෝ භාවිත නොකළ යුතුයි. ස්වාමිපුරුෂයාගේ ශරීරය භාර්යාවට හිමිවෙයි. භාර්යාවගේ ශරීරය ස්වාමිපුරුෂයාට හිමිවෙයි.

* විවාහ සම්බන්ධතාවයේ දෙදෙනා අතර ගරු කිරීමක් තිබිය යුතුයි. දෙදෙනා ශාරීරික වශයෙන් ද, ආධ්‍යාත්මික වශයෙන් ද, දෙපක්ෂය අතර, එකිනෙකා වෙනුවෙන්, අනෙකා තමාව කැපකළ යුතුයි.

* යාච්ඤා වේ වෙන් වී නොසිටිය යුතු ය.(1 කොරින්ති 7:5)

* විවාහ වූ අයට ශුද්ධ වූ පාවුලුතුමා දෙන අවවාදය නම්, ස්වාමිපුරුෂයා හා භාර්යාව වෙන් වී ජීවත් වීම සුදුසු නැත. එය දෙවියන් වහන්සේගේ නියෝගයයි. එසේ වෙන්වී ජීවත්වීමට සිදුවුවත්, නැවත විවාහ වීම සුදුසු නැත. හැකිතාක් ඉක්මණින් දෙදෙනා එක්විය යුතුය. සමඟි විය යුතුය.

* අන්‍යාගමික පුද්ගලයින් සමඟ විවාහවීම සම්න්ධව කොරින්ති නගරයේ ජනතාව අතර වැරදි ආකල්ප පැවතිණි. කිතුනුවෙක් අන්‍යාගමික පුද්ගලයෙකු සමඟ විවාහ වුවහොත්, ඒ දෙදෙනා එකට ජීවත්වීම වැරදි ය. අන්‍යාගමික පුද්ගලයාව හරවා යැවිය යුතුය.

* පාවුලුතුමා ඉහත කරුණට විරුද්ධව මෙසේ අදහස් ප්‍රකාශ කරයි. එනම්, කිතුනුවෙකු හා අන්‍යාගමිකයෙකු විවාහ වුවහොත් දෙදෙනා එක් ව ජීවත් විය යුතුය. එසේ කිරීමෙන් යම් විටෙක කිතුනු පුද්ගලයාගේ විශ්වාසය මගින් අන්‍යාගමික තැනැත්තා ශුද්ධවත් කෙනෙකු විය හැකිය.

* නමුත් අන්‍යාගමික තැනැත්තා වෙන්වී ජීවත් වීමට කැමැත්ත දැක්වුවහොත් එසේ කළ හැකිය. එමෙන් ම, කිතුනු පාර්ශවයේ තැනැත්තාට නැවත විවාහ වීමට නිදහස ඇත.

* නමුත් ඔවුන් එක් ව ජීවත්වීම පාවුලුතුමාගේ කැමැත්ත විය.

* පාවුලුතුමා එපීසිවරුනට ලියූ ලිපියේ තවත් වෙනත් අදහසක් ප්‍රකාශ කරයි. (එපීස 5:22-30) විවාහය ගැන පාවුලුතුමාගේ වැඩුණු අදහස් කීපයක් අපි දකිමු.

* ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාව ඉතා උසස්, පිරිසිදු එකක් වෙයි. පාවුලුතුමා, ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාවය, ක්‍රිස්තුස් වහන්සේ හා සභාව අතර ඇති සම්බන්ධතාවට සමාන කරයි. මෙම සම්බන්ධතාවයේ පදනම ආදරයයි.

* පාවුලුතුමා ස්වාමි පුරුෂයා භාර්යාව කෙරෙහි දැක්විය යුතු ආදරය ගැන එතුමාගේ අදහස් ප්‍රකාශ කරයි. එය පරිත්‍යාගශීලී ආදරයකි. ක්‍රිස්තුස් වහනසේ ශුද්ධ වූ සභාවට ප්‍රේම කළාක් මෙන් ස්වාමිපුරුෂයා ද තම භාර්යාවට ප්‍රේම කළ යුතුය. කිසිම විටෙක එය ස්වආලයේ ආදරයක් නොවිය යුතුය.

* ක්‍රිස්තුස් වහන්සේ සභාව මගින් යම් දෙයක් ලැබෙයි යන බලාපොරොත්තුවෙන් ඇයට ප්‍රේම කළේ නැත. නමුත් තමන් වහන්සේ විසින් සභාවට යහපතක් ඉටුවීම උන්වහන්සේගේ බලාපොරොත්තුව විය.

* ස්වාමි පුරුෂයා තමාට මෙන් තම භාර්යාවට ප්‍රේම කළයුතුය. භාර්යාව ද තම ස්වාමිපුරුෂයාට ගරු කළයුතුය. මෙසේ පාවුලුතුමා ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු ප්‍රේම සම්බන්ධතාව විස්තර කරයි.

* ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවත්වෙන ඔවුන් අතර ස්ත්‍රී පුරුෂ භේදයක් නැත. ඒ දෙදෙනා ක්‍රිස්තුන් වහන්සේ තුළ එක් කෙනෙක් වන්නෝය. (ගලාති 3:28) දෙදෙනා දෙවියන් වහන්සේගේ ස්වරූපයට මවනු ලැබූ අය වෙති. එම නිසා දෙවියන් වහන්සේ ඉදිරියේ ඔවුන් දෙදෙනා සමාන වන්නෝ ය.

* කිතුනු පවුලක ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාව ගැන කතාකළ පාවුලු තුමා අවසානයේ දෙමව්පියන් හා දරුවන් අතර පැවැතිය යුතු සම්බන්ධතාව ගැන ද කතා කරයි. දරුවනි . . . . ඇති දැඩි කරන්න. (එපීස 6:1-4)

* ක්‍රිස්තුස් වහන්සේ සභාවට හිස වන්නාක් මෙන් ස්වාමි පුරුෂයා භාර්යාවට හිසය.එය බලය පෙන්වීමේ නායකත්වයක් නොව ප්‍රේම කිරීමේ නායකත්වයක් වේ.

* සභාව දෙවියන් වහන්සේට යටත් ව සිටිනා සේ භාර්යාවත් ස්වාමිපුරුෂයනට යටත් විය යුතුය. මෙ යටත්වීම බියෙන් නොව ප්‍රේමයෙන් ඇතිවන යටහත් පහත් භාවයක් විය යුතුය. ක්‍රිස්තුස් වහන්සේ සභාවට දැක්වූ ප්‍රේමය නිසා සභාව ශුද්ධවත් කර දෙවියන් වහන්සේට පිළිගැන්වූ සේක. ස්වාමිපුරුෂයාගේ ප්‍රේමය ද තම භාර්යාව පිරිසිදු කර ඇයව වඩා යහපත් පුද්ගලයෙකු කළ යුතුය.

* ස්වාමිපුරුෂයාගේ ප්‍රේමය භාර්යාව කෙරෙහි සැලකිල්ල දක්වන, ඇයගේ යහපත් ජීවිතය කෙරෙහි සැලකිල්ල දක්වන ප්‍රේමයක් විය යුතුය. ස්වාමිපුරුෂයා තම ශරීරයට ප්‍රේම කරන්නාක් මෙන් තම භාර්යාවට ද ප්‍රේම කළ යුතුය. මෙය සේවය ලබාගන්නා ආදරයක් නොව සේවය කිරීමේ ආදරයක් විය යුතුය.

* ස්වාමි පුරුෂයා භාර්යාව කෙරෙහි දක්වන ආදරය කිසිම දිනෙක වෙන් කරන්නට බැරි ආදරයකි. මෙම ප්‍රේමය නිසා ස්වාමිපුරුෂයා තම දෙමව්පියන් අතහැර සිය භාර්යාවට ඇලුම් වන්නේ ය. ඒ දෙදෙනා එක්කෙනෙක් වන්නෝ ය. දෙදෙනා එකම ශරීරයක් වන්නෝය.

**සහෝදරත්වය හා එකමුතුකම** (1 කොරි : 8:9-13, 13:3-8, 2 කොරි. 8:9))

* ශුද්ධ වූ පාවුලුතුමා ගෘහස්ථ ශුද්ධ වූ සභාව නැමති පවුල තුල ස්වාමිපුරුෂයා හා භාර්යාව, දෙමාපියන් හා දරුවන් අතර තිබිය යුතු ආදරය, සම්බන්ධතාව, එකමුතුකම ගැන කතාකළ පසු, දෙවියන් වහන්සේගේ විශාල පවුලවන ශුද්ධ වූ සභාව තුළ තිබිය යුතු ප්‍රේමය, සහෝදරත්වය, එකමුතුකම ගැන උගන්වයි.

* පාවුලුතුමා, තමා දමස්කයට ගිය ගමනේ ද, ශු. සභාව හා ක්‍රිස්තුස් වහන්සේ අතර පවතින ප්‍රේමය අත්දුටුවේය. "සාවුල්, සාවුල් ඔබ මට පීඩා කරන්නේ මන් ද ? මම ඔබ විසින් පීඩා කරනු ලබන ජේසුස් ය." (ක්‍රියා. 9:5) එම අත්දැකීමෙන් ඇති වූ උද්යෝගය තව තවත් තමා තුළ වර්ධනය වී ඇති බව එතුමා ලියා ඇති ලිපිවල අපට දක්නට ලැබේ.

* එම කාලයේ විවිධ කිතුනු සභා තුළ, විශේෂයෙන් කොරින්තියේ සභාව තුළ දකින්නට ලැබුණු භේද, අසමගිතාව, අවස්ථාවක් කර ගනිමින් ශු. පාවුලුතුමා ශු. සභාව සම්බන්ධව තමාගේ ගැඹුරු අදහස් අපට පැහැදිලි ව ඉදිරිපත් කරයි.

* ශුද්ධාත්මයාණන්ගේ වරමින්, ක්‍රිස්තුස් වහන්සේ තුළ විශ්වාසය තබා ජීවත්වන අය ක්‍රිස්තුස් වහන්සේ සමඟ හා එකිනෙකා සමඟ එකමුතුව සිට, ප්‍රසාද ස්නාපනය මගින් ක්‍රිස්තුස් වහන්සේගේ ගැළවීමේ ක්‍රියාවේ සහභාගී වී උන්වහන්සේ සමඟ උන්වහන්සේ තුළ ජීවත් වෙති.

* ශු. පාවුලුතුමා ශු. සභාවේ සාමාජිකයින් අතර පවතින එකමුතුකම, මිනිස් සිරුරක අවයවයන් අතර පවතින එකමුතුකම හා සමානකොට අත්දකියි. ඔබ ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයයි.

* ශරීරයක් නිරෝගීව ක්‍රියාශීලී වීමට නම්, එම ශරීරයේ අවයවයන් තමාට හිමි වගකීම් නිසි ආකාරව ඉටුකළ යුතුය. එමෙන් ම ශු. සභාව නිසි ආකාරව ක්‍රියා කිරීමට, සභාව තුළ එකමුතුකම, සහෝදරත්වය, තිබිය යුතුය. එකිනෙකාට ගෞරව කළ යුතුය. එකිනෙකාට උදව් කළ යුතුයි. එකිනෙකා තම තමාගේ යුතුකම් ඉටුකළ යුතුය.

* කිතුනුවන් සැමට එකම ආත්මයාණන් වහන්සේ ජීවනය දෙන සේක. ඔවුහු සියලුදෙනා එකම ඉලක්කය කරා ගමන් ගන්නා අය වෙති. ඔවුහු සියලු දෙනා එකම බලාපොරොත්තුව ඇතිව ජීවත්වන අය වෙති. ඔවුන් සැමට එකම දෙවියන් වහන්සේ ය. සැමදෙනා එකම විශ්වාසයෙන් හා එකම ප්‍රසාද ස්නාපනයේ පංගුකාරයන් වී එකම දෙවියන් වහන්සේව, තම එකම පියාණන් වහන්සේ ලෙස පිළිගත් අය වෙති. එම දෙවියන් වහන්සේ සැමදෙනා තුළින් ම, සැමදෙනා මගින් ක්‍රියා කරන සේක. එම නිසා කිතුනුවන් සැමදෙන එකම හදවතකින් ජීවත් වීමෙන් එම එකමුතුකම රැකගත යුතුය.

* පාවුලුතුමා කිතුනුවන්ව තම සහෝදර, සහෝදරියන් කියා අමතා, තමා හා ඔවුන් එකම පියාණන් වහන්සේගේ දරුවන් බව සිහිගන්වයි. එමනිසා කිතුනු සමාජයේ භේදබින්න වෙනස්කම් ඇතිවීම සුදුසු නැතැයි මතක් කරමින්, ඔවුන් සහෝදර ප්‍රේමයේ එකමුතුව තුළ ජීවත් විය යුතුයි කියා උගන්වයි. ඔවුන් කිසිදු භේදයකින් තොරව, එකම අදහස් ඇති අය මෙන් එකම සිතකින්, එකම පරමාර්ථයක් ඇතිව ජීවත් වන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියි.

* යමෙකු කිතුනු සංඝයට ඇතුලුවන විට එම සංඝයට නියම වූ ජීවිත ක්‍රමය ඔහු ජීවත් විය යුතුය. ඔබ ලත් කැඳවීමට . . . . උත්සාහ කරන්න. (එපීස 4:13) මෙම එකමුතුකමට, ඒකත්වයට අත්තිවාරම් හා පදනම් වූ හේතුව නම්, ඔවුන් සැමට එකම බලාපොරොත්තුව, එකම ශරීරය, එකම ස්ප්‍රිතුව, එකම දෙවියන් වහන්සේ, එකම ඇදහිල්ල, එකම ප්‍රසාද ස්නාපනය, එකම දෙවි පියාණන් වන බැවිනි.

* කිතුනු ජීවිතය මිනිසා හා මිනිසා අතර නව සම්බන්ධතාවක් හඳුන්වා දෙයි. මෙම නව සම්බන්ධතාවයේ ජාති, කුල, ස්ත්‍රී පුරුෂ, භේද මැකී යන්නේ ය. මන්ද ප්‍රුදෙව්වරුන් ද . . . ස්නාපනය ලැබීම. (1 කොරි 12:13) ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවත්වන අය අතර මෙම වෙනස්කම් නැත. මෙම නව සම්බන්ධතාව සියලු ලෞකික මට්ටමේ සම්බන්ධතාවන් ඉක්මවා යන එකකි.

* ප්‍රසාද ස්නාපනය ලැබූ ඔබ සියල්ලන් . . . . භේදයක් නැත. (ගලා. 3:6-28)

* මෙම අදහසම, ශු. පාවුලුතුමා පිලමොන්ට ලියන ලද ලිපියේ දකිමු. පාවුලුතුමා, වහලෙකු වූ ඔනේසිමස් නම් පුද්ගලයෙකු ව මා හිරගෙදර සිටිය දී මාගේ දරුකමට පත් වූ ඔනේසිමස් කියා අමතයි. (පිලමොන් 1:10) තවද පාවුලුතුමා ඔනේසිමස්ව සහෝදරයෙකු මෙන් භාරගන්න කියා පිලෙමොන්ගේ ඉල්ලා සිටී. (පිලමොන් 1:10) පිලමෝන් පාවුලුතුමාව පිළිගන්නාක් මෙන් ඔනේසිමස්ව පිළිගන්නා ලෙස ද ඉල්ලා සිටියි. (පිලමොන් 1:17)

* අවසාන වශයෙන් පාවුලුතුමා, ශරීරයේ අවයවයන් නහරවලින් ඒකාබද්ධ කර තිබෙන නිසා ශරීරය නිරෝගී ව ක්‍රියාශීලීවීමට හැකිවන්නාක් මෙන්, ශු. සභාවේ ක්‍රිස්තුස් වහන්සේගේ හිසය, අවයවයන් වන අපි උන්වහන්සේ සමඟ ඒකාබද්ධ වී සිටීමෙන් සභාව ද නිසි ආකාරව ක්‍රියාශීලී වන බව පවසයි. මෙසේ කිතුනුවන් සියලු දෙනා තම තමා ලබා ඇති කැඳවීමට අනුව විශ්වාසවන්තව ක්‍රියා කිරීමෙන් සභාව ස්ථිර වෙයි. වර්ධනය වේ. මෙසේ පාවුලුතුමා සභාව තුළ තිබිය යුතු ඒකත්වය, එකමුතුකම තහවුරු කර, එය ආරක්ෂා කර ගොඩනැගීමට අපට ඇති වගකීම පැහැදිළි කරයි.

**ශුද්ධාත්මයාණන්ගේ දීමනා හා ඵල** (1 කොරි 12, 14:1-18)

* ආත්මය යන වචනය හඳුන්වා දීමට පාවුලුතුමා භාවිතා කරන ග්‍රීක වචනය "නෙයුමා" - පරණ ගිවිසුමේ භාවිත කළ හෙබ්‍රෙව් වචනය "රුආක්". මෙම වචනය ආත්මය යන අර්ථය පමණක් නොව සුළඟ යන අර්ථය ද දෙයි. පැරණි ගිවිසුමේ මෙම වචනය මිනිස් ශක්තිය ඉක්මවා යන දේවත්වයේ ශක්තිය, බලය, හැකියාව යන අර්ථය දීමට භාවිත කර ඇත.

* මෙය නව ජීවිතයේ බලවත්, ප්‍රධාන ශක්තියයි. දෙවියන් වහන්සේගේ ජීවිතයේ බලයයි. ක්‍රිස්තුස් වහන්සේගේ ගැළවීමේ කාර්යය මගින්, මිනිසා පාපයට ඇදීයන මිනිස් ස්වභාවයෙන් මිදී ශුද්ධාත්මයාණන් වහන්සේ මගින් වසාගෙන ඇත. ඔවුන් තමන් තුළ ඇති දුබල මිනිස් ශක්තිය ඉක්මවා යන ශක්තිය - බලය ලබාගෙන ඇත.

* ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් අප ලබන්නා වූ විශේෂ වරප්‍රසාදය දීමනා යන වචනයෙන් හඳුන්වනු ලබයි. එය "කරිස්මා" යන වචනයෙන් ගත් අර්ථයයි. දෙවියන් වහන්සේ අපට දක්වන උන්වහන්සේගේ අසීමිත ආදරය හා කරුණාව හේතුකොට ගෙන අපට නොමිලේ දානය කරන දීමනා යනුවෙන් ද එය අර්ථය ලබයි.

* දෙවියන් වහන්සේ අපට දානය කරන දීමනා අතරින් උසස් ම දීමනාව උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේ ය. එම ශුද්ධාත්මයාණන් වහන්සේ අප හදවත් තුළ ලැගුම් ගන්නා සේක. උන්වහන්සේ නොමිලේ දානය කරන දීමනා තුළින් උන්වහන්සේව අපට එළිදරව් කරන සේක.

* මුල් අවදියේ ශු.සභාව තුළ මෙම දීමනා බොහෝ දකින්නට ලැබුණි. ශු. පාවුලුතුමා ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනා ගැන එතුමා ලියූ ලිපි මගින් අපට කතා කරයි. (1 කොරි.12)

* ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ කියා ප්‍රකාශ කිරීමට අපට හැකියාව දානය කරන්නේ ද ශුද්ධාත්මයාණන් වහන්සේ ය. (1 කොරි. 12) ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් සිටීමට අපව මෙහෙයවන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ ය. උන්වහන්සේ අපට දානය කරන පළමු, ප්‍රථම දීමනාව මෙයයි.

* ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ කියා පිළිගන්නා අයට, එම එකම ශුද්ධාත්මයාණන් දානය කරන තවත් බොහෝ දීමනා ඇත. උන්වහන්සේ මෙම දීමනා අපට දානය කිරීමේ පරමාර්ථය කුමක් ද කියා පාවුලුතුමා අපට විස්තර කරයි. අන්‍යොන්‍ය . . . වීමක් ඇත. (1 කොරි. 12:7) මෙම දීමනා අපේ පෞද්ගලික යහපත සඳහා නොව, පොදු යහපත හා කිතුනු සංඝයේ, ශු. සභාවේ ද යහපත සඳහා දානය කරන බව පෙන්වා දෙයි.

* සියලු දෙනාටම සියලු දීමනා නොලැබේ. ශු. සභාව තුළ විවිධ කාර්යයන් ඉටුකරන, විවිධ පුද්ගලයන්ට, විවිධ දීමනා, දානය කරනු ලබයි. මේ සියල්ල දෙවියන් වහන්සේ වෙතින් පැමිණෙන බැවින්, ඒවා උන්වහන්සේගේ ම අභිප්‍රාය අනුව උන්වහන්සේගේ ම සේවය සඳහා භාවිත කළ යුතුයි.

* ශුද්ධ වූ පාවුලුතුමා ප්‍රථමයෙන් ප්‍රඥාවෙන් පිරුණු කථික ශක්තියක් හා දැනගැනීමෙන් පිරුණු කථික ශක්තියක් ගැන කතා කරයි. මෙම ක්‍රියා දෙක එකක් සේ පෙණුන ද, එය දෙවිධියේ ක්‍රියා වේ. ප්‍රඥාව දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාව මත ලැබෙන උන්වහන්සේ සම්බන්ධ ගැඹුරු සත්‍යතාවන් දැනගැනීමේ හැකියාවය. දැනීම එම ප්‍රඥාව අපේ එදිනෙදා ජීවිතයේ ක්‍රියාවේ යෙදීමට හැකිවීමය.

* තවද පාවුලුතුමා මෙම ප්‍රඥාව හා දැනගැන්ම පිළිගන්නා විශ්වාසය ගැන සඳහන් කරයි. ඉහත දී අපි ක්‍රිස්තුස් වහන්සේව දෙවියන් වහන්සේ කියා පිළිගන්නා විශ්වාසය ගැන කතා කළෙමු. එය අපි දේව සම්බන්ධ ධර්ම ගුණය කියා නම් කරමු. මෙහි අපි ප්‍රඥාව හා දැනගැනීම පිළිගන්නා විශ්වාසය ගැන කතා කරන්නෙමු. පාවුලු තුමා එය හදවතින් පිළිගනු පමණක් නොව එය ක්‍රියාවට නංවන හැකියාව ගැන ද, එයට විශ්වාසවන්ත ව ජීවත්වීම ගැන ද සඳහන් කරයි.

* ඉන්පසු පාවුලුතුමා ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාවක් නැමති සුවකිරීමේ හැකියාව ගැන සඳහන් කරයි. මෙම හැකියාව මුල් කිතුනු සභාව තුළ ව්‍යාප්තව දකින්නට ලැබුණු දීමනාවකි. අද සභාව තුළ ද නැවත අපි එය දකිමු.

* ඉන්පසු පාවුලුතුමා භාස්කම් කිරීමේ හැකියාව ගැන සඳහන් කරයි. එය යක්ෂයා දුරු කිරීමේ හැකියාවයි. ඒ කාලයේ සියලු ශාරීරික දුර්වලතාවන් යක්ෂයාගේ බලපෑමෙන් ඇති වූ විපාක හැටියට සලකනු ලැබුවේය. එමනිසා දුෂ්ට ආත්මයන් දුරු කිරීම ශු. සභාවේ සේවාවන් අතර එකක් හැටියට සලකනු ලැබුවේය. අදත් සභාව තුළ අපි මෙම සේවාව දකිමු.

* තවද පාවුලුතුමා දිවැස් වැකි දෙසීමේ හැකියාව ගැන ද විවිධ ශබ්දවලින් කතා කිරීමේ හැකියාව ගැන ද, එම ශබ්දය පහදා දීමේ හැකියාව ගැන ද කතා කරයි.

* අද අපි ශුද්ධාත්ම දීමනා, ප්‍රඥාව, තේරුම් ගැනීම, දැනගැන්ම, දැනුමැතිකම, ධෛර්‍ය, දේව භක්තිය, දේව භය, කියා දැන සිටින්නෙමු. කිතුනුවකුගේ ජීවිතයත් ශුද්ධ සභාවේ පොදු සේවාවන් සියල්ලත් මෙම ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනා මතයි රැඳී පවතී.

* සමහර දීමනා දේව සේවාවන් සමඟ සම්බන්ධ දීමනා වෙති. එම සේවාවන්, අපෝස්තලික සේවාව, දිවැස් දෙසීමේ සේවාව, ඉගැන්වීමේ සේවාව,ශුභ ආරංචිය දේශනා කිරීමේ සේවාව, මඟපෙන්වීමේ සේවාව වැනි විවිධදූත කාර්යය වේ.

* තවත් සමහර වරප්‍රසාද, සේවය කිරීම, දේශනා කිරීම, උනන්දු කිරීම, දයාවේ ක්‍රියා වැනි අවස්ථාවල දී සභාවේ යහපත සඳහා ප්‍රයෝජනවත් වෙයි. ප්‍රඥාවෙන් පිරුණු දේශනය, දැනීමෙන් යුතු දේශනය, විශ්වාසය, සුව කිරීමේ හැකියාව, හාස්කම් කිරීමේ හැකියාව, විවිධ ශබ්දවලින් කතා කිරීම, ආත්ම විසඳීමේහැකියාව වැනි සේවාවන් තුළ මෙම වරප්‍රසාදයේ සහාය ලැබෙයි.

* අවසාන වශයෙන් ශුද්ධ වූ පාවුලුතුමා ශුද්ධාත්ම දීමනා අතරින් ඉතා උසස් දීමනාව නැමති ප්‍රේමය ගැන කතා කරයි. සියලු වරප්‍රසාදවලට පදනම වන්නේ ප්‍රේමයයි. ප්‍රේමය නැතිනම් වෙනත් කිසිම දෙයකින් ඵලක් නැත. ප්‍රේමය නමැති ශුද්ධාත්ම දීමනාවේ ගුණාංග පහළොවක් ගැන පාවුලුතුමා පවසයි. ඉවසීම, යහපත කිරීම, ඊර්ෂ්‍යා නොවීම, තමා පරාට්ටු නොකර ගැනීම, උඩඟු නොවීම, පහත් දේ නොකිරීම, ස්ව ආලය නොබැඳීම, වෛර නොකිරීම, අයහපත නොපැතීම, අයහපතේ දී සතුටු නොවීම, විශ්වාසය, බලාපොරොත්තුව, සිත් ධෛර්‍ය්‍ය, වැනි ගුණාංගය ය.

* ශුද්ධ වූ පාවුලුතුමා තෘෂ්ණාවන්වලට විරුද්ධව ශුද්ධාත්ම ඵල අපට ඉදිරිපත් කරයි. ප්‍රේමය, ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව, යහපත්කම, විශ්වාසය, මෘදුකම හා ආත්ම දමනය (ගලාති 5:22)

* ප්‍රේමය නම් වචනය ශුද්ධ වූ පාවුලුතුමා අගපේ යන ග්‍රීක වචනයෙන් අපට හඳුන්වා දෙයි. අගපේ යන වචනයෙන් සඳහන් කරන්නේ කිසිදු ප්‍රතිලාභයක් නොතකා, අන් අය අපට අයහපත ම කළත්, පැතුවත්, ඒ අයට යහපත කරන, පතන ගුණාංගයයි.

* ප්‍රීතිය යන වචනයේ අර්ථය මෙලොව වස්තුවලින් ඇතිවන සතුට නොවෙයි. මෙය දෙවියන් වහන්සේගෙන් ලැබෙන වරප්‍රසාදයකි.

* සාමය නම්, රණ්ඩු දබර නොමැති නිසා දැනෙන සාමය නොව, දෙවියන් වහන්සේගෙන් ලැබෙන සුරක්ෂිතභාවය තුළින් ලැබෙන සාමයයි.

* ඉවසීම යනුවෙන් අපට උගන්වන්නේ, අන් අය අපට අයහපත කළත්, පළිගැනීමට සිතේ ඉඩ නොදී, දෙවියන් වහන්සේ අපට සමාව දානය කරන්නාක් මෙන් අපට අයහපත කරන අයට පවා සමාව දීමයි.

* යහපත්කම - ක්‍රිස්තුස් වහන්සේ පවුකාරයන් වෙත දැක් වූ දයාව කරුණාව මෙම වචන තුළින් අදහස් කරයි.

* විශ්වාසවන්තකම - අන් අයගේ විශ්වාසය දිනාගැනීම හා අන් අයට විශ්වාසවන්ත වීම.

* මෘදුකම - තමා ගැන නොසිතා අන් අය කෙරෙහි දක්වන කරුණාව, සැලකිලිවන්තකම මෙම වචනයෙන් අදහස් කරයි.

* ආත්ම දමනය නම්, තමාගේ හැඟීම් පාලනය කිරීම හා අන් අය ඉදිරියේ බැගෑපත් වීම වැනි ගුණාංග මේ තුළට ඇතුළත් වේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ජේසුස් වහන්සේ ග්‍රීක, රෝම, ජුදා, ශිෂ්ටාචාරය ගරු කරමින් ජීවත් වූ අන්දම සොයා බැලීමට උපදෙස් දෙන්න.
- කන්ද උඩ දේශනාව මගින් කිතු සමිඳුන් ව්‍යවස්ථාව සම්පූර්ණ කළ බව පැහැදිළි කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- සමකාලීන ජුදයින්ගේ හා කිතු සමිඳුන්ගේ ජීවිත පැවැත්ම පිළිබඳ වෙනස විමර්ශනයකට භාජනය කොට සසඳන්න.
- මුල් සභාවේ ලක්ෂණ පෙළගස්වයි.
- ශු. පාවුලුතුමාගේ ජීවිත පැවැත්ම, ප්‍රධාන ඉගැන්වීම්, ශීල ධර්මය හා සභාව ව්‍යාප්තිය පිළිබඳ කරුණු රැස්කර එමගින් තම දිවිපැවැත්ම සාර්ථක කර ගැනීමට අවශ්‍ය පියවර ගන්න.

**මූලාශ්‍රය :**


1. Fr. John Laux -Church History
2. Re. George Johnson - The Story of the Church
3. Alfred Lapple - The Catholic Church - A Brief History (1982)

**නිපුණතාව 7.0** : **කිතුනු ශිෂ්ටාචාරයක් බිහිවීම තුළ සමාජ සංස්කෘතික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් හරහා ජීවිත වෙනසක් කරා ගමන් කරයි.**

**නිපුණතා මට්ටම 7.2** : පෙර අපර දෙදිග ව්‍යාප්ත වූ සභාවේ මුල් යුගයේ සිදු වූ සමාජ ප්‍රවණතා ලක්ෂණ විමර්ශනය කරයි.

**කාලය** : කාලච්ඡේද 22

**ඉගෙනුම් ඵල** :

- ක්‍රමානුකූලව ගොඩනගා ගත් දේව ධර්මයක අවශ්‍යතාවක් ඇතිවීමට බලපෑ හේතු අනාවරණය වීම.
- සභාවේ මුල් යුගයේ බිහි වූ දේව ධාර්මික ගුරුකුල පිළිබඳ කරුණු හැදෑරීම.
- දේව ධාර්මික ඉගැන්වීම් සම්බන්ධයෙන් පැනනැගුණු විවිධ මතවාද
- දේව ධාර්මික ගුරුකුල ආරම්භ වීමට හේතු සාධක
- දේව ධාර්මික ගුරුකුලවල පුරෝගාමීන් දැනගැන්මට හැකි වීම.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 7.2.1 මෙම වකවානුව තුළ නව චින්තනයක උදාව සිදුවූ ආකාරය මෙසේ පැහැදිලි කළ හැකිය.

**නව චින්තනයේ ආරම්භය**

* ශුද්ධ වූ සභාවේ ආරම්භක අවස්ථාවේ දී ශුද්ධ වූ දේශය රෝම අධිරාජ්‍යයට යටත් ව තිබුණි. එබැවින ජෙරුසලමේ ආරම්භ වූ කිතුදහම (ශුද්ධ වූ සභාව) ක්‍රම ක්‍රමයෙන් පහසුවෙන් ම රෝම අධිරාජ්‍ය පුරා ව්‍යාප්ත විය. (රෝම අධිරාජ්‍ය තුළ කිතු දහම ව්‍යාප්ත වීමට හේතු වූ කරුණු නිපුනතා මට්ටම් 1.1 හි දැකිය හැක.)

රෝමවරුන්ගේ විරෝධයේ පසුබිම

* රෝම අධිරාජ්‍ය තුළ කිතුනුවෝ තම විශ්වාසය නිසා පීඩා වින්දහ. කිතුනු ජීවිතය පිළිබඳවත්, ඔවුන්ගේ වන්දනා හා විශ්වාසයේ සත්‍යතා පිළිබඳවත්, පැමිණිලි සහ චෝදනා ලැබූහ. රෝම පාලකයන් ඉදිරියේ දී කිතුනුවෝ මේ සම්බන්ධ ව විමසීමට ලක් වූහ.
* සභා ඉතිහාසයේ 2,3 සියවස්වල දී, පැනනැගුණු දරුණු පීඩනයේ දී විවිධ කිතුනු චින්තකයන් බිහි වූහ. ඔවුහු අධිරාජ්‍යවරුන්ට හා පාලකයන්ට ශුද්ධ වූ සභාව ඉදිරියේ හා කිතුනුවන් ඉදිරියේ, ඉවසීමේ හා දරාගැනීමේ ශක්තිය ඇති අය කළ හැකි බවට විශ්වාසයෙන් යුතුව, කිතු දහමේ ස්වාධීනත්වය ඔවුන් ඉදිරියේ පැහැදිලි ව ගෙනහැර පෑහ.
* කිතුනුවන්ගේ ජීවිත පිළිවෙත් නිවැරදි බවත්, ඔවුන් මත පැටවූ චෝදනා අසත්‍ය බවත්, කරුණු ඉදිරිපත් කරමින් පැහැදිලි කළහ.

* මෙකළ අඥාන නැණවතුන්, උගතුන්, කිතුනුවන්ට විරුද්ධව, ඔවුන් විශ්වාස කරන සත්‍යතාවන්ට විරුද්ධව, අත්පත්‍රිකා ද, කුඩා පොත් ද ලියා ප්‍රචාරය කළහ. මොවුහු අතරින් සෙල්සස්, සමෝසක, ලුසියන් යනාදීන් ප්‍රමුඛ වූහ.

* එබැවින් බොරු ප්‍රචාරයන්ට නිවැරදි පිළිතුරු ලෙස කිතුනු ලේඛකයන්, කිතුනු විශ්වාසයේ සත්‍යතාවයන් පෙන්වා දෙමින්, ඒවා නිවැරදි බව පැහැදිළි කරමින්, ඒවා ස්ථිර කරමින් පොත් ගණනාවක් ලියූහ. භේදකාරයන්ට විරුද්ධව කිතුනු විශ්වාසයේ පාරම්පරික ඉගැන්වීම් නිවැරදිව පැහැදිළි කර තහවුරු කළහ. මොවුන් විශ්වාසයේ සත්‍යතාවයන්, නිවැරදි බව පැහැදිළි කර ආරක්ෂා කළ නිසා, මොවුන් සත්‍යයේ ආරක්ෂකයන් ලෙස ද හැඳින්වේ. (APOLOGISTS)

* මේ ලේඛකයන් අතරින් ජස්ටින් තුමා, ඉරනේවුස් තුමා, ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා, ටර්ටුලියන් තුමා, ඔරිජන් තුමා ආදීන් ප්‍රමුඛ වෙති.

**රෝම අධිකරණයේ ශුද්ධ සභාවේ ස්වාධීන පසුබිම**

* ශුද්ධ වූ සභාවේ පීඩන යුගය ක්‍රි.ව. 313 දී කොන්ස්තන්තීනු අධිරාජයා විසින් නිකුත් කළ මිලාන් ආඥාවෙන් අවසන් විය.

* පීඩන යුගයේ දී (පළමු සියවස් තුන තුළ දී) ශුද්ධ වූ සභාවට ඉන් පිට ජීවත් වූ ජුදෙව්වන්ගෙන් හා රෝම අඥානයින්ගෙන් පීඩා චෝදනා එල්ල විය. නමුත් නිදහස් යුගයේ දී (4,5,6 සියවස්වලදී) අසත්‍යය දේශනා කළ වේද භේදකයන් ද, ඔවුන් දේශනා කළ අසත්‍යයන් ද ශුද්ධ වූ සභාව තුළින් මතු විය.

* දහම් දැනුමින්ද, ධර්මිෂ්ටකමින් ද, පාරිශුද්ධ බවින් ද පිරිපුන් වූ දේශකයන් සහ ලේඛකයන් මේ කාලයේ දී ශුද්ධ වූ සභාවේ බිහිවූහ. මොවුන් කිතු දහමේ සත්‍යතාවයන්, පැහැදිළි ව, දිරිමත් ව, දේශනා කර, භේදයන්ට එරෙහිව පොත් කීපයක් ම ග්‍රීක, ලතින් බසින් ලියා භේදකාරයින්ව සිත් හරවා සභාවට ඇතුළත් කර ගත්හ.

* එබැවින් මොවුන් වේද පණ්ඩිතයන් ද, සභා පියවරුන් ද ලෙස හැඳින්වේ.

* සභා පියවරුන් ව, පෙරදිග හා අපරදිග පියවරුන් ලෙස දෙකොටසකට බෙදන ලදී. අපරදිග ග්‍රීක සභා පියවරුන් අතර ශු. අතනාසියුස් තුමා, ශු. ක්‍රිසොස්තම් ජුවාම් තුමා, ශු. බැසිල් තුමා, ශු. ග්‍රෙගරි නසියන්සස් තුමා, ශු. නිස්සා හි ග්‍රෙගරි තුමා, ආදීන් අයත් වෙති. අපරදිග ලතින් සභා පියවරුන් අතර ශු. හිලරි තුමා, ශු. අම්බ්‍රෝස් තුමා, ශු. ජෙරොම් තුමා, ශු. අගෝස්තීනු තුමා, ශු මහා ග්‍රෙගරි තුමා අයත් වෙති.

**කිතු දහමේ සර්ව සාධාරණත්වය**

* අපෝස්තුලුවරුන්ගේ හා ශු. පාවුලුතුමන්ගේ ධර්මදූත සේවයේ ප්‍රතිඵලයක් ලෙස කිතු දහම පලස්තීනයට පිටින් ද ව්‍යාප්ත විය.

* ජෙරුසලමේ සංඝයේ කිතුදහම සකල ලෝකයේ ම දහම ලෙස පිළිගන්නා ලදී. මේ නිසා අන්‍ය ජාතීන් අතර ශුද්ධ වූ සභාව ඔවුන්ගේ සිරිත් විරිත්, සංස්කෘතියට අනුව වර්ධනය විය.

* කිතු දහමේ සත්‍යතාවයන් ජනතාවට පැහැදිළි කිරීම සඳහා ග්‍රීක දාර්ශනික චින්තන ක්‍රමයන්ද, සාහිත්‍යධරයන්ගේ චින්තනයන් ද, සංස්කෘතික අංගයන් ද, ග්‍රීක වදන් ද, උපයෝගී කර ගනිමින් ක්‍රිස්තු චින්තනය බිහිකිරීමටත්, එය වර්ධනය කිරීමටත් මඟ පෑදූහ.

* මේ නිසා ක්‍රිස්තු චින්තනයෙහි ග්‍රීක දාර්ශනික අදහස් ද ගැබ් වී ඇති බව දක්නට ඇත.

### 7.2.2 කිතුනු විද්‍යාපීඨ

**ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුලය**

**පසුබිම**

ඇලෙක්සැන්ඩ්‍රියාව යනු පැරණි ලෝකයේ සංස්කෘතික වශයෙන් දියුණු මූලස්ථානයකි. ඒ අතරම එම නගරය ක්‍රිස්තු ධර්මය හා හෙලනිස්ත වාදය එකට ක්‍රියාත්මක වූ ස්ථානයකි. මෙය හෙලනිස්ත ජුදා වාදයේ මූලස්ථානය ද විය. බයිබලයේ අඩංගු සිරාක් ගේ පොත හා ප්‍රඥා පොත ද මෙම ප්‍රදේශයේ ලියැවී ඇති බව බොහෝ දෙනාගේ මතයයි. හෙලනිස්ත ජුදාවාදී ෆිලෝ (*philo*) නමැති දාර්ශනිකයා ද ඇලෙක්සැන්ඩ්‍රියාවේ උපන් අයෙකි.

මෙම ගුරුකුළය ආරම්භ වීමට මූලික අරමුණ වූයේ ධර්මය ඉගැන්වීම හා ප්‍රසාද ස්නාපනය ලැබීම සඳහා සූදානම් වන අයට ධර්මය පහදා දීමයි. මෙය ඇලෙන්සැන්ඩ්‍රියාව මුල්කරගෙන බිහිවූ දේව ධාර්මික චින්තනයකි. මෙය දාර්ශනික දේව ධර්මයේ තෝතැන්නයි. ග්‍රීක දර්ශනවාදයට වඩාත් නැඹුරු දේව ධර්මයක් ඉදිරිපත් කරන නිසා මේ ගුරුකුළය ඉතිහාසයේ ප්‍රධාන ස්ථානයක් ගනී. මෙම ගුරුකුළයට අයත් වඩාත් කැපී පෙනෙන සභා පියවරු දෙදෙනා නම් ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් තුමා සහ ඔරිජන් තුමා ය.

ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුළයට සමාන්තරව අන්තියෝකයේ ද ගුරුකුළයක් බිහිවිය. මේ ගුරුකුළ දෙකටම ඒරියන්වාදයට මුහුණදීමට සිදුවිය. ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේගේ මැවිල්ලක් බව ඒරියන්වාදීන් ප්‍රකාශ කළ නිසා ඊට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට මේ කාලයේ දී සභා පියවරු කටයුතු කළහ. මේ අතර ක්ලෙමන්ට් තුමාගේ ඉගැන්වීම් දාර්ශනික ස්වරූපයක් ගත් අතර ඔරිජන් තුමාගේ ඉගැන්වීම් වඩාත් ක්‍රමවත් හා බුද්ධිමත් ස්වරූපයක් ගත්තේය. ඒවා බයිබලයට අනුකූලව ලියැවී තිබීම විශේෂත්වයකි.

**ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුලයේ දේව ධර්මය**

- ක්‍රිස්තු වේදය පිළිබඳ ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුලයේ මතය බොහෝවිට අපොලිනාරියස්ගේ හා එව්ටිකස්ගේ මතයන්ට සමාන වේ.
- ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුළයට අයත් එව්සේබියස් හා සිරිල් තුමන්ලා ශුද්ධ වූ ත්‍රිත්වය හා ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය පිළිබඳ සභා ඉගැන්වීම් ආරක්ෂා කිරීමට උත්සාහ දරා ඇත.
- මොවුහු ප්‍රධාන වශයෙන් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වයට අවධානය යොමු කරති.
- ප්ලේටෝ නැමති දාර්ශනිකයාගේ ක්‍රමවේද ඔවුන්ගේ ක්‍රමවේදයේ පදනම වී ඇත.
- ඒරියන් වාදයට විරුද්ධව තමන්ගේ ක්‍රිස්තු වේදය ඉදිරිපත් කළහ.
- ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුළයේ ක්‍රිස්තු වේදය නව ගිවිසුමේ හතර වන සුවිශේෂය නැතහොත් ශු. ජොහන් සුවිශේෂය පාදක කොට ගෙන ඇත.
- ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වයට මුල්තැන දෙන මොවුහු උන්වහන්සේගේ මනුෂ්‍යත්වය පිළිබඳ කිසිවක් නොපවසති.
- ඔවුන්ට අනුව ක්‍රිස්තුන් වහන්සේට ඇත්තේ එක ස්වභාවයකි. එනම් දේව ස්වභාවයයි. (සිරිල් තුමා මේ අදහස මූලික වශයෙන් නෙස්ටෝරියන් වාදයට එරෙහිව ඉදිරිපත් කරයි.)

- ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ අදහස් දක්වමින් තැනැන්වහන්සේලා දේවත්වයෙන් යුක්ත බව අවධාරණය කිරීමට ඔවුහු උත්සාහ දරති. (එකම පදාර්ථයකින් යුතු බව පෙන්වා දෙයි. /*of One Substance*)
- ඔවුන් ශුද්ධවූ ලියවිලි විග්‍රහ කර ඇත්තේ ව්‍යංගාර්ථයෙන් ය. (*Allegorical way*)
- බයිබලීය විවරණය හා සම්බන්ධ ටිපොලොජිකල් (*Typological Interpretations*) ක්‍රමවේදය මෙම ගුරුකුලය තුළ සුවිශේෂ ස්ථානයක් ගනී.

**අන්තියෝකියානු ගුරුකුලය**

**පසුබිම**

අන්තියෝකියානු ගුරුකුළයේ ආරම්භකයා සමෝසටාහි ලූෂන් ය. ඔරිජන් තුමාගේ ඇලගොරිකල් බයිබල් විවරණ ක්‍රමවේදය ප්‍රතික්ෂේප කිරීම හා එහි අඩුපාඩුකම් පෙන්වාදීම මෙම ගුරු කුලයේ අරමුණ විය. වචනාර්ථයට වැඩි අවධානයක් දුන් ඔවුහු බයිබල් විවරණයේ දී එහි ඓතිහාසික කරුණුවලට හා ව්‍යාකරණ රටාවට වැඩි අවධානයක් යොමු කළහ. ඔවුන්ට අනුව ඔරිජන් ඇතුළු ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුලයට අයත් අන් අයගේ ව්‍යංගාර්ථයෙන් බයිබලයේ කරුණු විවරණය කිරීමේ ක්‍රමවේදය මිත්‍යාවකි.

අන්තියෝකියානුවෝ ඇරිස්ටෝටල් නමැති දාර්ශනිකයාගේ ක්‍රමවේද පදනම් කොට ගත්හ.

**අන්තියෝකියානු ගුරුකුලයේ දේවධර්මය**

අන්තියෝකියානු ගුරු කුලයේ ඉගැන්වීම් යුග දෙකකට අයත් වේ.

- ඒරියන් වාදය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුගය. මෙහි දී ඒරියස් ව හා ලූෂන්ව ආරක්ෂා කරමින් ඔවුහු ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුළයේ ක්‍රිස්තුවේදයට අභියෝග කළහ. බයිබලීය විවරණයන්හි දී ඔරිජන්ට විරුද්ධව මත ඉදිරිපත් කළහ.
- අපොලිනාරියස්ගේ ක්‍රිස්තුවේදී මතවාද පිළිබඳ අර්බුදයට මුහුණ දුන් යුගය. මේ යුගයේදී ද්විත්ව වාදී ක්‍රිස්තුවේදයක ආරම්භයට මුල පිරිණි. ක්‍රිස්තුන් වහන්සේගේ ස්වභාවයන් දෙකක් පිළිබඳ ධර්මයක් මෙම යුගයේ දී ඉදිරිපත් විය.

ඉහත කරුණු අනුව ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුළයේ දේව ධර්මයට අභියෝග කළ ඔවුන්ගේ ප්‍රධාන ඉගැන්වීම් කීපයකි. ඒවා බයිබලීය විවරණය හා ක්‍රිස්තුවේදය මත පදනම් වේ.

- ඔවුන් බයිබලීය විවරණයේ දී එහි වචනාර්ථයට මූලික අවධානයක් දි ඇත.
- ඔවුහු බයිබල් විවරණයේ දී එහි ඓතිහාසික කරුණුවලට හා ව්‍යාකරණ රටාවට වැඩි අවධානයක් යොමු කළහ.
- ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුළයේ බයිබලීය විවරණය හා සම්බන්ධ ටිපොලොජිකල් (*Typological Interpretations*) ක්‍රමවේදය ප්‍රතික්ෂේප කළහ.
- ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වයට මූලික ස්ථානයක් නොදුන් මොවුහු උන්වහන්සේගේ මනුෂ්‍යත්වය තහවුරු කිරීමට උත්සාහ ගත්හ.
- මෙහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රිස්තුන් වහන්සේගේ ස්වභාවයන් දෙකක් පිළිබඳ මත දැරූ නෙස්ටෝරියන් වාදීන්ට සහයෝගය දැක්වූහ.

### 7.2.3 ග්‍රීක රෝම සංස්කෘතියේ නව ප්‍රවණතා

ග්‍රීක දර්ශනය, රෝම පාලන තන්ත්‍රය හා ග්‍රීක රෝම භාෂා ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය වර්ධනයට ඉවහල් වී ඇත.

- මිනිසාගේ ජීවිත පැවැත්මට ඉවහල් වූ ශිෂ්ටාචාර අතර මූලික වන්නේ ග්‍රීක ශිෂ්ටාචාරයයි.
- ග්‍රීක දර්ශනයේ බුද්ධිමත් චින්තකයන් හා විද්‍යාඥයින් ග්‍රීක ශිෂ්ටාචාරය තුළින් වර්ධනය වී ඇත.
- ග්‍රීකයන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ වෙළඳාම හා කෘෂිකර්මාන්තයයි.
- ග්‍රීක ශිෂ්ටාචාරය ව්‍යාප්ත වූ අංශ මෙසේ දැක්විය හැක.
    * දේශපාලනය
    * දර්ශනය
    * තාරකා විද්‍යාව
    * ජ්‍යාමිතිය
    * වෛද්‍ය විද්‍යාව
    * තර්ක ශාස්ත්‍රය
    * භෞතික විද්‍යාව
    * භූගෝල විද්‍යාව
    * ගණිතය
    * සාහිත්‍ය
    * ක්‍රීඩා
    * ඔලිම්පික් තරගාවලිය
- පෞද්ගලික හැකියා වර්ධනයට අවශ්‍ය තරග පැවැත්වීම, යුධ හමුදා පුහුණුව ලබාදීම, ඒ සඳහා ජනතාව පෙළඹවීමට තිළිණ ප්‍රදානය මගින් කුසලතා වර්ධනයට රුකුල් දීම සිදුවිය.
- සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි චින්තකයින් සිය දාර්ශනික චින්තනය ලොවට දායාද කිරීම.
- මැසිඩෝනියට යටත් වුව ද ග්‍රීක ශිෂ්ටාචාරය කිසිසේත් යටපත් වූයේ නැත.
- නව පිලිප්ගේ පුත් විසින් ඇලෙක්සැන්ඩර්ගේ අධිරාජ්‍යය ව්‍යාප්ත කරමින් සිරියාව, බබිලෝනියාව, පර්සියාව, ඊජිප්තුව, ඉන්දියාව අත්පත් කරගැනීම.
- ග්‍රීක ශිෂ්ටාචාරය හා නැගෙනහිර ආසියාවේ ශිෂ්ටාචාරය මිශ්‍රව හෙලනිස්ත නව ශිෂ්ටාචාරයක් බිහිවීම.

ග්‍රීක භාෂාව

- තම මවුබස වන ග්‍රීක භාෂාව යොදාගනිමින් ග්‍රීක විද්‍යාඥයින්, දාර්ශනිකයින් හා චිත්‍ර ශිල්පීන් නව සොයාගැනීම් හා පර්යේෂණ ඉදිරිපත් කළේ භාෂාවේ ප්‍රතිඵලයක් ලෙසිණි. මේ නිසා ග්‍රීක නව වාග්මාලාව පෝෂණය විය.
- නව සොයාගැනීම් හා දාර්ශනික චින්තන ලොවට ප්‍රකාශ කිරීමට ග්‍රීක් වාග්මාලාව පොහොසත් විය.

- ග්‍රීක් භාෂාව ඇලෙක්සැන්ඩර්ගේ කාලයේ හා ඉන්පසුව ජනප්‍රිය භාෂාවක් බවට පත්වී තිබුණි.
- රෝම හා බයිසෙන්තියානු අධිරාජ්‍යය තුළ ග්‍රීක භාෂාව භාවිත විය.
- රෝම අධිරාජ්‍යය තුළ ග්‍රීක භාෂාව භාවිත කළේ තම නීති ව්‍යවස්ථාවන් සම්පාදනය කිරීම සඳහාය.

ග්‍රීක දර්ශනය

- නොස්ටික්වාදය = ඥානවාදය පදනම් කොට ඇති වූ වේදභේදයකි.
- ප්ලේටෝනිසම්වාදය = ක්‍රි.පී.428 - 348 දර්ශනය පිළිබඳ වාදයකි. සත්‍ය ලෝකය පිළිබඳ ගැටලුවකි. අන් අලෝකයන් සියල්ලම සැබෑ ලෝකයේ ස්වරූප ලෙස හැඳින්වීම. (Images)
- ස්ටොයික්වාදය =
- ඇරිස්ටෝටල් වාදය = ක්‍රි.පූ. 348 - 322
  හේතුඵල වාදය කොටස් 4කට වර්ග කළ හැක.

    i. Material Cause *උදා* : යම් පිළිමයක් ඇඹීමට පෙර එම නිර්මාණකරු ඒ සඳහා යොදාගන්නා ද්‍රව්‍ය, මූලධාතුව

    ii. Formal Cause *උදා* : එම නිර්මාණකරු හෙවත් මූර්ති ශිල්පියාගේ මනසේ ඇඳෙන රූපය හෙවත් නිර්මාණය

    iii. Efficient Cause එම නිර්මාණය ඉදිරිපත් කරන මූර්ති ශිල්පියා හෙවත් නිර්මාණකරු

    iv. Final Cause - පිළිමය නිර්මාණය කිරීමට හේතුව විමසීම කුමක් සඳහා ඉදිරිපත් කළේ ද යන්නයි.

  ග්‍රීක චින්තනය පාවුලු හා ජොහන් තුමන්ගේ ලේඛනවලට බලපෑම් කර ඇතැයි විශාරද මතය වන්නේ එම දෙපළගේ චින්තනය හා ග්‍රීක චින්තනයෙහි ඇති සම්බන්ධතාවය හේතුකොට ගෙන ය.

ග්‍රීක බයිබලය

- ඉශ්රායෙල් ජනතාව විවිධ අධිරාජ්‍යයන්ට යටත් ව පැවතීම. එනම් ඊජිප්තුවරුන්, අසිරියන්වරු, බබිලෝනියන්වරු, පර්සියන්වරු හා රෝම හා ග්‍රීක වැනි විවිධ ජාතීන්ට ඔවුහු යටත් ව සිටියහ. මෙම ඓතිහාසික පසුබිම හා දේශපාලන පරිපාලනමය වෙනස්කම් ඉශ්රායෙල් ජනතාවගේ ශිෂ්ටාචාරය තුළ විවිධ වෙනස්කම් ඇතිකිරීමට පසුබිම් වූ බව ඉතිහාසය පෙන්වා දෙයි.
- මෙම ශිෂ්ටාචාරයේ වෙනස්කම් ඊශ්රායෙල් ජනතාවගේ භාෂාවේ වෙනස්කම්වලට ද භාජනය විය. තම මව්බස වූ හෙබ්‍රෙව් බස ක්‍රම ක්‍රමයෙන් අමතක විය. බබිලෝනියේ සිටි ඉශ්රායෙල් ජනතාවගේ භාෂාව වූයේ අරබීය භාෂාවයි. මේ වකවානුවේ දී ඉශ්‍රායෙල් ජනතාවට හේබ්‍රෙව් භාෂාවෙන් ලියැවුණු බයිබලය කියවා අවබෝධ කර ගැනීමට නොහැකි විය.
- මේ හේතුවෙන් අරාබීය භාෂාවෙන් බයිබලය පරිවර්තනය විය. මෙම පරිවර්තනය Targum ටර්ගුම් ලෙසින් හඳුන්වන ලදී.

- ක්‍රි.පූ. 333 සිට 63 දක්වා පලස්තීනයේ මහා ඇලෙක්සැන්ඩර් යටතේ ග්‍රීක පාලනයට ඔවුහු නතු වූහ. ග්‍රීක ශිෂ්ඨාචාරය ඊජිප්තුවේ සිට ඇෆ්ගනිස්ථාන් දක්වා ව්‍යාප්ත ව පැවතිණි.

- මෙම බල ප්‍රදේශවල ජීවත් වූ ජනතාව කොයිනේ Koine යන ග්‍රීක භාෂාව කථා කළෝය. ග්‍රීක භාෂාව නොදත් අය ශිෂ්ටාචාරයක් නොමැති පිරිසක් වූහ.

- නව ගිවිසුම් යුගයේ දී, ග්‍රීක පාලනයට යටත් වූ ප්‍රදේශවල ජීවත් වූ ජුදාවරුන් ග්‍රීක ශිෂ්ටාචාරයේ බලපෑමට ලක්වී ග්‍රීක භාෂාව පිළිබඳ පුළුල් අවබෝධයකින් යුක්ත වූහ.

- පුරාණ ගිවිසුමට අයත් ග්‍රන්ථ 46 න් වැඩි ග්‍රන්ථ ප්‍රමාණයක් ලියැවී ඇත්තේ හේබ්‍රෙව් භාෂාව උපයෝගී කොට ගෙන ය. එහෙත් සමහර ග්‍රන්ථ ඇරමයික් හා ග්‍රීක භාෂාවලින් ලියැවී ඇත. ග්‍රීක භාෂාවෙන් ලියැවී ඇති ග්‍රන්ථය මකබි 1, 2 සලමොන්ගේ ප්‍රඥාව (නව ගිවිසුමේ අඩංගු සියලුම ග්‍රන්ථ)

- මෙලෙස ග්‍රීක භාෂාව ශු. බයිබලයට කොතරම් බලපා ඇත්දැයි විමර්ශනය කළ හැක.

- ඓතිහාසික අවශ්‍යතාවන් හා ජනවන්දනා අවශ්‍යතාවන් මත ශු. බයිබලය ග්‍රීක භාෂාවට පරිවර්තනය වී ඇත. ග්‍රීක භාෂාවෙන් පරිවර්තනය වූ බයිබලය හැඳින්වූයේ සෙප්ටුවාජින්ත යනුවෙනි. විසිරී ගිය ජුදා ජනතාව සෙප්ටුවාජින්ත පිටපත අධ්‍යයනය හා පරිශීලනය මගින් ඉමහත් සහනයක් ලදහ.

- මෙම පරිවර්තනය සිදුවූ කාලය හා ස්ථානය දෙස බැලීමේ දී එය ක්‍රි.පූ. 275 පමණ කාලයේ 2වන ටොලමි ෆිඩඩෙල්ෆුස් රජතුමාගේ සමයේ ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියා නගරයේ ලියැවී ඇති බව විශාරද මතය වේ.

- මෙම ග්‍රීක පරිවර්තනය සෙප්ටුවාජින්ත පිටපත ශු. සභා ඉතිහාසයේ විශේෂයෙන් ශු. සභා මුල්කාලය තුළ ඉතා වැදගත් ග්‍රන්ථයක් ලෙස සැලකේ. අපෝස්තුලුවරුන් හා මුල් කිතුනුවන් සෙප්ටුවාජින්ත ග්‍රන්ථය බොහෝ සේ ප්‍රයෝජනයට ගත්හ.

  මෙම සෙප්ටුවාජින්න පිටපතෙහි නිරවද්‍යතාවය ග්‍රීක හා ලතින් සභා පියවරු පිළිගනු ලැබූහ.

**රෝම ශිෂ්ටාචාරයේ නව ප්‍රවණතා**

- ටයිබර් ගඟ අයිනේ තිබූ රෝම නගරය ලතින් ජන කොටස පදිංචිව සිටි ප්‍රදේශයයි. එය වෙළෙඳ මධ්‍යස්ථානයක් විය. මේ ජනකොටසගේ නාමය ශිෂ්ටාචාරයේ නාමයක් ලෙසින් භාවිත කළෝය.

- ග්‍රීසියේ පැවති යුද්ධය නිසා ග්‍රීසියෙන් පැමිණි ජනතාව මෙහි පදිංචි වූ නිසා රෝම ජනතාව යන විරුදාවලිය හිමි විය.

- මේ ලතින් ජනකොටස හැර ඉතාලියේ විවිධ ජනකොටස් ජීවත් වූහ. ඒ අය හඳුන්වනු ලැබුවේ ඉන්දු යුරෝපීය ජනකොටස ලෙසිනි.

- ඔවුහු කෘෂිකර්මාන්තයේ හා යුධ සේවාවේ දක්ෂ පිරිසකි.

- රෝම අධිරාජ්‍ය පුරා මෙලෙස ව්‍යාප්ත වූයේ අන් රටවලට තම අධිකාරී බලය යෙදවීමට හා අන් රටවල් අත්පත් කරගනිමින් යටපත් කර ගැනීමට ය.

- රෝම අධිරාජ්‍ය පුරා විහිදී ඇති මහා මාර්ග පද්ධතිය හා විවිධ සංස්කෘතීන් ශිෂ්ටාචාරයන් රෝමය තුළ සම්බන්ධවීම නිසා මේ ප්‍රදේශය ප්‍රධාන මධ්‍යස්ථානයක් විය.
- ක්‍රි.පූ. 5 වන ශතවර්ෂයේ සිට ක්‍රි.ව. 4 වන ශතවර්ෂය දක්වා රෝම අධිරාජයාගේ පාලනයට නතු විය. එම බල ප්‍රදේශය වූකලී අත්ලාන්තික් සාගරයේ සිට යුප්‍රටීස් ගඟ දක්වාත්, උතුරේ රයින් ඩැනියුබ් ගඟ සිට දකුණු සහරා කාන්තාර ප්‍රදේශ විය.
- මේ සමය තුළ ආගමික, දේශපාලන, සංස්කෘතික වශයෙන් අධිරාජ්‍ය පුරා එක්සත් බව දක්නට ලැබුණි.
- එහෙත් ක්‍රි.ව. 4 වන ශතවර්ෂයේ බාර්බේරියන්වරුන්ගේ ආක්‍රමණ නිසා රෝම අධිරාජ්‍යය විවිධ කොටස්වලට කැඩී බිඳී ගියේ ය.

ලතින් භාෂාව

- රෝමවරුන්ගේ අධිරාජ්‍යය සමයේ අධිරාජ්‍යය පුරාම පරිපාලන භාෂාව වූ ලතින් භාෂාව ව්‍යවහාරයේ යෙදුණි.
- යුරෝපයේ විවිධ භාෂාවලට ලතින් භාෂාව, මවුභාෂාව වීය. *උදා :* ඉතාලිය, ස්පාඤ්ඤ, පෘතුගාලය, ප්‍රංශය, රුමේනියාව වැනි රටවල ලතින් භාෂාව මවුභාෂාව වීම.
- ලතින් භාෂාවේ මූලිකත්වයෙන් නීතිය, විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, අධ්‍යාපන ක්ෂේත්‍රයන් ක්‍රියාත්මක වීම.
- ලතින් භාෂාව වසර 1000කට වැඩි කාලයක් එනම්, (18 වන සියවස දක්වා) සාහිත්‍ය භාෂාවක් ලෙසින් වර්ධනය වී ව්‍යාප්ත ව පැවතීම.
- වර්තමානයේ ශු. කතෝලික සභාවේ නිල පරිපාලන භාෂාව ලෙස ලතින් භාෂාව යොදා ගැනීම. එලෙසම අපෝස්තලික ශුද්ධාසනයේ නිල ප්‍රකාශන ලියකියවිලි ලතින් භාෂාවෙන් ප්‍රකාශයට පත්වීම.
- දෙවන වතිකාන කතිකාවට පෙර එනම් 1963 ට පෙර මුළු ශු. සභාව තුළ ජනවන්දනාව ලතින් භාෂාවෙන් පවත්වන ලදී.
- එම යුගයේ දෙව්සත්හල්වල දේව ධර්මය උගන්වන ලද්දේ ද ලතින් භාෂාවෙනි.

ලතින් බයිබලය

- රෝම අධිරාජ්‍යය තුළ ලතින් භාෂාව වැඩි වශයෙන් ව්‍යවහාරය වූ නිසා ශු. බයිබලය ලතින් භාෂාවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාව ද මතු විය.
- විවිධ පුද්ගලයෝ බයිබලය පරිවර්තනය කළහ. මෙය පුරාණ ලතින් පරිවර්තනය නමින් හැඳින්විය. (Old Latin Translation)
- ක්‍රි.ව. 390 දී දමස්කස් ශුද්ධෝත්තම පියතුමා විසින් ලතින් බයිබලය ප්‍රතිසංස්කරණයට තීරණය කරමින් ශු. ජෙරොම්තුමාට එම වගකීම පවරන ලදී. එතුමා ග්‍රීක හා හෙබ්‍රෙව් බස පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත ය.

- 4වන ශතවර්ෂයේ අග කාලයේ ශු. ජෙරොම්තුමා විසින් පරිවර්තනය කළ ශු. බයිබලය වල්ගේට් හෙවත් වුල්ගාතා ලෙස හැඳින්වේ. වුල්ගතුස් යන්නෙහි අර්ථය සරල හා පොදු බවයි. මෙය සැමටම අවබෝධ වන පරිදි අර්ථකථනය කරන ලදී.

- ශු. ජෙරොම් තුමා කිතු සමිඳුන් උපත ලද බෙත්ලෙහෙම් නුවර වසර 25 ක කාලයක් ගතකරමින් මෙම පරිවර්තනය කරන ලදී.

- 1546 ත්‍රිදෙන්ත්‍රීනු මන්ත්‍රණ සභාව විසින් වල්ගේට් පරිවර්තන බයිබලය නිල පරිවර්තනයක් ලෙස ඒකමතිකව පිළිගන්නා ලදී.

- ලතින් බයිබලීය පරිවර්තනය මූලික කරගෙන වෙනත් භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.

ගෘහ නිර්මාණ ශිල්පය

- රෝම ගෘහ නිර්මාණ ශිල්පය ඉතා දියුණු මට්ටමක පැවතිණ. මහාමාර්ග, පාලම්, ජලාශ, වරාය, ක්‍රීඩාංගන, වැව් වැනි යටිතල පහසුකම් දියුණු මට්ටමක පැවතිණි.

- ග්‍රීක ගෘහනිර්මාණ ශිල්පය අනුගමනය කළත් පසුකාලයක තමන්ගේ ම ස්ව නිර්මාණවලට ඔවුහු යොමු වූහ. බැසිලිකා ගෘහ නිර්මාණ පදනමට අනුව ක්‍රිස්තියානි බැසිලිකා නිර්මාණය විය.

- රෝම නගරය තුළ බැසිලිකා දේවස්ථාන නිර්මාණය කිරීමට කොන්ස්ටන්ටයින් අධිරාජයා විසින් මූල්‍යමය පරිත්‍යාග පිරිනමන ලදී.

- කොන්ස්තන්තීනුපලය නගරයේ ශුද්ධාත්මයාණන් වහන්සේ නමින් දේව මාළිගාවක් ඉදිකෙරිණි. එලෙසම කල්වාරියේ ස්වාමින් වහන්සේගේ ගල්ලෙන දෙව්මැදුරක් ද, ඔලිව් කන්දේ අන්‍යරූප විලාශවීමේ දෙව්මැදුරක් ද ඉදිකළෝය.

- මෙම දෙව්මැදුරු සියල්ලම බැසිලිකා ස්වරූපයට තනන ලදී. බැසිලිකා ආකෘතිය සෘජුකෝණාස්‍ර හැඩැති

රෝමයේ පරිපාලන ආකෘතිය

- රෝමයේ වාසය කළ ජනතාව ප්‍රධාන වශයෙන් කොටස් 2කට බෙදිය හැක. ඒ,

  1. පැට්ට්‍රිශියන්වරුන් හා

  2. ප්ලේබියන්වරුන් වශයෙනි.

- පැට්‍රිශියන් ජනතාව මුල් ජනගහනයෙන් 10%ක් පමණි. එහෙත් ඔවුහු ඉඩම්හිමි ලාභීන් වූ අතර පරිපාලන කටයුතු මෙහෙයවනු ලැබූහ. එහෙයින් රෝම පරිපාලන ආකෘතියේ පැට්ට්‍රිශියන්වරුන්ගේ කැපී පෙනෙන ලක්ෂණයක් දක්නට ලදී.

- රෝම සමාජයේ ප්ලේබියන්වරු 90%ක් සිටිය අතර, අඩු භූමිභාගයක හිමිකම් ඇවිරිණි. මේ ජනතාවගෙන් අඩු පිරිසක් සුළු ව්‍යාපාරිකයන් ලෙසින් කෘෂිකර්මාන්තයේ නියැලුණු අය වෙති.

- මෙම බලපෑම තුළ රෝම සංස්කෘතියේ පරිපාලනය ඉහත සඳහන් කළ පරිදි පැට්ට්‍රිශියන් වරුන් මඟින් සිදු විය.

- 4 වන සියවස වනවිට රෝමයේ ක්‍රිස්තියානි වර්ධනයක් වූ නිසා ඔවුන්ට විශේෂ පිළිගැනීමක් ද සමාජ තත්ත්වයක් ද හිමි විය.

- මෙලෙස ශු. සභාවේ පරිපාලන ආකෘතිය රෝම පරිපාලන ආකෘති හා සමගාමී ව පැවතුණු අතර එහි දේශපාලන සමාජ මට්ටමේ ආකෘතිය ශු. සභාවට හිමි විය. එනම් අඩු පිරිසක් වැඩි බලයන්ට සමන්විත වීම.

- ඉහත ආකෘතියට අනුව අග නගරයේ සභාවේ පාලන බලය හිමිවූයේ අගරදගුරුතුමාට ය. අනෙකුත් නගර පාලනය කරනු ලැබුවේ රදගුරුවරුන්, මීසම් පාලක පියතුමන්, තේවාචාරිවරුන්, පැවිදි අය ලෙස පිළිවෙළින් ය. මේ සියලු දෙනාටම ඉහළින් ශුද්ධෝත්තම පියතුමා සිටි අතර පහළම මට්ටමේ ගිහි ජනතාව සිටියහ.

- ශු. සභාවේ වැදගත් තීරණ ගැනීමේ වගකීම හා ක්‍රියාත්මක කිරීමේ බලයත් ක්‍රියාකිරීමේ වරම ද හිමි වූයේ පූජාප්‍රසාදීවරුන්හට ය.

- ගිහි ජනතාව ද මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හා සහභාගීත්වය දක්නට ලැබුණේ ඉතා ස්වල්ප වශයෙනි. රෝමයේ ජනතාව අතර ප්ලේබියන් ජන කොටසට තම නියෝජිතයන් තෝරා ගැනීමේ බලය සතු විය.

- මෙම පරිපාලන ආකෘතිය II වන වතිකාන කතිකාව මහා සභාව රැස්වන තුරු එලෙසම ක්‍රියාත්මක විය. II වතිකාන කතිකාව මෙම පාලන බල ආකෘතිය වෙනස් විය යුතු බව යෝජනා කළාය.

ජනවන්දනාව තුළ රෝම බලපෑම

- රෝම අධිරාජ්‍යය තුළ ජීවත් වූ ක්‍රිස්තියානි භක්තිකයන් රෝම ජනතාවගේ වත්පිළිවෙත් හා සංස්කෘතිය වැළඳ ගැනීම සිදුවිය.

- රෝම ජනතාව තම දෙවියන්ටත්, රජවරුන්ටත්, වීරවරුන්ටත්, මංගල්‍ය උත්සව පැවැත්වූහ. ඒ අනුව යමින් ක්‍රිස්තියානින් තම විශ්වාසයට සාක්ෂි දැරූ ප්‍රාණපරිත්‍යාගීවරුන්ට ස්මරණ උත්සව පැවැත්වීමට ආරම්භ කළහ.

- රෝමවරුන් දෙසැම්බර් 25 වන දින හිරු දෙවියන්ගේ මංගල්‍යය පැවැත්වූ අතර ක්‍රි.ව. 366 සිට රෝම අධිරාජ්‍යය පුරා ජීවත් වූ ක්‍රිස්තියානින් සාධාරණත්වයේ පුත්‍රයාණෝ (Son of Justice) වන කිතු සමිඳුන්ගේ උපන් මංගල්‍යය එදින පැවැත්වීම ආරම්භ කළෝය. ක්‍රි.ව. 366 සිට බටහිර රටවල රෝමයේ ලතින් පිළිවෙත් අනුගමනය කරමින් ක්‍රිස්තු උත්පත්ති මංගල්‍යය දෙසැම්බර් 25 වන දින සැමරීම කරන ලදී.

- රෝම සංස්කෘතියට අනුව පිළිම, ප්‍රතිමා රැගෙන වීදි යාම සිදු වූ අතර, එයට විවිධ ධජ රැගෙන යාම සිදුවිය. මෙලෙස ක්‍රිස්තියානි සංස්කෘතියට වීදි යාමේ පිළිවෙත් ඒකරාශී වී ඇත.

- එක්වරු ශීලය රැකීම හා විවිධ භාවිඥා ක්‍රමවල රෝම ආභාෂය ක්‍රිස්තියානින් ලබා ඇත.

- රෝම සංස්කෘතියේ රජවරුන්ට සෙන්පතීන්ට ගරුත්වය දැක්වූ අතර, ක්‍රිස්තියානි සංස්කෘතියේ දණනමා ආචාර කිරීමේ ආභාෂය එමගින් ලබා ඇත. ඔවුන් රජවරුන්ට, සෙන්පතිවරුන්ට, එක් පාදයක් නවා ආචාර කළ අතර, අද වත්මන් කිතුනුවෝ මේ සිරිත අනුගමනය කරති. මෙය රෝම ආභාෂය ලබාගැනීමකි.

### 7.2.4 මුල් යුගයේ කිතුනු චින්තකයෝ සහ ධර්මධරයෝ

ලේඛනවල අවශ්‍යතාවය

දෙවන ශතවර්ෂයේ මැදභාගය වනවිට ක්‍රිස්තියානියට විරුද්ධව විවිධ චෝදනා එල්ලවීමට පටන්ගෙන තිබුණේ ය. එම චෝදනා බිඳදැමීමට ගත් පියවරක් වශයෙන් ඒවාට පිළිතුරු සපයන පොත්පත් නිපදවිය. මෙම පොත්පත් ලියූ ලේඛකයෝ ජීවත් වූයේ ජේසුස් වහන්සේගේ හා අග්‍ර ශ්‍රාවකයන්ගේ කාලයට ආසන්න යුගයක වන නිසා ඔවුන්ගේ ලේඛන ඉතා වැදගත් වේ. මෙම කාලය වනවිටත් ක්‍රිස්තියානි සභාව නවක සභාවක් වූ නිසා කිතුනු සභාව පෝෂණයකිරීමට සහ පණගැන්වීමට මෙම ලිපිලේඛන ඉතා ප්‍රයෝජනවත් විය. එමනිසා ම මුල්කාලීන ලේඛකයෝ සභා පියවරු යන ගෞරවනීය නාමයෙන් හඳුන්වනු ලැබේ. ක්‍රිස්තියානිය තහනම් වූ යුගයක පොත්පත් ලිවීමට නිදහසක් නොතිබුණත් ආගම ධර්මය පිළිබඳ බොහෝ දෙනෙක් පොත්පත් ලියූහ.

ශාන්ත ජස්ටින් තුමා (ක්‍රි.ව. 100 - 165)

- ක්‍රිස්තියානි ඉතිහාසයේ ප්‍රථම මහා ලේඛකයා සේ මොහුව සළකනු ලබයි.
- පලස්තීනයේ උපන් මොහු ශ්‍රේෂ්ඨ දාර්ශනිකයකු ද වේ.
- මොහු ලියා ඇති පොත් අතරින් ප්‍රධානතම පොත වන්නේ අන්තෝනියුස් පියුස් නැමැති අධිරාජයා අමතා ලියා ඇති අපොලොජියාව නැමැති කෘතියයි. අපොලොජියා යන ග්‍රීක වචනයේ අර්ථය වන්නේ චෝදනාවලට පිළිතුරු දීම යන්නය.
- ඇපොලොජියා වේ වැදගත් කොටසක් වනුයේ යුකරිස්තිය (Eucharist) නමැති ක්‍රිස්තියානි ස්තෝත්‍ර පූජාව ගැන සඳහන් වී ඇති කොටසයි. ක්‍රි.ව. 150 තරම් ඈත යුගයේ දී ඉරුදිනවල රෝමයේ පැවැත්වුණු යුකරිස්තිය හෙවත් ස්තෝත්‍ර පූජාව දීර්ඝ ලෙස මොහුගේ මෙම කෘතියෙහි විස්තර වේ.
- ක්‍රි.ව. 165 දී පමණ රෝමයේ දී සිර අඩස්සියට ගනු ලැබ එහිදී මෙතුමාගේ හිසගසා මරනු ලැබුවේය.
- අද දක්වා ආරක්ෂා වී ඇති මෙම කෘතිය අන්‍යාගමිකයන් අරමුණු කරගෙන ලියා ඇත.

සාන්ත ඉග්නාසියස් තුමා (ක්‍රි.ව.35 - 107)

- සාන්ත ඉග්නාසියස් තුමාගේ ලිපිවලින් රාජගුරු ප්‍රසාදිවරුන්ගේ දිසා පාලක වගකීම් පිළිබඳ තොරතුරු ඉඟි කරයි.
- අන්තියෝක නගරයේ රාජගුරු ප්‍රසාදිවරයා වූ මෙතුමා ලිපි හතක් ලියා ඇත. එම ලිපිවලින් පැහැදිළිව ප්‍රකාශවන කරුණක් වන්නේ බැතිමතුන් අතර සමඟිය සහ එක්සත්කම රැකගැනීම සෑම ප්‍රදේශයක් ම භාරව සිටින රාජගුරු ප්‍රසාදී තුමාගේ වගකීම බවයි. ක්‍රි.ව. 107 දී මෙතුමා සිය දිවි පුදා ඇත.

සාන්ත ඉරේනියස් තුමා (ක්‍රි.ව. 130 - 202)

- තුර්කියේ ස්මිර්නා ප්‍රදේශයේ උපත ලත් සාන්ත ඉරේනියස් තුමා ප්‍රථම මහා ක්‍රිස්තියානි දේව ධර්ම ශාස්ත්‍රඥයා වශයෙන් සලකනු ලැබේ.
- ක්‍රි.ව. 177 ප්‍රංශයේ ලියොන්ස් නගරයේ රාජගුරු ප්‍රසාදිවරයා වූ මෙතුමා මිථ්‍යා මත බිඳීම (Against the Heresies) යන පොත ලීවේය.
- ක්‍රිස්තියානියේ ප්‍රධාන ධර්ම සිද්ධාන්ත ක්‍රමානුකූලව මෙම පොතෙහි දක්නට ලැබේ. සෑම කිතුනු සභාවක් ම රෝම සභාව හා එකඟ විය යුතු ය යන අදහස ද එහි ප්‍රකාශ කර ඇත. ක්‍රි.ව. 202 දී පමණ මොහු ස්වර්ගස්ථ වී ඇත.

ඔරිගන් තුමා (ක්‍රි.ව. 185 - 254)

- තුන්වෙනි ශතවර්ෂයේ සිටි ක්‍රිස්තියානි ධර්මයේ ප්‍රධාන ආරක්ෂකයා ලෙස ඔරිගන් තුමාව හඳුන්වා දිය හැකිය.
- මෙතුමා ක්ලෙමන්ට් තුමාගේ ගෝලයෙකි. මෙතුමා ක්ලෙමන් තුමාගේ චින්තනය ඉදිරියට ගෙන යන ලදී.
- ශු. බයිබලය අර්ථකථනය කිරීම සහ ක්‍රිස්තු වේදය පිළිබඳ ඉගැන්වීම් මගින් ඔරිගන් තුමා ක්‍රිස්තියානි සභාවට සේවය කර ඇත.
- Periarchon යන ග්‍රීක් භාෂාවෙන් අදහස් කෙරෙන මූලධර්ම නැමැති පොත මොහු ලියූ පළමුවෙනි පොත වේ. යුගාන්ත ධර්මය පිළිබඳ මොහු ඉදිරිපත් කළ ඇතැම් අදහස් ජගත් මන්ත්‍රණ සභාවලදී ප්‍රතික්ෂේප කරන ලදී.

- ශු. අතනාසියස් තුමා (ක්‍රි.ව. 296 - 373)
  * ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරු තනතුර දරා ඇති මෙතුමා 4 වෙනි ශතවර්ෂයේ ප්‍රථම භාගයේ විසූ ප්‍රධාන කිතුනු ලේඛකයා ය.
  * ඒරියන් වේද භේදයට නැගී සිටි ප්‍රධාන ධර්මධරයා ශු. අතනාසියස් තුමා ය.
  * නිසියාන මන්ත්‍රණ සභාවේ දී ප්‍රමුඛත්වය ගත්තේ මෙතුමා ය. මෙතුමා ග්‍රීක දර්ශනයේ තර්ක ක්‍රම ක්‍රිස්තු ධර්මයේ ගැඹුරු තැන් සොයා බැලීමට උපයෝගී කරගත්තේ ය.
  * මෙතුමා ලියන ලද කෘතීන් අතර බහු දේව වන්දනාව, ප්‍රේමය, ශු. අන්තෝනි ජීවිත චරිතය හා ඒරියන් වාදීන්ට විරුද්ධව ලියූ පොත් 3ක් ද ඉතා වැදගත් වේ.

- ශු. මහා බැසිල් තුමා (ක්‍රි.ව. 330 - 379)
  * තාපස ජීවිතයේ විනයමාලා සැකසීමෙහිලා ප්‍රධාන පුද්ගලයා මොහු ය.
  * මොහු ලියා ඇති පොත් අතර තාපස විනය නමින් පොත් 2ක් ද, මොරාලීසා නමින් ගිහි ජීවිතය පිළිබඳ පොතක් ද ශු. බයිබලයට අටුවාවක් මෙන් ලියන ලද දේශනා 24ක් ද වැදගත් වේ.

- ශු. ග්‍රෙගරි නිස්සා (ක්‍රි.ව. 330 - 395)

  * ශු. බැසිල් තුමාගේ බාල සොහොයුරකු වූ මෙතුමා ශ්‍රේෂ්ඨ චින්තකයෙකි.

  * කොන්ස්තන්තිනෝපල් හි පවත්වන ලද 2 වෙනි ජගත් මන්ත්‍රණ සභාවේ ප්‍රධාන ධර්මධරයා මෙතුමා ය. ධර්මස්ථම්භය යන පටබැඳි නාමයකින් හඳුන්වනු ලබයි.

  * ඕරාසියෝ කුට කේට්කා යන කෘතිය ද, ධර්ම විවාද ග්‍රන්ථ රැසක් ද කන්‍යාභාවය හා මිනිස් උපත යන පොතක් ද මෙතුමා ලියා ඇත.

- ශු ග්‍රෙගරි නාසියන්සුස් (ක්‍රි.ව. 329 - 389)

  * මෙතුමා දක්ෂ කථිකයෙකි. කවියෙකි. කෘතීන් ලියවුණේ ග්‍රීක සාහිත්‍යයේ දේශනා ශෛලියෙන් ය.

  * තම ජීවිත අත්දැකීම් තුළින් කෘතීන් බොහොමයක් ලියා ඇත.

  * ධර්මය පිළිබඳ ගැඹුරු තැන් සරල භාෂාවෙන් ඉදිරිපත් කිරීමට මෙතුමා දක්ෂයෙකි.

මහා බැසිල්, ග්‍රෙගරි නිස්සා, ග්‍රෙගරි නාසියන්සුස් යන තිදෙනා ම ඇලෙක්සැන්ඩ්‍රිය පෙළපතට අයත් පුද්ගලයන් වේ. වැඩිහිටි වයසේ දී ක්‍රිස්තු ධර්මය වැළඳගත් මොවුන් තරුණ වියේ දී ඇතැන්ස් ග්‍රීක විද්‍යා පීඨයෙහි දර්ශනවාදය හදාරා ඇත. සභාවේ රදගුරු තනතුරු දරා ඇති මොවුන් අපොලොජිස්ත ලේඛක ඔරිජන් තුමාගේ ගෝලයන් ය. මෙම තිදෙනාම ශු. ත්‍රිත්වය පිළිබඳ අංග සම්පූර්ණ ඉගැන්වීමෙහිලා දක්ෂයන් ය. මොවුන් තිදෙනා ම කූපඩෝසියන් පියවරුන් ලෙස හඳුන්වයි. එනම් කූපඩෝසියානු සභාවේ පියවරු තිදෙනා යනුවෙනි.

- ශු. අම්බ්‍රෝසි තුමා

  * ක්‍රි.ව. 340 දී උපත ලැබූ ශු. අම්බ්‍රෝසි තුමා රාජකීය පෙළපතකින් පැවත එන පුද්ගලයෙකි.

  * රෝමයේ අධ්‍යාපනය ලැබූ අම්බ්‍රොසි තුමා එහිදී නීතිය හදාරා ඇත. මිලාන් නගරයේ නීතිවේදියකු වශයෙන් ආණ්ඩුකාර තනතුර දරා ඇත.

  * ඒරියන් වේද භේදය වැළඳගත් මෙතුමා පසු කළෙක දී ක්‍රිස්තු ධර්මය වැළඳගත්තේය. අවුරුදු කිහිපයකින් රදගුරු තනතුරට පත් වූ මෙතුමා තමා සතු සියල්ල දුප්පතුන් අතර බෙදා දුන්නේ ය.

  * රෝම අගරජ වූ තියඩෝසියස්, ජනයා පෙළන විට නොබියව ඔහුව විවේචනය කර ඇත.

  * බටහිර තාපස ජීවිතය හැඩගැස්වීමට ශු. අම්බ්‍රෝසි තුමා වෙහෙස දරා ඇත.

**7.2.5 බටහිර යුරෝපා ගෝත්‍රයන්ගේ බලපෑම**

- ක්‍රි.පූ. 50 දී හන්ස් නමැති ගෝත්‍රිකයෝ චීන අධිරාජයාගේ බටහිර ප්‍රදේශවලට සංක්‍රමණය වූහ.

- අගෝස්තුස් අධිරාජයාගේ කාලයේ සිට රෝමයේ හමුදාව රෝම අධිරාජයාගේ සීමාවල නිරත වූයේ ශිෂ්ටාචාර නොවූ ජන කොටස්වලින් තමන් ආරක්ෂා වනු පිණිස ය.

- ගොත්ස් (Goths) යන කොටස නමින් හැඳින් වූ පිරිස් ඩැනියුබ් ගඟ ප්‍රදේශයේ රෝම රාජ්‍ය තුළ ජීවත් වන්නට අවසර ලැබූහ. මේ පිරිස දෙකොටසකට බෙදී බටහිර කොටසේ විසිගොත් (Visigoths) හා නැගෙනහිර කොටසේ ඔස්ට්‍රොගොත් (Ostrogoth) වාසය කළ බව සඳහන් වේ. ඔවුහු රෝම අධිරාජ්‍යය සමඟ සුහද සබඳතා ඇති කර ගත්හ. එමගින් විසිගොත් හා ඔස්ට්‍රොගොත් නමැති සමහර පිරිසක් හමුදා සේවාවට බැඳී පුහුණුව ලබාගත්හ.

- පසුකාලීනව ගොත්ස් ගෝත්‍රය රෝමයට එරෙහිව නැගී සිටීමට පටන් ගත් අතර ඇලරික් (Alaric) නමැත්තාගේ නායකත්වයෙන් විසිගොත් ජන කොටස රෝම අධිරාජ්‍යයට එරෙහිව නැගී සිටීමෙන් නැගෙනහිර ප්‍රදේශය ආක්‍රමණය කළෝය. ඉන්පසු රෝම නගරයට පහර දී ස්පාඤ්ඤයේ තම රාජ්‍යය ඉදිකළෝය.

- වැන්ඩල්ස් (Vandals) රෝම අධිරාජ්‍යය සමඟ ගැටුම් ඇති කරගත් ගෝත්‍රයකි. මෙම ගෝත්‍රය ස්පාඤ්ඤය හරහා දකුණු ප්‍රදේශයට පැමිණ උතුරු අප්‍රිකාව අත්පත් කරගත් අතර, රෝමයේ අවට ප්‍රදේශවලට පහර දී විනාශ කරනු ලැබීය. එහිදී රෝම හමුදා ප්‍රතිප්‍රහාර එල්ල කොට අප්‍රිකාවේ හා ඉතාලියේ වෙසෙන ඔවුන් සම්පූර්ණයෙන් විනාශ කළහ.

  ඔවුහු උතුරු ගෝල් ප්‍රදේශය අත්පත් කරගත්හ. පසුකාලීනව මෙම ප්‍රදේශය වැදගත් ස්ථානයක් බවට පත් විය.

- ක්‍රි.ව. 570 දී උතුරෙන් පැමිණි ලොම්බාඩ්වරුන් (Lombard) විසින් ඉතාලිය සම්පූර්ණයෙන් අත්පත් කර ගැනීම සිදුවිය.

- ඇන්ගල්ස් (Angles) වරුන් හා ජූට්ස් (Jutes) සැක්සන්ස් (Saxons) යන ගෝත්‍රයන් බ්‍රිතාන්‍ය පාලනයට නතුකර ගැනීම පහසුවෙන් කර ගැනීමට ඉවහල් වූයේ රෝමයේ ආක්‍රමණවලින් ආරක්ෂා කිරීමට හමුදා ගොස් සිටි හෙයිනි. මෙම පසුබිම යටතේ ඔවුන්ට බ්‍රිතාන්‍ය අත්පත් කර ගැනීමට පහසු විය.

- මෙම විවිධ ගෝත්‍රික ආක්‍රමණ නිසා කොන්ස්තන්තිනූපලය ප්‍රාදේශීය සුළු කොටස් ප්‍රමාණයක් රෝම අධිරාජයා සතු විය. එහෙත් බටහිර ප්‍රදේශ සම්පූර්ණයෙන් ම ගෝත්‍රික ජන කොටස් සතු විය. එනම්,

| | | |
|---|---|---|
| ඉතාලිය | - | ලොම්බාඩ්වරු |
| ස්පාඤ්ඤ | - | ගොතික්වරු |
| ගෝල් | - | ප්‍රෑන්ක්වරු |
| බ්‍රිතාන්‍යය | - | ඇන්ගල්ස් - සැක්සන් වැනි ගෝත්‍ර 7 ක් විසින් පාලනය කළෝය. |

- මේ ගෝත්‍රවලට ආවේනික වූ ශිෂ්ටාචාරයන් හා සංස්කෘතීන් තිබිණ. ග්‍රීක රෝම ශිෂ්ටාචාරයන් හා සැසඳීමේ දී ගෝත්‍රික ජන කොටස් සතු ශිෂ්ටාචාර පහත් මට්ටමක පැවතිණි.

- මෙම ගෝත්‍ර තුළ යුධ හමුදා තිබූ අතර බොහෝ පිරිස් කෘෂිකර්මාන්තයේ හා එඬේරික වෘත්තීන්වලට යොමු වූ අය වූහ.

- ගෝත්‍රික සංස්කෘතිය තුළ ස්වයං ගරුත්වය, මානව නිදහස, තමා තුළ ඇති කැපවීම, නෑදෑ මිතුරු සබඳතා පවත්වා ගැනීම, ස්ත්‍රීන්ට විශේෂ ගරුත්වය වැනි ගුණාංග කැපී පෙනුණු ලක්ෂණ විය.
- එහෙත් රෝම අධිරාජ්‍යයේ අවසාන භාගය තුළ ශුද්ධෝත්තම පියා ඇතුළු රදගුරුවරුන් බටහිර කොටසේ නායකයන් ලෙස ක්‍රියාත්මක වෙමින් තමන්ට අයත් ප්‍රදේශ ආරක්ෂා කර ගනිමින් ආක්‍රමණ කළ ගෝත්‍රික ජන කොටස් සමඟ සාම ගිවිසුම් ඇති කර ගත් හ.

  මෙහි දී ගෝත්‍රික ජනතාවට සේවය කිරීමට පූජා ප්‍රසාදීන් වහන්සේ ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා යැවීම මගින් ගෝත්‍රික ජන කොටස් ක්‍රිස්තු ධර්මය වැළඳ ගත්තෝය.
- කිතුනු ධර්මදූතවරුන් හා යුරෝපීය ගෝත්‍රිකයන් කිතු දහම වැළඳ ගැනීම පිළිබඳ නිපුණතා මට්ටම 1.2 සඳහන් වී ඇත.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සභාව අභ්‍යන්තරයෙන් හා බාහිරින් පැමිණි වේද භේද පිළිබඳ ව සිසුන්ගේ ආකල්ප අවධානයට ගත යුතුය.
- මුල් යුගයේ ප්‍රමුඛ දේවධාර්මික විද්‍යාපීඨ දෙක පිළිබඳ සාකච්ඡා කළ යුතුය.
- ග්‍රීක රෝම ශිෂ්ඨාචාරය මුල් සභාවේ වර්ධනයට රුකුලක් වූ ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කළ යුතුය.
- මුල් සභා පියවරුන්ගේ ප්‍රබල දායකත්වය පිළිබඳ ව සාකච්ඡා කිරීම සඳහා සාකච්ඡා මණ්ඩපයක් සංවිධානය කරන්න.
- බාබේරියානුවන්ගේ ආක්‍රමණය පිළිබඳ ව සිසුන් සමඟ අදහස් හුවමාරු කරගන්න.

**මූලාශ්‍රය :**


1. Fr. John Laux -Church History, Tan Books and Publications
2. Re. George Johnson - The Story of the Church, Tan Books and Publications

   Alfred Lapple - The Catholic Church - A Brief History (1982)

**නිපුණතාව 7.0** : **කිතුනු ශිෂ්ටාචාරයක් බිහිවීම තුළ සමාජ සංස්කෘතික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් හරහා ජීවිත වෙනසක් කරා ගමන් කරයි.**

**නිපුණතා මට්ටම 7.3** : නව යුරෝපීය ශිෂ්ටාචාරයක් ගොඩනැගීමට පැවිදි නිකායවල දායකත්වය සොයා බලයි.

**කාලය** : කාලච්ඡේද 07

**ඉගෙනුම් ඵල** :

- බෙනදිකාන ආදර්ශය, යාච්ඤාව හා වැඩකිරීම පිළිබඳ ව හදාරයි.
- තාපස ගම්මාන හා දුගී බවේ ආදර්ශය යන කරුණු ගැඹුරින් සාකච්ඡා කරයි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 7.3.1 බෙනදිකාන ආදර්ශය, යාච්ඤාව හා වැඩ කිරීම

- සභා ඉතිහාසයේ පැවිදි ජීවිතයේ ආරම්භය ඇතිවූ පැවිදි නිකාය, ඒවායේ වර්ධනය ආදිය නිපුණතා මට්ටම 2.1 හි සඳහන් ව ඇත.
- බෙනදිකාන නිකායේ ආදර්ශවත් සේවය, යුරෝපීය නාගරීකරණය ඇතිවීම සඳහා විශාල දායකත්වයක් දරා ඇත.
- පැවිදි ජීවිත ඉතිහාසය තුළ පැවිදි අය සමූහයාගෙන් ඈත් නොවී, සමූහයා සමඟ එක් ව සමාජයේ දියුණුවටත්, ජනතාවගේ ආධ්‍යාත්මිකත්වය සඳහාත් සේවය කිරීමට පැවිදි ක්‍රමයේ වෙනස්කම් ඇති විය.
- මේ වෙනස්කම් රෝම අධිරාජ්‍යයේ නැගෙනහිට රටවල ආරම්භ විය. මෙහි පුරෝගාමීන් ලෙස බටහිර රටවල ශුද්ධ වූ බැසිල් තුමාත්, නැගෙනහිර රටවල ශුද්ධ වූ බෙනදික් තුමාත් ගත හැක.

කය වෙහෙසා වැඩ කිරීමේ ගුණාංගය

- ශුද්ධ වූ බෙනදිකාන පැවිදි නිකායේ අය යාච්ඤාව සහ වැඩ කිරීම (ORA ET LABORA) යන අදහස තම ආදර්ශ පාඨය ලෙස ගත්හ.
- මෙවන් තත්ත්වයක් මත වැඩකිරීම පිළිබඳ ව නිවැරදි අවබෝධයක් ජනතාව තුළ ඇතිකිරීමත්, වැඩ කිරීමේ උතුම්කම අවබෝධ කරවීමත්, පැවිදිවරුන්ගේ ප්‍රධාන කාර්ය විය.
- ශුද්ධ වූ බෙනදික් තුමා පැවිදි අය වෙනුවෙන් සකස් කළ නීති මාලාවේ, පැවිද්දන් නිතරම කඩිසරව කටයුතු කළයුතු බවට නීති සඳහන් වේ. එමනිසා පැවිද්දෝ ඉතා වෙහෙස වී වැඩ කළහ. මෙලෙස පැවිද්දන් කටයුතු කිරීම, කය වෙහෙසා වැඩ කිරීමේ උතුම්කම ගෙනහැර පෑවේය. මේ අදහස බටහිර රටවල් පුරා ද, කය වෙහෙසා වැඩ කිරීමේ උතුම්කමත්, වැඩකිරීමේ ගුණාංගයත් ඇති කළේය. අදටත් බටහිර රටවල මිනිස් දිවියේ මේ ගුණාංගය ප්‍රමුඛ බව දැකිය හැක.

- ඒ අතරම, ගීතිකා ගායනය ද, නියමිත වේලාවල දී යාම යැදුම් කිරීම ද, පැවිද්දන්ගේ ප්‍රධාන කාර්යයන් විය. යාච්ඤාවත්, වැඩකිරීමත් පැවිදි ජීවිතයේ සමබරතාවයක් ඇති කළේය. ඔවුන්ගේ ක්‍රියාවන්වල කය වෙහෙසා වැඩකිරීමත්, බුද්ධිමය සේවයත්, ධර්මෝපදේශ සේවයත් ඇතුළත් විය.

- පැවිද්දන් කැළෑ එළිකර විශාල භූමිභාගයක් සාර්ථක ගොවිබිම් බවට පත්කළහ. මොවුන් යුරෝපයේ ගොවිතැන නංවාලූ බව ඉතිහාසඥයෝ කියති.

- පැවිද්දෝ සියලු රැකියා එක හා සමාන ව සැළකූහ. මොවුහු සතුන් ඇතිකිරීම, කිරි දෙවීම, මීමැස්සන් ඇතිකිරීම, ගොයම් කැපීම, සීසෑම, වී තැම්බීම හා වේලීම, කම්හල්වල වැඩ කිරීම, විවීම, මිදියුෂ සකස් කිරීම ආදී වැඩපළවල නිරත වූහ. ගොවිතැන් කටයුවල නිරත වූ මොවුහු තමන් වටා ජීවත් වූ ජනයාට ආදර්ශවත් වූහ. ජනතාව විසින්, උසස් යැයි ද, උගත් යැයි ද පිළිගත් පැවිද්දන් මෙලෙස කය වෙහෙසා වැඩ කිරීම ආදර්ශයක් විය.

- ශුද්ධ වූ බෙනදිකාන නිකායේ අය යුරෝපයේ ගොවිතැන් කටයුතුවල සාර්ථක නියැලුනු අතර, මිශ්‍ර භෝග වගාව ආදී නව වගා ක්‍රමයක් හඳුන්වා දුන්හ.

අධ්‍යාපනය

- පැවිදි ආරාමවල, පාසල්වල, ශුද්ධ බයිබලය, පැරණි ලතින් සාහිත්‍යයන්, සභාපියවරුන්ගේ කෘතීන්, විෂය නිර්දේශයක් ලෙස ගෙන උගන්වන ලදී.

- ශුද්ධ වූ බෙනදික් තුමා තම පැවිද්දන් මනා උගත් අය ලෙස සිටිය යුතු බවට කැමති විය.

- පැවිදිවීමට බලාපොරොත්තු වන අය, තරුණ වියේ දී, පැවිදි ආරාමවලට ඇතුළු වී එහි පාසල්වල ඉගෙනීම අනිවාර්ය විය.

- මෙම පාසල්වල භාවිත කළ පෙළපොත්, පිටපත් කිරීම පැවිද්දෝ පරිත්‍යාගශීලීව කළහ. මුද්‍රණ යන්ත්‍ර නොතිබුණු ඒ කාලයේ, පැවිද්දෝම අත්අකුරින් ලියූහ. තවද මේවා ලියන හම් ද, ඔවුහු පදම්කර ගත්හ. පිටපත් කිරීමේ කාර්යය ඉතා අවධානයෙන් කළයුතු විය. වැරදි නැතිව, ඇති කරුණු අත්නොහැර, අලුතින් යමක් එකතු නොකර, ඉතා අවධානයෙන් යුතු ව කළයුතු කාර්යයක් විය.

- කසියෝඩෝරස් යන ආරාම චින්තකයා පැවිද්දන් කුඹුරුවල වෙහෙස වී වැඩ කරනවාට වඩා පැරණි සාහිත්‍ය, පැරණි ශුද්ධ ලියවිලි, පිටපත් කිරීම වඩාත් සුදුසු කය වෙහෙසීමක් බව පැවිද්දන්ට ඒත්තු ගැන්වීය. මේ කරුණ පිළිගත් ශුද්ධ වූ බෙනදික්තුමා පැවිදි ආරාම, පාසල්, සියවස් ගණනාවක් පුරා තරඟකරුවන් නොමැති, දැනුම දෙන ආයතන ලෙස පිටපත් නිකුත් කරන ආයතන ලෙසත් පැවතුණි. පසුකාලයේ දී යුරෝපීය විශ්වවිද්‍යාල බිහිවීමටත්, පුස්තකාල සේවාවක් ඇතිවීමටත් ශුද්ධ වූ බෙනදිකාන නිකායේ පැවිද්දන් මගපෑදූහ.

ජර්මානු ජාතිකයන් නාගරීකරණය වීම

- රෝම අධිරාජ්‍ය පිරිහීමට, ජර්මානු ජාතික කණ්ඩායම් හෝ ගෝත්‍රික ආක්‍රමණිකයෝ එක් හේතුවක් වූහ. මේ ගෝත්‍රික ජනයා, සංක්‍රමණිකයන් ලෙසත්, නොදියුණු අය ලෙසත් ජීවත් වූහ.

- රෝම අධිරාජ්‍යය පිරිහීමත් සමඟ නායකත්වය භාරගෙන රෝම නගරය අත්පත් කරගත් රදගුරුවරු සහ පැවිදිවරු නාගරීකරණය නොවූ මේ ජනයා දියුණු කිරීමේත්, ගුණගරුක කිරීමේත් විශාල කාර්යභාරයක් දැරූහ.

- නාගරීකරණය නොවූ ජනයාගේ රජවරු, රදගුරුවරුන්ගේ දැනුම, ශුද්ධභාවය නිසා, කතෝලික රදගුරුවරුන් තම සාම දූතයන් ලෙසත්, උපදේශකයන් ලෙසත් පිළිගත්හ. මේ රදගුරුවරු පෙරදී උසස් පැවිද්දන් ලෙස සිටි බව සඳහන් ය.

- මේ ජනයාට නාගරීකරණ දිවිය කියාදී, ග්‍රීක, රෝම, නාගරීකරණයේ යහපත් දේ කියා දී, ඔවුන්ව කිතුනුවන් කිරීම රදගුරුවරුන්ගේ ප්‍රධාන කර්තව්‍යයක් විය.

- රදගුරුවරුන්ගේ මේ සේවාවේ පැවිද්දෝ ද පංගුකාරයෝ වූහ. මෙහිදී ශුද්ධ වූ බෙනදිකාන නිකායේ පැවිදිවරුන්ගේ සේවාව, ඉතිහාසඥයන්ගේ ප්‍රශංසාවට ලක් විය.

කය වෙහෙසා වැඩ කිරීම

- යුරෝපයේ නොදියුණු ජනතාව, වගා කටයුතුවලට යොමුකර දියුණුකරවීම, බෙනදිකානු පැවිදිවරුන්ගේ තවත් කාර්යයක් විය.

- සංචාරකයින් ලෙස ජීවත් වූ ජනයා නාගරීකරණය කර, පැවිදිවරුන්ගේ ආරාම සමීපයෙන් ඔවුන් පදිංචි කරවා, තම වගා කටයුතුවලට ඔවුන්ගේ සහාය ලබාගත්හ. සංචාරික ජීවිතයට වඩා ස්ථිර නිවාස තනා වගා කටයුතු කිරීම උසස් දිවියක් බව නාගරීකරණය නොවූ ජනයාට ඒත්තු ගැන්වූහ.

- කෘෂි කටයුතු හා සම්බන්ධ සියලු දේ ඉගැන්වූහ. මේසන් වැඩ, වඩු වැඩ ඇතුළු කුඩා හස්ත කර්මාන්ත, ලෝහ වැඩ ද ඉගැන්වූහ. නොදියුණු ජනයාට, පැවිදිවරුන්ගේ ආරාම කාර්මික විද්‍යාල බවට පත්විය.

- නාගරික නොවූ ජනයාට වැඩකිරීමේ උසස් බව ඒත්තු ගැන්වීම පැවිද්දන්ගේ විශේෂ විජයග්‍රහණයක් විය.

අධ්‍යාපනය

- නාගරීකරණය නොවූ ජනතාව දියුණු කිරීමටත්, කිතුනුවන් කිරීමටත් අධ්‍යාපනය ඉවහල් විය.

- මේ ජනතාවට අධ්‍යාපනය දී නාගරීකරණය කිරීමේ සේවාව පැවිදි සභා විසින් කරන ලදී. පැවිදිවරුන්ගේ ආරාම පාසල්වලින් අධ්‍යාපනය දෙන ලදී.

- නාගරීකරණය නොවූ යෞවනයන් හා පැවිද්දන්ට ලතින් ලිවීමටත්, කියවීමටත් ඉගැන්වූහ.

- පැවිද්දන් තම උත්සාහයෙන් ද, ඉවසීමෙන් ද, පරිත්‍යාගශීලීව ද, කඩිසරව ද, වැඩ නොකළහොත් මොවුන් නාගරීකරණය වීම ප්‍රශ්නාර්ථයක් විය හැකිව තිබුණි. තවද ග්‍රීක, රෝම ශිෂ්ටාචාරවල සමහර ප්‍රධාන අංග ද විනාශ විය හැකිව තිබුණි.

- පොදුවේ පැවිද්දන් මෙලෙස ජීවත් වීම, ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි තමන් තබා ඇති ආදරය, අන් අයට දක්වන්නක් විය.

- ශුද්ධ වූ බෙනදිකාන නිකායේ පැවිද්දන්, යුරෝපීය ශිෂ්ටාචාරය වෙනුවෙන් කළ සේවය, ලක්ෂණ තුනක් යටතේ ඉතිහාසඥයන් පෙන්වා දෙති.

I කුරුසිය - මේ පැවිද්දෝ, කිතුනු විශ්වාසය ද, ශුභාරංචියේ ප්‍රධාන ඉගැන්වීම් ද, ජනයාට දී ආධ්‍යාත්මික වශයෙන් මොවුන් ව ශක්තිමත් කළහ.

II ලේඛන - මේ ජනයාට ඉලක්කම් සහ අකුරු උගන්වා අධ්‍යාපනය දී, මොවුන්ගේ ජීවිත උසස් මට්ටමකට ගෙන ආහ.

III නගුල - සංචාරකයන් සේ තැනින් තැන ගිය මේ ජනයාව එක් තැනක නතරවී වාසය කිරීමටත්, භූමිය වගාකර, නාගරීකරණය වීමටත් මේ පැවිද්දෝ දායක වූහ.

**7.3.2 තපස් ගම්මාන හා දුගීබවේ ආදර්ශය**

**තාපස ජීවිතය යනු ,**

මේ ලෝකය තුළ මිනිස් සබඳතා හා බැඳීම්වලින් ඉවත් වී ලෞකික ජීවිතයෙන් මිදී දුගීනට සේවය කරමින් ආධ්‍යාත්මික ජීවිතය වර්ධනයට අවශ්‍ය භාවනාවේ හා යාච්ඤාවේ ජීවිත ගතකරමින් ක්‍රිස්තු අනුගාමිකත්වයට පුද්ගලික හෝ සංඝ ගත වීමයි.

**මුල් යුගය**

ශුද්ධ සභා ආරම්භයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් බොහෝ ක්‍රිස්තු භක්තිකයෝ ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව ජීවත් වීමට කැමැත්තෙන් සිටියහ. එමනිසා ශුද්ධවන්ත භාවය තුළ මුළුමනින් ම ජීවත්වීමට පොරොන්දු වී තම තමන්ගේ පවුල් තුළම විවාහ ජීවිතයෙන් ඉවත් වී ව්‍රත ශුද්ධිය තුළ ජීවත් වීම හා විවිධ මර්දන ක්‍රියාවල නිරතව ජීවත් වූහ.

- දිළිඳුකම යාච්ඤාව හා මර්ධන ක්‍රියාවේ නිරත වී අන් අයට සේවය කරමින් තම ජීවිත මුළුමනින්ම කැප කළහ.
- 3 ශතවර්ෂයේ දී ක්‍රිස්තියානි තපස් ජීවිතය වර්ධනය විය.
- පීඩන, වේදහේද, රූප වන්දනාව, ගෝත්‍රික ආක්‍රමණ පැවති සමයේ දී තම නිවසේ පවුල් තුළම ජීවත් වෙමින් ක්‍රිස්තියානි ශුද්ධවන්ත භාවයට විශ්වාසවන්ත වෙමින් ජීවත් වීමේ අපහසුව දැනගත් පිරිස තම පවුල, නිවස, ගම, නගරයෙන් පිටුවහල් වී ඊජිප්තු, සිරියාව යන රටවලට තිබූ කාන්තාරයට ගියහ.
- එහි දී ඔවුහු තම කුටි හෝ ගුහාවල තනි තනියෙන් ජීවත් වෙමින් දිළිඳුකම හා ව්‍රත ශුද්ධිය රැකගනිමින් ජීවත් වන්නට පොරොන්දු වූහ. ඔවුහු යාච්ඤාව, භාවනාව, ශුද්ධ වූ බයිබලය කියවීම, මර්දන ක්‍රියා සඳහා තම ජීවිතය කැප කළහ.
- ඔවුහු කාන්තාර පියවරු (Desert Fathers) ලෙසින් හැඳින්වූහ. ඔවුන් අතර තේබිස් හි පාවුල්තුමා , ඊජිප්තුවේ අන්තෝනි තුමා, මෙහිදී මූලික විය. ඔවුහු දිළිඳුකමේ ජීවිතය පිළිබඳ දෙවිඳුන් පිළිබඳ තිබූ රැකවරණය පිළිබඳ සාක්ෂි දැරූහ.
- මින්පසු පක්කෝමියුස්, බැසිල් යන තපස්වරුන් තපස් ජීවිතයට නීතිරීති සකසමින් මෙම ජීවිතය ක්‍රමානුකූලව ජීවත් වීමට මඟපෙන්වූහ.

- තේබ්ස් හි පාවුලුතුමා පළමු තපස්වරයා ලෙසත්, පක්කෝමියුස් පළමු තාපසාරාමයේ නිර්මාතෘවරයා ලෙසත් හඳුන්වයි.

- පෙරදිග ප්‍රදේශයේ ආරම්භ වූ තපස් ජීවිතය සාන්ත අතනාසියුස් තුමා මඟින් අපරදිග ප්‍රදේශවලටත් ව්‍යාප්ත විය.

- අපරදිග රටවල තපස් ජීවිතය ගතකළ අය අතර අගෝස්තීනු තුමා හා බෙනඩික් තුමා මූලික වේ. ඔවුන් දේපල සඳහා වහල් නොවී දිළිඳුකමේ වැදගත්කම තම තපස් ජීවිතය තුළ සාක්ෂි දැරී ය. දිළිඳුභාවය තුළ ජීවත්වීම, වැඩ කිරීම, තමන් සතු සියල්ල පොදුවේ බෙදාගැනීම අරමුණු කොට ජීවත් වූහ.

**යාචක නිකාය හා දිළින්දන්ගේ ව්‍යාපාර**

- දොළොස්වන හා දහතුන්වන සියවස්වල යුරෝපයේ ඇති වූ ආර්ථික හා සමාජීය වෙනස්වීම් නිසා ආත්මයන් ගැලවීම සඳහා වූ සභාවේ එඬේරික කාර්යය ක්‍රමවත් වීමේ අවශ්‍යතාව.

- කුරුස යුද්ධයන් හි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ වෙළහෙළඳාම්වල දියුණුව නිසා කුඩා නගර පවා දියුණුවීම.

- මෙම නගරවල පුරවැසියන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ජනතාව නැගී සිටීමට ඉදිරිපත් වීම.

- බොහෝ ඉඩකඩම් හා වතුපිටිවල හිමිකරුවන් වූ රදගුරුවරුන්ට පවා එරෙහිව තම අයිතීන් වෙනුවෙන් ජනතාව නැගී සිටීම.

- මෙම රදගුරුවරුන්ට සහාය දැක්වූ පූජකවරුන්ව ජනතාව ප්‍රතික්ෂේප කිරීම නිසා ඔවුන්ගේ ආත්මයන් ගැලවීමේ කාර්යය ඉතා අමාරු වීම.

- තාපසාරාම නගරවලින් පිටත පිහිටා තිබීම නිසා මෙම දේව කාර්යයන් සඳහා දායකවීමට ඉඩකඩ ඇහිරී යාම.

- සභාවේ අවශ්‍යතාව සුබ අස්න දේශනා කිරීම, ආත්මයන් යහමඟට යොමු කිරීම හා ජනතාවට සමීපවීම වැනි කාරණා වීම.

- පූජකවරුන් සැබෑ ලෙස සුබ අස්නට සාක්ෂි දරන අය මෙන් ජීවත්වීම සාමාන්‍ය ජනයාගේ බලාපොරොත්තුව වීම.

- මෙම ජනතාව එවකට පැවති වේද භේදීන්ගේ ආරක්ෂාකර ගැනීම හා නියම කතෝලික දහම ඉගැන්වීම සභාවේ මූලික කාර්යය වීම.

- මෙවැනි අවශ්‍යතාවන් නිසා දොමිනිකාන හා ෆ්‍රැන්සිස්කාන යාචක නිකාය බිහිවීම හා එමනිසා දහතුන්වන සියවසේ දී පමණ සභාවේ නවෝදයක් ඇතිවීම.

ඉහත සඳහන් කරුණුවලට අමතරව ඉතාලියේ බ්‍රේෂියාහි ආර්නෝල්ඩ් නැමැති පැවිදිවරයා ඉඩකඩම් අයිති තාපස, පූජක හා පැවිදිවරුන්ට දෙවියන් වහන්සේගේ ගැළවීම නොලැබෙන බව ප්‍රකාශ කරමින් දේශනා කිරීම මෙම යාචක නිකාය බිහිවීමට බලපෑ තවත් එක් කරුණකි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පළමුවෙන් ම ජෝන් වල්දේස් විසින් ලියොන්හි දිළින්දෝ යන නමින් නිකායක් පිහිටුවන ලදී. ඉන්පසු දහතුන් වන සියවස මුල්භාගය වන විට ඉතාලියේ හා ප්‍රංශයේ දිළිඳු ජනතාව අතර ඉතා සීඝ්‍ර ලෙස පැතිර යන්නට විය. මෙම නව ප්‍රවණතාවය එදා ශුද්ධ වූ සභාවට දැඩි අභියෝගයක්

විය. ඔවුන්ගේ මූලික කාර්යය වූයේ තම තමන්ගේ ආත්මය ගලවා ගැනීමට වඩා අන් අයගේ ආත්මය ගලවා ගැනීමට කැපවී සේවය කිරීමයි. නැතහොත් තමන් වෙනුවෙන් ජීවත් නොවී අන් අය වෙනුවෙන් සේවයට කැපවීම. (non sini soli vivere sed et aliis proficere/not to live for themselves only. but to serve others) ඔවුහු භාවනායෝගී ව හා ක්‍රියාකාරී ව ජීවත් වූහ. ඔවුන් මූලික වශයෙන් පොදු කිතුනු ජනයා අතර ධර්මදාන කටයුතුවල නියැලුණාහ. නගරබදව ජීවත් වූ බෙනදිකාන හා ශිෂ්ටර්ෂියන් තාපසවරුන්ට වඩා මෙම යාචක නිකායන් සාමාන්‍ය ජනතාව අතර ඉතා හොඳ පිළිගැනීමකට ලක් විය.

**යාචක නිකාය**

මේවා සෘජුවම අන් අයගේ උදව් උපකාර, අන් අයගෙන් ලැබෙන ආහාර පාන, ඇඳුම් පැළඳුම් හා ඉඳුම් හිටුම් මත යැපෙන පැවිදි නිකායන් ය. ඔවුනට ඉඩකඩම් අයිතියක් නැත. මිල මුදල් ළඟ තබාගැනීමට නොහැකි ය. ආගමික කටයුතුවල පමණක් නිතර දෙවේලේ නිරතවිය හැකි ලෙස නිදහසේ ජීවත්වන අරමුණින් ඔවුන් දිළිඳුකම නමැති වේද භාරය ගෙන ඇත. ඔවුහු සුබ අස්න දේශනා කරමින් හා දිළිඳු අයට සේවය කරමින් කල් ගත කළහ. යාචක නිකාය අතර ප්‍රැන්සිස්කාන නිකාය හා දොමිනිකාන නිකාය විශේෂ තැනක් ගනී. ඔවුහු දේශනා කළහ. පාපොච්චාරණය ඇසූහ. රෝගීන්ට ඇප උපස්ථාන කළහ. අසරණයන්ට සේවය කළහ. විදේශ රටවල පවා සේවයෙහි යෙදුණහ. මොවුහු තාපසවරුන් මෙන් පැවිදි හවුල තුළ ස්ථිරත්වය නැමැති වේද බාරය නොගනිති. (Votum Stanilatis) ඔවුහු එකම තාපසාරාමයකට පමණක් සීමා නොවෙති. ඔවුන්ගේ නායකයෝ ජීවිතාන්තය දක්වා එම තනතුරුවල නොසිටිති. ඒවා ඔවුන්ගේ ධර්ම සාකච්ඡා සභාවලට සීමා වේ. සියල්ල විකුණා දිළිඳුන්ට දෙන්න. (මතෙව් 19:21) තමකම නසා මා අනුගමනය කරන්න. (මතෙව් 16:24) ඔබ දූත සේවයට යනකළ කිසිවක් නොගෙනියන්න. (ලූක් 9:1-6) යන ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම්වලට ගරු කරමින් ඔවුහු තම ජීවිත අන් අය උදෙසා කැප කළහ. ඔවුහු අන් අයගෙන් ලැබෙන දානය හා උපස්ථානය තමන් කරන සේවයට ඔවුනට ලැබෙන වැටුපක් සේසැළකූහ. දෙදෙනා බැගින් ඔවුන් දානමාන ලබාගැනීමට ගියහ. මෙම තත්ත්වය තවමත් ඉතාලිය, ස්පාඤ්ඤය හා ජර්මනිය වැනි රටවල දැකිය හැකි වේ.

**9 වන හා 10 වන ශතවර්ෂ**

- 9 හා 10 ශතවර්ෂවල දී ශුද්ධ වූ සභාව මුහුණදුන් අභියෝග තාපසාරාම තුළ ද සිදුවිය.
- තාපසාරාමයේ නායකවරුන් (Abbot) රජවරුන්ට සේවය කරන ප්‍රභූවරුන් ලෙස වෙනස් විය. එම නිසා තාපසාරාමයේ පැවැති ක්‍රමානුකූල ජීවිතය දුර්වල විය. තපස්වරු ලෞකික හේතු මුල්කරගෙන ලෞකිකත්වයට යොමු වූහ. තාපසාරාම රජවරුන් යටතේ පාලනය විය.
- නමුත් තපස් ජීවිතයේ ආදර්ශය පවත්වාගෙන ගියහ.
- සමහර තපස්වරු තපස් ජීවිතයේ ආදර්ශ අනුව ජීවත් වෙමින් එයට නව ජීවයක් ලබා දුන්හ.
- ශු. බෙනදික් තුමා සැකසූ තාපසාරාමයේ නීතිරීති අනුව විශ්වාසවන්ත ව ජීවත් වීමට ක්ලූනි හා සිස්ර්ෂියන් යන තාපසාරාම මූලික විය. ආරම්භක සමයේ පැවති දිළිඳුකම, වැඩකිරීම, යාච්ඤාව, ශු. බයිබලය කියවීම, සේවාව සඳහා විශ්වාසවන්ත වී තපස් ජීවිතයේ වටිනාකම හා ශුද්ධවන්තභාවයට නව ජීවිතයක් ලබාදුන්හ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ආගමික නිකායන් විසින් කිතුනු ශිෂ්ටාචාරයක් ගොඩනැගීමට ලබාදුන් දායකත්වය අධ්‍යයනය කර වාර්තාවක් සැපයිය යුතුය.
- බෙනදිකාන ආදර්ශය, යාච්ඤාව හා වැඩකිරීම පිළිබඳ රචනාවක් ලියන්න.
- තාපස ගම්මාන හා දුගීබවේ ආදර්ශය පිළිබඳ සංකල්පය වෙනත් අයෙකුට පැහැදිළි කරන්න.

**නිපුණතාව 8.0** : **විශ්ව සමාජයේ ප්‍රගතිය උදෙසා සභාවේ සමාජ සංස්කෘතික දායකත්වය අධ්‍යයනය කරමින් කිතුනු වගකීම් ඉටු කරයි.**

**නිපුණතා මට්ටම 8.1** : සභාවේ අධ්‍යාපනික සේවාව විමසා බලා තම දැනුම වැඩි දියුණු කර ගනියි.

**කාලය** : කාලච්ඡේද 16

**ඉගෙනුම් ඵල** :

- අධ්‍යාපනය සඳහා සභාවේ කැපවීම පිළිබඳ අවබෝධයක් ලබා, ඒ පිළිබඳ ව කතා කරයි.
- විශ්ව විද්‍යාලයන්ගේ ආරම්භයට සභාව දැක්වූ සහයෝගය ලියයි.
- විද්‍යාව හා තාක්ෂණික දියුණුව කෙරෙහි සහය දැක්වූ කිතුනු විද්‍යාඥයින් මෙන් තමා ජීවත්වන සමාජය තුළ සමාජ සේවය කිරීමට ඉදිරිපත් වෙයි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 8.1.1 අධ්‍යාපනය සඳහා සභාවේ කැපවීම

රෝම අධිරාජ්‍යයේ පිරිහීමත් සමඟම යුරෝපයේ දැනුම පුපුරා යාමේ ප්‍රවණතාව ඉතා පහත් තත්ත්වයක පැවතුණි. ඉන්පසු ඇති වූ දේශපාලනික අරගල නිසාත්, යුධමය වාතාවරණය නිසාත්, සාමයක් නොමැති කාලයක් උදා විය. මෙම පසුබිම යටතේ දැනුම පිළිබඳ ව සොයා බැලීමක් නොමැති විය.

නමුත් කිතුනු පූජකවරු තමන්ට අවශ්‍ය දහම් දැනුම යම් මට්ටමකින් පෝෂණය කිරීමට උනන්දු වූහ. ඒවා කිතුනු ඉගැන්වීම්වලට පටහැනි නොවන ආකාරයට කරගෙන යාමට ඔවුහු වගබලා ගත්හ. අනෙකුත් ශිෂ්ටාචාරයන් හි මෙන් මෙහි ද පූජකවරුන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලුණු ආකාරය දැකගත හැකි විය. මෙම කාලයේ කිතුනු සංවිධාන හා පූජකවරුන්, ජර්මන් ජාතික ජනතාව ශිෂ්ට සම්පන්න කිරීමේ උත්සාහයේ ද, ඔවුනට රජයක් පිහිටුවන ආකාරය පිළිබඳව කියාදීමෙහි ද, නිවැරදි ව දහම ඉගැන්වීමේ කටයුතුවල ද නියැලුණහ.

පසු මධ්‍යතන යුගයේ එනම් 11 වන ශතවර්ෂයේ දී පැවති තත්ත්වය වෙනස් වීම හේතුවෙන් ප්‍රධාන සංවර්ධනයක් ඇති විය. ඒ අනුව අක්ෂර ඥානය, ප්‍රාථමික අධ්‍යාපනයේ පැතිරීම, විශ්ව විද්‍යාල බිහිවීම හා පැතිරීම, පුරාතන රෝම - ග්‍රීක දැනුමත්, ඉස්ලාමීය දැනුමත් යුරෝපය තුළට පැමිණීම සිදු විය. ඒ නිසා බටහිර පඬිවරුන්ගේ චින්තන තුළ වර්ධනයක් ඇතිවීම ප්‍රධාන කරුණකි. මධ්‍යතන යුගය තුළ උසස් මධ්‍යතන යුගය (High Middle Ages 1050 - 1300) ලෙස හඳුනාගත හැකි ආකාරයෙන් මෙම කාලයේ වෙනස්වීම සිදුවිය.

ක්‍රි.ව. 800 දී පමණ චාල්ස් මේනන් රජ කාලයේ, එතුමන්ගේ නියෝගය පරිදි සෑම දෙව්මැදුරක්ම, තාපසාරාමයක් ම අයත් ප්‍රදේශවල ප්‍රාථමික පාසල් ආරම්භ කළ යුතු විය. මේ අනුව බටහිර යුරෝපයේ විවිධ ප්‍රදේශවල පාසල් හා පුස්තකාල විවිධ තාපසාරාම ආශ්‍රිත ප්‍රදේශවල ස්ථාපනය කරන ලදී. නමුත් වෛකිං (Viking) වරුන්ගේ යුධමය කටයුතු, ප්‍රාථමික අධ්‍යාපනයේ ඇති වූ වර්ධනයට මහත් බලපෑමක් විය. ප්‍රාථමික අධ්‍යාපනය සමහර තාපසාරාම හා ආසන දෙව්මැදුරුද ආශ්‍රිතව වර්ධනය විය. ක්‍රි.ව.1050 දක්වා බටහිර යුරෝපයේ ප්‍රාථමික අධ්‍යාපනයේ තත්ත්වය හා පැතිරයාම ඉතා අවම තත්ත්වයක පැවතුණි.

නමුත් 11 වන සියවසේ ඇතිවූ ආගමික ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් වූයේ, තාපසාරාමවල වෙනත් පුද්ගලයින්ට (තාපසයින් නොවන) අධ්‍යාපනය ලබාදීමේ ක්‍රියාමාර්ගය අතහැර එය ආසන දෙව්මැදුරු ආශ්‍රිත පාසල්වලට පැවරීමයි. මෙම ආයතන පසුකාලීනව නිදහස් අධ්‍යාපනය (Liberal Arts) ලබා දෙන අධ්‍යාපනයේ ප්‍රධාන සන්ධිස්ථාන විය. ඒවා කැන්ටබරිය (Cantabury) චාර්ටස් (Chartes) පැරීසිය (Paris) යන ස්ථානවල පැවතුණි.

මෙලෙස දියුණු වෙමින් පැවති නගරවල වූ ආසන දෙව්මැදුරු ආශ්‍රිත පාසල් (Cathedral School) යුරෝපා අධ්‍යාපනයේ මූලස්ථාන විය. මෙය පාප්තුමන්ගේ රාජ්‍ය ක්‍රමය මගින් ද අනුග්‍රහය ලැබූ අතර දිළිඳුන්ට ද, ධනවතුන්ට ද නොමිලයේ මෙම අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව උදා විය. වෙනස් වෙමින් පැවති ආර්ථික, පරිපාලනමය අවශ්‍යතාවන්ට අනුව හොඳින් පුහුණුව ලද ලිපිකරුවන්, පරිපාලකයින් මෙම අධ්‍යාපන ක්‍රමය මගින් ලබා දේ යැයි පාප්තුමන් නිවැරදි ව තීරණය කළේය.

ආරම්භයේ ආසන දෙව්මැදුරු ආශ්‍රිත පාසල් පූජකවරුනට අවශ්‍ය මූලික පුහුණුව ලබාදීමේ අරමුණින් පිහිටුවන ලදී. ඒ අනුව ශුද්ධ වූ සභාවේ කටයුතු කරගෙන යා හැකි පරිදි වන පුහුණුවක් ලබා දෙන විෂයමාලාවක් මෙහි ක්‍රියාත්මක විය.

නමුත් ක්‍රි.ව. 1100 ට පසුව ආගමික ආයතනවල ද, ලෞකික රාජ්‍යවල ද ඇතිවූ සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස මෙහි ඉගැන්වූ විෂයමාලාවේ පුළුල් බවක් ඇති විය. ඉහත සංවර්ධනයට අනුව ප්‍රාර්ථනාවන්, යැදුම් ඇතුළත් ග්‍රන්ථ පමණක් කියවීමේ දැනුමට වඩා පුළුල් දැනුමක් සහිත පුහුණුව ලැබූ නිලධාරීන්ගේ අවශ්‍යතාව වැඩි විය.

රාජ්‍ය පාලනය ශක්තිමත් වීමට නීතිය ප්‍රධාන තැනක් ගත් හෙයින්, එය හොඳින් ඉගෙනීමට අවශ්‍ය පරිසරයක් උදා විය. මේ නිසා ප්‍රාථමික අධ්‍යාපනයේ තත්ත්වයේ ද සංවර්ධනයක් ඇති විය. ඒ සමඟ ලතින් භාෂාව, සාහිත්‍ය දැනුම, රෝම සාහිත්‍යධරයින්ගේ ග්‍රන්ථකියවීමේ උනන්දුව ආදිය ඇති විය

මෙම සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස, 12 වන ශතවර්ෂයේ නවෝදය යැයි මෙම කාලය නම් කරන ලදී.

බටහිර යුරෝපයේ ක්‍රි.ව. 1200 දක්වා ම නාගරික පාසල් පූජක පුහුණුව ලබා දෙන ආයතන ලෙසට පැවතුණි. පසුව බොහෝ ශිෂ්‍යයින් සමාජ තත්ත්වය හේතු කොටගෙන මෙම පාසල්වල අධ්‍යාපනය ලැබීමට පෙළඹුණාහ. විශේෂයෙන් ම ධනවත් පන්තියේ ළමෝ මෙම පාසල්වල ඉගෙනීමට පටන් ගත්හ. ඒ සමඟම වෙළඳ පන්තියට අයත් වූවෝ, රජයේ පුවත්පත්වලට ලිපි සපයන්නෝ, තම රැකියාවන්හි උසස්වීම් ලබන්නට අරමුණු කරගත් අය ද අධ්‍යාපනය ලැබීමට උනන්දුවක් දැක්වූහ.

කාලයාගේ ඇවෑමෙන් ආගමික බලපෑමෙන් ඈත්ව සම්පූර්ණ නිදහස සහිතව නව අවශ්‍යතාවයන්ට මුල් තැන දෙන ආකාරයේ පාසල් ආරම්භ විය. මෙම නව පාසල්වල ශිෂ්‍යයින් පමණක් නොව, ගුරුවරු, ආගමික අංශයන් යි කටයුතු නොකරන අය ද ඉගෙන ගත්හ. මෙහි ලතින් භාෂාවෙන් සිදු වූ ඉගැන්වීම් කටයුතු අවම වී ඒ ඒ ප්‍රාදේශීය භාෂාවන්ට අනුව ඉගැන්වීම් කටයුතු සිදු විය.

බටහිර යුරෝපා ඉතිහාසය තුළ ගිහි ජනතාවගේ අධ්‍යාපනයේ සංවර්ධනය තුළ ප්‍රධාන වූ කරුණු 2 ක් ඇත. පළමුවැන්න නම්, වසර 1000 ක් පමණ අධ්‍යාපනයේ ශුද්ධ වූ සභාව තමන් සතු කරගෙන තිබූ අධිකාරී බලය බිඳ වැටීමයි. මේ නිසා අධ්‍යාපනය හා ඒ නිසා ඇති වූ මානසිකත්වය වර්තමානයේ බොහෝ විට ලෞකික ගුණාංග ඇති ඒවා ලෙස වෙනස් කරන ලදී. ගිහි ජනතාව පූජකවරුන් පිළිබඳව වූ අදහස් විමර්ශනය කරන්නට පටන් ගත්හ.

මෙලෙස කිතුනු ආගමික පරිසරය තුළ බලපැවැත්වූ බටහිර ශිෂ්ටාචාරය දැන් නිදහස ලැබීය. එබැවින් නිදහස් චින්තනයක් සහිතව ගොඩනැගීමට අවකාශය ලැබුණි.

දෙවැන්න නම් ගිහි ජනතාව සඳහා වන පාසල් ඇතිවීමත්, ගිහි ජනතාවට අධ්‍යාපනය ලබාදුන් ශුද්ධ වූ සභාවේ පාසල්වල ක්‍රියාකාරීත්වයත්, ගිහි ජනතාවගේ අධ්‍යාපනය විශාල වශයෙන් වර්ධනය කිරීමට මඟ පෑදීමයි.

ක්‍රි.ව. 1340 වනවිට ෆ්ලෝරන්ස් නගරයේ ප්‍රජාව 40% කියවීමට දැන සිටීම තුළින්, එහි වර්ධනය යම්කිසි මට්ටමකින් වටහා ගත හැක.

ක්‍රි.ව. 1050 වනතුරු ම අධ්‍යාපනය සම්පූර්ණයෙන් ම පූජකවරුන් යටතේ පැවතුණි. මේ ප්‍රමාණය බටහිර යුරෝපා ජනගහනයෙන් 1%කටත් අඩු ප්‍රමාණයක් විය. මෙම පසුබිම තුළ යුරෝපයේ අධ්‍යාපනය තුළ ඇති වූ විශ්මිත පෙරළිය අනෙකුත් අංශවල සංවර්ධනයට ද මඟපෑදුණි.

### 8.1.2 විශ්ව විද්‍යාලයන්ගේ ආරම්භය

යුරෝපා ඉතිහාසයේ උසස් මධ්‍යතන යුගයේ ඇතිවූ අධ්‍යාපනයේ සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස යුරෝපා විශ්ව විද්‍යාල ඇති විය. ආරම්භයේ ආසන දෙව්මැදුරු ආශ්‍රිත පාසල්වලින් ලබාදිය නොහැකි උසස් අධ්‍යාපනය ලබාදෙන ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල දැකිය හැකි විය.

ඉංග්‍රීසියෙන් University යැයි අප භාවිත කරන වචනය ලතින් භාෂාවේ Universitas යන පදයෙන් බිඳී ආවකි. එහි අර්ථය වන්නේ Corporation නැතහොත් Guild යැයි පැවසෙන සංගමයක් නැතහොත් සමූහ ව්‍යාපාරයක් යන්නයි. බොහෝ මධ්‍යතන යුගයේ විශ්ව විද්‍යාල වෘත්තීය සංගමයන් හා බැඳුණු, ගුරුවරුනට ඉගැන්වීම් පුහුණුව ලබාදීම අරමුණු කොටගත් ඒවා ලෙස දැකිය හැකි විය. පොදුවේ මෙම ආයතන නිදහස් කලාව (A School of Liberal Arts) ආදිය උගන්වන පීඨයන් විශේෂයෙන් නීතිය, වෛද්‍ය විද්‍යාව, දේවධර්මය වැනි පීඨයන් සහිතව ගොඩනගන ලදී.

යුරෝපයේ ඉතා පැරණි අධ්‍යාපන ආයතනයක් ලෙස ඉස්ලාමීය රජ සමයේ ස්පාඤ්ඤයේ ටොලිඩො, හොර්ඩෝවා වැනි නගරවල ස්ථාපනය කරන ලද ආයතන විය.

ඉතාලියේ පැරණි විශ්ව විද්‍යාල 11 වන, 12 වන ශතවර්ෂවල නිර්මාණය විය. මේ අනුව වෛද්‍ය විද්‍යාවට මුල්තැන දුන් සලෙර්නො (Salerno) හා නීති අධ්‍යාපනයට මුල් තැන දුන් බොලොඤ්ඤ විශ්ව විද්‍යාල විශේෂ විය.

#### බොලොඤ්ඤ විශ්ව විද්‍යාලය

මෙය ඇත්ත වශයෙන් ම බටහිර ලෝකයේ ප්‍රථම විශ්ව විද්‍යාලය ලෙස පිළිගැනේ. විද්‍යාත්මක හා මානුෂීය චින්තනයන්ගෙන් හෙබි චින්තකයන් තුළ වූ යුරෝපා සංස්කෘතිය පිළිබඳ දර්ශනයට මෙහි ඉතිහාසය ඉතා වැදගත් වේ. මෙම බොලොඤ්ඤ විශ්ව විද්‍යාලය නමැති ආයතනය නිර්මාණය වීමට පටන් ගත්තේ 11 වන ශතවර්ෂයේ අග භාගයේදී ය. මෙය සිදුවූයේ ව්‍යාකරණ, බස හැසිරවීම හා තර්ක ශාස්ත්‍රය පිළිබඳ ශාස්ත්‍රපතීන් තමන්ව රෝමානු නීතිය උදෙසා කැප කිරීමට පටන් ගත් අවධියේ ය.

19 වන ශතවර්ෂයේ Giosue Caducci නමැත්තාගේ නායකත්වය යටතේ වූ ඉතිහාසඥයින් පිරිසක් මෙම විශ්ව විද්‍යාලයේ උපත 1088 වර්ෂයට පැවරූහ.

1364 දී දේවධර්මය ඉගැන්වීම ආයතනගත කරන ලදී. 15 වන ශතවර්ෂය වන විට ග්‍රීක හා හෙබ්‍රෙව් භාෂාව ඉගැන්වීම ද, 16 වන ශතවර්ෂයේ දී ස්වභාවික විජ්ජාව යන නමින් පර්යේෂණ විද්‍යාව ඉගැන්වීම ද ආරම්භ විණි.

දර්ශනවාදියකු වන Pietro Pompanazzi මෙම විශ්ව විද්‍යාලය තුළ ස්වභාවික නීතිය ඉගෙනීමට අනුබල දුන්නේය. එය දර්ශනයේ හා දේව ධාර්මික සම්ප්‍රදායේ පැවැත්මට පටහැනි විෂයයක් විය. මෙම විශ්ව විද්‍යාලයේ කීර්තිය ලොව පුරා පැතිරුණි.

18 වන ශතවර්ෂයේ ඇති වූ කාර්මික විප්ලවය සමඟ විද්‍යාත්මක හා තාක්ෂණික සංවර්ධනයට අදාළ විෂයයන් මෙම විශ්ව විද්‍යාලය විසින් හඳුන්වා දෙන ලදී.

තවද මෙම විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයෝ සංගමයක් ලෙස ක්‍රියා කළහ. රෝම සභා නීතිය, කිතුනු තාපසාරාම කටයුතු, සමාජමය ක්‍රියා ආදියෙහි පෙරමුණ ගෙන මෙම විශ්ව විද්‍යාලය තම කටයුතු කරන ලදී. දේව ධර්මය ඉගැන්වීම කෙරෙහි එතරම් උනන්දුවක් නොදැක්වීය.

**පැරිස් විශ්ව විද්‍යාලය**

අනෙකුත් විශ්ව විද්‍යාල මෙන් පැරිස් විශ්ව විද්‍යාලය ද ආරම්භයේ දී ආසන දෙව්මැඳුරු ආශ්‍රිත පාසලක් විය. මෙම මුල්ම පැරිස් විශ්ව විද්‍යාලය හඳුනා ගනු ලැබුවේ 12 වන ශතවර්ෂයේ මැද භාගයේදී ය.

මෙය නෝට්රේ ඩෑම් (Notre Dame) ආසන දෙව්මැඳුරට අයත් විවිධ පාසල් එක්කර සංවිධානය කරන ලද්දකි. පැරිසියේ රදගුරුතුමන් විසින් මෙය විශ්ව විද්‍යාලයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර, විවිධ ආයතන හා පීඨයන්ගෙන් එය සමන්විත විය.

13 වන ශතවර්ෂයේ දී මෙම විශ්ව විද්‍යාලය පීඨ 4කට බෙදා වෙන්කරන ලදී. ඒවා නම් දේවධර්ම පීඨය, වෛද්‍ය පීඨය, සභා නීති පීඨය හා කලා පීඨය ය. කලා පීඨය නැවත කොටස් දෙකකට බෙදා වෙන් කරන ලදී. එම බෙදීම කරන ලද්දේ ගුරුවරුන්ගේ හා ශිෂ්‍යයින්ගේ ජාතිකත්වය අනුව ය. දේව ධර්මය හා දාර්ශනික පර්යේෂණ ආදියෙහි 13 වන ශතවර්ෂය වනවිට ඉදිරියෙන් සිටියේ පැරිස් විශ්ව විද්‍යාලයයි. දේව ධර්මය හා දර්ශනය එකිනෙකට පරස්පර විරෝධී නොවන ආකාරයට කෙසේ සම්බන්ධ විය හැකි ද යන්න සොයා බැලීම මෙහි ප්‍රධාන කටයුත්ත විය. ක්‍රිස්තියානි දේවධර්මය, ග්‍රීක, ඉස්ලාම් දර්ශනය මෙහි ඉගැන්වූ හෙයින් ඒවායේ සබඳතා දර්ශන ලෝකය තුළ මහත් පෙරළියක් ඇති කළේය.

14 වන ශතවර්ෂය වනවිට මෙම විශ්ව විද්‍යාලයට අයත් පෞද්ගලික කොලේජි 40 ක් විය. මේවා ලෞකික හා ආධ්‍යාත්මික ඒවා විය.

මෙම කොලීජිවලින් සෝර්බෝන් (Sorbonne) කොලීජිය 1257 දී ප්‍රංශ ජාතික දේව ධර්මාචාර්ය වරයකු වන රොබට් ඩී. සෝර්බෝන් (Robert De Sorbonne) විසින් සොයාගන්නා ලදී. මෙය දේව ධාර්මික ඉගැන්වීම්වල මධ්‍යස්ථානය ලෙස ප්‍රසිද්ධ විය. මෙය සොයාගන්නා ලද්දේ අවශ්‍යතාවක් ඇති දේව ධර්මය හදාරණ සිසුන්ට නේවාසිකාගාරයක් ලෙස ය. මෙය අවශ්‍යතාවය ඇති දේව ධර්මය හදාරණ සිසුන්ගේ සංඝය (The Community of Needy, Theology Students) නම් විය.

13 වන ශතවර්ෂයේ අගභාගය වනවිට මෙය ලා සෝර්බෝන් (La Sorbonne) ලෙස ප්‍රසිද්ධ විය. ඊළඟ ශතවර්ෂ 3 තුළ එය යුරෝපයේ ආගමික ඉගැන්වීම් සඳහා පවතින ආයතනයක් ලෙස හඳුන්වා දෙන ලදී. විශේෂයෙන් විශ්වාසය (Dogma) සහ සභා නීතිය (Canon Law) යන ක්ෂේත්‍ර ඉගැන්වීමේ විශේෂ තැනක් හිමිකර ගන්නා ලදී.

සාහිත්‍ය පීඨය, නීති පීඨය, වෛද්‍ය පීඨය හා විද්‍යා පීඨය සමඟ පසුකාලීනව අවලංගු කරන ලද දේව ධර්ම පීඨය ආදිය සෝර්බෝන් හි ස්ථාපනය කරන ලදී. එහි පාලකයින් පත් කරනු ලැබුවේ පැරීසියේ ඇකඩමිය විසිනි. (සෝර්බෝනය වර්තමානයේ ප්‍රංශය විසින් වෙන් කරන ලද අධ්‍යාපනික දිස්ත්‍රික්ක 17 න් එකකි.)

**ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය**

ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය වර්ෂ 872 දී මහා ඇල්ෆ්‍රඩ් විසින් සොයාගන්නා ලදී. ඇල්ප්‍රඩ් මුණගැසුණු තාපසයින් හා කළ වැදගත් සාකච්ඡාවක ප්‍රතිඵලයක් වූයේ මෙම විශ්ව විද්‍යාලය ස්ථාපනය කිරීමයි. නමුත් මෙම විශ්ව විද්‍යාලය වර්ධනය වීමට පටන් ගත්තේ 12 වන ශතවර්ෂය වන විටය.

ප්‍රංශයේ විසූ සියලුම ශිෂ්‍යයින්ට නැවත පැමිණෙන ලෙස ඉංග්‍රීසි රජු කළ නියෝගයට අනුව ඔවුහු ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයට පැමිණියහ. Robert Grosseteste (1175 - 1253) 1214 වර්ෂයේ දී පළමුවන කුලපති ලෙස පත්වීම ලැබුවේය. එමෙන් ම 13 වන ශතවර්ෂය වනවිට පළමු කොලේජිය සොයාගන්නා ලදී. මෙම පළමු කොලේජිය (University College) සොයාගන්නා ලද්දේ 1249 ඩූර්හම් හි විලියම් විසිනි. (William of Durham)

1377 ජෝන් වයික්ලිෆ් (John Wyoliffe) සභා ඉගැන්වීම් විවේචනයට ලක්කළ හෙයින් ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයෙන් නෙරපනු ලැබීය.

Balliol කොලේජිය සොයාගනු ලැබුවේ 1264 ජෝන් ඩී බාලිඔල් (John de Baliol) විසිනි. ඔහු ඩූර්හම් හි රදගුරු තුමාව විවේචනයට ලක් කිරීමෙන් පසුව පශ්චාත්තාපික ක්‍රියාවක් ලෙස මෙම කොලේජිය සොයා ගත්තේය.

1427 ලින්කොලන් (Lincoln) කොලේජිය සොයාගන්නා ලද්දේ ලින්කොලන් හි රදගුරුතුමන් විසිනි. (Bishop of Lincoln) එය සොයාගන්නා ලද්දේ පිරිමි පාර්ශවයට පුහුණුව ලබාදීමට ය. 1630 දී යැදුම් කුටිය නිර්මාණය කරන ලදී. 1437 දී සියලු ආත්මයන්ගේ කොලේජිය (All Souls College) සොයාගන්නා ලද්දේ චර්චිල් හි අගරදගුරුතුමන් විසිනි. එය පස්වන හෙන්රි රජ හා අජින්කෝට් හි (Agincourt) හි දිවි පිදූ සියල්ලන්ට කැප කරන ලදී.

1448 මැග්ඩලින් (Magdalene) කොලේජිය වින්චෙස්ටර් හි රදගුරු විලියම් වායින්ෆ්ලෙට් (Waynflet) විසින් සොයාගන්නා ලදී. එහි සීනු කුඩු 1509 දී නිර්මාණය කරන ලදී.

මධ්‍යතන යුගයේ සිසුන් දේශනවලින් අධ්‍යාපනය ලැබූ අතර 1476 Caxton මුද්‍රණාලයක් එංගලන්තයට හඳුන්වා දුන් පසු මෙම තත්ත්වය වෙනස් විය.

කෝපස් ක්‍රිස්ටි (Corpus Christi) කොලේජිය 1516 දී සොයාගත් අතර 1525 ක්‍රයිස්ට් චර්ච් (Christ Church) කොලේජිය සොයාගනු ලැබුවේ කාදිනල් වොල්සේ (Cardinal Wolsey) තුමන් විසිනි. 1542 මෙම විද්‍යාලයේ යැදුම් කුටිය ඔක්ස්ෆර්ඩ් ආසන දෙව්මැදුර (Oxford Cathedral) විය.

1444 පස්වන හෙන්රි රජුගේ බාල සොහොයුරා වන ඩියුක් හම්ෆ්‍රේ (Duke Humfrey) ඔක්ස්ෆර්ඩ්හි පුස්තකාලයක් ස්ථාපනය කළේය. රෙප්‍රමාදු විප්ලවය කාලයේ දී එය කඩා එහි වූ ග්‍රන්ථ සියල්ල විකිණූහ. නමුත් 1598 දී සර් තෝමස් බෝඩ්ලි (Sir Thomas Bodley) එය නැවත ස්ථාපනය කළේය. නව පුස්තකාලය 1603 දී විවෘත කරන ලදී. බෝඩ්ලි ඉන්පසු පුස්තකාලය විස්තීර්ණ කිරීමට සිතීය. ඔහු 1613 දී මියගිය නමුත් ඔහු ආරම්භ කළ කටයුතු දිගටම කරගෙන ගිය අතර බෝඩ්ලියන් පුස්තකාලය නමින් 1624 දී සම්පූර්ණ කර විවෘත කරන ලදී.

**කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය**

කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයට, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ පැවති Town and Gawn අරගලය බලපාන ලදී. 1209 දී නගර වැසියන් හා විශ්ව විද්‍යාලය අතර පැවති අරගලයෙන් බේරුණු ශිෂ්‍යත්වලාභීහු හා ශාස්ත්‍රපතීහු කේම්බ්‍රිජ් වෙතට ආහ. 1226 දී සංවිධානය වූ මෙම ශිෂ්‍යත්වලාභීහු සාමාන්‍ය පාඨමාලා හදාරන්නට පටන් ගත් අතර, තමනට නායකත්වය ලබාදීම සඳහා කුලපතිවරයකු තෝරාගත්හ. විශ්ව විද්‍යාලය ගොඩනැගීමට තුන්වන හෙන්රි රජුගේ නොමඳ සහාය ලැබුණි. ප්‍රසිද්ධ ගුරුවරයකු යටතේ ඉගෙනුම ලබන සිසුන් පමණක් කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ රැඳී සිටිය හැකි බවට III වන හෙන්රි රජතුමා නිළ නියෝගයක් නිකුත් කළේය.

නර්තනය, ගණිතය, සංගීතය, තර්ක ශාස්ත්‍රය, ජ්‍යාමිතිය ඇතුළු විෂයයන් හා පාඨමාලා පැවැත්වුණු අතර, බොහෝ ගුරුවරු තාපස නිකායයන්ට අයත් අය වූහ.

බොහෝ පැවිදි ආශ්‍රම විසුරුවා හැරීමත් සමඟම ප්‍රසිද්ධ කොලේජ් බිහි විය. ඉමානුවෙල් කොලේජය දොමිනිකාන තාපසයින් පරිහරණය කළ ගොඩනැගිල්ල පවරා ගැනීමත් සමඟ ගොඩනැගුණු ගොඩනැගිල්ලකි. මෙම ආධ්‍යාත්මිකත්වයෙන් ලෞකික අංශයට බරවීම අවධාරණය කරන ලද්දේ 8 වන හෙන්රි රජ සහා නීතිය ඉගැන්වීම තහනම් කළ පසු ය. හෙන්රි රජතුමා ග්‍රීක් භාෂාව, හෙබ්‍රෙව් භාෂාව, සිවිල් නීතිය, දේවත්වය හා භෞතික විද්‍යාව යන විෂයයන් ඉගැන්වීමේ කාර්යයෙහි නියැලෙන මහාචාර්යවරයෙකු විය.

1534 රාජකීය ප්‍රඥප්තියක් මගින් ග්‍රන්ථ මුද්‍රණය සඳහා විශ්ව විද්‍යාලයට අවසර ලබාදෙන ලදී. නමුත් 17 වන සියවස තෙක් මෙම අවසරය නිසි ලෙස ප්‍රයෝජනයට නොගන්නා ලදී. 1690 වනවිට කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය බයිබල් මුද්‍රණයේ ඒකාධිකාරයක් පවත්වාගෙන ගිය අතර මුද්‍රණය කළ බයිබල් පිටපත් ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයට ද ලබා දුණි.

**සලමන්කා විශ්ව විද්‍යාලය**

සලමන්කා විශ්ව විද්‍යාලය ස්පාඤ්ඤයේ ඇති ඉපැරණිම විශ්ව විද්‍යාලයයි. මෙය ස්ථාපනය කරන ලද්දේ 1218 දී IX වන අල්පෝන්සු රජ විසිනි. මෙය 1254 දී IV වන ඇලෙක්සැන්ඩර් පාප්තුමන් විසින් ලෝකයේ ඇති ප්‍රධානතම විශ්ව විද්‍යාල 4න් එකක් බව ප්‍රකාශයට පත් කළේය. (ඔක්ස්ෆර්ඩ්, පැරිස් හා බොලොඤ්ඤ විශ්ව විද්‍යාල සමඟ)

1254 දී රජතුමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය මගින් විශ්ව විද්‍යාලයට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා දුන්නේය. ආරක්ෂක හටයින් පත්කර ගැනීම, පාලනය රදගුරුතුමා යටතේ පැවතීම, පීඨාධිපතීන් සහ කුලපතිවරුන් පත් කිරීම, විශ්ව විද්‍යාලය සාමාන්‍ය පාලනයෙන් නිදහස් කිරීම හා මහාචාර්යවරුන්ට වැටුප් තීරණය කිරීම ආදී අයිතිවාසිකම් ඒ අතර විය.

1830 වනතුරුම පීඨයේ නම පැවතුණේ කැතිඩ්‍රල් හි සිටි පාප්තුමා හා රජතුමාගේ නමිනි. 1584 දී ශිෂ්‍යයින් 6,778 ක් වූ අතර 1822 වනවිට එම ප්‍රමාණය 412 දක්වා පහත වැටුණි.

මධ්‍යතන හා නූතන යුගය තුළ විශ්ව විද්‍යාලය සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවේ රාජකීය හා පාප්තුමන්ගේ අවසරය මතය. මෙම ආදායම හා අනෙකුත් පරිත්‍යාගශීලීන්ගේ ආදායම සමඟ පීඨ 5 ක් නඩත්තු කළ හැකි විය. 1869 - 1904 කාලයේ වෛද්‍ය හා විද්‍යා පීඨ සඳහා රජය විසින් ප්‍රතිපාදන ලබා දෙන ලදී.

අද වනවිට මෙම විශ්ව විද්‍යාලයේ සිසුහු 30,000 ක් පමණ විවිධ පාඨමාලා 250 ක් පමණ හදාරති.

### 8.1.3 විද්‍යාව හා තාක්ෂණික දියුණුව උදෙසා කිතුණු විද්‍යාඥයින්ගේ දායකත්වය

**හැඳින්වීම**

නවීන ලෝකයේ විද්‍යාව හා තාක්ෂණික දියුණුව උදෙසා දායක වූවන්ගෙන් බහුතරය කිතුනුවන් ය. එම විද්‍යාඥයින්ගේ හැකියා සහ කුසලතා තුළින් දෙවියන් වහන්සේගේ හස්තය ක්‍රියාත්මක වී ඇත. කිතුනු සභාවෙන් ලෝකයට සුවිශේෂී වූ එම පුද්ගලයන්ගෙන් කිහිප දෙනෙකු පිළිබඳ ව සොයා බලා අධ්‍යයනය කරමු.

ටෙයියාර්ඩ් ඩෙ ෂාර්ඩෑන් පියතුමා (Pierre Teilhard de Chardin) 1881 - 1955

- පෘතුවිය මත වසන මිනිසාගේ පරිණාම ඉතිහාසය පිළිබඳ ව සම්පූර්ණ දර්ශනයක් ඉදිරිපත් කළ චින්තකයින් අතුරෙන්, ටෙයියාර්ඩ් ඩෙ ෂාර්ඩෑන් පියතුමා විශිෂ්ඨ තැනක් ගනී.
- අචේතනික (Inanimate) ද්‍රව්‍යයන්ගෙන් පටන්ගෙන ජීවයේ ඇතිවීම පසුකර නූතන මිනිසාගේ වර්ධනය පමණක් නොව ඉදිරි අනාගතය දක්වා යන්නා වූ මානව වර්ධනය පිළිබඳව වූ ප්‍රක්ෂේපනයක් (Projection) සහිත පුළුල් දර්ශනයක් එතුමා ලෝකයට දී ඇත.

ෂාර්ඩෑන් පියතුමා කවුද ?

- මෙතුමා ජේසු නිකායට අයත් පූජක තුමෙකු වූ ටෙයියාර්ඩ් ඩෙ ෂාර්ඩෑන් පියතුමා භූමිවිද්‍යා සහ පාෂාණීය ධාතු විද්‍යා පිළිබඳ විද්‍යාඥයෙකු වන අතර, දර්ශනවාදියෙකු, කිවිදෙකු ලෙස දක්ෂකම් සමූහයකින් යුත් පියතුමෙකි.
- ක්‍රි.ව. 1881 මැයි 01 දින උපන් මොහු නෝත්‍ර ඩාම් නැමැති ජේසු නිකායික ප්‍රාථමික පාසලේ අධ්‍යාපනය හදාරා 19 වැනි වියෙහි දී ජේසු නිකායට ඇතුළු විය.
- ක්‍රි.ව. 1911 දී පූජාත්වරය ලැබීමටත් පෙර සිටම මෙතුමා පාෂාණීධාතු විද්‍යාව සහ මානව විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා කාලය යොදවා ඇත.
- මිනිසාගේ මුල් කාලීන හැඩරුව සොයන ගවේෂකයෙකු වශයෙන් චීනය, අප්‍රිකාව වැනි රටවල කැනීම්වලට මෙතුමා සම්බන්ධ වී ඇත. ඉතාම වැදගත් මානව විද්‍යාත්මක සොයාගැනීම් අතරින් එකක් වූ සිනන්ත්‍රොපස් පෙකින්නෙන්සිස් (Sin anthropos Pekinnensis) හෙවත් පීකිං මානවයාගේ හිස්කබල සොයා ගැනීමේ දී මෙතුමා එයට සම්බන්ධ වී ඇත.

ෂාර්ඩෑන් පියතුමාගේ දර්ශනය

- කැණීම්වලින් සොයාගන්නා ලද ඇට කටු අධ්‍යයනය කිරීමෙන් පසු මිනිසා පහත් මට්ටමක සිට ඉහළ මට්ටමකට පරිණාමය වෙමින් සිටින්නෙකැයි යන ඩාවින්ගේ මතය ඔහු පිළිගත්තේය. නමුත් ඩාවින් මෙන් පරිණාමයක් ඇතැයි යන නිගමණයෙන් පමණක් නොනැවතී පරිණාමය සිදුවන්නේ කෙසේ ද ? ද්‍රව්‍යමය වස්තුවල පරිණාමයේ අරමුණ කුමක් විය යුතු ද ? එය කෙළවර වන්නේ කොතැනින් විය හැකි ද යන ප්‍රශ්න ද ඒ සමඟ ඔහු ඉස්මතු කෙරුවේ ය.
- තෙයියාඩ් දුටු පරිදි මිනිස් සංහතිය තුළ සිදුවෙමින් තිබෙන පරිණාමයට විශේෂ සැලැස්මක් ද විශේෂ අරමුණක් ද ඇති අතර, එම පරිණාමය පණගන්වනු ලබන්නේ මහා බලයකින් ය. ගුණධර්ම ක්ෂේත්‍රයට අයත් වූ එම මහා බලය නම් දයා ප්‍රේමයයි. (ආදර කේන්ද්‍රය යන බලයට මුළු විශ්වය තුළ ඇති සෑම බලයක් ම එක් කිරීමේ හැකියාවක් ඇත. මිනිසා මිනිසාට එක්

කිරීමක් ද මිනිසා විශ්වයට එක් කිරීමක් ද ඒ සෑම එක්වීමක් තුළින් ම දෙවියන් හෙවත් මහා ධර්ම සත්‍යයය හා එක් කරනු ලබන බව ඔහු විශ්වාස කළේය.

- මෙම පරිණාමයේ උච්ජතම අවස්ථාවක් ද ඔහු දුටුවේය. ග්‍රීක හෝඩියේ අවසාන අකුර උපයෝගී කර ගනිමින් ඔමේගා අදියර (Omega Point) සේ එය දැක්වීය. ඔමේගා අදියරේ දී මිනිසාට අත්වනු ඇත්තේ මිනිස් සංහතියේ වඩාත්ම පරිපූර්ණ තැනැත්තා සේ ගත යුතුවන ජේසු ක්‍රිස්තු තුමන්ගේ ස්වරූපයයි. මුළු මිනිස් සංහතියම පරිණාමය වෙමින් යන්නේ එම අදියර වෙතටයැයි ඔහු පැවසුවේය. දෙවියන් වහන්සේගෙන් ආරම්භ වූ විශ්වය (Cosmos) එය සමඟ මාංශගත වූ දෙව් මිනිස් ජේසුස් වහන්සේ තුළ සම්පූර්ණත්වයට පැමිණ නැවත පෙරළා උන්වහන්සේ වෙතටම පැමිණෙනු ඇත. විශ්වයේම අංශුවකට සමකළ හැකි තරමටම දෙවියන් වහන්සේ එය තුළට බැසීමෙන් උන්වහන්සේ එම ලෝකයේ ඒකත්වයට සහ පූර්ණත්වයට පමුණුවන බව ෂාර්ඩෑන්ගේ මතය වේ.
- ෂාර්ඩෑන්ගේ චින්තනය අතිශයින් වැදගත් වන්නේ ඔහු එකවිටම දැඩි ක්‍රිස්තු භක්තිකයෙකු ද අග්‍ර ගණයේ විද්‍යාඥයෙකු ද වීම නිසා ය. ආගම හා විද්‍යාව යන ක්ෂේත්‍ර දෙක එකිනෙකට පටහැනි යැයි ඔහු කිසිවිටෙක සැළකුවේ නැත. පැරණි ජීවීන්ගේ ඇටකටු පිළිබඳ පර්යේෂණ හැම විටම අවසන් වන්නේ සප්‍රාණික ජේසු ක්‍රිස්තු තුමන් ඒවා තුළින් දර්ශනය කිරීමට ලැබීමෙනැයි ඔහු නිතර පැවසුවේය.
- ෂාර්ඩෑන් පියතුමා 1938 හා 1940 අතර ලියූ මානව සංසිද්ධිය (Phenomenon of Man) මෙතුමා ලියා ඇත්තේ දෙවෙනි ලෝක සංග්‍රාමයේ මුල් අවස්ථාවේ පීකිං හි දී ය.
- ජාතික විද්‍යා පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක වශයෙන් පත් කරනු ලැබීම සහ සුප්‍රසිද්ධ ප්‍රංශ විද්‍යායතනයේ සාමාජිකත්වය එතුමා වෙත පිරිනැමීම එතුමා ලත් ගෞරව උපහාර අතුරෙන් දෙකක් වේ. මෙතුමා ඉදිරිපත් කළ දේව ධාර්මික මතයකට එවකට පැරීසියේ සහ රෝමයේ පිහිටි සභා ශ්‍රේෂ්ඨයන්ගෙන් විරෝධය එල්ල විය. 1955 අප්‍රේල් 30 වෙනි දින, පාස්කු ඉරුදින මෙතුමා ස්වර්ගස්ථ විය.

ඇලෙක්සැන්ඩර් ග්‍රෙහැම් බෙල් (1847 - 1922)

- ඇලෙක්සැන්ඩර් ග්‍රෙහැම් බෙල් ක්‍රි.ව. 1847 දී ස්කොට්ලන්තයේ එඩින්බරෝ නුවර කිතුනුවකු වශයෙන් මෙලොව එළිය දුටුවේය.
- මූලික අධ්‍යාපනයෙන් පසු එඩින්බරෝ විශ්ව විද්‍යාලය හා ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් උපාධි ලබා ගත් මොහු ක්‍රි.ව. 1876 මාර්තු 10 වෙනි දින දුරකථනය මගින් පළමුවෙනි පණිවුඩය ලබා දී දුරකථනය මේ ලෝකයට ලබා දී මහත් සේවයක් කළ විද්‍යාඥයෙකි. එපමණක් ද නොව මොහු ශ්‍රව්‍ය දෘශ්‍ය ආබාධිත ළමුන්ගේ තත්ත්වය සතුටුදායක කිරීමට මෙවලම් කිහිපයක් නිපදවන ලදී. එම ළමුන්ට ඉගැන්වීම සඳහා වෙනම ගුරුවරුන් පුහුණු කිරීමටත්, ඒ සඳහා විශේෂ පාඨමාලා සැකසීමටත් මොහු පුරෝගාමී විය. බොස්ටන් හි ශ්‍රව්‍ය ආබාධිත ළමුන් සඳහා වූ විද්‍යාලය ඔහු විසින් පිහිටුවන ලද්දකි.
- මහා මානව වාදියකු වූ ග්‍රෙහැම් බෙල් ඉතිහාසය වෙනස් කළ සම්මාන, ගරු නාම, ත්‍යාග හා පදක්කම් ලැබූ සුප්‍රකට මහාචාර්යවරයෙකු වූ අතර කිතුනුවකු වශයෙන් දිළිඳු, ආබාධිත, පීඩිත ජනතාව කෙරෙහි මහත් කරුණාවක් සහ ඔවුන්ගේ යහපත වෙනුවෙන් සෑම විටම නිර්ව්‍යාජ උත්සාහයක් ගත් ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙක් වූ බව කිව යුතුමය. ක්‍රි.ව. 1922 අගෝස්තු මස 2 වැනි දා ඔහු ස්වර්ගස්ථ විය.

අයිසෙක් නිව්ටන් (1643 - 1727)

- එංගලන්තයේ වුල්ස්තොප් නම් ග්‍රාමයේ උපන් අයිසෙක් නිව්ටන් භෞතික විද්‍යාඥයෙකි. ගණිතඥයෙකි. තාරකා විද්‍යාඥයෙකි. නූතන යුගයේ දාර්ශනිකයෙකි. දේව ධර්මාචාර් වරයෙකි. ලෝහ වර්ග පිළිබඳ හසල දැනීමක් තිබූ මොහු විද්‍යාඥයෙකු ලෙසින් ලෝ ප්‍රකට විය.

- ශු. බයිබලය සහ විද්‍යාව පිළිබඳ අධ්‍යයනයන්වලට මොහු කැමැත්තක් දක්වා ඇත. ඒ පිළිබඳ පොත් පත් රාශියක් මොහු ලියා ඇත.

- විද්‍යාවට පටහැනි නොවන දෙවි කෙනෙක් පිළිබඳ මොහු විශ්වාස කර ඇති අතර, ගුරුත්වාකර්ෂණය මොහු විසින් සොයාගෙන ඇත. එසේම චලිතය (Motion) පිළිබඳ නියමයන් තුනක් මොහු ඉදිරිපත් කර ඇත.

- වර්ණ හඳුනා ගැනීම, සූර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු අනාවරණය, පරාවර්තක දුරේක්ෂයක් තැනීම, මුහුදේ වඩදිය හා බාදිය හටගැනීම යන කරුණු රාශියක් මොහු අනාවරණය කරගෙන ලොවට ප්‍රකාශ කර ඇත.

- ක්‍රිස්තියානි ඇදහිල්ල තුළ එංගලන්ත සභා සාමාජිකයෙකු ලෙසින් ඉපදුණු මොහු වයස අවුරුදු 30 පමණ වනවිට විශ්වාසය පිළිබඳ ගැටලුවකට මුහුණ දුන්නේ ය. ශු. බයිබලය පිළිබඳ අධ්‍යයනය කිරීමට මොහු කැමැත්තක් දක්වා ඇත. දේව දර්ශනය තුළින් ලියැවී ඇති ශු. බයිබලයේ සැඟවුණු අරුත් සෙවීමට මොහු උත්සාහ කළේය.

- 1690 පසු මොහු බයිබලය පිළිබඳ කෙටි අර්ථකථන ලියා ඇත. ශු. බයිබලයේ සඳහන් දේ. විද්‍යාත්මක දත්ත මඟින් සෙවීමට උත්සාහ කර ඇත.

ඇල්බට් අයින්ස්ටයින් (1879 - 1955)

- ජර්මනියේ උල්ම් නගරයේ උපත ලැබූ අයින්ස්ටයින් ජුදා ජාතික කතෝලිකයෙකි.

- බාල වියේ අදක්ෂ ශිෂ්‍යයෙකු වුවත් අයින්ස්ටයින් ලොව පතල මහාචාර්යවරයෙක් බවට පත් වූයේ දෙවියන් වහන්සේ ඔහුට දී තිබූ අප්‍රතිහත ධෛර්යය නිසාය.

- සාපේක්ෂතා වාදය ඉදිරිපත් කිරීමත් සමඟම ඉතා ජනප්‍රිය වූ මොහු අහස, පොළොව, විශ්වය ගැන තවත් දේ සොයන්නට විය. විදුලිය, කාන්දම් බලය, ගුරුත්ව බලය යන මේවා එකම මූලයකින් බිහිවන බව කියා සිටියේ ය.

- ක්‍රි.ව. 1922 දී ඔහුට භෞතික විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගය ලැබුණේය. සෑම බලවේගයකටම ප්‍රතිවිරුද්ධ බලවේගයක් ඇති බව මොහු පැවසුවත් එය සොයා බැලීමට මිම්මක් සොයා ගැනීමට නොහැකිව තර්ක කර ඇත.

ඇලෙක්සැන්ඩර් ප්ලෙමිං (1881 - 1955)

- 1881 අගෝස්තු මස 6 වෙනිදා ස්කොට්ලන්තයේ අයේෂර්හි ලොජ්පීලඩ් නැමැති ගමේ දිළිඳු පවුලක උපන් ප්ලෙමිං කිතුනුවෙකි.
- ආර්ථික ප්‍රශ්නවලින් පෙළුණු මොහු බාල වියෙහි දී ම ලන්ඩන් නගරයට ගොස් ලිපිකරු තනතුරක් ලබාගෙන ඉතිරිකර ගත් මුදල්වලින් ලන්ඩනයේ ශාන්ත මරියා ආරෝග්‍ය ශාලාවට අනුබද්ධ වෛද්‍ය විද්‍යාලයට පිවිස, වයස අවුරුදු 28 දී ශල්‍ය වෛද්‍ය විශේෂඥයෙක් විය.
- පෙනිසිලින් ප්‍රතිජීවක ඖෂධය සොයා ගත් මොහුට 1945 දී ඒ සඳහා නොබෙල් ත්‍යාගය ද පිරිනමා ඇත.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ලෝකයේ පැවැත්මට කිතුනු විද්‍යාඥයන් දායක වී ඇති ආකාරය පිළිබඳ වචන 200 ක් පමණ රචනාවක් ලියන්න.
- අධ්‍යාපනය සඳහා සභාවේ කැපවීම පිළිබඳ ව විවේචනාත්මක කතිකාවතක යෙදෙන්න.

**මූලාශ්‍රය :**


1. www.salamanca-university.org
2. www.liv.ac. uk/history
3. uk.eucarta/msn.com
4. www.wug.unibo.it

**නිපුණතාව 8.0** : **විශ්ව සමාජයේ ප්‍රගතිය උදෙසා සභාවේ සමාජ සංස්කෘතික දායකත්වය අධ්‍යයනය කරමින් කිතුනු වගකීම් ඉටු කරයි.**

**නිපුණතා මට්ටම 8.2** : නව චින්තනයකට මඟ හෙළිකළ කිතුනු චින්තකයන් හඳුනා ගනියි.

**කාලය** : කාලච්ඡේද 08

**ඉගෙනුම් ඵල** :

- ශුද්ධ වූ අගෝස්තීනු මුනිතුමාගේ දේව ධාර්මික චින්තනය අවබෝධ කර ගැනීමට හැකියාව ලබා ගනියි.
- ශුද්ධ වූ අගෝස්තීනු මුනිතුමන් විසින් රචිත පාපොච්චාරණය නැමැති කෘතියේ සඳහන් වන ඔහුගේ ජීවිත කථාව අධ්‍යයනය කිරීමෙන් තම ජීවිතය පෝෂණය කිරීමට කටයුතු කරයි.
- 13 වන සියවසේ භාවිතයේ පැවති දැනුම තෝමස් ඇක්වයිනාස් තුමන් විසින් ක්‍රිස්තියානි සභාවේ සේවය සඳහා යොදාගත් ආකාරය පිළිබඳ ව අවබෝධයක් ලබාගනියි.
- ශුද්ධ වූ අගෝස්තීනු හා ශුද්ධ වූ තෝමස් ඇක්වයිනාස් චින්තනයන් අතර සමාන අසමානකම් හඳුනා ගැනීමට කටයුතු කරයි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 8.2.1 දාර්ශනවාදීහු

හිප්පෝ හී අගෝස්තීනු තුමා (St. Augustine of Hippo) (ක්‍රි.ව.354 - 430)

- කිතුණු සභා ඉතිහාසයේ විශිෂ්ඨතම ලතින් සභා පියා ය.
- පැට්‍රිෂියන් හා ශුද්ධ වූ මොනිකා තුමියට දාව ක්‍රි.ව. 354 නොවැම්බර් 13 දින උතුරු අප්‍රිකාවේ තගස්තේ (Tagaste) හි දී උපත ලැබීය.

ශුද්ධ වූ අගෝස්තීනු තුමාගේ ජීවිත අර්බුදය

- ශුද්ධ වූ අගෝස්තීනු තුමා ජීවත් වූයේ පැරණි රෝම අධිරාජ්‍යය පරිහාණිය කරා යමින් තිබූ යුගයක ය. එවකට ගොත්, විසිගොත්, හන් හා වැන්ඩල් නමැති දරුණු ආක්‍රමණිකයන් නිරන්තරයෙන් ප්‍රහාර එල්ල කළහ.
- ක්‍රි.ව. 410 අගෝස්තු 24 දින ඇලරික් නම් විසිගොත් ගෝත්‍ර නායකයා යටතේ සිදුකළ ආක්‍රමණික ප්‍රහාරයෙන් රෝම නගරය ම්ලේච්ඡයන් අතට පත් විය.
- ශුද්ධ වූ අගෝස්තීනුතුමා ජීවත් වූ යුගය රෝම අධිරාජ්‍යයේ ඉතා අඳුරු යුගයක් ලෙස සලකන අතර, ක්‍රි.ව. 430 දී එතුමා මියයන විට ඔහු ජීවත් වූ උතුරු අප්‍රිකාවේ හිප්පෝ නගරයත් ඉතා දරුණු වැන්ඩල් ගෝත්‍රිකයන්ට යටත් ව තිබූ බව ඉතිහාසයේ සඳහන් වේ.
- ඔහු තම ළදරු විය හා තාරුණ්‍යය පිළිබඳ ව ලියූ බොහෝ කරුණු කාරණා එතුමන් විසින් ම රචිත පාපොච්චාරණය (The Confessions) නමැති ග්‍රන්ථය අධ්‍යයනය කිරීමෙන් අපට දැනගත හැකිය.

- ශුද්ධ වූ අගෝස්තීනු තුමා තම උසස් අධ්‍යාපනය සඳහා රෝම අධිරාජ්‍යය තුළ අප්‍රිකාවේ එවකට පැවති අගනුවර වූ කාර්තේජ් නුවර විශ්ව විද්‍යාලයට ගියේය. එහිදී නීතිය හදාරණ කාලයේ එතුමා තර්ක ශාස්ත්‍රය, කථික ශාස්ත්‍රය හා දර්ශනයට වැඩි ඇල්මක් දැක්වූයේය.

- සිසාරෝගේ නෝර්ටෙන්සස් නමැති දාර්ශනික ග්‍රන්ථයේ ආභාෂයෙන් දර්ශනවාදයට ඇළුම් කළ මෙතුමා සිසාරෝගේ සිතුවිලිවලින් ප්ලොටීනස් කෙරෙහි ද පසුව ප්ලේටෝ කෙරෙහි ද ඇලුම් කරන්නට විය.

- එක්තරා අවස්ථාවක එකල බොහෝ කිතුනුවන් ඩැහැගත් මැනිකියන් වාදයට ද මෙතුමා ඇදී ගියේය.

*මැනිකියන් වාදය නිපුණතා මට්ටම් 1.1 හි සඳහන් වේ. එය අධ්‍යයනය කරන්න.*

- මුල් කාලයේ දී අගෝස්තීනුතුමා ද මැනිකියන් වාදයට එකඟ වූ අතර පසු කාලයේ දී තමා සොයාගිය සත්‍යය එහි නොතිබුණු නිසාත්, සමහර ප්‍රශ්නවලට සෙවූ පිළිතුරු හමු නොවූ නිසාත් පසුව මැනිකියන් වාදය ප්‍රතික්ෂේප කළේය. මෙම සියලුම ක්‍රියාදාමයන්ගේ අවසානයේ ලෞකික සියල්ල ගැන කළකිරී මෙවැනි නිගමනයකට පිවිසියේ ය. "දෙවියනි, ඔබ වහන්සේ අප මැව්වේ ඔබ වහන්සේ සඳහා ය. එබැවින් ඔබ වහන්සේ තුළ සැතපෙන තුරු අපට සැබෑ සහනයක් නොවන්නේම ය."

- ක්‍රි.ව. 376 දී උපාධිය හිමිකර ගත් මෙතුමාට කාර්තේජ් උසස් අධ්‍යාපන ශාස්ත්‍ර ශාලාවේම ආචාර්ය තනතුරක් ද හිමි විය.

- පසුව තමාගේම ශාස්ත්‍ර ශාලාවක් ආරම්භ කිරීමේ අරමුණ ඇතිව ක්‍රි.ව. 383 දී රෝමයට ගියේය. එම උත්සාහය අසාර්ථක වුව ද ඉන් පසුව තවත් වසරකට පසුව රෝමයේ පිළිගත් පුද්ගලයකුගේ අනුමැතිය ඇතිව ඉතාලියේ මිලාන් නුවර කථික ශාස්ත්‍ර හා තර්ක ශාස්ත්‍ර ඉගැන්වීමට අවස්ථාවක් ලබා ගත්තේය.

- මිලානයේ දී අම්බ්‍රෝස් නමැති විශාරද රදගුරුතුමාගේ දේශනයට සවන්දුන් අගෝස්තීනුතුමා තම ජීවිතයේ පරිවර්තනයකට අඩිතාලම දැම්මේය. ක්‍රි.ව. 387 පාස්කු ඉරුදින අම්බ්‍රෝස් රදගුරුතුමා අතින් ප්‍රසාද ස්නාපනය ලබාගත්තේ ය. ක්‍රි.ව. 391 දී පූජකවරයද ක්‍රි.ව. 395 දී හිප්පෝ හි රදගුරු පදවිය ද ලැබූ ශුද්ධ වූ අගෝස්තීනු තුමා ලෞකික හා ආත්මික වශයෙන් ජයග්‍රහණය හිමිකර ගත්තේ ය.

- පවට නැමුණු සිත, අයහපත් පරිසරය, කාමයට ලොල් වූ ජීවිත පැවැත්ම, උගත්කම හා තීක්ෂණ බුද්ධිය, නොසන්සිඳුණු බුද්ධිමය විමසීම හා දේව අනුග්‍රහය අතර ඇතිවුණු ගැටුම්කාරී තත්ත්වය යන විවිධාකාරී ජීවිත අරගල බොහෝමයක් අවසානයේ දී දෙවියන් වහන්සේගේ වරමින් ජය ගන්නට ඔහුට හැකි විය.

- තවද මෙතුමා ඩොනාටියානු වාදයට ද විරුද්ධව තම අදහස් ප්‍රකාශ කළේය.

- පසුව පෙලාජියානුවාදයට ද විරුද්ධව තම අදහස් ප්‍රකාශ කළේය. (ඉහත වාදයන් 2 ද නිපුණතා මට්ටම් 1.1 හි සඳහන් වේ.)

- කිතුනු සභාව තුළ ඉතා ප්‍රබල හා පැරණි පැවිදි නිකායක් ලෙස අගෝස්තීනු තුමන්ගේ මඟ පෙන්වීම හා එතුමන් විසින්ම සම්පාදනය කළ ව්‍යවස්ථා හා විනයමාලාවන් අනුව ආරම්භ වූ අගෝස්තීනු නිකාය ඉතිහාසයේ සඳහන් වේ.

- අගෝස්තීනු තුමා විසින් රචිත පොත් ගණන 113 ක් ද, දේශන ගණන 500 ක් ද, ලිපි ගණන 218 ක් ද වේ. ඔහු විසින් රචිත පොත් අතර දේව පටුන නැතහොත් දේව නගරය (The City of God) නමැති කෘතිය සම්භාව්‍ය සාහිත්‍යයෙහි ඇති ඉතා ශ්‍රේෂ්ට කෘතියක් ලෙස සැලකේ. තමාව දැන හැඳින ගැනීමට හා දෙවියන් වහන්සේව දැන හැඳින ගැනීමට වරම් පැතූ ඔහුට ලෝකය ගැන ද දැනගැනීමට වරම් ලැබුණු බව මෙම කෘතිය මගින් පැහැදිළි වේ. දේව නගරය කෘතිය කාණ්ඩ 22 කින් සමන්විත ඉතා විශාල ග්‍රන්ථයකි.

එහි අඩංගු ඓතිහාසික තොරතුරු අතර ක්‍රි.ව.410 අගෝස්තු මස 24 වැනි දින ගොත් ගෝත්‍රික නායකයා වූ ඇලරික්ගේ නායකත්වය යටතේ අවුරුදු දහස් ගණනක් පුරා ලෝකයේ මුදුන් මල්කඩ ලෙස සැළකූ රෝම පුරවරය තෙදිනකින් නඩඹුන් නරගයක් බවට පත් වූ ආකාරය ද විස්තර වේ. රෝම නගරය මෙවැනි අන්ත පරාජයකට පත්වීමට හේතුව බොහෝ දෙනාට තේරුම් ගන්නට බැරි වූහ. බොහෝ දෙනා රෝම පරාජයට හේතු සොයන්නට වූහ. බහුදේවවාදය හා පැරණි රෝග ආගම් අතහැරීමත්, නව ආගමක් වූ ඒකදේවවාදී කිතු දහම වැළඳ ගැනීම රෝම නගරයේ පරාජයට හේතු වූ බව බොහෝ රෝමානුවන්ගේ මතය විය. රෝම දෙවි දේවතාවන්ට වැඳුම් පිදුම් කිරීමට කිතුනුවන් ප්‍රතික්ෂේප කිරීමත්, ක්‍රි.ව. 313 දී කොන්ස්තන්තීනු අධිරාජයා යටතේ ඉදිරිපත් වූ මිලාන් ආඥාවෙන් පසුව කිතුනු ආගම රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය අගම බවට පත්වීමත් නිසා රෝම දෙවි දේවතාවුන් කොපයට පත්වීමේ හේතුවෙන් මෙම පරාජය අත්විඳීමට සිදුවූ බව තවත් බොහෝ රෝමානුවන්ගේ මතයක් විය. කිතුනු දහම රෝම ජනතාව තිබූ ජාතික මමත්වය හීනකළ බවත්, කිතුනු දහම තුළ සතුරන්ට ද ප්‍රේම කරව යන න්‍යායන් නිසා ජාතික සතුරන් පරාජය කිරීම හෝ විනාශ කිරීමට වීර රෝම සොල්දාදුවන්ගේ බලය හීන වූ බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස රෝම නගරය පරාජයට පත් වූ බවටත් රෝම කිතුනුවන් චෝදනා නැගූහ.

ශුද්ධ වූ අගුස්තීනු තුමාගේ ජීවිත කතාව හැදෑරීමට ඇති උසස්ම මාධ්‍යය යන්නේ එතුමන් විසින් ම රචිත දෙවියන් වහන්සේ හා ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ කරුණු දැන ගැනීමට උසස් ග්‍රන්ථයක් ද එතුමන් අපට දායාක කළේය. එනම් De Trinitate නැතහොත් දේව ත්‍රිත්වය නැමැති ග්‍රන්ථයයි. මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමට අවුරුදු පහළොවක්, දහසයක් පමණ කාලයක් වැය කර ඇත. (ක්‍රි.ව.400-426) අගුස්තීනු තුමාගේ මිතුරෙකු වූ කාර්තේජ් හි අගරදගුරු තුමන්ට යැවූ ලිපියේ ඩේ ට්‍රිනිටාඩේ නැමැති ග්‍රන්ථ සම්පාදනය වූ කාලය පිළිබඳ ව මෙසේ සඳහන් වේ. තරුණ වියේ දී මා විසින් ආරම්භ කළ මෙම ග්‍රන්ථය අවසන් කළේ මා වයෝවෘධ වූ විට ය. (ලිපිය 174)

සභාවේ මුල් සියවස් කීපය තුළ ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ ඉතා දැඩි වාද භේද ඇති විය. මෙම වාද භේදයන් කරණ කොටගෙන ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ කිතුනු ඉගැන්වීම අවබෝධ කර දීමට හා පැන නැගුණු ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට ජගත් මන්ත්‍රණ සභා පැවැත් වුණි. ශුද්ධ වූ අගුස්තීනු තුමා ද තම ග්‍රන්ථය තුළ මෙතෙක් ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ ව උද්ගත වූ වේද භේදයන් හා මත භේදයන්ට තුඩු දුන් දාර්ශනික වචන තවදුරටත් පැහැදිළි කර, ඒවා නිර්වචනය කර ඒවාහි ඉතා සියුම් අර්ථ නිරූපණයක් ද ඉදිරිපත් කරයි. මූල ජීවසාරය, භවත්වය, පෞරුෂත්වය, ප්‍රජනනය, ජනිතවීම හා ස්වභාවය වැනි දාර්ශනික වචනවල සැඟවී ඇති ගැඹුරු අර්ථයන් මෙතුමා පැහැදිළි කර දුන්නේය. ග්‍රීක සභා පියවරුන් වන ඇතනේසියස්, බැසිල් හා නසියන්සස්හී ග්‍රෙගරි යන අය ද ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ ග්‍රීක භාෂාවෙන් ලියූ කෘතීන්ගේ ලතින් පරිවර්තනයන් අගුස්තීනු තුමා කියවිනට ද ඇතැයි විශ්වාස කෙරේ.

කාණ්ඩ පහළොවකින් යුක්ත ත්‍රිත්වය නැමැති මෙම ග්‍රන්ථය ශුද්ධ වූ ත්‍රිත්වයේ ස්වභාවය ද, ක්‍රියාකාරීත්වය ද, සම්බන්ධතා ගැන ද විස්තර කරයි. පළමු කාණ්ඩයෙන් දෙවියන් වහන්සේගේ ඒකත්වය හා තුන්දෙනා වහන්සේලාගේ සමතාවය ගැන ශුද්ධ වූ ලියවිලි පාඨ මගින් සනාථ කරයි. ඊළඟ කාණ්ඩ තුන ද එම විෂය ගැන ම නමුත් වෙනත් දෘෂ්ටි කෝණයකින් තවදුරටත් සවිස්තරව පැහැදිළි කරයි. ඉතිරි කාණ්ඩවල දාර්ශනිකව, දේවධර්මානුකූලව හා මනෝවිද්‍යාත්මකව ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ සත්‍යතාවයන් වඩා පැහැදිළි කරයි. මනෝ විද්‍යාත්මකව කතා කිරීමේ දී ත්‍රිත්වය හා තමා අතර ඇති අන්තර්දාර්ශික සම්බන්ධකම් ද, ත්‍රිත්වය හා මානව සමාජය අතර ඇති සමානකම් ද ගෙනහැර පාන අගුස්තීනු තුමා කියවන්නා මෙනෙහි කිරීමකට යොමු කරයි.

දේව ධර්ම චින්තනයට දායකත්වය

බටහිර දේවධර්මය හා භක්තිය පිළිබඳ ව බොහෝ දේ මෙතුමා පවසා තිබේ. නැගෙනහිර සභාවෙන් ප්‍රතික්ෂේපකරණයට (Repudiated) ලක් වූ ලතින් සභා පීතෘවරයෙක් විය. ක්‍රිස්තියානි විශ්වාසය නව ප්ලැතෝනික වාදය (Neo Platonic) සමඟ මෙන් ම දෙවියන් පිළිබඳ ව වන බයිබලීය අවබෝධය නව ප්ලැතෝනික වාදය සමගි කිරීමට දැරූ උත්සාහය අගෝස්තීනු තුමා විසින් ලබාදුන් ඉමහත් දායකත්වය ලෙස සැලකිය හැකිය. ඔහු දේව ධර්මය අවබෝධ කරගත්තේ ක්‍රිස්තියානි විශ්වාසය පිළිබඳ ව වන ක්‍රමානුකූල අන්තරාවලෝකනයක් (Reflection) ලෙස ය. එහිදී විශ්වාසය හා බුද්ධිය (Faith and Reason) අතර කිසිදු පරස්පර විරෝධීබවක් තිබිය නොහැකිය. එවිට දේවධර්මය, චින්තනමය දේශනයක් හෝ දෙවිඳුන් පිළිබඳ ව වන කතාවකි.

**දේවධර්ම ශාස්ත්‍රඥයෝ**

ශුද්ධවූ තෝමස් ඇක්වයිනාස්

- ශු. සභා ඉතිහාසයේ මධ්‍යතන යුගය කිතුනු චින්තකයන්ට ආවේණික වූ දේව ධාර්මික චින්තන පහළ වූ යුගයකි. මෙම දේවධාර්මික චින්තනය ස්කොලැස්ටිසිසම් වේ. (Schlasticism)
- එම ක්‍රමවේදය තුළින් විවිධ වූ දේව ධාර්මික අදහස් මිනිස් මනස උපයෝගී කර ගනිමින් වඩා පැහැදිළි ව ප්‍රකාශ කිරීමක් දක්නට ලැබේ.
- ස්කෝලා ලතින් වචනයේ අර්ථය School පාසලයි.
- ස්කෝලා හා ආසන දෙව් මැඳුරු ආශ්‍රිත පාසල් විශ්ව විද්‍යාලවල දේව ධර්මය ඉගැන්වීම මෙම ක්‍රමවේදයට අනුකූලව සිදු වූ අතර, එම ක්‍රමවේදය ස්කොලැස්ටිසිසම් ලෙස හැඳින්වේ.
- ස්කොලස්ටික් ක්‍රමවේදය ප්‍රධාන කොටස් 3කට වෙන් කළ හැක.
    1. ප්‍රශ්න ඉදිරිපත් කිරීම.
    2. ඊට එකඟ හා එකඟ නොවන තර්ක ඉදිරිපත් කිරීම.
    3. එම ප්‍රශ්නයට මිනිස් මනස විසින් පිළිගන්නා අන්දමේ විසඳුමක් කරා ළඟාවීම.
- ස්කොලස්ටිසිසම් ක්‍රමවේදය දේව අනාවරණය, ශු. සභාව සතු ඉගැන්වීමේ ගුරු බලය යන කරුණු දෙක මත මුළුමනින් ම රඳා පවතී.
- මිනිස් චින්තනය හා ඇරිස්ටෝටල් දර්ශනය යන කරුණු දෙක රඳා පවතින්නේ දෙවියන් වහන්සේ පිළිබඳ කිතුනු දර්ශනය නිර්මාණය කිරීම සම්බන්ධයෙන් කරුණු ගෙනහැර දැක්වීමට ය.
- මධ්‍යතන යුගයේ දේවධර්ම විශාරදයින් අතරින් කැන්ටබරි ඇන්සලම්, තෝමස් ඇක්වයිනාස්, බොනවෙන්චර් යන අය විශේෂිත වූහ.

තෝමස් ඇක්වයිනාස් තුමාගේ කැඳවීම

- වර්ෂ 1224/1225 කාලයේ දී ඉතාලියේ මොන්ටෙකැසිනෝ නගරයේ ආසන්නයේ තෙරසෙකා ග්‍රාමයේ ඉපැදුණේය. දෙමව්පියෝ උසස් සමාජ මට්ටමක සිටියෝය.

- වයස අවුරුදු 5 දී මොන්ටෙ කැසිනෝ බෙනදිකාන තාපසාරාමයට දෙමව්පියන් විසින් මෙතුමා ඇතුළත් කරන ලදී. දෙමව්පියන්ගේ මුල්ම ආකල්පය වූයේ තාපස ජීවිතය පිළිබඳ අධ්‍යයනය කරමින් එහි ශ්‍රේෂ්ඨතම නිලය හිමිකර දීමය.

- බෙනදිකාන තාපසාරාමයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබාගත් හෙතෙම නේපල්ස් විශ්ව විද්‍යාලයට ඇතුළු වී ඇරිස්ටෝටල්ගේ දර්ශනය ගැන වැඩිදුර අධ්‍යයනය කිරීමෙන් පසුව දොමිනිකාන තාපස නිකායේ ජීවිත රටාවට ආකර්ශනය විය.

- දොමිනිකාන තාපස නිකායේ ජීවිතයේ ප්‍රධාන ලක්ෂණ 3 :
    1. අධ්‍යාපනය
    2. දිළිඳුකම
    3. තනතුරට වඩා සේවාව උසස් වීම

- තෝමස් තුමාට ඉහත මූලික ලක්ෂණ පිළිබඳ පැහැදීමක් ඇති වූ අතර ඔහුගේ දෙමාපියන් මේ බව දැනගෙන ඔහුව නිවසෙහි වසරක කාලයක් සිර අඩස්සි කර තැබීය. එමගින් තෝමස් තුමාගේ සිතුවිලිවල වෙනසක් ඇති කිරීම දෙමාපියන්ගේ අරමුණ විය. එහෙත් තෝමස් තුමාගේ ස්ථාවරත්වය දැනගැනීමෙන් අනතුරුව ඔහුට දොමිනිකාන නිකායට ඇතුළුවීමට අවසර ලැබිණ.

- ඔහු 1274 ලියොන් හි මන්ත්‍රණ සභාවට සහභාගී වීමට යන අතරමඟ දී ස්වර්ගස්ථ විය.

අධ්‍යාපන සේවාව

- පැරීසියේ දොමිනිකාන නිකායට ඇතුළත් වූ මෙතුමා මහා ඇල්බට් තුමාගේ මඟ පෙන්වීම යටතේ අධ්‍යාපනය ලබා පූජකවරය ලැබීය.

- ඔහුගේ බුද්ධි මහිමය හා දාර්ශනික සංකල්ප දැනගත් ඇල්බට් තුමා පැරිස් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය පදවියක් පිරිනැමුවේය. එලෙසම හෙතෙම රෝමයේ නේපල්ස් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය ලෙස සේවය කළේය.

තෝමස් ඇක්වයිනාස් තුමාගේ දායකත්වය

1. ජනවන්දනාත්මක දායකත්වය

- වර්ෂ 1261 - 1264 දක්වා රෝමයේ 6 වන උර්බාන් ශුද්ධෝත්තම පියතුමාගේ උපදේශකයකු ලෙස සේවය කිරීම.

- මේ කාලය තුළ දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍ය දිනට නියමිත දිව්‍ය පූජාව සහ යාම යාඥාව ඔහු විසින් සකස් කරන ලදී. ඒ සමඟ ම පහත සඳහන් සත් ප්‍රසාද ගීතිකා නිර්මාණය කරන ලදී.

    *ලව් ඕග් සියොන්, පාඞ්ගේ්ලිංගුවා, වෙර්බුම් සුපෙර්නුම්, සක්‍රිස් සෝනිලාම් නේස්, අරොරෝතේ*

2. රසායන විද්‍යාව
   වර්ෂ 1269 සිට 1272 දක්වා කාලය තුළ පැරිස් විශ්ව විද්‍යාලයේ සේවය කරමින් මහා ඇල්බට් සමඟ පොත් ලියා ප්‍රකාශය පත් කිරීම.

3. දේව ධාර්මික දායකත්වය
   නේපල්ස් විශ්ව විද්‍යාලයයේ සේවය කරනලද කාලයේ දොමිනිකාන නිකායේ රෝම ප්‍රදේශය වෙනුවෙන් දේව ධාර්මික පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය විෂය නිර්දේශය සකස් කළේය.

4. දර්ශනවාදී දායකත්වය
   තෝමස් ඇක්වනයිස් තුමා ඇරිස්ටෝටල්ගේ දර්ශනය ගැන විග්‍රහයක් ලියා ඇත.

තෝමස් ඇක්වයිනාස්තුමාගේ චින්තනයේ සුවිශේෂ ලක්ෂණ :

- ඔහු විසින් ගොඩනගන ලද න්‍යායන්ට අනුව කිතුනු දේව විශ්වාසය ඇරිස්ටෝටලියානු දර්ශනවාදයට අනුකූලව විග්‍රහ කිරීමට හේතු විය.
- මිනිස් චින්තනය හා දේව විශ්වාසය යන කරුණු දෙක එකිනෙකට පරස්පර විරෝධී නොව සමාන්තරව ගමන් කරන්නා වූ කරුණු 2 ක් ලෙසින් ඉදිරිපත් කිරීම.
- ඔහු විසින් ගොනු කරන ලද දේව ධාර්මික හා දර්ශනවාදී න්‍යායන්, ස්වාමීන් වහන්සේගේ කුරුස පාමුල සිට කරන යාච්ඤායෝගී හා යෝගී භාවනා ක්‍රම ඇතුළත් අභ්‍යාසයන්ගෙන් සමන්විත වූ අතර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ඔහුගේ ඇති අසීමිත ලැදියාව ඔස්සේ නිර්මාණ ඉදිරිපත් කළේය.
- ඔහු සභා ධර්මධර හැටියට පත්කළ අතරම කතෝලික පාඨශාලාවන්හි හා බුද්ධිමතුන්ගේ නාම සාන්තුවරයා ලෙස පත් කරන ලදී.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ශුද්ධ වූ අගෝස්තීනු තුමාගේ ජීවිත තොරතුරු වර්ෂ අනුව පෙළගැස්වීමට සිසුන්ව මෙහෙයවන්න.
- ශුද්ධ වූ තෝමස් ඇක්වයිනාස් තුමාගේ ජීවිත තොරතුරු වර්ෂ අනුව පෙළගැස්වීමට සිසුන්ව මෙහෙයවන්න.
- ඉහත චින්තකයන් දෙදෙනා අතින් දේව ධර්ම චින්තනයට වූ දායකත්වය වෙන වෙනම සාකච්ඡා කරන්න.
- ශුද්ධ වූ අගෝස්තීනුතුමාගේ ජීවිත අර්බුදය පිළිබඳ ව සිසුන් සමඟ ගවේෂණයක යෙදෙන්න.
- ශුද්ධ වූ තෝමස් ඇක්වයිනාස් තුමන් කුරුසිය ගැන මෙනෙහි කරමින්, යාච්ඤාව තුළින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වෙත විශේෂ භක්ති ආදරයක් දක්වමින් දේවධර්මය ප්‍රකාශ කළ ආකාරය ගැන සාකච්ඡා කරන්න.

**නිපුණතාව 8.0** : **විශ්ව සමාජයේ ප්‍රගතිය උදෙසා සභාවේ සමාජ සංස්කෘතික දායකත්වය අධ්‍යයනය කරමින් කිතුනු වගකීම් ඉටු කරයි.**

**නිපුණතා මට්ටම 8.3** : කලා ශිල්පයන්හි උන්නතිය උදෙසා සභාවේ දායකත්වය හඳුනාගෙන නිර්මාණශීලී ව ක්‍රියා කරයි.

**කාලය** : කාලච්ඡේද 15

**ඉගෙනුම් ඵල** :

- කොන්ස්තන්තීනු අධිරාජයා නිදහස දීමත් සමඟම දේවස්ථාන ගොඩනැගිලි ක්‍රමය ක්‍රමවත් ව ආරම්භ වූ බව කියයි.
- මුල් කිතුනුවන් යුකරිස්තිය (දිව්‍ය සත්ප්‍රසාදය) සඳහා භාවිතා කළ කිතුනු සංකේත ක්‍රිස්තියානි චිත්‍ර කලාවේ ආරම්භක චිත්‍ර බව පිළිගනියි.
- නූතන කිතුනු සංගීතයට පදනම ග්‍රෙගෝරියානු සංගීත ක්‍රමයෙන් ලැබුණු බව කියයි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 8.3.1 කලාවේ උන්නතිය උදෙසා සභාවේ දායකත්වය

**හැඳින්වීම**

ක්‍රිස්තියානි ධර්මය ලෝකයට හඳුන්වා දෙනු ලැබීමත් සමඟම යුරෝපා චින්තනයෙහි සහ ජනතාවගේ හැසිරීම් රටාවන්ගේ ඇති වූ වෙනස්කම්වල ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රිස්තියානි කලාව හඳුන්වා දිය හැකිය. ක්‍රිස්තියානි ධර්මය බටහිර ලෝකයේ චින්තන රටාව තුළ පමණක් නොව මිනිසුන්ගේ ජීවිත රටාවන්ගේ ද විශාල වෙනසක් ඇති කළ බව ඓතිහාසික සත්‍යයකි. කිතු දහම බිහිවීමත්, ව්‍යාප්ත වීමත් සමඟම රෝම අධිරාජ්‍යයේ එතෙක් පැවති චිත්‍ර, මූර්ති සහ වාස්තු කලාවන් මෙම නව ධර්මයට ගැලපුණේ නැත. එම නිසා කිතු දහමේ රුචි අරුචිකම්වලට ගැලපෙන ආකාරයට නව කලා නිර්මාණයන් බිහිවීම අවශ්‍ය විය. ක්‍රිස්තියානි කලාව නමින් හඳුන්වා දෙන මෙම කලාවේ උන්නතිය උදෙසා ක්‍රිස්තියානි සභාව විවිධාකාරව දායක වී ඇත. ක්‍රිස්තියානි සභා ඉතිහාසයේ විවිධ කාල වකවානුවල දී ක්‍රිස්තියානි කලාව වර්ධනය වී ඇත. කිතනු ලේඛනය, කිතුනු සංගීතය, ගෘහ නිර්මාණ, චිත්‍ර, කැටයම්, මූර්ති ආදියෙහි උන්නතිය උදෙසා විවිධ කණ්ඩායම්, පුද්ගලයින් දායක වී ඇත. ඉහත සඳහන් කළ සෑම අංගයක් ම කලාවට ඇතුළත් වන අතර ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය තුළ කලාවට හිමිවන්නේ සුවිශේෂී තත්ත්වයක් බව සඳහන් කළ හැකිය. මෙම කලාව පහත සඳහන් ආකාරයට ව්‍යාප්ත වූ අයුරු පෙන්වා දිය හැකිය.

## 8.3.2 ලේඛනය, ලේඛකයෝ හා සංගීතය

**ඩාන්ටේ අලිගියේරි (ක්‍රි.ව. 1265 - 1321)**

- ඉතාලියේ ෆ්ලෝරන්ස් නගරයේ උපත ලද ඩාන්ටේ අලිගියේරි මධ්‍යකාලීන යුගයේ ක්‍රිස්තියානි සාහිත්‍යයට මෙහෙවරක් කළ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි.
- මධ්‍යකාලීන යුගය වන තුරු සාහිත්‍ය කෘතීන් ලියා ඇත්තේ ලතින් භාෂාවෙන් ය. නමුත් මොහු එම සම්ප්‍රදාය අභිබවා සාමාන්‍ය ඉතාලි ජාතිකයන්ගේ මව් භාෂාව වූ ඉතාලි බසින් නිර්මාණ කළේය.
- ඔහුගේ සාහිත්‍ය කෘතීන් අතර අග්‍රගණ්‍ය සාහිත්‍ය කෘතිය වශයෙන් සළකන්නේ The Divine Comedy හෙවත් දේව සුඛාන්තය වේ. මොහු ලියූ ප්‍රථම මහා සාහිත්‍ය කෘතිය වන්නේ මෙයයි.
- සුප්‍රකට වර්ජිල් නැමැති කවියා සමඟ ඩාන්ටේ අපාය, ශුද්ධිගිනිස්ථානය සහ ස්වර්ගය කරා ගිය ගමනක අත්දැකීම් මෙම මහා සාහිත්‍ය කෘතියට පසුබිම් කරගෙන ඇත.

**තෝමස් අකම්පේ**

මධ්‍යකාලීන යුගයේ ක්‍රිස්තියානි සභාව පිරිහීමට පත් වූ යුගයක තෝමස් අකම්පේ නම් පූජකවරයා ලියූ ක්‍රිස්තු අනුසාරය (The Imitation of Christ) නම් කෘතිය වැදගත් වේ. ශු. බයිබලය හැරුණු විට භාෂා සංඛ්‍යාවකට පරිවර්තනය වී ඇත.

දිනපතාම දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීමට හැකිවන විලාසයකට හැම කෙනෙකුම ජීවත් විය යුතු යැයි ඔහු මෙම පොතෙන් ගෙනෙන පණිවිඩයයි.

**අවිලාවේ සාන්ත තෙරේසා**

- අවිලාවේ වූ කාර්මෙලිවානු තාපසාරාමයේ සාන්ත තෙරේසා තුමිය කම්කටොළුවලින් තොර සැප සම්පන්න ජීවිතයක් ගත කළාය.
- ඇය සාමාන්‍ය යාච්ඤාව බිමට වැටුණු කුරුළු පැටියෙක් කැදැල්ලට යාම සඳහා තනිවම නැගිටීමට තටු ගසමින් කරන ප්‍රයත්නයට සමාන කළාය.
- යෝග භාවනාව එම කුරුල්ලා තමාව කැදැල්ලේ ඔසවා තැබීමට තවත් කෙනෙකුට ඉඩ හැරීමක් යැයි ප්‍රකාශ කළාය.

  යෝග භාවනාව තුළින් සාහිත්‍යය පොත් ඇය ලීවාය. ඇගේ ජීවිත කථාව ද, යාච්ඤාවට පොත් දෙකක් ද ඇය ලද අත්දැකීම්වලින් ලියා ඇත.

**කුරුසයේ සාන්ත ජෝන්**

- යෝග භාවනාවේ අත්දැකීම් තුළින් ක්‍රි.ව. 1567 දී කුරුසයේ සාන්ත ජෝන් අවිලාවේ සාන්ත තෙරේසා තුමියගේ ආදර්ශයෙන් පිරිමි කාර්මෙලිකානු තාපස නිකාය සංශෝධනය කිරීමට අදහස් කළ පුද්ගලයෙකි.

**සංගීතය**

**ග්‍රෙගෝරියානු තාල ක්‍රමය**

ප්‍රථම වතාවට ක්‍රිස්තියානි සංගීත ක්‍රමයක් ආරම්භ වන්නේ ක්‍රි.ව. 500 - 1000 අතර කාලයේදී ය. අඳුරු යුගය නමින් හඳුන්වන මෙම කාලවකවානුව තුළ ජනවන්දනා ක්‍රමය විධිමත් ලෙස සකස් කරන ලදී. සාන්ත බෙනදික් තුමා තාපසාරාම තුළ සකස් කළ ජනවන්දනා ක්‍රමය ක්‍රිස්තියානි සභාවට ගැළපෙන විලාශයකට මහා ග්‍රෙගරි පාප්තුමා (ක්‍රි.ව.540 - 604) විසින් සකස් කරන ලදී. තනි තාල ක්‍රමයක් (Plain Chant) වූ මෙම සංගීත ක්‍රමය ග්‍රෙගෝරියානු තාල ක්‍රමය (Gregorian Chant) ලෙස ජනප්‍රිය විය.

**පොලිෆොනි සංගීත ක්‍රමය**

11 සහ 12 වෙනි ශතවර්ෂවල ග්‍රෙගෝරියානු තනි තාල සංගීත ක්‍රමයට වඩා වෙනස් මිශ්‍ර තාල ක්‍රමයක් පැරිසියේ නෝත්‍ර ඩාම් ආසන දෙව්මැදුරේ ආරම්භ විය.

ක්‍රි.ව. 1200 දී පමණ එම කන්තාරු කණ්ඩායමේ නායකයකු වූ පෙරොටින් (Perotin) සිවු හඬ තාල ක්‍රමයක් නිර්මාණය කළේය. පොලිෆොනි (polyphony) යන ග්‍රීක් වචනයෙන් එය ඉතා ප්‍රසිද්ධ විය. මෙම සංගීත ක්‍රමයේ අලංකාරත්වය නිසා සාමාන්‍ය ජනයාගේ හදවත් යාච්ඤාවට වඩා සමීප කර ඇත. පූජාවක තාලයට ගායනා කළ යුතු වූ කොටස් 6 ක් මිශ්‍ර තාල සංගීත ක්‍රමය තුළින් තීරණය වී තිබුණේය. නූතන දිව්‍ය යාගයේ දී ද මෙම කොටස් ගායනය කරනු ලැබේ.

i. කීරියේ (ස්වාමීනි, කරුණා කළ මැනව)
ii. ග්ලෝරියා (උත්කෘෂ්ඨ වූ දෙවියන් වහන්සේට මහිමය වේවා)
iii. ක්‍රේඩෝ (මම විශ්වාස කරමි)
iv. සාන්තුස් (සුවිශුද්ධය)
v. බෙනඩික්තුස් (වඩින තැනැත්තා ආශිර්වාදිතය)
vi. ආඤ්ඤුස් ඩේයි (දේව බැටළු පෝතකයාණෝ)

**ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවෙන් පසු බිහි වූ සංගීත ක්‍රම :**

රෙප්‍රමාදු විප්ලවයට පෙර භාවිත වූ සංගීත ක්‍රමයට සාමාන්‍ය ජනයාට සහභාගී වීමට නොහැකි විය. එම නිසා පූජාව ඉතා දික්ගැස්සුණු බවට චෝදනා විය. මන්ත්‍රණ සභාවෙන් පසු විශිෂ්ඨ මිශ්‍ර තාල සංගීත ක්‍රමයක් බිහි විය.

- මාර්සලස් පාප් තුමාගේ තාල පූජාව (Missa Papae Marcelle) මෙම මන්ත්‍රණ සභාවේ දී ගායනා කර ඇත.
- ඉතාලි ජාතික ජියොවන්නි පියර්ලුවිජී ඩා පලෙස්ට්‍රිනා නම් විශිෂ්ඨ නිර්මාතෘවරයා මෙම මිශ්‍ර තාල සංගීතයට නව ජීවයක් එකතු කර ඇත.
- නෙදර්ලන්ත ජාතික ඕර්ලෑන්ඩුස් ලැස්සුස් සාමූහික භක්ති අභ්‍යාසවලට මෙම මිශ්‍ර තාල සංගීත ක්‍රමය යොදා ගෙන ඇත. තූර්ය භාණ්ඩ නොමැතිව කටහඬ පමණක් යොදාගෙන කර ඇති මෙම නිර්මාණ ඉතා විශිෂ්ඨ ය.

- ඔරතෝරියෝ කෘති

  * ජෝර්ජ් ප්‍රිඩෙරික් හැන්ඩල් මෙම සංගීත ක්‍රමයේ ශ්‍රේෂ්ඨයා ය.
  * ආගමික තේමා වටා ගෙතුණු සංගීත නිර්මාණ විය.
  * තූර්ය භාණ්ඩ හා කටහඬ එකට මිශ්‍ර කරමින් ඔරතෝරියෝ කෘති නිර්මාණය කර ඇත.

- ගායනා පූජා

  * ගායනා පූජාවල නිර්මාතෘවරුන් අතරින් ප්‍රථමයා මෙන් ම ප්‍රමුඛයා ද වූයේ ලුඩ්විග් වෑන් බිතෝවන් ය.

  * 19 වෙනි සියවසේ දී ගායනා පූජා සහ දුක් ගායනා පූජා නිර්මාණය කරන ලදී. ප්‍රංශ ජාතික හෙක්ට බර්ලියෝස්, ගාබ්‍රියෙල් පෝරේ සහ ඉතාලි ජාතික ගුයියෙප්පේ වර්ඩි යන සංගීතඥයින් ඉතා වැදගත් මෙහෙවරක් සංගීතය වෙනුවෙන් කර ඇත.

### 8.3.3 ගෘහ නිර්මාණ කැටයම් ශිල්පය, චිත්‍ර හා මූර්ති ශිල්පය

- ගෘහ නිර්මාණ කැටයම් ශිල්පය

  ක්‍රි.ව. 313 දී කොන්ස්තන්තීනු අධිරාජයා විසින් ක්‍රිස්තියානි ධර්මයට නිදහස දීමෙන් පසු ක්‍රිස්තියානි ගොඩනැගිලි කලාව ආරම්භ විය. මෙම අවධියේ දේවස්ථාන තැනීමේ ක්‍රම දෙකක් හඳුන්වා දිය හැකිය.

  i. රෝමානු දේවස්ථාන ක්‍රමය
  ii. බයිසෙන්තියානු දේවස්ථාන ක්‍රමය

  I රෝමානු ශෛලියේ දේවස්ථාන ක්‍රමය

  * මෙකල රෝමවරුන්ගේ දේවාල අනුව නොව රෝමවරුන්ගේ බැසිලිකා යනුවෙන් හැඳින්වුණු ජන රැස්වීම් ශාලා අනුව මෙම දේවස්ථාන නිර්මාණය විය. රෝම අධිරාජ්‍යයේ බටහිර කොටසේ මෙම ක්‍රමය ජනප්‍රිය විය.
  * මෙම දේවස්ථානවල ප්‍රධාන ලක්ෂණ කිහිපයක් විය.

    i. පළලට වඩා දිගින් වැඩි වූ සෘජු චතුරස්‍ර ගොඩනැගිලි විය.

    ii. දේවස්ථානයට ඇතුළු වෙනවාත් සමඟම ඇසට දිස්වූයේ ප්‍රතිවිරුද්ධ පැත්තේ අර්ධ කවාකාර ගුහාවක පිහිටා තිබුණු පූජාසනයයි.

    iii. වහලය රඳවන දීර්ඝ කුළුණු පේළි දෙකක් විය. එමනිසා දේවස්ථානයේ බිම් පෙදෙස කොටස් තුනකට බෙදුණේය. එලෙස ම ප්‍රධාන මැදි ශාලාවකින් ද, පටු තීරු දෙකකින් ද යුක්ත විය. ඉංග්‍රීසියෙන් එම මැදි පෙදෙස නැව යන අර්ථය ඇති නේව් (Nave) යන්නෙන් ද තීරු දෙක කුරුළු තටු යන අර්ථය දෙන අයිල් (isle) යනුවෙන් ද හැඳින්විණි.

    iv. මැදි කොටසේ වහලය තටු කොටස්වලට වඩා උස විය. එම නිසා පිටතින් බැලූ විට එය තට්ටු දෙකක ගොඩනැගිල්ලක් බඳු විය.

    v. තටු කොටස සහ මැදි කොටස අතර වූ කුළුණු මත තනා තිබූ බිත්ති තුළ ජනේල ගොඩනගා තිබුණු අතර එම ජනේල නිසා ගොඩනැගිල්ල ඇතුළට ආලෝකය ගලා ආවේ ය.

vi. හරි හතරැස් දේවස්ථාන ද, කවාකාර බිත්තිවලින් යුක්ත වූ රවුම් දේවස්ථාන ද, කුරුසයක හැඩයට තැනූ දේවස්ථාන ද රෝම අධිරාජ්‍යයේ බටහිර කොටසේ නිර්මාණය කර ඇත.

vii. හතර වැනි සියවසේ රෝම නගරයේ නිර්මාණය කර ඇති සාන්ත පේදුරු, සාන්ත පාවුලු, සාන්ත ජෝන් ලැටරන්, සාන්ත මේරි මේජර් යන දේවස්ථාන බැසිලිකා ආකෘතියට තනා ඇති ප්‍රධාන දේවස්ථාන හතරක් වේ.

II බයිසෙන්තියානු ශෛලියේ දේවස්ථාන ක්‍රමය

* ග්‍රීක් භාෂාව කථාකළ බැතිමතුන් අතර එනම් රෝම අධිරාජ්‍යයේ පෙරදිග කොටසේ ගොඩනැඟුණු දේවස්ථානවල සැලසුම නිර්මාණය කළේ ආගමික අභිරහස්භාවය ප්‍රකාශ වන විලාශයකට ය.

* බයිසෙන්තියානු ශෛලියේ දේවස්ථානවල ප්‍රධාන ලක්ෂණ :

i. ඍජු සැලැස්මකට වඩා නැවීම් සහිත සප්‍රාණික සැලැස්මක් විය.

ii. පැතලි සිවිලිම්වලට වඩා අර්ධ කවාකාර පියැසි නිර්මාණය කළේය.

iii. පූර්ණ දීප්තිමත් ආලෝකයකට වඩා අර්ධ අඳුරු ආලෝක භාවිත කළේය.

iv. දේවස්ථානයේ මුළු මැද කොටස තුළම එකම කණුවක් හෝ මුක්කුවක් නොවීය.

v. දුණු හැඩයේ ආරුක්කු හා අර්ධ කවාකාර පියැසි වැනි ක්‍රම යොදා ගනිමින් බුබුලාකාර වහල එනම් ඩෝමයක් (Dome) නිර්මාණය කිරීමට මෙම කලාකරුවන්ට හැකි විය.

vi. බයිසෙන්තියානු දේවස්ථානයකට කදිම උදාහරණය නම්, කොන්ස්තන්තිනු පුරයේ තනන ලද සාන්ත සොෆියා දේවස්ථානයයි. බයිසෙන්තියානු ගොඩනැගිලි කලාවේ විශිෂ්ඨතම නිර්මාණය ලෙස මෙම දේවස්ථානය හඳුන්වා දිය හැකි ය.

**ගෝතික දේවස්ථාන**

ගෝතික (Gothic) දේවස්ථාන නිර්මාණය ආරම්භ වූයේ ප්‍රංශයේ ය. ගෝතික යන නම යොදා ඇත්තේ එම කලාව හෙලාදැකීම සඳහා ය. එහි අදහස නම් ම්ලේච්ඡ හෝ නීරස යන්නයි. යුරෝපය පුරා පැතිරී ගිය මෙම කලාව ගෝතික කලාව යන නමින් ම හඳුන්වා දෙනු ලැබීය.

ගෝතික දේවස්ථානවල ලක්ෂණ :

* අර්ධ වක්‍රාකාර ආරුක්කු වෙනුවට උල් වූ ආරුක්කු භාවිත විය. එම නිසා බර ගතිය අඩුකර ගැනීමට හැකි විය.

* ගොඩනැගිල්ල තනන විට ගෝතික කලාකරුවන් ප්‍රමුඛස්ථානය දුන්නේ සැකිල්ල හෙවත් මැස්ස තනා ගැනීමේ කාර්යයට ය. පළමුව අවශ්‍ය ප්‍රමාණයට කුළුණු තැනූහ. ඉන්පසු වහල රැඳවීම සඳහා ඒවා මත මැදින් උල් වූ වටකුරු ආරුක්කු සවි කළහ.

* ගෝතික දෙව්මැඳුරුවල ඇතුළත ගත් විට එය ද රෝමානු දේවස්ථාන සේ ම කුළුණු පේළි දෙකකින් යුක්ත විය. එම නිසා මෙම දේවස්ථානවල බිම් පෙදෙස පුළුල් මැදි ශාලාවකට ද පටු තීරු දෙකකට ද බෙදුණේ ය.

* උල් ආරුක්කු සහ මල් කවුළුව (Rose Windows) මෙම දේවස්ථානවල සුවිශේෂී ලක්ෂණයකි.

* වර්ණ වීදුරු භාවිත කිරීම, සමබරතාවය රැකගැනීම සඳහා කොත් සවිකිරීම ද කැටයම් භාවිත කිරීම ද ගෝතික දේවස්ථාන කලාවේ සුවිශේෂී තවත් ලක්ෂණයක් විය.

* ගෝතික දේවස්ථානයේ අංග සම්පූර්ණ වූ නිදසුන ලෙස පැරීසියේ නෝත්‍රඩාම් (Notre-Dame) ආසන දෙව්මැඳුර ගත හැකි ය.

**කැටයම් ශිල්පය**

ක්‍රිස්තියානි කැටයම් කලාව ආරම්භ වූයේ මධ්‍යකාලීන යුගයේ දී ය. යුරෝපයේ ආසන දෙව්මැඳුරු ඉදිකිරීමත් සමඟම කැටයම් කලාව ආරම්භ විය. නමුත් මේ යුගයේ දී කැටයම් කලාව ආරම්භ වුවත් එය ස්වාධීන කලාවක් නොවීය. කැටයම් යොදාගන්නේ ගොඩනැගිලි සරසන ක්‍රමයක් සේ ය. එනම් ගොඩනැගිලි කලාවේම අංගයක් වශයෙන් ය.

*උදා :*

i. කොත් මුදුන් සැරසීමට දේවදූතයන් යොදා ගත්තේ ය.

ii. වැහි පීලිවලින් වතුර පිටකිරීම සිදුකළේ මිනිස් හෝ සත්ව රූපවල කටවල් භාවිත කිරීමෙන් ය.

iii. ක්‍රිස්තුස් වහන්සේගේ සහ සාන්තුවරයන්ගේ රූප, දොරවල් මුරකිරීම අරමුණු කරගෙන නෙලා තිබුණේ ය.

iv. ද්වාර මණ්ඩපවල පුරාණ හා නව ගිවිසුම්වල කථා පුවත් දක්වන රූප අඹා තිබුණි. නමුත් මෙම රූප සම්පූර්ණ පිළිම නොවූ අතර ඒවායින් කොටසක් බිත්තියට ම ගිල්වෙන විලාසයකට නෙලා තිබුණි.

* කැටයම් කලාව ස්වාධීන වීම

  ක්‍රිස්තියානි කැටයම් කලාව ස්වාධීන කලාවක් වශයෙන් ලෝකය හඳුනා ගත්තේ ග්‍රීක රෝම පුනරුදයේ දායාදයක් වශයෙන් ය. ක්‍රිස්තියානි ඉතිහාසය තුළ කැටයම් කලාව ස්වාධීන කලාවක් බවට පත් කළේ මයිකල් ආන්ජෙලෝ ය. පහත සඳහන් කැටයම් ඔහුගේ ශ්‍රේෂ්ඨ කැටයම්වලින් කීපයකි.

  * පියෙටා (Pieta)

    ද්වි පුද්ගල රූපයක් වූ මෙම කැටයම තුළින් ක්‍රිස්තුන් වහන්සේගේ මව තම මළා වූ පුත්‍රයාව උකුලේ තබාගෙන සිටීම පෙන්වා ඇත. තිරිවාන ගලෙන් නෙලා ඇති මෙම කැටයම ලෝ ප්‍රකට මානවීය හැඟීම් දනවන කැටයමකි.

* කැටයම් ශිල්පය

කැටයම් කලාව ක්‍රිස්තියානි කලාවට ඇතුළුවන්නේ මධ්‍යතන යුගයේ දී ය. මධ්‍යකාලීන යුගයේ ඉදිකළ ආසන දෙව්මැදුරුවල විශේෂයෙන් ගෝතික දේවස්ථානවල සැරසිලි කිරීමට කැටයම් කලාව භාවිත කළේය කොත් මුදුන්වල දේව දූත, මිනිස් රූප, සත්ව රූප නිර්මාණය කෙරිණි.

* ලොරෙන්සෝ බර්නිනී (Gianlorenzo Bernini) 1598 - 1680

පශ්චාත් රෙප්‍රමාදු කතෝලික කලාව හෙවත් බැරොක් සම්ප්‍රදාය තුළ හමුවන බර්නිනී අද්විතීය ගණයේ කැටයම් ශිල්පියෙක් වෙයි. ඔහුගේ නිර්මාණ අතර ඉතා ජනප්‍රිය සහ අද්විතීය කෘතික නිර්මාණ ලෙස මේවා හඳුන්වා දිය හැකිය.

i. රෝමයේ ශාන්ත පීතර බැසිලිකාවේ පූජාසනය ඉහලින් නිර්මාණය කර ඇති ලෝකඩ උඩු වියන

ii. ශාන්ත පීතර බැසිලිකාවේ චතුරස්‍රය වටා තනා ඇති මහා කුළුණු පේළි දෙක සහ චතුරස්‍රය

iii. භාවනාවේ සාන්ත තෙරේසා යනුවෙන් හැඳින්වෙන පිළිමය. මෙම පිළිමය විශිෂ්ඨ කලා අගයකින් යුක්ත වන අතර ආධ්‍යාත්මික අගයකින් ද යුක්ත ය.

- චිත්‍ර හා මූර්ති ශිල්පය

ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත වීමත් සමඟ ම බහු ආගමික වාතාවරණයක් තුළ කිතුනුවන්ට ක්‍රම ක්‍රමයෙන් පීඩන එල්ල විය. ශතවර්ෂ දෙකක පමණ කාලයක් මොවුන්ට පීඩනවලට මුහුණ දීමට සිදු විය. මෙම පීඩන හමුවේ කිතුනුවන් පොළොව යට තනා තිබූ කැටකූම්බ් (Catacombs) නම් සොහොන් බිම් තුළ ස්තෝත්‍ර පූජාව හෙවත් යුකරිස්තිය පවත්වා ඇත. එහිදී කිතුනුවන්ට පමණක් තෝරුම් ගත හැකි රහසිගත කිතුනු සංකේත භාවිත කර ඇත. ප්‍රථම ක්‍රිස්තියානි චිත්‍ර ලෙස හඳුන්වන්නේ මෙම සොහොන් බිම් තුළ ඇඳ තිබූ චිත්‍ර නිසා මේවා කැටකූම්බ් චිත්‍ර ලෙස හඳුන්වනු ලැබේ.

මුල් කිතුනුවන් භාවිත කළ සංකේත කිහිපයක් පහත සඳහන් කර ඇත.

i. මාළුවා - ක්‍රිස්තුස් වහන්සේ
ii. පරෙවියා - ආත්මය
iii. මොණරා - සදාකාලිකත්වය
iv. කරෙහි බැටළුවකු තබාගෙන සිටින තරුණයා - යහපත් එඬේරාණන්
v. දෑත් ඔසවාගෙන සිටින මිනිසෙක් හෝ ගැහැණියක් - යාච්ඤාව හා දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාව

- ක්‍රි.ව. 1931 දී කැනීම්වලින් සොයාගෙන ඇති ඩුරා යුරෝපස් හි නිවෙසක රෝමයේ පිහිටා ඇති දොමිනිල්ලාගේ සොහොන් ගැබෙහි තිබී ක්‍රිස්තියානි බිතුසිතුවම් රැසක් හමු වී ඇත. එම චිත්‍රවලට තේමා වී ඇත්තේ ශු. බයිබලයෙහි අඩංගු කථාන්තර වේ.
  * ආදම් සහ ඒව
  * මොසෙස් පර්වතයකින් ජලය ලැබීම

* ජෝනා තල්මසකුගෙන් බේරීම
* සිංහයින්ගෙන් දානියෙල් ආරක්ෂා වීම
* ජේසුස් වහන්සේ සහ ගෝලයන් දක්වන චිත්‍රය ආදිය වේ.

සෞන්දර්යාත්මක වශයෙන් සළකන විට මේවා ඉතා ප්‍රාථමික ලක්ෂණවලින් යුක්ත වුවත්, හොර රහසේ ද, හදිසියේ ද දුබල උපකරණවලින් ද, කලා නිපුණත්වයක් නොමැති අත්වලින්ද, සකසන මෙම මුල් යුගයේ චිත්‍රවලින් මුල් බැතිමතුන් ගත කළ දුෂ්කර ජීවිත රටාව අවබෝධ කර ගත හැකිය.

- මොසැයික හෙවත් වීදුරු කැට කලාව

මොසැයික් චිත්‍ර බයිසෙන්තියානු කලාවේ නවතම කලා අංගයකි. වීදුරු කැට කලාව සේද මෙය හඳුන්වයි. ගෙවල් සහ දේවස්ථානවල සීලිම්, බිත්ති, බිම සැරසීමට මෙම ක්‍රමය උපයෝගී කරගෙන ඇත.

මොසැයික් චිත්‍ර කලාවේ ලක්ෂණ :

i. චිත්‍රය අලංකාර සහ ආලෝකවත්භාවයකින් යුක්ත වේ.
ii. පුද්ගලයෙකුගේ සප්‍රාණිකතාවයක් දක්නට නැත. එම නිසා මෙම කලාකරුවෝ චිත්‍රයේ ස්වාභාවිකත්වයට වඩා ගාම්භීරත්වයට මුල්තැන දුන්හ.
iii. වීදුරු කැටවලින් නිර්මාණය කළ නිසා චිත්‍ර රූප දරදඬු ය.
iv. නොසෙල්වෙන සුලුය. පැළඳ සිටින වස්ත්‍රවල රැළි නොමැත.
v. ඒවා දෙස භක්තියක් සහ ලෝකෝතරභාවයක් පැහැදිළිව ම ප්‍රකාශ වේ.

පන්ටොක්‍රොටෝර් (Pantocrotor) හෙවත් සියලු දෙයටම අධිපති සේ මොසැයික් කලාකරුවන් ක්‍රිස්තුන් වහන්සේව නිර්මාණය කර ඇත.

- අයිකොන් රූප

මොසැයික චිත්‍ර අනුගමනය කරමින් තීන්ත චිත්‍ර ක්‍රමයක් බිහි විය. දේවස්ථානවල දක්නට ලැබුණු මොසැයික චිත්‍රවල හැඩයට ම ජේසුස් වහන්සේගේ, මරිය තුමියගේ සහ ශුද්ධවන්තයින්ගේ රූප කුඩා ලී, ලෑලිවල පිටපත් කිරීමේ සම්ප්‍රදායක් බිහිවන්නට විය. එහාමෙහා ගෙන ගිය හැකි වූ එම චිත්‍ර රූප, ග්‍රීක් බසින් අයිකොන් සේ හැඳින්වුණේය. අයිකොන් රූප ද බයිසෙන්තියානු කලාවේ ම අංගයකි.

අයිකොන් රූපවල ලක්ෂණ කිහිපයක් නම් :

i. කුඩා ලෑලිවල තීන්තෙන් මෙම චිත්‍ර රූප ඇඳ ඇත.
ii. නිතරම පසුබිම රන්වන් පාටින් වූ අතර මොසැයික් චිත්‍ර සේ ම මුහුණු දරදඬු විය.
iii. ලෝකෝත්තර ගාම්භීරත්වයෙන් යුක්ත ය.

අයිකොන් චිත්‍රයකට විශිෂ්ඨතම නිදසුන වශයෙන් ලංකාවේ අතිශයින් ජනප්‍රියත්වයට පත් වී ඇති සදා සරණ දේව මාතා චිත්‍රය ගතහැකි ය.

- වර්ණ වීදුරු කලාව  (Stained Glass)

  වර්ණ වීදුරු චිත්‍ර කලාව ගෝතික කලාවට ආවේණික වූ කලා සම්ප්‍රදායකි.  ගෝතික දේවස්ථානවල විශාල කවුළු රාශියක් තැබීම නිසා එම කවුළුවල තිබූ වීදුරුවල මෙම චිත්‍ර ඇඳ ඇත.  මෙම කවුළු බොහෝ විට වක්‍රාකාර සහ පුෂ්පාකාර වැනි විවිධ හැඩවලින් සාදා ගෙන ඇත.

  මෙම චිත්‍රවල ඇති සුවිශේෂත්වය නම් වීදුරු තුළට සායම් කවා මෙම චිත්‍ර නිර්මාණය කිරීමයි. මෙම තාක්ෂණ ක්‍රමය මොසැයික් නිර්මාණවලටත් වඩා දුෂ්කර වී ඇති බව කිව යුතුය.  වීදුරු තුළට වර්ණ කැවීමේ මෙම ක්‍රමය ගෝතික කලාකරුවන් රහසිගත ව තබා ගැනීම නිසා පැරණි ක්‍රම අභාවයට ගියේ ය.  නූතනයේ වර්ණ වීදුරු කලාව ඇතත්, පැරණි ක්‍රමය තරම් ම ඒවා සමකළ නොහැකි ය.

මධ්‍යකාලීන යුගයේ චිත්‍ර ශිල්පයේ උන්නතියට දායක වූ පුද්ගලයින් ː

ගියොට්ටෝ ඩි බොර්ඩෝනේ (Giotto di Bordone) ක්‍රි.ව. 1266 - 1337

මොහුගේ චිත්‍රවල ඇති සුවිශේෂ ලක්ෂණ වන්නේ ,

- * ප්‍රෙස්කෝ (Fresco) චිත්‍ර හෙවත් නව බිත්ති මත (එනම් බදාම වේළීමට පෙර) චිත්‍ර ඇඳීමේ ක්‍රමයක් මොහු සොයා ගැනීමයි.

- * ඉතාලියේ ගෝතික දේවස්ථාන ක්‍රමයට නැඹුරු නොවීය.  එම නිසා රෝමනස්ක හෙවත් මධ්‍යකාලීන රෝමානු දේවස්ථානවල ඝන බිත්ති මත මොහු චිත්‍ර ඇන්දේය.  මොහුගේ ප්‍රෙස්කෝ චිත්‍ර අතර ප්‍රසිද්ධම චිත්‍ර වන්නේ, ප්ලෝරනස් නගරයේ අසීසියේ ෆ්‍රැන්සිස් තුමාගේ දේවස්ථානයේ බිත්ති මත ඇඳ ඇති චිත්‍ර ය.  එම චිත්‍රවල පහත සඳහන් ලක්ෂණ දක්නට ඇත.
  - මිනිසුන් තාත්වික ය.
  - ගස්කොළන්, කඳුවැටිවලින් පසුබිම අලංකාර කර ඇත.
  - වෛවර්ණ තටුවලින් යුත් කුරුල්ලන් සිත්තම් කර ස්වභාව ධර්මය වෙත ආදරයක් ඇතිකර ඇත.

- * පාදුවා හි දේවස්ථානයක ගියෙට්ටෝ විසින් ඇඳ ඇති ක්‍රිස්තු චරිත කතා දර්ශනවල ද ස්වභාවධාර්මිකභාවය ඉතා ඉහළ තත්ත්වයක ඇත.  නූතන චිත්‍ර කලාවේ පීතෘවරයා සේ බොහෝ දෙනෙකු විසින් ගියෙට්ටෝ සලකනු ලබති.

- ක්‍රිස්තියානි චිත්‍ර ශිල්පයේ උන්නතිය උදෙසා දායක වූ ශ්‍රේෂ්ඨ කලාකරුවෝ තිදෙනෙකු හඳුනා ගනිමු.

  ලෙයනාර්ඩෝ ඩා වින්චි (Leonardo da Vinci)

  - * මිලාන් නගරයේ භෝජන ශාලාවක බිත්තියක මොහු සිත්තම් කළ “අන්තිම රාත්‍රී භෝජනය” චිත්‍රය වැදගත් චිත්‍රයකි.  ඒකත්වය සමබරතාව රැකගනිමින් මෙම චිත්‍රය ඇඳ ඇත.

  - * ලෙයනාර්ඩෝ ඩා වින්චි ඇඳ ඇති “මොනාලිසා” චිත්‍රය ක්‍රිස්තියානි අරමුණක් සඳහා නිර්මාණය කර නැතත්, එම චිත්‍රය ද ලෝ ප්‍රකට චිත්‍රයකි.

මයිකල් ආන්ජෙලෝ (Michael Angelo)

* මොහුගේ ලෝ ප්‍රකට කෘති රැසක් අද පවා ඉතිරි වී ඇත.

* ක්‍රි.ව. 1508 වතිකාන මාලිගයේ සිස්ටයින් චැපලයේ එනම් පාප්තුමාගේ පෞද්ගලික දේවස්ථානයේ මයිකල් ආන්ජලෝ ඇඳ ඇති චිත්‍ර ඉතා වැදගත් වේ. මෙහි ඇඳ ඇති චිත්‍ර අතර, - විශ්වය මැවීමේ චිත්‍රය
  - අවසාන විනිශ්චය - ඉතා වැදගත් වේ.

* විශ්වය මැවීමේ චිත්‍රයෙන් දෙවියන් වහන්සේ තම දිගහැරුණු අතින් ආදම්ගේ දිගහැරුණු අතට පණ දෙන ආකාරය ඉතා තාත්ත්වික ය.

* අවසාන විනිශ්චය චිත්‍රය දෙස බලන්නාගේ සිත කළඹන ගතියක් ඇති කරන අතර එහි ඇඳ ඇති මිනිසුන්ගේ ඉරියව් නොසන්සුන්තාවයකින් ඇඳ ඇත.

රෆායෙල් සන්සියෝ (Raffael Sanzzio)

* මොහුගේ අනර්ඝතම චිත්‍රය වන්නේ පාප්තුමාගේ නිළ නිවසේ ඇඳ ඇති ප්‍රෙස්කෝ හෙවත් නව බදාම චිත්‍ර මාලාවයි.

* ඉතාලි ජාතිකයන් අතර ජනප්‍රිය මැඩෝනා (Madonna) හෙවත් දේව මාතාවන්, අප ස්වාමි දූ ගේ චිත්‍ර නිර්මාතෘවරයා සේ රෆායෙල් ව හඳුන්වනු ලබයි.

* රෆායෙල්ගේ මැඩෝනා චිත්‍ර අතරින් අතිශයින් ජනප්‍රිය වී ඇති චිත්‍රය වශයෙන් ආසනගත අප ස්වාමි දූ (Madonna of the Chair) චිත්‍රය සඳහන් කළ හැකිය.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 : මුල් කිතුනුවන් සංකේත චිත්‍ර භාවිත කරමින් ස්තෝත්‍ර පූජාව පැවැත්වූ ආකාරය මූලාශ්‍ර ඇසුරින් රැස්කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

පියවර 2 : නූතන දිව්‍ය පූජා යාගයේ දී ග්‍රෙගෝරියානු සංගීතය භාවිත කරන අයුරු සෙවීමට සිසුන් ගවේෂණයක යොදවන්න.

පියවර 3 : ලියනාර්ඩෝ ඩාවින්චි, මයිකල් ආන්ජෙලෝ, රෆායෙල් සන්සියෝ යන කලාකරුවන් ක්‍රිස්තියානි චිත්‍ර කලාවට දායක වූ ආකාරය මූලාශ්‍ර ඇසුරෙන් සෙවීමට සිසුන් පොළඹවන්න.

පියවර 4 : නිදහස් යුගයේ සහ මධ්‍යතන යුගයේ දේවස්ථාන කලාවේ අංග පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කරන්න.

**මූලාශ්‍රය :**

1. ක්‍රිස්තියානි ඉතිහාසය, සාහිත්‍ය සහ කලාව, ආචාර්ය ඇන්තනි ප්‍රනාන්දු

**නිපුණතාව 9.0** : **ලාංකේය සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් කිතුනු සභාවෙන් ලද දායකත්වය විස්තර කර සමාජ අභිවෘද්ධිය වෙනුවෙන් කිතුනුවෙකු ලෙස කටයුතු කරයි.**

**නිපුණතා මට්ටම 9.1** : අධ්‍යාපනය නඟාසිටුවීමෙහිලා සභාවෙන් ලද දායකත්වය වටහාගෙන තම අධ්‍යාපන හැකියාවන් වැඩිදියුණු කර ගනියි.

**කාලය** : කාල පරිච්ඡේද 28

**ඉගෙනුම් ඵල** :

- විදේශීය පාලන යුගයේ දී ශ්‍රී ලංකාවේ පැවති අධ්‍යාපන ක්‍රමයන් විමසා බලයි.
- නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ දියුණුව කතෝලික අධ්‍යාපනය කෙරෙහි ඇතිකළ බලපෑම් මධ්‍යයේත් එහි දියුණුව තකා ක්‍රියාකළ අධ්‍යාපනඥයන් ගැන දැනගනියි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 9.1.1 විදේශීය පාලන යුගයේ කිතුනු අධ්‍යාපන සේවාව

පෘතුගීසි යුගයේ අධ්‍යාපනය

- 1505-1948 දක්වා ශ්‍රී ලංකාවේ යුරෝපීය ආධිපත්‍යය පැවතිණි.
- ප්‍රථමයෙන්ම ශ්‍රී ලංකාවට පැමිණි පෘතුගීසීහු 1505 - 1658 දක්වා පාලනය කළහ.
- මුලින් ම ශ්‍රී ලංකාවට පැමිණි පෘතුගීසිහු කතෝලික ආගමිකයෝ වූහ.
- පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර ලංකාවේ පැවති බෞද්ධ, හින්දු, පාසල්, නිවෙස්, විල්වල පැවති පාසල්, පිරිවෙන් පාසල්, ගස් සෙවණේ පැවති පාසල් යනුවෙන් විවිධ නම්වලින් හඳුන්වන ලදී. තවද රාත්‍රී පාසල්, සඳඑළියේ පැවති පාසල් යනුවෙන් ද හඳුන්වන ලදී.
- විශේෂයෙන් පාසල්වලින් උසස් කුලවන්තයන්ට ද, සමාජයේ උසස් ප්‍රභූවරුන්ට ද අධ්‍යාපනය ලබා දෙන ලදී.
- මුල් කාලයේ දී අකුරු ලියා ඉගෙනීමේ පහසුකම් නොමැති නිසා වනපොත් කිරීම (කටපාඩම් කිරීම) මේ පාසල්වල අධ්‍යාපන ක්‍රමය විය.
- මේ කාල වකවානුවේ දී කාන්තාවන් දැනුම ලැබීම වැදගත් නොවීය. ඔවුන්ට අත්දැකීම් ම ප්‍රධාන අධ්‍යාපනය ලෙස සලකන ලදී.
- මේ පාසල්වල රංගනයත්, ගායනයත් එක්වූ අධ්‍යාපන ක්‍රමයක් දියුණු වෙමින් පැවතිණි.
- මෙලෙස යුරෝපීයයන්ගේ පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය පසුබෑස්මක පැවති බව පෙනේ.

**පෘතුගීසි අධ්‍යාපනය**

- පෘතුගීසීන්ගේ පැමිණීමත් සමඟ අධ්‍යාපනයේ නිපුණත්වයක් තිබූ මිෂනාරී නිකායක් වන ප්‍රැන්සිස්කන්, ජේසු, දොමිනිකන්, අගෝස්තීනු නිකායික ධර්මදූතවරු ශ්‍රී ලංකාවට ගොඩබැසීමත් සමඟ, දේශනය, වන්දනාව, පාසල් අධ්‍යාපනය, සාහිත්‍යය, නාට්‍යය, සමාජ සේවාව ආදියෙහි ද උනන්දුවක් දැක්වූහ.

- මොවුන්ගෙන් මේ සේවාවන් සියල්ල ද කතෝලික වත්පිළිවෙත් ද, බටහිර රටවල සංස්කෘතිය මුල්කරගෙන කළ නිසා බෞද්ධ, හින්දු ආගමික වත් පිළිවෙත් වලින් අතිශයින්ම වෙනස් ව පෙණුනි.

- පෘතුගීසි යුගයේ දී, ස්වදේශිකයන් අතර කතෝලික දහම පතුරුවා ඔවුන් කතෝලිකයන් බවට හැරවීමේ අරමුණින් අධ්‍යාපනය දෙන ලදී.

- මොවුන්ගේ කාලයේ දී විවිධ මිෂනාරී නිකායවල පූජකවරුන් ගුරවරුන් ලෙස ද සේවය කළ බැවින්, පාසල්වල ආගමික අධ්‍යාපනයත්, මඟපෙන්වීමත් කරන ලදී.

- මේ කාලයේ දී බටහිර අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දීම, ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ඇති වූ විශාල වෙනසක් ලෙස හැඳින්විය හැක.

**ශ්‍රී ලංකාවේ අධ්‍යාපන දියුණුව කෙරෙහි ෆ්‍රැන්සිස්කාන මිෂනාරීවරුන්ගේ දායකත්වය**

- 1543 දී ප්‍රථම පියවර ලෙස ෆ්‍රැන්සිස්කාන මිෂනාරීවරු නිලවශයෙන් දහම් ප්‍රචාරක කටයුතුවල නිරත වූහ.

- ෆ්‍රැන්සිස්කාන මිෂනාරීවරු ස්වදේශ භාෂාවන් ඉගෙනීමට දැක්වූ අධික උනන්දුව නිසාම, පසුකාලයේ දී කෝට්ටේ සහ යාපනයේ බොහෝ පාසල් ආරම්භ කළහ.

- මේවා දේවස්ථානයට අනුබද්ධිත පාසල් නමින් එක් මීසමක එක් පාසලක් බැගින් ආරම්භ කරන ලදී. මේවා ෆ්‍රැන්සිස්කාන මිෂනාරීවරුන් ගොඩනැගූ ප්‍රථම පාසල් විය.

- මෙවන් වූ දේවස්ථානයට අනුබද්ධිත පාසල්, යාපනයේ 25ක් ද, කෝට්ටේ 50ක් ද ඇතිකරන ලදී. මේවා ලන්දේසි හා ඉංග්‍රීසි යුගවලත්, කෝල්බෲක් ප්‍රතිසංස්කරණ දක්වාමත් පැවත ආවේය.

- මේවා කුඩා පාසල් ලෙස පැවතුණත්, මෙහි යාච්ඤා කිරීමටත්, ප්‍රශ්නෝත්තර ක්‍රමයෙන් දහම කියාදීමටත් ප්‍රධාන තැන දුන් අතර, ස්වභාෂාවෙන් අධ්‍යාපනය දෙන ලදී. ඒ සමඟම කිතුනු ගීත, ප්‍රාර්ථනා, ස්තෝත්‍ර ගීත ආදියත් ස්වදේශ බසින් ගායනා කරන ලදී. මේ නිසා ළමෝ දිනෙන් දින පිරිසිදු හදින් ආගමික මෙහෙයන්ට සහභාගී වීමට පුරුදු වූහ.

- තවද මේ පාසල්වල ලිවීමට, කියවීමට දැනුම දීමේ අරමුණින් පෘතුගීසි ක්‍රමයටත් අධ්‍යාපනය දෙන ලදී.

- පෘතුගීසි යුගයේ දී ප්‍රැන්සිස්කාන මිෂනාරීවරු දෙවෙනි පියවර ලෙස උසස් අධ්‍යාපනයක් දුන්හ.

- මේ උසස් අධ්‍යාපන පාසල්, බටහිර දෙව්සත්හල් අධ්‍යාපන ක්‍රමයට පැවතුණි. තවද මේ අධ්‍යාපන ක්‍රමය ආගමික පූජකවරුන් වීමට කැමති අයට දෙන ලදී.

- මේවා පෘතුගීසි භාෂාවෙන් පවත්වාගෙන යන ලදී. මේ පාසල්වල ආගම, ආගමික නීතිරීති, කියවීම, ලිවීම, ගණිතය, සංගීතය, ලතින් , යහ පුරුදු ආදිය උගන්වන ලදී.

- මෙවැනි විදුහල්, කොළඹ ශාන්ත අන්තෝනි විදුහල, යාපනයේ විදුහලක් සහ නවගමුවේ විදුහලක් යන විදුහල් තුනක් තිබුණි.
- තෙවන අධ්‍යාපන පියවර ලෙස රජවරුන් සඳහා පාසල් ඇති කරන ලදී.
- පෘතුගීසීන් විසින් සිරගත කරනු ලැබූ, ඔවුන් වෙත භාරවූ, අධ්‍යාපන ලබනු වස් ඔවුන් වෙත භාරකළ රජවරුන්ට, යුවරජවරුන්ට, මෙම විදුහල්වලින් අධ්‍යාපනය දෙන ලදී.
- මේ විදුහල් අධ්‍යාපන ක්‍රමය, යුරෝපීය රාජකීය අධ්‍යාපන ක්‍රමය හා සම විය.
- මේ විදුහල්, කොළඹ, ගෝවේ හා පෘතුගාලයේත් දක්නට ලැබුණි.
- මේවාත් පෘතුගීසි බසින් පවත්වාගෙන යන ලදී. මේ පාසල් විෂය නිර්දේශයේ ලිවීම, කියවීම, ලතින්, රජවරුන් සඳහා වූ කලාව ඇතුළත් කරන ලදී. රාජසිංහ රජු, කෝට්ටේ දොන් ජුවන් ධර්මපාල රජු මෙවන් අධ්‍යාපනයක් ලැබූවෝ ය.
- ප්‍රැන්සිස්කාන මිෂනාරීවරුන්ගේ අධ්‍යාපන ක්‍රමයේ දුර්වලතාවන්,
    i. කතෝලික ජන සංඛ්‍යාවට අනුව පාසල් ප්‍රමාණවත් නොවීම.
    ii. උසස් අධ්‍යාපන ආයතන තුනක් පමණක් තිබීම
    iii. විදුහල් සියල්ලක්ම ආගම ප්‍රධානකොට ගෙන පවත්වාගෙන යාම.
    iv. පහළ මට්ටමේ අයටත්, උසස් මට්ටමේ අයටත් පාසල් තිබුණ නමුත් මධ්‍යම මට්ටමේ අයට පාසල් නොතිබුණි.

**පෘතුගීසි යුගයේ ජේසු නිකායේ අධ්‍යාපනය**

- අධ්‍යාපන ක්ෂේත්‍රයේ මනා පරිපාලන අත්දැකීම් තිබූ ජේසු නිකායික මිෂනාරිවරු 1602 දී ලංකාවට පැමිණියහ.
- මොවුහු කොළඹ සිටි මධ්‍යම මට්ටමේ පාසල් ආරම්භ කිරීමේ අරමුණින් කැඳවනු ලැබූහ.
- මොවුහු ප්‍රාථමික, මධ්‍යම හා උසස් යන තුන් ආකාර පාසල් ආරම්භ කළහ.
- ආරම්භයේ දී මොවුහු කෝට්ටේ තම සේවය ආරම්භ කර, 1622 දී යාපනය දක්වා එය ව්‍යාප්ත කළහ. ජේසු නිකායිකයින් ඉන්දියාවේ සිට ලංකාවට පැමිණි නිසා කලින් ම දෙමළ භාෂාව මනාව දැන සිටියහ.
- මොවුහු බොහෝ තැන්වල ප්‍රාථමික පාසල් ආරම්භකර පවත්වාගෙන ගියහ. මෙවැනි පාසල් කොළඹට පිටින් 12 ක් දක්නට ලැබුණි. මේ පාසල්වල ගණිතය, කියවීම, ලිවීම, සංගීතය, යහපුරුදු, කතෝලික සිරිත් විරිත් ආදිය ද උගන්වන ලදී.
- මේ ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමයේත් ලතින්, පෘතුගීසි භාෂාව ආදිය ද භාවිත විය. ලතින් බසින් වන්දනාවන් ද, දෙමළ, සිංහල භාෂාවලින් ආගම දේශනා කිරීම ද කරන ලදී. ලිවීම පෘතුගීසි බසින් කරන ලදී.
- මොවුහු දහම පැතිරවීමේ මාධ්‍යයක් ලෙස නාට්‍ය, සංගීතය ආදිය උපයෝගී කර ගත් අතර, බයිබලීය කථා, ශුද්ධ වූ සභා ඉතිහාසය තුළ සිදුවූ සිදුවීම්, නාට්‍යානුසාරයෙන් රඟදැක්වූහ. මේවා ස්වභාෂාවෙන් ලියා රඟදක්වන ලදී.

- ජේසු නිකායිකයෝ නාට්‍යානුසාරයෙන් (roleplay) අධ්‍යාපනය දීම හඳුන්වා දුන්හ.

- මීටත් ඉහළින් ජේසු නිකායිකයෝ විධිමත් පාසල් අධ්‍යාපන ක්‍රමයක් ආරම්භ කළහ. මේ විධිමත් අධ්‍යාපනය කොළඹ සහ යාපනයේ ස්ථාපිත කරන ලදී. සිසුන් 150 දෙනෙකුගෙන් කොළඹ ආරම්භ කළ මේ අධ්‍යාපන ක්‍රමය පසුකාලයේ දී ඉතා දියුණු තත්ත්වයකට පත්විය. යාපනය, විදුහලේ ප්‍රාථමික අංශයේ සිසුන් 80ක් ද, ජ්‍යෙෂ්ඨ අංශයේ සිසුන් 22 ක් ද අධ්‍යාපනය ලැබූහ.

- මේ පාසල්වල ප්‍රාථමික, කනිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ යනුවෙන් අංශ තුනක් විය. මෙහි ප්‍රාථමික අංශය තරුණයන්ට වෙන් වූ අතර, එහි ලිවීම කියවීම පෘතුගීසි බසින් උගන්වන ලදී. යහපත් පුරුදු විෂයක් ලෙස ඉගැන්වුනු අතර, ලතින් භාෂාව ද මෙහි උගන්වන ලදී.

- කනිෂ්ඨ අංශයේ ද මෙසේ ම කරන ලදී.

- මෙහි ජ්‍යෙෂ්ඨ අංශයේ දේව ධර්මය උගන්වන ලදී. ඉන් බිහිවූ දක්ෂ සිසුන් ද පැවිදිවීමට කැමති අය ද ලතින් භාෂාවෙන් ඉගෙන ගත්හ.

- පෘතුගීසි නිලධාරීන්ගේ ළමුන් ද, සිංහල කුලවන්තයින්ගේ ළමුන් ද මෙම විදුහල්වල ඉගෙනුම ලැබූ අතර, සාමාන්‍ය පවුල්වල දරුවන්ට ද අධ්‍යාපනය දෙන ලදී.

**මොවුන්ගේ අධ්‍යාපනයේ වැදගත් අංගයන් නම්,**

නැවත නැවත කියාදීම, ගීතිකා මගින් සෑමෙකක් ම පැහැදිළි කිරීම, නාට්‍යය හා ශ්‍රව්‍ය දෘශ්‍ය ගෝචර ක්‍රමය අනුගමනය කිරීම. (ඇසෙන,පෙනෙන) හා ප්‍රශ්නෝත්තර ක්‍රමය අනුගමනය කිරීම ආදියයි.

- මේ කාලයේ ප්‍රැන්සිස්කාන නිකායිකයෝ ජේසු නිකාය, ඩොමිනිකන් නිකාය, අගෝස්තීනු නිකාය හා එක්වී විවිධ අධ්‍යාපන සේවාවල නිරත වූහ.

- මෙලෙස පෘතුගීසි අධ්‍යාපන ක්‍රමය, ශුද්ධ සභා අධිකාරීන් අතේ පැවති බැවින් ඔවුහු නිදහසේ සේවයේ යෙදුණාහ. පෘතුගීසි රාජ්‍ය අනුග්‍රහයත් ඔවුන්ට ලැබුණි.

- තවද ශ්‍රී ලංකාවේ දී මේ අධ්‍යාපන ක්‍රමය මිනිසුන්ගේ සිත් හැරවීමට ඉතාම සුදුසු ක්‍රමය බැවින්, ලන්දේසීහු හා ඉංග්‍රීසීහු ද මේ අධ්‍යාපන ක්‍රමයම අනුගමනය කළහ.

- පෘතුගීසි යුගයේ දී ආගමික අධ්‍යාපනය මුල් තැන ගති. ආගමින් තොර අධ්‍යාපනය දෙවන ස්ථානය ලැබීය.

- මොවුන්ගේ කාලයේ දී අධ්‍යාපනයේ ප්‍රධාන අංගය ලෙස ක්‍රිස්තු ධර්මය ඉගැන්වීම පළමුතැන ගත්තේ ය.

- පෘතුගීසි යුගයේ දී දේශීය භාෂාව ද, දේශීය සංස්කෘතිය ද යොදාගෙන බොහෝ කතෝලික වචන ද නිර්මාණය විය.

- විශ්වවිද්‍යාලවල නාට්‍ය හා රංගකලාව එක් විෂයක් ලෙස දියුණුවීමට හේතු වූයේ පෘතුගීසි අධ්‍යාපන ක්‍රමය බව කිවහැකිය.

- පෘතුගීසීන්ගේ අධ්‍යාපන ක්‍රමයත්, ධර්මදූත සේවාවත්, විවිධ බාධක මධ්‍යයේ කරගෙන යන ලදී. කෝට්ටේ රාජධානිය තුළ වීදියේ බණ්ඩාර ඇතිකළ අරගලයත්, යාපනයේ සංකිලි රජු, මන්නාරමේ ඇතිකළ මිනිස් ඝාතනයත්, පෘතුගීසි අධ්‍යාපන ක්‍රමයටත්, ධර්මදූත සේවාවටත්, මහත් බාධකයක් විය.

**ලන්දේසි යුගයේ අධ්‍යාපන ක්‍රමය**

- 1658 සිට 1796 දක්වා ලංකාවේ පාලනය පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම යටතේ පැවතුණි.
- ලන්දේසීන්ගේ අධ්‍යාපන ක්‍රමයත්,පෘතුගීසී යුගයේ අධ්‍යාපන ක්‍රමය ලෙසම, ස්වදේශිකයන්ව කිතුනුවන් හා එක් කිරීමේ ක්‍රමයක් අනුගමනය කරන ලදී.
- ලන්දේසීහු, පෘතුගීසීන් මෙන් අධ්‍යාපනය සම්පූර්ණයෙන් පූජකවරුන්ට භාරනොදී, රජු යටතේ මනා පරිපාලනයකින් යුතුව අධ්‍යාපනය දීමට උත්සාහ කළහ.
- තවද අඩු වියදමින්, උසස් අධ්‍යාපනයක් දිය හැකි ක්‍රමවේදයක් අනුගමනය කළහ.
- ලන්දේසීන්ගේ කාලයේ දී සතරාකාර පාසල් ක්‍රමයක් පවත්වාගෙන යන ලදී.
    - i. දේවස්ථානයට අනුබද්ධිත පාසල්
    - ii. දෙව්සත්හල් (සෙමනේරි)
    - iii. ලන්දේසි පාසල්
    - iv. අනාථ නිවාස
- පෘතුගීසීන් පවත්වාගෙන ආ **දේවස්ථානයට අනුබද්ධිත පාසල්** ලන්දේසීහු ද පවත්වාගෙන ගියහ.
- රාජ්‍ය ව්‍යවස්ථාවන් මගින් පාසල්වල සේවය කළ ගුරුවරුන්ගේ සේවා කාලය, පුහුණුවීම්, ඔවුන්ගේ කාර්යභාරයන්, වරින් වර පැහැදිළි කරන ලදී.
- පාසල්වල සේවය කළ ගුරුවරුන් අතුරෙන්, කිතුනුවකු, වැඩිමහල් අයකු, උසස් ප්‍රභූ පවුලක කෙනෙකු මුල්ගුරුවරයා ලෙස පත්කරන ලදී.
- මේ මුල්ගුරුතුමාට තෝම්බු පවත්වාගෙන යාම ද භාරවිය. (තම බල ප්‍රදේශය තුළ ලියාපදිංචි කිරීමේ කටයුතු) උපත, විපත, විවාහ ලියාපදිංචි කිරීම, ප්‍රසාද ස්නාපනය ලියාපදිංචි කිරීම ආදිය ද මුල්ගුරුතුමාට භාරවිය. සමහර අවස්ථාවල දී ඉඩම් ලියාපදිංචි කිරීම ද කළේය.
- මේ නිසා මුල්ගුරුතුමාගේ වැදගත්කමත්, ගෞරවයත් සමාජයේ කැපී පෙණුනි.
- ලන්දේසීහු අධ්‍යාපනය සඳහා වැයවන වියදම් අඩුකිරීමට ඕලන්දයේ සිට ගුරුවරුන් ගෙන්වීම වෙනුවට ස්වදේශිකයන් ගුරුවරුන් ලෙස පුහුණුකර පාසල්වල සේවයට යොදවා ගත්හ.
- දේශිය ගුරුවරුන් සේවය කළ දේවස්ථානයට අනුබද්ධිත පාසල්වල සිංහල හා දෙමළ භාෂා ඉගැන්වීම ලන්දේසිහු අනුගමනය කළහ. මොවුන්ගේ ඉගැන්වීම් අතර ප්‍රශ්නෝත්තර ක්‍රමය, කියවීම, ලිවීම, ක්‍රිස්තියානි නීතිරීති ආදිය ඇතුළත් විය.
- ලන්දේසීන් තමන්ගේම මුදලින් හෝ ආධාරවලින් හෝ පාසල් පවත්වාගෙන ගියේ නැත. දඩ මුදල්, බදු මුදල් ගෙව්වේ ද එම මුදල්වලිනි. මේ මුදල් භේදයකින් තොරව සියල්ලන්ගෙන්ම අයකරන ලදී.
- අවුරුදු 8 සිට 15 දක්වා වයසැති සියළු ළමුන් පාසල් යාම අනිවාර්ය කරනලදී. ඊට පසුවත් වසර තුනක් හෝ හතරක්, වාරයකට වරක් දහම් පාසල් යාම අනිවාර්ය කරන ලදී. මේ අන්දමේ අනිවාර්ය අධ්‍යාපන ක්‍රමය ජනයාගේ සිත්හැරීමට රුකුලක් විය.
- ලන්දේසි පාසල් නැගෙනහිර ඉන්දීය වෙළඳ සමාගමේ පාලනය යටතේ තැබූ අතර, රාජ්‍ය පරිපාලනය ක්‍රමවත් කිරීමට 1663 දී ලංකාවේ රාජ්‍ය පරිපාලන කණ්ඩායමක් ඇති කරන ලදී.

- මේ පරිපාලන කමිටුවේ ලන්දේසි පූජකවරු මුල්තැන ගත් අතර මේ කමිටුවට ගුරුවරුන් පත්කිරීම, පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම ආදිය භාරවිය. මේ කමිටුව ජනතාවගේ ගැටලු විසඳීමේ ද යෙදුණාහ.

- ලන්දේසි පාසල් ක්‍රමයේ අධීක්ෂණ කටයුතු මුල්තැනක් ගත්තේය. වසරකට වරක් මේ අධීක්ෂණ කටයුතු දැනුම් දීමකින් යුතුව කරන ලදී. කලින් දැනුම්දීමට අනුව, එදින විදානේ මහතා, ගුරුවරු, සිසුහු සියලුදෙනාම පාසලට පැමිණෙති.

- සිසුන්ගේ කියවීම, ලිවීම, ආගමික ප්‍රශ්න උත්තර, දස පණත, විශ්වාස ලක්ෂණය. ක්‍රිස්තුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව ආදිය කමිටුව මගින් අධීක්ෂණයට ලක්විය. පළමුවෙන් ප්‍රශ්න අසා පසුව තිළිණ ප්‍රදානය කරනලදී. ඒ අවස්ථාවේ දී පාසලේත්, දේවස්ථානයේත්, ලියාපදිංචිකිරීම් කළ ලේඛන ද, පෙළපොත් සියල්ල ද අධීක්ෂණය කර, අදක්ෂ ගුරුවරුන් ද, ඔවුන්ගේ දුර්වලකම් ද විමසන ලදී.

- ලන්දේසි යුගයේ දී දේවස්ථානයට අනුබද්ධිත පාසල්වලට වඩා **දෙව්සත්හල් (සෙමනේරි පාසල්)** ඉදිරියෙන් තිබුණි. සෙමනේරි පාසල්වල බටහිර අධ්‍යාපන ක්‍රම ක්‍රියාත්මක විය. මෙහි ඉහළ පංතිවල "ඩච්" භාෂාව (ලන්දේසි බස) උගන්වන ලදී. ඒ සමඟ කාලීන අවශ්‍යතාව අනුව ලතින් හා ග්‍රීක බස ද උගන්වන ලදී. ක්‍රිස්තු ධර්මයත්, තර්ක ශාස්ත්‍රයත් ඉහළ මට්ටමකින් උගන්වන ලදී.

- ලාංකික සිසුන්ව ඉගෙනුම සඳහා ඕලන්දයේ Leyden විශ්වවිද්‍යාලයට යවන ලදී.

- සෙමනේරි පාසල් අධ්‍යාපනය කොමිසම යටතේ නොතිබුණි. මෙම සෙමනේරි පාසල් ක්‍රමය කොළඹත්, යාපනයේ නල්ලූර්වලත් දක්නට ලැබුණි. මේ පාසල්වල සිසුහු පූජකවරුන් ලෙස, ලේඛකයන් ලෙස, භාෂා පරිවර්තකයන් ලෙස පුහුණුව ලදහ.

- වසරකට වරක් සිසුන් අධීක්ෂණයට ලක්කරන ලදී.

- 1610 දී යාපනයේ දී ඇරඹි සෙමනේරි පාසල් මුල්ගුරුතුමකු නොමැති බැවින් 1732 දී වසා දමා එහි සිසුන් කොළඹට එවන ලදී.

- මේ පාසල්වල "ඩච්" බස ද (ලන්දේසි බස) ව්‍යාකරණ ද අධිකව උගන්වන ලදී.

- මේ පාසල්වල දෙමළ පාසල් සිසුන්ට ඉගෙනීමට අනුමැතිය නීත්‍යානුකූලව ලබාදෙන ලදී. මෙහි ඉගෙනුම ලත් සිසුන් දේශීය පාසල්වල ගුරුවරුන් ලෙස බඳවා ගන්නා ලදී. මෙහි ඉගෙනුමලත් අය, රාජ්‍ය සේවයේ පමණක් නොව, බටහිර ඉන්දීය ඕලන්ද සමාගම්වල ද තනතුරු දැරීය.

- තවද මේ පාසල්වල ඉගෙනුම ලැබූ සමාජයේ උසස් පවුල්වල අය, මුදලිවරුන්, ගැමි නායකයන්, භාෂා විශාරදයන් යන ඉහළ තනතුරු දැරූහ.

- නමුත් මේ පාසල් අධ්‍යාපන ක්‍රමය සම නොවුණු බව පෙණුනි. එනම් උසස් අධ්‍යාපනයේ දී ස්වභාෂාවන්ට නොව ලතින්, ග්‍රීක, හෙබ්‍රෙව් යන භාෂාවලට මුල්තැන ලැබුණි.

- කුලවත් පවුල්වල කුලවන්ත දරුවෝ, රජයේ වියදමින් ඕලන්ද විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලැබූහ.

- පසුකාලයේ දී සෙමනේරි පාසල්වල පරිපාලනය එකිනෙකට වෙනස් වූ බැවින් මේවා අසාර්ථක විය.

- ඕලන්ද පාලන සමයේ දී (ලන්දේසි යුගයේ දී) **ඕලන්ද පාසල් සමහරක්** ලංකාවේ පැවතුණි. මෙහි ඕලන්ද (ලන්දේසි) , පරංගි (පෘතුගීසි), දරුවෝ ඉගෙනීම ලැබූහ. පූජකවරු, තේවාචාර්යවරු මෙහි ඉගැන්වූහ. ලිවීම, කියවීම, ගණිතය මෙහි උගන්වන ලදී.

- 1737 දී මෙවැනි පාසල් 4 ක් කොළඹ තිබුණි. එමෙන් ම මාතර, ගාල්ල, යාපනය යන ස්ථානවල ද මෙවැනි ඕලන්ද පාසල් දක්නට ලැබුණි. මෙහි ඉගෙනුම ලැබූ දරුවන් ඕලන්ද විශ්ව විද්‍යාලවලට යවන ලදී.

- ඕලන්ද කාලයේ දී, **දේවස්ථානයට අනුබද්ධිත පාසල්, සෙමනේරි පාසල්, අනාථ නිවාස පාසල්, ඕලන්ද පාසල්වලට වඩා ඉදිරියෙන්** තිබුණි. මෙහි ගැහැණු පිරිමි දෙපක්ෂයම ඉගෙනුම ලැබූහ. ලිවීම, කියවීම, ගණිතය, ආගම ආදිය මෙහි උගන්වන ලදී. ඒ සමඟම පිරිමි දරුවන්ට ව්‍යාපාර ද, ගැහැණු දරුවන්ට ගෙදර වැඩ, මැහුම්, ගෙතුම්, නූල් කැටීම ආදිය උගන්වන ලදී. මේවා රජයේ ආධාරයෙන් පවත්වාගෙන යන ලදී. සෑම දෙයක්ම උගත් අවුරුදු 18-20 අතර ළමුන් මේ පාසල්වලින් ඉවත් කරන ලදී.

- මෙලෙස ඕලන්ද යුගයේ (ලන්දේසි යුගයේ) අධ්‍යාපන ක්‍රමය අප විමසා බලන විට සෙමනේරිවල ස්වදේශිකයින්ට ද, ඉගෙනීමට අවස්ථාව ලැබුණු බව පෙනේ. අනාථ නිවාස පාසල්වල අවුරුදු 8 - 15 දක්වා දරුවන් අනිවාර්යයෙන් අධ්‍යාපනය ලැබිය යුතු විය.

- 1737 දී ලංකාවේ මුද්‍රණාල ආරම්භ විය. මේ මුද්‍රණාලවල පාසල් අධ්‍යාපන කටයුතුවලට අවශ්‍ය අත් පත්‍රිකා, සාහිත්‍ය ලේඛන මුද්‍රණය කළ අතර, මේ මගින් පාසල මුල්කරගෙන ජනතාව සමඟ සම්බන්ධතාවක් ඇතිකර ගැනීමට හැකිවිය. මෙය ලන්දේසි යුගයේ දී ඇතිවූ විශේෂිත අංගයක් බව කිවහැක.

**ඉංග්‍රීසි යුගයේ අධ්‍යාපනය**

- ලන්දේසීන්ට පසුව වර්ෂ 1796 - 1948 දක්වා ඉංග්‍රීසීහු ලංකාව පාලනය කළහ.

- මේ කාලයේ දී ඉංග්‍රීසි භාෂාව ජාත්‍යන්තර භාෂාවක් බවට පත්ව තිබුණි. ලංකාවේ බහුතරයක් ජනතාව ඉංග්‍රීසි බස උගත්හ.

- 1798 දී ඉංග්‍රීසී හු පාසල්වල භාරකාරත්වය තමන්ට පවරාගෙන (ඇංග්ලිකන්) රෙප්‍රමාදු, බැප්ටිස්ට්, වෙස්ලියන්, ඇමරිකානු මිෂනාරි ආදී පූජක නිකායවලට භාරදුන්හ.

- ඉංග්‍රීසි පාලන යුගයේ දී තුන් ආකාර පාසල් දැකිය හැකි විය.

    1. රජයේ පාසල්
       මේවායේ බහුතරයක් දෙමළ, සිංහල භාෂාවලින් ඉගැන්වීම් කටයුතු සිදුවිය. මේවා බහුතරයක් රෙප්‍රමාදු පූජකවරුන් විසින් පාලනය කරන ලදී.

    2. මිෂන් පාසල්
       මේවා ප්‍රොතෙස්තන්ත පූජකවරුන් විසින් පාලනය කරන ලදී.

    3. පිරිවෙන් පාසල්
       මේවා බෞද්ධ භික්ෂුන් වහන්සේ විසින් පාලනය කරන ලදී.

- 1829 - 1832 කාලය අතරතුර ඇති වූ කෝල්බෲක්, කැමරන් කොමිසම මගින් කොළඹ එක් පාසල් පරිපාලන කොමිසමක්ද, අනෙකුත් ප්‍රදේශවල පාසල් කමිටු ද ඇති කරන ලදී.

- කොළඹ ආරම්භ කළ පාසල් පරිපාලන කොමිසමේ, රෙප්‍රමාදු සහා පූජකවරු සාමාජිකත්වය දැරූහ. මේ කොමිසම මගින් ඉංග්‍රීසි පාසල් සමහරක් පවත්වාගෙන යන ලදී. උදාහරණයක් ලෙස කොළඹ රාජකීය විදුහල (රෝයල්) ගත හැක.
- මේ පාසල් ඉතා ඉහළ මට්ටමකින් පවත්වාගෙන ගිය බැවින් බොහෝ දෙනා මේවාට ඇදී ආහ. ඉංග්‍රීසින්ගේ කාලයේ දී පාසල් අධ්‍යාපනය තුළින් දහම් දැනුම බෙදාහරින ලදී.
- 1841 දී බලයට පත්වූ ස්ටුවඩ් මැකැන්සි ආණ්ඩුකාරවරයා විසින් මේ ක්‍රමය වෙනස්කර සියලුම නිකායවල පූජකවරුන්ට සාමාජිකත්වය දැරිය හැකි අන්දමේ මධ්‍යම පාසල් පරිපාලන කොමිසමක් ඇතිකරන ලදී. නමුත් මෙහි බෞද්ධ, හින්දු පූජකවරුන්ට සාමාජිකත්වය ලැබීමට අනුමැතිය නොදෙන ලදී.
- 1869 දී මධ්‍යම පාසල් පරිපාලන කොමිසම අහෝසිකර පොදු අධ්‍යාපන ආයතනයක් ඇතිකළ අතර, සියලුම පූජකවරුන්ට ස්වදේශීය පාසල් ආරම්භ කිරීමට හැකිවිය.
- මෙලෙස ඉංග්‍රීසීන්ගේ පාලන සමයේ දී බොහෝ ක්‍රිස්තියානි පූජකවරු අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලුණහ.

    i. 1801 දී ක්‍රිස්තියානි සේබර් නැමැත්තාගේ නායකත්වයෙන් බැප්ටිස්ට් මිෂනාරී සංගමය ලංකාවට පැමිණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලුණහ. කොළඹ රාජකීය විද්‍යාලය ආරම්භ කළේ මොවුන් ය.

    ii. 1912 දී ජේම්ස් සේබර නැමැති අයගේ නායකත්වය යටතේ කොළඹ රාජකීය විද්‍යාලය ආරම්භ විය.

    iii. 1815 දී වෙස්ලියන් මිෂනාරී සභාව ලංකාවේ සමහර ප්‍රදේශවල අධ්‍යාපන ආයතන ආරම්භ කළේය. කොළඹ වෙස්ලි මෙතෝදිස්ත විදුහල, නුවර කිංග්ස්වුඩ් විදුහල, ගාල්ලේ රිච්මන්ඩ් විදුහල මොවුන් ආරම්භ කළ විදුහල්ය.

    iv. ඇමරිකන් මිෂනාරී සභාව යාපනයේ වට්ටුකෝට්ටෙයි ප්‍රදේශයේ උසස් අධ්‍යාපන පාසල් ද, යාපනය නගරයේ සෙන්ට්‍රල් කොලීජිය උඩුවිල් හි බාලිකා විදුහල ආදිය මොවුන් ආරම්භ කළේය.

    v. 1845 දී මෙරටට පැමිණි කතෝලික සභාවට අයත් පූජකවරු, පැවිදි සහෝදරවරු, පැවිදි සහෝදරියන්, විවිධ පාසල් ලංකාවේ ආරම්භ කළහ. කොළඹ ශාන්ත බෙනදික් විදුහල, ශාන්ත ජෝශප් විදුහල, යහපත් එඬේරාගේ බාලිකා විදුහල, ශුද්ධ වූ පවුලේ බාලිකා විදුහල ද, යාපනයේ ශාන්ත පැට්‍රික් විදුහල ද මින් ප්‍රධාන වේ. පසු කාලයේ දී පාසල් 750 කට අධික සංඛ්‍යාවක් කතෝලිකයන් සතු විය.

- මෙලෙස නිදහස ලබන තෙක් ඉංග්‍රීසි පාලන සමයේ දී පාසල් 235කට අධික සංඛ්‍යාවක් ආරම්භ කර, සිසු සිසුවියන් 10,000කට අධික පිරිසකට අධ්‍යාපනය දුන්හ.
- ඉංග්‍රීසි යුගයේ අධ්‍යාපනය තුළ විශේෂයෙන් ජාති, ආගම් භේදයෙන් තොරව සියලුදෙනා එක් ව අධ්‍යාපනය ලැබීමත්, කාන්තාවන් අධ්‍යාපනයේ දියුණුව ලැබීම හා අධ්‍යාපනය කෙරෙහි උනන්දුවක් ඇතිවීමත් සිදුවිය.
- 1824 දෙමළ ශබ්දකෝෂයත්, දෙමළ - ඉංග්‍රීසි ශබ්දකෝෂයත් ලියන ලද්දේ ඉංග්‍රීසින්ගේ කාලයේදී ය. ගරු වයුරන් උපින්ගිලේ පියතුමා විසින් ලියන ලද දෙමළ-ඉංග්‍රීසි ශබ්දකෝෂය ප්‍රථමවරට මුද්‍රණය කරන ලදී.

- මේ කාලයේ දී සිසු සිසුවියන්ට විද්‍යා හා වෛද්‍ය විද්‍යා දැනුම දුන්නා පමණක් නොව ප්‍රථම වරට මානිපා හි වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කළහ.

- මේ කාලයේ දී යාපනයේ සේවයකරමින් සිටි ක්‍රිස්ටෝපර් බොන්ජීන් පියතුමා, ලංකාවේ අධ්‍යාපන සැළසුම් ගැඹුරින් සොයාබලා, ඇන්ග්ලිකන්, ප්‍රොතෙස්තන්ත ක්‍රමවේද එම ආගම්වලට අයත් නැති අයට බලපාන බවට ඉතා වැදගත් ලිපි තුනක් පළකලේය. ඒවා නම්,

    i. ලාංකීය කතෝලික අධ්‍යාපනය පිළිබඳ වදන් ස්වල්පයක් - මෙය 1860 දී පළකළේය.

    ii. විවිධ ආගම් හා මිශ්‍ර පාසල් යන මැයෙන් තවත් ලිපියක් 1861 දී පළකළේය.

    iii. කතෝලික සභාව සහ නාගරීකරණය මැයෙන් තෙවන ලිපිය 1867 දී පළකළේය.

- මෙතුමාගේ මේ ලිපි මගින් ලාංකීය අධ්‍යාපනය පිළිබඳව මනා අවබෝධයක් ලැබූ ඉංග්‍රීසි රජය, 1869 දී අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඇති කළේය. එය අද දක්වා පැවත එයි.

- මෙමගින් කතෝලික සභාවට පමණක් නොව, බෞද්ධ, හින්දු, ඉස්ලාම් සැමට පාසල් ආරම්භ කර, තම මව්බසින් අධ්‍යාපනය දීමට හැකි බවට නීතිමය අවසරය ලැබුණි.

- මෙලෙස විවිධ ආගමිකයන් පාසල් ලංකාවේ ඇරඹීමට මුල් වූයේ ගරු බොන්ජීන් පියතුමන් බව කවුරුත් අවිවාදයෙන් පිළිගනිති.

- එමෙන් ම බොහෝ පාසල්, උසස් පාසල් ලංකාවේ ආරම්භ කළ තැනැත්තා ද මෙතුමාම ය. කොළඹ ශාන්ත ජෝශප් විදුහල මෙතුමාගේ නොපසුබස්නා උත්සාහය නිසාම ආරම්භ විය.

- 1868.07.24 දින රදගුරුතුමකු ලෙස අභිසෙස් ලැබ යාපනය පදවියේ වැඩ භාරගත්තේය.

- 1883 දී කොළඹ විකාරියෙට් හි ප්‍රතිරාජගුරු ලෙස වගකීම් භාරගෙන 1887.01.06 දින කොළඹ රදගුරු පදවියක් ලෙස උසස් කරනු ලැබූ කළ එහි ප්‍රථම අගරදගුරු ලෙස පත්විය.

**9.1.2 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ කතෝලික අධ්‍යාපන සේවය**

- 1969 දී ගෙන ආ නව අධ්‍යාපන චක්‍රලේඛනය අනුව අධ්‍යාපන දෙපාර්තමේන්තුවක් ආරම්භ කළ අතර, කතෝලික පාසල් වඩාත් දියුණුවට පත්විය.

- නගරබද ව උසස් පාසල් සියලු පහසුකම් ඇති ව ආරම්භ කරන ලදී. ඒවා රජයේ පරීක්ෂාව යටතේ විවිධ ක්‍රිස්තියානි සභා මගින් පාලනය විය.

- කතෝලික පාසල් අධීක්ෂණය කිරීමට එක් එක් පළාත්වල අධ්‍යක්ෂවරයකු පත්කරන ලදී. මීසම් පාලක පියතුමන්ලා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙනුවෙන් සේවය කළහ.

- කතෝලික ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ගුරු විදුහල් මග්ගොන, බෝලවලාන, කොලුඹුතුරෙයි ආදී ස්ථානවල ඇති කරන ලදී.

- කතෝලික සභාවට අයත් පාසල් පාලනය සඳහා යම් යම් ස්ත්‍රී හා පුරුෂ පැවිදි නිකා ඉදිරිපත් වූහ.

    i. බෙනදිකාන නිකාය (ORDER OF SYLVESTRO BENEDICTINE)

ii. නිමල මරිය නිකාය (OBLIATES OF MARY IMMACULATE)
iii. ජේසු නිකාය (SOCIETY OF JESUS)
iv. ඩිලාසාල් සහෝදරවරු (CHRISTIAN BROTHERS)
v. මාරිස්ට් සහෝදරවරු (MARIST BROTHERS)
vi. ශුද්ධ වූ පවුලේ කන්‍යා සොයුරියන් (HOLY FAMILY)
vii. යහපත් එඬේරාගේ කන්‍යා සොයුරියන් (GOOD SHEPHERD)
viii. ෆ්‍රැන්සිස්කාන කන්‍යා සොයුරියන් (FRANCISCAN)
ix. අපෝස්තලික කාර්මෙල් කන්‍යා සොයුරියන් (APOSTOLIC CARMEL)
x. දයාවේ කන්‍යා සොයුරියන් (CHARITY)

- ස්වභාෂාවෙන් අධ්‍යාපනය දීම දියුණුකිරීම සඳහා මග්ගොන හා මාතලේ ශු. ෆ්‍රැන්සිස් නිකායේ සහෝදරවරු ද, යාපනය හා කොලුඹුතුරෙයිහි ශා. ජෝසප් නිකායේ සහෝදරවරු ද ෆ්‍රැන්සිස්කාන කන්‍යා සොයුරියන්ගේ නිකාය ආදිය ලංකාවේ ස්ථාපිත කරන ලදී.

- මෙලෙස නිදහස් ශ්‍රී ලංකාවේ විවිධ කිතුනු සභා නිසා අධ්‍යාපනය සීඝ්‍රයෙන් දියුණු විය.

- කිතුනු පාසල්වල දියුණුව කිතුනුවන්ව සමාජයේ ඉහළට ගෙනගියා පමණක් නොව, අනෙකුත් ආගමිකයන්ට මෙය විශාල අභියෝගයක් ද විය.

**පාසල් රජයට ගැනීම**

- මේ කාලයේ දී බෞද්ධ, හින්දු අය අතර ද දියුණුවක් ඇති විය.

- විශේෂයෙන් බෞද්ධයින් 1954 අප්‍රියෙල් මස දෙවන දින බෞද්ධ කොන්ග්‍රසයේ 33 වැනි සංවත්සරයේ දී, තම බෞද්ධ සංස්කෘතිය සහ තම ආගම දියුණු කිරීමට විවිධ මාර්ග සෙවූහ. ඒ සමඟම මෙය ක්‍රියාත්මක කිරීමට මෙම සංවත්සරයේ දී බෞද්ධ නිලධාරී සංගමයක් ආරම්භ කරන ලදී.

- කතෝලික, ක්‍රිස්තියානි පාසල්වල දියුණුව, බෞද්ධාගමේ දියුණුවට බාධකයක් වේ යැයි වැරදි නිගමනයක් මොවුන් තුළ විය.

- බෞද්ධ නිලධාරී සංගමයේ නිර්දේශය පරිදි, 1960 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පාලනයට පත් වූ විට, 750 කට වැඩි කතෝලික පාසල් රජයට පවරාගන්නා ලදී. ගොඩනැගිලි, ඉඩම්, ලීබඩු ආදියට කිසිදු වන්දියක් නොගෙවා සියල්ල රාජසන්තක කර ගන්නා ලදී.

- පාසල් පමණක් නොව, ගුරුවිද්‍යාල ද රජයට පවරාගන්නා ලදී. කතෝලික පාසල් 40 ක් පමණක් රජයේ ආධාර නොලබා, සිසුන්ගෙන් ද කිසිදු උපකාරයක් බලාපොරොත්තු නොවී, පවත්වාගෙන යාමට අනුමැතිය ලබා ගත්තත්, කාලයාගේ ඇවෑමෙන්, ආර්ථික අපහසුතා නිසා ඒවායින් සමහරක් ක්‍රම ක්‍රමයෙන් රජයට භාරදෙන ලදී.

- 1980 දී එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණි විට ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ අනුමැතිය ඇතිව ඉතිරි පාසල්වල ගුරුවරුන්ට රජයෙන් වැටුප් ගෙවන ලදී.

- මේ තත්ත්වය කතෝලික සභාවට විශාල බලපෑමක් ඇති කළේය. කතෝලික පාසල්වල කතෝලික සිසු සිසුවියන්ට ආගමික අධ්‍යාපනය දීම ප්‍රතික්ෂේප කළ අතර, බොහෝ පාසල්වල කතෝලික ගුරුවරු, කතෝලික විදුහල්පතිවරු නොමැති තත්ත්වයක් උදාවිය.

- අයහපතින් යහපත උදාකරන දෙවියන් වහන්සේ මේ තත්ත්වය තුළින් කතෝලික සභාව, කතෝලික දෙමාපියන් අතර පිබිදීමක් ඇති කළේය.
- කාලාන්තරයක් තිස්සේ දරුවන්ගේ අධ්‍යාපන හා ආගමික අධ්‍යාපනය පූජක හා පැවිදිවරුන්ට භාරදී තිබූ දෙමාපියෝ, අවදියෙන් සිට තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි සැළකිලිමත් වූහ.
- පාසල්වල ආගමික අධ්‍යාපනය නැතිවීගෙන යද්දී කතෝලික සභාව, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථාන, පදවි ධර්මෝපදේශ මධ්‍යස්ථාන ස්ථාපිත කර, ධර්මෝපදේශකවරුන් පුහුණු කළා පමණක් නොව, රදගුරු පදවි හා සමස්ත ලංකා මට්ටමින් දහම් දැනුම මිනුම තරඟ පවත්වා සිසුන් අතර දහම් දැනුම වර්ධනය කිරීමට උත්සාහ දැරුවේය. එමෙන් ම මේ මධ්‍යස්ථාන මගින්, සමස්ත ලංකා හා රදගුරු පදවි මට්ටමින් බයිබල් දැනුම දීම, සේවාස්ථ සැසි පැවැත්වීම, වැඩමුළු පැවැත්වීම ආදිය කරන ලදී.
- මීසම් මට්ටමින් දහම් පාසල් දිනෙන් දින දියුණු විය.
- කතෝලික සභාව තුළ ගිහියන් අතර පිබිදීමක් ඇතිවූවා පමණක් නොව, මීසම් පාලක පියතුමා, දෙමාපියන්, සිසුන් අතර සමීප සුහදතාවයක් ඇති විය.

### 9.1.3 කිතුණු අධ්‍යාපනඥයෝ

**අතිඋතුම් එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමිපාණෝ (නි.ම.නි.)**

- මෙතුමා 1897. 12.27 දින හලාවත දී උපත ලැබීය.
- 1924.02.25 දින නි.ම.නි. නිකායේ පූජාප්‍රසාදීතුමකු ලෙස පූජකවරය ලැබීය.
- 1940.04.23 දින මෙතුමාට වයස අවුරුදු 42 දී හලාවත රදගුරුතුමන් ලෙස අභිෂේක ලැබීය. මෙතුමා ශ්‍රී ලාංකික ප්‍රථම සිංහල රදගුරුතුමන් වූයේය.
- 1972.12.27 දින දී විශ්‍රාම ලැබ 1989.09.24 දින දී ස්වර්ගස්ථ වූයේ ය.
- මෙතුමා ශ්‍රී ලාංකික ශුද්ධ සභාවේ විදේශීය සංස්කෘතික අංගයන් ඉවත් කර, දේශීය සංස්කෘතික අංගයන්ට නැඹුරු කිරීමට ඉමහත් වෙහෙසක් ගෙන කටයුතු කළේය.
- මෙතුමා ඔරතෝරියානු නිකායික ගරු ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමන් විසින් රචිත, බොහෝ යාච්ඤා ද, දෙමළ සිංහල කාව්‍යයන් ද, මෙරට කර්ණාටක ගී තාල හා ගැමි නාටක තාලයන් අනුව සංස්කරණය කර නැවත ලීවේය.
- මෙතුමා ලන්ඩන් විශ්ව විද්‍යාලයේ බටහිර භාෂා පිළිබඳ පාණ්ඩිත්‍යයක් ලැබූවෙකි.
- මෙතුමා පොත් 16ක් ද, 250කට අධික රචනා ප්‍රමාණයක් ද ලියා ඇත. මෙතුමා විසින් ලියන ලද බොහෝ පොත්, පෘතුගීසි, ලන්දේසි භාෂාවෙන් තිබී පරිවර්තනය කරන ලද ඒවා ය.
- 1960 දී මෙතුමා ශු. මතෙව් ශුභාරංචිය සිංහල භාෂාවට පරිවර්තනය කළේය. අද වනතුරු ම මෙය විශිෂ්ටතම පරිවර්තනය ලෙස ප්‍රසිද්ධ ය.

- මෙතුමා,

    * රාජ්‍ය පුරාවිද්‍යා කොමිසම (Government Archives Advisory Board)

    * කොළඹ විශ්වවිද්‍යාලයේ පෙරදිග අධ්‍යාපන කොමිසම
    (The Board of Oriental Studies in the University of Colombo)

    * අධ්‍යාපන ප්‍රකාශන කොමිසම (The Educational Publication Commission)

    * සංස්කෘතික හා සිරිත් විරිත් කොමිසම (Customs and Traditions Commission)

    ආදියේ සාමාජිකත්වය දැරීය.

- මෙතුමා රෝයල් ආසියාටික් සංගමයේ (Royal Asiatic Society) සාමාජිකයකු ලෙස සේවය කළා පමණක් නොව, ලංකාවේ සංස්කෘතිය පිළිබඳ ව ලියැවුණු ලිපි මේ සංගමයේ සඟරාවේ පළකළේය.

- කතෝලික සභා ජනවන්දනා පිළිවෙත්හි සංගීතය පිළිබඳ ව උනන්දුවක් දැක්වූ මෙතුමා, ජනවන්දනාව සඳහා ගීතිකා කිහිපයක් ම නිර්මාණය කළේය.

- 1927 - 1930 දක්වා කාලය තුළ, නිමල මරිය නිකායේ සඟරාවක් වන භක්ති ප්‍රබෝධනයේ කර්තෘතුමන් ලෙස ද සේවය කළේය. මෙය ශ්‍රී ලංකාවේ දිගු කාලයක් තිස්සේ පළවන ඉපැරණි සඟරාවකි.

- දෙවන වතිකාන කතිකාවට පෙර සිටම, ජනවන්දනාව දේශානුරූපී විය යුතු බව පැවසුවේය.

**ගරු එස්.ජී. පෙරේරා පියතුමා**

- ගරු සයිමන් ග්‍රෙගරි පෙරේරා පියතුමා 1882.06.18 දින කළුතර දී උපත ලැබීය. මෙතුමා තම ප්‍රාථමික අධ්‍යාපනය කළුතර සිරිකුරුස විද්‍යාලයෙන් ද, පසුව කොළඹ ශාන්ත ජෝශප් විදුහලින්, හා වෙස්ලි විදුහලින් ද අධ්‍යාපනය ලැබීය.

- පාසල් අධ්‍යාපනයෙන් පසු රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලිපිකරුවකු ලෙස සේවය කරද්දී, තම විසිතුන්වන වියේ දී ජේසු නිකායට බැඳී, පූජක අධ්‍යාපනය ලැබීමට ඉන්දියාවට ගියේය.

- 1919.11.21 දින පූජාප්‍රසාදීතුමෙකු ලෙස පූජකවරය ලැබූ මෙතුමා ජේසු නිකායේ ප්‍රථම සිංහල පියතුමා විය.

- ඉන්දියාවේ සිට රෝමයට ගොස් ග්‍රෙගෝරියාන විශ්වවිද්‍යාලයේ තම අධ්‍යාපනය අරඹා, පසුව එම විශ්වවිද්‍යාලයේ ම කථිකාචාර්යතුමෙකු ලෙස සේවය කළේය.

- 1939 දී රෝමයේ සිට ලංකාවට පැමිණ, ගාලු පදවියේ ප්‍රථම සිංහල අනුනායකහිමි ලෙස සේවය කළ අතර, ගාල්ලේ ශාන්ත ඇලෝෂියස් විදුහලේ ආචාර්යවරයකු ලෙස ද, මාතර ශාන්ත සර්වේශස් විදුහලේ විදුහල්පති ලෙස ද සේවය කළේය.

- මේ කාලයේ දී ලංකා ඉතිහාසය කෙරෙහි උනන්දුවක් දැක්වූ මෙතුමා 1505 - 1948 දක්වා පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි පාලන සමයේ ලංකා ඉතිහාසයත්, ඊට පෙර කෝට්ටේ, නුවර, නල්ලූර් රාජධානි පිළිබඳ ඉතිහාසයත් මනාව හැදෑරුවේ ය.

- මෙතුමා සිංහල, ඉංග්‍රීසි, යුරෝපීය සමහර භාෂාවන් මනාව දැන සිටියේය. මෙතුමා පරිවර්තනය කළ පොත් අතරින් විශිෂ්ඨතම පොත වන්නේ ෆර්වා ඩි කුයිරොස් නැමැත්තා විසින් පෘතුගීසි බසින් ලියන ලද පොතයි. ලංකාව ලෞකික හා ආධ්‍යාත්මික ලෙස අත්පත් කර ගැනීම යන තේමාවෙන් තවත් පොතක් ඉංග්‍රීසියෙන් පරිවර්තනය කරන ලදී.

- තවද මෙතුමා සිංහල බසින් ලියන ලද පොත් ඉංග්‍රීසියට පරිවර්තනය කර, සිංහල කලාව, සංස්කෘතිය, ඉතිහාසය ආදිය ලොවට හෙළිකළේය. මෙයින් උසස් කෘතිය වන්නේ සුභසීන මවනවා යන්නෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කළ පොතයි.

- මෙතුමා 15කට නොඅඩු පොත් ද, 300කට අධික ලිපි ද ලියා ඇත. මෙතුමා ලියූ ලංකා ඉතිහාසය (CEYLON HISTORY) යන ඉංග්‍රීසි පොත දීර්ඝ කාලයක් ලංකාවේ පිළිගනු ලැබූ අතර, ඉතිහාස පෙළපොතක් ලෙස භාවිත කළ එකක් විය.

- ගරු එස්. ජී. පෙරේරා පියතුමා ලංකා සාහිත්‍ය ලියාපදිංචි කතුවරයකු ලෙස ද, ලංකා ඉතිහාස කමිටුව, රාජකීය ආසියාතික සංගමය ආදියේ සාමාජිකයකු ලෙස ද සේවය කළේය.

- මෙතුමා ලංකා ඉතිහාසය වෙනුවෙන් කළ සේවය අගයකර, 1983.11.22 ලක් රජය මෙතුමාගේ රුව ඇති තැපැල් මුද්දරයක් නිකුත් කළේය.

- මෙතුමා 1950.02.19 දින ස්වර්ගස්ථ විය.

**අතිගරු පීටර් පිල්ලේ පියතුමා (1904 - 1964)**

- යාපනයේ කරෙයිනගර් ප්‍රදේශයේ ජේකබ් මහතා සහ ඇනා පිල්ලේ මියට දාව 1904.10.19 දින වෙන්නප්පුවේ දී මෙතුමා උපත ලැබීය.

- මෙතුමා 1914 දී කොළඹ ශාන්ත බෙනදික් විදුහලට ඇතුළු වී තම මූලික අධ්‍යාපනය ලැබීය.

- 1920 දී ලන්ඩන් කේම්බ්‍රිජ් විභාගයේ සියලුම විෂයන්ගෙන් විශිෂ්ඨ සාමාර්ථයන් ලබා ගත්තේය. 1923 දී B.Sc. විභාගයෙන් සමත් වී විද්‍යා උපාධිධාරියකු ද, 1928 දී B.A. විභාගයෙන් සමත් වී කලා උපාධිධාරියෙකු ද විය. පසුව M.Sc. සහ M.A. විභාග ද සමත් විය.

- 1927 දී නිමල මරිය නිකායට බැඳී පූජක අධ්‍යාපනය ලැබ 1929 දී රෝමයට ගොස් අංජලිකුම් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබ 1931 දී එම විශ්වවිද්‍යාලයෙන් ම Ph.D. උපාධිය ද ලැබීය.

- 1934 නිමල මරිය නිකායේ පූජාප්‍රසාදීතුමකු ලෙස පූජකවරය ලබා 1936 දී රෝමයේ දී දේව ධර්මාචාර්ය උපාධිය ලැබ මහා අධ්‍යාපනඥයකු ලෙස ලංකාවට පා තැබීය.

- මෙතුමා ලංකාවේ තම ප්‍රථම සේවය ලෙස කොළඹ බම්බලපිටියේ ශාන්ත පීතර විදුහලේ ආචාර්යවරයකු ලෙස සේවය කළේය. එම කාලයේ 1936.10.14 දින කතෝලික සමාජ සේවා සංගමය බිහි කළේය. මෙතුමා සමාජ සේවයේ ඉතා උනන්දුවෙන් නියැලුණු පියතුමකු විය.

- 1940.12.08 දින කොළඹ ශාන්ත ජෝශප් විදුහලේ පස්වන විදුහල්පති ලෙස වැඩ භාරගත්තේය.

- මෙතුමාගේ දිගුකාලීන සිහිනය වූයේ දක්ෂතා ඇති සියලුම සිසුන්ට උසස් අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව උදාවිය යුතුය යන්නයි. නමුත් ලංකාවේ ප්‍රමාණවත් තරම් විශ්වවිද්‍යාල නොතිබුණු නිසා, සියල්ලන්ටම උසස් අධ්‍යාපනය හැදෑරීම නොහැකි බැවින්, අ.පො.ස. උසස් පෙළ උසස් ලෙස සමත්, වැඩි ලකුණු ගත් සිසුන්ට පමණක් උසස් අධ්‍යාපනය හැදෑරීමට තෝරාගන්නා ලදී. මේ නිසා ලංකාවට පෞද්ගලික විශ්වවිද්‍යාලයක් අවශ්‍ය බව මෙතුමා වටහා ගත්තේය.

- එබැවින් 1954 දී කොළඹ බොරැල්ල ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනය ආරම්භ කර, රජයේ විශ්වවිද්‍යාලවලට යා නොහැකි වූ සිසුන්ට මෙමගින් උසස් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව උදාකර දුන්නේ ය. තවද මෙතුමා එම ආයතනයේ ප්‍රථම විදුහල්පති (අධ්‍යක්ෂ) ලෙස ද සේවය කළේය.

- එමෙන් ම අධ්‍යාපනඥයකු වන මෙතුමා, මේ වසරේදී ම කොළඹ සිටි සියලුම අධ්‍යාපනඥයන් කැඳවා, ඔවුන්ට සුදුසු සංගමයක් සැමේරියන් නමින් ඇති කළේය.

- මෙතුමා සමාජ නීතිය මුල් කරගෙන 14කට නොඅඩු පොත් සංඛ්‍යාවක් ද, "මා විශ්වාස කරන්නේ කුමක් ද" යන මැයෙන් විශිෂ්ඨ පොතක් ද ලියා බොහෝ දෙනෙකුගේ ප්‍රශංසාවට පාත්‍ර වූයේය.

- මෙතුමා විශිෂ්ට අධ්‍යාපනඥයකු පමණක් නොව විශිෂ්ට ගෘහනිර්මාණ ශිල්පියෙකු ද, සමාජ සේවකයෙකු ද, දාර්ශනිකයෙකු ද වෙයි.

- මෙතුමා බ්‍රිතාන්‍යයේ සිටි ඉතා විශිෂ්ට අධ්‍යාපනඥයන් සත් දෙනාගෙන් විශිෂ්ටතම අධ්‍යාපනඥයා ය.

- 1964.09.27 දින මෙතුමා ස්වර්ගස්ථ විය.

**අතිගරු ඩබ්ලිව්. එල්. ඒ. දොන් පීටර් පියතුමා (1916-2008)**

- වෙල්ගම ලේකම් අප්පුහාමිලාගේ දොන් පීටර් පියතුමා 1916.09.25 දින මීගමුවේ සිට සැ. 5 ක් ඈතින් පිහිටි කොන්දගම්මුල්ල ග්‍රාමයේ උපත ලැබීය.

- තම ප්‍රාථමික අධ්‍යාපනය තමා උපන් කොන්දගම්මුල්ල ග්‍රාමයේ ද, පසුව මීගමුව මාරිස්ස්ටෙලා විදුහලේ ද අධ්‍යාපනය ලැබීය.

- 1935 දී කොළඹ ශාන්ත ඇලෝසියස් කුඩා දෙව්සත්හලට ඇතුළු වී පසුව ශාන්ත බර්නාඩ් මහ දෙව්සත්හලේ දේව ධර්මාචාර්ය උපාධිය හදාරා 1941.03.25 දින පූජාප්‍රසාදීතුමෙකු ලෙස පූජකවරය ලැබීය.

- 1941-1946 දක්වා මීගමුවේ මහාවීදියේ ශාන්ත මරියා දේවස්ථානයේ සහයක පියතුමා ලෙස වසර කීපයක් ද, පසුව කෝට්ටේ ශාන්ත තෝමස් දේවස්ථානයේ මීසම් පාලක පියතුමා ලෙස ද සේවය කළේය.

- 1946 කොළඹ ශාන්ත ජෝශප් විදුහලේ ආචාර්යවරයකු ලෙස සේවය කළේය. මේ කාලයේ දී පාලි භාෂාව මනාව ඉගෙන මෙකල ලංකාවේ ප්‍රබල වීගෙන ආ ජාතිකාභිමානී හැඟීම, ශුද්ධ වූ සභාව තුළත් ඇති කිරීමට වෙහෙස වී කටයුතු කළේය.

- මේ හැඟීම රටේත්, සභාවේත්, සමාජයේත් වර්ධනය කිරීමෙහිලා අති උතුම් එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමන්, ගරු මර්සලින් ජයකොඩි පියතුමන්, ගරු ඩී. ජේ. ඇන්තනී පියතුමන්, ගරු මෝසැසි පෙරේරා පියතුමන් සමඟ අත්වැල් බැඳගෙන වෙහෙස වූයේය.

- 1950 දී උසස් අධ්‍යාපනය ලැබීමට රෝමයේ උර්බානා විශ්වවිද්‍යාලයටත්, පසුව ලන්ඩන් විශ්වවිද්‍යාලයටත් ගොස් ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් Ph.D. උපාධිය ලබාගත්තේය.

- මෙතුමා තමන්ගේ ශ්‍රේෂ්ඨ කෘතීන් වන බුදු දහම සහ ශාන්ත බෙනදික් නිකායේ පැවිදි අධ්‍යාපනය, ශුද්ධ වූ ෆ්‍රැන්සිස් තුමා හා බුදුන් වහන්සේ, බෞද්ධ, කිතුනු පූජක දිවිය ආදී කෘතීන් මගින් කිතු දහම හා බුදු දහම අතර ඇති සම්බන්ධතාව ගැඹුරින් පැහැදිළි කළේය.

- මේ පාසල් ඉතිහාසය තුළත්,පදවිය තුළත් ආදි ශිෂ්‍යයෙකු ප්‍රථම වතාවට විදුහල්පති ලෙස පත්වී කීර්තිමත් වූයේය. ඒ මෙතුමා ය.

- 1971-1976 දක්වාත්, ඉන්පසු 1979-1989 දක්වාත් කොළඹ ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනයේ පීඨාධිපති පියතුමන් වූයේය. මෙතුමා ලංකාවේ කතෝලික අධ්‍යාපනය යන මැයෙන් පොත් කීපයක් ම ලීවේය. ඒවායින් උසස් ම පොත වන්නේ ලංකාවේ පෘතුගීසි සමයේ අධ්‍යාපනය යන පොතයි.

- 1963 දී ලංකාවේ ශුද්ධ සභා ඉතිහාසය ගැන STUDIES IN CEYLON CHURCH HISTORY නමැති පොත ලීවේය. මෙය මෙතුමා ලංකා ඉතිහාසය ගැන ලියූ පොත්වලින් එකකි. මෙතුමාගේ උසස් ඓතිහාසික සොයාගැනීම් නිසා 1965 දී බ්‍රිතාන්‍ය රජය ඓතිහාසික කමිටුවේ ROYAL HISTORICAL SOCIETY හි සාමාජිකයකු ලෙස තෝරාගත්තේ ය.

- මෙතුමා රට වෙනුවෙනුත් සභාව වෙනුවෙනුත් විවිධ සේවාවන් කර ඇත. කොළඹ අගරදගුරු පදවියේ අනුනායක හිමි ලෙස ද රාජ්‍ය අධ්‍යාපන ප්‍රකාශන කමිටුවේ සාමාජිකයකු ලෙස ද, විදුහල්පති සංගමයේ නායකයා ලෙස ද, ලංකා යුනෙස්කෝ සමුළුවේ සාමාජිකයකු ලෙස ද විවිධ සේවාවන් ශ්‍රී ලංකාවට කර ඇත.

- මෙතුමා බොහෝ පොත් ද, 400කට අධික ලිපි ද, සිංහල, දෙමළ, ඉංග්‍රීසි බසින් කුඩා දරුවන්ට බොහෝ කෙටි කථා ද ලියා ඇත. ඉන් සමහරක් නම් වනගත ළමෝ, තේක්ක වත්තේ කථාව ආදියයි. 1998 දී මෙතුමා ලියූ තේක්ක වත්තේ කතාව නම් ළමා කෘතිය ජනාධිපති සම්මානය දිනා ගත්තේ ය.

- ස්ව උත්සාහයෙන් දහම් සරණ ආයතනය ඇතිකර එහි කළමනාකරු ලෙස 1990 - 1995 දක්වා සේවය කළේය. මේ කාලයේ දී මේ ආයතනය මගින්,

  * ක්‍රිස්තු ප්‍රතිපත්ති

  * කතෝලික විනය

  * සාන්තුවරුන්ගේ චරිත කථා

  * ලංකා සභා ඉතිහාසය ආදී මාතෘකා අනුව පොත් 35කට අධික සංඛ්‍යාවක් ප්‍රකාශයට පත් කළේය.

- මෙතුමා 2008.04.24 දින 92 වන වියේ දී ස්වර්ගස්ථ විය.

**අතිගරු නල්ලූර් ස්වාමි ඥානප්‍රගාසර් (1875-1947)**

- රාජසිංහම් ස්වාමිනාදන්, තංගමුත්තු දෙපළගේ පුතණුවන් ලෙස 1875.06.30 දින නල්ලූර් ස්වාමි ඥානප්‍රගාසර් තුමා යාපනයේ මනිපාහි උපත ලැබුවේය.

- බාලවියේදී ම මෙතුමාගේ පියා මියගිය බැවින් මව යාපනයේ අච්චිවේලි ප්‍රදේශයේ කතෝලිකයකු වූ නම්බිමුත්තු මයා හා විවාහ වූවාය. එබැවින් මෙතුමා බෞතීස්මය ලැබ වෛද්‍යලිංගම් යන නම වෙනස්කර ඥානප්‍රගාසම් යන ලැබීය.

- අධ්‍යාපනය අවසන් කළ මෙතුමා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණේය. මේ කාලයේ දී යාපනයේ සේවය කළ ගරු චාර්ල්ස් පියතුමන් හමුවීම හේතුවෙන් රාජ්‍ය සේවය අත්හැර 1885 දී නිමල මරිය නිකායට බැඳුණේය.

- 1901.12.01 දින නිමල මරිය නිකායේ පූජාප්‍රසාදීතුමකු ලෙස පූජාත්වරය ලැබුවේය. 1904 දී යාපනයේ නල්ලූර්වලට ගොස් 3000 කට අධික පිරිසක් කතෝලික දහමට හැරවීය.

- මෙතුමා විශිෂ්ඨ ගණයේ අධ්‍යාපනඥයෙකි. උතුරු ඉන්දියානු භාෂා හා හින්දු දර්ශනවාදය හොඳින් ප්‍රගුණ කළ කෙනෙකි. මෙතුමා ඉතා ආශාවෙන් ඉගෙනගත් විෂයයක් වනුයේ යාපනයේ ඉතිහාසයයි.

- දෙමළ භාෂාව පිළිබඳව පර්යේෂණ කර, දෙමළ භාෂාව පැරණි භාෂාවක් බවත්, ඈත කාලයේ සිට එය ව්‍යවහාරයේ පැවති බවත්, දෙමළ භාෂාවෙන් තවත් භාෂා උපත ලත් බවත්, ඔප්පු කළේය. මෙලෙස ඉන්දු, යුරෝපීය භාෂා සියල්ල ද්‍රවිඩ මාතාවගේ දරුවන් ය යන මතය දැරුවේය.

- ඉතා පැරණි පුස්කොළ පොත්, කාසි ආදිය තොග වශයෙන් එකතු කර, එමගින් දෙමළ භාෂාවේ පෞරාණික බව ඔප්පු කළේය.

- මෙතුමා සිංහල හා ඉංග්‍රීසි බසින් පොත් බොහෝමයක් ලියා ඇත. මෙතුමා ලියූ දෙමළ පොත් අතර,
    i. යාල්පාන වෛපවමාලයි උට්ටුගල්
    ii. යාල් අරසනින් මරන්ද කාසිගල්
    iii. පෘතුගීසි යුගයේ රජවරු
    iv. යාල්පාන වෛපව විමෝෂනම්
    v. තමිලරුම් ඉලංගයුම් (දමිලයන් හා ලංකාව)
    vi. යාල්පාන වරලාට්ටු කල්වි උට්ටුගල්
    vii. දෙමළ සංස්කෘතිය, ආදිය ඉන් සමහරකි.

- මෙලෙස මෙතුමා දෙමළ සංස්කෘතියට බොහෝ සේවාවන් කර 1947 දී ස්වර්ගස්ථ විය.

**අතිගරු සේවියර් එස්. තනිනායගම් පියතුමා**

- ගරු සේවියර් එස්. තනිනායගම් පියතුමා 1913.08.02 දින යාපනයේ නෙඩුම්තිව් හි හෙන්රි ස්ටැනිස්ලාස් කනපතිපිල්ලේ මයා හා සෙලිල් රාසම්මා බස්තියන් පිල්ලේ මියගේ පුතණුවන් ලෙස කරම්පොන් නමැති ප්‍රදේශයේ දී උපත ලැබීය.

- මෙතුමා තම ප්‍රාථමික අධ්‍යාපනය 1920- 1922 දක්වා යාපනයේ ශාන්ත අන්තෝනි විදුහලින් ද, 1923-1930 දක්වා යාපනයේ ශාන්ත පැට්‍රික් විදුහලින් ද ලබා, 1931-1934 දක්වා කොළඹ ශාන්ත බෙනදික් විදුහලින් අධ්‍යාපනය ලැබ උපාධිය ද ලබා ගත්තේ ය.

- පසුව උසස් අධ්‍යාපනය සඳහා ඉන්දියාවේ අන්නාමලර් විශ්වවිද්‍යාලයට ගොස් සාහිත්‍යයෙන් ශාස්ත්‍රපති උපාධිය ලබා ගත්තේය.

- තම උසස් අධ්‍යාපනයෙන් පසු මැලේසියාවේ විශ්වවිද්‍යාලයක ඉන්දීය අධ්‍යාපන කථිකාචාර්යවරයකු ලෙස 1960-1969 දක්වා සේවය කළේය. ලන්ඩන් විශ්වවිද්‍යාලයේ කලානිධි උපාධිය ද, රෝම විශ්වවිද්‍යාලයෙන් උපාධියක් ද හිමිකර ගත්තේය.

- මෙතුමා විවිධ භාෂා ලිවීමට, කථා කිරීමට හැකියාව තිබූ කෙනෙකි. ප්‍රංශ, ජර්මන්, ඉතාලි, ස්පාඤ්ඤ, පෘතුගීසි භාෂා මනාව ප්‍රගුණ කළ කෙනෙකි.

- ලොවපුරා දමිල භාෂාව පැතිරවීමේ අදහසින් ටැමිල් කල්චර් නම් සඟරාව ආරම්භ කර 1951-1959 දක්වා එහි කර්තෘ ලෙස සේවය කළේය.
- මෙතුමා ජාත්‍යන්තර දෙමළ පර්යේෂණ සංගමය ආරම්භ කර (I.A.T.R.) එහි ලේකම් ලෙස ද කටයුතු කළේය.
- 1960 දී මෙහි ප්‍රථම සම්මන්ත්‍රණය මැලේසියාවේ ක්වාලාලම්පූර් විශ්වවිද්‍යාලයේ ද, දෙවන සම්මන්ත්‍රණය ඉන්දියාවේ චෙන්නායිවල ද, තෙවන සම්මන්ත්‍රණය යාපනය නගරයේ ද පවත්වන ලදී.
- මෙතුමා 1938 දී රෝමයේ කතෝලික පූජාප්‍රසාදීතුමකු ලෙස පූජකවරය ලද පසු ඉන්දියාවේ තූත්තුකුඩි පදවියේ සේවය ඇරඹුවේය. එවිට එම පදවියේ වට්ටිකන්කුලම් ප්‍රදේශයේ පිහිටි ශාන්ත තෙරේසා උසස් විද්‍යාලයේ ආචාර්යවරයකු ලෙස ද, උප විදුහල්පති ලෙස ද සේවය කර, ඉංග්‍රීසි, දෙමළ, ඉතිහාසය, ආගම ආදී විෂයයන් මනාව ඉගැන්වූයේය.
- මෙතුමා තම ජීවිත කාලය තුළ දී, සැඟවී තිබූ දෙමළ පොත් ලොවට හෙළිකළේය. ඒවායින් සමහරක් වූ, I හෙන්ඩ්‍රික් හෙන්රිගල් ලියූ දෙමළ ව්‍යාකරණ පොත, දෙමළ කෝෂය ආදිය 1954 දී ලිස්බන් පුස්තකාලයෙන් සොයාගත්තේ ය. ජේසු නිකායේ පියවරු ලියූ පෘතුගීසි ශබ්දකෝෂය පැරිසියේ ජාත්‍යන්තර පුස්තකාලයේ තිබී මෙතුමා සොයාගත්තේය. තම්බිරාන් වනක්කම් යන පොත ඇමරිකා එක්සත් ජනපදයේ හර්බට් විශ්වවිද්‍යාලයෙන් ගෙන එය පරීක්ෂා කළේය. ක්‍රිස්තියානි වනක්කම් යන පොත ඡායාපිටපත් කර ලොවපුරා පැතිරවීමට කටයුතු කළේය.
- මෙතුමා දෙමළ බස වෙනුවෙන් තමන් කළ දූත මෙහෙවර සියල්ල එකට ගෙන තමින් තූදු (දෙමළ මෙහෙවර) නමින් පොතක් ලෙස එළිදැක්වූයේය.
- රටවල් කීපයකටම ගොස් මෙතුමා දෙමළ භාෂාව, දෙමළ සංස්කෘතිය, දෙමළ සාහිත්‍යයේ ශ්‍රේෂ්ඨ බව කියාපෑවේය. මෙතුමාගේ දේශනාවලට සවන්දුන් අය දෙමළ ගැන දැනගැනීමට අධික උනන්දුවක් දැක්වූහ. 1948 -1950 කාලය තුළ ලොවපුරා ගොස් දෙමළ ගැන ප්‍රචාරය කළෝය.
- අවුරුදු 14 දී, ලියෝ ටෝල්ස්ටෝයි ලියූ පුනර්ජීවනය නම් පොත කියවූ පසු, දෙමළ බස ගැන පර්යේෂණ කිරීමටත්, ආගමික හා අධ්‍යාපන සේවය කිරීමටත්, තමන් පෙළඹුණු බව තමන් විශ්වාස කරන බව තම ජීවිත කථාවේ දී එතුමා පවසා ඇත.
- මෙතුමා පෘථුල දැනුමක් ඇති, අන් ආගම් හෙළානොදකින ගති ඇති කෙනෙකි. කිතු දහම පිළිබඳ ගැඹුරු භක්තියක් ද, දෙමළ බස ගැන ඉමහත් ගෞරවයක් ද ඇති කෙනෙකි.
- මෙතුමාගේ දැනුම් සම්භාරය, පැහැදිළි චින්තනය, මනහර කටහඬ, මෙතුමාගේ සේවයට ඉමහත් රුකුලක් විය.
- දෙවිඳුන්ට බැගෑපත් ව, තම සංස්කෘතිය වෙනුවෙනුත්, රට වෙනුවෙනුත් කෙනෙකු තම හැකියාවන් වැය කිරීම, පරාර්ථකාමී ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් බව 1995 දී කොළඹ දී කළ කථාවක මෙතුමා සඳහන් කළේය.
- මෙතුමා බොහෝ දැනුම් ඇත්තෙකි. ආධ්‍යාත්මිකවාදියෙකි. චතුර කථිකයෙකි. ලොව පුරා සිටි දෙමළ උගතුන් එක්කළ කෙනෙකි. මෙතුමා දෙමළ බසට කළ සේවය අගයමින් ඉන්දියාවේ තෙවන දෙමළ සමුළුව පැවති මදුරෙයිවල දී මෙතුමාගේ පිළිරුවක් තනන ලදී.

**ගරු එච්. එස්. දාවිත් පියතුමා**

- මෙතුමා යාපනය පදවියේ පියතුමෙකි. ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයෙකි. බොහෝ පදවි ලද කෙනෙකි.
- ගරු ඥානප්‍රකාසම් පියතුමා මියගිය පසු, එතුමා ආරම්භ කර තිබූ ශබ්දකෝෂය පිළිබඳ සේවාව ඉදිරියට කරගෙන ගියේය.
- මෙතුමා 1950 දී එංගලන්තයේ සේවය කර බොහෝ දෙනාගේ ප්‍රශංසාව ලද කෙනෙකි.
- ගරු ඥානප්‍රගාසම් පියතුමා, ගරු තනිනායගම් පියතුමා වැනි ශ්‍රේෂ්ඨයන් ලෙසට දෙමළ බස වෙනුවෙන් මෙතුමා ද බොහෝ පර්යේෂණ කළේය.
- මෙතුමාගේ මහළු වියේ දී තමා ඇරඹූ සේවාව, දෙමළ සමූහයා නොනවත්වා කරගෙන යායුතුය යන අරමුණින් තමන් සතුව තිබූ දහස් ගණන් පොත්, යාපනය පුස්තකාලයට පරිත්‍යාග කළේය.

**අති ගරු සිරිල් අබේනායක බිෂොප් තුමා (රදගුරු හිමිපාණෝ - 1911-1991)**

- වර්ෂ 1911 හි පෙබරවාරි මස 22 වන දින ඇඩ්වෙන් සහ සොෆියා අබේනායක යුවළට දාව මෙලොවට බිහි වූ සිරිල් ලින්ඩන් අබේනායක සිය අධ්‍යාපනය සඳහා ඇතුළත් කරන ලද්දේ කොළඹ රාජකීය විද්‍යාලයටය. එහිදී ඉතා හොඳින් අධ්‍යාපනය නිමකළ ඔහු විශ්වවිද්‍යාල ශිෂ්‍යත්වයක් ලැබ, විශ්වවිද්‍යාලයට ඇතුළත් විය. ඔහු විශ්වවිද්‍යාලයයෙන් පිටවූයේ ගෞරව උපාධියක් ද සහිතව ය. ඒ ඉතිහාසය විෂය මුල්කරගෙනය. ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක්වෙතැයි බොහෝ දෙනෙකු අපේක්ෂා කළද, එසේ නොවීය. ඔහු විශ්වවිද්‍යාල ආචාර්‍ය මඩුල්ලට ද එක් නොවීය. ඒ වෙනුවට ඔහු තමාට ලැබුණු දේව කැඳවීමට හිස නැමූ අතර, ඒ සඳහා වැඩිදුර ඉගෙනීම වෙනුවෙන් ලන්ඩන් විශ්වවිද්‍යාලයය වෙත පියනැඟීය. එහිදී ද ගෞරව උපාධියක් ලබාගත් එතුමා සිය දේවධාර්මික හැඩගැහීමට යොමු වූයේ ශාන්ත බොනිෆස් දේවධර්ම විද්‍යාලයෙනි.
- නැවතත් ශ්‍රී ලංකාවට පැමිණි මෙතුමා වර්ෂ 1936 දී දියාකොන්වරයෙකු ලෙස හෝර්ස්ලි බිෂප්තුමා අතින් ආලේපය ලැබීය. ඉන්පසු ගල්කිස්සේ ශාන්ත තෝමස් විදුහලේ නියෝජ්‍ය කුලාචාර්‍යවරයා ලෙස හා ගුරුවරයකු වශයෙන් පත්වීම ලබා එහි සේවයට ඇතුළත් විය. ඉන්පසුව එවකට ලංකා සභා පාසල් වූ ඌව මධ්‍ය මහා විද්‍යාලයයේ හා වත්තේගම ක්‍රිස්තුදේව විද්‍යාලයයේ පිළිවෙළින් උප විදුහල්පතිවරයා හා විදුහල්පතිවරයා වශයෙන් සේවය කරන ලදී. මෙහිදී අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් එතුමා කර ඇති මෙහෙය අපමණ ය.
- ක්‍රීඩා හා විෂය සමාන්තර කටයුතු සමගාමී ව පරිපූර්ණ අධ්‍යාපනය කෙරෙහි සිසුන් මෙහෙයවූ අතර නියම එඬේරකු ලෙස මඟපෙන්වීය.

  සිය කැමැත්තෙන් ම වර්ෂ 10ක් පුරා දියාකොන්වරයකු වශයෙන් සේවය කළ මෙතුමා පූජක පදවියට ආලේපය ලැබූයේ 1946 දී ය. ඉතා නිහතමානී පුද්ගලයකු ලෙස දිවි ගෙවූ මෙතුමා විවිධ දක්ෂතාවලින් පරිපූර්ණ කෙනෙකු විය. විවිධ දේවස්ථාන පළාත් හි සේවය කළ මෙතුමා සිලෝන් චර්ච්මන් නමැති ලංකා සභා ප්‍රකාශයනයෙහි කතුවරයා ද විය. එමෙන් ම ලංකා සභා පාසල් පරිපාලන මණ්ඩලයේ කළමනාකරු වශයෙන් සේවය කළ මෙතුමා 1964 දී කොළඹ දියෝකීසියේ අනුනායක ධූරයට පත්කරනු ලැබීය. එකලම මෙතුමා පිළිමතලාව දේවධර්ම විද්‍යාලයයේ විදුහල්පතිවරයා ද විය.
- 1971 දී බිෂොප් තනතුරට ආලේපය ලැබ 1977 දක්වා කොළඹ දියෝකීසියේ 10 වන බිෂොප්වරයා ලෙස සේවය කළේය. 1991 මැයි මස 8 වන දින එතුමා ස්වර්ගස්ථ විය.

**ගරු විලී වික්‍රමසිංහ පියතුමා**

ඉතා උසස් අධ්‍යාපනයක් ලබා ඇති මෙතුමා අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් කර ඇති සේවය ඉමහත් ය.

- ඉන්දියාවේ සෙරෙම්පු විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු වශයෙන් මහඟු සේවයක් කරන ලදී.
- පිළිමතලාවේ දේවධර්ම ශාස්ත්‍රාලයේ ද බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස බොහෝ කල් සේවය කළේය.
- කේරී විද්‍යාලයයේ වසර 15 ක් පමණ විදුහල්පතිතුමා ලෙස සේවය කළ මෙතුමා දරුවන්ට සම්පූර්ණ අධ්‍යාපනයක වටිනාකම පහදාදීමට නිරතුරුවම ක්‍රියාකරන ලදී. අංග සම්පූර්ණ දරුවකු බිහිකිරීමට අධ්‍යාපනය මෙන් ම ක්‍රීඩාව ද අවශ්‍ය බව අවධාරණය කරමින් ඒ සඳහා නිරතුරුවම දිරිදරන ලදී.
- විශ්‍රාම ගැනීමෙන් පසුව ද කේරී විද්‍යාලයීය පාලක/කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය (Board of Governers) දරමින් විශාල සේවයක් අධ්‍යාපනය වෙනුවෙන් ඉටුකරන ලදී.

**ගරු කැනන් ආර්. එස්. ද සේරම් පියතුමා**

කැනන් ආර්.එස්. ද සේරම් පියතුමා ගල්කිස්ස ශා.තෝමස් විදුහලේ ආදි සිසුවෙකි. 1918 දී එංගලන්තයට ගිය ඔහු ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයයෙන් දෙවන පෙළ ගෞරව උපාධියක් ද සහිතව සමත් වූ අතර, එහි ඉගෙනුම ලැබූ කීර්තිමත් සිසුවකු විය. උපාධියට පසු එතුමා කියුඩෙස්ඩන් දේවධර්ම විද්‍යාලයට ඇතුළත්වී එහි දී පූජකවරයට ආලේපය ලැබීය. ශ්‍රී ලංකාවට පැමිණ මහනුවර ශා.පාවුලු දේවස්ථානයේ දේවගැතිතුමා ලෙස සේවය කළ අතර, 1925 දී ශා. තෝමස් විදුහලේ ආචාර්ය මණ්ඩලයට එක්විය. 1926 දී එතුමා ශා.තෝමස් විදුහලේ උප විදුහල්පතිවරයා වශයෙන් පත් කරන ලදී. දෙවරක් වැඩබලන විදුහල්පතිවරයා ලෙස සේවය කරන ලදී. 1932 දී එතුමා ශා.තෝමස් විද්‍යාලයයේ විදුහල්පතිවරයා ලෙස පත්වීම ලැබූ අතර, එතැන් පටන් එතුමාගේ සේවාව තවත් පුළුල් විය. මනා සමබර අධ්‍යාපනයක් ලබාදීම එතුමාගේ ඒකායන පරමාර්ථය වූ අතර, පාසල තුළ ඒ සඳහා විශාල ක්‍රියාමාර්ග රැසක් අරඹන ලදී. ඉතා කෙටි කලක් තුළ පාසලේ විනය මනාව දියුණු කළ අතර, එතුමා විසින් ඵලදායී වැඩසටහන් රැසක් අරඹන ලදී. සිසුන් තුළ ඇති විවිධ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා මහත් කැපවීමකින් ක්‍රියාකළ අතර, ක්‍රීඩා බොහොමයක් පාසලට හඳුන්වා දෙන ලදී. මේ සා මහත් ක්‍රියාදාමයන් රැසක් මගින් පාසල් අධ්‍යාපනය එතුමා මගින් නව මඟකට යොමු කෙරිණි.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- විදේශීය පාලන යුගයේ කිතුනු අධ්‍යාපන සේවාව පහත සඳහන් මාතෘකා ඔස්සේ සාකච්ඡා කරන්න.
- නිදහසින් පසු යුගයේ දී අධ්‍යාපනය නඟාසිටුවීමට ගත් පියවර පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පාසල් රජයට පවරා ගැනීම නිසා ඇති වූ ප්‍රතිඵල පිළිබඳ ව කතිකාවතක් ගොඩනගන්න.
- කිතුනු අධ්‍යාපනඥයින් අතින් ලාංකීය අධ්‍යාපනය නඟාසිටුවීමට ලද දායකත්වය වෙන වෙනම සාකච්ඡා කරන්න.

**නිපුණතාව 9.0** : **ශ්‍රී ලාංකේය සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් කිතුනු සභාවෙන් ලද දායකත්වය විස්තර කර සමාජ අභිවෘද්ධිය වෙනුවෙන් කිතුනුවකු ලෙස කටයුතු කරයි.**

**නිපුණතා මට්ටම 9.2** : ශ්‍රී ලාංකේය සමාජයේ සුබසාධනය හා මානව හිමිකම් වෙනුවෙන් සභාවේ දායකත්වය දැන පුරවැසි යුතුකම් ඉටුකරයි.

**කාලය** : කාලච්ඡේද 15

**ඉගෙනුම් ඵල** :

- ශුද්ධ වූ බයිබලීය චින්තනය හා ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව කිතුනු දයාව යන්න නිවැරදිව වටහාගෙන එම දයාව නිසාම සමාජ සුබසාධනයට දායක වෙයි.
- ශ්‍රී ලාංකේය ජන සමාජයේ සුබසාධනය උදෙසා සභාවේ දායකත්වය උගෙන කිතුනු කැඳවීම තුළ එම සුබසාධනය සඳහා හදවතින්ම ඉදිරිපත් වෙයි.
- සියලු මැවිලි අතර මනුෂ්‍යයාගේ උතුම් තත්ත්වය වටහාගෙන මානව හිමිකම් සුරැකීමට සක්‍රීය ලෙස දායක වෙයි.
- සමාජීය වගකීම් ඉටුකිරීමෙහිලා සුව සේවාව හා සුබසාධනයේ වැදගත්කම අවබෝධ කරගෙන කිතුනු දයාව පෙරදැරි කොට ඒ සඳහා ඉදිරිපත් වෙයි.
- මානව හිමිකම් සුරැකීමට හා සමාජ සුබසාධනයට, සමාජ සාධාරණත්වයට දිවි කැපකළ උදාර චරිතවලින් ආලෝකය ලැබ ඒ සඳහා තම වගකීම් ඉටු කිරීමට පෙළඹෙයි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 9.2.1 කිතුනු දයාව හා සමාජ සුබසාධනය

**ශුද්ධ වූ බයිබලීය චින්තනය**

- පැරණි ගිවිසුම

සියලු මැවිලි අතර උසස්තම මැවිල්ල මිනිසා බවත්, මිනිසා තනිව විසීම දෙවියන් වහන්සේගේ අභිමතය නොවූ බවත් උත්පත්ති පොත ආරම්භයේදී ම සඳහන් කරයි. (උත්පත්ති 2 /18) එහෙයින්, මිනිසා සමාජීය සත්වයෙකි. දෙවියන් වහන්සේ මිනිසා පවුල් ජීවිතයට, පවුල් ජීවිතයකට හෙවත් සමාජීය ජීවිතයකට කැඳවන බව මින් පැහැදිලි ය. සමාජීය ජීවිතයේ සාර්ථකත්වය සඳහා ආත්මාර්ථය බිඳහැර පරිත්‍යාගශීලී බවකින් ජීවත්වීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා දේව ප්‍රේමය හා දයාව තුළ ජීවිත ගොඩනගා ගැනීමට අවශ්‍යය. දයාව පෙරදැරි කරගෙන සාධාරණත්වයෙන් කටයුතු කිරීම මගින් සමාජයේ පොදු යහපත හා සැබෑ සාමය ගොඩනැගෙන බව ශුද්ධ වූ බයිබලීය චින්තනය අපට පවසයි.

මෝසස් තුමාගේ නායකත්වය යටතේ ඊජිප්තුවේ වහල්කමින් මිදුණු ඊශ්‍රායෙල් ජනයා පොරොන්දු දේශයට යන ගමනේ දී, දෙවි සමිඳාණන් වහන්සේ ඔවුනට දුන් නීති නියෝග හා ඉගැන්වීම්වල හරය වූයේ සහෝදර දයාවෙන් එකිනෙකාට යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරීමයි. විශේෂයෙන් එම සමාජයේ ජීවත් වූ දුගී දුප්පතුනට, අසරණයන්ට, වැන්දඹුවන්ට හා දරුවන්ට දයාව දැක්වීම හා සරණය පෑම මෙම අණපණත් හා නියෝගවලින් වඩා ඉස්මතු වෙයි.

- ලෙවී ව්‍යවස්ථාව 19/9, 10, 13, 15, 17,18
- ලෙවී ව්‍යවස්ථාව 25/35 - 38
- නික්මයාම 22/21-27

ඇසට ඇස ද, දතට දත ද (නික්මයාම 21/24) යන නීතියෙන් පිළිබිඹු වන්නේ ද සමාජ සාධාරණත්වයයි. එය, බැලූ බැල්මට පළිගැනීමක් සේ දිස්වුව ද, එකළ සමාජ සන්දර්භය තුළ තමාට සිදුවූ හානිය ඉක්මවා යන හානියකට කිසිසේත් අවසරයක් නොදෙන සාධාරණත්වයක් ඉන් ගම්‍ය වේ.

- නව ගිවිසුම

"ඇසට ඇස ද, දතට දත ද"යන පුරාණ ගිවිසුමේ නීතිය, ඉන් ඔබ්බට ගොස් ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් හා ජීවිතාදර්ශය මගින් උඩුයටිකුරු වී "ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤාකරන්න." (මතෙව් 5/43) ලෙස සහෝදර ප්‍රේමයේ නව දැක්මකින් යුතුව එළිදකින අයුරු ක්‍රිස්තුස් වහන්සේගේ කන්ද උඩ දේශනයේ දැක්වේ.

උන්වහන්සේගේ ඉගැන්වීම් හා දේශනා තුළින් ප්‍රකට වූ මෙම ප්‍රේමයේ නව අභිධර්මය කුරුසියේ ජීවිත පූජාව මගින් තහවුරු වී සතුරන්ට පවා සමාව දෙන සීමාවකින් තොර ප්‍රේමයක් උන්වහන්සේගේ ජීවිතයේ අපි දකින්නෙමු. කිතුනු දයාව හා එකිනෙකාගේ සුබසාධනය සඳහා පදනම හා ජවය වන්නේ කිතුනු අනුගාමිකයන්ගේ ජීවිතවල ද තිබිය යුතු මෙම ප්‍රේමයයි.

ජාතීන්ගේ විනිශ්චය දවසේ දී එඬේරකු එළුවන්ගෙන් බැටලුවන් වෙන් කරන්නාක් මෙන් දෙවියන් වහන්සේ ජනතාව දෙපසට වෙන්කර පවසන "මම සාගිනිව සිටියෙමි. ඔබ මට කන්න දුන්නාහුය. පිපාසා වී සිටියෙහි, ඔබ මට බොන්න දුන්නාහුය. . ." (මතෙව් 25/31-46) යන ඉගැන්වීමෙන් උන්වහන්සේ පසක් කරන්නේ ප්‍රේමයේ ජීවිතය හා දයාව දැක්වීම ක්‍රිස්තු ශ්‍රාවකයකු, අනුගාමිකයකු වීම නිසාම උරුම වන, වෙන්කළ නොහැකි, බැහැර කළ නොහැකි වගකීමක් හා යුතුකමක් බවයි. සමාජයේ වෙසෙන කාහට වුව ද යහපතක් කලේ නම් ඒ කළේ උන්වහන්සේටම බව ද මින් පැහැදිළිය. "සැබැවින් ම මම ඔබට කියමි. මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතාම සුළු තැනැත්තාට වුව ද ඔබ එසේ කළා නම් එය කළේ මටය." (මතෙව් 25/40) එසේ නොකළා නම් නොකළේ ද උන්වහන්සේටම ය. (මතෙව් 25/45)

එම නිසා, කිතුනු දයාව යනු කිතුනු ශ්‍රාවකයකුට බැහැර කළ නොහැකි ශ්‍රාවකත්වයේම යුතුකමකි. තමා ජීවත්වන කිනම් ජීවිත තත්ත්වයක, රැකියාවක වුව ද ජීවත්වන ස්ථානය, සමාජ පරිසරය තුළ සමාජ සුබසාධනය හා පොදු යහපත වෙනුවෙන් ඇපකැප වී දයාවේ පුණ්‍ය ක්‍රියාවල යෙදීමට සිය ස්වාමියාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගෙන් නියමවුණු ප්‍රේමයේ පණතක් කිතුනුවනට ලැබී ඇත. කිතුනුවාට ඉන් බැහැරවීමට නොහැකිසේ ම කිසිවෙකුට එය බාහිර බලපෑමකින් හෝ නීතියකින් නතර කිරීමට ද නොහැකිය.

බයිබලීය දැක්මට අනුව ගොඩනැගුණු කිතුනු චින්තනය, අසල්වැසියාට ප්‍රේම කිරීමේ ණය යුක්තිය අපට සිහිගන්වයි. තවද, තමාට මෙන් ම අසල්වැසියාට ප්‍රේම කිරීම දේව ප්‍රේමය නිසාම සිදුවන්නකි. (1 ජොහන් 4/7-19) ක්‍රිස්තියානි දයාවේ අරමුණ, අසල්වැසියාට ප්‍රේමකිරීම මගින් දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම බව මින් ඉතා පැහැදිළි ය.

සියලු ධර්මතා අතර ශ්‍රේෂ්ඨතම වන්නේ ප්‍රේමයයි. ප්‍රේමය නොමැති තැන ඇත්තේ හිස්බවකි. පුහු ඝෝෂාවක් පමණි. (1 කොරින්ති 13/1-13) එහෙයින්, ප්‍රේමය, දයාව නොමැති තැනැත්තා සැබෑ කිතුනුවකු ද නොවන බව පැහැදිළි ය.

දෙවියන් වහන්සේට හා අසල්වැසියාට ප්‍රේම කිරීම හැර ශ්‍රේෂ්ඨ අන් කිසි ආඥාවක් නැත. (මාක් 12/29-31) මා ඔබට ප්‍රේම කලාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න යනු ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට දුන් අලුත් ආඥාවයි. (ජොහන් 13/34) අප උන්වහන්සේගේ ගෝලයන් බව සියල්ලන් දැනගන්නේ මෙම ප්‍රේමකිරීම නිසා බව ද උන්වහන්සේ පවසති.

කතෝලික සභා ධර්මෝපදේශය (නො 1889, 2196)

### 9.2.2 ශ්‍රී ලංකාව තුළ සමාජ සුබසාධන කටයුතු

කිතුනු දයාව පෙරදැරි කරගෙන සමාජයේ පොදු යහපත වෙනුවෙන් කටයුතු කිරීම සහ සමාජ සුබසාධනයට දායකවීම කිතුනු වගකීමයි. සමාජ සුබසාධනයෙහිලා වැදගත් වනුයේ භෞතික දියුණුව පමණක් නොව මිනිසා පූර්ණ මනුෂ්‍යයෙකු ලෙස සමාජයේ ජීවත්වීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමයි. දේව සමානකමට මවන ලද මිනිසාගේ එම මිනිස් ගරුත්වය ඔප්නැංවෙන ලෙස කටයුතු කිරීමට සහාය වීමයි.

ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ දී මෙන් විශේෂයෙන් වර්තමානයේ ද මෙම දැක්ම අනුව කිතුනු දයාව පෙරදැරි කරගෙන ජාති, ආගම්, කුල, පංති ආදී භේද නොතකා සමාජ සුබසාධනය හා මානව සංවර්ධනයට අදාළ ක්‍රියාවන්හි සභාවක් ලෙස ද විවිධ සමිති හා සංවිධාන ලෙස ද පෞද්ගලික වශයෙන් ද කිතනුවෝ නිරතව සිටිති.

16 ශතවර්ෂයේ මෙරටට පැමිණි කිතුනු මිෂනාරී නිකායයන්ගේ සේවාව පිළිබඳ පිරික්සන කළ ඔවුන්ගේ දූත සේවාවේ අරමුණ වූයේ ආත්මයන් ගලවා ගැනීම බව ඓතිහාසික ලේඛනවල සඳහන් වේ. එහෙත් මිනිසා ආත්මයකින් පමණක් හෙබි පුද්ගලයකු නොව ශරීරයකින් ද හෙබි ය. එම නිසා ආත්මික අවශ්‍යතා මෙන් ම ශාරීරික අවශ්‍යතා ද මනුෂ්‍යත්වයට නිගරුවක් නොවන ලෙස ජීවිතය ගෙනයාමට අවශ්‍ය මූලික පහසුකම් වෙනුවෙන් ද ඔවුන් කටයුතු කළ බැව් පැහැදිළි ව පෙනේ. ආරම්භයේ සිටම සභාව මිනිස් අවශ්‍යතා සපුරාලීම සඳහා දයාවේ පුණ්‍ය ක්‍රියාවල යෙදෙමින් සේවාවේ නියැලුණු බව පෙනී යයි. වර්තමානයේ දී නොයෙකුත් ශාරීරික හා භෞතික මිනිස් අවශ්‍යතා සඳහා ජනතාව කිතුනු දේවස්ථාන, ආයතන හා සංවිධාන වෙත ජනතාව ඇදී එන්නේ මෙම කිතනු දයා සරණ සේවා පිළිබඳ සමාජගත වී ඇති ආකල්ප හේතුකොට බව පැහැදිළි ය.

පෘතුගීසි ආගමනයේ සිට මේ දක්වා ගෙවී ගිය කාලවකවානුව තුළ සිදු වූ කිතුනු දයා සේවාවන් පිළිබඳ නිරීක්ෂණය කරන කළ ස්ත්‍රී පැවිදි නිකායන්ගේ පැමිණීම හෙවත් ගරු කන්‍යා සොහොයුරියන්ගේ දූත සේවාව වැදගත් සාධකයක් සේ ඉස්මතු වෙයි. මෙය ලංකා ඉතිහාසයේ යටත් විජිත යුගයේ සිදුවූ වැදගත් විමුක්තිදායක සිද්ධියකැයි හැඳින්වූවාට වරදක් නැත. පසුව පැමිණි පිරිමි පැවිදි නිකායන්ගෙන් සිදුවූ සේවාව ද මේ හා බැඳේ. එම නිකායන්ගෙන් සිදුවූ සේවාවන් හා ඉතිහාසය පිළිබඳ ස්වයං අධ්‍යයනයක යෙදීම ඉතා යෝග්‍ය ය.

ඉහත සඳහන් කළ විදේශවලින් පැමිණි පැවිදි නිකායන් මෙන් ම ඊට පරිබාහිර ව මෙරට ආරම්භ වී ක්‍රියාත්මක වන පැවිදි නිකායන් තමන්ට ආවේනික වූ කරිස්මාව ඔස්සේ සේවාවන්හි නිරත වුව ද ඒ සෑම සේවාවකට ම පදනම වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් මත පදනම් වූ කිතුනු දයාවයි.

මෙම පැවිදි නිකායන්ගෙන් සිදුවූ හා දැනටමත් සිදුවන සේවාවන් අතර රෝගීන්ට උපස්ථාන කිරීම, අනාථ ළමුන් හා හිංසාවට, අතවරවලට ලක්වූ අවිවාහක මව්වරුන් රැකබලා ගැනීම, අන්ධ, ගොළු, බිහිරි හා වෙනත් ආබාධයන්ට ලක්වූ දරුවන් රැකබලා ගැනීම හා ඔවුනට සරිලන අධ්‍යාපනයක්, වෘත්තීය පුහුණුවක් ලබාදීම, මහලු හා වැඩිහිටියන් විශේෂ නිවාසවල රැකබලා

ගැනීම, විධිමත් පාසල් අධ්‍යාපනය, වීථි දරුවන්ගේ නොවිධිමත් අධ්‍යාපනය, සිරගත වූවන්ට හා මානසික ආබාධවලට ලක්වූවන්ට සරණය, උපදේශන සේවා, රෝහල් හෙද සේවාව, මන්ද මානසික දරුවන් රැකබලා ගැනීම, පවුල් අපෝස්තලික සේවා හා යුද්ධයෙන් අවතැන් වූ දරුවන් සහ සරණාගත කඳවුරුවල සිටින්නන්ට සේවා සැපයීම සඳහන් කළ හැකිය. මෙම සේවාව විවිධ ක්ෂේත්‍රවල විසිරී පැවතුන ද එහි අරමුණ හා පදනම කිතුනු දයාව මිස අනෙකක් නොවන බැව් පැහැදිළි ය.

වර්තමානයේ සභාව තුළ රදගුරු පදවි මීසම් හා කිතුනු දේවස්ථාන මට්ටමින් ද, පැවිදි නිකායන්ගේ හා පූජාප්‍රසාදීතුමන්ලාගේ හා රාජගුරු ප්‍රසාදි තුමන්ලාගේ උදව්වෙන් මෙවැනි බොහෝ දයාවේ සේවාවන් ක්‍රියාත්මක වේ. ඒවා විවිධ ආයතන, සමිති සමාගම්, සංවිධාන ස්වරූපයෙන් ද ක්‍රියාත්මක වේ.

- **කිතුනු සමාජ සුබසාධන දයා සේවා ආයතන**

**කරිටාස් (ශ්‍රී ලංකා) - සෙඩෙක්** CARITAS (SRI LANKA) - SEDEC

මෑත ඉතිහාසයේ මෙරට කතෝලික දයා සරණ සේවා හා සමාජ සංවර්ධන, සුබසාධන කටයුතු නිරීක්ෂණය කිරීමේ දී ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලයේ යුක්තිය, සාමය හා මානව සංවර්ධනය පිළිබඳ ජාතික කතෝලික කොමිසම යටතේ ක්‍රියාත්මක, මෙරට කතෝලික සභාවේ සමාජ සේවා අංශය වන කරිටාස් (ශ්‍රී ලංකා) - සෙඩෙක් ආයතනය වැදගත් තැනක් ගනී.

1968 දී ස්ථාපිත, දැනට ශ්‍රී ලංකාවේ සෑම රදගුරු වසමකම විවිධ නම්වලින් දයා සේවාවේ හා සමාජ සුබසාධනයේ යෙදෙන කරිටාස් (ශ්‍රී ලංකා) - සෙඩෙක් ආයතනය විශේෂයෙන් මිනිසුන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් සුරැකීම, සමාජීය අවශ්‍යතා සපුරාලීම, මානව සංවර්ධනය හා සාධාරණත්වයෙන් හෙබි සමාජයක් ගොඩනගන්නට විවිධ ව්‍යාපෘති හා ක්‍රියාමාර්ග ඔස්සේ දායක වෙයි.

**සාන්ත වින්සන් ද පාවුලා දයා සේවාව** (St. VINCENT DE PAUL SOCIETY)

ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක මෙම දයා සේවාව ශ්‍රී ලංකාවේ විවිධ රදගුරු වසම්වල ස්ථාපිත මධ්‍ය මණ්ඩල මුල් කරගෙන මීසම් මට්ටමින් ක්‍රියාත්මක වේ. දේවස්ථාන මට්ටමේ ගිහි සැදැහැවතුන් එකට එක්වී පරිත්‍යාගශීලීන්ගේ ආධාර මගින් දයා සරණ සේවාවේ නියැලීම දක්නට ලැබේ.

**තරුණ ක්‍රිස්තියානි සංගමය** (YMCA)

විවිධ කිතුනු සභා සාමාජිකයින්ගේ එකතුවකින් සැදි ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අනුබද්ධිත සමාජ සේවා හා දයා සේවාවන්ගේ නිරත ආයතනයකි.

**තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය** (YWCA)

විවිධ සමාජ සේවා හා දයා සේවා ව්‍යාපාතිවල නිරතවන විවිධ කිතුනු සභා සාමාජිකාවන් (කාන්තා) ගේ එකමුතුවකින් සැදි ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අනුබද්ධිත ආයතනයකි.

### 9.2.3 මානව හිමිකම් හා සමාජ සංවර්ධනය

ඕනෑම සමාජයක උන්නතිය හා සංවර්ධනය රඳා පවතිනුයේ එම සමාජයේ ගොඩනැගෙන සාමය හා සංහිඳියාව මත ය. එම සාමය හා සංහිඳියාව ඇතිවීම සඳහා විශේෂයෙන් හේතු වනුයේ සමාජයේ පුරවැසියන්ගේ මානව හිමිකම් රැකදීම හෙවත් සුරැකීමයි. සියලු මනුෂ්‍යයන්ගේ මනුෂ්‍යභාවයට උරුම වූ ගරුත්වය රැකෙන සේ සාධාරණත්වයෙන් සැළකීමයි.

මානව ඉතිහාසය පුරා මෙන් ම වර්තමානයේ ද මානව හිමිකම් කෙළෙසීම්, උල්ලංඝනය කිරීම්, මානව ගරුත්වයට නොගැලපෙන සිදුවීම් ජනමාධ්‍ය ඔස්සේ වාර්තා වේ. එසේ වුව ද, මිනිස් අයිතිවාසිකම් කඩවුණු අඳුරු අතීතයක් සමඟ බිහිවුණු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් ප්‍රඥප්තිය මිනිස් පවුලේ සෑම කෙනෙකුටම හිමිවිය යුතු අන්සතු කළ නොහැකි, උල්ලංඝනය නොකළ යුතු මානව හිමිකම් වගන්ති 30කින් ප්‍රකාශ කරයි. ජගත් සංවිධානයට අයත් රටවල් විසින් පිළිපැදීමට බැඳී සිටින මෙම ප්‍රඥප්තිය සඳහා පදනම වූ කරුණු අතර මානව ගරුත්වය පිළිබඳ ශුද්ධ වූ බයිබලීය චින්තනය, කිතුනු දැක්ම හා මෑත ඉතිහාසයේ සභා ඉගැන්වීම් ද හේතු වී ඇතැයි කිවහොත් නිවැරදි ය.

ශුද්ධ වූ බයිබලීය චින්තනයට අනුව මනුෂ්‍යයකු ලෙස බිහිවීමේ විශේෂ වටිනාකමක් ඇත. මිනිසා දෙවිඳුන්ගේ ස්වරූපයට හා සමානත්වයට මවන ලද මැවිල්ලකි. (උත්පත්ති 1/26) සියලු මැවිලි අතර අග්‍රස්ථානය ද මිනිසා ය. (ගීතාවලිය 8/4-6)

මෙම කිතුනු චින්තනයට අනුව ජාති, ආගම්, කුල, පංති ආදී භේදවලින් තොරව ශ්‍රී ලාංකේය ජන සමාජයේ මිනිස්බවේ ගරුත්වය රැකීමට හා මානව හිමිකම් සුරැකීමට විවිධ යුගවල දී ද විශේෂයෙන් වර්තමානයේ දී ද සභාව විවිධ උත්සාහයන් දරා ඇත. ශ්‍රී ලංකාව වැනි විවිධ ජාතීන් හා විවිධ ආගමිකයන් වෙසෙන සමාජ පරිසරයක, මානව හිමිකම් අතින් කෙනෙකු ඉහළිනුත්, කෙනෙකු පහළිනුත් සිටින සේ සැළකීම් හා බෙදීම් කිසිසේත් සාධාරණ නොවන බවත්, එය සැබෑ සාමකාමී ජන සමාජයක් ගොඩනැංවීමට ද, සමාජ සංවර්ධනයට මහත් බාධාවක් බවත් සභාව අවධාරණයෙන් පෙන්වා දෙන්නීය. මානව හිමිකම් සුරැකීම සහ සැමට සමානත්වයෙන් සැළකීමෙන් සාමයට හා සංවර්ධනයට අවතීර්ණ විය හැකි බව කිතුනු සභාවේ විවිධ ප්‍රවේශ මගින් පෙන්වා දී ඇත.

මෑත ඉතිහාසයේ අප ශ්‍රී ලංකා දේශය තුළ මානව ගරුත්වය කෙළෙසුණු හා මානව හිමිකම් කඩවුණු අවස්ථාවල දී ඊට දැඩි විරෝධය දක්වමින් සාමය හා සමානාත්වතාව වෙනුවෙන් සභාව සමස්ත ජාතියටම අනුශාසනා කළ අවස්ථා බොහෝ ය. ඒ අතරින් කිහිපයක් පමණක් මෙහි දැක්වේ.

- විවිධ ජාතීන්ගේ හා ආගමිකයන්ගේ හා සමාජ කණ්ඩායම්වල සමාන අයිතිවාසිකම් හා යුක්තිය වෙනුවෙන් හඬනැගීම.
- වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් වැඩ වර්ජනයේ නියැලීමේ හේතුවෙන් රැකියා අහිමි වූ 1980 ජූලි වර්ජකයන්ගේ රැකියා අවස්ථා නැවත ලබාගැනීම සඳහා හඬනැගීම සහ ඔවුනට සරණ වීම.
- 1983 ජූලි මස සිදුවූ ජාතිවාදී ගැටුම්වලින් පසු ලාංකික ජන සමායේ ඇතිවුණු භේද භින්නතා, හිංසනය, ගැටුම් හමුවේ සාමය සඳහා වූ අභියෝගය පිළිබඳ 1984 ජූනි 10 දින ශ්‍රී ලංකාවේ කතෝලික රාජගුරු මණ්ඩලය නිකුත් කළ “ශ්‍රී ලාංකික ජාතිය නැවත ගොඩනැංවීම කරා” යන අනුශාසනා පත්‍රය

- 1983 ජුලි මාසයේ සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා ගැන විමසමින් ඇසකට ඇසක් ය, දතකට දතක් ය යන ගෝත්‍රික පළිගැනීමටත් වඩා පහළ මට්ටමේ සදාචාරයකට අප පත් වී ඇති බව පවසමින් අහිංසක දමිල වැසියන් වෙත එල්ල කරන ලද ප්‍රහාර ගැන කම්පා වෙමින් කිතුනු ප්‍රේමයේ දැක්ම තුළ සමාජ සාධාරණත්වය වෙනුවෙන් කටයුතු කරන්නට ආරාධනා කරමින් සභා සාමාජිකයන් හා ශ්‍රී ලාංකික ජනතාව වෙත, කරුණෑගල දියෝකීසියේ අති උතුම් ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමන් නිකුත් කළ එතුමන්ගේ අවසාන පණිවිඩය.
- වසර තිහක පමණ කාලයක් ඇදීගිය යුද්ධයේ දිනෙන් දින සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා, බිහිසුණු ඝාතන, බෝම්බ පිපිරීම් ආදියේ දී ප්‍රචණ්ඩ ක්‍රියා තරයේ හෙලා දකිමින්, සාකච්ඡා මාර්ගයෙන් සාමකාමී විසඳුමකට එන ලෙස අදාළ පාර්ශවවලට බලකරමින් සහා නිවේදන හා අනුශාසනා මගින් ඉල්ලීම.
- යුද්ධයේ දී සිදුවූ මානව හිමිකම් කඩවීම්වලට විරුද්ධව හඬනැගීම, අසාධාරණ අත්අඩංගුවට ගැනීම්, රඳවා තබාගැනීම්වලට විරුද්ධව හඬ නැගීම.
- 1988 - 1989 භීෂණ සමයේ සිදුවූ පැහැරගෙන යාම්, ඝාතන, නීතයානුකූල නොවන අත්අඩංගුවට ගැනීම්, රඳවා තැබීම්, අතුරුදහන් කිරීම්, හිංසා සහ වදබන්ධනවලට එරෙහිවීම හා එම පීඩාවන්ට ගොදුරුවූවන් හා ඔවුන්ගේ පවුල්වලට ආධාර කිරීම.
- නිදහස් වෙළෙඳ කලාපයේ සේවාවේ නිරතවූවන්ගේ කම්කරු ශ්‍රමයේ වටිනාකම පසක් කර සේවක අයිතිවාසිකම් පාලකයන්ගේ අවධානයට ලක්කිරීම, සේවක අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම.
- පරිසරයට හා ජනතාවට හානිකර විවිධ යෝධ සංවර්ධන ව්‍යාපෘතිවල අහිටු ඵලවිපාක පිළිබඳ සියල්ලන් දැනුවත් කර අවිහිංසාවාදී විරෝධතා, සාකච්ඡා මගින් බලධාරීන්ගේ අවධානය යොමුකර ජනතා සුබසිද්ධිය වෙනුවෙන් හඬනැගීම.

### 9.2.4 ආරෝග්‍යශාලා සේවය

වෛද්‍ය ක්ෂේත්‍රය හා ආරෝග්‍යශාලා සේවය ගැන සළකන කළ පෘතුගීසි සමයේ ද මෙරට ආරෝග්‍ය ශාලා පැවැති බව ඉතිහාසයේ සඳහන් වේ. පෘතුගීසි සොල්දාදුවන්ට ප්‍රතිකාර කිරීම සඳහා මූලික වූ ආරෝග්‍ය ශාලාවක් කොළඹ කොටුවේ ඇරඹිණි. එය පවත්වාගෙන ගියේ ෆ්‍රැන්සිස්කාන මිෂනාරිවරුන් විසිනි. හලාවත සහ යාපනයේ ආරෝග්‍යශාලා දෙකක් විය. එකක් සොල්දාදුවන්ට හා අනෙක කතෝලික, කතෝලික නොවන සැමට විවෘත වූ ආරෝග්‍යශාලා දෙකක් මන්නාරම් දූපතේ ඇති විය. ජෙරමියෝ පියතුමා විසින් නිලධාරීන් සඳහා වූ ආරෝග්‍ය ශාලාවක් මන්නාරම් බලකොටුවේ විවෘත කරන ලදී. කිතුනුවන් එහි ස්වේච්ඡාවෙන් සේවය කළ බැව් සඳහන් ය.

වසූරිය, කොළරාව, මැලේරියාව ආදී වසංගත රෝග වැළඳුනු විට ගම්බිම්, ගෙවල් දොරවල් හැරයාම විනා වෙනත් විකල්පයක්, සෞඛ්‍ය සේවාවන් එතරම් දියුණු නොවූ එකල නොවීය. 1612 දී යැවූ ලිපියකට අනුව ජේසු නිකායික මිෂනාරිවරුන් ද වසූරිය වසංගතයට මුහුණපෑම ගැන කියැවේ. රොබට් නොක්ස් ද සිය ලේඛනවල සඳහන් කරන පරිදි දෙමාපියන් රෝග වැළඳුනු දරුවන් ද, සැමියන් බිරින්දෑවරුන් ද, ගම්බිම් ද දමා පලාගියේ සුදුසු සෞඛ්‍ය සේවාවන් නොමැති නිසා ය. එහෙත් ක්‍රිස්තියානි මිෂනාරිවරු රෝගීන් අතහැර පලා නොගියහ. සැමදෙන ඔවුන්ගේ මෙම සත්ක්‍රියාව හා පරිත්‍යාගය අගය කළ බැව් සඳහන් ය. 1609 දී මොරටුව හා කම්මල ප්‍රදේශවල වසූරිය පැතිරුණු බව ද කම්මල දී ක්‍රිස්තියානීන් 70 ක් පමණ මියගිය බවද සැළයි.

ලන්දේසි පාලන සමයේ දී 1697 අවසානයේ මහනුවරට වසූරිය වසංගතය පැතිරුණු අවස්ථාවේ භාග්‍යවත් ජුසේ වාස් පියතුමා ප්‍රමුඛත්වය ගෙන රෝගීන්ට උවටැන් කිරීමේ දයා සේවාවන් ඇරඹීම ඉතිහාසයේ සඳහන් වේ. එවකට වසංගතය හේතුවෙන් ඥාතීන් විසින් ගම්බිම් ද රෝගීන්ගේ මළසිරුරු ද දමා පළායාම සිදුවිය. දෙවන විමලධර්මසූරිය රජු ද මහනුවර හැර දමා පලා ගියේ ය. එහෙත් ජුසේවාස් පියතුමා තමන්ට රෝගය වැළඳීමේ අවදානම තිබියදී එය නොතකා සිය සහායක ජෝසප් කර්වල්ලෝ පියතුමා සමඟ ගෙයින් ගෙට ගොස් රෝගීන්ට ඇප උපස්ථාන කිරීම, මෘත ශරීර භූමදාන කිරීම සිදුකළේ කතෝලික, අකතෝලික භේදයකින් තොරව ය. රජු හා ජනතාව ද මෙම දයාවේ සරණ සේවාව ගැන මවිත වූ බැව් සඳහන් ය. මනුෂ්‍යයා ආත්මයකින් පමණක් නොව ශරීරයකින් ද හෙබි හෙයින් ශාරීරික සුවතාව වෙනුවෙන් ජුසේවාස් පියතුමන් කළ මෙම කැපවීමේ දයා සේවාව, මෙරට ආරෝග්‍යශාලා සේවාව හා ශරීර සුවතාව වෙනුවෙන් සිදුවූ කිතුනු දායකත්වය හැදෑරීමේ දී කිසිසේත් සුළුවෙන් තැකිය නොහැකිය.

බ්‍රිතාන්‍ය යුගයේදී ද මෙම රෝගීන්ට උපස්ථාන කිරීමේ දයා සේවාව ක්‍රියාත්මක විණි. නිර්මල මරිය නිකායේ පියවරු ලංකාවට පැමිණ වසර 3 ක් ගතවන විට 1850 දී දරුණු කොළරාව වසංගතයක් ප්‍රදේශ පුරා පැතිරුණු බැව් සඳහන් ය. එම මිෂනාරිවරු දැඩි වෙහෙසකාරී තත්ත්වයක රෝගීන්ට උපස්ථාන කළහ. එම නිකායේ ෆීලික්ස්, ඇලෙක්සැන්ඩර් හා වික්ටර් යන පියවරු සිය දූත සේවාව ආරම්භයේදීම රෝගයට ගොදුරු වී මියගිය බව සඳහන් ය. දරුණු වසංගතයක් පවතිද්දී අප මිෂනාරිවරු දයාවේ ප්‍රාතිහාර්යයන් සිදු කරතියි මැසනඩ් රදගුරුතුමා එම නිකායට යැවූ ලිපියක ද සඳහන් කර ඇත.

ෆ්‍රැන්සිස්කාන මිෂනාරී සොයුරියන් 1886 දී රජයේ ඉල්ලීම පරිදි හෙදි පුහුණු පාසලක් කොළඹ අරඹා පසුව එම සේවාව මන්නාරමට ද ව්‍යාප්ත කර, හැඳල සහ මාන්තිව් හි ලාදුරු රෝහල් දෙකක් ආරම්භ කළ එම නිකාය, එහි රෝගීන් සඳහා කැපවෙමින් සේවය කළේය. මෙම නිකායේ කන්‍යා සොහොයුරියෝ මඳකලක් කොළඹ ජාතික රෝහලේ ද හෙද සේවාවේ නිරත වූහ.

මෙන්සිහියරහි සිරිකුරුස සොයුරියෝ ඇල්ප්‍රඩ් ඩියෝනා නි.ම.නි. යාපනයේ රදගුරුතුමන්ගේ ආරාධනයෙන් ඉන්දියාවේ කේරල සිට 1930 ජුලි මාසයේ ශ්‍රී ලංකාවට සැපත් ව මෙම ආරෝග්‍යශාලා සේවාව කයිට්ස් හි රජයේ රෝහලින් ආරම්භ කළේය. ඉන් අනතුරු ව යාපනයේ රජයේ රෝහල තුළ සේවය කළෝය. 1961 වර්ෂයේ සිට මිෂනාරී සේවය අවසන් වූ බැවින් දේශීය කන්‍යා සොයුරියන් එම සේවාව දිගින් දිගටම පවත්වාගෙන යාමට සමත් විය.

### 9.2.4 ආරෝග්‍යශාලා සේවය

1819 වසරේ දී ඇමරිකානු මිෂන් සේවය විසින් ආරෝග්‍ය ශාලා සේවය තම අධ්‍යාපන සේවාවට අමතර ව ආරම්භ කරන ලදී. පළමුවන ආරෝග්‍ය ශාලාව 1820 වසරේ දී පණ්ඩතරිප්පු හිදී ආරම්භ විය. 1842 ඔක්තෝබර් මස 06 දින වෛද්‍ය ග්‍රීන් ඇමරිකාවේ සිට පැමිණ ඔහුගේ සේවාව ආරම්භ කළේ කිසිදු ආගමික වෙනසකින් තොරව ය. 1848 වසරේ දී මෙම රෝහල මනිප්පායි ප්‍රදේශයට නැවත ගෙනයන ලදුව එය වෛද්‍ය ග්‍රීන් රෝහල ලෙස නම් කරන ලදී.

1898 වසරේ සැප්තැම්බර් මස 24 දින ඉනුවිල් හි තවත් රෝහලක් ආරම්භ කර මැක්ලොයිඩ් දේවගැති තුමාගේ හා ඔහුගේ බිරිඳගේ නමින් ආරම්භ කළ අතර එය මැක්ලොයිඩ් රෝහල ලෙස හැඳින්වේ.

### 9.2.5 මානව හිමිකම් හා සමාජ සුබසාධනයට දායක වූවෝ

කිතුනු දයාව පෙරදැරි කරගෙන, ඉතාම සුළු තැනැත්තාට වුව ද ඔබ එසේ කළා නම්, එය කළේ මට ය (මතෙව් 25/40) යන ක්‍රිස්තුස් වහන්සේගේ වචනවලින් දිරිගැන්වී තම සහෝදර ජනතාවගේ සුබසිද්ධිය හා සුබසාධනය වෙනුවෙන් සියදිවි නොතකා පරිත්‍යාගශීලී ව කැපවුණු බොහෝ ගිහි පැවිදි පුද්ගලයන් මෙරට කිතුනු ඉතිහාසයේ හමුවේ. ඒ අතර මෙරට මානව හිමිකම් හා සමාජ සුබසාධනය වෙනුවෙන් කැපවුණු සේවාවක නියැලුණු චරිත කිහිපයක් පහත සඳහන් වේ.

* **අති උතුම් ලියෝ නානායක්කාර (රදගුරු හිමි (සා.බෙ.නි.) - (1917 - 1982)**

මහනුවරට හා පසුව බදුල්ල රදගුරු වසමේ ප්‍රථම රාජගුරු ප්‍රසාදීන් වහන්සේ ලෙස සේවය කළ මෙතුමා තරුණ පූජ්‍යප්‍රසාදීවරයකු ලෙස විදුහලක ගුරු සේවයේ නිරතවෙමින් තරුණයන් හා ශිෂ්‍යයන් ඇසුරෙන් ජීවිත අවශ්‍යතා පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලැබීය.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට ද සහභාගී වීමේ භාග්‍ය ලද මෙතුමා එහි දර්ශනය ඔස්සේ සිය ජීවිත ප්‍රතිපත්ති හා දර්ශනය වෙනස් කරගෙන ජනතාවාදී ගමනක් ඇරඹීය. 1970 දී බදුල්ල රදගුරු වසමේ ප්‍රථම රාජගුරු ප්‍රසාදීන් වහන්සේ ලෙස ප්‍රදේශයේ ජනතා ප්‍රශ්න, හදගැස්ම හඳුනන පූජක පරපුරක් බිහිකරලීමට, එම ප්‍රදේශයට සරිලන පූජක පුහුණුවක් ලබාදීමට පියවර ගත්තේය. ජාති, ආගම්, පංති භේදයකින් තොරව සැමටම යහපත් එඬේරකු වූ මෙතුමා ප්‍රදේශයේ සිංහල, දමිල වාර්ගික සුහදතාව නැංවීමට ද ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වූ වතුකම්කරු සේවාව හා බැඳි ප්‍රශ්න, ගැටලු, වෘත්තීය අරගලවල දී ඔවුනට සරණ වීමට ද ඉදිරිපත් විය. තරුණයන්ගේ සුබසාධනය, වතු කම්කරුවන් නඟාලීම, අන්තර් ආගමික සුහදතාව, මානව හිමිකම් සුරැකීම, අඩු පහසුකම් සහිත වූවන්ගේ අධ්‍යාපනික හා සෞඛ්‍ය කටයුතු වෙනුවෙන් වෙහෙසීම ආදී විවිධ ක්ෂේත්‍රවලට දායක විය. 1982 මැයි 28 දින ස්වර්ගස්ථ විය.

* **අති උතුම් ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරු හිමි (1927 - 1983)**

මෙරට මානව හිමිකම් සහ සමාජ සාධාරණත්වය වෙනුවෙන් නොබියව හඬක් නැගූ උදාර චරිතයක් සේ මෙතුමන්ගේ සේවාව දිස් වේ. ලංකා සභාවේ, කුරුණෑගල දියෝකීසියේ රදගුරුතුමන් ලෙස 1962 පත් ව 1982 ස්වර්ගස්ථ වන තුරු සිය ජනතාවට යහපත් එඬේරකු විය.

සමාජයේ විවිධ තරාතිරම්වල හා ජීවිත තත්ත්වවල සිටින සෑම කෙනෙකු සමඟ සබඳතා ගොඩනඟා ගත් මෙතුමා සියලු ආගම් සමඟ ආගමික සුහදතාව හා සංවාදය තුළ දිවි ගෙවීය. සමාජ ප්‍රශ්න හා අර්බුදකාරී අවස්ථාවල දී පීඩාවට පත්වූවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියේ ය. 1980 ජූලි වැඩ වර්ජකයින්ගේ අහිමි වූ රැකියා නැවත ලබාගැනීම සඳහා බලකර ඔවුන්ගේ රැස්වීම් හා විරෝධතාවලට ද සහභාගී වී විවිධ සමිති, දේශපාලන පක්ෂ හා ආගමික නායකයන් සමඟ පොදු අරමුණක් වෙනුවෙන් කටයුතු කළේය. ගොවි ජනතාවගේ දැවෙන ප්‍රශ්න ගැන ද හඬක් නැඟීය. 1983 ජූලි ජාතිවාදී ගැටුම් හේතුවෙන් පීඩාවට පත් දමිල ජනතාව ගැන මහත් කම්පා වී ඔවුන්ගේ සාධාරණ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැහැදිලි ස්ථාවරයක සිටිමින් යුක්තිය ඉල්ලා හඬනැගුවේය. ජාතිවාදී අරගලයේ දී පීඩාවට පත්වූවන් පෞද්ගලිකව මුණගැසී දිරිමත් කළේය. දේව රාජ්‍යයේ වටිනාකම් සමාජය තුළ ගොඩනගන්නට උරදුන් මෙතුමන්ගේ දූත සේවාව සැබෑ කිතුනු සාක්ෂ්‍යකි. 1983 ඔක්තෝබර් 23 දින මෙතුමා ස්වර්ගස්ථ විය.

* **ගරු මයිකල් රුද්‍රිගෝ පියතුමා (හි.ම.හි.) (1927 - 1987)**

ශ්‍රී ලාංකික ජන සමාජයේ පැවති ආගම හා සමාජය පිළිබඳ සාම්ප්‍රදායික දැක්මෙන් ඔබ්බට ගොස් ඒ පිළිබඳ නව දැක්මක් හා ප්‍රතිස්වරූපීකරණයක් ගොඩනැංවීමට දායක වූ උදාර චරිතයක් සේ මෙතුමාගේ සේවාව අපට දිස්වේ. සමාජය තුළ කිතුනු අනුගාමිකයකු වීමේ අර්ථය විමසමින් ජීවිතාදර්ශයෙන් ඊට පිළිතුරු සපයන්නට සමත් විය. දිළින්දන් සමඟ ජීවත් වෙමින් ඔවුන් හා අනන්‍යතාව සොයා ගමන් කළේය. 1981 දී වෙල්ලස්ස ප්‍රදේශයේ බුත්තල ගම්මානයේ "සුබසෙත් ගෙදර" පැල්පතක දිවි ගෙවමින් ප්‍රදේශයේ බොදුනු - කතෝලික ජනතාව හා සංවාදයෙන් විශාල සේවාවක නිරත විය. ප්‍රදේශයේ ජනතාව පෙළන දරිද්‍රතාව, අසරණ ජීවිත රටාව, අඩුපහසුකම් සහිත අධ්‍යාපනය හා සෞඛ්‍යය මෙන් ම ශ්‍රමය සූරාකන බහුජාතික, විජාතික බලපෑම්වලට එරෙහිව ද දිවැසිවර හඬක් නැඟීම හේතුවෙන් 1987 නොවැම්බර් මස 10 දින සාහසිකයෙකුගේ වෙඩි උණ්ඩයකට ගොදුරුව ස්වර්ගස්ථ විය.

* **අති උතුම් ෆ්‍රෑන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරු හිමි (1931-2009)**

කොළඹ අගරදගුරු පදවියේ සහායක රදගුරු ලෙස අභිෂේකය ලබා පසුව හලාවත පදවියේ යුවරදගුරු ලෙස පත් ව, අති උතුම් එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමි විශ්‍රාම යාමෙන් පසු 1972 දී හලාවත රදගුරුතුමන් ලෙස පදවි ප්‍රාප්ත ව 2009 වසරේ ස්වර්ගස්ථවන තුරු සිය එඬේරික කාර්යය තුළ ජනතාවගේ සාධාරණ අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නැඟීය.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට ද සහභාගී වීමේ භාග්‍ය ලද මෙතුමා ශ්‍රී ලාංකික රදගුරුතුමකු ලෙස විශේෂිත දැක්මකින් එඬේරික සේවාවේ නියැලිණි. ඉරණවිල ඉදිකිරීමට නියමිත වූ ඇමෙරිකානු හඬ ගුවන්විදුලි සම්ප්‍රේෂණාගාරය හා හෝටල් සංකීර්ණයට හා පසුකාලීනව නොරොච්චෝලේ තාපබලාගාරයට විරුද්ධව තම ස්ථාවරය නොබියව පළ කරමින් ජනතාවගේ අයිතිවාසිකම් හා පරිසරය සුරැකීමේ කිතුනු වගකීම වෙනුවෙන් පෙනී සිටියේය. 2004 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ බලාත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීමේ පණත් කෙටුම්පත මගින් මෙරට ආගමික සුහදතාවට හා කිතුනු අයිතිවාසිකම්වලට සිදුවන හානිය පිළිබඳ නොබියව අදහස් පලකරමින් එම පනත් කෙටුම්පතට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය ගොස් යුක්තිය ඉටුකර ගත්තේය. 2009 අගෝස්තු 24 දින උන්වහන්සේ ස්වර්ගස්ථ විය.

* **ඉව්ලින් කානි මැතිනිය (1869 - 1953)**

එංගලන්ත සභාවේ සෙනානා මිෂනාරී සමාගමේ සාමාජිකාවක වූ ඇය මිෂනාරී සේවාව සඳහා දැඩි ආශාවකින් සිටි අයෙකි. දැඩි කිතුනු ඇදහිල්ල ද, පැහැදිළි දර්ශනයක් ද, අසරණයන්ට දයාවෙන් සරණ වීමේ නොනිමි ආශාවකින් යුතුව 1896 දී ඇය ලංකාවට පැමිණියා ය.

උතුරුමැද පළාතේ තලාව ප්‍රදේශය මුල්කරගෙන අසරණ පීඩිත ජනතාවට සරණය වීම සඳහා සිය ජීවිතයම කැප කළාය. ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවන්ට සංවේදීව විශේෂයෙන් මැලේරියාවට ගොදුරු ව රෝගීන් මියයාමද, මාතෘ හා බිළිඳු මරණ සංඛ්‍යාවේ ඉහළ බව කෙරෙහි ද අවධානය යොමු කර, සෞඛ්‍ය පහසුකම් හැකි පමණින් සැළසීමට පියවර ගත්තාය.

"මාගේ සමිඳාණෝ මට ඇවැසි සියල්ල සපයන සේක" යන ආදර්ශ පාඨය තුළ දැඩි දේව විශ්වාසයකින් යුතුව ප්‍රදේශයේ රෝගීන් සඳහා උපස්ථාන කළාය. එම රෝගීන් වෙනුවෙන් මුලදී ගොඩනැඟූ අතුපැල අනුක්‍රමයෙන් ආරෝග්‍ය ශාලාවක් බවට පත්විය. වෛද්‍ය සායනයක් ද, මාතෘ රෝහලක් ද ගොඩනැඟුවාය. ප්‍රදේශයේ අනාථ ළමුන්ට සතුටින් ගතකිරීමට ළමා නිවසක් ද තනා වයෝවෘද්ධ අයගේ ජීවිකාව වෙනුවෙන් මාස්පතා වියලි ආහාර මල්ලක් දීමට ද කටයුතු කළාය.

1953 ජනවාරි 23 දින දෙව්සමිඳුන් සොයා සදාතන ජීවිතයට නික්ම ගිය ඇය සෑදූ සරණ සේවා හා ආරෝග්‍යශාලා ගොඩනැගිලි තලාව ප්‍රදේශයේ අදද ඇයගේ සේවාවට සාක්ෂ්‍ය දරයි. "තලාවේ අම්මා" යන ආදර නාමයෙන් තලාව ප්‍රදේශ අද ද ඇයව හඳුන්වනු ලබයි.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

පියවර 1 : කිතුනු දයාව හා සමාජ සුබසාධනය පිළිබඳව සාකච්ඡා කරන්න.

පියවර 2 : ශ්‍රී ලංකාව තුළ සමාජ සුබසාධන කටයුතු පිළිබඳ ව සාකච්ඡා කරන්න.

පියවර 3 : මානව හිමිකම් හා සමාජ සංවර්ධනය ගැන කථිකාවතක් ගොඩනගන්න.

පියවර 4 : ආරෝග්‍යශාලා සේවය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

පියවර 5 : මානව හිමිකම් හා සමාජ සුබසාධනයට දායක වූවන් ගැන සාකච්ඡා කරන්න.

**නිපුණතාව 9.0 : ශ්‍රී ලාංකේය සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් කිතුනු සභාවෙන් ලද දායකත්වය විස්තර කර සමාජ අභිවෘද්ධිය වෙනුවෙන් කිතුනුවකු ලෙස කටයුතු කරයි.**

**නිපුණතා මට්ටම 9.3 :** ශ්‍රී ලාංකේය සමාජය තුළ කලාවේ උන්නතිය සඳහා වූ කිතුනු දායකත්වය වටහාගෙන තම හැකියා සමාජයට එක් කරයි.

**කාලය :** කාලච්ඡේද 15

**ඉගෙනුම් ඵල :**

- ශ්‍රී ලාංකේය සමාජයේ ආගමික උන්නතිය වෙනුවෙන් කිතුනුවන්ගෙන් ලද හැකියා සහ කුසලතා අගය කරයි.
- ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා, එඩ්මන් පීරිස් රදගුරු, මර්සලීනු ජයකොඩි පියතුමා යන කලාකරුවන්ගේ නිර්මාණ සදා අමරණීය බව අධ්‍යයනය කර පිළිගනියි.
- මුල් යුගයේ ධර්මදූතවරුන්ගේ අම්ල කැපවීම මත කිතුනු කලාවට අත්තිවාරම වැටුණු බව පිළිගනියි.
- නූතන කිතුනුවන් ද අඛණ්ඩව හැකියා සහ කුසලතා මගින් කිතු සසුන සඳහා කැපවිය යුතු බව කියයි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 9.3.1 ශ්‍රී ලාංකේය කලාව උදෙසා කිතුනු දායකත්වය

ශ්‍රී ලාංකේය කලාව උදෙසා කිතුනු දායකත්වය ඉතා උසස් මට්ටමක වන අතර එය මෙසේ විග්‍රහ කළ හැක.

* කලාව සෞන්දර්ය හා සබැඳිය. කලාව යනු කුමක් දැයි නිර්වචනය කිරීමට අපහසු ය. හේතුව වන්නේ කලාව විවිධ අංශයෙන් විවිධ මාධ්‍යයන් තුළින් ඉදිරිපත් වන නිසා ය.

* මිනිස් සිතුවිලි, චින්තනයන්, නිර්මාණීකරණය, කලාව ලෙස හැඳින්වේ.

* කලාව නිර්මාණයට හා වර්ධනයට විවිධ ආගම් දායක වී ඇත. මේ අනුව කිතු දහම කලාවේ උන්නතියට මහඟු දායකත්වයක් ලබා දී ඇත. විශේෂයෙන් ශ්‍රී ලාංකේය කලාව සඳහා කිතු දහම දායක වී ඇත.

* ශ්‍රී ලංකාවේ බෞද්ධ හා හින්දු ආගම්වලින් බෞද්ධ හා හින්දු කලාව නිර්මාණය කර ඇත.

* බටහිර යුරෝපා සංක්‍රමණ ශ්‍රී ලංකාව තුළ පැවති නිසා බටහිර කලාවේ අංශ වන ලේඛන කලාව, චිත්‍ර ශිල්පය, සංගීතය, නාට්‍යය හා නාඩගම් කලාව, ගෘහ නිර්මාණ කලාව හඳුන්වා දී ඇත. ඒ සමඟම ශ්‍රී ලංකාවේ තිබුණු කලා අංශ ද ඇතුළත් කොට ශ්‍රී ලංකාවේ කලාවේ වර්ධනයට දායකත්වය ලබා දී ඇත.

### 9.3.2 විවිධ කලා ක්ෂේත්‍ර

ශ්‍රී ලාංකේය කලාව තුළ කිතනු අනන්‍යතාවය රැකගැනීමට කිතුනුවන්ට හැකි වී ඇත. ලේඛන කලාව, චිත්‍ර ශිල්පය, සංගීතය, නාට්‍ය හා නාඩගම් කලාව, සිනමා කලාව යන ක්ෂේත්‍රයන් තුළ කලාව උදෙසා දායක වීමට කිතුනුවන්ට හැකි වී ඇත.

- **ලේඛන කලාව**

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ මුල් කිතුනු ලේඛන සම්පාදනය වූයේ ආගමික හා ජනවන්දනාත්මක පරමාර්ථ වෙනුවෙන් ය. රටේ ජන ජීවිතයට සමීපවීමට නම් දේශීය භාෂා හැදෑරීම අත්‍යවශ්‍ය සාධකයක් විය. දේශීය ජනතාව සිය භාෂාවට හා සංස්කෘතියට දැක් වූ ලැදියාව පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍ය යුගවල සිටි විදේශික කිතුනු ලේඛකයන් දැන සිටියේ ය. ආගමික ධර්මතා, ගැඹුරු ආගමික සංකල්ප දේශීය ජනතාවට පැහැදිළි කරදීමට ගැඹුරු භාෂා දැනුමක් අවශ්‍ය බව මොවුහු අවබෝධ කරගත්තේය.

"පෙදෙන් බුදු සිරිතැ - කළ හෙළ බසින්" යන්න,
"පෙදෙන් කිතු සිරිතැ - කළ හෙළ බසින්"
වැනිම කිතු දහම ලක්බිමට සංක්‍රමණය වීමත් සමඟ වූ අවශ්‍යතාවයක් විය. ශ්‍රී ලංකාවේ සේවය කළ ඇතැම් මිෂනාරිවරුන් දේශීය භාෂාවන් පිළිබඳ මනා ප්‍රාගුණ්‍යයක් ලැබ ගද්‍ය, පද්‍ය හා නාටක ද ශබ්දකෝෂ සහ ව්‍යාකරණ ග්‍රන්ථ ද සම්පාදනය කිරීමට සමත් වූහ. සාන්ත ප්‍රැන්සිස් සාවියෙර්තුමා (ක්‍රි.ව.1542 - 1552) ධර්මදූතවරුන් භාෂා හොඳින් දැනගැනීමේ වැදගත්කම දැඩි ලෙස අවධාරණය කළේය.

- **පෘතුගීසි යුගයේ ක්‍රිස්තියානි ලේඛන :**

  - මුල්ම කිතුනු කෘතීන් අතර ගෝවේ සාන්ත පීතර විදුහලේදී ජේසු නිකායික පියවරුන් විසින් ක්‍රි.ව.1545 දී රචිත සිංහල ග්‍රන්ථය විශේෂ ස්ථානයක් ගනී.

  - මෙරට උපත ලැබූ පෘතුගීසි ජාතිකයෙකු වූ ජේසු නිකායික ගරු එම්මෑනුවෙල් කොස්තා පියතුමා විදේශීය බසකින් මුල්ම සිංහල ව්‍යාකරණ පොත ලියා ඇත. "Ars Chingalensis Linguae" හෙවත් "සිංහල භාෂාවේ සිද්ධාන්ත" මෙම ග්‍රන්ථයයි. මෙම ග්‍රන්ථය මුද්‍රණය නොවූ අතර, එතුමාගේ ධර්මදූතවරුන් මෙය භාවිත කර ඇත.

  - ක්‍රි.ව. 1645 දී ජේසු නිකායික ගරු පියරේ බෙර්ගුවින් පියතුමා කාණ්ඩ තුනකින් සමන්විත සිංහල ව්‍යාකරණ පොතක් ලියා ඇත. Arte E Grammatica de Lingua Chingala එහි නාමයයි.

  - මල්වානේ ගරු පෙද්‍රෝ ෆ්‍රැන්සිස්කෝ නම් ජේසු නිකායික පියතුමා ලියා ඇති සාන්තුවරයන්ගේ ජීවිත චරිත 26ක් සහ ධර්මෝපදේශ ග්‍රන්ථයක් ද අප ස්වාමීන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය ගැන ග්‍රන්ථයක් ද මෙකල වැදගත් ලේඛන වශයෙන් ගත හැකිය.

  - ප්‍රැන්සිස්කාන නිකායික ධර්මදූතවරයෙකු වූ අන්තෝනියෝ පෙක්ෂෝටෝ පියතුමා සම්පාදනය කර ඇති කාව්‍ය නාටක සහ ගීතිකා ජනප්‍රිය ග්‍රන්ථ ලෙස ජනතාවගේ පැසසුමට ලක්වී ඇත.

- නූතනයේ අපට ඉතිරිව ඇති ඉපැරණිම දෙමළ කතෝලික ග්‍රන්ථය වන "සන්තියෝගු මායෝර් අම්මානෙ" නමැති ග්‍රන්ථය, ක්‍රි.ව. 1647 දී ගරු ජෝආඩ් කර්වල්ලෝ ජේසු නිකායික පියතුමා තුළින්, කිතු දහම හඳුනාගත් ආර්යවංශික ජේදෝ නැමැති වියත් ලේඛකයා ලියා ඇත.

- ක්‍රි.ව. 1644 - 1650 අතර කාළයේ ගරු සෙබස්තියන් ගොන්සේ (ජේ. නි.) පියතුමාගේ ඉල්ලීම මත යාපනයේ නිර්නාමික කතුවරයෙකු ලියා ඇති ඥානප්පල්ලු හෙවත් ආත්මික ගොපළු ගීය යන නාට්‍ය කාව්‍යය ඉතා වැදගත් පොතකි.

- වර්ෂ 1612 දී කිතු දහම වැළඳගත් අලගියවන්න මුකවැටි කවියා දොන් ජෙරොනිමෝ නමින් ප්‍රසාද ස්නාපනය ලැබීය. සුභාෂිතය, සැවුල් සංදේශය වැනි ජනප්‍රිය කාව්‍ය පොත් රචනා කළ මොහු කුස්තන්තීනු හටන නම් ප්‍රථම සිංහල ක්‍රිස්තියානි කාව්‍යය ක්‍රි.ව. 1620 දී රචනා කර ඇත. කොන්ස්ටන්ටයින් ද සා නැමැති පෘතුගීසි සෙන්පතියා අන්තෝනියෝ බරෙත්තු හෙවත් කුරුවිට රාළ පරදවා ජයගැනීම වර්ණනා කිරීම සඳහා රචනා කර ඇති මෙම කාව්‍ය පැරණි සිංහල ලේඛක පරපුර විසින් සම්පාදිත අවසාන කෘතිය ද වේ.

- **ලන්දේසි යුගයේ ක්‍රිස්තියානි ලේඛන**

ලන්දේසීන් ව්‍යාකරණ ග්‍රන්ථ, වදන් පුස්තක, ශබ්දකෝෂ යනාදිය ලන්දේසි සහ සිංහල භාෂාවලින් සම්පාදනය කළේය. ගීතාවලියේ ගීත, බැති ගීත, ජනවන්දනා පුස්තක ලන්දේසි භාෂාවෙන් සිංහලට පරිවර්තනය කරන ලදී.

ලංකා ඉතිහාසයේ පළමු වතාවට මුද්‍රණාලයක් පිහිටෙව්වේ ලන්දේසි ජාතික ගේබියෙල් ස්කාඩේ නැමැති ආයුධ ගබඩාකරු ය.

- ක්‍රි.ව. 1737 දී පළමු මුද්‍රිත සිංහල පොත සංස්කරණය කරන ලදී. මෙම පොතෙහි ස්වාමිවාක් ආරාධනය, උදේ සවස යැදුම්, කෑමට පෙර පසු යැදුම්, විශ්වාස ලක්ෂණය, දස පනත ආදිය අන්තර්ගත විය.

- ක්‍රි.ව. 1755 දී කොළඹ දෙව්සත්හලේ ආචාර්ය මණ්ඩලයේ ඇන්තනී පෙරේරා සහ ලුවී ද සේරම් විසින් පද රචනය කළ මුද්‍රිත ගීතිකා පොතක් නිර්මාණය විය. මෙම ගීතිකාවල තනු යුරෝපීය ක්‍රමයට යොදා ගැනිණි.

- ලන්දේසි රජයෙන් කිතුනු සාහිත්‍යයට පිරිනැමුණු වැදගත්ම දායකත්වය වන්නේ ශු. බයිබලයේ සම්පූර්ණ නව ගිවිසුම ද පැරණි ගිවිසුමේ කොටසක් ද සිංහල භාෂාවට පරිවර්තනය කිරීමයි.

- ක්‍රි.ව. 1705 මැයි 09 වෙනි දින ඉන්දියාවෙන් ලංකාව බලා පිටත් වූ ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා සිංහල කිතුනු සාහිත්‍යයට කළ සේවය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් විස්තර කළ නොහැකිය. මෙතුමා ප්‍රතිභාපූර්ණ සාහිත්‍යධරයෙකි.

- **ගරු ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා**
  - ගෝවේ දිවාර් නම් ග්‍රාමයේ කොන්කණි බ්‍රාහ්මණ වංශයට අයත් තෝමස් ගොන්සාල්වේස් සහ මරියා ද ආබ්‍රෑ යන දෙමාපියන්ට දාව 1676 ජූනි 8 වෙනි දින උපත ලැබීය.
  - ක්‍රි.ව.1696 දී ගෝවේ සාන්ත තෝමස් ඇක්වයිනස් ආයතනයේ සිව් වසරක දේව ධර්ම පාඨමාලාවක් හැදෑරීය.
  - ක්‍රි.ව. 1700 නොවැම්බර් 02 දින ගෝවේ ඔරතෝරියානු නිකායට ඇතුළුව පූජකවරය ලැබීය.
  - භාග්‍යවත් ජුසේ වාස් පියතුමාගේ ඉල්ලීමකට අනුව ක්‍රි.ව.1705 මැයි 09 වෙනි දින ගෝවේ නිගරයෙන් පිටත් වූ මෙතුමා ක්‍රි.ව. 1705 අගෝස්තු 30 වෙනි දින මෙරටට ගොඩබැස්සේය.
  - එතුමාගේ මව් භාෂාව වූ කොංකණි බසට අමතරව පෘතුගීසි, ලතින්, ග්‍රීක, ස්පාඤ්ඤ භාෂා මැනැවින් දැන සිටියේ ය. ලන්දේසි බස ද උගත්තේය.
  - මල්වතු නිකායික බෞද්ධ භික්ෂුවකගේ සහ දස්කොන් අදිකාරම් පඬිවරයාගෙන් සිංහල භාෂා වචන සහ රචනා ශෛලීන් මෙතුමා උගත්තේය.
  - සිංහල කිතුනු සාහිත්‍යයේ පීතෘවරයා වශයෙන් පිදුම් ලබන අප පියතුමා අතින් පොත් හතලිස් දෙකක් ලියැවී ඇත. පොත් 22 ක් සිංහල භාෂාවෙන් ද, 15 ක් දෙමළ භාෂාවෙන් ද, හතරක් පෘතුගීසි භාෂාවෙන් ද, එකක් ඕලන්ද භාෂාවෙන් දලියා ඇත. මීට අමතරව පෘතුගීසි - දෙමළ - සිංහල ත්‍රි භාෂා මහා ශබ්දකෝෂය මෙතුමා සම්පාදනය කරන ලදී.

ගරු ජාකොමේ ගොන්සල්වේස් පියතුමා සම්පාදනය කළ ග්‍රන්ථ අතර පද්‍ය රචනාවන් සහ ගද්‍ය ප්‍රබන්ධයන් ඇත. එතුමාණන්ගේ ග්‍රන්ථයෙහි සාහිත්‍යාංශයන් ද විවිධත්වයක් විද්‍යමාන කරයි.

එතුමා විසින් රචිත සිංහල හා දෙමළ කෘතීන් :

1. ක්‍රිස්තියානි පල්ලිය - ක්‍රිස්තියානි ආලයම් (දෙමළ බසින් මේ නමින් හැඳින්වේ.)
2. දේව වේද පුරාණය

| | සිංහල බසින් | දෙමළ බසින් |
|---|---|---|
| 1. | ක්‍රිස්තියානි පල්ලිය | ක්‍රිස්තියානි ආලයම් |
| 2. | දේව වේද පුරාණය | දේව අරුල් වේද පුරාණම් හෝ තප පුරාන්තිම පච්චිම කාණ්ඩම් |
| 3. | දේව වේද සංක්ෂේපය | සත්‍ය වේදාහම සංක්ෂේපම් |
| 4. | සුවිශේෂ විසාධනය | සුවිශේෂ විරිත්තුමයි |
| 5. | දුක් ප්‍රාප්ති ප්‍රසංගය | වියාකූල පිරසංගම් |
| 6. | ධර්මෝද්‍යානය | ධර්ම උද්‍යානම් |
| 7. | ප්‍රති ආරියවල්ය | අට්පුද වරලාරු |
| 8. | ඥානු | |
| 9. | ලක්රුත තර්පනය | සුහිර්ද තරිපනම් |
| 10. | ධර්ම සංඥාව | සුහිර්ද කුරල් |

සිංහල බසින් පමණක් ලියැවුණු කෘතීන් :

* දේව නීති විසර්ජනය
* අඥාන ඖෂධය
* බුධපන ප්‍රත්‍යක්ෂය
* භේදකාරයින්ගේ තර්කය
* වේද කාව්‍ය
* මංගල ගීතය
* ආනන්ද කලිප්පුව

දෙමළ මාධ්‍යයෙන් ලියැවුණු කෘතීන් :

1. වාත්තියරුම් කුඩියානවනුම් තර්කිත්තුක්කොන්ඩ තර්කම්
2. නව තර්කම්
3. මූසාල්වන් වේදම්
4. කඩවුල් නිර්නයම්
5. නාළු වේදම්
6. සින්දු පිරාර්තනයි

දුක් ප්‍රාප්ති ප්‍රසංගය

ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා විසින් රචිත මෙම ග්‍රන්ථය ජේසුස් වහන්සේගේ දුක්විඳීම හා මරණය කේන්ද්‍ර කොටගත් කෘතියකි.

එතුමා විසින් රචිත සියළුම ග්‍රන්ථ අතුරින් මෙම කෘතිය අද දක්වා භාවිතයට ගැනේ. මෙම ග්‍රන්ථයේ මූඛ්‍ය පරමාර්ථය වන්නේ චතාරික සමය තුළ කිතුනුවන්ගේ සිත් හැරීමක් ඇති කිරීමය.

- **ඉංග්‍රීසි යුගයේ කිතුනු ලේඛකවරු**

මෙම සියවසේ දී කිතුනු ලේඛකයින් රැසක් ලේඛනය සම්බන්ධයෙන් දායකත්වය ලබා දී ඇත. කිතුනු පූජකවරුන් මෙන් ම කිතුනු ගිහි කොටස් ද මෙම කර්තව්‍යය වෙනුවෙන් දායක වී ඇති බව පෙනේ.

- ක්‍රි.ව. 1866 ජූනි 07 දින සිට අද දක්වා සංස්කරණය වන ශ්‍රී ලංකාවේ ඉපැරණිම සිංහල පුවත්පත වන **ඥානාර්ථ ප්‍රදීපය** තුළින් ලේඛකයින් රැසක් බිහිවී ඇත.
  - මෙම පුවත්පතේ පළමුවන කතුවරයා සහ ප්‍රකාශකයා වීමේ ගෞරවය හිමිවන්නේ මෝදර මාලුකන්දේ පදිංචිව සිටි ජී. ජුවාම් ප්‍රනාන්දු මහතා ය. මෙතුමා දක්ෂ ලේඛකයෙකි.
  - ඥානාර්ථ ප්‍රදීපය පත්‍රයේ පළමුවන සංස්කාරක පියතුමා වීමේ ගෞරවය හිමිවන්නේ ක්‍රි.ව.1912 වනවිට සුප්‍රකට භාෂා විශාරදයෙකු වූ ගරු ජෝන් පහමුණේ පියතුමා ය. ඇතුගල් පුරයේ වංශවත් බෞද්ධ පවුලක පුතෙකු වූ මෙතුමා හෙළ සාහිත පුනරුදයක් සඳහා ප්‍රදීප පත්‍රය යොදාගෙන ඇත.

භක්ති ප්‍රබෝධනය සඟරාව

1889 ආරම්භ කරන ලක භක්ති ප්‍රබොධනය සඟරාව ශ්‍රී ලංකාවේ ඉපැරණිම අඛණ්ඩව පවත්වාගෙන යන සඟරාවයි. එය නිර්මල මරිය නිකායේ ප්‍රකාශනයකි.

1899 ජනවාරියේ මුල්ම සඟරාව සඳහා ආරම්භක සංස්කාරක අන්තෝනියස් ජයවර්ධන මහතා මෙම සඟරාව ආරම්භ කළ අරමුණ මෙසේ පැහැදිළි කරයි.

ශ්‍රී ලංකාවේ කතෝලික සභාව වර්තමාන කාලයෙහි ඉතා බොහෝ සෙයින් දියුණු අඩියක පිහිටා තිබෙන බව සියල්ලන්ටම පෙනෙන සත්‍යයකි.

“අප කතෝලික සභාවේ දියුණුව මෙතරම් වූ නමුත්, සිංහල කතෝලිකයින්ගේ ප්‍රයෝජනය සඳහා කතෝලික සඟරාවක් යමකු විසින් ආරම්භ නොකරන ලද්දේය.”

මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ පොත පතද වේද භේද කාරයන්ගේ තර්කාදියද දක්නා ලැබේ. මහා නපුරක් නම්, රාග නිශ්‍රිත කවි සින්දු ආදී පොත් පත් හැම තැනම විසිරී තිබීමයි.

“භක්ති ප්‍රබොධනය” යන ගැඹුරු වදන් වලින් හඳුන්වන ලද මෙම වාර්තාගත සඟරාවේ අතීතානාගත මුළු කතාවම යටකී වැකි තුළ ගොනු වී තිබේ.

අනගාරික තවුසකු වූ මර්සලින් ප්‍රදිනන්දස්ගේ ධාර්මික සංකල්පයක් මත භක්ති ප්‍රබෝධනය මුල පිරීම සිදුවිය. ගිහියන්ගේ දිවැසි වරය ප්‍රකට කළ අසිරිමත් සලකුණක් ලෙස ප්‍රබෝධනය හැඳින්විය හැක.

1899 සිට 1930 දක්වා අන්තෝනියස් ජයවර්ධන මහතා ද 1930 සිට 1944 දක්වා ඇම්. අගුස්තිනු සිල්වා මහතා ද සංස්කාරක වරුන් ලෙස කටයුතු කර ඇත.

1944 සිට 1948 දක්වා ගරු එඩ්මන්ඩ් පීරිස් නි.ම.නි. පියතුමා (හලාවත රදගුරුතුමා) ප්‍රථම සංස්කාරක පියතුමා වශයෙන් ආරම්භ කළ සංස්කාරක ධූරය මේ දක්වා නි.ම.නි. පියවරුන් විසින් කරගෙන යනු ඇත.

- **දෙමළ කිතුනු ලේඛන**

  * බටහිර ධර්මදූත කණ්ඩායම් මෙරට සේවයේ යෙදෙන අවස්ථාවලට කිතු දහම් ශු. ලියවිලි සාන්තුවර චරිත පිළිබඳ ජනතාවට ඉගැන්වීම සඳහා පහසුවෙන් ඉගැන්වීමට මාධ්‍යයක් ලෙස යොදාගෙන ඇත්තේ දෙමළ ලේඛන ය. මෙලෙස නිර්මාණය වූ ලේඛන දෙමළ කිතුනු ලේඛන බව සඳහන් වේ.

  * පෘතුගීසි ලන්දේසි යුගයේ විවිධ දෙමළ කිතුනු ලේඛන නිර්මාණය වූ අතර එය අඛණ්ඩව නිර්මාණය වී ඇත.

- **පෘතුගීසි යුගය**

* පෘතුගීසි සමයේ මෙරටට පැමිණි ෆ්‍රැන්සිස්කානු හා ජේසු නිකායේ ධර්මදූතවරුන් විවිධ දෙමළ කිතුනු ලේඛන නිර්මාණය කළ අතර දේශීය ගත්කතුවරුන් දෙමළ ලේඛන කලාවට යොමු කළහ.

* දෙමළ කිතුනු සාහිත්‍යයේ පීතෘවරයා ලෙස හඳුන්වන හෙන්රි හෙන්රිකස් දකුණු ඉන්දියාවේ සේවය කළ සමයේ දෙමළ බසට විවිධ ලේඛන පරිවර්තනය කොට ඇත. මෙතුමා 3 වසරක් මන්නාරම සේවය කළ අතර එහිදී විවිධ පරිවර්තන නිර්මාණ කළ බව වාචික සම්ප්‍රදායේ පැවතේ. එහෙත් මේ ලේඛන සොයාගෙන නොමැත.

* දකුණු ඉන්දියාවේ ධර්මදූත සේවයේ නියැලුනු ඩි නෝබිලේ පියතුමා විවිධ දෙමළ කුතුනු ලේඛන නිර්මාණය කළේය. මෙතුමා තම මහළු වයසේ දී යාපනයේ තෙල්ලිපපලෙයි ප්‍රදේශයේ වසර දෙකක් පදිංචිව විවිධ කිතුනු ලේඛන නිර්මාණය කළ බව සම්ප්‍රදායේ පවතී.

* පෘතුගීසීන් මෙරට මුහුදුබඩ ප්‍රදේශවල හා ග්‍රාමීය ජනතාවට සේවය කළහ. එම කාලය තුළ මේ ජනතාවට පහසුවෙන් කිතුනු චින්තනය ලබාදීමට ජනතාව තුළ භාවිත වූ "නාට්ටාර්" ලේඛන කලාව යොදා ගෙන විවිධ දෙමළ කිතුනු "නාට්ටාර් ලේඛන" නිර්මාණ කරන ලදී.

* මේ අනුව විවිධ නාට්ටුකූත්තු ලේඛන, සන්දියෝගු මයෝර් අම්මානෙ, මඩුවුමාතා අම්මානෙ, ආශිර්වාදකර් අම්මානෙ යන ලේඛන හා ඥානප්පල්ලු, කුරවංචි, කුම්මි, කාදල්, ඔප්පාරි, යන ලේඛන නිර්මාණ විය. මෙම කාලය තුළ නිර්මාණය වූ බව හඳුනාගත් සමහර තවත් ලේඛන සොයා ගැනීමට අපහසු ය.

**සන්දියෝගු මයෝර් අම්මානෙ**

* දෙමළ කිතුනු නාටාර් ලේඛන අතර මුලින්ම ලියවුනු මෙම ලේඛනය අද දක්වා පවතී.

* යාපනයේ තෙල්ලිපපලෙ ප්‍රදේශයේ සේවය කළ ජේසු නිකායේ සුවං කර්වාලු පියතුමාගේ සහය ඇතිව තෙල්ලිපපලෙ හි දී කතෝලික ධර්මය වැළඳගත් පේදුරු පූලවර් විසින් එම ලේඛනය නිර්මාණය කළේය.

* කිලාලි පච්චිලෙප්පල්ලි ග්‍රාමයේ පිහිටි සාන්ත සන්තියාගු දේවස්ථානයේ පැවති වාර්ෂික මංගල්‍යය සැමරීමට පැමිණෙන සැදැහැවතුන් සා.සන්තියාගු මුනිවර පියා කථාව ඔස්සේ දැනුවත් කිරීම සඳහා ජේසු නිකායික පියවරුන් විසින් මෙම අම්මානෙ නිර්ණය කළහ.

**ඥානප්පල්ලු**

* දෙමළ කෙටි ලේඛන 96 අතරින් එක් ලේඛනයක් ලෙස පල්ලු ලේඛනය හැඳින්වේ.

* මෙම ලේඛනය අනුව නිර්මාණය වූ කිතුනු ලේඛන ඥානප්පල්ලු ලෙස හැඳින්වේ.

* කතෝලික ධර්මය වැළඳගත් හින්දු ආගමිකයන් කුඹුරේ වැඩ පළෙහි යෙදෙන අවස්ථාවල දී ධර්මය ඉගැන්වීමට මෙම ලේඛනය යොදා ගන්නා ලදී.

* පන්නෙක්කාරන් (දෙවියන් වහන්සේ) පල්ලන් (ක්‍රිස්තුස් වහන්සේ) මුත්තපල්ලි (ජෙරුසලම්) ඉලෙයපල්ලි (රෝමය) යන චරිත 4ක් කේන්ද්‍ර කොට මෙම ලේඛන නිර්මාණය විය.

* 1645 සිට 1650 දක්වා කාලය තුළ මෙම ලේඛනය තෙල්ලිප්පලෙ පේදුරු පූලවර් විසින් රචිත නිර්මාණයක් විය හැකි බව අති උතුම් වූ දියෝගපිල්ලෙ රදගුරුතුමා සිය පර්යේෂණ මගින් සඳහන් කොට ඇත.

- **ලන්දේසි යුගය**

  * ලන්දේසි පාලන සමය තුළ කැල්වින් දර්ශනය ව්‍යාප්ත කිරීමට පිලිප් පල්දේවුස් නමැති පුද්ගලයා මූලික වී ඇත.

  * මතෙව්තුමාගේ ශුභාරංචිය දෙමළ භාෂාවට පරිවර්තනය කළ මෙතුමා විවිධ ලේඛන නිර්මාණය කොට පාසල් හා දේවස්ථානවල ඉගැන්වීමට යොදා ගත් බව සඳහන් වේ.

  * පර්සිවල් අයියර් නැමැති පුද්ගලයා ආර්මුගනාවලර් ගේ සහාය ඇතිව ශු. බයිබලය දෙමළ භාෂාවට පරිවර්තනය කළේය.

  * ලන්දේසි යුගයේ කතෝලික සැදැහැවතුන් අතර සේවය කළ වන්දනීය ජෝසප් වාස් පියතුමා සැදැහැවතුන් සඳහා යාච්ඤා පොත් , ධර්ම උපදේශ පොත්, පාද නමස්කාරය හා ප්‍රාර්ථනා පොත් දෙමළ බසින් ලියා ඇත.

  * ලන්දේසි යුගයේ දෙමළ කතෝලික ලේඛන නිර්මාණයට විශේෂ දායකත්වය ලබාදෙන ලද්දේ ජාකොමේ ගොන්සල්වේස් පියතුමා විසිනි. එමනිසා මෙතුමා දෙමළ කතෝලික සාහිත්‍යයේ පීතෘවරයාණන් ලෙස හැඳින්වේ. ආරම්භයේදී ජෝසප් වාස් පියතුමා විසින් නිර්මාණය කළ යැදුම් පොත් දෙමළ භාෂාවට පරිවර්තනය කොට උසස් භාෂා ශෛලියකින් නිම කරන ලදී. පසුව ගොන්සාල්වේස් පියතුමා දෙමළ බසින් විවිධ ලේඛන නිර්මාණය කළේය.

- **ඉංග්‍රීසි යුගය**

  උදය තාරකෙ

  * ශ්‍රී ලංකාවේ පැරණිතම හා පළමු ක්‍රිස්තියානි සඟරාව ලෙස මෙය හැඳින්වේ. වර්ෂ 1841 දී ඇමරිකානු ධර්මදූතවරුන් විසින් යාපනයේ දී මෙය ප්‍රකාශයට පත් කළෝය. මාසයක දෙවරක් ප්‍රකාශයන් නිකුත් කරන ලදී. "ධර්මිෂ්ඨතම ජාතියක් උසස් කරයි. කවර ජාතියකට වුව ද පාපය නින්දාවකි" (හිතෝපදේශ 14:34) යන පාඨය මෙම සඟරාවේ පරමාදර්ශයයි. මෙම සඟරාවේ මුල් පිටු දෙක ඉංග්‍රීසි බසින් ද, ඉතිරි පිටු දෙක දෙමළ බසින් ද මුද්‍රණය කොට ඇත. පළමු ඉංග්‍රීසි සංස්කාරක ලෙස චුන්ඩිකුලීයේ උපන් හෙන්රි මාටින් හා දෙමළ සංස්කාරක ලෙස උඩුවිල්ලේ උපන් සෙත් බෙයිසන් සේවය කළෝය. මෙහි මූලික අරමුණ වූයේ කිතු දහම ප්‍රචාරය කිරීමය.

  පාදුකාවලන්

  * යාපනයේ රදගුරු පදවියේ ප්‍රකාශන වන පාදුකාවලන් සඟරාව ශ්‍රී ලංකාවේ පළමු කතෝලික දෙමළ සඟරාව ලෙස හැඳින්වේ. වර්ෂ 1876 මෙම සඟරාව කතෝලික පාදුකාවලන් යන නමින් ආරම්භ විය. කතෝලික බැතිමතුන්ගේ විශ්වාසය ගැඹුරු කිරීම මෙහි පරමාර්ථය විය.

  * මෙහි පළමු සංස්කාරක ලෙස ඇම්. ඒ. මර්ෆි ද සහකාර සංස්කාරක ලෙස සාන්ත පැට්‍රික් විද්‍යාලයේ ගුරුවරයෙකු වූ ජේම්ස් මාටින් ද සේවය කළේය. ආරම්භයේ දී සෑම සතියකට වරක් මෙය නිකුත් වූ නමුත් වත්මන් තත්ත්වය නිසා මාසයකට දෙවරක් මෙම සඟරාව නිකුත් වේ.

**චිත්‍ර ශිල්පය**

අධ්‍යයනයේ පහසුව සඳහා ප්‍රාග් පෘතුගීසි යුගය, පෘතුගීසි යුගය, ලන්දේසි යුගය, බ්‍රිතාන්‍ය යුගය සහ නිදහසින් පසුව උදාවූ යුගය තුළ සොයාගන්නා ලද කිතුනු ලාංඡන සහ චිත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

- ප්‍රාග් පෘතුගීසි යුගය

I. - ක්‍රි.ව. 1912 දී ඊ.ආර්. අයර්ටන් නමැති පුරාවිද්‍යාඥයා විසින් අනුරාධපුරයේ මැද නගරයේ තිබී ගලින් නිමවූ පසුතලයක කොටන ලද විශේෂ හැඩයකින් යුතු කුරුසියක් සොයාගෙන ඇත. අනුරාධපුර කුරුසිය නමින් හඳුන්වන මෙම කුරුසිය කළුගල් කුළුණක කොටා ඇති අතර, මෙම කුරුස ලාංඡනය එහි ඉදිකර තිබුණු දෙව් මැදුරක කණුවක් බව පිළිගනු ලැබේ.

- මෙම කුරුස ලාංඡනය ක්‍රි.ව.2000 දී අනුමත කරන අද බහුලව භාවිත කෙරෙන ශ්‍රී ලංකා කතෝලික ජාතික ධජයේ යොදා තිබේ.

- කලකට ඉහත දී මෙම අනුරාධපුර කුරුස ලාංඡනය වේද භේද කිතුනු නිකායක් වූ නෙස්ටෝරියානුවන්ගේ කුරුසියක් බව වරදවා විශ්වාස කරන ලදී. එහෙත්, පසු කල ලැබී ඇති දත්ත අනුව මෙය පැහැදිළිවම එකල පෙරදිග කතෝලික පිරිස් අතර ජනප්‍රිය වූ කුරුස සලකුණක් බව අවබෝධ වී ඇත. මෙය ශුද්ධ වූ තෝමස් අපෝස්තුළුවරයාණන් විසින් ම නිර්මාණය කරන ලද කුරුසියක අනුරුවක් බව අද පොදු පිළිගැනීමයි. මෙම ආකෘතිය අනුව ම තනන ලද කුරුස කිහිපයක් ඉන්දියාව, පාකිස්තානය, තුර්කිස්තානය සහ ඇෆ්ගනිස්ථානය යන රටවල් අතරින් ද හමු වී ඇත.

II. බෞතීස්ම පොකුණු

- වවුනියාවේ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති ගලෙන් නිමැවූ ප්‍රසාද ස්නාපන ජල බඳුන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දක්වා ඇති පරිදි මුල දී සොයාගෙන ඇත්තේ මාතොට වරාය අසල තිබී ය.

- මෙහි වට ප්‍රමාණය සෙ.මී. 300 කි. විශ්කම්භය සෙ.මී. 118 කි. ගැඹුර සෙ.මී.35 කි. ඝනකම සෙ.මී. 7 කි. මෙම බේසම නිමවා ඇත්තේ එකම ගලකින් ය. දකුණු ඉන්දියාවේ ද තිබී මෙවැනිම ජල බඳුන් හමු වී ඇත. මෙවැනි බේසමක් තැනීම මගින් පෙන්වන්නේ සැළකිය යුතු ප්‍රමාණයක් බෞතීස්මය ලබා ඇති බවයි.

III. කැලණි ගඟ මුවදොර ශුද්ධ වූ තෝමස් මුනිඳුන් සිහිවීම සඳහා කුරුසියක් සහිත කුළුණක් හමුවී ඇත. නූතනයේ එංගලන්ත සභාවේ ගොඩනැගිල්ලක් වන ජින්තුපිටියේ ශාන්ත තෝමස් දේවස්ථානය තනා ඇත්තේ මෙම ස්ථානයේ යැයි ඉතිහාසඥයෝ සැක කරති.

- **පෘතුගීසි යුගය**

I. ගලක කෙටූ පෘතුගීසීන්ගේ නිල ලාංඡනය මෙය ජනාධිපති මන්දිරය පහළින් ඇති ඉඩමක ගෝර්ඩන් ගාඩන් හි පිහිටා ඇත.

II. සන්තානා තිර රෙද්ද. 1666 වන කාලයේ දී සන්තානා මැණියන් ගේ නවගමුව දෙවස්ථානයේ තිරය සඳහා භාවිත කර ඇති මෙම චිත්‍රය අද තේවත්ත කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

III. යාපනයේ චාන්කානෙයි හි (CHANAKANI) ශේෂ වූ කිතුනු දෙව්මැදුරක නටබුන් හමුවී ඇත.

- **ලන්දේසි යුගය**

I. කුරුණෑගල රිදී විහාරයේ මල් ආසනයෙ හි ක්‍රිස්තියානි චිත්‍ර ඇඳ ඇති ටයිල් රැසක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සොයාගෙන ඇත. පහත සඳහන් ක්‍රිස්තියානි තේමා එම ටයිල්වල අඩංගු කර ඇත.

* ක්‍රිස්තුන් වහන්සේගේ ස්වර්ගාරෝහණය, කුඩා වියේදී උන්වහන්සේව ඔප්පු කිරීම, ජේසුස් වහන්සේ මුහුද මත ඇවිදීම, අන්‍ය රූප විලාශය, මාර්තා සහ මරියා යන නව ගිවිසුමේ කථා මෙම චිත්‍රවල තේමාව වී ඇත.

මෙම චිත්‍ර විශේෂත්වය නම් ක්‍රිස්තුන් වහන්සේට ලන්දේසි ඇඳුම් අන්දවා තිබීමය. එතුමාගේ හිස වටා රැස් වළල්ලක් නිර්මාණය කර ඇත.

II. පාස්කු නාටක සහ පසන් ගීත ආරම්භවීමත් සමඟම සුරුවම් කලාව කිතුනුවන් අතර ජනප්‍රිය වී ඇත.

- **බ්‍රිතාන්‍ය යුගය**

- Bezalel Navaratne - බෙෂලෙල් නවරත්න නොහොත් මුහන්දිරම් මුදියන්සේ නවරත්න නම් දක්ෂ කැටයම්කරුවා පන්සල්වල කැටයම් නිර්මාණ කළ පුද්ගලයෙකි. මොහු බෞතීස්මය ලබා බෙෂලෙල් නවරත්න වශයෙන් නම වෙනස් කළේය.
- ඔහු ඉතා දක්ෂ ලෙසින් පේරාදෙණියේ ගුරු පුහුණු මධ්‍යස්ථානයේ ලී කැටයම්වලින් දේවස්ථානයක් නිර්මාණය කර ඇත. ඇම්බැක්කේ දේවාලයේ දක්නට ඇති ආකාරයට මහනුවර කලාව මෙම ස්ථානයේ කැටයම්වලින් ඉස්මතු කර ඇත. බිත්ති ආවරණ නොමැති, සම්පූර්ණ වහලය ලී කැටයම්වලින් දැවමය කුළුණුවලින් නිර්මාණය කර ඇත. එංගලන්ත සභාවට අයත් වූ මෙම දේවස්ථානය අද භාවිතයෙන් අත්හැර දමා ඇති දේවස්ථානයකි. 1936 දී මෙය නිර්මාණය කර ඇත.
- මෙම දේවස්ථානයේ කණු මත ක්‍රිස්තියානි සංකේත හා නිර්මාණ කැටයම් කපා ඇත. ඉතා සමීපව බැලූවිට සිංහල සංස්කෘතියට අයත් මල්, ලියවැල්, පළාපෙති සහ ජ්‍යාමිතික හැඩතල වලින් යුක්ත ය.
- මෙම දේවස්ථානය ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පය සහ මෝස්තර නිර්මාන හුවා දක්වන පළමු දේවස්ථානය වශයෙන් ගත හැකිය.

මෙම යුගය තුළ ස්ථානවලට වඩා පුද්ගලයින් වැදගත් වී ඇත. චිත්‍ර කලාව සම්බන්ධයෙන් වැදගත් වන පුද්ගලයින් කිහිප දෙනෙක් පිළිබඳ ව සොයා බලමු.

- **පෝල් නවරත්න**

  * 1939 - 1940 කාලයේ දී කිතු උපත පිළිබඳ චිත්‍රයක් මොහු චිත්‍රණය කර ඇත. ගවලෙනෙහි ජුසේ තුමා සහ මරියතුමියත්, රජවරුන් තිදෙනාත් ඇඳ තිබුණේ සාම්ප්‍රදායික පෙරදිග ඇඳුම් ඇඳගත් පුද්ගලයින් ලෙස ය. බැටලුවන් වෙනුවට අලි, දේවදූතයින් වෙනුවට දේවතාවන් ද, සයිප්‍රස් ගස් වෙනුවට නා ගස් ද දේශීය ගෘහ භාණ්ඩ ද මෙම චිත්‍රයේ තිබූ අතර, මෙය මතභේදයට තුඩු දුන් චිත්‍රයකි.

  * මොහු බෙෂලෙල්ගේ වැඩිමහල් පුත්‍රයා වූ අතර, දක්ෂ චිත්‍ර ශිල්පියෙක් සහ කැටයම්කරුවෙක් ද විය.

- **හෙන්රිකස්**

  * ක්‍රිස්තියානි තේමා අරමුණු කරගෙන නිර්මාණ කළ චිත්‍ර ශිල්පියෙකි. මෝදර ශා. ජේම්ස් දෙව්මැඳුරේ චිත්‍ර ඇඳ ඇත්තේ මොහු ය. මොහු ඇඳ ඇති අන්තිම රාත්‍රී භෝජන චිත්‍රයේ මොහු තමාවම ගෝළයෙක් වශයෙන් ගෙන නිර්මාණය කර ඇත. මොහුගේ චිත්‍රවලට සාම්ප්‍රදායික පෙරදිග ආභාෂය ලැබී ඇත.

- **ඇන්. ඇස්. ගොඩමාන්න**

  * වර්ෂ 1941 දී ගරු සෙබස්තියන් ප්‍රනාන්දු පූජාප්‍රසාදීතුමා මීගමුවේ මහාවීදියේ ශාන්ත මරියා දෙව්මැඳුරට වෘත්තාකාර සිවිලිමක් සවිකිරීමට මඟ පාදා ගත්තේ ගරු අසව් (Fr. Assau) පියතුමාගේ මූලික සැලැස්ම අනුවය. මෙම නිර්මාණය සඳහා එතුමා යොදාගත්තේ 36 හැවිදිරිදි බෞද්ධ චිත්‍ර ශිල්පියෙකු වූ ගොඩමාන්න නමැති චිත්‍ර ශිල්පියාව ය.

  * ඔහු බයිබලයේ සුලබ අවස්ථා චිත්‍රයට නඟා ඇත. වසර ගණනාවකට පෙර මයිකල් ආන්ජලෝ නම් ඉතාලි ජාතික චිත්‍ර ශිල්පියා මෙන් මොහු ද අඩි 72ක් උස පලංචියක් මත වැතිරී මෙම චිත්‍ර ඇඳ ඇත.

  * වසර 11/2 ක් තුළ දී මොහු චිත්‍ර 12ක් සම්පූර්ණ කර ඇත. සිංහල ජාතිය නමින් ලේක්හවුස් ආයතනය නිකුත් කළ පුවත්පතේ ඉරුදින චිත්‍ර අතිරේකය ද නිර්මාණය කළ මොහු මීගමුව ශාන්ත මරියා දේවස්ථානය වෙනුවෙන් කර ඇති මූර්ති, චිත්‍ර, වෙනත් කිසිම දෙව්මැදුරක නොමැති තරම් ය.

- ඩේවිඩ් වෙන්ඩර්

  * මහනුවර ත්‍රිත්ව විද්‍යාලයයේ දේවස්ථානයේ චිත්‍ර ඇඳ ඇත. පාද දෝවනයේ චිත්‍රයක් ඇති අතර ජේසුස් වහන්සේගේ මුහුණේ රැවුලක් නැත.

  * අල්තාරය පිටුපස කපාල කන්දේ ජේසුස් වහන්සේගේ උකුන් වීමේ චිත්‍රයක් ඇඳ ඇත. මෙම චිත්‍රයේ ද ජේසුස් වහන්සේගේ මුහුණේ රැවුලක් ඇඳ නැත. අත් පා ද, පුද්ගල රූප ඉතා ඉහළ මට්ටමෙන් ඇඳ ඇත.

  * ගල්කිස්සේ ශාන්ත තෝමස් විදුහලේ දේවස්ථානයේ ඇඳ ඇති අන්‍ය රූප විලාශ වීමේ චිත්‍රය මොහු ඇඳ ඇති වැදගත් චිත්‍රයකි. මෙම රූපයේ චිත්‍රගත කර ඇති ජේසුන් වහන්සේගේ ද රැවුල ඇඳ නැත. පසුබිම පමණක් දේශීයකරණය කර ඇත.

**සංගීතය**

හෙළ කිතුනු සංගීත ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රය තුළ ඉතා වැදගත් අංශයකි. කිතුණු සංගීත සම්ප්‍රදායයන් සෘජුවම සහ වක්‍රාකාරයෙන් ජාතික සංගීත ක්ෂේත්‍රයට තම දායකත්වය ලබා දී ඇත.

- සිංහල සංගීතයට කිතුනු සංගීතය දායකත්වය ලබා දී ඇත්තේ කෙසේ ද ?
  - ගරු ජාකොමේ ගොන්සාල්වේස් පියතුමාගේ ඉපැරණි නිර්මාණ මගින්.
  - වහකෝට්ටේ, දූවේ, බෝලවත්තේ ගැයුණු පසන්, ලතෝනී, විලාප තුළින්
  - නත්තල් කැරොල් ගීත සම්ප්‍රදාය මගින්
- හෙළ කිතුනු සංගීතයේ අභිවෘද්ධිය වෙනුවෙන් දායක වූවෝ :

1. ගරු ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා

   ආදි වින බිඳ හරින - ආදි වින බිඳ හරින
   ලෙස පවර මනු වෙසින්
   කුරුසේ මත වැඩ ඉන්න - තෙද දේවාජ බාලනේ
   නිරයෙ අප සතුරන්ගෙන් - නිරයේ අප සතුරන්ගෙන්
   ජය ගන්න සාන්ත කුරුසියෙ අඩයාලමේ
   පිත් පුත් - ස්ප්‍රීතු සාන්තුගෙන් නාමෙන් ආමෙන් - ජේසු . . .

* මෙය හෙළ කතෝලික ගීතිකා සාහිත්‍යයේ මංගල පියවරයි. එනම් ආරම්භයයි. ත්‍රි එක සුර ජේසුනි, නමෝ නමෝ මරිය, අහස පොළොව නිදොසින්නේ, ආරම්බෙන් පෙර, දෙවිඳු උපන්නේය සතුනි වැනි ආදී කිතුනු ගීතිකා තවමත් අප අතර භාවිත වේ.

* බැති ගීවලට පමණක් නොව නාඩගම් ගීත ශෛලිගත නාට්‍ය ආදිය සඳහා ද ගරු ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමාගේ නිර්මාණ බලපා තිබේ. මනමේ නාට්‍යයේ එන ප්‍රේමයෙන් මනරංජිත වේ ගීතයේ තනුව කතෝලික නාඩගම් ගීයක අනුකරණයකි. එය ආරම්බෙන් පෙර... ගීතයයි.

* එතුමාගේ ගීතිකාවට රිද්මය, තනුව සොයා එතුමා කන්ද උඩරට, පහතරට, සබරගමුව කරා ගියේය. එහි දවුල, තම්මැට්ටම, ගැට බෙරය, දෙවොල් බෙරය, හොරණෑ, තාලම්පට එනම් පංච තූර්ය නාද රටා සොයා ගියේය. හෙළ ජනතාවගේ ගීත රිද්මය, තම හදගැස්මට එකතු කර ගත් මෙතුමා හෙළයේ නාටක, නැටුම් සමඟ තමන් උපන් දේශයේ දුටු නාඩගම් කලාවන් අත්දැකීමට ගනිමින් කතෝලික සංගීතයට පණපෙවුවේ ය.

මෙතුමා ලියා ඇති ගීත ප්‍රබන්ධ (5 ක් ලියා ඇත) :

i. වේද කාව්‍යය
ii. පසන් පොත
iii. ආනන්ද කලිප්පුව
iv. මංගල ගීතය
v. ලතෝනි පොත

2. දේව ධර්මාචාර්ය අතිඋතුම් එඩ්මන්ඩ් පීරිස් (නි.ම.නි.) රදගුරුතුමා

* ක්‍රි.ව. 1897 දෙසැම්බර් 27 දින හලාවත ග්‍රාමයෙන් උපන් මෙතුමා හෙළ කතෝලික සංගීතයට පුරෝගාමී මෙහෙවරක් කළ උතුම් පුද්ගලයෙකි.

* හෙළ කතෝලික සාහිත්‍යයෙහි මුල් පොත් සොයා යමින් මෙතුමා ජාකෝමේ ගොන්සාල්වේස් පිය කෘතීන් හෙළ රංගන කලාවට අයත් හෙළ නාඩගම් හා ගායනා එළිමහනට රැගෙන ආවේය.

* - ජයවේ ජේසුනි - ජයවේ ක්‍රිස්තුනී
  - වඩිනු දෙව්මැසියා - පතා සිරී මෙලෝ දනා
  - ගී හඬින් තුති දෙව - සන්තොසින් සියොනෙහි
  - සුම්හිරි ජේසු අසිරි දෙවා - වදන් ඔබේ ඇප් සිත්හි පිහිටුවා
  - සන්තානා මෑණියනී - දෙව් මව්ගේ මාතෘනේ . . .

  යන ගීතිකා රදගුරු හිමිපාණන් සිය පූජක සේවා කාලයේ දී හෙළ කතෝලික ගීතිකා සාහිත්‍යයට තිළිණ කළ ගීතිකා රැසින් ගීතිකා කිහිපයකි.

3. ගරු මර්සලීන් ජයකොඩි (නි.ම.නි.) පියතුමා :

* හෙළ කතෝලික සසුන කෙතක් නම් එම දහම් කෙත අස්වැද්දූ නියමුවා ලෙසින් මෙතුමාව හඳුන්වා දිය හැකිය.

* මහා කිවිසුරාණන් වශයෙන් විශේෂණ නාමයෙන් සඳහන් කිරීමට තරම් මෙතුමන් පොහොසත් වේ.

* මෙතුමාගේ ගීත අතරින් පහත සඳහන් ගීත ඉතා ජනප්‍රිය ය.
  - සපිරි සෑම අසිරි සෝම . . .
  - ශ්‍රී ලංකා රාණී මෑණියේ . . .
  - සුවඳ සැවැන් දෙන . . .
  - රොනට වඩින බිඟු ඔබයි . . .
  - රෑ තරු බබලනවා . . .
  - සීනු හඬින් ලොව පිබිදෙනවා . . .

* ගරු මර්සලීනු ජයකොඩි පියතුමා විසින් පළකළ බැති ගීතිකා පොත් :
  - කැකුළු කිනිති මල්
  - කුමාරි
  - මංගලී
  - තුන් කැකුළ
  - කැරොලිනා
  - රෝස තිත
  - යාගිකා
  - යාග ගී I, II, III
  - සරණ සිරිත
  - වන මල
  - සුවඳ ලාටු
  - බයිබලයෙහි ගීතාවලිය අනුවර්තනය කර හෙළ බසින් පිරිපුන් ගීතිකා පොතක් බවට පත්කර ගීතාවලිය නමින් ගීතිකා පොතක් පළකර ඇත.

* කතෝලික ගීත සාහිත්‍ය විමර්ශනයේ දී ගරු මර්සලීන් ජයකොඩි ගීත සාහිත්‍යයේ තවත් සුවිශේෂී ක්ෂේත්‍රයක් ලෙස නත්තල් ගීත ගත හැකිය. රෑ තරු බබලනවා, සීනු හඬින් ලොව පිබිදෙනවා, නත්තල් ගීත තවත් සියවස් ගණනාවක් දෙව් මැඳුරුවල ගායනා කෙරෙන විට මර්සලීනු ජයකොඩි පියතුමා නොමැති නත්තලක් කිතුනුවනට නොමැති තරම් ය.

* දුව පාස්කු දර්ශනයට ගරු මර්සලීනු ජයකොඩි පියතුමා නව ජීවයක් දී ඇත. එහෙත් භාවිත වූ අජීවී රූප වෙනුවට සජීවී චරිත භාවිත කරමින් පාස්කු දර්ශනය සජීවී චරිතයන් රඟන දර්ශන බවට පත් කළේය. පාස්කු දර්ශනයත් සමඟම ගීතිකා සාහිත්‍යයට ගීත කිහිපයක් එකතු විය. ඒවා නම්,

  - වාදනවේ දුර, සෙවනැලි මත, සඳපානේ පිපි රත් මල් වාගේ, කුරුසියේ නැග අත් විහිදා වැනි ගීත ය.

* 1956 දී තිරගත වූ රේඛාව චිත්‍රපටයේ ගීත පබැඳුම සිදුකළේ අප පියතුමා ය. සමස්ත ලංකා සිංහල කවි සම්මේලනයෙන් පළකළ කවිය නමැති පොතට මෙතුමා කවි ලියමින් හෙළ කවියත් සමඟ එක් විය. සමස්ත ලංකා කවි සම්මේලනයේ සභාපති වශයෙන් ද කටයුතු කළ මෙතුමාට සංගීතය වෙනුවෙන් සම්මාන කිහිපයක් ලබා ගැනීමට හැකි විය.

  - 1975 දී රන් පියුමක් පළදා සම්මානයක් ලබාගන්නා ලදී.
  - 1980 දී මුතු කාව්‍යය වෙනුවෙන් රාජ්‍ය සම්මානය ලබාගන්නා ලදී.
  - 1982 දී කලාශූරී ගෞරව විශේෂණ නාමයෙන් පුදන ලදී
  - 1983 අගෝස්තු 31 දින පිලිපීන රජය විසින් මැනිලාවේ දී රමොන් මැග්සයිසයි නම් ලත් ආසියාතික නොබෙල් තිළිණයෙන් පුදන ලදී.

* ගරු මර්සලීනු ජයකොඩි පියතුමා 1998 දුරුතු මස 15 දින හෙළ කතෝලික සසුනටත් හෙළ දේශයටත් තමාට දෙව් පියාණන්ගෙන් දායාද වූ තලෙන්තු තිළිණ කරමින් සිය දිවියෙන් සමුගත්තේ ය.

**නාට්‍ය හා නාඩගම් කලාව**

කිතුනු සසුන සදාචාරයට පටහැනි නොවූ ආකාරයෙන් නාට්‍ය රඟදැක්වීමට අනුබල දී ඇති බවට ඓතිහාසික සාධක හමු වී ඇත. කිතුනු ප්‍රධාන මංගල්‍ය පැවති අවස්ථාවන්හි දී එම මංගල උත්සවයට හේතු වන ප්‍රධාන කරුණු බැතිමතුනට අර්ථාන්විත ව පහදා දීම අරමුණු කරගෙන දෙව්මැඳුරු ආශ්‍රිතව එම පුවත් නාට්‍යානුසාරයෙන් රඟදැක්වීමේ සිරිතක් ව පැවතුණි. එම නිසා ධර්මදූතවරු පොදු ජනතාවට දහම පහදා දීමට විනෝදාත්මක ක්‍රමයක් වූ නාට්‍ය ක්‍රමය යොදා ගත්තේය. නාට්‍ය රඟදැක්වීම සඳහා ම දෙව්මැඳුරු ආශ්‍රිතව රඟමඬල ද ඉදිකරන ලදී. බල්දෙවුස් නම් ඕලන්ද දේවගැති තුමා 1656 - 1665 කාලයේ දී කළ නිරීක්ෂණයක් අනුව එතුමා පැරණි කතෝලික දෙව්මැඳුරු ගැන මෙසේ ලියා ඇත. මෙහි බොහෝ දේවස්ථාන අසල අට්ටාල හෙවත් රඟමඩුලු ඉදිකර තිබේ. ඒවා හි ජේසු නිකායේ පෘතුගීසි පියතුමන්ලා මංගල දිනයන්හි බයිබලය රඟදැක්වූහ.

- පෘතුගීසි යුගයේ ධර්මදූතවරු ක්‍රිස්තියානි නාට්‍ය රඟදැක්වූ අවස්ථා :

  - ජේසු නිකාය
    - ක්‍රි.ව. 1604 දී කොළඹ ජේසු නිකායට අයත් දෙව්මැඳුරේ මංගල්‍යයේ දී ගිව්සුම් දා ගැබ හා දේව මාතාවන් යන තේමාව පිළිබඳ කරුණු ඇතුළත් නාට්‍යයක් වේදිකාගත විය.
    - ක්‍රි.ව.1613 දී කම්මල ප්‍රදේශයේ විශාල සංඛ්‍යාවක් කිතුදහම වැළඳගත් අවස්ථාවේ දී ලෝකය මැවීම හා ජේසු සමිඳුන්ගේ මාංශගතවීම පුවත ගැබ්කොට නාට්‍යයක් රඟදක්වා ඇත.
    - ක්‍රි.ව.1617 දී හලාවත අභිනව දෙව්මැඳුර ආසිරි ගැන්වීමේ දී කොන්ස්තන්තීනු අගරජුගේ හිත් හැරීම රඟදක්වා ඇත.

  - ප්‍රැන්සිස්කාන නිකාය

    - මාතර ධර්ම සේවයේ නිරතව සිටි අන්තෝනියෝ පෙශෝටෝ තුමා වැදගත් වේ. 1636 දී ලියා ඇති ග්‍රන්ථයක ක්‍රිස්තුන් වහන්සේ ද, ආදම් සහ ඒව යන දෙදෙනාගේ චරිතාපදාන වස්තු බීජ කොට ගෙන දෘශ්‍ය කාව්‍යයන් කිහිපයක් ලියා වේදිකාගත කර ඇති බව ය.

  - පාස්කු නාට්‍ය සම්ප්‍රදාය
    - චතාරික කාලය සහ ශුද්ධ සතිය ආශ්‍රිතව ක්‍රිස්තුන් වහන්සේගේ දුඃඛප්‍රාප්තිය නාට්‍යානුසාරයෙන් රඟදැක්වීම ඉතා සුලභ දසුනකි.
    - ලන්දේසි යටත් විජිත සමයේ දී වන්නි ප්‍රදේශවල දහම් කටයුතු ඉටුකළ ධර්මදූතවරුන්ට නිදහස තිබූ අතර, ඉන් ප්‍රයෝජන ගත් ජුසේ වාස් පියතුමා ඇතුළු ඔරතෝරියානු පූජකයින් සංඛ්‍යාමය වශයෙන් වර්ධනය වී තිබූ සැදැහැවතුන් සමඟ සංවිධානය වී මංගල උත්සවය පෙරහැර සහිතව පවත්වා ඇත.
    - ක්‍රි.ව. 1706 දී ඉහත කී පරිසරය තුළ ගෝවේ ඔරතෝරියානු නිකායෙන් ගෙන්වා ගත් පළඳනා භාවිත කරමින් පාස්කු ප්‍රදර්ශනයක් වේදිකාගත කළ බව ඔරතෝරියානු වාර්තාවක සඳහන් වී ඇත.
    - 16 වන සියවසේ සිට මෙවැනි නාට්‍ය ප්‍රදර්ශන ගෝව නගරයේ ජනප්‍රිය කලාවක් ව පැවතුණු අතර, මෙරට දහම් මෙහෙවර සඳහා පැමිණි පියවරු නාට්‍ය කලාව පිළිබඳ ප්‍රගුණත්වයක් ලබා සිටියේ ය. ජුසේ වාස් පියතුමා සහ ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ද එවකට ගෝවේ ප්‍රචලිත ව තිබූ පාස්කු නාට්‍ය කලාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලැබ සිටියේ ය.

  - ලන්දේසි යුගය

    - සාම්ප්‍රදායික සිංහල නාට්‍ය කලාවක ඓතිහාසික තොරතුරු නොමැති අතර, දේශීය නාට්‍ය කලාවක් බිහි කිරීමේ ප්‍රබල දායකත්වයක් දුන් පාස්කු නාට්‍ය කලාවේ ප්‍රභවය ඇති වූයේ පෘතුගාලයේ සහ ස්පාඤ්ඤයේ පැවති ආගමික නාට්‍යයන් අනුසාරයෙනි.

    - පාස්කු හෙවත් පාස්සු (Passo) නමැති පෘතුගීසි වචනයේ එක් අරුතක් නම් ජේසු ස්වාමි දරුවන්ගේ දුඃඛප්‍රාප්තිය සුරුවම් මගින් නිරූපණය කිරීමයි.

- පාස්කු නාට්‍ය කලාවේ විකාශනය
    - සියවස් හතරකට පමණ පෙර පේසාලෙයි හි ආරම්භ කළ පාස්කු නාට්‍ය මෑතක් වනතුරු රඟදක්වන ලදී. සුරුවම් මාධ්‍ය භාවිත කරමින් මෙය ඉදිරිපත් කර ඇත.
    - පේසාලෙයි හි ආරම්භ කළ පාස්කු නාට්‍ය සම්ප්‍රදාය මුල් කරගෙන දූව, පිටිපන, පමුණුගම ආදී ගම්වල ද නාට්‍ය සංදර්ශන පවත්වා ඇත.
    - දූව පාස්කු නාට්‍යයේ ඉතිහාසය සමඟ සෘජු සම්බන්ධතාවයක් ඇති දූවේ ක්‍රිස්තු ප්‍රතිමාවේ උපත ද ඉන්දියාවේ කොචින් දේශයට නෑකම් කියන්නකි.
    - කොචින් හි විසූ දක්ෂ ප්‍රතිමා ශිල්පියෙකු වූ ජෝකීනු මේස්ත්‍රි නමැති නිර්මාණ ශිල්පියා මගින් ඒ ප්‍රතිමා ලබාගෙන ඇත්තේ ක්‍රි.ව. 1838 දී ය. ඉන්පසු 1839 දී එම ප්‍රතිමාව භාවිත කරගනිමින් මහ සිකුරාදා දින පාස්කු සංදර්ශනය ඉදිරිපත් කර ඇත.
    - දූවේ පාස්කු නාට්‍යයේ ඉදිරිපත් කළ රංග ශෛලිය මධ්‍යකාලීන යුරෝපීය ජනවන්දනා නාට්‍යයෙන් උකහා ගත් රංග ක්‍රමයක් අනුගමනය කරන නිසා මෙම නාට්‍ය තුළ දක්ෂින භාරතීය නාඩගම් ක්ෂේත්‍රයෙන් ලද ආභාෂය මඳ බව පෙනේ.
    - ශ්‍රී ලාංකේය පාස්කු නාට්‍ය පිළිබඳ පැවසීමේ දී බොරලැස්සේ පාස්කු සම්ප්‍රදායේ විශේෂත්වය පිළිබඳ එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමිපාණන් මෙසේ ප්‍රකාශ කර ඇත. මුළුමනින් ම ජීවමාන නළු පිරිසක් විසින් කිතු සමිඳාණන්ගේ දුඃඛප්‍රාප්තිය රඟදක්වනු ලැබූයේ බොරලැස්සේදී බවය.
    - මෙම පාස්කු නාට්‍ය සංදර්ශන ශිල්පය, චරිත නිරූපණය, තාක්ෂණය, සංගීතය සහ වාදනය යන අංශයන්ගෙන් ඉතා ඉහළ මට්ටමක තිබී ඇත.
    - ගී සිංදු සඳහා භාරතීය රාග තාල ඇසුරු කොටගත් මෙම පාස්කු නාට්‍ය සම්ප්‍රදාය දේශීය නාට්‍ය සම්ප්‍රදායේ පිළිබිඹුවක් බව මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා සිය සිංහල ගැමි නාටකයෙහි සඳහන් කර ඇත.
- සිංහල නාඩගම් කලාව
    - කතෝලිකයෝ තමන්ගේ ධර්මාලෝකය ප්‍රකාශ කිරීමට දෘශ්‍ය නාට්‍යයන් උපයෝගී කර ගැනීමට මහත් රුචියක් දැක් වූ අතර, ඒ වනවිට මෙරට නියම නාට්‍ය කලාවක් නොතිබුණ නිසා දක්ෂිණ භාරතයේ ප්‍රචලිත ජනප්‍රිය ගැමි නාට්‍ය විශේෂයක් වන නාඩගම් කලාව ආදර්ශයට ගත්තේය. නාඩගම් වඩාත් ප්‍රචලිත වූයේ බටහිර මුහුදුබඩ වෙරළ ආශ්‍රිත හලාවත සිට තංගල්ල දක්වා වූ ප්‍රදේශවල ය.
    - එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමිපාණන් පවසන පරිදි අද පවතින පළමුවන සිංහල නාඩගම වන්නේ, හලාවත මිහිඳුකුලසූරිය ග්‍රාබියෙල් ප්‍රනාන්දු මහතා විසින් රචනා කර ඇති රජතුන් කට්ටුවේ නාඩගමයි. මෙය නිෂ්පාදනය කර ඇත්තේ ලොරෙන්සු පුලවර් නැමැති කතෝලික පඬිවරයා විසින් රචිත මුව්රාස්කල් නාඩගම අනුව යමිනි.
    - ලොහොකුරුවෙකු වූ පිලිප්පු සිඤ්ඤෝ නමැත්තා දක්ෂ කවියෙකු වූ අතර ඔහු නාඩගම් දහතුනක් රචනා කර ඇත. ඒවායින් බොහොමයක් ක්‍රිස්තියානි විෂයයන් තේමා කරගෙන ලියා ඇත. එනම්, ආදි පිතුරු ජෝශප්, ශු. හෙලේනාතුමිය, ශු. නිකලස් මුනිතුමා, රජතුන් කට්ටුව සහ ප්‍රාණපරිත්‍යාගී ශු. එවුස්තාකියුස්තුමා යන තේමා ය. මොහු ලියා ඇති ලේපොල, සිංහවල්ලී යන නාඩගම්වලටත් කතෝලික ආභාෂය බලපා ඇත.

- කතෝලික ජනවන්දනා ආභාෂය ලැබ රචිත නාඩගම්වල අරමුණ වූයේ හුදු නාට්‍යමය රසයක් ප්‍රේක්ෂකයින්ට ලැබදීමට වඩා කිතු දහම වඩා ප්‍රායෝගිකව සැදැහැවතුන් තුළ පිහිටුවීමත්, නවක කිතු බැතිමතුන් දිරිගැන්වීමත් ය.

- ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා සහ සිංහල නාට්‍ය කලාව

  - සිංහල සාහිත්‍ය ඉතිහාසයේ නාට්‍ය සාහිත්‍යාංගය දෘශ්‍යමාන නොවූ අවධියෙක සිංහල ක්‍රිස්තියානි සාහිත්‍යයක් සහ නාට්‍ය කලාවක් බිහිවීමට රුකුලක් වූයේ ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගේ සාහිත්‍යාවලිය බව කිව යුතුම ය.

  - දේව නීති විසර්ජනය නාටෝචිත අවස්ථාවන්ගෙන් පිරිපුන් දෘශ්‍ය වූ කාව්‍යය ප්‍රබන්ධයක් වූ අතර, නඩු පොත යනුවෙන් ද ඇතැම්හු මෙය හඳුන්වා ඇත.

  - පාස්කු නාට්‍යයක ස්වරූපය උසුලන දුක් ප්‍රාප්ති ප්‍රසංගය ප්‍රබන්ධයෙන් සුරුවම් මගින් කිතු සමිඳුන්ගේ දුඃඛප්‍රාප්තිය ප්‍රදර්ශනය කිරීමේ දී කියවා ඇත.

    මෙම දර්ශන අතරතුර දී ශෝකාකූල විලාශයක් ලෙස ගායනා කිරීම සඳහා දේශනා නවයේ පසන් පොත පද්‍ය ප්‍රබන්ධය ද භාවිත කර ඇත.

  - සිංහල නාඩගම් රචකයින්ට ගොන්සාල්වේස් පියතුමාගේ නිර්මාණයන් පූර්වාදර්ශය හා අමුද්‍රව්‍ය සපයා ඇත. මංගල ගීතයෙන්, පසන් පොතින්, නාඩගම් රචකයින් එතුමාගේ ප්‍රබන්ධයක් උපුටාගත් බව ඇම්. එච්. ගුණතිලක මහතා සිය ආචාර්ය උපාධිය සඳහා සම්පාදනය කළ නාඩගම නම් නිබන්ධයේ සඳහන් කර ඇත.

    *උදා* : පුරාණ රජතුන් කට්ටුව නාඩගම රචනයේ දී කතුවරයා ගොන්සාල්වේස් පියතුමන් රචනාකළ දේව වේද පුරාණය මත යැපුණ බව පැහැදිළි වේ. එමෙන් ම දුක්ප්‍රාප්ති ප්‍රසංගයෙන්, සුවිශේෂ විසර්ජනයෙන් ගත් යෙදුම් ද බෞද්ධ රචකයින් විසින් ප්‍රබන්ධ කරන ලද නාඩගම්වල විද්‍යාමාන වේ.

- දෙමළ නාඩගම් කලාව

  - ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාව ජීවත් වූ යාපනය, මඩකලපුව, මන්නාරම, මාතෝඩ්ඩම්, වන්නි, පුත්තලම, හලාවත යන ප්‍රදේශවල නාඩගම් කලාව පැවතිණ. දෙමළ නාඩගම් කලාව හින්දු ආගමේ පුරාණ ඉතිහාසයේ තිබූ භක්ති ප්‍රේමය, වීර්යය, යුද්ධ වැනි තේමා ඔස්සේ පැවතුණි.

  - කතෝලික ධර්මයේ ඉගැන්වීම් හා වටිනාකම් ජනතාවට ගෙන යාමේ මාධ්‍යයක් ලෙස පෘතුගීසීන් පාලන කළ යුගයේ මෙරට සේවාවේ නියැලුනු ප්‍රැන්සිස්කාන හා ජේසු නිකායික පියවරු නාට්ටුකූත්තු කලාව යොදාගෙන ඇත. මෙහි ප්‍රධාන තේමාව ලෙස සාන්තුවර චරිත හා යුරෝපීය කථා ඉවහල් කොටගෙන ඇත. කතෝලික නාඩගම් කලාව බිහිවන අවස්ථාවේ මෙරට ලන්දේසි පීඩනයට මුහුණ දෙමින් සිටියහ. එම නිසා මේ කාලයේ බිහිවූ නාඩ්ටුකුත්තු හි දුක් විඳීම මූලික තේමා විය.

  - ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ විශ්වාසයට හා ශුභාරංචියේ වටිනාකම්වලට සාක්ෂි දරමින් අභියෝගවලට මුහුණ දුන් සාන්තුවරු ප්‍රතිලාභ ලැබූවාක් මෙන් කිතුනුවන් තමන් මුහුණ දෙන දුක්විඳීම ප්‍රතිලාභ ලබා ගනියි යන්න බලාපොරොත්තු ඇති කරන ඉගැන්වීම් මෙම කතෝලික නාට්ටුකූත්තු මගින් ප්‍රකාශ කළහ.

  - කතෝලික නාට්ටුකූත්තු බොහෝවිට සාන්තුවර චරිතවල ආභාෂය ලබා ඇත. සාන්තුවර බැතිය හා ගෞරවය ප්‍රකාශ කරන මාධ්‍යයක් ලෙස මෙම නාට්‍යය යොදාගෙන ඇත. එම නිසා සාන්තුවර චරිතය රඟදැක්වූයේ නැත. ඒ වෙනුවට ගීතිකා ගායනා කළහ. එලෙස කිරීමට හේතුව වූයේ සාන්තුවර ගෞරවය ගෙන දීමය.

- **පෘතුගීසි යුගය**

  - පෘතුගීසි ධර්මදූතවරු විශේෂයෙන්, ජේසුනිකායේ පියවරු අපරදිග තිබූ නාඩගම් කලාව මගින් ධර්මදූත සේවාවේ යෙදුන බව වාර්තා වී ඇත. ධර්මදානය හා සාරධර්ම පිළිබඳ ඉගැන්වීම් සඳහා ස්පාඤ්ඤ නාට්‍ය කලාව මෙහි දී උපයෝගී කොට ඇත.

  - ජේසු නිකායික පියවරුන්ගේ නාට්‍ය කලාව මගින් වාර්ෂික දේවස්ථාන මංගල්‍යය පිළිබඳ ජනතාව දැනුවත් කරන ලද්දේ තමන් සතු වූ පාසල් හා දේවස්ථාන තුළිනි. උදා : 1633 තෙල්ලිපලෙල ෆ්‍රැන්සිස් සේවියර් මුනිතුමාගේ දේවස්ථානය විවෘත කරන අවස්ථාවේ දී විවිධ නාඩගම් ඉදිරිපත් කළ බව ඉතිහාසයේ සඳහන් වේ. නමුත් මේ සමයේ පෘතුගීසි ඉතිහාසය අනුව පෙරදිග සම්ප්‍රදායික නාඩගම් කලාව ජේසු නිකායේ පියවරු විසින් භාවිත කළ බවට සාක්ෂි නැත.

- සාම්ප්‍රදායික කතෝලික නාට්‍ය කලාවේ ආරම්භය

  - සාම්ප්‍රදායික කතෝලික නාට්ටුකූත්තු මන්නාරම, යාපනය ප්‍රදේශවල ආරම්භ වී වර්ධනය විය. නානාට්ටාන් හි බෙන්ජමින් සෙල්වම් මහත්මාගේ මන්නා මාතෝඩ්ටම් තමින් පූලවර් සරිතිරම් නමැති කෘතිය මන්නා මතෝඩ්ටම් ප්‍රදේශයේ නාට්ටුකූත්තු වර්ධනය වූ අන්දම දැනගැනීමට අත්වැලක් වේ.

  - මේ ග්‍රන්ථයට අනුව මන්නා මතෝට්ටම් ප්‍රදේශයේ ලොරන්සු පිල්ලෙල පූලවර් ප්‍රථම වතාවට මුව්රාසාක්කල් වාසාප්පු යන නාඩගම් ගායනා කළේය. මෙය තෙන්පාංගු ශෛලයෙන් ඉදිරිපත් කළේය.

  - ලොරෙන්සු පුල්ලෙල පූලවර් මහතාගේ මුණුපුරා වන කිතාම්පිල්ලෙල විසින් එරුමෙම නොන්ඩි, එන්රික් එම්පරදෝ, පූරිසීන කන්නි යන නාඩගම ගායනා කරන ලදී. මෙහිදී වඩපාංගු යාපනයේ ශෛලය යොදාගෙන තිබේ.

  - යාපනයේ පාෂෛයූර් හි සුවාම්පිල්ලෙල පුලවර් 1810 දී ප්‍රථමයෙන් අන්තෝනියාර් නාඩගම රචනා කළේය. තවද තේවසහයම් පිල්ලෙල, සවින කන්නි, යුදකුමාරන්, එස්තාකියාර්, සෙන්නිකිලාර්, ක්‍රිස්තෝපර්, ඥාන සෞන්දරී යන විවිධ කූත්තු නාඩගම් රඟදක්වන ලදී. මේවා තෙන්පාංගු ශෛලය අනුසාරයෙන් නිර්මාණය විය.

- **බ්‍රිතාන්‍ය යුගයේ නාට්ටුකූත්තු**

  - බ්‍රිතාන්‍ය යුගයේ කතෝලික නාට්‍ය සඳහා ප්‍රබල විරෝධතා ඇතිවිය. මත්පැන් භාවිතය හා ස්ත්‍රී පුරුෂ සියල්ලෝ මිශ්‍රව කටයුතු කිරීම මගින් සදාචාරයට බාධාවක් විය හැකි නිසා නාඩගම් තහනම් කරන ලදී.

  - නමුත් මේ යුගයේදීත් නාඩගම් රඟදැක්වූ බවට සාක්ෂි තිබේ.

- **සිංහල නාඩගම් කලාවට දායක වීම**

  සිංහල නාට්‍ය සඳහා දෙමළ

  - සිංහල නාඩගම් සම්ප්‍රදාය බිහිවී වර්ධනය වීමට දෙමළ නාට්ටුකූත්තු මූලික වී ඇත. විශේෂයෙන් ම සමහර නාට්ටුකූත්තු දෙමළ නාට්ටුකූත්තුවලින් සෘජුව පරිවර්තනය කොට ඇත. උදා : එස්තාකි යෝසපාන්, සන්නිකිලාර්, ඥාන සෞන්දරී යන නාඩගම් සඳහන් වේ.

- මුවිරාසාකල් යන නාඩගම ප්‍රථමයෙන් සිංහල භාෂාවට පරිවර්තනය වූ නාඩගමයි. හලාවත ගේබ්‍රියෙල් ප්‍රනාන්දු මහතා විසින් එය පරිවර්තනය කර ඇත.
- සිංහල නාඩගම් කලා සම්ප්‍රදාය දෙමළ නාඩගම් කලාවෙන් බිහි වූ බව සිංහල නාඩගම් කලාවේ නිර්මාතෘ වන මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර ශූරීන් හා හලාවත රදගුරු පදවියේ හිටපු රදගුරු අති උතුම් එඩ්මන්ඩ් පීරිස් රදගුරු හිමිපාණෝ පිළිගත්තේය.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- කිතුනු ලේඛන කලාවට පන්නරයක් වූ ලේඛනයන් පිළිබඳව හා ඔවුන්ගේ ලේඛන පිළිබඳ අධ්‍යයනය කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එම ලේඛනවලින් ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීමට ලේඛනයන් දායක වූ අයුරු ගොනු කිරීමට අවස්ථාව දෙන්න.

**පැවරුම :**

- කිතුණු සංගීතය නිර්මාණය කිරීමට දායක වූ කිතුනු කලාකරුවන් පිළිබඳ තොරතුරු සොයා පොත් පිංචක් නිර්මාණය කරන්න.
- ජාකොමේ ගොන්සාල්වේස් තුමා ලේඛකයෙකි. කවියෙකි. සංගීතඥයෙකි. මෙම කරුණු සනාථ කරමින් ව්‍යුහගත රචනාවක් ලියන්න.
- ප්‍රාග් පෘතුගීසි යුගයේ කිතුදහම මෙරට තිබූ බව කිතුනු චිත්‍ර සහ ලාංඡන මගින් ඉදිරිපත් කරන්න.

**මූලාශ්‍රය :**

1. හෙළ කලාවේ කිතනු සළකුණු
2. ශ්‍රී ලංකාවේ කිතුනු දායකත්වය
3. හෙළ කාව්‍ය කලාව පොහොසත් කළ කිතුනු රංග කලාව
4. ශ්‍රී ලංකාවේ ක්‍රිස්තු ශාසන ඉතිහාසය

**නිපුණතාව 10.0** : **නව ලෝක ශිෂ්ටාචාරයක් බිහිකිරීමේ සහ ප්‍රයත්නයේ දී ආසියාතික හා ලාංකේය සමාජය වෙනුවෙන් සභාවේ වගකීම දායක වේ.**

**නිපුණතා මට්ටම 10.1** : දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ සංස්කෘතික හා සමාජීය සංවර්ධනය සඳහා වූ යෝජනා ක්‍රියාත්මක වෙයි.

**කාලය** : කාල පරිච්ඡේද 14

**ඉගෙනුම් ඵල** :

- දෙවන වතිකාන කතිකාව පැවැත්වීමට මුල් වූ කරුණු සොයයි.
- මන්ත්‍රණ සභාවේ සමාජ ප්‍රගතිය සඳහා දායක වූ අයුරු විමර්ශනය කරයි.
- පවුල් ජීවිතය හා සංස්කෘතිය නඟා සිටුවීමට ක්‍රියා කරයි.
- සාමය, සහජීවනය ගොඩනංවාලිය හැකි අවස්ථා ඉදිරිපත් කරයි.
- සභා සවෝදයට වතිකාන කතිකාව දායකවීම පිළිබඳ විවාදයක් ගොඩනගයි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 10.1.1 දෙවන වතිකාන මන්ත්‍රන සභාවේ ඉගැන්වීම් පිළිබඳ තොරතුරු

- දෙවන වතිකාන කතිකාවත කැඳවීමට පසුබිම් වූ සිදුවීම් රාශියක් ඇත.

    * ලෝකය හා සභාව වෙන් වශයෙන් ගමන් කරමින් තිබූ අවධියක ලෝකය හා සභාව ගැන ගැඹුරින් සිතා බලා වර්තමාන ලෝකයට ගැලපෙන ලෙස සභාවේ ඉගැන්වීම් ඉදිරිපත් කිරීම.

    * සභාව තුළ පැවති පිරමීඩාකාර ආකෘතිය තුළ සභා නවෝදයක් උදාකළ නොහැකි බව වටහා ගැනීම.




    * මෙම පිරමීඩාකාර ආකෘතිය පූජක කේන්ද්‍රීය විය.



* මේ නිසා ජනතා කේන්ද්‍රීය සභාවක අවශ්‍යතාවය කැපී පෙණුනි.

නායකයාව තෝරාගනු ලබන්නේ ජනතාව තුළින්ම ය. ඒ නිසා එය ජනතා කේන්ද්‍රීය සභාවක් ලෙස හඳුන්වයි. මේ නිසා කොපර්නිකස් විප්ලවයක් සිදුවූ මන්ත්‍රණ සභාවක් ලෙස II වතිකාන මන්ත්‍රණ සභාව දැක්විය හැකිය.

* කාල් රානර්, කාර්දිනල් බෙයා, හෑන්ඩ්ස් කොංගා වැනි උගත් දේව ධර්ම විශාරදයන්ගේ හඬනැඟීම් විශේෂ තැනක් ගනු ලැබුවෝය. විශේෂයෙන් ම හෑන්ඩ්ස් කෝංගා ගිහියා පිළිබඳ ව ඉතා ප්‍රබලව කථාකළ පුද්ගලයෙකි.

* විවිධ ගිහි සංවිධානවල බලපෑම් (උදා : මරිය හමුදාව)

* පළමු වතිකාන කතිකාව ප්‍රංශ - පර්සියන් යුද්ධය නිසා දිගටම කරගෙන යාමට නොහැකි වූ නිසා ඉතිරි වූ කෙටුම්පත්වල අඩංගු කරුණු මගින් සභාව නැවතවරක් ප්‍රාණවත් කිරීම 23 ජුවාම් ශුද්ධෝතම පියතුමාගේ අදහස විය.

* විවිධ ක්‍රිස්තියානි සභා අතර මේ තාක් එකිනෙක කෙරෙහි තිබූ සැකය හා අවිශ්වාසය දුරුකර සභා එකමතුකමට මඟ පෑදීන.

* විශ්වාසයේ සත්‍යතාවයන් වෙනස්වන ලෝකයට එනම් නූතන මිනිසාගේ මනෝභාවයට ගැලපෙන පරිදි දෙවිදහම තුළින් ඉදිරිපත් කිරීම.

* සභාව තුළ පැවති ගිහි පැවිදි දුරස්තරභාවය ගැන පැන නැගී ඇති දුර්මත බිඳදැමීම.

* පරිවර්තන යුගයට ගැලපෙන ලෙස විනය කරුණු සකස් කිරීම

- දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ සාකච්ඡාවල සෑම දෙයක්ම ප්‍රධාන තේමා 4කට වෙන්කළ හැකි ය.

| | | |
|---|---|---|
| * දෙවියන් වහන්සේ | - | ආදරවන්ත පියෙක් බව (ජොහාන් 15/13, ලූක් 5/20, මතෙව් 6/9) |
| * මනුෂ්‍යයා | - | මිනිසා දේව ස්වරූපයට හා සමානකමට මවා ඇති බව (උත්පත්ති 2/19-20) |
| * ශුද්ධ වූ සභාව | - | උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ ඉතිහාසය තුළ ලෝක අන්තිමය දක්වා වැඩ සිටීම (මතෙව් 28/16-20) |
| * ලෝකය | - | මුළු මිනිස් සංහතියම එකම පවුලක් ලෙස ජීවත් වීම. |

- (මිනිස් වටිනාකම් හා ක්‍රිස්තියානි වටිනාකම් අතර වෙනසක් නැත.) අද නවීන ලෝකය තුළ යුක්තිය, සත්‍යය, සාධාරණත්වය, සංවර්ධනය යනු ක්‍රිස්තුන් වහන්සේට තවත් නම් ය. (උත්පත්ති 1/31)

- දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ ජනතා ප්‍රතිචාරය ඒකාකාර නොවේ. විවිධ කොටස් තම මතිමතාන්තර අනුව විවිධාකාරයෙන් ඊට ප්‍රතිචාර දැක්වූහ.

* මුල සිටම පුද්ගල මූලික චින්තන ක්‍රමය කෙරෙහි පැහැදී සිටි පිරිස් දෙවන වතිකාන කතිකාව ඉමහත් ආශාවකින් පිළිගත්හ.

* ඇතැමෙක් මෙම ඉගැන්වීම් තමනට නුහුරු නුපුරුදු දෙයක් වුවත් සභාවේ ගුරුබලය වෙත ඇති ගෞරවය නිසා පිළිගත්හ.

* සමහරෙක් වතිකාන කතිකාව මානුෂික අංශය හා ලෝකය වෙත නැඹුරු වෙමින් ධර්මානුකූල

අංශය නොසලකා හැරියේ යැයි චෝදනා කළහ.

* කතිකාවතේ ඉගැන්වීම්වල ගැඹුරු හා නවතාවය ගැන බලන කළ මෙවැනි ප්‍රතිචාරයක් ඇතිවීම පුදුමයට කරුණක් නොවේ යැයි පවසන 6 වන පාවුළු ශුද්ධෝතම පියතුමා කතිකාව අවසන් කරමින් එහි අරමුණු ඉටුවී ඇති බව සඳහන් කළ සේක. තුන්වන ප්‍රතිචාරය පදනම් විරහිත බව ප්‍රකාශ කළ සේක. දෙවන වතිකාන කතිකාවේ ශුද්ධ වූ සභාව අනුගමනය කරන්නේ යහපත් සමරිතානුවරයාගේ උපමාවෙන් ඉදිරිපත් වුණු සහෝදර දයාව පදනම් කරගත් ආධ්‍යාත්මිකත්වයෙන් බව එතුමෝ ප්‍රකාශ කළහ.

* දෙවන වතිකාන කතිකාවෙන් ගත් තීරණ ප්‍රකාශන 16 කින් නිකුත් කරන ලදී. ඒවා වර්ග 3කට බෙදිය හැක. එනම්,
    * ව්‍යවස්ථා
    * නියෝග (ආඥා)
    * ප්‍රකාශ

ව්‍යවස්ථා හතරකි.

1. ජනවන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව
2. ශුද්ධ වූ සභාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව
3. දේව ප්‍රකාශන පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව
4. නූතන ලෝකයේ ශුද්ධ සභාව පිළිබඳ උපදේශාත්මක ව්‍යවස්ථාව

නියෝග (ආඥා) නවයකි.

1. ජනසන්නිවේදන මාධ්‍ය පිළිබඳ නියෝග
2. පෙරදිග සභා පිළිබඳ නියෝග
3. සභා එකමුතුව නඟාලීම පිළිබඳ නියෝග
4. රදගුරුතුමන්ලාගේ වගකීම් පිළිබඳ නියෝග
5. පැවිදි දිවිය කාලානුරූප කිරීම පිළිබඳ නියෝග
6. පූජක පුහුණුව පිළිබඳ නියෝග
7. ගිහි ධර්මදූත සේවාවන් පිළිබඳ නියෝග
8. සභාවේ ධර්මදූත සේවාවන් පිළිබඳ නියෝග
9. පූජක ජීවිතය හා සේවාවන් පිළිබඳ නියෝග

ප්‍රකාශන තුනකි.

1. ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ප්‍රකාශනය
2. සභාව හා අන්‍යාගමිකකරණයන් පිළිබඳ ප්‍රකාශනය
3. ආගමික නිදහස පිළිබඳ ප්‍රකාශනය

- නූතන ලෝකයේ ශු. සභාව ලේඛනය තුල මන්ත්‍රණ සභාවේ සමාජ ප්‍රගතිය සඳහා වූ ඉගැන්වීම් ද සංස්කෘතිය නඟාසිටුවීම සඳහා වූ ඉගැන්වීම් ද, පවුල් ජීවිතය පිළිබඳ ඉගැන්වීම් ද, සාමය හා සහජීවනය පිළිබඳ ඉගැන්වීම් ද අඩංගු වේ.

- නූතන ලෝකයේ ශු. සභාව නමැති ව්‍යවස්ථාව සඳහා වූ පසුබිම අවබෝධ කරගත යුතු වේ.
- II වතිකාන කතිකාව මගින් ප්‍රකාශිත දීර්ඝතම ව්‍යවස්ථාව මෙයයි. බ්‍රසීලයේ රියෝ ද ජෙනරෝ පදවියේ හෙල්ඩා කමාරා සහයක රදගුරු හිමිපාණන් විසින් සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කළේය.

  දිළිඳුකම, අසමතුලිත දේපළ බෙදීම වැනි ලෝකය තුළ දක්නට ලැබෙන මූලික ප්‍රශ්න වන අතර, ඒවාට විසඳුම් සෙවීමට සභාවේ දායකත්වය පිළිබඳ මෙහි දී ගෙනහැර දැක්වේ. දීර්ඝ විවාදයකින් අනතුරුව මෙම ව්‍යවස්ථාව එළිදැක්වේ.
- ඉහත ව්‍යවස්ථාව තුළින් ශු. සභාවට නව දැක්මක් ඉදිරිපත් කරයි.
- සමස්ත මිනිස් සංහතිය සමඟ පොදු එකඟතාවයකට යොමුවී එම කටයුත්ත සඳහා සියල්ලන්ගේ දායකත්වය ලබාගැනීම මෙහි දී සැලකිල්ලට ගැනීම.
- ලෝකයේ සැබෑ තත්ත්වය අනාවරණය කර මිනිසාගේ ගරුත්වය කෙරෙහි බලපාන විවිධ ගැටලුවලට පිළිතුරු සෙවිය යුතු ආකාරය පිළිබඳ ව ශු. බයිබලීය දැක්ම අනුසාරය පිළිබඳ කරුණු ගෙනහැර දක්වයි.
- මෙම ව්‍යවස්ථාවේ සියලු කරුණු තුළ සැලකිල්ලට ගතයුතු ක්‍රිස්තු කේන්ද්‍රීය බව ඉතා දැඩි ලෙස හුවා දක්වයි.

### 10.1.2 දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ සමාජ ප්‍රගතිය සඳහා වූ ඉගැන්වීම්

- සමාජ ප්‍රගතිය සඳහා වූ ඉගැන්වීම් ඇතුළත් දෙවන වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශනය කුමක්දැයි විමසා වර්තමාන ලෝකයේ ශු. සභාව නමැති විශ්ව ප්‍රකාශනය ගැන කෙටි හැඳින්වීමක් කරන්න. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ සමාජ ප්‍රගතිය සඳහා ඉගැන්වීම් පිළිබඳ කරුණු මතුකර ගැනීම.

  * මනුෂ්‍යයා සමාජ හා ආර්ථික ජීවිතයේ ප්‍රගමනයන් කේන්ද්‍රය හා පරමාර්ථයන් වන බව.
  * තාක්ෂණික හා කාර්මික දියුණුව සමස්ත මිනිස් වර්ගයාගේ සේවයට යෙදවිය යුතු බව.
  * මෙහිදී මිනිසා තුළ ඇති ශාරීරික, මානසික හා අධ්‍යාත්මික අවශ්‍යතාවයන් ගැන ද සිහිතබා ගත යුතු බව.
  * සෑම පුද්ගලයෙක් ම තමනට අයිතිවාසිකම් හා යුතුකම් ඇති බවත් ඒවා මගින් තම පොදු සංඝයේ වර්ධනයට සහයෝගය දිය යුතු බවත් මතක තබාගත යුතු ය.
  * කම්කරුවන්ගේ වැටුප් සහ වැඩකිරීමේ කොන්දේසි සම්බන්ධව සාධාරණව තීරණ ගන්නා අතර, ඔවුනට පාඩුවක් වන ආකාරයෙන් වෙනසක් ඇති නොකළ යුතු බවය.
  * මිනිස් වැඩ කර්මාන්ත උසස් වූ ගෞරව සම්පන්න දෙයක් කළේ නාසෙරෙත් හි ජේසුස් ස්වාමීන් වහන්සේ ය.
  * vi පාවුළු ශුද්ධෝතම පියතුමා කම්කරු සේවකයා පිළිබඳ විශ්ව ලේඛනය මගින් කම්කරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ව ඉතා දීර්ඝ ලෙස සාකච්ඡාකොට ඇත.
  * කම්කරුවා උන්වහන්සේගේ කැළවීමදායක කෘතියට සම්බන්ධ වන බව අපි විශ්වාස කළ යුතුය.
  * කම්කරුවන්ට තමන් කරන වැඩ මගින් තම හැකියා හා පෞද්ගලිකත්වය දියුණු කරගැනීමට

අවස්ථාව සැලසිය යුතු ය.

* සෑම කම්කරුවෙක්ම ක්‍රියාකාරීව තම සේවා ස්ථානයේ පාලන කටයුතුවලට සහභාගී විය යුතු ය.

* එම සහභාගීත්වය පුද්ගලිකව හෝ තම නිදහස් කැමැත්තෙන් කළහැකි ය.

* කම්කරු සමිති පිහිටුවා ගැනීමේ නිදහස් අයිතිය හැම මනුෂ්‍යයෙකුගේම මූලික අයිතිවාසිකම්වලින් එකක් වශයෙන් සැලකිය යුතු ය.

* ලෝකයේ වර්තමාන තත්වය අනුව වුව ද කම්කරු අයිතිවාසිකම් හා වුවමනා ලබාගැනීමට වැඩවර්ජන අන්තිම උපකරණය ලෙස සැලකිය යුතු ය.

* එහෙත් එම තීරණයට පෙර දෙපක්ෂය අතරේ අවංකව සාකච්ඡා පැවැත්වීම ප්‍රථමයෙන් කළයුතු බවත් සමාදානයෙන් සමථයකට පැමිණීමට නොහැකි වූ අවස්ථාවල දී මෙම තීරණය ගත හැකි ය.

* තමාටත්, තම පවුලටත් සෑහෙන ප්‍රමාණයක මෙලෝ දේවලින් තම කොටස ලබා ගැනීමට අයිතියක් ඇත.

* දෙවියන් වහනසේගේ අභිමතය අනුව මෙලොව සෑම දෙයක්ම සෑම මනුෂ්‍යයෙකුගේ ම අවශ්‍යතා සඳහා මවන ලදී.

* වස්තුව බෙදා ගැනීමේ දී දැනට ජීවත්වන අයටත්, මතුව ජීවත්වන අයටත්, ලබාගැනීමට හැකිවන සේ ඒවා පරිහරණය කළයුතුය.

* අයිතිය හා භෞතික දේවල් පෞද්ගලික පාලනය කෙනෙකුගේ පෞද්ගලිකත්වයේ හා නිදහස ප්‍රකාශ කිරීමේ අවස්ථාවක් වනු ඇත.

* ක්‍රිස්තියානීන් වර්තමානයේ සමාජ, ආර්ථික සංවර්ධනය ව්‍යාපාරවල ක්‍රියාකාරීව සහභාගී වෙමින් යුක්තිය හා ප්‍රේමය උදෙසා සටන් කරමින් මිනිස් සමෘද්ධියට හා ලෝක සාමයට ආධාර කළ යුතුය.

* සැබෑ මිනිස් දේශපාලන ජීවිතයක් ගොඩනැගීමට නම් යුක්තියේ ද, කරුණාවන්තකමේ හා පොදු යහපත සඳහා සේවය කිරීමේ දී අභ්‍යන්තර හැඟීම් තිබිය යුතු ය.

* තම පාලකයන් පත්කිරීම සහ කුමන ආණ්ඩු ක්‍රමයක් තම රටේ තිබිය යුතු ද යන්න ගැන රටවැසි සෑම කෙනෙකුටම පූර්ණ නිදහසක් තිබිය යුතු ය.

* පක්ෂ දේශපාලනය, ශු. සභාවට අහිතකර වුවත් සමාජයේ වර්ධනය සඳහා පොදු දේශපාලන කටයුතුවල නිරත විය යුතුය.

* සෑම ක්‍රිස්තියානි කාරයෙක් ම තම යුතුකම් ඉටුකිරීම පිළිබඳ ව ප්‍රත්‍යක්ෂ ආදර්ශයක් වීම හා පොදු යහපත නඟාලීම සඳහා තමන්ගේ සේවාවන් සමාජය වෙනුවෙන් ඉෂ්ට කළ යුතුය.

* ශු. සභාව කිසිදු ආකාරයකින් දේශපාලන පක්ෂයකට හෝ කිසිදු ලෞකික සංවිධානයකට සම්බන්ධයක් නැත.

* දෙවියන් වහන්සේගේ මහිමය සඳහා ද මනුෂ්‍යයන් අතර සාමය ශක්තිමත් කිරීම සඳහා ද මිනිස් සමාජයේ සත්‍ය හා යහපත් වූ දේ අනාවරණය කිරීම භක්තියෙන් රැකබලා ගැනීම හා උසස් බවට පත් කිරීම සභාවේ කාර්යය වනු ඇත.

* ආගම දේශපාලනය ඉක්මවා යාම පමණක් නොව මෙලොවට සීමාවූවක් ද නොවනු ඇත.

### 10.1.3 සංස්කෘතිය නගාසිටුවීම සඳහා වූ ඉගැන්වීම්

- මනුෂ්‍ය සම්පූර්ණත්වය මේ ලෝකය තුළලබාගත නොහැකිය. ප්‍රසාද ස්නාපනයෙන් ආරම්භ කරන සක්‍රමේන්තුමය ජීවිතය සංස්කෘතික හා ස්වභාවික සම්පත් භාවිත කරමින් ඉදිරියට යාමක් සිදුවෙයි.

  * මිනිස් සංස්කෘතිය ඉතිහාසමය හා සමාජයීයමය පැතිවලින් යුක්ත ය.

  * සමාජයීයව හා ජනවාර්ගිකව කථා කිරීමේ දී සංස්කෘතීන් බොහොමයක් ගැන කථා කළ හැකි ය.

  * දැන් මනුෂ්‍ය ඉතිහාසයේ නව යුගයක් උදාවී ඇත්තේ යැයි කිවහැකි අතර, මිනිසාගේ කල්පනා කිරීමේ පිළිවෙල සහ ක්‍රියාකාරීත්වය ද විවේකය ගැනීම ද බොහෝ දුරට වෙනස් වී ඇත.

  * ක්‍රමානුකූලව මුළු මිනිස් වර්ගයාටම පොදුවන සංස්කෘතියක් වර්ධනය වන ආකාරයක් දිස් වෙයි.

  * නව මානවීයවාදය අනුව මනුෂ්‍යයා යන්නෙන් අදහස් කරන්නේ ප්‍රධාන වශයෙන් සහෝදරයන් කෙරෙහිත්, ඉතිහාසය කෙරෙහිත්, ඔහුගේ වගකීමෙන් සීමා කරනු ලැබීමක් ය.

  * සංස්කෘතිය යනු පුළුල් විෂයකි. යම් යම් මත ඉදිරිපත් කිරීමට හැකිවුවත්, එය සම්පිණ්ඩනය කිරීමට අපහසු විෂයක් ය.

  * ක්‍රිස්තියානි පණත අනුව සෑම කෙනෙක් ම තම සහෝදර සහෝදරියන් සඳහා වැය විය යුතුය.

  * දෙවියන් වහන්සේ තම මාංශගත වූ පුත්‍රයාණන් තුළින් විවිධ සංස්කෘතීන් සම්බන්ධ සහ විවිධ කාලවලට සම්බන්ධව ජනතාවට කථා කළ සේක.

  * සදාචාර පටිපාටිය සහ පොදු යහපත තුළ මනුෂ්‍යයාට සත්‍ය සෙවීමටත්, තම අදහස් ප්‍රකාශ කිරීමටත්, ඒවා ප්‍රසිද්ධ කිරීමටත් තමා කැමති කලාවක් වර්ධනය කිරීමටත් ඔහුට නිදහස තිබිය යුතු බව.

  * සෑම කිතුනුවෙක් ම පිළිගත යුතු සත්‍යයක් නම් සියලු මනුෂ්‍යයන්ගේ පෞද්ගලික ගෞරවයට ඔබින මානුෂික වූ මහජන සංස්කෘතියට ඔවුනට ඇති අයිතිය පිළිගෙන ඒවා ක්‍රියාවෙහි යෙදවිය යුතු ය යන්නයි.

  * වංශය, ස්ත්‍රී පුරුෂභාවය, ජාතිය, ආගම හෝ සමාජ තරාතිරම අනුව කිසි වෙනසක් නොමැති විය යුතු ය.

  * මැවුම්කාර දෙවියන් වහන්සේ තුළ පදනමක් ඇති බුද්ධියේ ද, අධිෂ්ඨානයේ ද, හෘදය සාක්ෂියේ ද, සහෝදරත්වයේ ද වටිනාකම් ක්‍රිස්තුන් වහන්සේ තුළ පුදුමාකාර ලෙස ප්‍රතිසංස්කරණය කරනු ලැබ උසස් බවට පත් කරනු ලැබීය.

  * ගිහි පැවිදි සෑම කිතුනුවෙක්ම පරීක්ෂණයේ හා කල්පනාවේ යුක්ති සහගත නිදහසක් ද

තමන් විශේෂයෙන් ඉගෙන ගෙන තිබෙන කරුණු පිළිබඳ ව තම මතය බැගෑපත්ව හා නොබියව ඉදිරිපත් කිරීමට නිදහසක් ද තිබිය යුතු ය.

### 10.1.4 පවුල් ජීවිතය පිළිබඳ ඉගැන්වීම්

- යහපත් විවාහය හා පවුල් ජීවිතය තුළින් පුද්ගලයාගේ ත් මිනිස් සමාජයේ ත් සුබසිද්ධිය ඇතිකර ගත හැකි ය.
- විවාහක ජීවිතයේ කර්තෘ දෙවියන් වහන්සේ ම වන නිසා ශුද්ධ වූ සභාව විවාහ වූ කිතුනුවන්ගේ ජීවිතය තමනට සම්බන්ධ වන්නේ විවාහයේ දේව ප්‍රසාද නිධානය මගින් ය.
- ඒ නිසා දෙවියන් වහන්සේ එක් කළ අය මිනිසා විසින් වෙන් නොකළ යුතු යන සිද්ධාන්තය වැදගත් ය.
- වෛවාහික ප්‍රේමය (විවාහක වූ ප්‍රේමය) තුළින් තමන්ගේ විවාහ බන්ධනය පොහොණි කර, දියුණු කරගත හැකි ය.
- මනුෂ්‍ය පුද්ගලත්වයේ සමාජීය පරිමාව මූලික වශයෙන් ප්‍රකාශ වන්නේ පවුල හා විවාහක යුවල මගින් ය. (දෙවියන් වහන්සේ මිනිසා තනි පැවැත්මක් වශයෙන් නොමැවූ සේක. ස්ත්‍රිය ද පුරුෂයා ද වශයෙන් ඔවුන් මැවූ සේක)
- ක්‍රිස්තුස් වහන්සේ කිතුනු විවාහයේ තිබෙන ශක්තිමත්භාවය දික්කසාදය පිළිබඳ අනුශාසනා (මතෙව් 19/1-12) යටතේ විස්තර කරන සේක.
- මෙම ප්‍රේමය විවාහයට ඇතුළුවන සෑම පුද්ගලයෙකුගේම යහපතට උදව් කරයි.
- විවාහය තුළ අඹුසැමි දෙදෙනා අතර ඇතිවන සෑම ක්‍රියාවක් ම උතුම් මෙන් ම වැදගත් වෙයි.
- විවාහයේ ඒකඟතාවය ඇතිවන්නේ, එක සමාන පෞද්ගලික උතුම්කම ස්වාමි පුරුෂයා හා භාර්යාව තුළ රඳා පැවතීමෙන් ය.
- විවාහයේ මූලික අරමුණ අන්‍යෝන්‍ය ආදරය වන අතර, එහි ප්‍රතිඵලය දරුවන් ය.
- ඔවුහු දෙමාපියන්ගේ සුබ සිද්ධියට උපකාරී කරන්නෝ ය.
- දෙමාපියන්ගේ ප්‍රධාන වගකීම ළමයින් මෙලොවට බිහිකිරීම සහ ඔවුනට නිසි අධ්‍යාපනයක් ලබාදීම ය.
- අද සභාවේ ඉගැන්වීමට අනුව විවාහයේ ප්‍රධාන පරමාර්ථ 3ක් ඇති අතර, එම පරමාර්ථ තුනම එක හා සමානව දෙවියන් ඉදිරියේ වැදගත් වන බව.

  ඒවා නම්,
  * දෙදෙනා අතර වෛවාහික ප්‍රේමය
  * මෙළොවට ළමයින් බිහිකිරීම
  * එම දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබාදීම

- මිනිස් දිවිය සහ මෙලොවට දරුවන් බිහිකිරීම යන සත්‍යතාවන් මෙලොවට පමණක් සීමා නොවන බැවින් විවාහයේ පූජනීය භාවය සැමවිටම ආරක්ෂා කිරීමට සභාව බැඳී සිටින්නීය.
- ඒ නිසා කෘතිම උත්පත්ති පාලන ක්‍රම වැනි ස්වභාව ධර්මයේ නීතිරීතිවලට විරුද්ධව යන සෑම

ක්‍රියාවක් ම සභාව හෙළාදකින්නීය.

- විවාහයේ හා පවුලේ යහපත් තත්වය දියුණු කිරීමට සියලුදෙනා උත්සාහ කළයුතු ය.
- පවුල සමාජයේ පදනම වන බවත්, පවුලක වාතාශ්‍රය නොමැති දරුවන්ට දූරදර්ශී නීති හා වෙනත් ව්‍යාපාරයන් මගින් අවශ්‍ය ආරක්ෂාව හා උපකාර ලැබිය යුතු ය.
- ජීවමාන දෙවියන් වහන්සේගේ සමානකමට මවන ලදුව පුද්ගලත්වයේ සැබෑ ගෞරවය භුක්ති විඳින අඹුසැමියෝ අන්‍යෝන්‍ය ප්‍රේමයෙන් ද, එක සිතින් ද, ශුද්ධවත් වීමේ එකම ආශාවෙන් ද එකමුතු විය යුත්තාහ.
- මෙසේ ඔවුහු ජීවනයේ උල්පත වන ක්‍රිස්තුන් වහන්සේව අනුගමනය කරන අතර විවාහකයෝ තමන්ගේ ජීවිතයේ ප්‍රීති සන්තෝෂවලින් ද, ආත්ම පරිත්‍යාගයෙන් හා විශ්වාසවන්ත ප්‍රේමයෙන් ද ස්වාමීන් වහන්සේ මරණයෙන් හා උත්ථානයෙන් ලෝකයට ප්‍රකාශ කළ ප්‍රේමයේ අභියෝගය දරන්නෝ ය.

### 10.1.5 සාමය හා සහජීවනය පිළිබඳ ඉගැන්වීම්

- සෑම කිතුනුවෙක් ම දෙවන වතිකාන මන්ත්‍රණ සභා ආරාධනය අනුව සමාදානයේ සත්‍යවූ ද, උතුම් වූ ද, අර්ථය පහදා දෙමින් යුද්ධයේ භයංකර හා වැරදි බව ප්‍රකාශ කරමින්, යුක්තිය හා ප්‍රේමය පිට ගොඩනගනු ලබන සාමය සඳහා සාම කර්තෘ වන ක්‍රිස්තුන් වහන්සේගේ ආධාරයෙන් ඉදිරියට යායුතු ය.
- සැබෑ සාමය උදාවන්නේ දිව්‍ය කර්තෘවරයාණන් විසින් සමාජය තුළට කාවද්දන ලද සම්පූර්ණ ධර්මිෂ්ටකම සඳහා, සාපිපාසව ඇති මනුෂ්‍යයන් විසින් ක්‍රියාත්මක කළයුතු සමගිය මගින් වන බව.
- මෙලොව ඕනෑම රටකට තම රට ආරක්ෂා කිරීම සඳහාත්, අසාධාරණ ආක්‍රමණකාරී යුද්ධයකට විරුද්ධව සටහන් කළ හැකි ය.
- යුද්ධය යනු ආයුධවලින් කරන දෙයක් පමණක් නොව සාගින්න, ලෙඩරෝග වැනි විවිධ පැතිවලින් ඒ පිළිබඳ ව කථාකළ යුතු ය.
- එම සටන්වලට සහභාගී වන අය ආරක්ෂා වීමට පමණක් නොව තම ජනතා නිදහස හා රටේ සාමය තහවුරු කිරීමටත්, සටන් කරන බව අවබෝධ කරගත යුතු ය.
- රටවල් අතර පැනනගින ආරවුල් තෝරාගැනීමට මිනිසාගේ උතුම් තත්ත්වය ගැන කල්පනාකොට සාකච්ඡා මගින් මෙම ප්‍රශ්න විසඳා ගතහැකි නම් මිනිසුන් වහලුන් කරන යුද්ධයෙන් ජයගත හැකි ය.
- ජාත්‍යන්තර කැමැත්ත ඇතිව යුද්ධය සම්පූර්ණයෙන් තහනම් කිරීමට කාලය සූදානම් කරගනු සඳහා උද්යෝගීමත් ව ක්‍රියාකිරීම අපගේ යුතුකම ය.
- සාමය හා නිරායුධ කිරීම පිළිබඳ ප්‍රශ්න පෑටුල වූ ද, විඩාදායක වූ ද, පරීක්ෂණවලට භාජනය වී තිබෙන දේවල් වන අතර, ජාත්‍යන්තර රැස්වීම්වල දී මේ ප්‍රශ්නයන් ගැන කෙරී තිබෙන සාකච්ඡා පළමුවෙනි පියවර කොට ගෙන, අනාගතයෙහි දී ප්‍රයෝජනවත් ප්‍රතිඵල ලබාගන්නා බලාපොරොත්තුවෙන් මේ සාකච්ඡා පෙරටත් වඩා ඕනෑකමින් කෙරීගෙන යාමට අනුබල දිය යුතු ය.
- මනුෂ්‍යයන් අනුන්ගේ උත්සාහයන් පිටම රඳා නොසිට මේ කාරණය සම්බන්ධයෙන් තමන්ගේ චිත්ත ස්වභාවය ගැන ද සලකා බැලිය යුතු බවත්, තමන්ගේ රටේ යහපත ගැන වගකීමට ද

පොදු යහපත සඳහා වැඩ කිරීමට ද බැඳී සිටින රජයේ බලධරයන් බොහෝ දුරට මහජන මතය හා මහජන හැඟීම් අනුව ක්‍රියාකළ යුතු ය.

- සාමය පිහිටුවීම සඳහා පළමුවෙන් ම මනුෂ්‍යයන් අතරේ අසමඟියට බලපාන හේතු නැතිකර දැමීමට ක්‍රියාකළ යුතු ය.
- මනුෂ්‍යයන් අතරේ ඊර්ෂ්‍යාව ද, අන්‍යෝන්‍ය අවිශ්වාසය ද, උඩඟුව හා තවත් ආත්මාර්ථකාමී තෘෂ්ණා ද ඉහත දේ සම්බන්ධයෙන් හේතු සාධක වෙයි.
- ජාත්‍යන්තර සංවිධාන මගින් වර්තමාන කාලයේ අවදානම් ප්‍රශ්න විසඳීමට ද මුළු ලෝකයේ ප්‍රගතිය නඟාලීමට ද යුද්ධය වැලැක්වීමට ද කටයුතු කළ යුතු ය.
- යම් ජාතියක සංවර්ධනය රඳා පවත්නේ මනුෂ්‍යයා හා මුදල් පිළිබඳ ආධාරය පිට වන අතර, අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව මගින් එක් එක් ජාතියේ පුරවැසියන් ආර්ථික වූ ද, සමාජීය වූ ද, තනතුරු දැරීමට සූදානම් කරනු ලැබිය යුතු අතරම, මේ ආධාරය දෙන විට ඒ විශේෂඥයන් අහංකාර ලීලාවෙන් නොව උදව්කාරයන් හා සහයෝගී ව ක්‍රියාකරන්නන් මෙන් ඉදිරිපත් විය යුතු ය.
- දෙවියන් වහන්සේගේ කැමැත්තට අනුව පවුල් සැලසුම් ගැන සිතිය යුතු අතර, අද බොහෝ සංවිධාන බිහිවී තිබෙන්නේ පවුල විනාශය කරා රැගෙන යාමට ය..
- ආධාර මුදල් එකතු කිරීම හා බෙදාහැරීම වෙනස් නොවන ඒකාකාරයකින් නොකෙරුන ද මේ එකතුකිරීම හා බෙදාහැරීම රදගුරු පදවිවල ද, රටවල ද මුළු ලෝකයෙහි ද නිසි පිළිවෙලකට සකස් වූ ක්‍රමයකින් හසුරුවනු ලැබිය යුතු ය.
- මනුෂ්‍යයන් අතරෙන් අතිවිශාල කොටසක් බලගතු දුෂ්කරතාවන්ගෙන් දැනුදු පීඩා කරනු ලබන හෙයින් දුප්පතුන් වෙත යුක්තියත් ඔවුන් කෙරෙහි ක්‍රිස්තුන් වහනසේගේ ප්‍රේමයත් නඟාලනු සඳහා සමස්ත සාන්ත සභාව තුළ විශේෂ සංස්ථාවක් පිහිටුවීම කාලෝචිත වන අතර, මෙබඳු සංස්ථාවක කාර්යය වියයුත්තේ දුප්පත් ප්‍රදේශවල සංවර්ධනයත්, ජාතීන් අතරේ සමාජ සාමයත් නඟාලීම ය.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පැවැත්වීමට මුල් වූ හේතූන් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- දෙවන වතිකාන මන්ත්‍රණ සභා තීරණ පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.
- දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් ඉදිරිපත් කළ ලේඛන 16 පිළිබඳ ව පැහැදිළි කරන්න.
- දෙවන වතිකාන කතිකාවතේ සමාජ ප්‍රගතිය සඳහා වූ ඉගැන්වීම් විස්තර කරන්න.
- සංස්කෘතිය නඟාසිටුවීම සඳහා වූ ඉගැන්වීම් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- පවුල් ජීවිතය පිළිබඳ ඉගැන්වීම් පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**මූලාශ්‍රය :**

1. දෙවන වතිකාන මන්ත්‍රන සභා ප්‍රකාශන

**නිපුණතාව 10.0 : නව ලෝක ශිෂ්ටාචාරයක් බිහිකිරීමේ සහ ප්‍රයත්නයේ දී ආසියාතික හා ලාංකේය සමාජය වෙනුවෙන් සභාවේ වගකීමට දායක වෙයි.**

**නිපුණතා මට්ටම 10.2 :** කිතුනු සභා නායකයන්ගේ සමාජ, සංස්කෘතික ප්‍රගතිය සඳහා වූ ඉගැන්වීම් හා මඟපෙන්වීම් කිතුනු ජීවිතයට ආදේශ කරගනී.

**කාලය :** කාල පරිච්ඡේද 14

**ඉගෙනුම් ඵල :**

- ආසියානු රදගුරු සමුළුව ලෝක කිතුනු සභා සම්මේලනය හා ආසියානු කිතුනු සම්මේලනයේ ව්‍යුහය පිළිබඳ සොයා බලයි.
- ආසියා රදගුරු සමුළු සම්මේලනය (ආරසසය) හා ලෝක කිතුනු සභා සම්මේලනයේ ප්‍රකාශන රැස්කොට එහි අඩංගු කරුණු පිළිබඳ ව අදහස් බෙදාගනී.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 10.2.1 ආසියා රදගුරු සමුළු ප්‍රකාශන (2000-2006)

ආසියානු රදගුරු සමුළුවේ ආරම්භය

1970 නොවැම්බර් පිලිපීනයේ මැනිලා නුවරදී vi වන පාවුළු ශුද්ධෝත්තම පියතුමාව හමුවීමට ආසියානු රදගුරුතුමන්ලාට අවස්ථාව ලැබුණි. මේ සඳහා 180 දෙනෙක් සහභාගී වූහ. මේ අවස්ථාවේ දී ආසියානු රදගුරු ව්‍යාපාරය (ASIAN BISHOP'S MOVEMENT) බිහිවිය.

මේ ව්‍යාපාරය තුළ ආසියානු රදගුරුතුමන්ලා තම දූතසේවා ගැන අදහස් බෙදා ගත්හ. ආසියාවේ කිතුනු සභාව මුහුණදෙන අභියෝගයන් හඳුනාගත්හ. ආසියානු ජනතාව අතර සන්නිවේදන හැකියාව දියුණු කරගැනීමටත්, සම්ප්‍රදායන් හා සංස්කෘතිය අවබෝධ කරගැනීමට මෙය අවස්ථාවක් කරගත්හ.

ආසියානු සභාව එකම දේව ජනතාවේ පවුලක් ලෙස විවිධ ආගම් අතරත්, විවිධ සමාජයන් අතරත් සුහදතාවය වර්ධනය කිරීමට සමයාන්තර සහජීවනය අවශ්‍ය බව අවබෝධ කර ගත්හ. ආසියානු තත්වය, මිනිස් ජීවිතයේ තත්වය, ආසියානු සමාජය, ආගම් හා සංස්කෘතිය අතර ඇති විවිධත්වයන් හා සමාජ වටිනාකම් ගැනත් ගවේෂණයක යෙදුණාහ. වෙනස්වීගෙන එන ආසියානු සමාජය තුළ ශුද්ධ වූ සභාවේ දූත මෙහෙයට සම්බන්ධ වී ආසියානු ජනතාව සමඟ ඒකාබද්ධ වී සේවය කිරීමට උනන්දුවක් දැක්වූහ.

මේ ව්‍යාපාරය රැස්වීමේ දී ආසියානු රදගුරු සමුළුව (FABC) ආරම්භ කිරීමට අවශ්‍ය රීති ගැන සාකච්ඡා කළහ.

1971 මාර්තු මස හොංකොං නුවර මේ සමුළුව ආරම්භ කිරීමට සාකච්ඡාවක් පැවැත්වීය. මේ සමුළුවේ ස්වභාවය, පරමාර්ථය, ව්‍යාපෘති ගැන සාකච්ඡා කළහ. 1972 නොවැම්බර් මාසයේ දී ආසියානු රදගුරු සමුළුව වතිකාන කාර්යාලය නිල වශයෙන් අනුමත කළේය.

**ස්වභාවය**

ආසියානු රදගුරු සමුළුවේ ව්‍යවස්ථාව අනුව මෙය ස්වේච්ඡා සංවිධානයකි. දකුණු ආසියාව, ගිණිකොණදිග ආසියාව, නැගෙනහිර ආසියාව හා මධ්‍යම ආසියාවේ රදගුරුතුමන්ලා මේ සමුළුවේ

සාමාජිකයෝ වෙති. ඒ අනුව රටවල් 15ක් මේ සමුළුවට සාමාජිකත්වය ලබාගත්හ.

i. දකුණු ආසියාවට අයත් රටවල්
ඉන්දියාව, ශ්‍රී ලංකාව, පකිස්ථානය සහ බංග්ලාදේශය

ii. ගිණිකොණදිග ආසියාව
මියන්මාරය, තායිලන්තය, කාම්බෝජය, ලාඕසය, වියට්නාමය, පිලිපීනය, ඉන්දුනීසියාව, මලයාසියාව, සිංගප්පූරුව, බෲනායි

iii. නැගෙනහිර ආසියාව
ජපානය, දකුණු කොරියාව, තායිවානය

iv. මධ්‍යම ආසියාව
කසකස්ථානය

අනුබද්ධිත සාමාජිකයින් :

නේපාලය, හොංකොං, මැකාඕ, මොන්ගෝලියාව, සයිබීරියාව, නැගෙනහිට ටිමෝරය, කිර්ජිස්ථානය, ටජිකිස්ථානය, මුර්ක්මෙනිස්ථානය සහ උස්බෙකිස්ථානය

ආ.ර.ස.ස.යේ කාර්යාංශ

1. මානව සංවර්ධනය පිළිබඳ කාර්යාංශය (මාපිකාය)
(Office of Human Development - OHD)
2. කිතුනු සභා සමගිය සහ සමයාන්තර සබඳතා පිළිබඳ කාර්යාංශය (කිසපිකාය)
(Office of Ecumenical and Interrelious Dialogue - OED)
3. සදහම්කරණය පිළිබඳ කාර්යාංශය (සපිකාය)
(Office of Evangelization - OE)
4. අධ්‍යාපනය සහ විශ්වාසයේ හැඩගැස්ම පිළිබඳ කාර්යාංශය (අවිපිකාය)
(Office of Education and Faith Formation - OEFF)
5. ජනසන්නිවේදනය පිළිබඳ කාර්යාංශය (ජපිකාය)
(Office of Social Communication - OSC)
6. ගිහි සැදෑවතුන් පිළිබඳ කාර්යාංශය (ගිපිකාය)
(Office of Laity - OL)
7. දේවධර්මය පිළිබඳ කාර්යාංශය (දේපිකාය)
(Office of Theological Concerns - OTC)
8. පූජාපූසාදිවරුන් පිළිබඳ කාර්යාංශය (පූපිකාය)
(Office of Clergy - OC)
9. පැවිදිවූවන් පිළිබඳ කාර්යාංශය (පැපිකාය)
(Office of Consecrated Life - OCL)

ආසියානු රදගුරු සමුළුවේ පරමාර්ථයන් :

1. ස්වේච්ඡා සංවිධානයක් ලෙස තම සාමාජිකයින් අතර එකමුතුකම ගොඩනැගීමට ක්‍රියාකිරීම (Solidarity)
2. සාමාජිකයන් අතර සාමූහික වගකීම (Collective Responsibility) ප්‍රවර්ධනය කිරීම තුළින් ආසියානු සභාවේ හා සමාජයේ වර්ධනයට ක්‍රියා කිරීම.

ආරසසයේ ප්‍රධාන ක්‍රියාකාරකම් හතක් ඇත.

i. දෙවන වතිකාන කතිකාවතේ සහ ඉන්පසු නිකුත් කරන ලද ප්‍රකාශනවල ආලෝකය තුළ ආසියාවේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි අපෝස්තලික සේවාවන් ප්‍රවර්ධනය කිරීම.

ii. ශු. සභාවේ ජීවමාන බව ප්‍රකාශ කරමින් පූර්ණ මිනිස් සංවර්ධනය සඳහා දායක වීම.

iii. ආසියාවටම පොදු ප්‍රශ්න පිළිබඳ ව සංවේදී වී ඒවා අධ්‍යයනය කර, ඒවාට විසඳුම් සහ ක්‍රියාකාරකම් සෙවීමට ද, කටයුතු සම්බන්ධීකරණයට ද දායක වීම.

iv. ආසියාවේ සභාවන් අතර සහ රදගුරුවරුන් අතර සාංඝිකත්වය වර්ධනය කිරීම.

v. තමන්ගේ දේශීය සභාවල දේව ජනතාවට වඩා ඵලදායී ලෙස සේවය කිරීම සඳහා ආසියානු රදගුරු සමුළුවලට උපකාර කිරීම.

vi. කිතුනු සභා සමගිය සහ සමයාන්තර සබැඳියාව වෙනුවෙන් කැපවීම සහ දායකවීම.

vii. වඩා ක්‍රමවත් වර්ධනයක් සහ ව්‍යාප්තියක් ඇතිකර ගැනීමට ආසියාවේ සහ අන්තර්ජාතික මට්ටමේ සභා සංවිධානවලට සහ ව්‍යාපාරවලට උපකාරී වීම.

මේ ක්‍රියාකාරකම් ඉදිරියට ගෙනයාමට ආසියානු රදගුරු සමුළුව දෙවන වතිකාන සමුළුවේ ඉගැන්වීම් හා ඉන්පසුව කාලීනව ප්‍රකාශයට පත් කරන ශුද්ධ වූ සභාවේ ප්‍රකාශනවලට අනුව ක්‍රියා කරයි.

ස්වේච්ඡා සංවිධානය

ආසියානු රටවල ඇති රදගුරු මණ්ඩලයට වඩා බලයක් ආසියානු රදගුරු සමුළුවට හිමිවී නැත. ආසියානු රදගුරු මණ්ඩලයේ තීරණයන් හා යෝජනා තම රටවල ඇති රදගුරු මණ්ඩලවල කැමැත්ත අනුව ක්‍රියාත්මක කළ හැකිය. ආසියානු රදගුරු සමුළුව හැම රදගුරුතුමෙකුගේ ම නිදහසට ද රාජගුරු මණ්ඩලවල නිදහසට හා ස්වෛරීභාවයට ගරු කරයි. එමෙන් ම මෙම සමුළුව ආසියානු රටවල තිබෙන නිදහස හා ස්වෛරීභාවය ගරුකරමින් ක්‍රියාකරන සංවිධානයකි.

මෙම තීරණය එඬේරික දර්ශනයක් ඔස්සේ තමතමන්ගේ රටවලට (රදගුරු පදවි) ආවේනික පරිසරය තුළ දේව වචනයට සාක්ෂි දැරීමේ අරමුණින් මෙම මඟපෙන්වීම ලබාදී ඇත. මෙම ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය සෙසු ආසියාතික ජනතාව සමඟ වඩා මිත්‍රශීලීව ජීවත්වීම සඳහා ලබාදුන් අත්වැලකි. (For all the Peoples of Asia - Volume 04) අධ්‍යයනය කරන්න.

**ආසියානු රදගුරු සමුළු ප්‍රකාශන (2000 - 2006)**

**සමාජ ජීවිතය තුළින් විශ්වාසය ගොඩනැඟීම**

- ගෝලීයකරණය හා එහි ප්‍රතිඵල නිසා ජනතාවට නව ආකාරයකට සිතීමට සිදුවී ඇත.
- ආසියානු පසුබිම තුළ ශුද්ධ වූ සභාව මනුෂ්‍යයාගේ විශ්වාසය තුළින් මානව ජීවිතය ගොඩනංවීමේ සේවාවට යෙදවිය යුතුය. ආසියාවේ විවිධ ආගම්, සංස්කෘතීන් හා ශිෂ්ටාචාරයන් තිබෙන බව අපි දනිමු. ඒ නිසා අනෙක් ආගම් සමඟ සංවාදය තුළින් මිනිස් සමාජ ජීවිතය ගොඩනංවන අතර, ඔවුන්ගේ විශ්වාසය ද වර්ධනය වන බව ආසියානු රදගුරු සම්මේලනය (ආරසසය) පිළිගනියි.

- අද ලෝකයේ ව්‍යාප්තවන ගෝලීයකරණය නිසා යුද්ධමය වාතාවරණයන්ට මිනිසාට මුහුණදීමට සිදුවී ඇත. මේ පසුබිම නිසා මිනිස් ජීවිතය හරියාකාරයෙන් ගොඩනැංවීමේ කාර්යය ආසියානු සභාව අද මුහුණ දෙන අභියෝගයකි. ශුද්ධ වූ සභාව මිනිස් සමාජය වෙනුවෙන් දායකත්වය ලබාදීම අවශ්‍ය වේ.

- 2 වන ජුවාම් පාවුළු ශුද්ධොත්තම පියතුමා සංවාදය ඉදිරියට ගෙනයාමටත්,ධෛර්යමත් කිරීමටත් යොමුවිය.

- ප්‍රශ්නවලට මුහුණදෙමින් සාමය උදාකිරීමට ප්‍රයෝජනයක් වෙමින් යුක්තිය හා සාධාරණත්වයේ සමාජය ගොඩනැංවීමට හැකි බව ආරසසය විශ්වාස කරයි. දෙවියන් වහන්සේ තුළ මිනිසාට තිබෙන විශ්වාසය තුළින් ඔවුනට නිදහස ලබාදීමටත්, මනුෂ්‍යත්වය ගරු කරන්නටත්, සමාජය තුළ මඟපෙන්වීමක් කිරීම ශුද්ධ වූ සභාවේ වැදගත් වගකීමක් වේ. අනෙකුත් ආගම් සමඟ සම්බන්ධතාවය තුළින් සියලුදෙනා සමඟ සහෝදර සහෝදරියන් ලෙස සාමකාමීව ජීවත්වීමට අවස්ථාව ලබාදෙයි.

**සංස්කෘතිය**

- සංස්කෘතිය තුළ මිනිස් ජීවිතයේ වටිනාකම් වැදගත්කොට සලකයි. මිනිස් ජීවිතය, මනුෂ්‍යත්වය, මූලික මානව හිමිකම් වැනි දේ මූලික වටිනාකම් ලෙස සලකයි.

- ආසියානු පසුබිම අනුව සංස්කෘතික සම්පත් භාවිත කිරීම වැදගත් වේ. සංස්කෘතිකාංග, මිනිස් ජීවිතය සමඟ කිට්ටු සබැඳියාවක් පවතින අතර, එය එකිනෙකින් වෙනස් කිරීම අපහසුය. ආසියානු ජනතාව තමන්ගේ සම්පත් භාවිත කිරීමත්, එය ආසියානු පසුබිමත් අනුව තමන්ගේ ජීවිතය හැඩගස්වා ගැනීම දැකිය හැකිය.

- දෙවියන් වහන්සේගේ වැඩසිටීම ස්වභාව දහම තුළින් තමන් වහන්සේව අනාවරණය කරන දෙවියන් වහන්සේව හඳුනාගෙන තමන්ගේ ජීවිත රටාව හැඩගස්වයි.

- ආසියානු ජනතාවගේ ජීවිතය ස්වභාවදහමත් සමඟ සමීප සබඳතාවයක් ඇති අතර ස්වභාව දහම තුළින් දෙවියන් වහන්සේගේ ජීවමාන වැඩසිටීම අත්දකින දේව ජනතාවක් ලෙස සැලකිය හැකිය.

මිනිස් ජීවිතයේ අභියෝග විශ්ලේෂණය කරමින් ඒවාට පිළිතුරු සොයාගෙන ක්‍රිස්තියානි ජීවිතය ගොඩනංවන ආකාරය ගැන ආරසසයේ අවධානය යොමුවේ. ශුද්ධාත්මයාණන් වහන්සේ සංවාදයට දායක වෙයි. ආසියානු සංස්කෘතිය හා ආගමික වටිනාකම් තුළින් මිනිස් වටිනාකම් වර්ධනය කිරීමට අවශ්‍ය වේ. මේ තුළින් සංස්කෘතියේ කේන්ද්‍රය වන ක්‍රිස්තුස් වහනසේව අනාවරණය කිරීමට හැකිවේ.

**ආසියානු පවුල් සම්ප්‍රදාය හා වටිනාකම්**

විවිධ වෙනස්වීම්වලට භාජනය වී ඇති මේ ලෝකය තුළ ආසියානු ජනතාව පවුල් ජීවිතයේ පරිශුද්ධතාවය සුරකි. දරුවන් දෙවියන් වහන්සේගේ තිළිණයක් ලෙස ලබයි. දරුවන් තම අධ්‍යාපනය, සෞඛ්‍යය, ජීවිතයට අවශ්‍ය දේ සපයා, ළමා ජීවිතය සම්පූර්ණ කිරීමට ප්‍රයත්න දරයි. විස්තෘත පවුල් ක්‍රමය තමන් අතර ඇති සබඳතා ස්ථිර කරයි. වැඩිහිටියන්ට හා විශ්‍රාමිකයන්ට ගෞරවාන්විතව සලකයි.

එකිනෙකා වෙනුවෙන් හැඩගැසීම, අනෙක් අයට උදව් කිරීම තුළින් සබඳතාවය වර්ධනය වන අතර, තම පරිත්‍යාගී ජීවිතය තුළින් අන් අය ජීවත් කිරීමට කැමැත්තෙන් ක්‍රියා කරයි. ආසියානු ජනතාව අතර ඉතා වැදගත් ලක්ෂණයක් ලෙස ආගන්තුක සත්කාරය දැක්විය හැකිය. නොදියුණු ගම්වල ආසියානු ජනතාව ජීවත් වූවත්, දෙවියන් වහන්සේ සමඟ තිබෙන විශ්වාසයේ ජීවිතය ඉතා ගැඹුරුය.

ජනතාව සංවර්ධනය වන ලෝකයේ තමන්ව හැඩගස්වා ගනී. නමුත් තම වටිනාකම් වගකීමෙන් යුතුව හර පද්ධතීන් රැකගනී. ක්‍රිස්තියානි වටිනාකම් ඔස්සේ දරුවන් කුඩා අවධියේ පටන් දරුවන්ට ක්‍රිස්තියානි පසුබිමක් තුළ ඇති දැඩි කිරීම මගින් මතු දිනෙක දෙවියන් වහන්සේට ලැදි පිරිසක් බිහි කරගත හැකි ය. මිනිස් ජීවිත ක්‍රමය සරලය. අන් අයව පිළිගෙන ඔවුන්ට ගෞරවාන්විත ලෙස සලකයි.

**සාමය උදෙසා යොවුන් දායකත්වය**

ආසියා සමාජය තුළ යොවුන් දායකත්වය ඉතාම වැදගත් ය. සාමය යනු යුද්ධ කිරීමෙන් වැලකී සිටීම පමණක් නොවේ. සෑම ගැටලුවකින් ම නිදහස් තත්වයකි. මිනිසා තුළ මෙම සාමයේ බීජය ඇතුල් වී ඇත. සැබෑ සාමය වර්ධනය වන්නේ ක්‍රිස්තුස් වහන්සේ වෙත අපට ඇති බලාපොරොත්තුවේ මට්ටම අනුවයි. මේ සමාදානය කිතුනුවන් මගින් සෑම කෙනෙකුන් සමඟම බෙදාගැනීම අවශ්‍ය වේ. එය කිතුනු යුතුකමකි.

මිනිස් සංහතියේ මානවත්වය රැකගැනීමට සෑම කෙනෙක් ම සහෝදර සහෝදරියන් ලෙස ජීවත් විය යුතුය. යොවුන් පරපුර ආසියාවේ මිත්‍රත්වය ප්‍රකාශ කරන ජනතාවක් ලෙස බැබලෙන්නට අවශ්‍ය වේ. අද ගෝලීයකරණය තුළ සමාජයේ විවිධ ක්ෂේත්‍රයන් වෙතට තරුණයන්ට ආකර්ශනය කිරීමක් සිදුවේ. නමුත් ආසියානු සංස්කෘතිය ගොඩනැංවීමට යොවුන් සහභාගීත්වයේ දායකත්වය ලබාදීම ඔවුන්ගේ වගකීම වේ.

සාධාරණත්වය ඇතිව සමාදානයේ සමාජය ගොඩනැඟීමට තම මුළු ශක්තියම කැපකළ යුතු බව ආසියානු රදගුරු සමුළුව ප්‍රකාශ කරයි.

තරුණයන් සඳහා වන ජීවිත පුහුණුව, ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ සේවාවට තරුණ පරපුර යොමුකිරීම, සමුළුව විශේෂයෙන් යොවුන් අය වෙනුවෙන් යෝජනා කරයි. තරුණ සමුළුව විවිධ මට්ටමින් සංවිධානය කරන ආසියානු යොවුන් දායකත්වය ලබාගැනීමට ශුද්ධ වූ සභාව කටයුතු කරයි.

**සාමකාමී සමාජයක් නිර්මාණය කිරීම**

ක්‍රි.ව. 2000 ජුබිලි වසර ආරම්භයේ දී නව සහස්‍රයකය නව බලාපොරොත්තුවක් ඇතිකරන ආකාරයෙන් ශුද්ධෝත්තම පියතුමාගේ ආරාධනයෙන් අපේ බලාපොරොත්තු ක්‍රිස්තු කේන්ද්‍රීය කර ගනිමු..

*සියල්ල ප්‍රතිනිර්මාණය කිරීමට මම පැමිණියෙමි* යන ආරසසයේ තේමාව ජුබිලි වසරට අඩිතාලමක් සැපයීය.

ආසියානු කිතුනු සභාවේ පරමාර්ථයන් හා දැක්ම ද ඉහත තේමාවෙන් ප්‍රදර්ශනය වේ. මේ කාලය තුළ දෙවන ජුවාම් පාවුළු ශුද්ධොත්තම පියතුමා විසින් ප්‍රේමය හා සේවය පදනම් කරගෙන ශුද්ධ වූ සභාව ඉදිරියට ගමන් කරවයි. ඉහත සේවය තුළින් (ප්‍රේමය හා සේවය) පමණක් ආසියානු කිතුනු සභාව නව වෙනසක් හා ප්‍රතිසංවිධානයක් ඇතිකිරීමට උත්සාහ දරයි.

සාධාරණත්වය තුළින් පමණක් සාමය ලබාගැනීමට හැකි බව හැමදෙනාම පිළිගනී. රදගුරුතුමන්ලා, පියවරුන්, පැවිදි සොයුරු සොයුරියන් හා ගිහි සෑමදෙනාම විශ්වාසය පදනම් කරගෙන එකමුතු වී සේවය ඉටුකිරීම අවශ්‍ය වේ. මෙම එකමුතුකම අපගේ සබඳතාවය ගොඩනංවන අතර, ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කරන සේවක සේවිකාවන් ලෙස අපගේ වගකීම් හා සේවය උනන්දුවෙන් ඉටු කිරීම තුළින් ආසියානු කිතුනු සභාව යන පවුල ගොඩනැංවීමට හැකිවේ.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ආසියානු රදගුරු සමුළුව, ලෝක කිතුනු සභා සම්මේලනය හා ආසියානු කිතුනු සම්මේලනය යනාදියේ ව්‍යුහය හා ක්‍රියාවලිය පිළිබඳ ව තොරතුරු රැස්කර අධ්‍යයනය කිරීමට සිසුන්ව යොමු කරවන්න.
- ආසියානු රදගුරු සමුළුව (ආරසසය) ලෝක කිතුනු සභා සම්මේලනය, ආසියානු කිතුනු සම්මේලනයන් හි නිකුත් වූ ප්‍රකාශනවල අඩංගු අන්තර්ගතය විග්‍රහ කර ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**මූලාශ්‍රය :**


1. For all the Peoples of Asia
2. ආසියානු රදගුරු සමුළු සන්ධානය (ආරසසය)
   (දේව ධර්ම නිකේතන ප්‍රකාශන අංක 17)

### 10.2.2 ලෝක කිතුනු සභා සම්මේලන ප්‍රකාශන (2000-2006)

**ආරම්භය**

ලොව පුරා ව්‍යාප්ත වී තිබෙන සභාවන්වල එක්සත් සංවිධානයකි. ලෝකයේ කිතුනු සභාවන් 1941 සංවිධානය වීමට ප්‍රයත්න දැරුවත්, පළමු ලෝක යුද්ධය ඇතිවීම නිසා මෙම අදහස කල් දැමීමට සිදුවිය. පසුව 1948 දී නෙදර්ලන්තය, ඇමස්ටර්ඩෑම් නගරයේ දී, පළවෙනි නිල රැස්වීම පැවැත්වීය. මෙම රැස්වීමට රටවල් 44 කින් නියෝජිතයන් 147 දෙනෙක් සහභාගී වූහ.

**අරමුණ**

මෙම ජගත් ශාසනික මන්ත්‍රණ සභාව යටතේ පවතින්නා වූ අනෙකුත් සභාවන්වලට ඉහළින් තිබෙන සභාවක් නොවන අතර, එම සභාවන් කෙරෙහි පාලන බලයක් නැත. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ සභාවන්ගෙන් අපේක්ෂා කරන්නා වූ එකමුතුකම ක්‍රියාවෙන් සනාථ කරන්නට පෙළඹීමක් ඇති කරන මිත්‍රශීලී සංවිධානයකි.

**සාමාජිකත්වය**

ශුද්ධ වූ බයිබලය අනුව යේසුස් ක්‍රිස්තුස් වහන්සේට දෙවියන් වහන්සේ ලෙසත්, ගැළවුම් කරුවෙක් ලෙසත් ප්‍රකාශ කරන සභාවන්වල එකමුතුභාවය නිසා පියාණෝය, පුත්‍රයාණෝය, ශද්ධාත්මයාණෝය යන ත්‍රී එකදෙවිඳුන්ගේ කැඳවීමට අනුව එක්සත් වී සේවය කරන්නට කැමැත්ත දැක්වීම යන පදනම මත මෙම සභා සංවිධානය ක්‍රියාත්මක වේ. වර්තමානයේ දී රටවල් 110 කට අයිති සභාවන් 319 ක් ලෝක (ජගත් ශාසනික මන්ත්‍රන සභාවේ සාමාජිකත්වය ලබා ඇත. 560 කට ආසන්න කිතුනු සභා සාමාජිකයන් මෙහි සිටින අතර, එහි බහුතරය වන්නේ Orthodox සභාවට අයත් සාමාජිකයන් ය.

රෝමානු කතෝලික සභාව ජගත් ශාසනික මන්ත්‍රන සභාවේ සාමාජිකත්වය ලබාගෙන නොමැති වුවත්, තමන්ගේ නියෝජිතයන් ජගත් ශාසනික මන්ත්‍රන සභා රැස්වීම්වලට සහභාගී කරවීමෙන් සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගෙන ක්‍රියා කරයි.

**සංවිධාන**

ජගත් ශාසනික මන්ත්‍රන සභාවේ විධායක තීරණ (Executive decisions) වසර 8කට වරක් පවත්වන්නා වූ මහා සභා රැස්වීම්වල දී ද අනෙකුත් මධ්‍යම කමිටුවේදී ද (Central Committee) විධායක කමිටුවේ ද ගනු ලබයි. ජගත් ශාසනික මන්ත්‍රන සභාව තුළ සාමාජිකත්වය ලබා ඇති සභාවේ සභිකයන්ගේ සංඛ්‍යාවට අනුවත්, භූගෝලීය ව්‍යාප්තියට අනුවත්, සාමාජිකත්වය දරන්නා වූ සෑම සභාවක් ම නියෝජනය වන ලෙසත්, මහ සභා රැස්වීමට එක් එක් ආසන වෙන් කර ඇත. මෙසේ ආසන වෙන්කිරීම, මධ්‍යම කාරක සභාව විසින් කරනු ලබයි. (Central Committee)

1948 දී සභාවන් 147 කින් නියෝජිතයන් 351 දෙනෙක් ද, 1991 දී සභාවන් 317 න් නියෝජිතයන් 842 දෙනෙක් ද, 2006 දී රටවල් 120 කින් සභාවන් 347 ක් ද ජගත් ශාසනික මන්ත්‍රන සභාවේ සාමාජිකත්වය ලබා දී ඇත.

මහා සභා රැස්වීම් අතර තීරණය ගනු ලබන්නේ වසරකට වරක් රැස්වෙන්නා වූ මධ්‍යම කාරක සභා රැස්වීම් තුලිනි. ඒ සමඟම මධ්‍යම මහ සභා රැස්වීම් තීරණය ක්‍රියාත්මක කරනු ලබන්නේ කාරක සභා විසින් ය. අවශ්‍ය මුදල් උපයාගන්නේ මධ්‍යම කාරක සභා විසින් ය. මධ්‍යම කාරක සභාව විසින් තෝරාගන්නා වූ ලේකම් සඳහා අවුරුදු 5 ක සේවා කාලයක් ඇත. ජගත් ශාසනික මන්ත්‍රන සභා සියලු ක්‍රියාකාරීත්වයන්වලට වගකිව යුතුය. ජගත් ශාසනික මන්ත්‍රන සභාවේ ක්‍රියාකාරකම් තුළින් සාමාජිකත්වය නොලැබූ සභා ද තමන්ට යම් යම් උපකාර ලබා ගනියි.

(අ) ව්‍යුහය

කිතුනු සභා අතර සමඟිය වර්ධන කරනු පිණිස අංශ 12 ක් මගින් ජගත් ශාසනික මන්ත්‍රන සභාව ලොව තුළ මෙහෙයක් සිදු කරයි. සමාජය හා සංස්කෘතික අභිවෘද්ධිය සඳහා ජගත් ශාසනික මන්ත්‍රන සභාව ඉදිරිපත් කර ඇති ඉගැන්වීම් හා මඟපෙන්වීම් හා සේවය (2000-2006 දක්වා) මෙසේ ය ;

**i. ප්‍රචණ්ඩත්වයෙන් තොර ව සාමය :**

ප්‍රචණ්ඩත්වය ඉදිරියෙහි නරඹන්නන් ලෙස හෝ දුකට පත් අය ලෙස හෝ සිටීමට, සභාව තුළත් පිටත් සිදුවන ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමට ක්‍රියාකළ යුතුය. (2001-2010) ප්‍රචණ්ඩ ජාතිවාදය හා කාන්තාවන් හා ළමා අපචාරය හා දේශය, ජාතිය, වෙනුවෙන් උපයෝගී කරගන්නා වූ ප්‍රචණ්ඩත්වයට විරුද්ධව හඬනැගීම, කිතුනු සභාවන් අතර සමඟිය සොයන අතර, ලොව තුළ සාමය වෙනුවෙන් කටයුතු කළහොත් කිතුනු සභාවේ සේවය සාර්ථක වනු ඇත. නැතහොත් අසාර්ථක වනු ඇත.

ලොව තුළ අලුත් ආරම්භයන්ට හා වෙනසට ශුභාරංචිය තුළ ලබාගන්නා වූ සාමයික මඟපෙන්වීම අලුත් බලාපොරොත්තුවට උල්පතක් වේ.

ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමට මිත්‍රත්වය ගොඩනැගීම අවශ්‍ය වේ. මිත්‍රත්වය යන්න සමාජයේ අවශ්‍යතාවයක් පමණක් නොව, එය දේවධාර්මික යථාර්ථයක් ද වෙයි. කිතුනු සභාව ගිවිසුමේ ජනතාවක් වෙයි. ජනතාව අතර සමඟිය ඇති කරමින් ක්‍රිස්තුස් වහන්සේ තුළින් නව ජීවයක් ඇති කිරීමට සභාව ලොවට යවනු ලැබුවා ය.

- යුක්තිය වෙනුවෙන් හඬ නගන දිවැසිවරුන් බිහි කිරීම සභාවේ මෙහෙවරයි.
- අවිහිංසාව ප්‍රචලිත කරමින් ප්‍රේමයෙන් විමුක්තිය හා සමඟිය කෙරෙහි අපි ක්‍රියාකළ යුතුයි.
- ආගමේ නාමයන් සිදුකළ ප්‍රචණ්ඩත්වය අප තේරුම් ගත යුතුය. ඒ වෙනුවෙන් පාපොච්චාරණය කිරීමටත්, සමාව අයැදීමටත් අපි පසුබට නොවිය යුතුය.
- “”ප්‍රචණ්ඩත්වය ඇයි, සාමය නැත්තේ ඇයි” යන මාතෘකාවේ 2002 දී ලොවේ භාෂාවන් කීපයකින් පොත් නිකුත් කරමින් සාමයේ අවශ්‍යතාවය ගැන ලොව දැනුවත් කරන ලදී.
- එක්සත් ජාතීන් හා එකතු වී 2004 සැප්තැම්බර් 21 වෙනි දින ජගත් සාමයික දිනය සැමරීම සඳහා, ලොවේ සාමය උදෙසා කන්නලව් කරන ලෙස කිතුනු සභාවන්ගෙන් ජගත් ශාසනික මන්ත්‍රණ සභාව ඉල්ලා සිටියා ය.

**ii. සභා එක්සත්කම**

ජගත් ශාසනික මන්ත්‍රන සභාවේ සාමාජිකත්වය ලබන්නට නම් සභාව හා දේශීය සීමාවන් අභිබවා ක්‍රියා කිරීමේ හැකියාව තිබිය යුතුය.

සාමාජිකත්වය ලැබූ සභාවන් සෙසු සභාවන්ගේ බෞතීස්මයේ වටිනාකම අගය කළ යුතුය.

මෙම සභාවන් තුළ විකල්ප හැකියාවන් ඇති අයට හිමිවිය යුතු ස්ථාන ලබා දිය යුතුය. මන්ද, ඔවුන් ද දෙවියන් වහන්සේගේ ස්වරූපයෙන් මවනු ලැබ ඇත.

iii. **මෙහෙය**

සෞඛ්‍යය ගැන අවධානය යොමුකිරීම, කිතුනු මෙහෙවරයේ වැදගත් අංගයක් වන නිසා නොව, එය වර්තමාන ලෝකයේ දැඩි අවශ්‍යතාවයක් වන නිසා ද කිතුනු සභාව සෞඛ්‍යය සම්බන්ධව ක්‍රියා කළ යුතුය.

2004 දී යන Transformative Justice ; Being Church and Overcoming Racism තේමාව යටතේ ග්‍රන්ථයක් ද නිකුත් කර ඇත.

iv. **බහු ආගමික සන්දර්භය**

ආගන්තුකයන් කෙරෙහි ඇති බියෙන් හා ද්වේශයෙන් ප්‍රේමයට "Xenophobia to philoxenia, From Fear and Harted of Strangers to Love of Strangers" යන්න තේමාවක් කරගෙන, ආගම් අතර සංවාදයක් පැවැත්වීම තුළින් විවිධ ආගමිකයන් අතර බිය හා ද්වේශය වෙනුවට ප්‍රේමය වඩවා ජීවත් වීමට මඟ පෑදුවේ ය.

- 2005 දී වතිකානුව ජගත් ශාසනික මන්ත්‍රණ සභාව සමඟ එකතු වී, ව්‍යාපාර තුළින් ආගම්වලට හරවා ගැනීම වෙනුවට විවිධ ආගමිකයන් තම තමන්ගේ ආගම් පිළිබඳ ව වටිනාකම් ගැන කරුණු ඉදිරිපත් කිරීමට ද ආගමික නිදහස ගැන තේරුම් ගැනීමට ද බහු ආගමික පරිසරයට ගරු කිරීමට ද පෙළඹුනෝය. ආගම් අතර සංවාදය, ශක්තිමත් කිරීම පිණිස Current Dialogue තත්කාලීන සංවාදය නමැති සඟරාව ද නිතුක් කෙරේ.

v. **සමාජීය සේවාව**

- සභා එක්සත් වීම ගැන ප්‍රයත්න දරන අතර. දේව ප්‍රේමයට අනුව ලෝක වාසීන්ගේ අවශ්‍යතාව හා දුක පිළිබඳ ව එකතු වී කටයුතු කළ යුතු ය.
- මිනිස් ජීවිත ගැන උනන්දුවීම යනු ලෝකය තුළ විවිධ සේවාවන්වල නිරත වීමයි. සභා එක්සත් වීම මෙන් ම සමාජ සේවාවන් ද වැදගත් වේ.
- අනාථයන් හා අවතැන් වූවන් කෙරෙහි සෑම රාජ්‍යයක් ම ඉතා උනන්දුවෙන් කටයුතු කළ යුතුය. මේ ගැන ජගත් ශාසනික මන්ත්‍රන සභාව අවධානය යොමු කරයි. ජගත් ශාසනික මන්ත්‍රන සභාව යටතේ එක් එක් රටවල පිහිටා තිබෙන ජාතික ක්‍රිස්තියානි මණ්ඩල හරහා ඒ ඒ රටවල ඇති අනාථවූවන් ද, අවතැන් වූවන් ද, එච්. අයි. වී. (HIV) ඒඩ්ස් වැනි රෝගවලට ගොදුරු වූවන් ද සම්බන්ධව සේවය කරයි.

vi. **අධ්‍යාපනය**

තමන්ගේ ම සම්ප්‍රදාය තුළින් හා තමන්ගේ සම්ප්‍රදාය ගැන පමණක් අධ්‍යනය කිරීම, ලෝකයේ ඇති මිනිස් සමාජය තුළ තිබෙන විවිධත්වය දැනගැනීමට හා එය අත්දැකීමට බාධාවක් වේ. අප අවට සිටින මිනිසුන්ගේ ආගමික හා සංස්කෘතික ජීවිතය සම්බන්ධව දැනුම හා අත්දැකීම ලබාගන්නා විට, ව්‍යාප්ත වී තිබෙන්නා වූ මිනිස් සමාජය තුළ සහයෝගයෙන් ජීවත් වන්නේ කෙසේදැයි දැනගැනීමට හැකි වේ.

### 10.2.3 ආසියානු ක්‍රිස්තියානි සම්මේලන ප්‍රකාශන (2000 - 2006)

**ඉතිහාසය**

- අරමුණු සහ ඉලක්ක

ආසියානු ක්‍රිස්තියානු සභාවන් හා ජාතික ක්‍රිස්තියානි සම්මේලනයන් අතර සහයෝගීතාව හා එකමුතුකම ඇති කිරීම, වර්ධනය කිරීම සඳහා ජගත් ක්‍රිස්තියානි සම්මේලන වැඩ රාමුව තුල ක්‍රියා කිරීම.

- ආරම්භය

ඉන්දුනීසියාවේ නැගෙනහිර ආසියානු ක්‍රිස්තියානි සම්මේලනය 1957 මාර්තු 26 වන දින ආසියානු ක්‍රිස්තියානි සම්මේලනය ආරම්භ කිරීමට තීරණය කරන ලදී. 1959 මැයි මාසයේ මැලේසියාවේ ක්වාලාලාම්පූර්වල පැවැත් වූ සැසි වාරයේ දී එය උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදී. 1964 බැංකොක් නුවර පවත්වන ලද පොදු සැසිවාරයේ දී හා 1971, 1973 වසරවල තිබුණු සැසිවාරයේදීත් 1995 කොළඹ පැවැත්වූ සැසිවාරයේ දීත් 2000 දී ඉන්දුනීසියාවේ පැවැත්වූ සැසිවාරයේදීත් ව්‍යවස්ථාවෙහි වෙනස්කම් ඇති කරමින් නොකඩවා පවත්වාගෙන යන ලදී. ආසියානු ක්‍රිස්තියානි සම්මේලනය යන නාමය 1973 දී දෙනු ලැබුවේය.

- සාමාජිකත්වය

නවසීලන්තය, ඕස්ට්‍රේලියාව, බංග්ලාදේශය, කම්පෝලියාව, නැගෙනහිර තිමෝරය, හොංකොං, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ලාවොස්, ජපානය, කොරියාව, මැලේසියාව, මියන්මාරය, පකිස්ථානය, පිලිපීන් දූපත්, ශ්‍රී ලංකාව, තායිවානය, තායිලන්තය ආදී රටවල්වලට අයත් සියයකට අධික කිතුනු සභාවන් හා ජාතික ක්‍රිස්තියානි මණ්ඩල 15 ක් සාමාජිකත්වය ලබා ඇත.

සාමාජිකත්වය ලැබීම පිණිස ශුද්ධ වූ බයිබලයට අනුව ජේසු ක්‍රිස්තුස් වහන්සේ දෙවියන්වහන්සේ හා ගැලවුම්කරුවාණන් ලෙස ප්‍රකාශ කළ යුතු අතර පියාණන්, පුත්‍රයාණන් හා ශුද්ධාත්මයාණන් යන ත්‍රී එක දෙවිඳුන්ගේ කැඳවීමට අනුව ජීවත් වීමට එකඟ විය යුතුය.

ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ ක්‍රියාකාරකම්

ආසියානු බහුවිධ සමාජයේ ප්‍රශ්න ඇතිවන විට සංවාද ගොඩනගා විසඳුම් ලබාගන්නා අවකාශයක් ඇති කිරීම, ජනතාවගේ සම්බන්ධතාවයන්වලට බාධාවක් ව පවතින කරුණු හඳුනාගෙන ඒවා මඟ හරවා ගැනීමට ජනතාව දැනුවත් කිරීම දැනට පවත්වාගෙන යන ප්‍රධානතම ක්‍රියාකාරකම් වේ.

i. ආසියාවේ කිතුනු සභාවන් හා සමූහයන් තුල සහයෝගීතාවය වර්ධනය කිරීම, ශක්තිමත් කිරීම යථාර්ථයක් බවට පත් කිරීම.

ii. සභා එක්සත්කම තහවුරු කිරීම පිණිස එකතු කිරීම දර්ශනයක් ඇතුව ක්‍රියා කිරීම. (Inclusive)

iii. පසුගිය කාල වකවානු තුළ දේශපාලනික හා මතවාද හේතුකොට ගෙන වෙන්වුනා වූ ආසියානු සභාවන් නැවත එකමුතු කිරීමට ප්‍රයත්න දැරීම.

iv. සභාවන් අතර එකමුතුකම වර්ධනය කිරීම සඳහා ක්‍රියා කිරීම.

v. රෝමුනු කතෝලික සභාව සහ එවන්ජලිස්ත සභාවන් ඇතුලත් වන ආකාරයට වැඩ සැලසුම් කිරීම.

**ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ ව්‍යුහය**




**මහ සභා රැස්වීම**

වසර හතකට වරක් තෝරා පත් වූ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් මහ සභා රැස්වීම පැවැත්වෙයි. මෙහිදී වසර පහකට වැඩසටහන් සැලසුම් කිරීම, කුමකට ප්‍රමුඛත්වය දිය යුතු ද යන්න තීරණය කිරීම හා ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබයි. වසර පහකට කාර්ය මණ්ඩලය පත් කරන අතර මහ සභා රැස්වීමේ තීරණ ක්‍රියාත්මක කරනු ලබන්නේ තේරී පත් වූ නායකයන් වන ප්‍රධාන නායකයන් සිව්දෙනා, භාණ්ඩාගාරික හා ලේකම් ය.

**පොදු කාර්ය මණ්ඩලය**

මහ සභා රැස්වීමේ දී තේරී පත් වූ කණ්ඩායම හා සාමාජික එක් නියෝජිතයක් බැගින් හා තවත් තේරී පත් වූ පස් දෙනෙක්ගෙන් මෙම කාර්ය මණ්ඩලය අන්තර්ගත වේ.

**විධායක කමිටුව**

මහ සභා රැස්වීමේ දී තේරී පත් වූ කණ්ඩායම හා පොදු කමිටුවේ සිටින අනෙකුත් නිලධාරී මණ්ඩලයේ අවමය තුන්දෙනෙක් හා උපරිමය පස් දෙනෙකුගෙන් සමන්විත වේ. විධායක කමිටුව පොදු කාර්ය මණ්ඩලය විසින් පත් කරනු ලබයි. විධායක කමිටුව රැස්වන්නේ පොදු කමිටුව රැස් නොවන වසරවල හා පොදු කමිටුවේ විශේෂ ඉල්ලීම මත ය. විධායක කමිටුවේ ගනු ලබන තීරණ ඊළඟට රැස්වෙන පොදු කමිටුවේ දී හා මහ සභා රැස්වීමේ දී අනුමත කරනු ලබයි.

**පොදු ලේකම්**

පොදු කමිටුවේ පත් වූ ලේකම්, ආසියානු ක්‍රිස්තියානි මණ්ඩලයේ විධායක බලතල ඇති ප්‍රධානියා වේ. සම්බන්ධීකාරක අංශය හා මුදල් අංශය සහකාර ලේකම් අතර ද ප්‍රධානියා විධායක ලේකම් තුමා වේ. ඔවුන්ගේ කාර්යභාරය වන්නේ ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, කාර්යාලයේ එදිනෙදා වැඩ කටයුතු පවත්වාගෙන යාම හා සභාවන් අතර එකමුතුකම වර්ධනය කිරීමයි.

ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ ක්‍රියාකාරකම් ප්‍රධාන අංශ 4කට බෙදිය හැක.

* ඇදහිල්ල, දූතනය, එක්සත්කම (Faith, Mission, Unity)
* යුක්තිය, අන්තර් ජාතික තොරතුරු සංවර්ධනය හා සේවය
* සභා සහයෝගීතාවය, ලිංග භේදයකින් තොර යුක්තිය, තරුණ ප්‍රවර්ධනය
* පොදු ලේකම් කාර්යාලය (General Secretariat)

මේ හැර වෙනත් විශේෂ කාර්යයන් ඔවුන් භාරගනී. එයින් සමහරක් නම් ,

* ආසියානු සභා සහයෝගීතාවය තුල අධ්‍යාපන හුවමාරුව
* ආසියානු දූත මෙහෙවරට සහය වීම - Asian Missionary Support Program (AMSP)
* සංවර්ධන අරමුදල - Development Fund
* තරුණ අරමුදල - Youth Fund
* කාන්තා නායකත්ව අරමුදල (Women Leadership Fund)
* යුක්තිය සහ සමගිය පහල පන්තියේ සිට ඇති කිරීමේ අරමුදල

ආසියානු ක්‍රිස්තියානි සම්මේලනය විසින් විවිධ ජාතික ක්‍රිස්තියානි මණ්ඩල තුලින් සමාජය හා සංස්කෘතික සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළ මගින් දී ඇත්තා වූ ඉගැන්වීම් (2000-2006 දක්වා)

* "එකතු වී කළ හැකි සියලු දේ වෙන වෙනම නොකරමු" යන තේමාව යටතේ විවිධ සම්ප්‍රදායන්ට අයත් සභාවන් රැස්වී එකම ගැලවුම්කරුවන්ට සාක්ෂි දැරීම.
* ආසියානු ප්‍රාන්තයේ ආර්ථික පසුබෑම් නිසා මානසිකව, ශාරීරිකව වැටුණු අයට ජීවනෝපාය මාර්ග සොයා ගැනීමට උපකාර කිරීම තුළින් HIV/AIDS හා ලිංගික අපරාධවලට භාජනය වීම අවම කිරීම.
* මානව අයිතීන් වෙනුවෙන් ඉදිරිපත් වීම.

  උදා : මැලේසියාවේ උප්පැන්න සහතික ලබාගන්නට නොහැකිව, පුරවැසිකම නොමැතිව සිටින්නා වූ බොහෝ අය උදෙසා නිසි පියවර ගැනීමට රජය පොළඹවීම, ළමා රැ කියාවලට විරුද්ධව හඬ නැගීම.

* ස්වභාවික විනාශයන් ගැන තොරතුරු රැස්කරමින් අවශ්‍ය පියවර ගැනීම.
* බටහිර රටවලින් ලබාගත් ණය පියවන්නට නොහැකිව සිටින රටවලින් ණය බර අඩු කරවන්නට බලපෑම් කිරීම.
* මානව අයිතීන් උල්ලංඝනය වන රටවල ඒ සඳහා නිසි පියවර ගන්නා ලෙස ඒ ඒ රජයට බලපෑම් කිරීම.

**නිපුණතාව 10.0** : **නව ලෝක ශිෂ්ටාචාරයක් බිහිකිරීමේ සහා ප්‍රයත්නයේ දී ආසියාතික හා ලාංකික සමාජය වෙනුවෙන් සභාවේ වගකීමට දායක වෙයි.**

**නිපුණතා මට්ටම 10.3** : විවිධ ආගමික කොටස් හා සහජීවනයෙන් ජීවත් වෙයි.

**කාලය** : කාල පරිච්ඡේද 10

**ඉගෙනුම් ඵල** :

- සාමයික අවබෝධය හා කිතුනු සභා එකමුතුව පිළිබඳ ව කරුණු අවබෝධ කර ගැනීම.
- කිතුනු සභා එකමුතුවට දායක වූවන් පිළිබඳ ව සොයා බලයි.

## විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්

### 10.3.1 සාමයික අවබෝධය හා කිතුනු සභා එකමුතුව

- කිතුනු ඒකත්වය යන අදහසේ ග්‍රීක වචනය OIKUMENE . මේ මගින් අදහස් වන්නේ විශ්වීය ජනතාවයේ ඒකත්වය යන්නයි.

- ඒකත්වය ශු. සභාවේ එක් ලක්ෂණයකි. එකම දෙවියන් වහන්සේ පමණකි, එකම ශු. සභාවකි, එහි ඇත්තේ එකම විශ්වාසයකි.

- නමුත් අද කිතුදහම භේද භින්න වී ඇත. එහි ඇති විවිධ භාෂාවන්, ඒවායේ න්‍යායයන්, වන්දනා ක්‍රම, පරිපාලනය, ක්‍රියාකාරකම් ආදියේ එකින් එක වෙන් වී පවතිනු පමණක් නොව, බොහෝවිට ඒවා එකිනෙකට පරස්පර විරෝධී ලෙස ක්‍රියාත්මක වේ.

- කිතුනු සමාජයේ භේද, වර්තමානයේ හදිසියේ ඇතිවූවක් නොව, නව ගිවිසුමේ කාලයේ සිටම ශු. සභාව තුළ භේද ඇති වී ඇත. (1 කොරි 1:10)

  කාලයාගේ ඇවෑමෙන් ඇරියුස් (ARIUS), නෙස්ටෝරියස් (NESTORIUS)වැනි සමහරුන්ගේ අදහස් නිසාත් බොහෝ භේද ඇතිවිය. 11 වන සියවසේ ඇති වූ ග්‍රීක සභා, රෝම සභා යන්න මහා දෙකඩවීමක් පමණක් නොව, ස්ථිර වශයෙන් අද දක්වාම පවතින්නකි.

  එලෙසම 16වන සියවසේ ඇති වූ ආගමික පුනරුදය නිසා ද යුරෝපයේ ඇතිවූ ප්‍රතිසංස්කරණවාදී සභාවන්හි බෙදීම, එංගලන්ත සභා භේදය, අද දක්වාම පවතින්නකි.

- සියල්ලෝම එකට ජීවත්වෙති යන (ජොහන් 17:21-22) ක්‍රිස්තුස් වහන්සේගේ එකමුතුකමේ සිහිනය කිතුදහම තුළ කිසිවිටෙකත් නැති නොවීය. සියල්ල එකමුතු කරන ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය නිසා නව ඒකත්ව උත්සහයන් නිතර නිතර ක්‍රියාත්මක වෙමින් පවතී.

- කොරින්ති සභාවේ ඇතිවූ භේදයට විරුද්ධව ක්‍රිස්තුස් වහන්සේ මෙලෙස භේද වූවා ද යැයි (1 කොරින්ති 1:13) වසර දෙකකට පෙර ශු. පාවුලුතුමා අභියෝග කරයි.

  ඒ සමඟම භේදකාරී අදහස් ඇත්තන් එකම සභාවක් යටතට ගෙනඑමේ උත්සාහය වැදගත් එකක් විය.

මහා දෙකඩවීම යන නම දැරූ අපරදිග සභාවන්හි බෙදීම තුරන් කිරීමට ගත් උත්සාහය අති මහත් ය. නමුත් ප්‍රතිසංස්කරණවාදී සභාවන් හි බෙදීමට පසු කිතුනු ඒකත්වය සඳහා වන උත්සාහයන් බොහෝමයක් ගත්ත ද, කිතුනු සභාවන් අතර ශතවර්ෂ 4 ක් පුරා පැවතියේ තමන් පිළිබඳ සංරක්ෂණ හැඟීමත්, අනෙක් සභාවන් කෙරෙහි භේදකාරී හැඟීමත් පමණි.

- 20 වන ශතවර්ෂයේ සිට සභාවන් අතර පැවැති විරුද්ධවාදී හැඟීම ක්‍රම ක්‍රමයෙන් අඩුවන්නට විය. මේ සඳහා වන හේතු රාශියකි.

- ශු. සභාව යන්න දේව ජනතාවගේ සමාජය යන්න පදනම් කරගෙන ඇත. දේව ජනතා සමාජය යන පදනමින් ධූරාවලි සංවිධානය (Hierarchical) අධිකාරී බලයේ බලපෑම යන්න අතහැර බෞතීස්මය නමැති ප්‍රසාද නිධානය නිසා කිතුනුවන් තුළ ඒකරාශී වූ එකම විශ්වාසිකයින්ගේ සමාජයේ ශුද්ධත්වය, ඒකත්වය, සාධාරණත්වය, කතෝලිකත්වය ආදියට වැදගත්කම දෙනු ලබයි.

- කිතුනු ඒකත්වය දෙවියන් වහන්සේ සමඟ ඒකත්වයටත්, මිනිස් සමාජයේ ඒකත්වයටත්, වරප්‍රසාදීය ලකුණක් සේ පවතින බව පැහැදිලි ය.

- තවද දේව ජනතාවගේ සමාජය වන ශු. සභාවේ සේවය පමණක් වන නිසාත්, ශු. සභාවේ අභ්‍යන්තර ජීවිතයේ ඒකත්වය යන්න එහි ලක්ෂණයක් වන නිසාත්, ශු. සභාවේ අභ්‍යන්තරික ජීවිතයේ භේදකාරී තත්වය යන්න ජනතාවගේ සිත්හි කැළඹීමක් ඇති කරන අතර, ශු. සභාවේ සුපුවත් දෙසීමේ සේවය එවැනි භේදකාරී අභ්‍යන්තර ජීවිතයට බාධාවක් වන නිසාත්, කිතුනු ඒකත්වය අවධාරණය කෙරේ.

- කිතුනු ඒකත්වයට ක්‍රිස්තුස් වහන්සේ පදනමත් සිරසත් වන සේක. ශු. සභාව කිතුතුමන්ව පදනම් කරගත් සාමූහික සමාජය (Communion) වන නිසාත්, ශු. සභාවේ දේව රාජ්‍යය යන දැක්මට අනුව කිතුනු ඒකත්වය අද වැදගත් වේ.

- කිතුනු සභා එකමුතුව අද කතෝලික සභාව, ප්‍රතිසංස්කරණවාදී සභා, ග්‍රීක සභාව යන සභාවන් අතර සුහදතාවය ඇතිකිරීමට කටයුතු කරයි.

- කිතුනු සභා එකමුතුව පිළිබඳ විවිධ අදහස්

  * ශුද්ධෝත්තම පියතුමන්ගේ අධිකාරී බලයට යටත් ව සියලුම කිතුනුවන්, එනම් සියලු කිතුනු සභා නැවත කතෝලික සභාව හා එක්වීම (Return)

  * එක් සභාවක් තුළට තවත් සභාවක් ඈදගැනීම (Absorbtion) මෙම කිතුනු සභාව එකමුතුවේ ස්ප්‍රිතුවට පටහැනි ය.

  * එකමුතුකම නැවත ඇතිකිරීම (Restore Unity) සත්‍ය ලෙස තහවුරු නොකළ සිතෙහි මවාගත් පැරණි එකමුතුකම ලබාගැනීම.

- දිව්‍ය සත්ප්‍රසාදය තුළ විවිධත්වය හා අන්‍යොන්‍ය බෙදාගැනීම හඳුනාගැනීම (Mutual Recognition of Diversity and Mutual Sharing in the Eucharist)

- ක්‍රමානුකූල ඒකත්වය (Organic Unity) ඇති කිරීම. විවිධ සභාවන් විශ්වාසය, ප්‍රසාද නිධාන, සේවාවන් ආදියෙහි ඒකත්වයක් ඇතිකර සංවිධානාත්මක ක්‍රමයක් අනුගමනය කිරීම.

- යහ සබඳතා නැතහොත් සහ සබඳතා සහිත සමාජයක් බිහිකිරීම. මෙම සමූහ ඒකත්වය තුළ විවිධ සභාවන්හි ආධ්‍යාත්මික සම්ප්‍රදායයන් හා පහත සඳහන් ගුණාංග 4 අඩංගු වී ඇත. එනම්, විශ්වාසීය ධර්මතා, බෞතීස්මය තුළින් ආරම්භවන ප්‍රසාද නිධානීය ජීවිතය, දිව්‍ය සත්ප්‍රසාදීය බෙදාගැනීම, සේවය ආදියයි.

- සභාවක් ලෙස නැතහොත් සංවිධානය වී ඇති ආකාරයෙන් ඒකත්වය (Conciliar Fellowship) විවිධ භාෂාවන්හි නියෝජිතයින්, රදගුරුවරුන්, ගිහියන් එකට එක්වන සම්මේලනයන්හි ප්‍රකාශවන ඒකත්වය හා (උදා : ලෝක කිතුනු සම්මේලනය, රෝමයේ කතෝලික රදගුරු සමුළුව, පෙරදිග භාෂාවන් හි Eastern Orthordox churches පොදු සංගම් පැහැදිළි කරන කතෝලිකත්වය යන සම්ප්‍රදායට අනුව අධ්‍යාත්මික ඒකත්වය හා සහසබඳතා සංගම්) සමාජයේ ස්වභාවය මේ තුළින් ප්‍රකාශ වේ.

  * මක්නිසා ද යත්, කිතුනු ඒකත්වය - බලාපොරොත්තුවේ පදනමින් (Hope) නැග එන වරප්‍රසාදයක් හා කැඳවීමක් වේ.

  * සමඟිය ශු. සභාව යන අභිරහසේ ප්‍රධාන ගුණාංගය වන අතර, ඓතිහාසික පූර්ණත්වය කරා ළඟාවිය යුත්තකි.

- අද කිතුනු එකමුතුව සඳහා යැදීමට සේවය කිරීමට, දුක්විඳීමට, සාක්ෂි දැරීමට, කිතුනුවන් උනන්දු කරනු ලබති. කිතුනු එකමුතුව සඳහා යැදීම පෙන්නුම් කරන්නා සේ ම කිතු තුමන්ගේ කැමැත්තට අනුව, එතුමන් බලාපොරොත්තු වන ඒකත්වය සඳහා ක්‍රියාකළ යුතු ය.

- බේදයන් කිතුනු ඒකත්වයට බාධාවක් වී ඇත. සාකච්ඡා අවබෝධයෙන් තොර වීම මෙයට හේතු වී ඇත. කිතුනු අභිරහස පිළිබඳ ඒක පාර්ශවික පැහැදිළි කිරීම, දේවධාර්මික ඉගැන්වීම්වල අපැහැදිළි බව වැනි දෑ මෙම භේදවලට හේතු වී ඇත.

- සත්‍යය, ගැඹුරු අදහස් සාකච්ඡා මගින් එකිනෙකා අවබෝධ කරගැනීම, දේව ධාර්මික අදහස්, ඓතිහාසිකත්වය, ආධ්‍යාත්මිකත්වය, සේවයේ දිවිය, ගුණාංග වැනි දෑ පිළිබඳ අදහස් බෙදා ගැනීම.

- කිතුනුවන් සමඟ එක් වී පොදු සේවාවන් හි ක්‍රියාකාරී ලෙස සහභාගී වීම.

- මේවා පිළිබඳ ව අවධාරණය කිරීමට දෙවන වතිකාන මන්ත්‍රණ සභාව කිතුනු ඒකත්වය පිළිබඳ ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කළේය.

- ලොව පුරා කිතුනු ඒකත්වය සඳහා නවතම විවිධ උත්සාහයන් ද පෙළඹවීම් ද කරනු ලැබේ. විවිධ කිතුනු සභාවන් අතර වූ භේදයන්, විරෝධකම්, සැකය, තරග මානසිකත්වය යනාදිය තුරන් වී යහපත් සබඳතාවක් කෙමෙන් කෙමෙන් වර්ධනය වන්නට විය.

- මෙම යහපත් සබඳතාවයේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ අංශයන්ගේ සභාවන් හි සහයෝගීත්වය ඇති වන්නට විය.

- කිතුනු ඒකත්ව සතිය (ජනවාරි 18-25) කිතුනු ඒකත්වය සඳහා යදින, සංඝයක් ලෙස දෙවිඳුන් යදින අවස්ථාවක් වේ.

- එකම දෙවිඳුන් යැදීම, මංගලයයන් සැමරීම ආදිය ක්‍රියාත්මක වී ඇත.

- වර්තමානයේ සිංහල, දෙමළ භාෂාවලින් ශු. බයිබලය ප්‍රකාශයට පත්කොට ඇත. මෙය කිතුනු ඒකත්වය සඳහා ලැබුණු මහත් ජයග්‍රහණය වේ.

- අ.පො.ස. උසස් පෙළ විභාග සඳහා ක්‍රිස්තියානි ධර්මය, ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය යන විෂයයන් සියලු ආගම්වලට පොදු ලෙස සකස් කර ඇත.

- ශු. බයිබලීය ග්‍රන්ථවලට පොදු හැඳින්වීම ලිවීමේ කටයුතු කිතුනු ඒකත්වයට උචිත ප්‍රකාශනයක් ලෙස ගොඩනැගීමේ අවස්ථාව ඇත.

- විවිධ සභාවන් හි දේව ධර්මාචාර්යවරුන් එක් වී විශ්වාසය ප්‍රකාශ කිරීම, දේව යැදුම්, සිරිත් විරිත්, ධර්මතාවයන් පිළිබඳ පැහැදිළි කිරීම, ශු. බයිබලීය විචාර ආදිය තුළින් ද ඒකත්වය ඇති කළ හැක.

- පොදු වන්දනාවලදීත්, පොදු යැදුම්වලදීත් කොතරම් සහභාගී විය හැකි යැයි ද, වෙනත් සභාවල ජනවන්දනා කොතරම් දුරට සහභාගී විය හැකි යැයි ද , වෙනත් සභාවන් හි තම වන්දනා කටයුතුවල දී කොතරම් දුරට සහභාගී විය හැකි යැයි ද, මඟ පෙන්වීමේ ග්‍රන්ථයක් නිර්මාණය කර කිතුනු ඒකත්වයට මඟ පෙන්විය හැක.

- විවිධ සභාවන්ට අයත් දේව ධර්මය උගන්වන දේවධර්ම ශාස්ත්‍රාල අතර සහයෝගීතාව උනන්දු කරවිය හැක.

- කිතුනු ඒකත්වය සඳහා ක්‍රිස්තුස් වහන්සේගේ සිහිනය පූර්ණත්වයට පත් කිරීම සෑම කිතුනුවෙකුගේ ම වගකීම වේ. සෑම කිතුනුවෙකු ම කිතුනු ඒකත්වයේ සේවකයෝ ය.

- අනෙකුත් සභා පිළිබඳ ව හොඳ අවබෝධයක් ලබාගැනීම, ඔවුන් හා සුහදව ආශ්‍රය කිරීම, ඔවුන්ගේ විශ්වාසයන්, ක්‍රමවේදයන් පිළිබඳ ව සිත් රිදවන ආකාරයේ විවේචන කිරීමෙන් වැලකීම, ඔවුන් හා යහ සබඳතාව වර්ධනය කර ගැනීම, ඔවුන්ගේ පවුල් හා සමාජ කටයුතුවලදී සහභාගී වීම, ආගමික සිරිත් විරිත් හා උත්සවවල දී අනුමැතිය ලැබූ ආකාරයට සහභාගී වීම ආදිය සියලුම කිතුනුවන් ඒකත්වය සඳහා කළහැකි සාමාන්‍ය ක්‍රියාවන් ය.

- නමුත් කිතුනු ඒකත්වය සඳහා යන ගමනේ දී අභියෝගයන්ට මුහුණ දීමට සිදුවේ. විශ්වාස ප්‍රකාශනය, ප්‍රසාද නිධාන, දිව්‍ය සත්ප්‍රසාදය වැනි ධර්මතා පිළිබඳ ව තවදුරටත් ඒකත්වයක් දැකිය යුතුය.

- දේව ධර්මාචාර්යවරුන් ගේ චින්තනයේ කාන්තාවන් පිළිබඳ අදහස සියලු දෙනා නොපිළිගත්හ. විශේෂයෙන් කාන්තා පූජකවරය පිළිබඳ අදහස ක්‍රියාත්මක කිරීම කිතුනු ඒකත්වයට ප්‍රධාන බාධාවක් වී ඇත.

- සියලුම කිතුනු සභා එක්වුවහොත් එහි නායකත්වය කුමන සභාවට ලබාදෙනවා ද යන්නත්, වර්තමානයේ ඇති අභියෝගවලින් එකකි.

### 10.3.2 සාමයික අවබෝධය හා සභා එකමුතුවට දායකවූවෝ

- මධ්‍යතන යුගයේ සභාව තුළ ඇති වූ භේද නිරාකරණය කිරීම සඳහා මන්ත්‍රණ සභා කැඳවනු ලැබීය.

- සභාවේ භේද ඇතිවන සෑම අවස්ථාවක ම, එකමුතුකම සඳහා වන උත්සාහයක් ගන්නා ලදී.

- 19 වන සියවසේ දී කිතුනු සභා එකමුතුව සඳහා වන කටයුත අරඹන ලදී.

- 1844 දී තරුණ ක්‍රිස්තියානි (පුරුෂ) සංගමය (YMCA) ලන්ඩනයේ දී ආරම්භ කරන ලදී.

  මෙහි අරමුණ : ශු. බයිබලයට අනුව ක්‍රිස්තුස් වහන්සේව තම දෙවියන් හා ගැලවුම්කරුවාණන් ලෙස පිළිගෙන, තම විශ්වාසීය ජීවිතයේ එතුමාණන්ගේ අපෝස්තුලුවරයකු වී, තරුණ සමාජය තුළ එතුමන්ගේ රාජ්‍යය පැතිරවීමට තරුණයින් එක්රැස් කිරීම.

- 1846 දී, යුරෝපයේ, උතුරු ඇමරිකාවේ ප්‍රතිසංස්කරණ සාමාජිකයන් 800 ක් පමණ තම ධර්මදූත කටයුතු, මුද්‍රණ කටයුතු, සමාජ සංශෝධනය ආදී සේවාවන් හි එකමුතු කිරීමට එවැන්ජලිකල් එලයින්ස් (Evangelical Alliance) යන සංවිධානය ආරම්භ කළහ.

- 1855 දී තරුණ ක්‍රිස්තියානි (ස්ත්‍රී) සංගමය (YWCA) ලන්ඩනයේ දී ආරම්භ විය.

- 1875 දී ප්‍රතිසංස්කරණවාදී සභාවන් හි විශ්ව එකමුතුව (World Alliance of Reformed Churches - WARC) අරඹන ලදී.

- 1908 දී ඇග්ලිකානු සභා සේවකයකු වන පාවුලු වොට්සන් නමැත්තා කිතුනු එකමුතු සතිය (ජනවාරි 18- 25) යැයි හඳුන්වනු ලැබූ සතිය තුළ, කිතුනු සභා එකමුතුව සඳහා දෙවිඳුන් යැදීමට උනන්දු කළේය.

- කිතුනු එකමුතුව සඳහා කිතුනුවන් දින අටක් දෙවිඳුන් යැදීමේ මෙම සිරිත 1916 දී 15 වන බෙනදික් ශුද්ධෝත්තම පියාණන් විසින් පිළිගෙන ලොව පුරා කතෝලික සභාව තුළ පැතිරවීය.

- 1910 දී ඇංග්ලිකානු ප්‍රතිසංස්කරණවාදී සභා එක් වී එඩින්බර්ග් නගරයේ දී ජාත්‍යන්තර (ධර්මදූත) මන්ත්‍රණ සභාව (International Missionary Conference) රැස්කළහ. මෙම මන්ත්‍රණ සභාව තුළින් කිතුනු සභා එකමුතු සංඝය ආරම්භ වූ බව පැවසිය හැක.

- කිතුනු සභා එකමුතුකමේ ඊළඟ වැදගත් ප්‍රධාන වර්ධනය මෙම ශතවර්ෂයේ මැද භාගයේ දී සිදුවිය. මෙහි දී සඳහන් කළයුතු වැදගත් සිදුවීම් 3 කි.

  * 1947 දී දකුණු ඉන්දියානු ඇංග්ලිකාන සභාව සහ විවිධ ප්‍රතිසංස්කරණවාදී සභා එකට එක්වී දකුණු ඉන්දියානු සභාව ලෙස එක්වීම මුළුමහත් විශ්වයම කිතුනු එකතුව සඳහා පොළඹවන ආදර්ශයක් විය.

  * 1948 දී සභාවන් හි විශ්ව මන්ත්‍රණ සභාව (World Council of Churches) ස්ථාපිත කරන ලදී. (කතෝලික සභාව මෙහි සාමාජිකත්වය දැරුවේ නැත.)

  * 1949 දී රෝමයේ තිබූ විශ්වාසයේ ධර්මතා පිළිබඳ සංඝය එකමුතු සංඝය පිළිබඳ උපදෙස් ප්‍රකාශ කර, සභාවන් හා එකමුතුවට හා සාකච්ඡාවට බීජ වැපිරවීය.

- කිතුනු එකමුතුව සඳහා නව ප්‍රබෝධයක් හා ගැඹුරු ක්‍රියාකාරකමක් කතෝලික ශු. සභාව තුළ ඇති කළේ කිතුනු එකමුතු සංඝයේ පියා යන විරුදාවලිය ලත් 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමන් ය.

  ඒකත්වය සඳහා වන ක්‍රියාකාරකම් පිළිබඳ උනන්දුවක් ඇතිකර, සංවිධානය කිරීම සඳහා එතුමා රෝමයේ කිතුනු සභා එකමුතු ලේකම් කාර්යාලයක් පිහිටුවීය. තම දිළිඳුකම, බැගෑපත්කම, කරුණාවන්තකම යන ගුණාංග තුළින් විරුද්ධවාදීන් යැයි සළකනු ලැබූ අනෙකුත් සභාවන්හි කිතුනුවන්ව ද දෙවිඳුන්ගේ සහෝදර, සහෝදරියන් ලෙස එක්රැස්කර ගත්තේ ය.

- මෙතුමා දෙවන වතිකාන මන්ත්‍රණ සභාව එක්රැස්කළ විට එහි ප්‍රධාන අරමුණක් වූයේ කිතුනු සභා එකමුතුවයි.

- එතුමන්ට පසු 6 වන පාවුලු ශුද්ධෝත්තම පියතුමෝ කිතුනු සභා එකමුතුව සඳහා විශාල උනන්දුවක් දැක්වූයේය. තම සේවන කාලය ආරම්භයේදී ම, පෙරදිග සභා ධර්ම පියාණන් වන අතනාගොර්ස් මුණගැසුණෝය. එතුමා මන්ත්‍රණ සභාවේ දෙවන වටයේ ආරම්භක කථාවේදී, සෑම අයුරකින් ම අප (කතෝලිකයින්) මෙම භේදයට, භේදයන්ට හේතු වූයේ වූ නම්, බැගෑපත්ව දෙවියන් වහන්සේගෙන් සමාව අයදින අතර, අප විසින් තමන් රඳවනු ලැබූවා යැයි අදහස් කරන සහෝදරයින්ගෙන් ඉවසා වදාරණ ලෙස ද ඉල්ලමු යි පැවසීය.

- කතෝලික සභාවේ මෙවැනි සාමූහික සහජීවනය සඳහා වන උත්සාහයන් හි වැදගත් තැනක් හිමිවනුයේ දෙවන වතිකාන මන්ත්‍රණ සභාව විසින් දානය කළ කිතුනු සභා එකමුතුව සඳහා වන ප්‍රකාශනය යි. මෙම ප්‍රකාශනය කිතුනු සභාවන් අතර එකමුතුව තුළින් සහජීවනයක් ඇති කරන නව යුගයක ආරම්භයක් වූ බව පැවසිය හැක. මන්ත්‍රණ සභාව තුළින්, කිතුනු සභා එකමුතුවට අදාළ පරිසරයක් ගොඩනැගේ. නව මඟක් පෙන්නුම් කෙරේ යැයි සියලුම කිතුනුවන්ගේ සිත් හි පිරී තිබුණු බලාපොරොත්තු මෙම ප්‍රකාශන තුළින් සම්පූර්ණ විය.

  ඔස්කාර් කුල්මාන් නමැති ප්‍රතිසංස්කරණවාදී සභා පඬිවරයා පවසන පරිදි, මෙය එකමුතුකමට මඟ හෙළිකරන ප්‍රකාශනයක් පමණක් නොව, නව වාර්තාවකි. කතෝලිකයින් නොවන අය පිළිබඳ ව මේ දක්වා කිසිදු ප්‍රකාශනයක හෝ ග්‍රන්ථයක මෙලෙස සාකච්ඡා නොවුණි.

- ශු. සභාවේ ජාත්‍යන්තර සමුළුව (WCC) විශ්වාසීය ධර්මතා, බෞතීස්මය, දිව්‍ය සත්ප්‍රසාදය, කිතුනු ජීවිතය පිළිබඳ එහි ප්‍රකාශන මගින් කිතුනු එකමුතුවට පොළඹවයි.

- මේවා පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු සම්මේලනය (Catholic Bishop's Conference of Sri Lanka) මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන කිතුනු සභා එකමුතුව සඳහා වන කොමිසම තම ක්‍රියාකාරකම් ඉදිරියට රැගෙන යයි. එලෙසම ශ්‍රී ලංකා ජාතික කිතුනු සංගමය (National Christian Council of Sri Lanka) කිතුනු සභා එකමුතුව සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

  මෙම සංගම් දෙක ස්වාධීනව ක්‍රියාත්මක වුව ද,කිතුනු එකමුතුව සඳහා වන සාකච්ඡා එකට එක්වී ක්‍රියාත්මක කරති.

- ශු. සභාවේ ජාත්‍යන්තර සමුළුවත් (WCC) කතෝලික සභාවත් විශ්වාසීය ධර්මතා පිළිබඳ සාකච්ඡා තවදුරටත් ඉටු කරමින් සිටිති.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- කිතුනු ඒකත්වය සඳහා පසුබිම් වන කරුණු පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- අද ශිෂ්‍යයන් ජීවත්වන සමාජයේ කිතුනු ඒකත්වයට අභියෝගයක් වන දෑ පිළිබඳ ව ලැයිස්තුවක් පිළියෙල කිරීමට උපදෙස් දී, සිසුන් ගොඩනැංවූ කරුණු පිළිබඳ ව කතිකාවතක් ගොඩනගන්න.
- සාමයික අවබෝධය හා කිතුනු සභා එකමුතුව පිළිබඳ ව කරුණු සාකච්ඡා කරන්න.
- කිතුනු සභා එකමුතුවට දායක වූ පුද්ගලයින් ව පෙළගස්වා ඔවුන්ගේ සේවාව පිළිබඳව සාකච්ඡා කරන්න.

# පාසල පදනම් කරගත් තක්සේරුව

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය

## හැඳින්වීම

ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත්, ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදා ගත යුතු බවත් සෑම ගුරුවරයෙකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයෙකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයෙකු ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත්, සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීමට සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩපිළිවෙල ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර, සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථොක්ත අරමුණ සහිතව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත්, සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් - ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද, ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද, තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේ ය :

| | |
|---|---|
| 01. පැවරුම් | 02. ව්‍යාපෘති |
| 03. සමීක්ෂණ | 04. ගවේෂණ |
| 05. නිරීක්ෂණ | 06. ප්‍රදර්ශන/ඉදිරිපත් කිරීම් |
| 07. ක්ෂේත්‍ර චාරිකා | 08. කෙටි ලිඛිත පරීක්ෂණ |
| 09. ව්‍යුහගත රචනා | 10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. ශ්‍රවණ පරීක්ෂණ |
| 13. ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. කථනය |
| 15. ස්ව නිර්මාණ | 16. කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. සංකල්ප සිතියම | 18. ද්විත්ව සටහන් ජර්නලය |
| 19. බිත්ති පුවත්පත් | 20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21. ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. විවාද |
| 23. සාකච්ඡා මණ්ඩල | 24. සම්මන්ත්‍රණ |
| 25. ක්ෂණික කථා | 26. භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම් - ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගතයුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වගබලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත්, මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

## පාසල පදනම් කරගත් තක්සේරුව

**1. පාසල් වාරය** - 01

**2. උපකරණ අංකය** - 01

**3. ආවරණය කරන නිපුණතා මට්ටම** - 6.2

**4. ආවරණය කරන විෂය අන්තර්ගතය :**

- කිතුනු ශිෂ්ටාචාරයට පදනම සකසන ශිෂ්ටාචාරයන් පිළිබඳ ව ක්‍රමානුකූලව විමසීම.
- බයිබලීය භූගෝලීය පසුබිම, නික්ම යාම, ජන නායකයෝ, රජවරු, විප්‍රවාසය

**5. උපකරණයේ ස්වභාවය :**

විවිධ ශිෂ්ටාචාරයන් පිළිබඳ භූගෝලීය පදනම කෙටි ලිඛිත පරීක්ෂණයක් සිදුකිරීම

**6. අරමුණු :**

- ශු. බයිබලීය භූගෝලීය පසුබිම සොයා බලයි.
- පලස්තීන දේශයේ යුප්‍රටීස්, ටයිග්‍රීස් ගංගා පිළිබඳ කියවයි.
- ජන නායකයන්, රජවරු, විප්‍රවාසය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.

**7. ඇගයීම් ක්‍රමය :**

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. කෙටි ලිඛිත ප්‍රශ්න හොඳින් අවබෝධ කර ගනී | 4 |
| 2. තොරතුරු එක්රැස් කරයි | 4 |
| 3. ඉතා නිවැරදි පිළිතුරු සපයයි | 4 |
| 4. යෝජිත කාලය තුළ පිළිතුරු ලියා භාරදෙයි | 4 |
| 5. පැහැදිළි ව විස්තර ඉදිරිපත් කරයි | 4 |
| | **20** |

## පාසල පදනම් කරගත් තක්සේරුව

**1. පාසල් වාරය** - 01

**2. උපකරණ අංකය** - 02

**3. ආවරණය කරන නිපුණතා මට්ටම** - 6.4

**4. ආවරණය කරන විෂය අන්තර්ගතය :**

- කිතුනු දහම බිහිවූ සමාජ පසුබිම ගවේෂණය කරයි. කිතු දහම බිහිවීමට පසුබිම, ජේසු සමිඳුන් ජීවත් වූ කාලය පිළිබඳ විමසයි.
- පලස්තීන දේශයේ ආගම් පසුබිම හඳුනාගනියි.
- කිතුනු දහම බිහිවීමට පසුබිම් වූ රෝම පාලන ක්‍රමය හදාරයි

**5. උපකරණයේ ස්වභාවය** - බිත්ති පුවත්පතක් සකස් කිරීම

**6. අරමුණු :**

- ජේසු සමිඳුන් ජීවත් වූ කාලය තුළ සමාජීය දේශපාලන, සංස්කෘතික පසුබිම හදාරයි.
- කිතුදහම බිහිවූ සමාජය පිළිබඳ සොයයි
- ජුදා ආගමික සංස්කෘතිය, සමාජ ක්‍රමය. සමාජ පන්තිය, සිරිත් විරිත් ගැන සොයා බලයි.

**7. ඇගයීම් ක්‍රමය :**

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සම්බන්ධතාවය/ උචිත බව | 4 |
| 2. සංවිධානාත්මක බව හා ප්‍රමාණාත්මක බව | 4 |
| 3. අලංකාරය සඳහා යොදා ඇති උපක්‍රම හා ඒවායේ යෝග්‍ය බව | 4 |
| 4. අන්තර්ගතයේ ඇති නිර්මාණශීලී බව හා තර්කානුකූල බව | 4 |
| 5. බිත්ති පුවත්පතක් වශයෙන් නිමැවුමෙහි සාර්ථක බව | 4 |
| | **20** |

## පාසල පදනම් කරගත් තක්සේරුව

**1. පාසල් වාරය** - 01

**2. උපකරණ අංකය** - 03

**3. ආවරණය කරන නිපුණතා මට්ටම** - 7.1

**4. ආවරණය කරන විෂය අන්තර්ගතය :**

- කිතුනු දහමේ මූලාශ්‍ර අධ්‍යයනය කරමින් වත්මන් සභාවේ වර්ධනය
- මතෙව් 5 - 7
- ක්‍රිස්තු ශිෂ්ටාචාරයේ පදනම ක්‍රිස්තුන් වහනසේ
- මුල් කිතුනු සම්ප්‍රදාය පිළිබඳ අධ්‍යයනය කරයි.

**5. උපකරණයේ ස්වභාවය :** පැවරුම

**6. අරමුණු :**

- කිතු දහමේ වර්ධනයට පාදක වූ මූලාශ්‍ර අධ්‍යයනය කරයි.
- ශීලධාර්මික කරුණු තම ජීවිතයට අදාළ කර ගනියි.
- මුල් කිතුනු සභාවේ සම්ප්‍රදාය ලියා දක්වයි.

**7. ඇගයීම් ක්‍රමය :**

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. පැවරුමේ අරමුණු පැහැදිළි කිරීම හා මාතෘකාවට එහි ඇති සම්බන්ධතාවය ප්‍රකාශ කිරීම | 4 |
| 2. දත්ත/තොරතුරු රැස්කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හා උචිත බව | 4 |
| 3. දත්ත/තොරතුරු රැස්කිරීම හා ඒ පිළිබඳ සටහන් තබාගැනීම | 4 |
| 4. උපක්‍රමවල උචිත බව හා තර්කානුකූල බව | 4 |
| 5. නිගමනවලට එළඹීම/නිමැවුම ඉදිරිපත් කිරීම | 4 |
| | **20** |

# පාසල පදනම් කරගත් තක්සේරුව

**1. පාසල් වාරය** - 02

**2. උපකරණ අංකය** - 04

**3. ආවරණය කරන නිපුණතා මට්ටම** - 7.2

**4. ආවරණය කරන විෂය අන්තර්ගතය :**

- පෙර අපර දෙදිග ව්‍යාප්ත වූ සභාවේ මුල් යුගයේ සිදු වූ සමාජ ප්‍රවණතා ලක්ෂණ විමර්ශනය කරයි.

**5. උපකරණයේ ස්වභාවය :** ව්‍යුහගත රචනා

**6. අරමුණු :**

- ක්‍රිස්තියානි විශ්වාසයට එරෙහිව සභාව ඇතුළත හා පිටත ඇති වූ වාද භේදවලට සභාව මුහුණ දුන් ආකාරය අධ්‍යයනය කරයි.
- සභාවේ ආරම්භක යුගයේ දී බිහි වූ කිතුනු විද්‍යා පීඨ ගැන හදාරයි.
- ආරම්භක යුගයේ සිටි කිතුනු චින්තකයන් හා ධර්මධරයන් පිළිබඳ ගැඹුරින් ගවේෂණය කරයි.

**7. ඇගයීම් ක්‍රමය :**

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. මාතෘකාව හැඳින්වීම | 4 |
| 2. විෂය කරුණුවල වැදගත්කම/මාතෘකාවට අදාළ බව | 4 |
| 3. සංවිධානය, ඡේද බෙදීම, අනුපිළිවෙල, | 4 |
| 4. භාෂාවේ නිවැරදි බව, නිවැරදි ව්‍යාකරණ, විරාම ලක්ෂණ, උචිත යෙදුම්, පැහැදිලි බව හා නිර්මාණශීලී බව | 4 |
| 5. නිගමනවලට එළඹීම, සාධාරණීකරණය, තර්කානුකූලව කරුණු ඉදිරිපත් කිරීම | 4 |
| | **20** |

# පාසල පදනම් කරගත් තක්සේරුව

**1. පාසල් වාරය** - 02

**2. උපකරණ අංකය** - 05

**3. ආවරණය කරන නිපුණතා මට්ටම** - 8.3

**4. ආවරණය කරන විෂය අන්තර්ගතය :**

- කලාශිල්පයේ උන්නතිය සඳහා සභා දායකත්වය
- ගෘහ නිර්මාණ ශිල්පය, කැටයම්, මූර්ති පිළිබඳ අධ්‍යයනය
- ලේඛන, ලේඛකයෝ, සංගීතය පිළිබඳ අධ්‍යයනය
- කලාවේ උන්නතිය සඳහා සභා දායකත්වය පිළිබඳ අධ්‍යයනය

**5. උපකරණයේ ස්වභාවය :** ගවේෂණය

**6. අරමුණු :**

- කලා ශිල්ප උන්නතිය සඳහා සභා දායකත්වය දැන ගනියි.
- ලේඛනය, ලේඛකයෝ හා සංගීතය පිළිබඳ දැන ගනියි.
- සභාවේ දායකත්වය සොයා බලයි.
- ගෘහ නිර්මාණ ශිල්පය, කැටයම්, මූර්ති කලාව තුළ අඩංගු සෞන්දර්ය පිළිබඳ අගය කරයි.

**7. ඇගයීම් ක්‍රමය :**

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. ගැටලුව/විෂය මාතෘකාව අවබෝධ කර ගැනීම, අරමුණු හා විෂයට ඇති සම්බන්ධතාවය | 4 |
| 2. ක්‍රියාවලිය, සැලසුම් කිරීම, සංවිධානය හා දත්ත රැස්කිරීමට ගන්නා ක්‍රියාමාර්ග තීරණය කිරීම | 4 |
| 3. දත්ත රැස්කිරීම හා නිවැරදි බව | 4 |
| 4. දත්ත විශ්ලේෂණය, වගුගත ප්‍රස්තාර නිරූපණය කිරීම | 4 |
| 5. නිගමනවලට එළඹීම, හේතු දැක්වීම, වාර්තා සකස් කිරීම | 4 |
| | **20** |

## පාසල පදනම් කරගත් තක්සේරුව

**1. පාසල් වාරය** - 02

**2. උපකරණ අංකය** - 06

**3. ආවරණය කරන නිපුණතා මට්ටම** - 9.1

**4. ආවරණය කරන විෂය අන්තර්ගතය :**

- අධ්‍යාපනය නඟාසිටුවීමට විදේශ පාලන යුගයේ දායකත්වය
- නිදහසින් පසු යුගය පිළිබඳ ව අධ්‍යයනය

**5. උපකරණයේ ස්වභාවය :** කණ්ඩායම් ක්‍රියාකාරකම්

**6. අරමුණු :**

- කිතුනු අධ්‍යාපනඥයෝ කළ සේවාවන් සොයා බලා වාර්තා සකස් කරයි.
- අධ්‍යාපනය නඟාසිටුවීමට සභාවෙන් ලද දායකත්වය සොයා බලයි.
- පෘතුගීසි, ලන්දේසි, බ්‍රිතාන්‍ය යුගයේ අධ්‍යාපනය හදාරයි

**7. ඇගයීම් ක්‍රමය :**

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. ප්‍රවේශය, මාතෘකාව පැහැදිළි ව හැඳින්වීම හා එහි උචිත බව | 4 |
| 2. සංවිධානාත්මක බව, මාතෘකාවට අදාළ කරුණු ඉදිරිපත් කිරීම නිවැරදි බව | 4 |
| 3. නිර්මාණ ගුණාත්මක ලෙස සකස් කර තිබීම | 4 |
| 4. ශිෂ්‍ය ප්‍රගතිය දැක්වෙන සේ නිර්මාණ ඇතුළත් කිරීම | 4 |
| 5. නිර්මාණ සංග්‍රහයේ සංවිධානාත්මක බව, නිර්මාණාත්මක බව හා පිරිසිදු බව | 4 |
| | **20** |

# පාසල පදනම් කරගත් තක්සේරුව

**1. පාසල් වාරය** - 03

**2. උපකරණ අංකය** - 07

**3. ආවරණය කරන නිපුණතා මට්ටම** - 9.2

**4. ආවරණය කරන විෂය අන්තර්ගතය :**

- ශ්‍රී ලාංකේය සමාජයේ සුබසාධනයට සභාවේ දායකත්වය පිළිබඳ විමසා බලයි.
- මානව හිමිකම් හා සමාජ සංවර්ධනය
- කිතුනු දයාව සමාජ සුබසාධන කටයුතු සඳහා සභා දායකත්වය අගය කරයි.

**5. උපකරණයේ ස්වභාවය :** ප්‍රායෝගික ක්‍රියාකාරකම්

**6. අරමුණු :**

- මානව හිමිකම් හා සමාජ සංවර්ධනයට අතහිත දෙයි.
- කිතුනු දයාව හා සමාජ සුබසාධනය, ආරෝග්‍ය ශාලා , සුබසාධන කටයුතු සංවර්ධනය විමසා බලයි.

**7. ඇගයීම් ක්‍රමය :**

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. ක්‍රියාකාරකම්වල අරමුණු පැහැදිළි බව, ක්‍රියාවලිය සැකසීම | 4 |
| 2. ක්‍රියාකාරකම සඳහා උපකරණ සොයා ගැනීම, සැකසීම හා නිසි ලෙස භාවිතය | 4 |
| 3. දත්ත රැස්කිරීම හා ක්‍රියාවලියේ ගුණාත්මක බව | 4 |
| 4. ලබාගත් දත්තවල නිරවද්‍යතාව නිසි අයුරු වගුගත කිරීම, රූප සටහන් | 4 |
| 5. ඉදිරිපත් කිරීම, සමස්තය ගොඩනැගීම | 4 |
| | **20** |

# පාසල පදනම් කරගත් තක්සේරුව

**1. පාසල් වාරය** - 03

**2. උපකරණ අංකය** - 08

**3. ආවරණය කරන නිපුණතා මට්ටම** - 9.3

**4. ආවරණය කරන විෂය අන්තර්ගතය :**

- ශ්‍රී ලාංකේය සමාජයේ කලාව උදෙසා කිතුනු දායකත්වය පිළිබඳ අධ්‍යයනය
- විවිධ කලා ක්ෂේත්‍ර ඔස්සේ වත්මන් සමාජයට ලබා දී ඇති දායකත්වයන් අධ්‍යයනය

**5. උපකරණයේ ස්වභාවය :** නිර්මාණශීලී ක්‍රියාකාරකම්

**6. අරමුණු :**

- නාඩගම් කලාව, සිනමා කලාව, සංගීතය, චිත්‍ර, ලේඛන කලාව මඟින් සිදුවී ඇති විවිධ සේවා ලැයිස්තුගත කරයි.
- ශ්‍රී ලාංකේය කලාව උදෙසා කිතුනු දායකත්වය දැනගනියි.
- ලේඛන කලාව, චිත්‍ර ශිල්පය, සංගීතය, නාට්‍ය කලාව, සිනමා කලාව පිළිබඳ අධ්‍යයනය කරයි.

**7. ඇගයීම් ක්‍රමය :**

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. ඉගෙනුම් ක්‍රියාවලියට අදාළ නිර්මාණයන් ඉදිරිපත් කරයි. | 4 |
| 2. යොදාගනු ලබන ද්‍රව්‍ය උපකරණවල අදාළ බව හා යොදාගත් මාධ්‍යවල උචිත බව/ගැලපීම | 4 |
| 3. ශාස්ත්‍රීය ගැලපීම හා පදනම | 4 |
| 4. ඉදිරිපත් කිරීම, භාෂාව හා චිත්‍ර, නර්තනය, නාට්‍ය, ගායනය, වාදනය, සංවිධානය, සිත් ඇදගන්නා බව, ලාලිත්‍ය, උචිත බව | 4 |
| 5. සමස්ත නිර්මාණය ඉගෙනුම් ඵල හුවා දැක්වීම, ඉගෙනුම් අරමුණු හා සම්බන්ධ වීම | 4 |
| | **20** |

# පාසල පදනම් කරගත් තක්සේරුව

**1. පාසල් වාරය** - 03

**2. උපකරණ අංකය** - 09

**3. ආවරණය කරන නිපුණතා මට්ටම** - 10.1, 10.2

**4. ආවරණය කරන විෂය අන්තර්ගතය :**

- දෙවෙනි වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ හදාරයි
- ආසියා රදගුරු සම්මේලනය පිළිබඳ, ආසියානු කිතුනු සම්මේලනය පිළිබඳව හදාරයි
- සාමය, පවුල් ජීවිතය, සංස්කෘතිය නඟාසිටුවීමට මන්ත්‍රණ සභාව ක්‍රියා කර ඇති අන්දම හදාරයි.

**5. උපකරණයේ ස්වභාවය :** පැවරුමක්

**6. අරමුණු :**

- ආසියානු රදගුරු සමුළු ප්‍රකාශන, ආසියානු කිතුනු සම්මේලන පිළිබඳ සොයා බලා එමගින් උගත් කරුණු ප්‍රකාශ කරයි.
- ආසියානු රදගුරු සමුළු, ලෝක කිතුනු සභා සම්මේලන පිළිබඳ දැනගනියි.
- සාමයික අවබෝධය හා කිතුනු සභා එකමුතුවට දායක වූ අය ගැන විස්තර කරයි.

**7. ඇගයීම් ක්‍රමය :**

| **නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| 1. පැවරුමේ ඇමුණු පැහැදිළි කිරීම හා මාතෘකාවට අදාළ වීම. | 4 |
| 2. දත්ත තොරතුරු රැස්කිරීමට ගත් ක්‍රියාමාර්ග | 4 |
| 3. දත්ත/තොරතුරු සටහන් තැබීම | 4 |
| 4. උපක්‍රමවල උචිත බව, තර්කානුකූල බව | 4 |
| 5. නිගමනවලට එළඹීම/වාර්තාව, නිමැවුම ඉදිරිපත් කිරීම | 4 |
| | **20** |